ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවල
බදු හා වරිපනම්
පැනවීමේ හා අයකිරීමේ ක්‍රමවේදය
පිළිබඳ
පර්යේෂණ අධ්‍යයන වාර්තාව

2017 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම
මහා නගර සභා /නගර සභා /ප්‍රාදේශීය සභා



2017 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම
මහා නගර සභා /නගර සභා /ප්‍රාදේශීය සභා



GOOD GOVERNANCE FOR LOCAL DEVELOPMENT

අපේ සමාජ දේශන ශ්‍රී පොත

අංකය

අංක 17, පැලැන්තර වාරය, මාලේ 07

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන විසින් බදු හා වරිපනම් පැනවීමේ හා අයකිරීමේ ක්‍රමවේදය පිළිබඳ පර්යේෂණ අධ්‍යයනය

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

අංක 17, මලලසේකර මාවත, කොළඹ 07

පර්යේෂණ වාර්තාවේ අන්තර්ගතය

විධායක සාරාංශය ..... **xi**

01 පරිච්ඡේදය **1**

1. හැඳින්වීම : **1**

1.1 පසුබිම : 3

1.2 අධ්‍යයනයේ විෂය පථය : 6

1.3 පර්යේෂණ ක්‍රමවේදය : 6

සටහන් අංක 01 ..... **11**

සිතියම් අංක 01 ..... **14**

සටහන් අංක 02 ..... **15**

1.4 අධ්‍යයනයේ අරමුණු: 16

1.5 විශේෂිත අරමුණු: 16

1.6 අපේක්ෂිත ප්‍රතිඵල: 17

02 පරිච්ඡේදය **18**

2. පර්යේෂණ අධ්‍යයනයේ ප්‍රවේශය **18**

2.1 දත්ත රැස්කිරීම හා සැලසුම් කිරීම: 18

2.2 අදාල නීති, අතුරු ව්‍යවස්ථා, නව නීති වාර්තා අධ්‍යයනය හා තොරතුරු ලබාගැනීම: 19

2.3 පළාත් සභා සහ පළාත් පාලන ආයතන සතු තොරතුරු, වාර්තා අධ්‍යයනය: 20

2.4 අදාල පර්යේෂණ වාර්තා අධ්‍යයනය: 22

2.5 පරීක්ෂණ කණ්ඩායමේ ඉලක්කගත එකඟතාව: 23

2.6 ප්‍රශ්ණාවලීන් සම්පාදනය: 23

2.7 නියැදි අධ්‍යයනය: 25

සටහන් අංක 03 ..... **25**

03 පරිච්ඡේදය **28**

3. ක්ෂේත්‍ර තොරතුරු සමීක්ෂණය : **28**

3.1 නියැදිගත පළාත් පාලන ආයතනයන්හි ප්‍රායෝගික තත්ව අධ්‍යයනය: 29

සටහන් අංක 04:මහා නගර සභා :- 2016 වසර සඳහා වරිපනම්, බදු හා බලපත්‍ර ගාස්තු පැනවීම. ... 30

3.2 මහා නගර සභා ... 31

සටහන් අංක 05 :මහා නගර සභා ... 31

සටහන් අංක 06:නගර සභා:- 2016 වසර සඳහා වරිපනම්, බදු හා බලපත්‍ර ගාස්තු පැනවීම. ... 32

3.2.1 නගර සභා ... 34

සටහන් අංක 07:නගර සභා ... 34

සටහන් අංක 08:ප්‍රාදේශීය සභා:- 2016 වසර සඳහා වරිපනම්, බදු හා බලපත්‍ර ගාස්තු පැනවීම. ... 35

3.2.2 ප්‍රාදේශීය සභා ... 37

සටහන් අංක 09 :ප්‍රාදේශීය සභා ... 37

3.3 තොරතුරු එක්රැස් කිරීම: ... 38

3.4 පළාත් පාලන ආයතන, පළාත් සභා ප්‍රධාන නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීම: ... 39

සටහන් අංක 10 : පළාත් පාලන චක්‍රලේඛ උපදෙස් හා මගපෙන්වීම් ... 40

3.5 බදු ගෙවන්නන්ගේ සංගම්, ව්‍යාපාරික සංගම් ආදිය සමඟ සාකච්ඡා පැවැත්වීම: ... 40

04 පරිච්ඡේදය ... 43

4. වරිපනම්, බලපත්‍ර ගාස්තු හා බදු පැනවීම පිළිබඳ නෛතික විධිවිධාන : ... 43

සටහන් අංක 11 :ලංකාවේ පළාත් පාලන ආයතන වෙත අනුමතකර ඇති ආදායම් ... 46

4.1 වරිපනම්: ... 46

සටහන් අංක 12 :වරිපනම් පැනවීමට අදාල නෛතික විධිවිධාන ... 47

සටහන් අංක 13 :බදු වර්ගීකරණය ... 52

4.2 බදු කුළී ... 56

4.3 බලපත්‍ර ගාස්තු ... 61

4.4 සමහර සේවාවන් වෙනුවෙන් වූ ගාස්තු ... 65

05 පරිච්ඡේදය ... 68

5. පර්යේෂණ අධ්‍යයනයේදී අනාවරණය වූ කරුණු ... 68

5.1 වරිපනම් ... 68

5.1.1 කොළඹ මහා නගර සභාව ... 74

5.1.2 දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව 75

5.1.3 ගම්පහ මහා නගර සභාව 76

5.1.4 කුරුණෑගල මහා නගර සභාව 77

5.1.5 මහනුවර මහා නගර සභාව 77

5.1.6 දඹුල්ල මහා නගර සභාව 79

5.1.7 රත්නපුර මහා නගර සභාව 79

5.1.8 බදුල්ල මහා නගර සභාව 80

5.1.9 හම්බන්තොට මහා නගර සභාව 80

5.1.10 මඩකලපුව මහා නගර සභාව 81

5.1.11 අනුරාධපුරය මහා නගර සභාව 82

5.1.12 යාපනය මහා නගර සභාව 83

5.2 බලපත්‍ර ගාස්තු 84

5.2.1 කොළඹ මහා නගර සභාව 87

5.2.2 දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව 89

5.2.3 ගම්පහ මහා නගර සභාව 90

5.2.4 කුරුණෑගල මහා නගර සභාව 92

5.2.5 මහනුවර මහා නගර සභාව 92

5.2.6 දඹුල්ල මහා නගර සභාව 94

5.2.7 රත්නපුර මහා නගර සභාව 96

5.2.8 බදුල්ල මහා නගර සභාව 97

5.2.9 හම්බන්තොට මහා නගර සභාව 99

5.2.10 මඩකලපුව මහා නගර සභාව 99

5.2.11 අනුරාධපුර මහා නගර සභාව 100

5.2.12 යාපනය මහා නගර සභාව 103

5.3 ව්‍යාපාර බදු 102

සටහන් අංක 14:ව්‍යාපාර බද්ද අයකිරීමේ පදනම 103

5.3.1 කොළඹ මහා නගර සභාව 104

5.3.2 දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව 105

5.3.3 ගම්පහ මහා නගර සභාව 105

5.3.4 කුරුණෑගල මහා නගර සභාව 106

5.3.5 මහනුවර මහා නගර සභාව 106

5.3.6 දඹුල්ල මහා නගර සභාව 107

5.3.7 රත්නපුර මහා නගර සභාව 108

5.3.8 බදුල්ල මහා නගර සභාව 108

5.3.9 හම්බන්තොට මහා නගර සභාව 109

5.3.10 මඩකලපුව මහා නගර සභාව 111

5.3.11 අනුරාධපුරය මහා නගර සභාව 111

5.3.12 යාපනය මහා නගර සභාව 112

5.4 කර්මාන්ත බදු (Trade Tax) 113

සටහන් අංක 15 :කර්මාන්ත බද්ද අයකිරීමේ පදනම 113

5.4.1 කොළඹ මහා නගර සභාව 115

5.4.2 දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව 116

5.4.3 ගම්පහ මහා නගර සභාව 117

5.4.4 කුරුණෑගල මහා නගර සභාව 118

5.4.5 මහනුවර මහා නගර සභාව 118

5.4.6 දඹුල්ල මහා නගර සභාව 119

5.4.7 රත්නපුර මහා නගර සභාව 120

5.4.8 බදුල්ල මහා නගර සභාව 121

5.4.9 හම්බන්තොට මහා නගර සභාව 121

5.4.10 මඩකලපුව මහා නගර සභාව 121

5.4.11 අනුරාධපුර මහා නගර සභාව 122

5.4.12 යාපනය මහා නගර සභාව 122

7.5 විභව ආදායම් ප්‍රභවයන් හි ඌණ භාවිතය 291

7.5.1 වරිපහම් / දේපල බදු 291

7.5.2 අක්කර බදු 293

7.5.3 බලපත්‍ර ගාස්තු 293

7.5.4 ව්‍යාපාර බදු 295

7.5.5 වෘත්තීය බද්ද 295

7.5.6 විනෝද බදු 296

7.5.7 වාහන හා සත්ව බද්ද 296

7.5.8 සංවර්ධනය නොකළ ඉඩම් මත බදු 296

7.5.9 ප්‍රචාරක දැන්වීම් පුවරු 297

7.5.10 ඇතැම් ඉඩම් විකිණීම් මත බදු පැනවීම 297

7.5.11 පරිසර බලපත්‍ර ගාස්තු පැනවීම 298

7.5.12 ප්‍රසිද්ධ රැඟුම් බලපත්‍ර ගාස්තු 298

7.5.13 සමාජ ශාලා බලපත්‍ර ගාස්තු 298

7.5.14 ඛනිජ තෙල් ආඥාපනත අනුව බලපත්‍ර ගාස්තු 299

7.5.15 සන්නිවේදන කුළුණු බදු 299

7.6 පළාත් පාලන ආයතනයන්හි ආදායම් පැනවීම බිඳවැටීමට බලපා ඇති සාධක 300

7.6.1 1931 සිට 1989 දක්වා පැවති ශක්තිමත් පළාත් පාලන කළමනාකරණ හා අධීක්ෂණ ව්‍යුහය හා මධ්‍ය පාලනය අහෝසිවීම. 301

7.6.2 පළාත් පාලන සේවය බිඳවැටීම. 304

7.6.3 පළාත් පාලනය පළාත් රාජ්‍ය සේවාවේ තවත් එක් සේවා ස්ථානයක් බවට පත්වීම. 306

7.6.4 පළාත් පාලන ආයතන පරිපාලනය අධීක්ෂණය කරන ජාතික, පළාත් බද හා පළාත් පාලන ස්ථරයන්හි නිලධාරීන් තුළ පළාත් පාලන මූලධර්ම පිළිබඳ පවතින අවබෝධය හීනවීම 307

7.6.5 පළාත් පාලන ආයතන පරිපාලනය අධීක්ෂණය කිරීම බිඳවැටීම. 311

7.6.6 පළාත් පාලනයේ නිරත පිරිස තුල නීතිය පිළිබඳව ප්‍රමාණවත් දැනුවත් භාවයක් නොමැතිවීම හා නීති කියවා අවබෝධකර ගැනීමට නොහැකිවීම. 312

7.6.7 පළාත් පාලන ආයතන සඳහා පැවති පළාත් පාලන කොමසාරිස්වරයාගේ කාලීන විමර්ශන (Periodical Investigations) නොමැතිවීම. 313

7.6.8 පළාත් පාලන ආයතනයන්හි නිළධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග තුලින් පළාත් පාලන විෂය ඉවත් වීම. 315

7.6.9 පළාත් පාලන ආයතනයන්හි නිළධාරීන්ගේ පුහුණුවේ ඌණතා. 315

7.6.10 පළාත් පාලන විගණනයේ දුර්වලතා 318

08 පරිච්ඡේදය 322

8. නිරීක්ෂණ හා නිර්දේශ 322

8.1 නිරීක්ෂණ 322

8.2 නිර්දේශ 336

8.2.1 කෙටිකාලීන නිර්දේශ 336

8.2.2 මධ්‍ය කාලීන හා දිගු කාලීන නිර්දේශ 341

උපලේඛණ 347

උපලේඛණ අංක 01 ..... **348**

උපලේඛණ අංක 02 ..... **353**

උපලේඛණ අංක 03 ..... **364**

උපලේඛණ අංක 04 ..... **365**

උපලේඛණ අංක 05 ..... **366**

උපලේඛණ අංක 06 ..... **375**

පෙරවදන

මහා නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා යන පළාත් පාලන ආයතනවල මූලික ස්වයං උත්පාදන ආදායම් ප්‍රභවයන් වන්නේ වරිපනම්, බදු හා ගාස්තු පනවා අයකර ගැනීමෙන් රැස්කරගන්නා ආදායම්ය.මේ සඳහා එක් එක් වර්ෂයට අදාලව ඒ ඒ සභා බල ප්‍රදේශ තුළින් ආදායම් ඒකරාශී කරගැනීම සඳහා ගනු ලබන සභා තීරණ මත අදාළ නීති රීතිවලට අනුකූලව සකස් කරන ලද බදු නිවේදන ගැසට් මගින් ප්‍රකාශයට පත්කළ යුතුය. පසුගිය කාල පරිච්ඡේදය තුළ පළාත් පාලන ආයතන මගින් ප්‍රකාශයට පත්කොට තිබූ බදු පැනවීමට අදාළ ගැසට් පත්‍ර නිරීක්ෂණයේදී අනාවරණය වූ දුර්වලතාදවන්ද මෙවැනි අධ්‍යයනයකට යොමුවීමට හේතු විය.

ඒ අනුව පළාත් පාලන ආයතන වර්ග තුනට අදාළව ලැබී ඇති නීතිමය ප්‍රතිපාදනවලට අනුගතවීමෙන් හා උප නීති සකසාගැනීමෙන් ආදායම් රැස්කරගැනීමට යොමුවී ඇත්තේද, ඒවායේ පවත්නා දුර්වලතාවන් මොනවාද, ඒවා අවමකොටගෙන ප්‍රශස්ථ මට්ටමකට ආයතන පද්ධතිය පත්කිරීම සඳහා ගතයුතු පියවර මොනවාද යන්න පිළිබඳ නිර්දේශ ලබාදීමටත් මෙම අධ්‍යයනය මගින් උත්සාහ කොට ඇත.

මේ සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය, පළාත් අමාත්‍යාංශ හා පළාත් පාලන කොමසාරිස් කාර්යාල හා පළාත් පාලන ආයතනවල ක්‍රියාත්මකවීම කෙබඳුද, ඒවායේ පවත්නා දුර්වලතාවන් කවරේද, ඒවා අතික්‍රමණය කිරීමට නොපමාව කටයුතු කළ යුත්තේ කෙසේද යන්නත් ගැඹුරින් සොයාබැලීමද මෙම පර්යේෂණයේ තවත් අරමුණක් වේ.

දිවයිනේ පළාත් සභා නවයම ආවරණය වන පරිදි පළාත් පාලන ආයතන 48 ක් ආශ්‍රයෙන් ප්‍රාථමික දත්ත, ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා මගින් රැස්කරගන්නා ලද දත්ත හා තොරතුරු විශ්ලේෂණය කොට විග්‍රහ කිරීමෙන් ඉදිරිපත්කොට ඇති නිගමන හා නිර්දේශ ක්‍රියාවට නැංවීම සඳහා ඊට අදාළ අංශවල අවධානය යොමුකරවීමටද මෙම අධ්‍යයන මගින් කටයුතු කොට ඇත.

මෙම පර්යේෂණ අධ්‍යයනය මගින් අනාවරණය කොටගෙන තිබෙන දුර්වලතාවයන් සැළකිල්ලට ගෙන ඒවා නිවැරදි කිරීම සඳහා කඩිනම් ඉදිරි ක්‍රියාමාර්ගවලට යොමුවීම තුළින් පළාත් පාලන ආයතන පද්ධතිය ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග අප්‍රමාදව ක්‍රියාත්මක කරනු ඇතැයි විශ්වාසය පළකරමු.

පී.එස් .ධර්මරත්න

නියෝජ්‍ය අධ්‍යක්ෂ(පර්යේෂණ හා සංවර්ධන)

5.5 පළාත් පාලන ආයතන විසින් අයකළහැකි සෙසු බදු 123

5.5.1 විනෝද බදු 124

5.5.2 වාහන හා සත්ව බදු 125

5.5.3 සංවර්ධනය නොකළ ඉඩම් මත බදු 126

5.5.4 ඇතැම් ඉඩම් විකිණීම් විෂයෙහි බදු 127

5.6 නගර සභා 127

සටහන් අංක 16:අධ්‍යයනයට භාජනය කරන ලද නගර සභා 127

5.6.1 වරිපනම් පැනවීම 128

5.6.2 බලපත්‍ර ගාස්තු 143

5.6.3 ව්‍යාපාර බද්ද: 158

5.6.4 කර්මාන්ත බද්ද 169

5.6.5 විනෝද බද්ද වාහන හා සත්ව බද්ද සංවර්ධනය නොකළ ඉඩම් මත පනවන බද්ද 179

5.7 ප්‍රාදේශීය සභා: 188

සටහන් අංක 17 :අධ්‍යයනයට භාජනය කරන ලද ප්‍රාදේශීය සභා 189

5.7.1 කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව 189

5.7.2 බියගම ප්‍රාදේශීය සභාව 193

5.7.3 දොඩංගොඩ ප්‍රාදේශීය සභාව 197

5.7.4 හලාවත ප්‍රාදේශීය සභාව 201

5.7.5 අලව්ව ප්‍රාදේශීය සභාව 204

5.7.6 යටිනුවර ප්‍රාදේශීය සභාව 207

5.7.7 අඹගමුව ප්‍රාදේශීය සභාව 214

5.7.8 ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව 2145

5.7.9 ගලිගමුව ප්‍රාදේශීය සභාව: 221

5.7.10 දික්වැල්ල ප්‍රදේශීය සභාව: 225

5.7.11 බෙන්තොට ප්‍රාදේශීය සභාව: 229

5.7.12 පස්සර ප්‍රාදේශීය සභාව: 233

5.7.13 මොණරාගල ප්‍රාදේශීය සභාව: 236

5.7.14 තලාව ප්‍රාදේශීය සභාව: 239

5.7.15 මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව 242

5.7.16 තමන්කඩුව ප්‍රාදේශීය සභාව: 245

5.7.17 තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව: 246

5.7.18 සේරුවිල ප්‍රාදේශීය සභාව: 246

5.7.19 නානාටාන් ප්‍රාදේශීය සභාව 246

5.7.20 කරච්චි ප්‍රාදේශීය සභාව 247

5.7.21 මුහුදුබඩ පත්තු ප්‍රාදේශීය සභාව 247

06 පරිච්ඡේදය 249

6. පළාත් පාලන ආයතනයන්හි මූල්‍ය කළමනාකරණය පිළිබඳ වර්තමාන ස්වරූපය 249

6.1 පළාත් පාලන දෙපාර්තමේන්තු වල මගපෙන්වීම හා අධීක්ෂණය පිළිබඳ යථාතත්වය 257

6.2 පළාත් පාලන ආයතන පද්ධතියෙහි වාර්ෂික ආදායම් පැනවීම විෂයෙහි පළාත් සභාවන්හි පළාත් පාලන කොමසාරිස් වරයාගේ අධීක්ෂණය පිළිබඳ වර්තමාන තත්වය ः 260

සටහන් අංක 18:පළාත් පාලන දෙපාර්තමේන්තුව සංවිධාන ව්‍යුහය 264

6.3 පළාත් පාලන ආයතනවල නිලධාරීන් අදාළ ක්ෂේත්‍රය පිළිබඳව ලබා ඇති පුහුණුවීම් 264

6.4 අධ්‍යයනයට අයත් පළාත් පාලන ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ලබා ඇති පුහුණුවීම් 269

6.5 පළාත් පාලන ආයතන පද්ධතියෙහි ආදායම් කළමනාකරණය කෙරෙහි ජාතික මට්ටමේ මැදිහත්වීම් ः 275

07 පරිච්ඡේදය 277

7. අවිධිමත් ආදායම් පැනවීම් විෂයෙහි දැකියහැකි ප්‍රතිවිපාක 277

7.1 අධික සමුච්චිත හිඟ මුදලක් ගොඩනැගීම 278

7.2 ආදායම් පැනවීමේ ඒකමිතික / විද්‍යාත්මක ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබීම 281

7.3 පළපුරුදු ආදායම් නිලධාරීන්ගේ හිඟය : 283

7.4 දෝෂ සහගත ආදායම් පැනවීම් හේතු කොට ගෙන අධිකරණ ක්‍රියාමාර්ග සඳහා ඉඩ ප්‍රස්ථා සැලසීම. 284

වගු ලැයිස්තුව

වගුව1:	අධ්‍යයනය සඳහා තෝරාගත් ආදායම් වර්ග	248
වගුව2:	ගැසට් පත්‍රයේ පළකර නැති අයකිරීම්	260
වගුව 3:	පුහුණු සැසි සංඛ්‍යාව හා ඊට ආයෝජනය කරන ලද මුදල්	266
වගුව4:	ආදායම් කළමනාකරණයට අදාළ වැඩසටහන් සංඛ්‍යාව හා ඒ සඳහා වූ පිරිවැය	266
වගුව5:	ප්‍රාදේශීය සභා නිලධාරී පුහුණුව	271
වගුව6 :	නගර සභා නිලධාරී පුහුණුව	272
වගුව7:	මහා නගර සභා නිලධාරී පුහුණුව	273
වගුව8:	කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව-2016	278
වගුව9:	සමුච්චිත හිඟ මුදල්	280
වගුව10:	සමුච්චිත හිඟ මුදල්	280
වගුව11:	දිවයිනේ නගර කිහිපයක 2016 වර්ෂයේ වරිපනම් ප්‍රතිශතය	282
වගුව12:	1971 වර්ෂයේදී ලංකාවේ පළාත් පාලන ව්‍යුහය	302
වගුව13:	1981 - 12 - 31 දිනට හිඟ ආදායම්	321
වගුව14:	මහා නගර සභා සම්බන්ධ නිවැරදි ආදායම් පැනවීම් පුරෝකථනය	323
වගුව15:	නගර සභා සම්බන්ධ නිවැරදි ආදායම් පැනවීම් පුරෝකථනය	324
වගුව16:	ප්‍රාදේශීය සභා සම්බන්ධ නිවැරදි ආදායම් පැනවීමේ පුරෝකථනය	324

විධායක සාරාංශය

ශ්‍රී ලංකාවේ පළාත් පාලනය දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන්නකි. එහි ආරම්භය ක්‍රි. පූ. තුන්වන (3) සියවස පමණ දක්වා විහිදී යයි. ඉතා දියුණු පදනමක පැවැති මෙරට සාම්ප්‍රදායික පළාත් පාලනය 16 වන සියවසේ සිට 20 වන සියවසේ මැද භාගය දක්වා පැවති බටහිර ජාතීන්ගේ යටත් විජිත පාලනය තුළ ප්‍රබල වෙනස්වීම් වලට භාජනය විය.

වර්තමානයේ ශ්‍රී ලංකාවේ දැකිය හැකි වන පළාත් පාලනය 19 වන සියවසේ මැද භාගයේදී බ්‍රිතාන්‍ය ජාතිකයින් විසින් හඳුන්වා දෙන ලද්දකි. මෙරට නූතන පළාත් පාලනයේ ආරම්භය 1865 අංක 17 දරණ කොළඹ මහා නගර සභා ආඥා පනත යටතේ කොළඹ මහා නගර සභාව පිහිටුවීමත් සමඟ ආරම්භ වී යැයි සැලකේ. එවක් පටන් කාලීන අවශ්‍යතාවයන්ට අනුකූලව වෙනස් වෙමින් වර්ධනය වූ මෙරට පළාත් පාලන ව්‍යුහයේ වර්තමාන ස්වරූපය වන්නේ මහා නගර සභා 24 කින් නගර සභා 41 කින් හා ප්‍රාදේශීය සභා 275 කින් සමන්විත ආයතන 337 ක් වූ පළාත් පාලන ආයතන පද්ධතියයි.

මෙරට පළාත් පාලන ආයතන ආරම්භයත් සමගම එතෙක් බ්‍රිතාන්‍යයේ පැවති පළාත් පාලන ආයතන රාමුව ගුරුකොට ගෙන එම ආයතන වල නෛතික රාමුව සැකසූ අතර එම ආයතන වල කාර්යය කර්තව්‍ය හා බලතල විශේෂිතව දක්වා තිබුණි. එසේම එම ආයතන වලින් අපේක්ෂිත තරමක් පුළුල් වපසරියක පැතිර ගිය සේවා සම්පාදනය නිර්බාධිතව ඉටු කිරීම අරමුණු කොට එම ආයතන වලට වරිපනම්, බදු හා බලපත්‍ර ගාස්තු පැනවීමටද බලතල පැවරුණි.

මෙසේ විකාශනය වූ මෙරට පළාත් පාලනය රජයේ අමාත්‍යංශයක හා ඒ යටතේ පැවති පුළුල් දෙපාර්තමේන්තුවක් වූ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ 1988 වර්ෂය දක්වා ලංකාවේ දෙවන පාලන ස්ථරය ලෙස ක්‍රියාත්මක විය. එතෙකුදු වුවත් 1988 දී සම්මත වූ 13 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් සමඟ පළාත් පාලනය රජයේ පාලනයෙන් ඉවත් වී අභිනවයෙන් ඇති කළ පළාත් සභාව නම් වූ උප ජාතික මට්ටමේ නව පාලන ස්ථරය යටතට පත්විය.

මෙය මෙරට පළාත් පාලනයේ සුවිශේෂ සන්ධිස්ථානයකි. එතෙක් රජය විසින් පවත්වාගෙන ආ පරිපාලනය අධීක්ෂණය කිරීම පළාත් සභාව වෙත පැවරුණි. එතෙක් පැවති ඒකීය පළාත් පාලන දෙපාර්තමේන්තුව අහෝසි වී පළාත් බද පලාත් පාලන දෙපාර්තමේන්තු නවයක් පළාත්

නවය සඳහා ස්ථාපනය විය. මෙම වෙනස්වීම ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකවද සිදු වූවක් විය. පළාත් සභා යටතේ පළාත් පාලනය එහි පැවැති කිසියම් ආකාර වූ ස්වාධීනත්වය (Autonomy) බොහෝ දුරට අහිමි කරගත් එකක් වූ බව පෙනේ. එතෙක් පළාත් පාලන ආයතන කළමනාකරණය කළ පළාත් පාලන සේවය (Local Government Service / L.G.S.) යටපත් වී පළාත් සභා රාජ්‍ය සේවය (Provincial (Counisil) Public services / P.P.S.C) කරලියට පැමිණියේය. එහි සමීප ප්‍රතිඵලය වූයේ පළාත් පාලන ආයතන සතුව පැවති පළාත් පාලනයට ආවේණික වූ විශේෂාංග දැනුම ක්‍රමානුකූලව පළාත් පාලන ආයතන පද්ධතියෙන් බැහැර වීමයි.

ඒ අනුව පළාත් පාලන ස්ථරය (Local Government Sphere) පළාත් සභාවේ තවත් එක් විෂයක් (Subject) බවට පත් විය. පළාත් පාලනය යනු කුමක්දැයි නොදන්නා පිරිසක් මගින් එය කළමනාකරණය වීම එසේ ආරම්භ විය. මෙම තත්ත්වය වසර 28 ක් පැවතී ඇති අතර එහි ඍජු හා වක්‍ර ප්‍රතිවිපාක ප්‍රාදේශීය ආණ්ඩුකරණය (Local Goverance) කෙරෙහි අහිතකර බලපෑම් එල්ල කර ඇත. 1988 ට ප්‍රථම පළාත් පාලන ආයතන හා රජය අතර පැවැතුණේ ඉතා ශක්තිමත් සබඳතාවයකි. එකල ආදායම් පැනවීම, ආදායම් ඒකරාශි කිරීම, හිඟ අයකර ගැනීමේ ක්‍රියාවලිය ආදිය මෙන්ම දත්ත හා තොරතුරු නඩත්තු කිරීමද ඉතා ඉහළ ප්‍රමිතියකින් යුතුව පැවතුණි. එහෙත් පළාත් සභා යටතේ දැන් එබඳු කළමනාකරණයක් සිදු නොවේ.

පළාත් පාලන ආයතනයන්හි ආදායම් පැනවීම මුළුමනින්ම පළාත් පාලන නීතියේ ඇතුළත් විධිවිධාන මතම සිදු කළ යුතුය. ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය රටේ ඉමහත් පිළිගැනීමට ලක් වී ඇති ජනතාවගේ විශ්වාසය උපරිම අයුරින් රැක ගත් ප්‍රබලතම ප්‍රකාශන මාධ්‍යයකි. එහෙත් එහි සාවද්‍ය හා දෝෂ සහිත නිවේදන පළ කර පළාත් පාලන ආයතන විසින් මෑතදී කර ඇති හානිය සුළු පටු නොවේ.

මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ වර්තමානයේ මෙරට පළාත් පාලන ආයතන විසින් වරිපනම් හා විවිධ බදු පනවා අය කිරීමේ ක්‍රමවේදය ගැඹුරින් අධ්‍යයනය කර එහි ලා දැනට භාවිතා කරන ක්‍රියා පටිපාටිය විශ්ලේෂණය කර එහි නීතියට පරිබාහිර පරිචයක් පවතී නම් ඒවා සහ ඊට අනුෂාංගික දෝෂ හා ඌණතා හඳුනාගැනීමත් එකී සාවද්‍ය පරිචයන් සහ දෝෂ යථාවත් කිරීමට ගත යුතු පියවර නිර්දේශ ලෙස ඉදිරිපත් කිරීමත්ය.

ඒ අනුව දිවයිනේ සෑම පළාතක්ම නියෝජනය වන පරිදි තෝරා ගත් නියැදියක් මත පළාත් පාලන ආයතන 48 ක් එනම් මුළු පළාත් පාලන ආයතන සංඛ්‍යාවෙන් 14% ක් මෙම අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදී.

මෙහිදී දත්ත සහ තොරතුරු ලබා ගැනීම පිණිස විෂයානුබද්ධ අධ්‍යයන, ප්‍රකාශන හා මූලාශ්‍ර විමර්ශනය, ව්‍යුහගත ප්‍රශ්නාවලින්, ප්‍රධාන නිලධාරීන් සමඟ වූ සම්මුඛ සාකච්ඡා, ඉලක්ක ගත කණ්ඩායම් සමඟ වූ සාකච්ඡා සහ ක්ෂේත්‍ර පරීක්ෂාව හා සෘජු නිරීක්ෂණ ආදී ක්‍රමවේද භාවිතා කරන ලදී.

වෙනත් බොහෝ රටවල මෙන්ම ශ්‍රී ලංකාවේද පළාත් පාලන ආයතනයන්හි ප්‍රධාන ස්වයං ජනිත ආදායම් මූලය වරිපනම් වේ. ඊට අමතරව බලපත්‍ර ගාස්තු, කර්මාන්ත බදු හා ව්‍යාපාර බදු, කුලී හා ගාස්තු ආදායම් සෙසු ප්‍රධාන ආදායම් මූලයන් වේ. එම ආදායම් වර්ග අය කිරීම හා ඊට අදාළ නෛතික ස්වභාවය මෙහිදී සවිස්තරව දක්වා ඇත. එසේම යටකී ආදායම් වර්ග පිළිබඳව නියැදි ගත පළාත් පාලන ආයතනයන්හි ක්‍රියාකාරීත්වයත් නීතිමය තත්ත්වය හා පවතින තත්වය අතර ඇති වෙනස්කම් හා ඌණතා (Gaps & Issues) මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡාවට භාජනය කරන ලදී.

නියැදි ගත පළාත් පාලන ආයතන වෙතින් ලබාගත් දත්ත හා තොරතුරු විග්‍රහ කිරීමේදී අනාවරණය වූයේ සෑම වර්ගයකම පළාත් පාලන ආයතන සිය ආදායම් පරිමාව කුමක් වුවද ආදායම් පැනවීමේ කාර්යයේදී දැඩි අසමත් කමක් පෙන්නුම් කර ඇති බවයි. මෙය පළාත් පාලන බලධාරීන්ගේ දැඩි අවධානය යොමු විය යුතු කරුණකි. ප්‍රස්තුත විෂයට අදාලව එක් එක් පළාත් පාලන ආයතනයේ කාර්යය සාධනය 5 වැනි පරිච්ඡේදයේ විස්තරාත්මකව විමර්ශනයට ලක් කර ඇත. එසේම මෙබඳු තත්ත්වයක් හට ගැනීමට හේතු කාරක වී ඇති සාධක හඳුනා ගෙන ඉදිරිපත් කොට ඇත.

කිසියම් පළාත් පාලන ආයතනයක් වරිපනම් හෝ බදු අය කරයි නම් ඊට අදාළ නීති සියල්ල මැනවින් දැනගත යුතුය. එහෙත් වරිපනම්, බදු, කුලී හෝ ගාස්තු පැනවීමේදී එකී පැනවීම් සිදු කිරීම සඳහා යොදා ගන්නා පදනම කුමක්ද යන්න පිළිබඳව පළාත් පාලන ආයතනයන්හි වගකිව යුතු නිළධාරීන් දැනුවත් වී නැති බව මෙහිදී අනාවරණය විය. ආදායම් පැනවීමට අදාලව බොහෝ පළාත් පාලන ආයතන වල ජ්‍යෙෂ්ඨ නිළධාරීන් ඊට අදාල නෛතික ප්‍රතිපාදන පිළිබඳව අනවබෝධයෙන් සිටින බව විද්‍යාමාන විය.

එපමණක් නොව පළාත් පාලන ආයතන පද්ධතියේ විමර්ශනය භාරව සිටින පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යලයන්හි විමර්ශන කාර්යය මණ්ඩල පවා මෙම ප්‍රතිපාදන පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැතිව සිටින බවද නිරීක්ෂණය විය. මෙම සියලුම දෝෂ සහගත තත්ත්වයන් තුලනාත්මකව විග්‍රහ කරන ලද අතර මෙම බිඳ වැටීම් සහගත තත්ත්වය පිටුදැක්ම සඳහා උපයෝගී කොට ගත හැකි නිරීක්ෂණ හා නිර්දේශ මෙම අධ්‍යයන වාර්තාවේ අවසාන පරිච්ඡේදයෙහි දක්වා ඇත. එම නිර්දේශ ඉදිරිපත් කිරීමේදී කෙටි කාලීනව සහ දිගු කාලීනව ගතයුතු පියවර සම්බන්ධයෙන් ද සවිස්තරාත්මකව කරුණු සාකච්ඡා කරන ලදී.

ඒ අනුව මෙම පර්යේෂණ අධ්‍යයනයේදී අනාවරණය වූ කරුණු මේ වන විට ලංකාවේ බහුතර පළාත් පාලන ආයතන සංඛ්‍යාවක පවත්නා යථා තත්ත්වය නිරූපණය කරන හෙයින් අප්‍රමාදව අපගේ පළාත් පාලන ආයතන පද්ධතිය යථාවත් කර ජනතාවට ප්‍රශස්ත සේවාවක් සපයන ආයතන බවට පත් කර ගැනීමට මෙම නිර්දේශ ඉවහල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

01 පරිච්ඡේදය

1. හැඳින්වීම :

පළාත් පාලන ආයතනයන්හි බදු සහ ආදායම් සම්බන්ධව වූ මෙම පර්යේෂණ අධ්‍යයනය එම ක්ෂේත්‍රයට අදාල වැදගත් පැතිකඩ ගණනාවක් ආශ්‍රයෙන් සිදුකරනු ලබන්නකි. එබැවින් පළාත් පාලනය පිළිබඳව, එහි ප්‍රායෝගික මෙන්ම නෛතික පදනම සම්බන්ධව සංක්ෂිප්ත එහෙත් ප්‍රමාණික අවබෝධයක් ඇතිකර ගැනීම අදාල අධ්‍යයනයේ අපේක්ෂිත පරමාර්ථය සාක්ෂාත් කරගැනීම සඳහා මහෝපකාරී වනු ඇත.

වර්තමාන ලෝකයේ සෑම රටකම පාහේ පළාත් පාලන ක්‍රමයක් හෙවත් මහ ජනතාවට ඉතාමත් සමීප වූ ප්‍රාදේශීය ආණ්ඩුකරණ ක්‍රමයක් පවතී. ඒ ඒ රටවලට විශේෂිත වූ දේශපාලනික, සමාජ, ආර්ථික හා සංස්කෘතික තත්වයන් අනුව යම් යම් වෙනස්කම් පැවතිය ද පුළුල් වශයෙන් සලකා බැලීමේදී පළාත් පාලනයේ විෂය ක්ෂේත්‍රය බොහෝදුරට සමාන ස්වරූපයක් ගනී. කොළඹ විශ්ව විද්‍යාලයේ දේශපාලන විද්‍යා අධ්‍යයන අංශයේ හිටපු මහාචාරිනී ට්‍රෙසි ලේටන් මැතිණිය " කිසියම් නිශ්චිත බලප්‍රදේශයක මහජනතාවට බලපාන කටයුතු මහජනතාව විසින් තෝරාපත් කරගනු ලබන නියෝජිත කණ්ඩායමක් මගින් පරිපාලනය වීම." පළාත් පාලනය ලෙස නිර්වචනය කර ඇත. පළාත් පාලනය පිළිබඳ ප්‍රකට බ්‍රිතාන්‍ය විද්වතෙකු වන ටෝනි බ්‍රයන් පළාත් පාලනය යනු "මහජන ඡන්දයෙන් තේරී පත්වූ නියෝජිතයන් විසින් යම් ප්‍රදේශයක මහජනතාවට බලපාන කරුණු මහජන සහභාගීත්වය ඇතිව පරිපාලනය කිරීමේ ස්වයං පාලන ක්‍රමයකි. මධ්‍යම රජයේ පාලනයට යම් ප්‍රමාණයකට යටත් වූව ද ප්‍රමාණවත් වගකීමක් හා අභිමතානුසාරී බලයක් ද ඊට ඇත." යනුවෙන් පළාත් පාලනය අර්ථ දක්වා තිබේ. මෙම විද්වත් නිර්වචන වලින් පෙනී යන්නේ මහජනතාව විසින් ප්‍රාදේශීකව තෝරාපත් කරගනු ලැබූ නියෝජිත කණ්ඩායමක් මගින් එම ප්‍රදේශයේ මහජනතාවගේ සුභසාධනය හා සුබ විහරණය සඳහා ජන සහභාගීත්වය ඇතිව ජන ජීවිතයට සමීප අත්‍යාවශ්‍ය පොදු සේවා සහ මහජන උපයෝගිතා සේවා පවත්වා ගෙන යාම පළාත් පාලනය තුලින් අපේක්ෂා කරන බවයි.

පළාත් පාලනය රටක ජනතාවට සමීපතම පාලන ක්‍රමයයි. එය ප්‍රදේශබඳව ක්‍රියාත්මක වන අතර, ඒවාහි බලප්‍රදේශ නිශ්චිතව වෙන්කරනු ලැබ ඇත. ඒවාට වෙන වෙනම පළාත් පාලන ආයතනයක් බැගින් ස්ථාපිත කර ඇත. ඒවා නාගරික හා ග්‍රාමීය වශයෙන් වෙන්කොට

හඳුනාගත හැකිය. එකී ආයතන පාලනය වන්නේ එක් එක් බලප්‍රදේශයක් සඳහා එහි ජනතාව විසින් ම තෝරා පත්කරගනු ලබන නියෝජිතයින්ගෙන් සැදි නෛතික වශයෙන් බලගැන්වූ සභාවක් (Council) මගිනි. පළාත් පාලන ආයතන වලට පැවරී ඇති විෂය පථය, කාර්යභාරයේ ව්‍යාප්තිය හා ස්වාධීනත්වයේ ප්‍රමාණය රටින් රටට වෙනස් වේ. සෑම රටකම පළාත් පාලන ආකෘතියේ ස්වභාවය සාධක කිහිපයක් මත තීරණය වී ඇත. දේශයේ ඓතිහාසික සම්ප්‍රදාය, එහි ජනතාවගේ ස විඥාණකත්වය හා ඒ සියල්ලටමත් වඩා පළාත් පාලන සංකල්ප කෙරෙහි එරට දේශපාලන හා පරිපාලන ප්‍රභූ පැලැන්තිය තුල ඇති ආකල්ප මීට ඉවහල් වේ. බටහිර ලෝකයේ බොහෝ රටවල් විසින් පළාත් පාලන ආයතන වෙත ප්‍රදේශයේ ප්‍රජාවට සේවා සැපයෙන පරිදි පොලිස් සේවාව, අධ්‍යාපනය, සමාජ සේවා, ගමනාගමනය, නිවාස, පරිසර කළමනාකරණය හා ජල සම්පාදනය ආදී වශයෙන් විස්තීරණ වූ සේවා රාශියක් පවරණු ලැබ ඇත. මහා බ්‍රිතාන්‍යය හා ස්කැන්ඩිනේවියානු රටවල් මෙම ගණයට අයත්වේ. අනෙක් අතට මෙහි ප්‍රතිවිරුද්ධ අන්තය ලෙසින් පළාත් පාලන ආයතන වෙත ප්‍රමුඛත්වයේ ලා නොගැනෙන නිත්‍ය වශයෙන් සීමිත පරාසයක ක්‍රියාකාරකම් රජයේ හෝ ප්‍රාන්ත වල දැඩි පාලනයට යටත්ව පවරනු ලැබූ ඇති අවස්ථාද දැකිය හැකිය. [1]

ඉහත කී ස්වරූප ද්වය අතරමැද වෙනස් ආකාරයකින් සංවිධානය වූ ක්‍රමවේද සෙසු රටවලින් දක්නට ලැබේ. ලංකාවේ පළාත් පාලනයේ විකාශනය සුපරීක්ෂාකාරීව අධ්‍යයනය කරන විට අතීතයේ අපගේ පළාත් පාලන ආයතන විෂය පථය හා බලතල සම්බන්ධයෙන් පුළුල් පරාසයක විහිදී ගිය කාර්යභාරයක් මෙන්ම සාපේක්ෂ වශයෙන් සැලකිය යුතු මට්ටමේ ස්වාධීනතාවයක් ද භුක්ති විඳින ලද බව පෙනේ. එසේ වුවත් වර්තමානයේ ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන වෙත පවරණු ලැබ ඇත්තේ සීමිත පරාසයක විහිදුණු ඉහල පාලන ස්ථර විසින් දැඩි පාලනයකට හසු කරගනු ලැබූ කාර්යභාරයකි.

ජාතික වශයෙන් හෝ පළාත් වශයෙන් හෝ වැදගත් වන කරුණු පළාත් පාලන විෂය පථයට ඇතුළත් නොවේ. එසේම, සෘජුවම ආර්ථික සංවර්ධනයට අදාලවන කරුණු ද පළාත් පාලනයට ඇතුළත් වන්නේ සුළු වශයෙනි. පළාත් පාලනයේ කාර්යභාරයට අයත් වන්නේ ජනතාවට අතිශයින් සමීපවූත්, ජනතාවගේ එදිනෙදා ජීවිතය සැපවත් කරගැනීමට හා පහසු කරගැනීමට අත්‍යාවශ්‍ය වූත් කාර්යයන්ය. සිය බල ප්‍රදේශයේ ප්‍රජාවගේ එදිනෙදා කටයුතු

[1] පළාත් පාලන කළමනාකරණය - 3 පිටුව – 2913 – International Institute & Development Training

පවත්වාගෙන යමින් ප්‍රදේශය පිරිසිදු සෞඛ්‍ය සම්පන්න හා වාසයට යෝග්‍ය තැනක් බවට පත්කිරීම පළාත් පාලනයට පැවරෙන මූලික වගකීම වේ. ඒ සඳහා නගර පවිත්‍රව තබාගැනීම, වාසස්ථාන හා ගොඩනැගිලි ඉදිකිරීම් විධිමත් කිරීම, පීඩා වැලැක්වීම, මංමාවත්, ජල බැසයන කාණු නිසි ලෙස නඩත්තු කිරීම, විවේකය ගතකිරීම සඳහා උද්‍යාන, ක්‍රීඩා භූමි ආදී පහසුකම් සැලස්වීම පළාත් පාලන ආයතනය විසින් ඉටුකරනු ලැබේ. එය ජන ජීවිතයට අත්‍යාවශ්‍ය මෙන්ම බෙහෙවින් පුළුල් වූ විෂය ක්ෂේත්‍රයකි. පළාත් පාලනයේ තවත් සුවිශේෂ ලක්ෂණයක් වන්නේ එකී ආයතනවලට පැවරී ඇති බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම පිණිස ආදායම් පැනවීමට හා අයකර ගැනීමට නීතියෙන් ඉඩකඩ සලසා දී තිබීමයි. ඒ අනුව වරිපනම්, බදු, බලපත්‍ර ගාස්තු, ගාස්තු පැනවීම හා කුලී නියම කිරීම පිළිබඳව ද ණය හා ප්‍රදාන ලබාගැනීම සඳහා ද පළාත් පාලන ආයතන වෙත බලය පැවරී ඇත. එසේම සෑම පළාත් පාලන ආයතනයක්ම, ආයතනයේ ආදායම් සඳහා අරමුදලක් පිහිටුවීම, පවත්වාගෙන යාම හා අරමුදල පාලනය කිරීම, බලය පැවරී ඇති කාර්යයන් සඳහා අරමුදල යෙදවීම, ආයතනයේ ගිණුම් නිසි ලෙස පවත්වගෙන යාම, වාර්ෂික අයවැය, පරිපූරක අයවැය සකස් කිරීම, සම්මත කිරීම හා ක්‍රියාත්මක කිරීම ද ඊට නීතියෙන් පවරා ඇත.

ඊට අමතරව සෑම පළාත් පාලන ආයතනයකටම සිය කාර්යභාරය හා වගකීම් පහසුකරලීම සඳහා අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ගැනීම සඳහා බලය පවරා තිබීම ද මෙම ආයතන වෙත පැවරී ඇති ඉතා වැදගත් බලතල අතර වේ.

1.1 පසුබිම :

පසුගිය දශක තුනක පමණ කාලය තුල පළාත් පාලන ආයතනයන්හි අභ්‍යන්තර පාලනයන්හි කැපී පෙනෙන සුළු පසුබෑමක් ක්‍රමානුකූලව වර්ධනය වනු දැකිය හැකිය. මෙම තත්වය පැහැදිලිව දැකිය හැකි දර්ශක ලංකාවේ පළාත් පාලන ආයතන පද්ධතිය වෙත අයවිය යුතු ස්වයං ජනිත ආදායම් අඩුවීම හා සමුච්චිත හිඟ ආදායම් ඉහළ ප්‍රතිශතයක් ගැනීම, පළාත් පාලන ආයතන බල ප්‍රදේශයන්හි නිශ්චල දේපල තක්සේරු කිරීම වසර 10 - 15 වැනි දීර්ඝ කාල පරාසයන් දක්වා ප්‍රමාද වීම, පළාත් පාලන ආයතන සතු නගර කේන්ද්‍රයේ ස්ථානගතව ඇති පොදු වෙළඳපළ කඩ කාමර ප්‍රමාණවත් නොවන නාමමාත්‍ර කුලී මත අතුරු බදු කරුවන් අත පැවතීම, කිසිම විටෙක හිඟ නොසිටිය යුතු බලපත්‍ර ගාස්තු හිඟ විශාල වශයෙන්

ලේඛණගතව තිබීම හා පළාත් පාලන ආයතනයන්හි වරිපනම්, බදු හා ආදායම් පැනවීම් විෂයෙහි අතිශය සාවද්‍ය නිවේදන ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීම ආදිය දැක්විය හැකිය. මෙබඳු වාතාවරණයක් ඇතිවීමට හේතු වූ කරුණු අතිශය සංකීර්ණ ස්වරූපයක් ගනී. 1999 අංක I දරණ සැසි වාර්තාව ලෙස ප්‍රකාශිත පළාත් පාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවෙහි හතරවන හා පස්වන පරිච්ඡේදයන්හි මෙම කරුණු දීර්ඝ ලෙස විස්තර කොට ඇත. ඒ අනුව මීට ප්‍රමුඛ හේතුව වී ඇත්තේ 1987 අංක 42 දරණ පළාත් සභා පනත යටතේ ස්ථාපිත පළාත් රාජ්‍ය සේවාවන්ට පළාත් පාලන ආයතන පාලනයේ නිරතව සිටි පළාත් පාලන සේවා කොමිෂන් සභාව මගින් පාලනය වූ සියළුම වෘත්තීය සේවාවන්හි නිලධාරීන් අන්තර්ග්‍රහණය කිරීමයි.

එමගින් විශේෂිත නිපුණතාවයක් සහිත වෘත්තීන් හි නියැලි නිලධාරීන් පොදුවේ පළාත් රාජ්‍ය සේවාවන්ට අයත්වීමත් පසුව පළාත් පාලන ලිපිකරු සේවය, පළාත් පාලන පොත් තබන්නන්ගේ සේවය, පළාත් පාලන සරප් සේවය හා පළාත් පාලන ගබඩා පාලක සේවය ආදී සේවාවන්හි නිලධාරීන් පොදුවේ කළමනාකරණ සහකාර සේවය වෙත ගොනු කිරීමත් හේතුකොට ගෙන පළාත් පාලන ආයතනවලට අනන්‍ය වූ සුවිශේෂී පාලන ක්‍රමවේද බිඳ වැටීම ආරම්භ විය. එම සේවාවල දිගු කලක් පුහුණුව හා විශේෂඥතාවය ලද නිලධාරීන් සෙසු ක්ෂේත්‍ර වලට එනම් අධ්‍යාපන, සෞඛ්‍ය, කෘෂිකාර්මික හා සමාජ සේවා වැනි ක්ෂේත්‍ර වෙත ස්ථාන මාරු ලැබීමත් යටකී ක්ෂේත්‍රවල නිලධාරීන් උසස් වීම් මත හා ස්ථාන මාරු මත පළාත් පාලන ආයතන වෙත ස්ථානගත කිරීමත් නිසා පළාත් පාලන ගිණුම් තැබීම, ආදායම් කළමනාකරණය අයවැය සම්පාදනය, වියදම් කළමනාකරණය, යන විෂයයන් මුළුමනින්ම වියවුල් කාරී තත්වයකට පත්විය.

දෙවනුව පළාත් පාලන ආයතන පද්ධතිය වෙත එතෙක් මාර්ගෝපදේශ සැපයූ මධ්‍යම පළාත් පාලන දෙපාර්තමේන්තුව අහෝසිවීම නිසා එහි පැවති නිපුණ විශේෂඥ ඥාණය පළාත් බද පළාත් පාලන දෙපාර්තමේන්තු වෙත විසිරී ගොස් ක්‍රමාණුකූලව ක්ෂයවීමත් පළාත්බද පළාත් පාලන දෙපාර්තමේන්තු වෙත වෙනත් ක්ෂේත්‍රවල නිලධාරීන් පත්වීමත් හේතුකොට ගෙන තවදුරටත් පළාත් පාලන දෙපාර්තමේන්තුව පළාත් පාලන ආයතන පද්ධතිය වෙත මිත්‍රශීලි මගපෙන්වන්නෙකු හා දර්ශනය සපයන්නෙකුගේ කාර්යභාරය ඉටුකළ නොහැකි හුදෙක්

අඩුපාඩු සොයන්නෙකුගේ තත්වයට පත්ව ඇත. වර්තමානය වනවිට මෙම තත්ත්වය අතිශය උග්‍ර තත්වයකට පත්ව පළාත් පාලන කොමසාරිස් හා සහකාර කොමසාරිස් කාර්යාල පළාත් පාලනය පිළිබඳ බෙහෙවින් ඌණ දැනුමක් ඇති ස්ථාන බවට පත්ව ඇත.

තෙවනුව පළාත් පාලන ආයතන වෙත උසස් වීම් මගින් හා ස්ථානමාරු මගින් යොමුවන නවක කාර්ය මණ්ඩල වෙත නිසි පුහුණුවක් ලබාදීමට, පූර්වාදර්ශ පිළිබඳ අවබෝධයක් ඇති කිරීමට අවශ්‍ය දැනුම හා හැකියාව එම පළාත් පාලන ආයතන තුල හෝ පළාත් පාලන සහකාර කොමසාරිස් හෝ පළාත් පාලන කොමසාරිස් කාර්යාල වල නිලධාරීන් කිසිවෙකු සතුව නැත. මෙම තත්වය තවදුරටත් බැරෑරුම් වී ඇත්තේ කිසිම පළාත් පාලන ආයතනයක ඒ ඒ විෂයයන් වෙනුවෙන් සම්පාදිත, වැඩ පියවර ඇතුළත් විෂය සමගාමී මාර්ගෝපදේශ නොමැති වීමයි. එබැවින් නවක නිලධාරීන් කිසිදු හරවත් මගපෙන්වීමකින් තොරව කලින් සිටි නිලධාරියා ඉටුකළ කටයුතු තම දැනුම මත ඉදිරියට ගෙන යාමට පෙළඹේ. එවැනි අවස්ථාවල ආයතනයන්හි ඉහළ කළමනාකාරිත්වය ද පළාත් පාලනයට ආධුනිකයන් වන විට පාලනය බෙහෙවින් අවුල්කාරී ස්වරූපයකට පත්වීම නොවැලැක්විය හැකිය. මෙම තත්වය මේ වන විට බොහෝ පළාත් පාලන ආයතන අත්දකිමින් සිටී.

සිව්වනුව ලංකාවේ බොහෝ පළාත් පාලන ආයතන වාර්ෂික බදු හා ආදායම් පැනවීම් කිරීම සඳහා සභා සම්මත යෝජනා ලබාගැනීමෙන් අනතුරුව ව්‍යවස්ථාපිත නිවේදන ගැසට් මගින් ප්‍රකාශ පත්කළ යුතුවීම නීතිමය අවශ්‍යතාවයක් වන හෙයින් නාමිකව ගැසට් නිවේදන පළකරණු ලැබුව ද එම නිවේදන බොහොමයක් සාවද්‍ය වීමයි. මෙහි ඇති බැරෑරුම් කරුණ වන්නේ පළාත් පාලන බලධාරීන් (පළාත් සභා) හෝ බදු ගෙවන සංවිධාන, ව්‍යාපාරික ප්‍රජාව හෝ මහජනතාව මේ වැරදි පරිචයන් පිළිබඳ නොදැන සිටීමයි.

මෙවැනි පසුබිමක් තුල පූර්වෝක්ත තත්වයෙහි අවදානම් සහගත බව පිළිබඳව අවබෝධ කොටගත් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය මෙම කරුණට අදාලව අමාත්‍යාංශය හරහා තිරසාර විසඳුම් ක්‍රියාමාර්ග ගැනීමේ අභිප්‍රායෙන් පර්යේෂණ අධ්‍යයනයක් සිදුකර නිර්දේශ හා යෝජනා ලබාගැනීමට ක්‍රියාකර ඇත. මෙම බෙහෙවින් කාලෝචිත ක්‍රියාමාර්ගයෙහි ප්‍රතිඵලයක් ලෙස මේ පර්යේෂණ අධ්‍යයනය සිදුකෙරේ.

1.2 අධ්‍යයනයේ විෂය පථය :

මෙම පර්යේෂණ අධ්‍යයනය සඳහා පහත සඳහන් විෂය ක්ෂේත්‍ර අන්තර්ගත වනු ඇත.

I. ලංකාවේ මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා නියෝජනය වන පරිදි තෝරාගත් නියැදියක් ආශ්‍රයෙන් එම ආයතන විසින් බදු හා වරිපනම් පැනවීම, ගැසට් නිවේදන පළ කිරීම, තක්සේරු දැන්වීම් යැවීම, විරෝධතා කළමනාකරණය, බදු හා වරිපනම් අයකිරීම, ගිණුම් ගත කිරීම, ගෙවීම් පැහැර හැරීම සම්බන්ධ ක්‍රියාකාරකම් ආදී සෑම පියවරක්ම ගැඹුරින් අධ්‍යයනය කිරීම.

II. නියැදියට අදාල පළාත් පාලන ආයතනයන්හි විෂයට අදාල නිලධාරීන් සමඟ සම්මුඛ සාකච්ඡා මඟින් තොරතුරු හා අදහස් ලබාගැනීම.

III. නියැදිය තුලවූ සියළුම පළාත් පාලන ආයතනවල පසුගිය වර්ෂයේ බදු හා වරිපනම් පනවන ලද සහා යෝජනා හෝ තීරණ රැගත් ගැසට් නිවේදන සියල්ල අධ්‍යයනය කිරීම.

IV. යටකී පළාත් පාලන ආයතනවල බදු හා වරිපනම් ආදායම් එකතු කිරීමේ ප්‍රගතිය හා පරීක්ෂා කිරීම.

V. ප්‍රස්තුතයට අදාලව පවතින නෛතික හා පරිපාටිමය ඌණතා හඳුනාගැනීම.

VI. හඳුනාගත් දෝෂ සහ ඌණතා නිවැරදි කිරීමට අවශ්‍ය තිරසාර නිර්දේශ ඉදිරිපත් කිරීම.

1.3 පර්යේෂණ ක්‍රමවේදය :

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන විසින් බදු හා වරිපනම් පැනවීමේ හා අයකිරීමේ ක්‍රමවේදය පිළිබඳව වූ මෙම පර්යේෂණ අධ්‍යයනයේදී සම්මත පර්යේෂණ ක්‍රමවේදයන් අනුගමනය කරන ලදි. ඒ අනුව ප්‍රධාන වශයෙන් පහත සඳහන් මෙවලම් උපයෝගීකොට ගනු ලැබීය.

අ. විෂයානුබද්ධ අධ්‍යයන, ප්‍රකාශන හා මූලාශ්‍ර විමර්ශනය.

ආ. ව්‍යුහගත ප්‍රශ්නාවලීන්

ඇ. ප්‍රධාන තොරතුරු ධාරීන් සමඟ සම්මුඛ සාකච්ඡා

ඉ. ඉලක්කගත කණ්ඩායම් සමඟ (ව්‍යාපාරික, බදුගෙවන්නන්ගේ සංගම්) සාකච්ඡා මගින් තොරතුරු ලබාගැනීම.

ඊ. ක්ෂේත්‍ර පරීක්ෂාව හා සෘජු නිරීක්ෂණ

අ. මූලාශ්‍ර අධ්‍යයනය:

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ක්ෂේත්‍රයේ බදු, වරිපනම් හා සෙසු ආදායම් පැනවීමට හා අයකිරීමට අදාලව කරන ලද හෝ ප්‍රසිද්ධ කරන ලද පර්යේෂණ වාර්තාවක් සොයාගත නොහැකි විය. එතෙකුදු වුවත් පසුගිය දශක දෙකක පමණ කාලය තුල පළාත් පාලනය විෂයෙහි විදේශ ආධාර ව්‍යාපෘති මගින් සකස් කරන ලද සමහර වාර්තාවන්හි එම ආයතනවල මූල්‍ය කළමනාකරණය සහ ආදායම් එක්රැස් කිරීම පිළිබඳ සිදුකර ඇති අධ්‍යයන වාර්තා පරීක්ෂා කරන ලදි. ඒ අතුරින් 2009 - 2012 කාලය තුළ ඇමරිකානු ආධාර වැඩ පිළිවෙල යටතේ ක්‍රියාවට නංවන ලද "Supporting Regional Governance Project" (SURG) ව්‍යාපෘතිය ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වූ උතුරු නැගෙනහිර පළාත් පාලන සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (NELSIP) කැනේඩියානු මහා නගර සම්මේලනය (FCM) විසින් ක්‍රියාත්මක කරන ලද කැනඩා ශ්‍රී ලංකා මහා නගර සභා සහයෝගිතා වැඩසටහන (MCP) ආසියානු පදනම විසින් ක්‍රියාත්මක කරන ලද පාරදෘෂ්‍ය වගවීමේ පළාත් පාලන ව්‍යාපෘතිය (TALG) ජර්මන් ආධාර වැඩ පිළිවෙළ යටතේ උතුරු නැගෙනහිර ක්‍රියාත්මක කරන ලද කාර්යසාධනය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PIP - GTZ) යනාදී ව්‍යාපෘතීන් හි වාර්තා සියල්ල සැලකිල්ලට භාජනය කරන ලදි.

තවද 2008 දී පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලය විසින් පළකරන ලද "Financing Local Government" සහ එම ආයතනය විසින් 2010 දී පළකරන ලද "Municipal Infastructure Financing" යන කෘති මෙම විෂය පිළිබඳ අතිශය වැදගත් තොරතුරු රැසක මූලාශ්‍ර ලෙසින් පරිහරණය කරන ලදි. එසේම මෙතෙක් ලංකාවේ සිදුකර ඇති පළාත් පාලන අධ්‍යයන අතුරින් අතිශය වැදගත් අධ්‍යයනයක් වූ චොක්සි කොමිෂන් වාර්තාව මෙහිලා පෘථුල ලෙස විමසුමකට භාජනය කරන ලදි. (1955.12.27 සැසි වාර්තා අංක XXXIII – 1955) එහි V වන කොටසෙහි XVIII සිට XXII දක්වා වූ පරිච්ඡේද මේ විෂය පිළිබඳ පුළුල් අවබෝධයක්

ලබාගැනීම විෂයෙහි ඉතා වැදගත් ය. ඊට අමතරව 1999 සැසි වාර්තා අංක I ලෙසින් පළකරන ලද පළාත් පාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවන්හි පස්වන පරිච්ඡේදය වූ ආදායම් හා මූල්‍ය කළමනාකරණය මේ පිළිබඳ ප්‍රමාණාත්මක විග්‍රහයන් සිදුකොට ඇත.

විෂයානුබද්ධ සාහිත්‍ය අධ්‍යයනය යටතේ නියැදිගත සියළුම පළාත් පාලන ආයතන විසින් ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි 2015 හා 2016 වසර වලට අදාළව පළකරන ලද සෑම ව්‍යවස්ථාපිත නිවේදනයක්ම තියුණු පරීක්ෂාවට භාජනය කරන ලදි. මෙම ගැසට් නිවේදන මෙන්ම අදාළ සභා තීරණ අධ්‍යයනය කිරීම අතිශය දුෂ්කර හා කල්ගතවන කාර්යයක් වූයේ පළාත් පාලන ආයතන වෙතින් එම තොරතුරු හා ලියකියවිලි ලබාගැනීම බෙහෙවින් දුෂ්කර කාර්යයක් වූ හෙයිනි.

ඊට අමතරව නියැදිගත පළාත් පාලන ආයතන සියල්ලෙහිම 2015 හා 2016 අයවැය වාර්තා පරීක්ෂාවට භාජනය කරන ලද අතර ව්‍යුහගත ප්‍රශ්නාවලීන් මගින් ලබාගත් තොරතුරු සංසන්දනාත්මකව පරීක්ෂාවට භාජනය කිරීම සඳහා මෙම කාර්යය අත්‍යවශ්‍ය විය.

ආ. ව්‍යුහගත ප්‍රශ්නාවලීන්

පූර්වෝක්ත පර්යේෂණ අධ්‍යයනය සඳහා තොරතුරු හා දත්ත ලබාගැනීම පිණිස ව්‍යුහගත ප්‍රශ්ණාවලීන් කිහිපයක් සම්පාදනය කරන ලදි. වරිපනම්, බදු, ගාස්තු හා කුලී පැනවීමට හා නියම කිරීමට අදාල පළාත් පාලන ආයතනවල කොමසාරිස් / ලේකම් / ගණකාධිකාරී ආදී ඉහළ කළමනාකාරීත්වයෙන් ද, ආදායම් පරීක්ෂක, කළමනාකරණ සහකාර සහ විෂයභාර නිලධාරී ආදී සෘජුව මීට සම්බන්ධ නිලධාරීන්ගෙන් තොරතුරු ලබාගැනීම සඳහා ද ව්‍යුහගත ප්‍රශ්ණාවලීන් යොමුකරන ලදි. ඊට අමතරව ව්‍යාපාරික සංවිධාන, බදුගෙවන්නන්ගේ සංගම් ආදියෙන් තොරතුරු ලබාගැනීම පිණිස ද, ප්‍රශ්නාවලී භාවිතා කරන ලදි. මෙම කාර්යය ඉටුකර ගැනීම විෂයෙහි ද පර්යේෂණ කණ්ඩායමට වැඩි වෙහෙසක් දැරීමට සිදුවූයේ සාපේක්ෂ වශයෙන් පළාත් පාලන ආයතනවල නිලධාරීන් මෙන්ම ව්‍යාපාරික ප්‍රජාවද තොරතුරු හෙළිකිරීම සඳහා පසුබෑමකින් හෝ යථෝක්ත තොරතුරු හෙළි කිරීමෙන් තම වෘත්තියට, රැකියාවට යම් ප්‍රශ්ණයක් හෝ අවදානමක් ඇති වේය යන අනියත සැක සහිත ස්වභාවයකින් යුක්තව සිටීමයි. මීට හේතු කාරක වන්නට ඇත්තේ මෙබඳු පර්යේෂණයක් සඳහා දත්ත සමීක්ෂණයක් මෙම ක්ෂේත්‍රයේ මෑත ඉතිහාසය තුල සිදුවී නොතිබීම විය හැකිය. කෙසේ

වෙතත් ඉතා මිත්‍රශීලීව කරුණු පැහැදිලි කිරීමේදී එම ගැටළුව බොහෝදුරට මඟහරවා ගැනීමට හැකිවිය. මෙහිදී නිරීක්ෂණය වූ තවත් කරුණක් නම් ව්‍යාපාරික සංවිධාන පවා සිය පළාත් පාලන ආයතනය සම්බන්ධ විවේචනාත්මක ස්වරයෙන් කරුණු දැක්වීමට මැලි බවක් පෙන්නුම් කිරීමයි. එමගින් මතුවට ඔවුනට අවාසිදායක ප්‍රතිපලවලට මුහුණදීමට සිදුවේය යන බිය ඔවුන් තුල පැවති බව පෙනීගිය අවස්ථා ද තිබුණි. කෙසේ වෙතත් ව්‍යුහගත ප්‍රශ්නාවලීන් ආශ්‍රිතව තොරතුරු ලබාගැනීම් ක්‍රියාවලිය ගැන කරුණු පැහැදිලි කරමින් ඉටුකර ගැනීම හා අදාළ තොරතුරු මූලාශ්‍ර සමඟ ප්‍රශ්න කිරීම සිදුකිරීම නිසා එකී තොරතුරු වල නිරවද්‍යතාව ඉහළ ප්‍රතිශතයක පැවති බව සඳහන් කළ හැකිය.

ඇ. ප්‍රධාන තොරතුරුධාරීන් සමඟ සම්මුඛ සාකච්ඡා

මෙම විෂයෙහිලා ප්‍රධාන තොරතුරුධාරීන් වන්නේ පළාත් පාලන ආයතන පාලනය භාරව මේ වන විට කටයුතු කරන නාගරික කොමසාරිස්වරුන් හා නගර සභා සහ ප්‍රාදේශීය සභා ලේකම්වරුන්ය. නියැදිගත සෑම පළාත් පාලන ආයතනයකම පූර්වොක්ත නිලධාරීන් සමඟ සම්මුඛ සාකච්ඡා මගින් තොරතුරු ලබාගන්නා ලදි. මීට අතිරේකව අවස්ථානුකූලව පළාත් පාලන කොමසාරිස්, සහකාර පළාත් පාලන කොමසාරිස් හා විමර්ශන නිලධාරීන් සමඟ සාකච්ඡා කර තොරතුරු ලබාගන්නා ලදි. මෙම සාකච්ඡා තුලින් අනාවරණය වූ පොදු කරුණක් වූයේ පළාත් පාලන ආයතන සාමාන්‍යයෙන් බදු හා ආදායම් පැනවීම් පිළිබඳව හෝ විශේෂයෙන් ව්‍යවස්ථාපිත නිවේදන පළකිරීමේදී පළාත් පාලන සහකාර කොමසාරිස් හෝ පළාත් පාලන කොමසාරිස් වෙතින් උපදෙස් හෝ මගපෙන්වීම් ඉල්ලා නොසිටින බවයි.

එමෙන්ම තවදුරටත් මේ තුළින් දැකිය හැකි වූයේ පළාත් පාලන ආයතනවල බදු හා ආදායම් පැනවීම් පිළිවෙත් පිළිබඳව පළාත් පාලන දෙපාර්තමේන්තුවල සිටින නවක නිලධාරීන් පැහැදිලි අවබෝධයකින් යුතුව නොසිටින බවයි.

ඉ. ඉලක්කගත කණ්ඩායම් සමඟ සම්මුඛ සාකච්ඡා

මේ යටතේ නියැදිගත පළාත් පාලන ආයතන බල ප්‍රදේශයන්හි ක්‍රියාකාරී ව්‍යාපාරික සංගම් හා බදුගෙවනන්ගේ සංගම් හි නිලධාරීන් සමඟ ව්‍යුහගත ප්‍රශ්ණාවලීන් ආශ්‍රිතව තොරතුරු ලබාගන්නා ලදි. මෙබඳු බොහෝ සංවිධාන සිය වෘත්තියට අදාල බදු, ගාස්තු හා කුලී පැනවීම හා නියම කිරීමේ බලය සහිත අධිකාරිය සිය පළාත් පාලන ආයතනය වුව ද එම ආයතනයේ

ක්‍රියා පිළිවෙත් නිරවද්‍ය ද යන්න පිළිබඳ සංවේදී නැත. පළාත් පාලන ආයතනවල සාවද්‍ය පරිචයන් ප්‍රශ්ණ කරන හෝ ඊට අභියෝග කරන ආස්ථානයක ඔවුන් නොසිටීම අසාමාන්‍ය තත්වයක් බව නිරීක්ෂණය විය.

මීට අමතරව පළාත් පාලන ආයතනයන්හි හෝ එම ක්ෂේත්‍රයේ දීර්ඝ කාලීනව කටයුතු කළ ප්‍රභූ පුද්ගලයින්ගෙන් ද අදහස් ලබාගැනීමට ක්‍රියාකළ අතර එවැනි කරුණු විමසීම් වලදී අනාවරණය වූයේ වර්තමාන පළාත් පාලන ආයතන බොහොමයක ක්‍රියාකාරකම් මහජනයාගේ දැනුවත් බවින් තොර බවත් නීතියේ විධිවිධාන ඉක්මවා ක්‍රියාකිරීම් දැකිය හැකි බවත් ය. අඛණ්ඩ පුහුණු වැඩ පිළිවෙලක් මෙම ආයතන තුල නොමැතිවීම මීට බලපා ඇතිබව ඔවුන්ගේ මතය විය.

ඊ. ක්ෂේත්‍ර පරීක්ෂාව හා සෘජු නිරීක්ෂණ

පූර්වෝක්ත පර්යේෂණ අධ්‍යයනයට අදාල නියැදිය පළාත් පාලන ආයතන 48 කි. එය දිවයිනේ සියළුම පළාත් හා දිස්ත්‍රික්ක නියෝජනය වන පරිදි සමස්ථ ආයතන සංඛ්‍යාව වූ ආයතන 337 න් 14% ක ප්‍රතිශතයකි. පළාත් හා දිස්ත්‍රික්ක අතර නියැදිගත පළාත් පාලන ආයතන සමූහය සංවිධානය වී ඇති අන්දම අංක 01 සටහනින් දැක්වේ.

මෙම අධ්‍යයනය සඳහා නියැදිය වශයෙන් මහා නගර සභා 12 ක් ද. නගර සභා 15 ක් හා ප්‍රාදේශීය සභා 21 ක් වශයෙන් පළාත් පාලන ආයතන 48 ක් නියැදිය වශයෙන් තෝරා ගැනිමට පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) සමග කරන ලද මූලික සාකච්ඡාවේදී එකඟවිය. එසේම එහි භෞතික ව්‍යාප්තිය අංක 1 සිතියමෙන් දක්වා ඇත.

සටහන් අංක 01

දත්ත සමීක්ෂණය සඳහා නියැදිය

පළාත	දිස්ත්‍රික්කය	මහා නගර සභාව	නගර සභාව	ප්‍රාදේශීය සභාව
මධ්‍යම පළාත	මහනුවර	මහනුවර	ගම්පොල	යටිනුවර
	මාතලේ	දඹුල්ල	-	-
	නුවරඑළිය	-	තළවාකැලේ ලිඳුල	අඹගමුව
නැගෙනහිර පළාත	ත්‍රිකුණාමලය	-	ත්‍රිකුණාමලය	සේරුවිල
	මඩකලපුව	මඩකලපුව	කාන්තන්කුඩි	-
	අම්පාර	-	-	තිරුක්කෝවිල්
උතුරු මැද පළාත	අනුරාධපුරය	අනුරාධපුරය	-	මධ්‍යම නුවරගම් පළාත
	පොළොන්නරුව	-	-	තමන්කඩුව
උතුරු පළාත	යාපනය	යාපනය	පේදුරුතුඩුව	-
	වව්නියාව	-	වව්නියාව	-
	මන්නාරම	-	-	නානාටාන්
	කිලිනොච්චි	-	-	මුහුදුබඩ පත්තු
	මුලතිව්	-	-	කරච්චි
වයඹ පළාත	කුරුණෑගල	කුරුණෑගල	කුලියාපිටිය	අලව්ව

	පුත්තලම	-	පුත්තලම	හලාවත
සබරගමුව පළාත	රත්නපුර	රත්නපුර	ඇඹිලිපිය	ඇහැළියගොඩ
	කෑගල්ල	-	-	ගලිගමුව
දකුණු පළාත	ගාල්ල	-	හික්කඩුව	බෙන්තොට
	මාතර	-	-	දික්වැල්ල
	හම්බන්තොට	හම්බන්තොට	-	-
බස්නාහිර පළාත	කොළඹ	කොළඹ, දෙහිවල ගල්කිස්ස	සීතාවකපුර	කොටිකාවත්ත, මුල්ලේරියාව
	ගම්පහ	ගම්පහ	ජා ඇල, පෑලියගොඩ	බියගම
	කළුතර		හොරණ	දොඩන්ගොඩ
ඌව පළාත	බදුල්ල	බදුල්ල	හපුතලේ	පස්සර
	මොණරාගල	-	-	මොණරාගල

පර්යේෂණ කණ්ඩායම ඉහත විස්තර කරන ලද ක්‍රමවේදය ප්‍රකාර නියැදිගත සියළු පළාත් පාලන ආයතන භෞතිකවම සිය ක්ෂේත්‍ර පරීක්ෂාවේදී සෘජු නිරීක්ෂණ ලබා ගැනීමටත් දත්ත වල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමටත් තියුණු විමර්ශනයට ලක්කරන ලදි. මෙම ක්ෂේත්‍ර චාරිකාවන්හිදී සිංහල භාෂාව භාවිතා කරන ආයතන 36 ක් ද, දෙමළ භාෂාව භාවිතා කරන ආයතන 11 ක් ද, ආවරණය කරන ලදි. පර්යේෂණ කණ්ඩායමේ ද්විභාෂා සංයුතිය හේතුකොට ගෙන සහ ප්‍රශ්ණාවලීන් ද්විභාෂාවන්ගෙන් සකස් කිරීම නිසා කිසිදු ආයාසයකින් හෝ විශේෂ ගැටළුවකින් තොරව තොරතුරු හා දත්ත ලබාගැනීමට හැකිවීම නියැදිගත සෑම පළාත් පාලන ආයතනයකටම සමාන අවධානයක් යොමු කිරීමට ඉවහල් විය.

සිතියම් අංක 01


උතුරු පළාත
• යාපනය මහ නගර සභාව
• පේදුරු තුඩුව නගර සභාව
• වවුනියා නගර සභාව
• නාතාටාන් ප්‍රාදේශීය සභාව
• කරච්චි ප්‍රාදේශීය සභාව
• මුහුදුබඩු පත්තු ප්‍රාදේශීය සභාව
උතුරු මැද පළාත
• අනුරාධපුර මහ නගර සභාව
• තලාව ප්‍රාදේශීය සභාව
• මධ්‍යම නුවර ගම් පළාත ප්‍රාදේශීය සභාව
වයඹ පළාත
• කුරුණෑගල මහ නගර සභාව
• කුලියාපිටිය නගර සභාව
• පුත්තලම නගර සභාව
• හලාවත ප්‍රාදේශීය සභාව
• අලවිව ප්‍රාදේශීය සභාව
නැගෙනහිර පළාත
• මඩකලපුව මහ නගර සභාව
• ත්‍රිකුණාමලය නගර සභාව
• කාත්තන් කුඩි නගර සභාව
• පිටිස්කෝවිල් ප්‍රාදේශීය සභාව
• සේරුවාවිල ප්‍රාදේශීය සභාව
මධ්‍යම පළාත
• දඹුල්ල මහ නගර සභාව
• ගම්පොල නගර සභාව
• යටි නුවර ප්‍රාදේශීය සභාව
• තලව කැලේ ලිඳුල නගර සභාව
• අඹගමුව ප්‍රාදේශීය සභාව
ඌව පළාත
• බදුල්ල මහ නගර සභාව
• හපුතලේ නගර සභාව
• පස්සර ප්‍රාදේශීය සභා
• මොනරාගල ප්‍රාදේශීය සභාව
සබරගමුව පළාත
• රත්නපුර මහ නගර සභාව
• ඇඹිලිපිටිය නගර සභාව
• ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව
• ගලිගමුව ප්‍රාදේශීය සභාව
බස්නාහිර පළාත
• කොළඹ මහ නගර සභාව
• දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව
• පිළියන්දල නගර සභාව
• කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව
• පැලියගොඩ නගර සභාව
• ජා ඇල නගර සභාව
• ගම්පහ මහ නගර සභාව
• බියගම ප්‍රාදේශ සභාව
• හොරණ නගර සභාව
• දොඩම්ගොඩ ප්‍රාදේශීය සභාව
දකුණු පළාත
• හම්බන්තොට මහ නගර සභාව
• දික්වැල්ල ප්‍රාදේශීය සභාව
• හික්කඩුව නගර සභාව
• බෙන්තොට ප්‍රාදේශීය සභාව

සටහන් අංක 02

ක්‍රමවේදයේ ගැලීම් සටහන



1.4 අධ්‍යයනයේ අරමුණු:

පොදු අරමුණු :

වර්තමානයේ මෙරට පළාත් පාලන ආයතන විසින් වරිපනම් හා විවිධ බදු පනවා අයකිරීමේ ක්‍රමවේදය ගැඹුරින් අධ්‍යයනය කර එහිලා දැනට භාවිතා කරන ක්‍රියා පරිපාටිය විශ්ලේෂණය කර එහි නීතියට පරිබාහිර පරිචයන් පවතීනම් ඒවා සහ ඊට ආනුෂාංගික දෝෂ සහ ඌණතා හඳුනාගැනීමත් එකී සාවද්‍ය පරිචයන් හා දෝෂ යථාවත් කිරීම පිණිස ගත යුතු පියවර නිරීක්ෂණ හා නිර්දේශ ලෙස ඉදිරිපත් කිරීමත් ය.

1.5 විශේෂිත අරමුණු:

1. දිවයිනේ පළාත් පාලන ආයතන පද්ධතිය විසින් වරිපනම් පැනවීම, එකතු කිරීම හා ගිණුම් නිසි පරිදි සිදුකරන්නේ ද යන්න පරීක්ෂා කිරීම.
2. මෙරට පළාත් පාලන ආයතන විසින් අයකරනු ලබන ව්‍යාපාර බදු, කර්මාන්ත බදු, වාහන සහ සත්ත්ව බදු, විනෝද බදු, සංවර්ධනය නොකළ ඉඩම් මත බදු සහ විවිධ බලපත්‍ර ගාස්තු පැනවීම, එකතු කිරීම යථා පරිදි සිදුකරන්නේ ද යන්න පිළිබඳව විමර්ශනය කිරීම
3. පළාත් පාලන ආයතන විසින් වර්තමානයේ අයකරනු ලබන විවිධ ගාස්තු නීතියෙහි දක්වා ඇති ප්‍රතිපාදන මත පැනවීම හා එක්රැස් කිරීම සිදුවන්නේ ද යන්න විමර්ශනය කිරීම.
4. යටකී සොයා බැලීම් වලදී හෙළිවන තොරතුරු ලේඛනගත කර සෑම පළාත් පාලන ආයතනයකටම විශේෂිත ගැටළු, දෝෂ හා ඌණතා හඳුනාගැනීම හා විශ්ලේෂණය කිරීම.
5. පළාත් පාලන ආයතන විසින් වරිපනම්, බලපත්‍ර ගාස්තු, හා බදු අයකිරීම් පිළිවෙත් මත අයකර ගන්නේ ද යන්න පරීක්ෂා කිරීම.
6. මෙම පර්යේෂණ අධ්‍යයනයේදී අනාවරණය වූ දෝෂ හා ඌණතා පිටු දැකීම සඳහා අනුගමනය කළයුතු නිර්දේශ ඉදිරිපත් කිරීම.

1.6 අපේක්ෂිත ප්‍රතිඵල:

විශේෂිත අරමුණු පදනම් කොටගෙන;

අ. දිවයිනේ පළාත් පාලන ආයතන පද්ධතිය විසින් වරිපනම්, බදු, බලපත්‍ර ගාස්තු, ගාස්තු හා කුලී පැනවීම,හා අයකිරීම පිළිබඳ පවතින තත්වය වාර්තා කිරීම.

ආ. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන පද්ධතිය විසින් වරිපනම්, බලපත්‍ර ගාස්තු බදු, ගාස්තු, පැනවීමේ දී අනුගමනය කළ යුතු විධිමත් කාර්ය පරිපාටිය සැකෙවින් ඉදිරිපත් කිරීම.

ඇ. ඉහත අ හා ආ අතර පවතින වෙනස්කම්, නීතියට එකඟ නොවන පරිචයන් හා නීතිය ඉක්මවා යන තත්වයන් වාර්තා කිරීම.

ඈ. යථොක්ත දෝෂ, ඌණතා හෝ අවභාවිතයෙන් නිවැරදි කිරීම සඳහා අනුගමනය කළයුතු වූ නිර්දේශ ඉදිරිපත් කිරීම.

02 පරිච්ඡේදය

2. පර්යේෂණ අධ්‍යයනයේ ප්‍රවේශය

මෙම අධ්‍යයනයේදී උපදේශාත්මක, සහභාගිත්ව, නම්‍යශීලී හා අදාල කරගත හැකි ප්‍රවේශයක් අනුගමනය කරන ලදි. අපේක්ෂිත ප්‍රතිඵල අරමුණු කරගත් නම්‍යශීලී හා උචිත පරිදි සකසාගත හැකිවූ ප්‍රවේශයක් හා අධ්‍යයන ක්‍රමවේදයට අනුකූල වන්නාවූ දැක්මක් සහිතව සම්පූර්ණ අධ්‍යයනය සංවිධානය කරන ලදි. සියළු පාර්ශවකරුවන් සමඟ සමීප උපදේශනය සහ සම්බන්ධීකරණය සමස්ථ පර්යේෂණ කාල සීමාව තුල පවත්නා ගෙනයන ලදි.

2.1 දත්ත රැස්කිරීම හා සැලසුම් කිරීම:

පූර්වෝක්ත අධ්‍යයනය පදනම් වී ඇත්තේ පළාත් පාලන ආයතන විසින් වරිපනම් හා බදු පැනවීම හා එම ආදායම් එකතු කිරීමේ දී අනුගමනය කරන ලද නීතිමය විධිවිධාන හා පරිපාටිමය කරුණු මත වන හෙයින් මූලික වශයෙන් අදාල දත්ත රැස්කිරීමේදී පහත සඳහන් ක්ෂේත්‍ර ඔස්සේ අදාල දත්ත ලබාගැනීමට තීරණය කරන ලදි.

1. අදාල විෂයයන් භාරව සිටින නිලධාරීන් එම විෂය පිළිබඳ ලබා ඇති පළපුරුද්ද පරිචය හා පුහුණුව පිළිබඳ තොරතුරු.
2. වරිපනම්, බදු, බලපත්‍ර ගාස්තු, ගාස්තු, ආදිය පැනවීම පිණිස සභා යෝජනා සම්මුතීන්ගේ තීරණ ලබාගත් ආකාරය.
3. යථෝක්ත තීරණ වල නීත්‍යානුකූලභාවය සනාථ කරගැනීම.
4. ඉහත අංක 02 ට අදාල ගැසට් නිවේදන පිළිබඳ තොරතුරු හා දත්ත ලබාගැනීම.
5. ඒ ඒ ආයතනය පනවා ගැසට් මගින් ප්‍රකාශයට පත්කර ඇති බදු හා ආදායම් වර්ග කොපමණ ද යන්න, සොයා බැලීම.
6. එම මූලයන්ගෙන් අදාල වර්ෂය සඳහා ලද ආදායම, හිඟ හා හිඟ අයකිරීමට ගත් ක්‍රියාමාර්ග.
7. බලපත්‍ර ගාස්තු පැනවීම නෛතික වලංගුභාවය පරීක්ෂා කිරීම, වැලඳගත් අතුරු ව්‍යවස්ථා තිබේද යන්න සොයා බැලීම.
8. බදු විරෝධතා පිළිබඳ පැමිණිලි, පරීක්ෂණ ආදිය පිළිබඳ දත්ත.

ප්‍රස්තුත පළාත් පාලන ආයතන කාර්ය මණ්ඩලය උක්ත තොරතුරු හා දත්ත ලබාගැනීම සඳහා ව්‍යුහගත ප්‍රශ්ණාවලීන්, ප්‍රධාන තොරතුරුධාරීන් සමඟ සම්මුඛ සාකච්ඡා, කළමනාකරණ සහකාර, ආදායම් පරීක්ෂක, පරිපාලන නිලධාරීන් සමඟ කණ්ඩායම් සාකච්ඡා ආදී මිශ්‍ර මෙවලම් හා ක්‍රමවේදයන් භාවිතා කිරීමට සැලසුම් කරන ලදි.

2.2 අදාල නීති, අතුරු ව්‍යවස්ථා, නව නීති වාර්තා අධ්‍යයනය හා තොරතුරු ලබාගැනීම:

පළාත් පාලන ආයතනයන්හි ප්‍රධාන ආදායම් මාර්ග වන වරිපනම්, බදු හා බලපත්‍ර ගාස්තු සම්බන්ධ නීතිමය විධිවිධාන සවිස්තරව පාලන ව්‍යවස්ථා වන, මහා නගර සභා ආඥා පනත (252 වන අධිකාරය) නගර සභා ආඥා පනත (255 වන අධිකාරය) හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යන අණපනත්හි ඇතුලත් වේ. වරිපනම් පැනවීමට අදාල තක්සේරුකරණය පිළිබඳ විධිවිධාන ප්‍රධාන වශයෙන් 1946 අංක 30 දරන වරිපනම් හා තක්සේරුකරණ ආඥා පනතෙහි (266 වන අධිකාරය) ඇතුළත් වේ.

ඊට අමතරව 1889 අංක 15 දරන වෙන්දේසිකරුවන් හා තැරැව්කරුවන් පිළිබඳ ආඥා පනත (109 වන අධිකාරය) 1893 අංක 19 දරන ගෝඝාතක ආඥා පනත (27 වන අධිකාරය),1899 අංක 09 දරණ සුසාන භූමි හා මිනී පිටි ආඥා පනත (231 වන අධිකාරය), 1907 අංක 1 දරණ නොතාරිස් ආඥා පනත (107 වන අධිකාරය), 1912 අංක 7 දරන ප්‍රසිද්ධ රැඟුම් ආඥා පනත (176 වන අධිකාරය), 1935 අංක 47 දරන වීථි සම්මාදම් විධිමත් කිරීමේ ආඥා පනත (478 වන අධිකාරය), 1946 අංක 12 දරන විනෝද බදු ආඥා පනත (267 වන අධිකාරය), 1975 අංක 17 දරන සමාජශාලා සඳහා බලපත්‍ර ලබාදීමේ නීතිය හා 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත යන අන පනත් හි පළාත් පාලන ආයතනයන්හි බදු, බලපත්‍ර ගාස්තු, ආදියට අදාල නෛතික විධි විධාන රාශියක් අන්තර්ගත වේ.

තවද ගත වූ සියවසක පමණ කාලය තුල පළාත් පාලන ආයතනයන්හි පරිපාලනය තුළ බදු ගෙවන්නන්ට, සේවාලාභීන්ට හෝ පාර්ශවකරුවන්ට ඇතිවූ විවිධ අසාධාරණයන් සම්බන්ධව ගන්නා ලද අධිකරණ ක්‍රියාමාර්ග / නීති කෘත්‍යයන්හි ප්‍රථිපල ලෙස දෙන ලද නඩු තීන්දු, නව නීති වාර්තා හා ශ්‍රී ලංකා නීති වාර්තා ලෙස අධිකරණය මගින් ප්‍රසිද්ධියට පත්කර ඇත. මෙම අධිකරණ තීන්දු නීති ලෙස අධිකරණයේ භාවිතා වේ. එබැවින් පළාත් පාලන ආයතනයන්හි

කාර්ය මණ්ඩල මෙම නව නීති වාර්තා / ශ්‍රී ලංකා නීති වාර්තා පිළිබඳව මනා දැනුම්වත් භාවයකින් කටයුතු කළ යුතුවේ. වරිපනම්, බදු හා ගාස්තු පැනවීමට හා අයකිරීමට අදාලව නිකුත් කරන ලද එබඳු නව නීති / ශ්‍රී ලංකා නීති වාර්තා රාශියක් ඇත. මෙම අධ්‍යයනයේදී එබඳු වාර්තා ගණනාවක් කෙරෙහි අවධානය යොමු කරන ලද අතර ඒ පිළිබඳ වැඩි විස්තර සඳහා උපලේඛන අංක 1 බලන්න.

මෙම අධ්‍යයනයේදී පෙනීගිය ඉතා අයහපත් කරුණක් වූයේ වර්තමාන පළාත් පාලන ආයතන ප්‍රධාන නිලධාරීන් තබා පළාත් පාලන විමර්ශන නිලධාරීන් හා සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන් පවා මේ සම්බන්ධව දැනුවත් භාවයකින් වියුක්තව සිටින බවයි.

ඉහත සඳහන් කළ නීති සාහිත්‍යය පිළිබඳව පෘථුල අවබෝධයකින් තොරව පළාත් පාලන ආයතනයන්හි වරිපනම්, බදු, බලපත්‍ර ගාස්තු හා ගාස්තු පැනවීමත් කුලී නියම කිරීමත් නිවැරදිව කළහැකි නොවේ. මේ සම්බන්ධව ඒ ඒ ආයතනයන්හි පවතින වාස්තවික තත්වය ඉදිරි පරිච්ඡේද වලදී නිදසුන් සහිතව විග්‍රහ කරනු ඇත.

2.3 පළාත් සභා සහ පළාත් පාලන ආයතන සතු තොරතුරු, වාර්තා අධ්‍යයනය:

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වීමත් සමග පළාත් සභා බිහිවීමෙන් පසු පළාත් පාලනය නමින් පැවති පාලන ස්ථරය පළාත් සභාව සතු තවත් එක් විෂයයක් බවට පත්වුනි. ඉන් පෙර පළාත් පාලන දෙපාර්තමේන්තුව පැවති අවධියේ පළාත් පාලන කොමසාරිස්වරයාගේ වාර්ෂික පාලත වාර්තාව අඛණ්ඩව වාර්ෂිකව ප්‍රසිද්ධ කරන ලදි. මෙම වාර්තාව මගින් ලංකාවේ සෑම පළාත් පාලන ආයතනයකම විස්තර, විශේෂයෙන් ආදායම්, වියදම්, රජයේ ආධාර, හිඟ ආදායම් ආදී තොරතුරු හා දත්ත සෑම පළාත් පාලන ආයතන වර්ගයක් සඳහාම වෙන් වෙන්ව පළකරන ලදි. එකල පළාත් පාලන ආයතන පද්ධතිය පිළිබඳ අධ්‍යයනය සඳහා අද ඇති පරිපූර්ණ මූලාශ්‍ර ලෙස එම ප්‍රකාශන අතිශය වැදගත් වේ.

එහෙත් පළාත් පාලනය පළාත් සභා වෙත පැවැරුණු පසු මෙම වාර්ෂික වාර්තා ප්‍රකාශයට පත් කිරීම ක්‍රමයෙන් අභාවයට පත්වූ අතර වර්තමානයේ එබඳු වාර්තා කිසිදු පළාත් සභාවකින් ප්‍රකාශයට පත්නොවේ. එබැවින් කිසියම් පළාතක පළාත් පාලන ආයතනයක පරිපාලනයට අදාල තොරතුරු ලබාගැනීමට නිසි මූලාශ්‍රයක් හමු නොවේ. එතෙකුදු වුවත් පළාත් සභා සහ

පළාත් පාලන අමාත්‍යාංශය මගින් ප්‍රකාශයට පත් කරනු ලබන " පළාත් සභාවන්හි මූල්‍ය කාර්යසාධනය" හා " පළාත් පාලන ආයතනයන්හි මූල්‍ය කාර්යසාධනය" නමින් වූ වාර්ෂික ප්‍රකාශනය මෙම ක්ෂේත්‍රයේ තොරතුරු ලබාගැනීමට ඇති ප්‍රමුඛ මූලාශ්‍රයකි. මීට අතිරේකව ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ වාර්ෂික සංඛ්‍යා ලේඛන සංග්‍රහය මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික සංඛ්‍යා ලේඛන ප්‍රකාශන ද පළාත් පාලන ආයතන පද්ධතියේ දත්ත ලබාගැනීමට පවත්නා සාධනීය මූලාශ්‍රයෝය.

මෙම අධ්‍යයනයේදී අනාවරණය වූයේ පළාත් පාලන ආයතන (මහා නගර සභා සහ නගර සභා) විසින් වාර්ෂිකව ප්‍රකාශයට පත්කළ යුතු බවට නීතියෙන් නියමකර ඇති වාර්ෂික පරිපාලන වාර්තා නියැදිගත කිසිදු පළාත් පාලන ආයතනයක් විසින් ප්‍රකාශයට පත්කර නොතිබූ බවයි. මහා නගර සභා ආඥා පනතේ 218 වන වගන්තිය ප්‍රකාර වාර්ෂික පරිපාලන වාර්තාව සභාගත කිරීමෙන් අනතුරුව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම අනිවාර්‍යය අවශ්‍යයතාවයකි. එසේම නගර සභා ආඥා පනතේ 180 වගන්තිය ප්‍රකාර සෑම නගර සභාවකම සභාපතිවරයා විසින් වාර්ෂික පරිපාලන වාර්තාව සභා සම්මත කිරීමෙන් අනතුරුව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතුවීම ද අනිවාර්‍ය නෛතික අවශ්‍යතාවයකි. එතෙකුදු වුවත් මේ කිසිම ආයතනයක් එම අවශ්‍යතාවය ඉටු නොකරන අතර පළාත් පාලන කොමසාරිස්වරයා හෝ අමාත්‍යවරයා හෝ විගණනය ඒ පිළිබඳ විමසීමක් කර ඇති බවක් ද නෙපෙනුණි. එබැවින් පළාත් පාලන ආයතන කිසිවක මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ආයතනය මගින් සම්පාදනය කරන කිසිදු ප්‍රකාශනයක් ප්‍රසිද්ධියට පත්නොවේ.

ඒ අනුව ඒ පිළිබඳ තොරතුරු ලබාගැනීමට ඇති ප්‍රධාන සාධනීය මූලාශ්‍රය පළාත් පාලන ආයතනයේ අවසාන ගිණුම් ප්‍රකාශය වන්නේය.

බොහෝ පළාත් පාලන ආයතන වෙත වාර්ෂිකව ලැබෙන විගණන වාර්තාව මගින් ආදායම් අයකිරීමේ ප්‍රගතිය පිළිබඳව කිසියම් අදහසක් ලබාගත හැකිය. එහෙත් ඇතැම් ආයතනවල එම වාර්තා යාවත්කාලීනව නඩත්තු කරනු නොලැබේ.

පළාත් පාලන ආයතනයන්හි මූල්‍ය තොරතුරු කිසියම් ආකාරයකට ලබාගත හැකි එකම ප්‍රකාශනය වාර්ෂික අයවැය ලේඛනයයි. එහි අඩංගු තොරතුරු වල නිරවද්‍යතාවය ප්‍රශ්ණ සහගත වුවත් යාවත්කාලීන තොරතුරු ලබාගතහැකි එකම මූලාශ්‍රය බවට අයවැය ලේඛනය

පත්ව තිබේ. එබැවින් මෙම අධ්‍යයනය සඳහා දත්ත ලබාගැනීම පිණිස සෑම ආයතනයකම අවසාන ගිණුම් ප්‍රකාශන හා අයවැය ලේඛණ පරිශීලනය කරන ලදි.

2.4 අදාල පර්යේෂණ වාර්තා අධ්‍යයනය:

ප්‍රස්තුත ක්ෂේත්‍රයට අදාලව පළාත් සභා හෝ පළාත් පාලන ආයතන විසින් කිසිදු පර්යේෂණ අධ්‍යයනයක් පසුගිය කාලය තුළ සිදුකර ඇති බවට කිසිදු තොරතුරක් නොලැබුණි. සෘජුවම මෙම විෂයට අදාල නොවූවත් ජාත්‍යන්තර ආධාර ආයතන විසින් පළාත් පාලන ක්ෂේත්‍රය සම්බන්ධව සිදුකරන ලද පර්යේෂණ අධ්‍යයනයන් කිහිපයක් ප්‍රකාශයට පත්ව ඇත. ඒ අතුරින් පහත සඳහන් වාර්තා පර්යේෂණ කණ්ඩායම් විසින් අධ්‍යයනය කරන ලදි.

I. පළාත් පරිපාලන සහයෝගිතා වැඩසටහන 2009 - 2012 SURG – USAD මගින් ප්‍රකාශිත පළාත් පාලන කළමනාකරණය (2013- ජූලි)

II. උතුරු නැගෙනහිර පළාත් පාලන සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය NELSIP – WB ආදායම් ප්‍රවර්ධන වැඩ සැලසුම්

III. පාරදෘෂ්‍ය වගවීමේ ව්‍යාපෘතිය - TALG (TAF - 2007) සහභාගි සැලසුම් අයවැය සම්පාදනයට අත්වැලක්

IV. උතුරු නැගෙනහිර පළාත් පාලන ආයතනවල කාර්ය සාධනය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති වාර්තාව PIP (GTZ - 2008)

V. කොළඹ මහා නගර සභාවේ අතුරු ව්‍යවස්ථා පිළිබඳ අධ්‍යයන වාර්තාව- (2015 Sevanatha)

VI. පොදු රාජ්‍ය මණ්ඩලීය පළාත් පාලන අත්පොත (2009 - පොදු රාජ්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය

VII. පළාත් පාලන මූල්‍ය සම්පාදනය - (2008 - පොදු රාජ්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය)

VIII. මහා නගර සභා යටිතල පහසුකම් මූල්‍ය සම්පාදනය (2010 - පොදු රාජ්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය)

IX. චොක්සි කොමිෂන් සභා වාර්තාව - (සැසි වාර්තා අංක XXXIII – 1955)

X. අබිවර්ධන කොමිෂන් සභා වාර්තාව - (සැසි වාර්තා අංක I – 1999)

XI. පළාත් පාලන මූල්‍ය කාර්ය සාධනය (2015අ 2016 පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය)

උක්ත පර්යේෂණ / අධ්‍යයන වාර්තා මඟින් මෙම ක්ෂේත්‍රයට අදාල ඉතා වැදගත් තොරතුරු රැසක් ලබාදෙයි. නිරීක්ෂණය වූ තවත් විශේෂ කාර්යයක් වන්නේ කිසිදු පළාත් සභාවක් හෝ කිසිම පළාත් පාලන ආයතනයක් මෙම මූලාශ්‍ර අධ්‍යයනය කර ඇති බවක්, හෝ ඒවා ප්‍රයෝජනය සඳහා ගෙන ඇති බවක් හෝ අනාවරණය නොවීමයි. මෙම මූලාශ්‍ර අධ්‍යයනය කළේ නම් බදු හා බලපත්‍ර ගාස්තු කළමනාකරණය ඉතා කාර්යක්ෂම කර ගැනීමට ඉඩ තිබුණි. පළාත් පාලන ආයතන විසින් වාර්ෂිකව පළකරනු ලබන ගැසට් නිවේදන පරීක්ෂා කිරීමේදී හැඟී ගියේ බොහෝ පළාත් පාලන ආයතන බදු, බලපත්‍ර ගාස්තු, ව්‍යාපාර, වෘත්තීන් හෝ කර්මාන්ත කවරේද යන්න පිළිබඳ නිසි අවබෝධයක් නොමැතිව එම නිවේදන පළකර ඇති බවයි. මේ සම්බන්ධ පැහැදිලි විග්‍රහයක් ඉදිරි පරිච්ඡේදයන්හි ඉදිරිපත් කරනු ඇත.

2.5 පරීක්ෂණ කණ්ඩායමේ ඉලක්කගත එකඟතාව:

ඉතා පුළුල් හා විස්තීරණ කාර්යයක් වූ ඉහත 02. 4 ඡේදයෙහි සඳහන් විෂයගත මූලාශ්‍ර අධ්‍යයනය සාමූහිකව සිදුකිරීමටත් ඉන් අනතුරුව ව්‍යුහගත ප්‍රශ්ණාවලීන් අවසන් කර ක්ෂේත්‍ර පරීක්ෂාව සඳහා නියැදිගත ආයතන වෙත යාමටත් තීරණය කරන ලදි. ඉන් අනතුරුව දත්ත එක්රැස් කිරීම, ප්‍රායෝගිකව ඒ ඒ ආයතනවලදී උද්ගත වියහැකි ගැටළු වලට විසඳුම් ලබාගෙන තොරතුරු එක්රැස් කිරීමටත් දත්ත විශ්ලේෂණය සඳහා සාරාංශ ගත කිරීමටත් ඉලක්ක සකසා ගනු ලැබිණ.

2.6 ප්‍රශ්ණාවලීන් සම්පාදනය:

01.3 - ආ ඡේදයෙහි විස්තර කර ඇති පරිදි මෙම පරීක්ෂණ අධ්‍යයනය සඳහා දත්ත හා තොරතුරු ලබාගත යුතු වූ සියළු පාර්ශවකරුවන් ආවරණය වන පරිදි ප්‍රශ්ණාවලීන් කිහිපයක් සකස් කරන ලදි. මෙහිදී ප්‍රමුඛ අවධානය යොමු කරන ලද්දේ නියැදි ගත මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභාවන්හි තොරතුරුධාරී ප්‍රධාන නිලධාරීන් හා අදාල විෂය භාරව කටයුතු කරන හා ඊට සෘජුව සම්බන්ධ වන කාර්ය මණ්ඩල කෙරෙහිය.

ඒ අනුව මහා නගර සභාවල නාගරික කොමසාරිස්වරුන්, ගණකාධිකාරීන් ප්‍රධාන ආදායම් පරීක්ෂකවරුන්, තක්සේරු නිලධාරීන් ද, අංශ ප්‍රධානීන්, විෂයභාර කළමනාකරණ සහකාර නිලධාරීන් ඉලක්ක කර ප්‍රශ්ණාවලියක් සම්පාදනය කරන ලදි. එසේම නියැදිගත නගර සභා සම්බන්ධයෙන් ලේකම්වරුන්, ගණකාධිකාරීවරුන්, ආදායම් පරීක්ෂකවරුන් සහ විෂයභාර කළමනාකරණ සහකාර නිලධාරීන් ඉලක්ක කර ප්‍රශ්නාවලියක් සැලසුම් කරන ලදි.

ඊට අමතරව ප්‍රාදේශීය සභා ලේකම්වරුන්, ආදායම් පරීක්ෂක, ආදයම් පරිපාලකවරුන් හා විෂයභාර කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා ද ප්‍රශ්ණාවලියක් සැලසුම් කරන ලදි. තවද අදාල පළාත් පාලන ආයතන බල ප්‍රදේශයන් හි ව්‍යාපාරික සංගම්, බදු ගෙවන්නන්ගේ සංගම් ආදියෙන් අදහස් ලබාගැනීම පිණිස ද ප්‍රශ්ණාවලියක් සැලසුම් කරන ලදි.

ඊට අමතරව පළාත් පාලන දෙපාර්තමේන්තුව, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාල ආදියෙහි ප්‍රධාන නිලධාරීන්ගෙන් හා විමර්ශන නිලධාරීන්ගෙන් සම්මුඛ සාකච්ඡා මගින් අදාල තොරතුරු ලබාගැනීමට විධිවිධාන යොදන ලදි.

ව්‍යුහගත ප්‍රශ්ණාවලීන් සැකසීමේදී ප්‍රමුඛ අවධානය යොමු කරන ලද්දේ වරිපනම්, බදු, බලපත්‍ර ගාස්තු, ගාස්තු, කුලී ආදී පළාත් පාලන ආයතනයක ස්වයං උත්පාදන ආදායම් විෂය ධාරාව පිළිබඳ එම කාර්යාවලියෙහි නිරත කාර්යමණ්ඩල කොතරම් පළපුරුද්දක් හා විෂයගත පුහුණුවක් ලබා තිබේද යන්න නිශ්චය කර ගැනීමටය. ඉන් අනතුරුව ආදායම් පැනවීමේදී සභාව විසින් හෝ එහි අනුප්‍රාප්තිකයා විසින් පැනවීම් සිදුකිරීමට අදාල යෝජනා සම්මුතීන් / තීරණ ගනු ලබන ආකාරය, ඒවාහි අන්තර්ගතය, නීත්‍යානුකූලභාවය ආදිය නිශ්චය කිරීමට අදාල තොරතුරු ලබාගැනීම කෙරෙහි අවධානය යොමුකරන ලදි.

අනතුරුව වරිපනම් පැනවීම විෂයෙහි පවත්නා අත්‍යාවශ්‍ය සාධක වන්නා වූ තක්සේරුව, තක්සේරු දැන්වීම, විරෝධතා, විරෝධතා පරීක්ෂණ ආදිය පිළිබඳ විස්තර ලබාගන්නා ලෙස ප්‍රශ්නාවලිය සංවිධානය වී ඇත. එසේම පසුගිය වසර තුල වරිපනම්, බදු හා බලපත්‍ර ගාස්තු වල ලැබීම් හා හිඟ ආදායම් පිළිබඳ දත්ත ලබාගැනීමට ද විධි විධාන සලසන ලදි.

වර්තමානයේ පළාත් පාලන ආයතන බදු හා බලපත්‍ර ගාස්තු පනවා අය කර ගැනිමේදී මූලික අවධානය යොමුවිය යුතු කරුණ වන අදාල බද්ද හෝ බලපත්‍ර ගාස්තුව පැනවීමට හා

අයකිරීමට නෛතික බලයක් තිබේද යන්න පිළිබඳව සොයා බැලීමක් නොකරන බව පෙනී ගොස් ඇත. එබැවින් අදාල පැනවීම් සඳහා පවත්නා නීතිමය බලය විමසීමට කටයුතු කර ඇත. ඒ අනුව බලපත්‍ර ගාස්තු අයකිරීම් වලට අදාල වෙළඳ ව්‍යාපාර සඳහා අතුරු ව්‍යවස්ථා විධිමත් පරිදි පනවා තිබේද යන්න පරීක්ෂා කිරීමට අදාල තොරතුරු විමසන ලදි.

මේ අනුව ප්‍රස්තුතයට අදාල තොරතුරු සියල්ල ආවරණය කරගත හැකිවන පරිදි අදාල පාර්ශවකරුවන් ඉලක්කකොට ව්‍යුහගත ප්‍රශ්ණාවලීන් සකසන ලදි. ආදර්ශ ප්‍රශ්නාවලීන් උප ලේඛන අංක 02 හි සංග්‍රහ කොට ඇත.

2.7 නියැදි අධ්‍යයනය:

මෙම පර්යේෂණ අධ්‍යයනය සඳහා තෝරාගත් නියැදිගත පළාත් පාලන ආයතන සංඛ්‍යාව 48 කි. එය පවත්නා මුළු පළාත් පාලන ආයතන සංඛ්‍යාවෙන් 14 % කි. මෙහිදී පළාත් නවය නියෝජනය වන පරිදි මෙන්ම පරිපාලන දිස්ත්‍රික්ක 24 ම නියෝජනය වන පරිදි අදාල ආයතන නියැදිය තෝරා ගන්නා ලදි. මෙය පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ එකඟතාවය මත තීරණය කරණු ලැබිය. උතුරු මැද පළාත හැර සෑම පළාතකම පළාත් පාලන ආයතන වර්ග තුනම නියෝජනය විය. උතුරු මැද පළාතේ දැනට පවත්නේ මහා නගර සභා සහ ප්‍රාදේශීය සභා පමණක් වන හෙයින් එහි නගර සභා නියෝජනය නොවේ. ඒ අනුව මහා නගර සභා 12 ක් ද, නගර සභා 15 ක් ද, ප්‍රාදේශීය සභා 21 ක්ද වශයෙන් නියැදිගත පළාත් පාලන ආයතන 48 සංයුක්ත වේ.

සටහන් අංක 03

නියැදිගත පළාත් පාලන ආයතන ලේඛනය

අංකය	මහා නගර සභා	නගර සභා	ප්‍රාදේශීය සභා
01	කොළඹ	සීතාවකපුර	කොටිකාවත්ත මුල්ලේරියාව
02	දෙහිවල - ගල්කිස්ස	පෑලියගොඩ	බියගම
03	ගම්පහ	ජා - ඇල	දෙඩංගොඩ
04	කුරුණෑගල	හොරණ	හලාවත
05	මහනුවර	කුලියාපිටිය	අලව්ව
06	දඹුල්ල	පුත්තලම	යටිනුවර
07	රත්නපුරය	ගම්පොල	අඹගමුව
08	හම්බන්තොට	තළවාකැලේ - ලිඳුල	ඇහැලියගොඩ
09	බදුල්ල	ඇඹිලිපිටිය	ගලිගමුව
10	මඩකලපුව	හික්කඩුව	දික්වැල්ල

11	අනුරාධපුරය	හපුතලේ	බෙන්තොට
12	යාපනය	ත්‍රිකුණාමලය	පස්සර
13		කාන්තන්කුඩි	මොණරාගල
14		පේදුරුතුඩුව	තලාව
15		වව්නියාව	මධ්‍යම නුවරගම් පළාත
16			තමන්කඩුව
17			තිරුක්කෝවිල්
18			සේරුවාවිල
19			නානාටාන්
20			කරච්චි
21			මුහුදුබඩපත්තු

පර්යේෂණ අධ්‍යයනය ආරම්භයේදී පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ අධ්‍යක්ෂක විසින් නියැදිගත පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතා මෙම අධ්‍යයනය පිළිබඳ හැඳින්වීමක් සහිතව පර්යේෂණ නිලධාරීන් ද හඳුන්වා දෙමින් ඊට අවශ්‍ය දත්ත හා තොරතුරු ලබාදී අවශ්‍ය සහාය ලබාදෙන ලෙස දැනුම්දීමක් කරන ලදි. ඊට අමතරව පර්යේෂණ කටයුතු කරගෙන යාම සඳහා දත්ත හා තොරතුරු අදාල ආයතන වෙතින් ලබාගැනීම සඳහා බලය පවරමින් නිල ලියවිල්ලක් ද, නිකුත් කරන ලදි. මෙය අදාල කටයුතු පහසුකරලීමට බෙහෙවින් උපකාරී විය.

එතෙකුදු වුවත් අනුරාධපුරය හා මහනුවර මහා නගර සභා සහ කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව යන ආයතන වලින් ආරම්භයේදීම ඊට නිසි සහයෝගය නොලැබුණ බවද මෙහිලා සඳහන් කළ යුතුව ඇත. මේ සම්බන්ධව යලි කරුණු පැහැදිලි කරදීමේ ප්‍රතිඵලයක් ලෙස මහනුවර මහා නගර සභාවේ තොරතුරු පසුව ලබාගත හැකිවිය. එහෙත් අනුරාධපුර මහා නගර සභාවේ තොරතුරු හා දත්ත ලබාගැනිම දුෂ්කර වුවද විකල්ප මාර්ග වලින් අදල දත්ත ලබා ගැනිමට හැකි විය.කෙසේ වෙතත් අවසානයේදි සියළුම නියැදිගත ආයතන සම්බන්ධ දත්ත තොරතුරු ලබාගැනිමට පරීක්ෂණ කණ්ඩායමට හැකිවුණි. තමන්කඩුව ප්‍රාදේශිය සභාව මෙම විස්තර අභ්‍යන්තර තොරතුරු නිසා ලබා දිය නොහැකි බව පැවසූ අතර පසුව එවිමට එකඟවුවත් අවසාන මොහොත දක්වාම එම විස්තර නොලැබුනි. කොළඹ මහා නගර සභාව පවා ආදයම් පැනවීම් විස්තර ලබා දිමට එතරම් කැමැත්තක් නොදැක්විය. එහෙත් අන්තර්ජාලය හරහා ගැසට් පත්‍ර ලබා ගැණීම් තුළින් අධ්‍යයනය සඳහා අවශ්‍ය මූලික දත්ත ලබා ගැනිමට හැකි විය.

නියැදිගත පළාත් පාලන ආයතන විමර්ශනයේදී කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ මේ පිළිබඳව කලින් අවබෝධයක් ලබාදී තිබුණ ද ප්‍රධාන නිලධාරීන් හා විෂයභාර නිලධාරීන් පර්යේෂණ කණ්ඩායමේ කාර්යභාරය ගැන දැනුම්වත් වී නොසිටීමයි. ඒ හේතුකොට ගෙන ඒ පිළිබඳ අදාල නිලධාරීන්ට මූලික අවබෝධයක් පළමුව ලබාදීම අත්‍යාවශ්‍ය විය. විශේෂයෙන් සාවද්‍ය පරිචයන් දක්නට ලැබුණු ආයතනයන්හි වැඩ බැලීම පදනමේ සිටි නිලධාරීන් නිවැරදි තොරතුරු අනාවරණය කිරීම සඳහා කිසියම් බියමුසු සැක සහිත භාවයකින් යුක්තව සිටි බව නිරීක්ෂණය විය. ඊට හේතුවන්නට ඇත්තේ මෙය ඔවුනට අළුත් අත්දැකීමක් වීමත් තම වෘත්තීය සුරක්ෂිත භාවයට පැවති තත්වය අවාසියක් විය හැකිව තිබූ බවට ඔවුනට සැක පහළවීමත් විය හැකිය.

කෙසේ වෙතත් උතුරු හා නැගෙනහිර පළාත් වල සෑම පළාත් පාලන ආයතනයකින්ම ඉතා යහපත් ප්‍රතිචාර මෙන්ම සහාය ලැබීම විශේෂයෙන් සඳහන් කළයුතු කරුණකි.

03 පරිච්ඡේදය

3. ක්ෂේත්‍ර තොරතුරු සමීක්ෂණය :

මෙම පර්යේෂණ අධ්‍යයනය සඳහා ක්ෂේත්‍ර තොරතුරු සමීක්ෂණය කිරීම පිණිස දිවයිනේ සෑම පළාතක් ම නියෝජනය වන පරිදි මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා 48 ක් තෝරගන්නා ලදි. මෙම ආයතන තෝරා ගැනීම සිදුකිරීමේදී ඉතා දියුණු තත්වයක පවතින ප්‍රධාන ආයතන මධ්‍යම ප්‍රමාණයේ ආයතන සහ ග්‍රාමීය අඩු පහසුකම් සහිත ආයතන යනාදී වශයෙන් ලංකාවේ පළාත් පාලන ආයතන ව්‍යුහයේ යථා ස්වරූපය නිරූපණය වන පරිදි හැකිතාක් දුරට පොදු නියෝජනයක් ගොඩ නගා ගැනීම සඳහා උත්සාහ දරණ ලදි. එසේම ජනගහන හා ජන වර්ග ව්‍යාප්තිය ද සැලකිල්ලට ගෙන අගතියෙන් තොරව අධ්‍යයනය සිදුකිරීමට කටයුතු කරන ලදි.

ලංකාවේ පළාත් පාලන ආයතන ආශ්‍රිතව පර්යේෂණ අධ්‍යයනයන් සිදුවී ඇත්තේ ඉතාම අල්ප වශයෙන් බව මෙම අධ්‍යයනය සම්බන්ධ ක්ෂේත්‍ර තොරතුරු සමීක්ෂණයේදී පරීක්ෂණ කණ්ඩායම වෙත තහවුරු වූ සුවිශේෂ කරුණකි. පර්යේෂණ අධ්‍යයනයක පරමාර්ථය එහි ස්වරූපය හා ඊට අවශ්‍ය නිරවද්‍ය තොරතුරු සපයාදීම පිළිබඳව පළාත් පාලන කාර්ය මණ්ඩල තුල ඇත්තේ අල්ප අවබෝධයකි. පොදුවේ සෑම තරාතිරමකම බොහෝ නිලධාරීන් තම විෂය පථය පිළිබඳ තොරතුරු, පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ හඳුන්වාදීමේ ලිපිය ඉදිරිපත් කළ ද, ප්‍රශ්නාවලීන් සම්පූර්ණ කිරීම, නිවැරදි තොරතුරු හා දත්ත ලබාදීම මෙන්ම තොරතුරු පිළිබඳ සිය අනන්‍යතාවය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ප්‍රබල පසුගාමී බවක් හෝ බියක් පෙන්නුම් කරන බව නිරීක්ෂණය විය.

එසේම පොදුවේ අපගේ සෑම පළාත් පාලන ආයතනයකම නිලධාරීන් ඕනෑම අවස්ථාවක විශේෂයෙන් පෙරවරුවේ ඉතා අවිවේකී බවක ගැලී සිටීම ද, ඉතා සුලභ කරුණක් සේ දිස්විය. ආයතනයේ සමස්ථ කාර්ය සාධනය කුමක් වුවත් නිලධාරීන් හා සේවකයින් මහජනයාගෙන් පිරිගිය බොහෝවිට ඉතා සීමිත ඉඩ ප්‍රමාණයක දැඩි අවිවේකී බවක සිටී. යම්කිසි ප්‍රශ්නයකට සාවධානව සවන් යොමුකර විස්තර හෝ තොරතුරු ප්‍රකාශ කිරීමට හෝ ලිපිගොනු හෝ

ලේඛන පරීක්ෂාකර අදාල දත්ත ලබාදීමට ඔවුනට සතියේ කිසිම දිනක විවේකයක් නොමැති වීම විමතියට කරුණකි.

ප්‍රධාන නිලධාරීන් වන නාගරික කොමසාරිස්වරුන් හා නගර සභා, ප්‍රාදේශීය සභා ලේකම්වරුන් හමුවීම අතිශය අපහසු කාර්යයකි. එම නිලධාරීන්ට සාමාන්‍යයෙන් ඉහල ආයතනවල අවශ්‍යතා මත රැස්වීම්වලට හෝ උත්සව වලට සහභාගීවීමට සිදුව ඇතැයි සඳහන් වන හෙයින් ආයතන පරිපාලනය, ප්‍රතිපත්තිමය කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම, බදු පැනවීම ආදියට අදාල බුද්ධිමය සාවධානයකින් ඉටුකළ යුතු වැදගත් පරිපාලනමය අවශ්‍යතා සඳහා යොමුකිරීමට ගුණාත්මක කාලයක් (Quality time) නොවීම බෙහෙවින් අවධානය යොමුවිය යුතු තත්වයකි. මෙම අවධිමත් කාල කළමනාකරණයෙහි ප්‍රතිඵල ඉදිරි පරිච්ඡේදයන්හි විස්තර කෙරෙනු ඇත.

3.1 නියැදිගත පළාත් පාලන ආයතනයන්හි ප්‍රායෝගික තත්ව අධ්‍යයනය:

නියැදිගත පළාත් පාලන ආයතනයන්හි වරිපනම් බදු හා බලපත්‍ර ගාස්තු පැනවීම විෂයෙහි පවතින යථා තත්වය අංක 04 සිට අංක 09 දක්වා සටහන් මඟින් පිළිවෙලින් මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා නිරූපනය වන පරිදි දක්වා ඇත.

සටහන් අංක 04: මහා නගර සභා :- 2016 වසර සඳහා වරිපනම්, බදු හා බලපත්‍ර ගාස්තු පැනවීම.

අංකය	දර්ශකය	කොළඹ	දෙහිවල මහනගර සභාව	ගාල්ල	මාතර	කලුතර	මහනුවර	කුරුණෑගල	මාතලේ	නුවරඑළිය	බදුල්ල	මොණරාගල	රත්නපුර
01	වරිපනම්	-	*	*	*	*	*	-	*	*	*	*	*
	පැනවීම	-	✗	✗	✗	✗	✗	-	✓	✓	✗	✗	✗
	ගැසට් නිවේදනය	-	✗	✗	✗	✗	✗	-	✓	✓	✗	✗	✗
02	බලපත්‍ර ගාස්තු	*	*	*	-	*	*	*	*	*	*	*	*
	පැනවීම	✗	✗	✗	-	✗	✗	✗	✗	✓	✗	✗	✗
	අතුරු ව්‍යවස්ථා	✗	✗	✗	-	✗	✗	✗	✗	✓	✗	✗	✗
	ගැසට් නිවේදන	✗	✗	✗	-	✗	✗	✗	✗	✓	✗	✗	✗
03	ව්‍යාපාර බදු	*	*	*	-	*	*	*	*	*	*	*	*
	පැනවීම	✓	✓	✗	-	✗	✗	✗	✗	✓	✗	✗	✗
	ගැසට් නිවේදනය	✓	✗	✗	-	✗	✗	✗	✗	✗	✗	✗	✗
04	කර්මාන්ත බදු	*	*	*	-	-	*	*	-	*	*	*	*
	පැනවීම	✗	✗	✓	-	✗	✗	✓	-	✓	✗	✗	✗
	ගැසට් නිවේදනය	✗	✗	✓	-	✗	✗	✓	-	✓	✗	✗	✗
05	විනෝද බදු	-	*	-	-	*	*	*	-	*	-	-	-
	පැනවීම	-	✗	-	-	✗	✗	-	-	✗	-	-	-
	ගැසට් නිවේදනය	-	✗	-	-	✗	✗	-	-	✗	-	-	-
06	වාහන හා සත්ව බදු	-	*	*	-	*	*	-	*	*	*	*	*
	පැනවීම	-	✓	✓	-	✗	✗	-	✗	-	✓	✓	✗
	ගැසට් නිවේදනය	-	✓	✓	-	✗	✗	-	✗	-	✓	✓	✗
07	සංවර්ධනය නොකළ ඉඩම් මත බදු	-	*	-	-	-	-	-	-	*	-	-	-
	පැනවීම	-	✓	-	-	-	-	-	-	✓	-	-	-
	ගැසට් නිවේදනය	-	✓	-	-	-	-	-	-	✓	-	-	-

✠ - පනවා ඇත ✓ - නිවැරදිය ✗ - සාවද්‍යයි - - පනවා නැත.

3.2 මහා නගර සභා

නියැදිගත මහා නගර සභා සංඛ්‍යාව 12 කි. නියැදිගත මහා නගර සභා අතරින් 10 ක පමණක් 2016 වර්ෂය සඳහා වරිපනම් පැනවීම සිදුකර තිබුණි. කොළඹ හා රත්නපුර මහා නගර සභා විධිමත් ලෙස වරිපනම් පනවා ගැසට් පත්‍රයේ පළකර නොතිබුණි. ඒ අතුරින් ආයතන 08 ක් පැනවීම් නිවැරදිව සිදුකර නොමැති බවද ආයතන 08 ක් අදාල ගැසට් නිවේදනය නිවැරදිව පළකර නොමැති බවද නිරීක්ෂණය විය.

එමෙන්ම බලපත්‍ර ගාස්තු, කර්මාන්ත බදු, ව්‍යාපාර බදු, විනෝද බදු හා වාහන සහ සත්ව බදු පිළිබඳ ව්‍යවස්ථාපිත ගැසට් නිවේදන පළකර තිබුණද එකී පැනවීම් බෙහෙවින් සාවද්‍ය හා දෝෂ සහගත බව නිරීක්ෂණය විය. පරීක්ෂාවට භාජනය කළ මහා නගර සභා අතුරින් නිවැරදිව වරිපනම් පැනවීම් සිදුකර ව්‍යවස්ථාපිත නිවේදන නිවැරදිව පළකර තිබුණේ එම ආයතන අතුරින් 02 ක් පමණි.

බලපත්‍ර ගාස්තු නිවැරදිව පනවා ව්‍යවස්ථාපිත නිවේදන පළකර තිබුණේ මහා නගර සභා අතුරින් 01 ක් පමණි. සෙසු බදු සම්බන්ධව පැවති යථා ස්වරූපය සටහන් අංක 05 හි දැක්වේ.

සටහන් අංක 05 : මහා නගර සභා

	බද්ද	නිවැරදිව පනවා තිබූ ආයතන සංඛ්‍යාවේ ප්‍රතිශතය
01	වරිපනම්	16.6%
02	බලපත්‍ර ගාස්තු	08.3%
03	ව්‍යාපාර බදු	33.3%
04	කර්මාන්ත බදු	25%
05	විනෝද බදු	00%
06	වාහන හා සත්ව බදු	33.3%
07	සංවර්ධනය නොකළ ඉඩම් මත බදු	16.6%

සටහන් අංක 06: **නගර සභා- 2016 වසර සඳහා වරිපනම්, බදු හා බලපත්‍ර ගාස්තු පැනවීම.**

	දර්ශකය	කොළඹ නගර සභාව	දෙහිවල මහ නගර සභාව	මහරගම නගර සභාව	කොළොන්නාව නගර සභාව	මොරටුව නගර සභාව	සුළුපිටිය නගර සභාව	පානදුර නගර සභාව	කලුතර නගර සභාව	මිරිහාන නගර සභාව	පැලියගොඩ නගර සභාව	මහරගම නගර සභාව	කොළොන්නාව නගර සභාව	මොරටුව නගර සභාව	සුළුපිටිය නගර සභාව	පානදුර නගර සභාව
01	වරිපනම්	*	*	*	*	*	*	*	*	*	*	-	-	*	*	*
	පැනවීම	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	-	-	✘	✘	✘
	ගැසට් නිවේදනය	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	-	-	✘	✘	✘
02	බලපත්‍ර ගාස්තු	*	*	*	*	*	*	*	*	*	*	*	*	*	*	*
	පැනවීම	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘
	අතුරු ව්‍යවස්ථා	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘
	ගැසට් නිවේදන	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘
03	ව්‍යාපාර බදු	*	*	*	*	*	*	*	*	*	*	-	*	*	-	*
	පැනවීම	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	-	✘	✘	-	✘
	ගැසට් නිවේදනය	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	-	✘	✘	-	✘
04	කර්මාන්ත බදු	*	*	*	*	*	*	*	*	*	*	-	*	*	-	*
	පැනවීම	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	-	✘	✘	-	✘
	ගැසට් නිවේදනය	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	-	✘	✘	-	✘
05	විනෝද බදු	-	-	*	-	-	-	*	-	*	*	-	-	-	-	-
	පැනවීම	-	-	✘	-	-	-	✘	-	✘	✘	-	-	-	-	-

	දර්ශකය	සිත්වැලගම	කුලුගොඩමුණ	ඉරි - ඇළ	හොරණ	බුලියාපිටිය	පත්තලම	ගම්පොල	රම්බොඩගල්ල	ඇඹිලිපිටිය	ගිරන්දුර	පුත්තලම	මාතලේ	කෑගල්ල	ඉස්ලාම්පුර	වැලිගම
	ගැසට් නිවේදනය	-	-	✘	-	-	-	✘	-	✘	✘	-	-	-	-	-
06	වාහන හා සත්ව බදු	*	-	-	-	*	*	-	-	*	*	-	-	-	-	-
	පැනවීම	✓	-	-	✘	✓	✘	-	-	✘	✘	-	-	-	-	-
	ගැසට් නිවේදනය	✓	-	-	✘	✓	✘	-	-	✘	✘	-	-	-	-	-
07	සංවර්ධනය නොකළ ඉඩම් මත බදු	*	-	-	*	-	-	-	*	-	-	-	-	-	-	-
	පැනවීම	✓	-	-	✘	-	-	-	✓	-	-	-	-	-	-	-
	ගැසට් නිවේදනය	✘	-	-	✘	-	-	-	✓	-	-	-	-	-	-	-

* - පනවා ඇත ✓ - නිවැරදිය ✘ - සාවද්‍යයි - - පනවා නැත.

3.2.1 නගර සභා

නියැදිගත නගර සභා සංඛ්‍යාව 15 කි. නියැදිගත නගර සභා අතරින් ආයතන 13 ක් පමණක් 2016 වර්ෂය සඳහා වරිපනම් හා බලපත්‍ර ගාස්තු පැනවීමේ ගැසට් නිවේදන පළකර තිබුණි. හපුතලේ හා ත්‍රිකුණාමලය නගර සභා අදළ පැනවීම් සිදුකර විධිමත් පරිදි ගැසට් නිවේදන පළකර නොතිබුණි . එතෙකුදු වුවත් වරිපනම් පැනවීම නිවැරදිව සිදුකර තිබූ එකදු නගර සභාවක් වත් නොවීය. බලපත්‍ර ගාස්තු කර්මාන්ත බදු ආදී සෙසු ආදායම් වර්ග සම්බන්ධයෙන්ද පවතින තත්වය මීට බෙහෙවින් සමානය. ඒ පිළිබඳ යථා ස්වරූපය සටහන් අංක 07 හි නිරූපිතව ඇත.

සටහන් අංක 07: නගර සභා

	බද්ද	නිවැරදිව පනවා තිබූ ආයතන සංඛ්‍යාවේ ප්‍රතිශතය
01	වරිපනම්	00%
02	බලපත්‍ර ගාස්තු	13.3%
03	ව්‍යාපාර බදු	6.6%
04	කර්මාන්ත බදු	6.6%
05	විනෝද බදු	00%
06	වාහන හා සත්ව බදු	26.6%
07	සංවර්ධනය නොකළ ඉඩම් මත බදු	20.0%

සටහන් අංක 08: **ප්‍රාදේශීය සභා- 2016 වසර සඳහා වරිපනම්, බදු හා බලපත්‍ර ගාස්තු පැනවීම.**

	දර්ශකය	කොට්ටාවත්ත මල්ලේවියාව	බිසගල	දෙඩංගොඩ	හලාවත	අම්බිග	සිලිකුවර	අඹලන්ගොඩ	ඇහැලියගොඩ	ගලිගමුව	දික්වැල්ල	බෙංතොට	පස්සර	මොණරාගල	තලාව	මධ්‍යම කුවරගම පළාත	තමන්කඩුව	නිරුත්තගස්වල	පේරාවාඩිය	ගොනගල	කරුවල	මුතුකඩවල
01	වරිපනම්	*	*	*	*	*	*	*	*	*	*	*	*	*	*	-	-	-	-	-	-	-
	පැනවීම	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	-	-	-	-	-	-	-
	ගැසට් නිවේදනය	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	-	-	-	-	-	-	-
02	අක්කර බදු	-	-	*	*	*	*	*	*	*	*	*	*	-	-	-	-	-	-	-	-	-
	පැනවීම	-	-	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	-	-	-	-	-	-	-	-	-
	ගැසට් නිවේදනය	-	-	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	-	-	-	-	-	-	-	-	-
03	වෙළඳ බලපත්‍ර ගාස්තු	*	*	*	*	*	*	*	*	*	*	*	*	*	*	*	-	-	-	-	-	-
	අතුරු ව්‍යවස්ථා	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✓	✓	-	-	-	-	-	-
	පැනවීම	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✓	✓	-	-	-	-	-	-
	ගැසට් නිවේදනය	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✓	✓	-	-	-	-	-	-
04	ව්‍යාපාර බදු	*	*	*	*	*	*	*	*	*	*	*	*	*	*	*	-	-	-	-	-	-
	පැනවීම	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	-	-	-	-	-	-
	ගැසට් නිවේදනය	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	✘	-	-	-	-	-	-

දර්ශකය	ගොවිතැන්කර මිලදීගැනීම්	කෘෂිකර්මය	අලුත්වැඩියා කිරීම්	ගොවිපොළ	කුලී වැඩ	ඉඩම්	ජලය	ඉන්ධන	ලුණු	සත්වාහාර	පොහොර	කෘෂි රසායන	වගා කිරීම්	අස්වැන්න නෙලීම	පරිවහනය	වෙළඳපොළ	ගබඩා කිරීම	ගබඩා පහසුකම්	ගොවි සමිති	ගොවි සංවිධාන	ගොවි සමුපකාර	ගොවි සංගම්
05																						
කර්මාන්ත බිඳ	*	*	*	*	*	*	*	*	*	*	*	*	*	*	*	*	*	*	*	*	*	*
පැනවීම	✓	✗	✗	✗	✗	✗	✗	✗	✗	✗	✗	✗	✗	✗	✗	✗	✗	✗	✗	✗	✗	✗
ගැසට් කිරීමේදීය	✓	✗	✗	✗	✗	✗	✗	✗	✗	✗	✗	✗	✗	✗	✗	✗	✗	✗	✗	✗	✗	✗
විමසන්ද බිඳ	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
05																						
පැනවීම	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
ගැසට් කිරීමේදීය	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
06																						
වාහන හා සත්ව බිඳ	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
පැනවීම	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
ගැසට් කිරීමේදීය	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
07																						
සංවර්ධනය නොකළ ඉඩම් මත බිඳ	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
පැනවීම	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
ගැසට් කිරීමේදීය	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-

* යන්ත්‍ර අත්‍ය ✓ විවෘතයි ✗ සාවද්‍යයි

-සැකසුම්කරන

3.2.2 ප්‍රාදේශීය සභා

නියැදිගත ප්‍රාදේශීය සභා සංඛ්‍යාව 21 කි. ඒ අතුරින් ආයතන 14 ක් වරිපනම් සහ ආයතන 10 ක් අක්කර බදු පනවා තිබුණි. එසේම සටහන් අංක 08 හි දක්වා ඇති පරිදි සෙසු බදු හා ආදායම් පැනවීමට අදාලව ආයතන 15 ක් ව්‍යවස්ථාපිත ගැසට් නිවේදන පළකර තිබුණි. විධිමත් පරිදි අදාල බදු පැනවීම සිදුකර තිබුණේ ප්‍රාදේශිය සභා අතුරින් 23.8 % ක් පමණි. මේ පිළිබඳ පැහැදිළි තොරතුරු සඳහා අංක 09 සටහන බලන්න.

සටහන් අංක 09 : ප්‍රාදේශීය සභා

	බද්ද	නිවැරදිව පනවා තිබූ ආයතන සංඛ්‍යාවේ ප්‍රතිශතය
01	වරිපනම්	00.0%
02	බලපත්‍ර ගාස්තු	00.0%
03	ව්‍යාපාර බදු	00.0%
04	කර්මාන්ත බදු	04.7%
05	විනෝද බදු	00.0%
06	වාහන හා සත්ව බදු	00.0%
07	සංවර්ධනය නොකළ ඉඩම් මත බදු	04.7%

පරීක්ෂාවට භාජනය කරන ලද පළාත් පාලන ආයතනයන්හි බදු හා ආදායම් පැනවීම පිළිබඳ යථා ස්වරූපය දෙස බැලීමේදී එහිලා පවතින අසතුටුදායක හා නීතියට පරිබාහිර පරිචයන්හි පරිමාව පහසුවෙන් වටහා ගත හැකිය.

එතෙකුදු වුවත් ඉහත සඳහන් බදු හා ආදායම් මූලයන්ට අමතර තවත් බදු, ගාස්තු, කුලී හා විවිධ ආදායම් වශයෙන් නීතිය තුල හා ඉන් පරිබාහිරව මහජනතාවගෙන් ඉතා අවිධිමත් හා අසාධාරණ ලෙස මුදල් අය කරන ගැසට් නිවේදන රාශියක් පොදුවේ මේ සෑම ආයතනයක් ම පාහේ වාර්ෂිකව පළකරනු ලැබේ. මෙම අධ්‍යයනයේ විෂය පථයට එම සියළු මූලයන් සෘජුව සම්බන්ධ නොවුන ද ඒ පිළිබඳව මෙහිදී සඳහන් කිරීම අත්‍යාවශ්‍ය වන හෙයින් ඉදිරි පරිච්ඡේදයන්හිදි ඒ පිළිබඳව තොරතුරු ඇතුළත් කිරීමට අපේක්ෂා කෙරේ.

3.3 තොරතුරු එක්රැස් කිරීම:

මෙම අධ්‍යයනයේදී තොරතුරු ලබා ගැනීමට හා දත්ත විශ්ලේෂණය කිරීම ප්‍රමාදවීමට බලපාන ලද ප්‍රධාන හේතුව වූයේ පරීක්ෂාවට භාජනය කළ පළාත් පාලන ආයතන වලින් අපේක්ෂිත පරිදි තොරතුරු ලබාගත නොහැකිවීමයි.

ශ්‍රී ලංකාවේ සෑම පළාත් පාලන ආයතනයක්ම සෑම ව්‍යවස්ථාපිත දැන්වීමක්, ගැසට් නිවේදනයක්, ප්‍රකාශනයක්, අතුරු ව්‍යවස්ථාවක් ආදී වූ සෑම නෛතික ලේඛණයක්ම භාෂාත්‍රයෙන් ප්‍රකාශයට පත්කළ යුතු බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නියම කර තිබුණද සෑම පළාත් පාලන ආයතනයක්ම පාහේ එම නෛතික විධිවිධාන පැහැර හැර තමාට හුරු පුරුදු ස්වභාෂාවෙන් පමණක් යථෝක්ත නිවේදන ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීම පුරුද්දක් ලෙස මෑතක සිට සිදුකිරීම මෙයට හේතුවයි. සිංහල භාෂාව භාවිතා කරන සෑම ප්‍රදේශයක ම පළාත් පාලන ආයතන යථෝක්ත නිවේදන සිංහල භාෂාවෙන් පමණක් පළකරන අතර දෙමළ භාෂාව කථාකරන ප්‍රදේශවල පළාත් පාලන ආයතන බහුතරයක් දෙමළ භාෂාවෙන් පමණක් එකී නිවේදන ගැසට් පත්‍රයේ පළකරනු ලබයි. පළකර ඇති ඇතැම් ඉංග්‍රීසි පරිවර්තන ඉතා දුර්වල මට්ටමක පැවතුනි.

එබැවින් එම නිවේදන නැවත සිංහල, ඉංග්‍රීසි භාෂාවන්ට පරිවර්ථනය කර අධ්‍යයනය කිරීමට සිදුවීමෙන් අදාල තොරතුරු ලබාගැනීමට දීර්ඝ කාලයක් ගත කිරීමට සිදුවිය. තවද සෑම පළාත් පාලන ආයතනයකම පොදු ආකෘති පත්‍ර, අයවැය ලේඛන, ලෙජර්, නිවේදන, අවසාන ගිණුම් ආදිය ද භාෂාත්‍රයෙන් ම සකස් කළ සම්මත ආකෘති භාවිතා කර පිළියෙළ කළ යුතු වුවත් එසේ සිදුකරන ආයතන ඇත්තේ ඉතා සීමිත සංඛ්‍යාවකි. මෙම සාවද්‍ය තත්වය හමුවේ පළාත් පාලන ආයතන මෙන්ම පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන්, පළාත් පාලන කොමසාරිස්වරුන් ඇතුළු අධීක්ෂණ නිලධාරීන් නිහඬව සිටීම බලධාරීන්ගේ කඩිනම් අවධානය යොමු විය යුතු තත්වයකි. මේ සම්බන්ධව පළාත් පාලන බලධාරීන්ගේ අවධානය යොමුවී ඇත්තේ අල්ප වශයෙනි.

3.4 පළාත් පාලන ආයතන, පළාත් සභා ප්‍රධාන නිලධාරීන් සමග සාකච්ඡා කිරීම:

මීට ඉහත දී ද සඳහන් කළ පරිදි පළාත් පාලන ආයතනයන්හි ප්‍රධාන නිලධාරීන් අතිශය කාර්ය බහුල පිරිසක් බවට පත්වී සිටීම නිසා කලින් කරන ලද දැනුම් දීම් මත වුවද ඔවුන් සමග ගුණාත්මක සාකච්ඡාවකට (Quality time) ඉඩ සලසා ගැනීම අතිශයින් දුෂ්කර කාර්යයකි.

මීට බලපා ඇති ප්‍රධාන හේතුව ලෙස නිරීක්ෂණය වූයේ විධිමත් කාර්යාල කළමනාකරණ ක්‍රමවේදයක් පළාත් පාලන ආයතන රැසක ක්‍රියාත්මක නොවීමයි. කාර්ය මණ්ඩල වෙත බලතල, රාජකාරී බෙදාදීම, පැවරීම මගින් කාර්යක්ෂමතාව ඉහල නැංවීමට ක්‍රියා නොකිරීම, නිසි අධීක්ෂණයක් නොමැතිවීම හා විශාල ලෙස පුරප්පාඩු පැවතීම මෙම අසාමාන්‍ය අවිවේකී බවට හේතුවී ඇති බව නිරීක්ෂණය විය.

එසේම පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන්, විමර්ශන නිලධාරීන් මෙන්ම පළාත් පාලන කොමසාරිස්වරුන් ද අතිශය අවිවේකී කාල රාමු තුල රැස්වීම් සඳහා සිය බහුතර කාලය යෙදවීමට හුරු වී සිටීම පළාත් පාලන ආයතන පද්ධතිය කිසිවෙකුගේ ඇල්මක් බැල්මක් නොමැතිව එම ආයතනවල කළමනාකරණ සහකාර නිලධාරීන්ගේ හැකියාව, දැනුම හා පළපුරුද්ද මත දෝලනය වීමට හේතුවී ඇති බව නිරීක්ෂණය විය.

ලංකාවේ පළාත් සභාවන්හි පළාත් පාලන ආයතන පරිපාලනය අධීක්ෂණය කිරීමේ වගකීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ම පැවරී ඇති පළාත් පාලන දෙපාර්තමේන්තුව, පළාත් පාලන අමාත්‍යාංශය සහ පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා විසින් පසුගිය වසර 5 ක කාලය තුල සිය බල ව්‍යාප්තිය තුල පිහිටි පළාත් පාලන ආයතන වෙත පළාත් පාලන ආදායම් පැනවීම, එකතු කිරීම හා ප්‍රවර්ධනය අරභයා නිකුත් කර ඇති චක්‍රලේඛණ උපදෙස් හා මගපෙන්වීම් කෙරෙහි පරීක්ෂණ කණ්ඩායමේ අවධානය යොමුවිය. ඒ පිළිබඳ විස්තර සටහන් අංක 10 හි දැක්වේ.

සටහන් අංක 10 : පළාත් පාලන චක්‍රලේඛණ උපදෙස් හා මගපෙන්වීම්

පළාත	උපදෙස් නිකුත්කළ බලධරයා	උපදෙස්වල ස්වභාවය	නිකුත් කළ දිනය
මධ්‍යම	පපාකො	ප.පාලන ආයතන වල ආදයම් හා වත්කම් කළමනාකරණය. ව්‍යාපාර බදු පැනවීම හා අය කිරීම සභා ආයතනවල ආදයම් එකතු කිරීම හා කළමනාකරණය. ප්‍රචාරක දැන්වීම් පුවරුව සවි කිරීම. තක්සේරු ප්‍රතිශෝධන හා දැන්වීම් නිකුත් කිරීම .	2012-2015
සබරගමුව	පපාකො	ප.පාලන ආයතන වල හිඟ වරිපනම් හා අක්කර බදු එකතු කිරීම සඳහා කොමිස් මුදලක් ගෙවීම.	2017
බස්නාහිර	පපාකො	ප.පාලන ඉඩම් හා ගොඩනැගිලි බදු දීම. ආදයම් එකතු කිරීමේ දිරි දීමනා	2016
ඌව	පපාකො	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම	2015
උතුරු මැද	පපාකො	කළමනාකරණය වැඩිදියුණු කිරීම. ආදයම් එකතු කිරීම.	2011-2015

සෙසු පළාත් සභා විසින් කිසිදු චක්‍රලේඛණයක් නිකුත් කළ බව නිරීක්ෂණය නොවුණි. පළාත් පාලන ආයතන හා ඒවාහි පරිපාලනය අධීක්ෂණය කිරීම සිදුකළ යුතු ආයතන අතර පවතින පරතරය මෙයින් අවබෝධවේ. පරීක්ෂණ කණ්ඩායම විසින් පළාත් සභාවන්හි ප්‍රධාන නිලධාරීන් සමග කරන ලද සාකච්ඡාවන්හිදී හැඟී ගියේ එම නිලධාරීන් බොහෝ දෙනෙක් එම ක්ෂේත්‍රයට ආධුනිකයන් වන බවත් ඔවුනට පළාත් පාලන ආයතනයන්හි බදු හා ආදායම් පැනවීම් විෂය නව අත්දැකීමක් වන බවත්ය.

3.5 බදු ගෙවන්නන්ගේ සංගම්, ව්‍යාපාරික සංගම් ආදිය සමඟ සාකච්ඡා පැවැත්වීම:

දිවයිනේ සියළුම පළාත් ආවරණය වන පරිදි නියැදිගත සියළු පළාත් පාලන බල ප්‍රදේශයන්හි ක්‍රියාත්මක භාවයේ පැවති බදුගෙවන්නන්ගේ සංගම්, ව්‍යාපාරික සංගම් ආදිය සම්මුඛ සාකච්ඡාවන්ට භාජනය කරන ලදි. එම සංගම් වලින් ලද ප්‍රතිචාර බෙහෙවින් වැදගත් විය. එකී ප්‍රතිචාරයන්ගෙන් පෙනීගිය ප්‍රධාන කරුණක් නම් පොදුවේ බදුගෙවන ජනතාව තුල සභාවේ කාර්ය භාරය හා වගකීම් පිළිබඳව පැහැදිළි අවබෝධයක් නොමැති බවයි. එසේම

පුරවැසියන් වශයෙන් තමන් විසින් බදු, බලපත්‍ර ගාස්තු. කුලී හා වෙනත් ගෙවීම් පළාත් පාලන ආයතන වෙත ගෙවිය යුතු නීතිමය ප්‍රතිපාදන හා එම ආදායම් අයකිරීම පිණිස පැනවීම් සිදුකිරීමේ පරිපාටිය ඔවුන් බොහෝ විට නොදැන සිටින බව නිරීක්ෂණය විය. එසේම සමීක්ෂණයේදී සිදුකළ කරුණු විමසීම් වලදී මෙම සංවිධාන පළාත් පාලන ආයතන සමඟ ඉතා සුහද හා හොඳ සම්බන්ධතාවයක් පවතින බව තහවුරු කිරීමට බොහෝ විට උත්සාහ දරණු ලබන බවක් විද්‍යමාන විය.

එතෙකුදු වුවත් උතුරු හා නැගෙනහිර පළාත් වල පළාත් පාලන ආයතනයන්හි ව්‍යාපාරික සංගම් නියෝජිතයින් ගෙන් 22% ක් සිය ආයතනයන්හි සේවා සම්බන්ධව තමන් සෑහීමකට පත් නොවන බව ප්‍රකාශ කර තිබූ අතර ඊට බලපෑ ඉතා වැදගත් කරුණු සඳහන් කර තිබුණි.

උදා - 1. කාතන්කුඩි නගර සභාව.

පළාත් පාලන ආයතනයෙන් සපයන සේවා පිළිබඳ තෘප්තිමත් නොවෙමු ඊට හේතු;

- වෙළඳ බලපත්‍ර ගාස්තු විෂමතා.
- වරිපනම් පිළිබඳ ගැටළු.
- අතුරු ව්‍යවස්ථා පළාත් පාලන අනපනත් අනුව පනවා නොතිබීම.
- අක්‍රමවත් වත්කම් කළමනාකරණය.
- දුර්වල මහජන සම්බන්ධතා.
- අපද්‍රව්‍ය හා ජලප්‍රවාහන ගැටළු පැවතීම.
- සුසාන භූමි අනවසරයෙන් අල්ලාගෙන සිටීම.
- අවිධිමත් ගොඩනැගිලි සැලසුම් අනුමැතිය.
- පෞද්ගලික පළිගැනීම.

උදා - 2. කරච්චි ප්‍රාදේශීය සභාව කිලිනොච්චිය.

- වසර තුනක් සඳහා වෙළඳ බලපත්‍ර ව්‍යාපාරික ස්ථාන 13 ක් සඳහා නිකුත් නොකිරීම.

මීට හේතුව ලෙස ප්‍රාදේශීය සභාව සඳහන් කරන්නේ එම ව්‍යාපාරික ස්ථාන රජයේ ඉඩමක (ලංගම රක්ෂිතයේ) පිහිටා තිබීමයි.

උදා: 3 මඩකළපුව මහ නගර සභාව

- ම.න ස සපයන සේවා ගැන අප සාමාන්‍යයෙන් තෘප්තිමත් වෙමු.

උතුරු නැගෙනහිර හැර සෙසු පළාත් වල පළාත් පාලන ආයතන කෙරෙහි ව්‍යාපාරික හා බදු ගෙවන ප්‍රජාවගේ එකී ආයතනවල සේවා සම්පාදනය පිළිබඳ අදහස් මෙසේය.

උදා 4 :හොරණ නගර සභාව

- වෙළඳ සංගමය: අපගේ ප්‍රශ්න වලට සවන් දීමක් කොහෙත්ම නැත.
- නියමිත දිනයට නිවේදන නොලැබීම.
- නිත්‍යානුකූල නිවේදන නොලැබීම.
- පැමිණිලි කිරීමට නිවේදන නොදීම.
- නියෝජිතයන් (මන්ත්‍රීවරුන්) සිටියදී රාත්‍රී කාලයේ වුවද අවමංගල අවස්ථාවල උපකරණ ලබා ගැනීමට හැකිවිය. වර්තමානයේ එම පහසුව නැතිවිය.

04 පරිච්ඡේදය

4. වරිපනම්, බලපත්‍ර ගාස්තු හා බදු පැනවීම පිළිබඳ නෛතික විධිවිධාන :

වර්තමාන ලංකාවේ පළාත් පාලන ආයතන වෙත පැවරී ඇති විෂය පථය හා කාර්යභාරය සාපේක්ෂ වශයෙන් ඉතා පටු වූවකි. ආසියානු හා අප්‍රිකානු රටවල් හා සැසඳීමේදී පවා මෙරට පළාත් පාලනය ඉතා සීමිත රාමුවක් තුළ විහිදුනු බලතල හා විෂය පථයක් සහිත වූවක් බව පෙනේ. මෙහිලා වැඩිමනත් විස්තර සඳහා 03 වන උපලේඛනය බලන්න.

කෙසේ වෙතත් මෙරට පළාත් පාලන ආයතන පද්ධතිය බදු, වරිපනම්, ගාස්තු ආදී වශයෙන් වූ කවරාකාර ආදායමක් හෝ මහජනතාවගෙන් අයකර ගැනීමේදී ඊට අදාල " නීතියෙහි " සඳහන් විධිවිධාන මත එකී අයකිරීම් සිදුකළ යුත්තේය. මෙම කරුණ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සිය 148 වන ව්‍යවස්ථාව මඟින් පැහැදිලිව දක්වා ඇත. ඒ මෙසේය;

148 – ව්‍යවස්ථාව

"රාජ්‍ය මූල්‍ය පිළිබඳ පාලනය පාර්ලිමේන්තුව සතුබව:

රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතුවන්නේය. පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ නීතියක හෝ පවත්නා යම් නීතියක හෝ අධිකාරය අනුව හෝ ඒ යටතේ හෝ මිස කිසිම පළාත් පාලන ආයතනයක් විසින් හෝ වෙනත් පොදු අධිකාරයක් විසින් හෝ කිසිම බද්දක්, වරිපනමක් වෙනත් යම් කිසි බදු විශේෂයක් නියම කිරීමට බලයක් නැත්තේය. "

මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විධිවිධාන අනුව අපගේ පළාත් පාලන ආයතන පද්ධතියට එනම් මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභාවන්ට සිය බදු හා ආදායම් අයකර ගැනීමේ විධිවිධාන ඉහත කී පරිදිම පාර්ලිමේන්තුව සම්මත කළ නීතියක් හෝ පවත්නා යම් නීතියක් මඟින් හෝ ඉතා පැහැදිලිව එම ආයතන වෙත පවරා ඇත. මෙහිදී සැලකිය යුතු තවත් විශේෂ කරුණක් වන්නේ බදු, වරිපනම් හා ගාස්තු ආදිය අයකිරීමේදී ප්‍රධාන පාලන ව්‍යවස්ථාවන්හි හා ඊට සමාන්තරව ඇති සෙසු නීතීන්හි (උදා - අර්ථ කථනය පිළිබඳ ආඥා පනත - 2 වන අධිකාරය) දක්වා ඇති විධිවිධාන ද මැනවින් සැලකිල්ලට භාජනය කළ යුතුය. ඒ හැර ඊට අදාල අතුරු ව්‍යවස්ථා, රීති හා නියෝග ආදිය ද අවස්ථානුකූලව මනා

අවබෝධයකින් යුතුව පිළිපැදිය යුතුය. එපමණක් ද නොව සියළුම සභා සම්මතයන්, යෝජනා, තීරණ බලයානුකූල (Intra vires) විය යුතුය. බලයානුකූල වීම යන්න දෙවැදෑරුම් වේ.

1. සත්තාවී බලයානුකූලවීම - හෙවත් හරයාත්මක බලයානුකූලවීම (Substantive Intra vires)
2. පරිපාටිමය බලයානුකූලවීම (Procedureral Intra vires)

මෙම මූලධර්ම වැදගත් වන්නේ අදාල පැනවීම් හෝ තීරණ 100% ක් ම නීතියේ දක්වා ඇති හරයාත්මක කරුණු හා අනුකූල වියයුතුවාක් මෙන්ම නීතියේ සඳහන් කර ඇති පරිපාටිය 100% ක් ම අනුගමනය කළයුතු ද වන හෙයිනි. එසේ නොමැති වුවහොත් එකී පැනවීම් හා තීරණ බලාතික්‍රමණය(ultra vires) මූලධර්මයට යටත් වන්නේය. එහිදී එකී පැනවීම්, තීරණ යනාදිය නිසි අධිකරණයක් මඟින් ශූන්‍ය හා බල රහිත කර නිශේධනය කළ හැකි වන්නේ ය.

මෙම සුවිශේෂී පසුබිම අනුව පාලන ව්‍යවස්ථාවන්හි පවතින විධිවිධාන පිළිබඳ පමණක් දැනුවත් වීම ප්‍රමාණවත් නොවේ. අදාල නීති, අතුරු ව්‍යවස්ථා, නියෝග හා රීති පිළිබඳවද නවනීති වාර්තා හා ශ්‍රී ලංකා නීති වාර්තා (New Law Reports and Sri Lanka Law Reports) පිළිබඳ මනා දැනුමක් ලබාගත යුතුය. අදාල නෛතික ප්‍රතිපාදන පිළිබඳ සාකච්ඡා කිරීමට ප්‍රථම පළාත් පාලන ආයතනවලට අනුමත කර ඇති ආදායම් මූලාශ්‍ර පිළිබඳව දැනගැනීම ප්‍රයෝජනවත් වේ. පවතින සන්දර්භය තුළ පළාත් පාලන ආයතනවලට ආදායම් ලැබෙන මූලාශ්‍ර පුළුල් කාණ්ඩ තුනක් යටතේ වර්ග කළ හැකිය[2]. එනම්;

I. ප්‍රාදේශීය බදු අයකිරීම් – Local Taxtaion (ස්වයං උත්පාදිත ආදායම්)

II. රජයේ ප්‍රදානයන් හා මාරුකිරීම්- Government Grants & Transfers

III. ණය මුදල් - Loans

මෙම පර්යේෂණ අධ්‍යයනයේදී අවධානය යොමු කරණු ලබන්නේ ඉහත ආදායම් වර්ග අතුරින් ප්‍රාදේශීය බදු අයකිරීම් යටතට ගැනෙන ආදායම් ප්‍රභවයන් සම්බන්ධයෙනි. සාමාන්‍යයෙන් දියුණු හා විශාල නාගරික ප්‍රදේශවල පළාත් පාලන ආයතන මෙන්ම අර්ධ නාගරික හා ග්‍රාමීය

[2] පිටු අංක 62- පළාත් පාලන ආයතනවල මූල්‍ය කළමනාකරණය - පළාත් පාලන කළමනාකරණය- 2013 සංවර්ධන පුහුණු පිළිබඳ ජාත්‍යන්තර ආයතනය - ශ්‍රී ලංකාව

ප්‍රදේශවල පළාත් පාලන ආයතන දක්වා වූ පළාත් පාලන ආයතන මෙම ආදායම් ලබාගන්නේ අදාල ප්‍රදේශයෙහි පිහිටා ඇති වානිජ හා නේවාසික දේපළ තක්සේරු කොට අය කර ගන්නා වරිපනම්, ව්‍යාපාර බදු, ගෙවල් කුලී, කර්මාන්ත බදු (වෙළඳ බදු), බලපත්‍ර ගාස්තු ආදිය මගින්ය.

සටහන් අංක 11 : ලංකාවේ පළාත් පාලන ආයතන වෙත අනුමතකර ඇති ආදායම්

1. වරිපනම් හා බදු - වරිපනම් - විශේෂ වරිපනම් - අක්කර බදු - වෙළඳ බදු - ව්‍යාපාර බදු - සංවර්ධනය නොකළ ඉඩම් මත බදු - සමහර ඉඩම් විකුණුම් මත බදු - වාහන සහ සත්ව බදු - විනෝද බදු	4. සමහර සේවාවන් වෙනුවෙන් වූ ගාස්තු - ලියාපදිංචි කිරීම් හා සහතික කිරීම් ගාස්තු - වීථි රේඛා සහතික ආදිය - ගිනි වැලැක්වීමේ ගාස්තු - ගලි බවුසර් සේවා ගාස්තු
2. කුලී - නේවාසික නිවාස සඳහා කුලී - වෙළඳ පොළ හා වෙළඳ සැල් සඳහා කුලී - බදු කුලී - තවකාලික කුලී (වාහන නැවැත්වීම් ඉඩකඩ, ප්‍රජා ශාලා හා ක්‍රීඩා පිටි කුලියට දීම)	5. වෙනත් ආදායම් - කාර්ය මණ්ඩල ණය මත පොලිය - ආයෝජන සඳහා පොලිය - ජලය විකිණීමෙන් ලැබෙන ගාස්තු
3. බලපත්‍ර ගාස්තු - වෙළඳ බලපත්‍ර ගාස්තු - බලය පවරන ලද බලපත්‍ර ගාස්තු (පරිසර හා ඛණිජ තෙල් නිශ්පාදන) - ප්‍රසිද්ධ රැගුම් බලපත්‍ර ගාස්තු - සමාජ ශාලා බලපත්‍ර ගාස්තු - වෙන්දේසි හා බ්‍රෝකර්වරුන්ගේ බලපත්‍ර ගාස්තු	6. වරෙන්තු ගාස්තු හා දඩ මුදල් - නිකුත් කරන ලද වරෙන්තු මත පැනවූ ගාස්තු - උසාවි දඩ

ඉහත සටහනේ දැක්වෙන ආදායම් පැනවීමට අදාල නෛතික ප්‍රතිපාදන නිවැරදිව අවබෝධ කොට ගැනීම මෙම අධ්‍යයනයට අදාල පළාත් පාලන ආයතනයන්හි වර්තමාන ආදායම් පැනවීමේ පරිචයන් හඳුනාගැනීමට උපකාරී වන හෙයින් ඒ පිළිබඳව කෙටියෙන් සලකා බලමු.

4.1 වරිපනම්:

i. වරිපනම් :

ලංකාවේ බොහෝ පළාත් පාලන ආයතනවල මුඛ්‍ය ආදායම් ප්‍රභවය වරිපනම් වේ. වරිපනම් යනු කුමක්ද ? කිසියම් පළාත් පාලන ආයතන බල ප්‍රදේශයක ජීවත් වන ජනතාවගේ සෞඛ්‍ය,

සනීපාරක්ෂාව, පහසුව, සුබවිහරණය හා සුභ සාධනය සැලසීම වෙනුවෙන් ඉදිරි වර්ෂය තුල වැය කළ යුතුවන පුනරාවර්ථන හා මුළු ප්‍රාග්ධන වැය ප්‍රමාණය ඒ බල ප්‍රදේශයේ ඇති එක් එක් දේපලෙහි වාර්ෂික වටිනාකම් එකතුවෙහි අනුපාතයක් වශයෙන් එක් එක් දේපල මත පනවා අයකරනු ලබන මුදල වරිපනම් වේ. ඒ අනුව නිසි ක්‍රමවේදයක් හා අවබෝධයක් සහිතව වරිපනම් පැනවීම සිදුකරන්නේ නම් එමගින් ආයතනයේ ඉදිරි වර්ෂයේ සියළු සංවර්ධන කටයුතු කිරීමට අවශ්‍ය මුදල් ලබාගත හැකිවේ. එහිලා අනුගමනය කළයුතු විද්‍යාත්මක ක්‍රමවේදය පහත දැක්වේ.

$$\frac{\text{වරිපනමෙන් අයකර ගතයුතු මුළු වියදම}}{\text{බල ප්‍රදේශය තුළ ඇති දේපලවල වාර්ෂික වටිනාකම් වල මුළු එකතුව}} \times 100 = \text{වාර්ෂික වරිපනම් ප්‍රතිශතය}$$

අපගේ අධ්‍යයනයන්හිදී වාර්ෂික වරිපනම් ප්‍රතිශතය තීරණය කිරීමට උක්ත ක්‍රමය අනුගමනය කරනු ලබන ආයතන පිළිබඳව සොයා බැලූ අතර දිවයිනේ එකදු නියැදිගත පළාත් පාලන ආයතනයක්වත් මෙම සූත්‍රය අනුගමනය නොකරෙන බව හා ඒ බව නොදන්නා බව නිරීක්ෂණය විය.

වරිපනම් පැනවීම

වරිපනම් පැනවීමට අදාල නෛතික විධිවිධාන මහා නගර හා නගර සභා සම්බන්ධයෙන් මහා නගර සභා ආඥා පනතේ ද, ප්‍රාදේශීය සභා සම්බන්ධයෙන් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතින් ද දක්වා ඇත.

සටහන් අංක 12 : වරිපනම් පැනවීමට අදාල නෛතික විධිවිධාන

	මහනගර සභාව	නගර සභාව	ප්‍රාදේශීය සභාව
වරිපනම්	230 - 244 දක්වා සහ 247	160, 161 හා 166 සිට 170 දක්වා වගන්ති සහ මහ නගර සභා ආඥා පනතේ අදාල වගන්ති	134 සිට 146 සහ 155 - 158

වරිපනමක් පැනවීමට පෙර ප්‍රාදේශීය සභාවක් දියුණුකළ ප්‍රදේශ හඳුනාගෙන ඒ ප්‍රදේශය දියුණු කළ ප්‍රදේශයක් ලෙසට සභා යෝජනා සම්මතයකින් පිළිගත යුතුය. ඉන් අනතුරුව ඊට

ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබාගත යුතුය. එහිදී පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා ඊට අනුමැතිය දෙමින් අදාල ප්‍රදේශය දියුණුකළ ප්‍රදේශයක් ලෙස අනුමත කළ බව ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත්කළ යුතුය.

මෙහිදී මෙම පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා 1946 අංක 57 දරණ පළාත් පාලන පරිපාලන ප්‍රදේශ ආඥා පනත යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් නීත්‍යානුකූලව පත්කරනු ලැබ සිටිය යුතුය. එසේ නොවුනහොත් එම නිලධාරියා විසින් දෙනු ලබන කිසිම තීරණයක් නිත්‍යානුකූලව වලංගු නොවන්නේය. මෙහිදී සහකාර කොමසාරිස්වරයාගේ කාර්යය වන්නේ අදාල ප්‍රදේශය පරීක්ෂා කර බලා තමන් සෑහීමකට පත්වන්නේ නම් එහි නිශ්චිත සීමාවන් සහිතව එම නිවේදනය ගැසට් පත්‍රයේ පළකිරීමයි. එයින් පසුව එම සීමාවන් තුල පවතින ප්‍රදේශය වරිපනම් පැනවීම සඳහා සුදුසු වන්නේය. මහා නගර සභා සහ නගර සභා දියුණු කළ ප්‍රදේශ ලෙස සලකන නිසා එම ආයතන සම්බන්ධයෙන් එබඳු අනුමැතියක් අවශ්‍ය නොවේ.

සෑම පළාත් පාලන ආයතනයක් ම වරිපනම් පැනවීමට පෙර එම ප්‍රදේශයේ දේපලවල වාර්ෂික වටිනාකම තක්සේරු කළ යුතුය. ඒ සඳහා ද අමාත්‍යවරයාගේ අනුමැතිය අවශ්‍ය වේ. ඇමතිවරයා විසින් මෙවැනි අනුමැතීන් වාර්ෂිකව සෑම ආයතනයකටම ලබාදීම ප්‍රායෝගික නොවන හෙයින් ප්‍රාදේශීය සභා පනතේ 146 හා මහා නගර සභා ආඥා පනතේ 238 වගන්ති අනුව පවත්නා වර්ෂයේ තක්සේරුව ඉදිරි වර්ෂයේ තක්සේරුව ලෙස සභාවේ අනුමැතිය මත පිළිගත යුතුවේ.

එතෙකුදු වුවත් බද්දට හෝ කුලියට දී නොමැති රජයේ දේපල තක්සේරු කළ නොහැකිය. (අර්ථ නිරූපණය පිළිබඳ ආඥා පනතේ 3 වන වගන්තිය, මහා නගර සභා ආඥා පනත 231 හා ප්‍රාදේශීය සභා පනත 136 වගන්තිය බලන්න.)

ඉහතින් සඳහන් කළ පරිදි වරිපනම් අයකළ යුතු ප්‍රතිශතය නිවැරදිව ගණනය කළ පසු ඒ සඳහා ද ඇමතිවරයාගේ අනුමැතිය ලබාගත යුතුය. (මහා නගර සභා ආඥා පනත 230 (1), නගර සභා ආඥා පනත 160 (1) හා ප්‍රාදේශීය සභා පනත 134 (2)) තවද වරිපනම් පැනවීමේදී එකී ප්‍රදේශ සඳහා සපයනු ලබන සේවා සැලකිල්ලට ගෙන වෙනස් ප්‍රතිශතයක්

මත වරිපනම් පැනවිය හැකිය. (මහා නගර සභා ආඥා පනත 230 (1 ආ), නගර සභා ආඥා පනත 160 (2), සහ ප්‍රාදේශීය සභා පනත 134 (2)). වගන්ති බලන්න

මහා නගර සභා සහ නගර සභා මගින් වානිජ හා ව්‍යාපාරික ස්ථාන සඳහා නේවාසික පරිශ්‍ර වලට වඩා වැඩි ප්‍රතිශතයක වරිපනම් පැනවිය හැකිය. (මහා නගර සභා ආඥා පනත 230 (1 අඅ), නගර සභා ආඥා පනත 160 (1 අ)) එහෙත් ප්‍රාදේශීය සභාවන්ට මෙසේ වෙනස් ප්‍රතිශතයන්ගෙන් යුතුව වරිපනම් පැනවිය නොහැකිය. එසේම මහා නගර සභාවලට හා නගර සභාවලට යම් ප්‍රමාණයකට නොවැඩි වාර්ෂික වටිනාකමක් සහිත නේවාසික පරිශ්‍ර/දේපල අමාත්‍යතුමාගේ අනුමැතිය ඇතිව වරිපනම් වලින් නිදහස් කළ හැකිය. (මහා නගර සභා ආඥා පනත 230 (1අආ), නගර සභා ආඥා පනත 160 (1 අආ)) තවද වරිපනම් අයකිරීම පිළිබඳ කාල සීමා කවරේද යන්න, සභා සම්මුතියෙන් නියම කළයුතුය. (මහා නගර සභා ආඥා පනත 230 (2) (ඈ), ප්‍රාදේශීය සභා පනත 134 (6)) නගර සභා සඳහා සමාන ප්‍රතිපාදන සැලසී නැත.

කිසියම් වර්ෂයකදී වරිපනම් ප්‍රතිශතය වෙනස් කරන ලද්දේ නම් ඒ සඳහා අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගත යුතුය. (මහා නගර සභා ආඥා පනත 230 (1), නගර සභා ආඥා පනත 160 (3) සහ ප්‍රාදේශීය සභා පනත 134 (5)). තවද වර්ෂය තුලදී යම් දේපලක කිසියම් භෞතික වෙනසක් සිදුවූ විට තක්සේරුව ප්‍රතිශෝධනය කොට තක්සේරු පොත හා වරිපනම් ලේඛනය සංශෝධනය කළ යුතුය. (මහා නගර සභා ආඥා පනත 237, නගර සභා ආඥා පනත 166, 237, ප්‍රාදේශීය සභා පනත 143)

මෙහිලා විශේෂයෙන් අවධානයේ තබාගත යුතු කරුණක් වන්නේ සෑම තක්සේරුවකම වලංගු කාලය එක් වර්ෂයක් පමණක් බවයි. එහෙත් නව තක්සේරුවක් පිළියෙළ කිරීමට ඇමතිවරයාගේ විධානයක් අවශ්‍ය වේ.

මීට ඉහත දී ද පෙන්වා දුන් පරිදි එබඳු විධානයක් අමාත්‍යවරයාට වාර්ෂිකව ප්‍රායෝගිකව සිදුකළ නොහැකි හෙයින් පවත්නා වර්ෂයේ තක්සේරුව අනුගාමී වර්ෂයේ තක්සේරුව ලෙස සභා සම්මුතියක් මගින් පිළිගැනීමට පළාත් පාලන ආයතන වලට බලය පවරා තිබේ. (මහා

නගර සභා ආඥා පනතේ 238, නගර සභා ආඥා පනතේ 166, සමඟ කියවිය යුතු මහා නගර සභා ආඥා පනතේ 238, ප්‍රාදේශීය සභා පනතේ 146 (1)) වගන්ති බලන්න.

වරිපනම් පැනවීමේදී පළාත් පාලන ආයතන විසින් උක්ත විධිවිධාන සියල්ල ඉතා පැහැදිලිව අධ්‍යයනය කොට අනුගමනය කළ යුතුව ඇත. මෙහිදී බොහෝ පළාත් පාලන ආයතන මෙන්ම පළාත් සභාවන්හි පළාත් පාලන බලධාරීන් ද අදාල පාලන ව්‍යවස්ථා පමණක් පරිහරණය කරණු දැකිය හැකිය. එහෙත් එය ප්‍රමාණවත් නොවේ. අවශ්‍යයෙන්ම අර්ථ කථනය පිළිබඳ ආඥා පනත, වරිපනම් හා තක්සේරුකරණ ආඥා පනත සහ මීට අදාලව ඇති නව නීති වාර්තා සහ ශ්‍රී ලංකා නීති වාර්තා පිළිබඳව අවධානය යොමු කළ යුතුව ඇත.

ii. විශේෂ වරිපනම්;

විශේෂ වරිපනම් යනු ප්‍රධාන වශයෙන් නගර සභා සහ ප්‍රාදේශීය සභා මගින් සපයනු ලබන කිසියම් මහජනෝපකාරී සේවාවක් හෝ පොදු උපයෝගිතා සේවා ගණයට අයත්වන සේවාවකින් ප්‍රයෝජන ලබන ප්‍රතිලාභීන් අරමුණු කොට පනවනු ලබන බද්දකි. මෙය ජල සේවා, විදුලි සේවා, මලාපවහන සේවා ආදී වූ විශේෂිත පහසුකම් සඳහා ප්‍රධාන වශයෙන් යොදාගත හැකිය. කිසියම් පළාත් පාලන ආයතනයක් එකී බල ප්‍රදේශය තුලම හෝ ඉන් පිටත වෙනත් පළාත් පාලන ආයතන බලප්‍රදේශයක කිසියම් සේවාලාභීන් අරභයා යටකී පළාත් පාලන ආයතනයේ එකඟතාව මත මෙම විශේෂ වරිපනම් පැනවිය හැකිය. (නගර සභා ආඥා පනත 130, 131 වගන්ති, ප්‍රාදේශීය සභා පනත 109 සිට 113 දක්වා වගන්ති) මෙයින් සිදුකරන්නේ යටකී විශේෂිත සේවාව සැපයීමේදී දැරීමට සිදුවූ පිරිවැය නැවත අයකර ගැනීමයි.

iii. අක්කර බදු;

අක්කර බදු උපචිත වන්නේ ප්‍රාදේශීය සභාවන්ට පමණි. මෙම බද්දට යටත් වන්නේ හෙක්ටයාර් 5 ට අඩු 1 ට නොඅඩු ප්‍රදේශයක් වන කල්හී ඇමතිවරයා විසින් අදාල ප්‍රදේශය අක්කර බදු පැනවීම සඳහා සුදුසු විශේෂිත ප්‍රදේශයක් ලෙස ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත්කිරීමෙනි. හෙක්ටයාර් 1 ට අඩු ප්‍රදේශ සඳහා අක්කර බදු අදාල නොවේ. හෙක්ටයාර් 5 ට වැඩි ප්‍රදේශ සඳහා ද ඇමතිවරයාගේ අනුමැතිය අවශ්‍ය නොවේ.

අක්කර බදු පැනවීම සඳහා වගාකර ඇති ඉඩම් ප්‍රමාණය පරීක්ෂාකර බලා පසුගිය වසරේ වගාවට යටත් කොට පැවති අදාල වර්ෂයේ බදු සඳහා වන හෙක්ටයාර් ප්‍රමාණය සත්‍යෙක්ෂණය කර ප්‍රාදේශීය සභා පනතේ 146 වගන්තියේ විධිවිධාන ප්‍රකාර සභා යෝජනාවක් ලෙස සම්මත කළයුතුය. අනතුරුව ප්‍රාදේශීය සභා පනතේ 134 (6) වගන්තිය ප්‍රකාර නියම කරනු ලබන වාරික වලින් අක්කර බදු අයකළ යුතුය. අයකළ හැකි අක්කර බදු ප්‍රමාණ ප්‍රාදේශීය සභා පනතේ 134 (3) වගන්තියේ නිශ්චිතව දක්වා ඇත. එතෙකුදු වුවත් බොහෝ ප්‍රාදේශීය සභා මෙම විධිවිධාන මැනවින් අවබෝධ කොට නොගෙන අදාල පැනවීම් කර සාවද්‍ය නිවේදන පළකරන බව නිරීක්ෂණය විය.

iv. වෙළඳ (කර්මාන්ත) බදු;

වෙළඳ බද්ද හෝ කර්මාන්ත බද්ද යනුවෙන් හැඳින්වෙන්නේ ඉංග්‍රීසි භාෂාවෙන් Trade Tax ලෙස හඳුන්වන බද්දයි. පළාත් පාලන නීතියට අනුව මිලදීගෙන විකිණීම හා නිෂ්පාදනය කර විකිණීම ව්‍යාපාරයක් හෝ ව්‍යාපාරයක කොටසක් ලෙසින් සලකනු ලැබේ.

බොහෝ පළාත් පාලන ආයතනයන්හි නිලධාරීන් වෙළඳ බද්ද, කර්මාන්ත බද්ද, ව්‍යාපාර බද්ද හා වෘත්තීය බද්ද යන බදු වර්ග නිශ්චිතව හඳුනාගෙන නැති අතර නීතියෙහි ඊට ලබාදී ඇති අර්ථකථන අධ්‍යයනය කර නිරවුල් අවබෝධයක් ලබාගෙන නැත. ලංකාවේ පළාත් පාලන ආයතන අතුරින් ඉතාම සුළු ආයතන සංඛ්‍යාවක් පමණක් මෙම විෂය නිසිලෙස හඳුනාගත් බවක් පෙනේ. එබැවින් මෙම බදු වර්ග පැහැදිලිව හඳුනාගැනීම පිණිස පහත සඳහන් පරිදි ඉතා සරල ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

සටහන් අංක 13 : බදු වර්ගීකරණය



ම. න. ස 247 අ	ම. න. ස 247 අ	ම. න. ස 247 ඇ (1අ)	ම. න. ස 247 ඇ (1)
න. ස. 164	න. ස. 165 අ	න. ස. 165 ආ (1අ)	න. ස. 165 ආ (1)
ප්‍රා. ස. 149	ප්‍රා. ස. 150	ප්‍රා. ස. 152 (2)	ප්‍රා. ස. 152 (1)

කර්මාන්ත හෝ වෙළඳ බද්දට අයත් වන කර්මාන්ත සඳහා බලපත්‍ර නිකුත් කිරීමක් අවශ්‍ය නොවේ. ප්‍රථමයෙන් පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ පවතින බලපත්‍ර නිකුත් කිරීමක්

අවශ්‍ය නොවන කර්මාන්ත පරීක්ෂා කර උපලේඛණයක් සකස් කර ගත යුතුය. එම උපලේඛණයෙහි ඇතුලත් කර්මාන්ත / වෙළඳාම්, කර්මාන්ත බද්ද පැනවීම පිණිස වෙනම ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත්කළ යුතුවේ. එබඳු කර්මාන්ත / වෙළඳ බද්ද සඳහා ගතහැකි ව්‍යාපාර කිහිපයකට නිදසුන් පහත දැක්වේ.

1. රටඋළු, ගඩොල්, කලුගල්, බ්ලොක් ගල්, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
2. විදුරු උපයෝගී කොටගෙන භාණ්ඩ නිපදවීම.
3. වෙස් මුහුණු කැපීම හා අලෙවිය.
4. බ්‍රේක් ලයිනර් නිපදවීම
5. සපත්තු නිෂ්පාදනය කිරීම.
6. පපඩම් නිෂ්පාදනය හා අලෙවිය.
7. අභ්‍යාස පොත් නිෂ්පාදනය
8. මෙට්ට නිපදවීම
9. කජු මද සකස් කිරීම හා අලෙවිය
10. පරිගණක මෘදුකාංග නිෂ්පාදනය හා අලෙවිය.

මෙසේ කර්මාන්ත බද්දට යටත් කර්මාන්ත වෙනම උපලේඛනයක් මගින් අදාල බදු මුදල සහිතව ගැසට් පත්‍රයේ පළකිරීම විධිමත් ක්‍රියාමාර්ගයයි.

v. ව්‍යාපාර බද්ද;

වෙළඳ බලපත්‍ර, කර්මාන්ත බදු හා වෘත්තීය බදු වලට අයත් නොවන ව්‍යාපාර වලින් එම ව්‍යාපාරයේ වාර්ෂික අදායම මත බදු අයකිරීමට පළාත් පාලන ආයතනවලට බලය ලැබී ඇත. අදාල පළාත් පාලන ආයතනය සභාවේ යෝජනාවක් සම්මත කිරීම මගින් වාර්ෂිකව මෙම බද්ද පැනවිය යුතුය. මේ බද්ද පැනවීම සඳහා පදනම් කරගනු ලබන්නේ අදාල ව්‍යාපාරයේ ගතවූ වර්ෂයේ ලැබීම් වේ. එම බද්ද අදාල වන අදායම් සීමා මව් නීතියේ සඳහන් වේ. එම සීමා ඉක්මවා යාම සිදුකළ නොහැකිය. (මහා නගර සභා ආඥා පනත 247 ඇ (1), නගර සභා ආඥා පනත 165 ආ (1) සහ ප්‍රාදේශීය සභා පනත 152 (1) වගන්ති බලන්න.)

පළාත් පාලන ආයතන විසින් ව්‍යාපාර බදු පැහැදිලිව හඳුනාගෙන උපලේඛනගත කර එම උපලේඛනය පැනවීම් නිවේදනය සමඟ ගැසට් පත්‍රයේ පළකළ යුතුවේ. එහි මෙම බද්ද ගෙවිය යුතු දින හෝ දිනය සඳහන් කළ යුතුය.

vi. සංවර්ධනය නොකළ ඉඩම් මත බදු;

ලංකාවේ සෑම පළාත් පාලන ආයතනයකම පාලන ව්‍යවස්ථාවන්හි පවත්නා ප්‍රතිපාදන මත මෙම බද්ද අයකිරීමට බලය ලැබී ඇත. (මහා නගර සභා ආඥා පනත 247, නගර සභා ආඥා පනත 165 ඇ සහ ප්‍රාදේශීය සභා පනත 153 වගන්ති බලන්න.) මෙම බද්ද සෑම පළාත් පාලන ආයතනයක් විසින්ම වාර්ෂිකව පැනවිය යුතු බද්දකි. පළාත් පාලන ආයතනයට ඇත්තේ අභිමතානුසාරී බලයක් නොවේ. මෙම බද්ද පැනවිය යුතු වන්නේ පහත සඳහන් කරුණු වලට යටත් ඉඩම් මතවේ.

- ඉඩමේ ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් හෝ
- ස්ථාවර නැතහොත් නිතිපතා කෙරෙන ගොවිතැනකට ඒ ඉඩම යොදවා නැත්තම් හෝ
- ඒ ඉඩමේ ගොඩනැගිලිවලට යටවූ බිම් ප්‍රමාණය, සභාව විසින් යෝජනා සම්මතයක් මගින් තීරණය කරන අනුපාතයට වඩා අඩුනම් පමණි.
- මෙම අනුපාතය මහා සභාව විසින් යෝජනා සම්මතයකින් තීරණය කිරීම පළමුවෙන් සිදුකළ යුතුය.
- සමීක්ෂණයක් මගින් බල ප්‍රදේශයේ ඇති ඉඩම් සමීක්ෂණය කර මේ යටතට ගැනෙන ඉඩම් හඳුනාගෙන ඒ එක් එක් ඉඩමේ ප්‍රාග්ධන වටිනාකම තක්සේරු කළ යුතුය.
- පැනවිය හැකි බද්දේ උපරිමය ඉඩමේ ප්‍රාග්ධන වටිනාකමෙන් 2% කි. එය ඉතා විශාල අගයක් වන හෙයින් මෙමගින් පළාත් පාලන ආයතන වෙත ඉතා විශාල ආදායමක් ලැබිය හැකිය.

vii. ඉඩම් විකුණුම් මත බදු;

ලංකාවේ සෑම පළාත් පාලන ආයතනයකටම සිය බල ප්‍රදේශය තුළ වෙන්දේසිකරුවන් හා බ්‍රෝකර්වරුන් විසින් විකුණනු ලබන ඉඩම් සඳහා මෙම බද්ද අයකර ගැනීමට බලය ලබාදී ඇත. ඒ අනුව අදාල ඉඩම විකිණීමෙන් ලද මුදලින් 1% කට සමාන මුදලක් බද්දක් ලෙස

සභාවට ගෙවිය යුතුය. ගෙවිය යුතු වන පුද්ගලයන් වෙත කල් තබා දැනුම්දීමෙන් බද්ද අයකිරීම පළාත් පාලන ආයතනයේ රාජකාරිය වන්නේය. එම ඉල්ලීම නොසලකා හරින්නේනම් හෝ බද්ද ගෙවීමට අපොහොසත් වන්නේ නම් එය අයකර ගැනීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණය වෙත වාර්තා කළ යුතුය. එවිට මහේස්ත්‍රාත් අධිකරණය එසේ අයවිය යුතු මුළු මුදල් ප්‍රමාණය ඒ අධිකරණය විසින් නියම කරන ලද දඩයක් වූ පරිද්දෙන් අයකර සභාවට ලබාදෙනු ඇත. (මහා නගර සභා ආඥා පනත 247 ඉ, නගර සභා ආඥා පනත 165 ඈ සහ ප්‍රාදේශීය සභා පනත 154 වගන්ති බලන්න.) මෙය අමාත්‍යවරයා විසින් නීතිය මගින් පනවා ඇති හෙයින් පළාත් පාලන ආයතන විසින් වාර්ෂිකව පැනවිය යුතු බද්දක් නොවේ.

viii. වාහන හා සත්ව බදු;

යම් පළාත් පාලන ආයතන බල ප්‍රදේශයක් තුළ තබා ඇති හෝ පාවිච්චි කරනු ලබන්නා වූ මහා නගර සභා ආඥා පනතේ 246 වගන්තිය සමඟ කියවිය යුතු 4 වන උපලේඛනයෙහි, නගර සභා ආඥා පනතේ 163 වගන්තිය සමඟ කියවිය යුතු එහි 3 වන උප ලේඛනයෙහි සහ ප්‍රාදේශීය සභා පනතේ 148 වගන්තිය සමඟ කියවිය යුතු 4 වන උප ලේඛනයේ සඳහන් වූ සියළු වාහන හා සතුන් වෙනුවෙන් යථෝක්ත උපලේඛනයේ දැක්වෙන ප්‍රමාණයක වාර්ෂික බද්දක් සෑම පළාත් පාලන ආයතනයක් විසින් ම අයකළ හැකිය.

මෙම බද්ද වාර්ෂිකව පැනවිය යුතුය. එහෙත් එය අනිවාර්යයෙන්ම පනවා අයකළ යුතු බද්දක් නොවේ. මෙම බද්දට ජනාධිපතිවරයා, රජය, සන්නද්ධ හමුදා විසින් භාවිතා කරන වාහන හා සතුන් ඇතුලත් නොවේ. එසේම කිසියම් වාහන වෙළෙන්දෙකු විසින් විකිණීම සඳහා තබා ඇති වාහන ද, රථවාහන ආඥා පනතේ 3 වන වගන්තිය යටතේ බලපත්‍ර ගාස්තු වලට යටත් වන වාහන ද මීට අයත් නොවේ.

මෙම බද්දෙහි මූල්‍ය සීමා පනතෙහි දැක්වෙන ආකාරයට අයකිරීම හැර ඒවා වෙනස් කළ නොහැකිය. උප ලේඛන ගත බදු මුදල් ඉතා සුළු අගයක් ගැනීම හේතුකොට ගෙන මෙය අකර්මන්‍ය බද්දක් සේ සලකා බොහෝ ආයතන ක්‍රියාකරන බව පෙනේ. මහා නගර සභා ආඥා පනතේ 287 වගන්තිය ප්‍රකාර උපලේඛනගත විධිවිධාන ගැසට් පත්‍රයේ පළකරනු ලබන

නියමයක් මගින් සම්මත කිරීමට අමාත්‍යවරයාට බලය පවරා ඇත. එතෙකුදු වුවත් මේ දක්වා කිසිදු පළාතක එකී බදු ප්‍රමාණ සංශෝධනය කර ඇති බවක් නිරීක්ෂණය නොවුණි.

ix. විනෝද බදු;

1946 අංක 12 දරණ විනෝද බදු ආඥා පනතේ (267 අධිකාරය) 2 වන වගන්තියේ ප්‍රතිපාදන වලට අනුව දිවයිනේ සියළුම පළාත් පාලන ආයතන වලට විනෝද බදු පැනවීමට බලය ලබාදී ඇත. එසේ වුවත් එය වලංගු වන්නේ ඉහත සඳහන් ආඥා පනතේ 2 වන වගන්තිය අනුව පළාත් පාලන ආයතනයේ සභාව විසින් තීරණය කරන විනෝද බදු ප්‍රමාණය සඳහා පළාත් පාලන අමාත්‍යවරයා විසින් සිය අනුමැතිය ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසුවය.

මේ අනුව පුද්ගලයෙකු වෙත කිසියම් සිනමා හෝ වෙනත් විනෝද සංදර්ශනයක් නැරඹීම සඳහා නිකුත් කරනු ලබන ප්‍රවේශ පත්‍රයේ මුළු වටිනාකමින් 5 % සිට 25 % දක්වා බද්දක් අයකළ හැකිය. මෙම බද්ද වාර්ෂිකව පැනවිය යුතු නොවේ. මෙම බද්ද විධිමත්ව පැනවීම බොහෝ ආයතන වල සිදුනොවේ. ඊට හේතුව අදාල විධිමත් පරිපාටිය පිළිබඳව පළාත් පාලන ආයතන සතුව ප්‍රමාණවත් දැනුමක් නොමැතිවීමයි. දැනට බොහෝ ගැසට් නිවේදන වල දැකිය හැකි වන්නේ සභාවේ තීරණයක් පළකිරීම පමණි. එයින් මෙම බද්ද අයකිරීමට අවශ්‍ය වලංගුභාවය පළාත් පාලන ආයතන වෙත නොලැබේ.

4.2 බදු කුළී

මහා නගර සභා නගර සභා හෝ ප්‍රාදේශීය සභා සතු නිශ්චල දේපළ වලින් ප්‍රයෝජනය ගැනීමේ අයිතිවාසිකම් බාහිර පුද්ගලයින්ට හෝ ආයතන වලට ලබා දීම වෙනුවෙන් අය කරනු ලබන මුදල් බදු කුළී ලෙස හඳුන්වනු ලැබේ. යට කී සෑම ගණයකටම අයත් පළාත් පාලන ආයතන සතු දේපළ සම්බන්ධ විශේෂිත කොන්දේසි මගින් සීමා කර තිබේ නම් මිස නීතියේ දක්වා ඇති ප්‍රතිපාදන ප්‍රකාර කුළියට දීමට නීතියෙන් ඉඩ සලසා ඇත. බදු කුළී යන්නට පළාත් පාලන ආයතන සතු නිශ්චල දේපළ වර්ග කිහිපයක් ඇතුලත් වේ.

I. පදිංචි (නේවාසික) නිවාස
II. වෙළෙඳසැල් සහ කඩ
III. පොළ වෙළඳාම් ගාස්තු
IV. ටෙන්ඩර් මත කුළී

V. බදුකර
VI. කුලී

I. නේවාසික නිවාස

පළාත් පාලන ආයතන සතු නේවාසික නිවාස දෙවර්ගයක් ඇත.

(අ) පළාත් පාලන ආයතන සතු නිවාස

(ආ) පළාත් පාලන ආයතන සතු නිල නිවාස

නේවාසික නිවාස යනු පළාත් පාලන ආයතනය විසින් ඉදිකරන ලද හෝ වෙනත් පාර්ශ්ව විසින් ඉදිකර පසුව යම් කොන්දේසි වලට යටත්ව සභාව වෙත පවරන ලද නේවාසික ස්ථාන වේ. සභාව සතු නිවාස දේපළ විධිමත් පරිපාටිය යටතේ තෝරා ගන්නා ලද තැනැත්තන් වෙත ගිවිසුම් ප්‍රකාරව යම් ගිවිස ගන්නා කාල පරිච්ඡේදයක් සඳහා කුලියට දිය හැකිය. එහිදී අදාල කුලී ගිවිසුම කෙරේ විශේෂ අවධානයකින් යුතුව කටයුතු කළ යුතු වේ.

පළාත් පාලන ආයතනයකට කිසියම් දානපතියකු විසින් කිසියම් නිශ්චිත කාර්යයක් සඳහා ඉඩම් ගොඩනැගිලි හෝ වෙනත් දේපළ පරිත්‍යාග වශයෙන් ලබා දිය හැකිය. එබඳු දේපල පරිත්‍යාග කරන ලද සාධන පත්‍රයේ සඳහන් කොන්දේසි ප්‍රකාර පවත්වාගෙන යා යුතු වේ. එබඳු දේපළ කුලියට හෝ බද්දට දීමේ හැකියාවක් පළාත් පාලන ආයතනයට නොලැබේ. නේවාසික ස්ථාන ලෙස ප්‍රධාන වශයෙන් සැලකෙන්නේ පළාත් පාලන ආයතන මගින් ඉදි කරන ලබන නිවාස වේ. මෙබඳු නිවාස බොහෝ පළාත් පාලන ආයතන සතුව සිය ආදායම් මාර්ග ලෙස පවතී. මෙම නිවාස කුලී පදනම මත ගිවිසුම් ගතව නිවැසියන්ට ලබා දුන් පසු මාසිකව හෝ ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව එහි කුලිය සභාවට ගෙවිය යුතුය. එසේ ගෙවීම අඛණ්ඩව සිදු කළ යුතු අතර කිසියම් හේතුවක් මත ගෙවීම් පැහැර හැරිය හොත් නියමිත දිනෙන් දින 14 කට පසු එම නිවසේ වංචල දේපළ තහනමට ගැනීමටත් දිගින් දිගටම කුලී ගෙවීම් පැහැර හැරි විට නිවසේ නිවැසියාව අවසන් කර එය සභාවට පවරා ගැනීමටත් අදාල පළාත් පාලන ආයතනයට නීතියෙන් බලය ලැබී ඇත.

පළාත් පාලන ආයතන විසින් සිය කාර්යය මණ්ඩල සඳහා පදිංචිය පිණිස ලබා දෙන නිල නිවාසද නේවාසික නිවාස ලෙස සැළකේ. එහෙත් එම නිවාස වල අදාල කාර්යය මණ්ඩල

සාමාජිකයන්ට පදිංචි විය හැක්කේ එම ආයතනයේ සේවය කරන කාල පරිච්ඡේදය තුළදී පමණි. ඒ සඳහාද ගිවිසුම් ගතව විධිමත් ක්‍රියා පටිපාටිය අනුගමනය කොට නියමිත කුලී ගෙවිය යුතු වේ.

II. වෙළෙඳසැල් සහ කඩ

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන සතුව පොදු වෙළෙඳසැල්, කඩකාමර, ව්‍යාපාරික පරිශ්‍ර, පොළවල්, වෙළෙඳ මැසි ආදී වශයෙන් කුලී හෝ බදු කුලී පදනම මත බාහිර පුද්ගලයන්ට හෝ ආයතන වලට ව්‍යාපාරික කටයුතු සඳහා ලබා දෙන පරිශ්‍ර රාශියක් ඇත. මහා නගර සභා ආඥා පනත, නගර සභා ආඥා පනත හා ප්‍රාදේශීය සභා පනත යන ප්‍රධාන නීති මගින් මෙබදු වෙළෙඳපොළ හා කඩ කාමර කුලියට හෝ බද්දට දීමට අදාළ ප්‍රතිපාදන පැහැදිලිව දක්වා ඇත. නීතියේ ප්‍රතිපාදන ප්‍රකාර සියලුම පළාත් පාලන ආයතන අතුරු ව්‍යවස්ථාවක විධි විධාන මත පොදු වෙළෙඳපොළ සඳහා බදු කුලී තීරණය කළ යුතු වේ. ප්‍රා.ස. පනතේ 126 වගන්තියේ xii අනුඡේදය, න.ස. ආඥා පනතේ 157 වගන්තියේ (ii) උප වගන්තිය හා ම.න.ස. ආඥා පනතේ 272 වගන්තියේ (28) උප වගන්තිය ප්‍රකාර වෙළෙඳ පොළ අතුරු ව්‍යවස්ථා තිබිය යුතු අතර ඒවාහි කුලී මුදල ද අතුරු ව්‍යවස්ථාවට ඇතුළත් කළ යුතුය.

එතකුදු වුවත් ලංකාවේ බොහෝ පළාත් පාලන ආයතන මෙම නීති ප්‍රතිපාදන ප්‍රකාර පනවා ඇති අතුරු ව්‍යවස්ථා උපයෝගී කොටගෙන වෙළෙඳ පොළවල් සම්බන්ධව කටයුතු කළ ද ඒවාහි කුලී හෝ ගාස්තු අතුරු ව්‍යවස්ථාවන්ට ඇතුලත් කර නැත. ටෙන්ඩර් මගින් වෙළෙඳ පොළ කඩකාමර බදු දීමත් පෙර මුදල් (Key money) ක්‍රමය යටතේ විශාල මුදලක් එකවර අය කිරීමත් සිදු කෙරේ. එමගින් විශාල වශයෙන් මුදල් උපයා ගැනීම සිදු කළද අතුරු ව්‍යවස්ථා ඒ අනුව සංශෝධනය කොට ප්‍රතිපාදන සලසා ගෙන නැත.

මේ තත්ත්වය හේතු කොට ගෙන එවක සිටි පළාත් පාලන කොමසාරිස්වරයා විසින් 1980 අංක 46 දරන චක්‍රලේඛනය මගින් පොදු වෙළෙඳපොළ සම්බන්ධ අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීමට උපදෙස් දෙනු ලැබිය. එහෙත් ඉන් වැඩි ප්‍රයෝජනයක් නොලද හෙයින් 2005 වසරේදී අමාත්‍යවරයාගේ උපදෙස් මත පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යංශයේ ලේකම් විසින් චක්‍රලේඛනයක් මගින් දැනට සිදුවන අවභාවිතයන් වැළැක්වීමට අතුරු ව්‍යවස්ථා සම්පාදනය

කරන ලෙස උපදෙස් දෙන ලදී. එහෙත් බොහෝ ආයතන මෙම උපදෙස් නොතකා පුරුදු පරිදි සාවද්‍ය භාවිතයන්ම ක්‍රියාත්මක කරමින් සිටීම බරපතල වරදකි.

III. පොළ වෙළඳාම් ගාස්තු

පළාත් පාලන ආයතන වලට අයත් භූමි වල හා ගොඩනැගිලි වල මහජන පොළ පවත්වාගෙන යනු ලැබේ. මෙබඳු පොළවල් සඳහා නීතියේ ප්‍රතිපාදන අනුව කුලී හෝ ගාස්තු අය කළ හැකිය. එම අදාළ ප්‍රතිපාදන ප්‍රා.ස. පනතේ 126 වගන්තියේ (xii) අනුඡේදයේ පැහැදිලිව දක්වා ඇත. කෙසේ වෙතත් රටේ සෑම පළාතකම තිබෙන පළාත් පාලන ආයතන අතුරු ව්‍යවස්ථා සකස් කිරීමකින් තොරව පහසුකම් පවා නොමැතිව මහජනතාව මත බර පටවමින් අසාධාරණ ලෙස විශාල මුදලක් උපයනු ලබයි. බොහෝ ආයතන මෙම පොළවල් වල බදු අය කිරීම වාර්ෂිකව විවිධ පුද්ගලයින්ට බදු දෙමින් නීතියට පරිබාහිරව කටයුතු කරනු දැකිය හැකිය.

IV. ටෙන්ඩර් මත කුලී

බොහෝ පළාත් පාලන ආයතන සතු පොදු වෙළෙඳපොළ කඩ කාමර බදු දීම කරනු ලබන්නේ ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමෙන් ලැබෙන පෙර ගෙවීම් හා මාසික කුලිය මතය. එහෙත් මීට සරිලන පරිදි අතුරු ව්‍යවස්ථා සංශෝධනය කර නැත. බොහෝ ආයතන වෙළෙඳපොළ, කඩ කාමර සඳහා ගිවිසුම් නිසි ලෙස නඩත්තු නොකරන අතර නිතිපතා ගිවිසුම් ප්‍රකාර කුලී අය කිරීම ද සිදු නොකරති. පළාත් පාලන ආයතන වල බදු කුලී ලේඛන වල විශාල හිඟ මුදල් පැවතීම සාමාන්‍ය කරුණක් බවට පත් වී ඇත. මීට අදාලව නීතියේ සඳහන් ප්‍රබල ප්‍රතිපාදන බොහෝ නිලධාරීන් නොදැන සිටීම එයට ප්‍රධාන හේතුවයි.

V. බදුකර

සභාව සතු දේපල බදුකරයක් යටතේ ප්‍රයෝජනයට ගැනීම පුද්ගලයන්ට පැවරූ විට ලැබෙන කුලී මුදල් මේ යටතට ගැනේ. ඇතැම් පළාත් පාලන ආයතන සතු ඉඩම්, ගොඩනැගිලි හා වගා බිම් මෙසේ කාලීන බදුකර මත බාහිර පුද්ගලයන්ට ලබා දී ඇත. මෙබඳු බදුකර කාලීනව තක්සේරු කර ගිවිසුම් යළි විමසුමට ලක් කර අදාල ලේඛන නිසි පරිදි නඩත්තු කිරීම පළාත් පාලන ආයතනයේ වගකීමකි. එහෙත් එම ක්‍රියාමාර්ග නියමිත පරිපාටිය අනුව සිදුවන බවක් නොපෙනේ.

VI. කුලී

සභාව සතු දේපල ඉතා කෙටි කාල සීමාවක් සඳහා භුක්ති විඳීමට දී ඇති අවස්ථා මින් අදහස් කෙරේ. උදා:- නගර ශාලා, උත්සව ශාලා, ක්‍රීඩා පිටි ආදිය පැය කිහිපයකට හෝ දින කිහිපයකට පාවිච්චි කිරීමට ඉඩ දීම වෙනුවෙන් මුදල් අය කිරීම් එයට අයත්වේ.

මේ කුමන ආකාරයක බදු දීමක් වුවද ප්‍රධාන නීතියේ හා අතුරු ව්‍යවස්ථා ප්‍රතිපාදන මත ඉතා කාර්යක්ෂමව කළමනාකරණය කළ යුතු වේ. වර්තමාන ලංකාවේ බහුතර පළාත් පාලන ආයතන සංඛ්‍යාවක දෙවන ප්‍රධාන ආදායම් මූලය ලෙස මෙය පවතී. එහෙත් අතුරු ව්‍යවස්ථා නොමැති වීම, කාලීනව කුලිය තක්සේරු කර ගිවිසුම් වලට ඇතුළත් නොකිරීම, අයිතිය වෙනස් කිරීමට ඉඩ සැලසීම, අවිධිමත් පාලනය, නිසි නඩත්තුවක් නොමැති වීම වැනි කරුණු හේතු කොට ගෙන මෙම වැදගත් ආදායම් මාර්ගය නිසි ලෙස කළමනාකරණය කර ගැනීමට පළාත් පාලන ආයතන අපොහොසත් වී ඇත.

4.3 බලපත්‍ර ගාස්තු

i. වෙළඳ බලපත්‍ර;

ලංකාවේ සෑම පළාත් පාලන ආයතනයකටම සිය බල ප්‍රදේශයේ පවත්නා වෙළඳාම් විෂයෙහි බලපත්‍ර නිකුත් කිරීමට බලය පවරා ඇත. මහා නගර සභා ආඥා පනතේ 247 අ, නගර සභා ආඥා පනතේ 164 සහ ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්ති ප්‍රකාර මෙම බලය ලැබී ඇති අතර එසේ එකී වෙළඳාම් සඳහා බලපත්‍ර නිකුත් කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා තිබිය යුතුය. නීතියේ ඉතා පැහැදිලිව දක්වා ඇති පරිදි මෙම බලපත්‍ර ගාස්තු වාර්ෂිකව සභාවේ සම්මුතියක් මාර්ගයෙන් නියම කොට පැනවිය යුතුය. මෙසේ අදාල බලපත්‍ර ගාස්තුව සභාව විසින් තීරණය කිරීමේදී එසේ බලපත්‍රය දෙනු ලබන,

(අ) ස්ථානයේ වාර්ෂික වටිනාකම,

(ආ) ඒ වෙළඳ ව්‍යාපාරයේ පිරිවැටුම,

(ඇ) ඒ ඒ වෙළඳ ව්‍යාපාරයෙන් උපයනු ලැබිය හැකි ලාභය,

(ඈ) ඒ වෙළඳ ව්‍යාපාරය මගින් සපයනු ලබන බඩුවල හෝ සේවාවල අත්‍යාවශ්‍ය ස්වභාවය,

සැලකිල්ලට ගත යුතුය.

එහෙත් වර්තමානයේ කිසිම පළාත් පලාන ආයතනයක් යටකී මූලධර්ම මත සභා සම්මුතියකින් මෙම ගාස්තු තීරණය කරනු නොලැබේ. සිදුවන්නේ එකම ගැසට් නිවේදනය, දිනය පමණක් වෙනස්කර ගැසට් පත්‍රයේ පළකර බලපත්‍රයක් නොව රිසිට් පතක් නිකුත් කර මුදල් එකතු කර ගැනීමයි. මෙම බලපත්‍ර නිකුත් කිරීම සඳහා නීතියට අනුව අදාල වෙළඳාම් අධීක්ෂණයට, නියාමනයට, පරීක්ෂා කිරීමට හා පාලනය කිරීමට අවශ්‍ය අතුරු ව්‍යවස්ථා තිබීම අනිවාර්ය අවශ්‍යතාවයකි. එහෙත් දිවයිනේ බොහෝ පළාත් පාලන ආයතන අතුරු ව්‍යවස්ථා වලින් ආවරණය නොවන දීර්ඝ වෙළඳාම් ලේඛණයක් ගැසට් පත්‍රයේ පළකර නීතියට පටහැනි අයුරින් ගාස්තු එකතුකර ගනී. මෙහිදී පළාත් පාලන ආයතන මගින් නිකුත් කරන රිසිට්වල කිසිදු නීතිමය වලංගුභාවයක් නොමැත.

ඉහත දැක්වූ කරුණු වලට අමතරව බොහෝ පළාත් පාලන ආයතන අන්තරායකාරී වෙළඳාම්, සහ අන්තරායකාරී හා අප්‍රසන්න වෙළඳාම් සඳහා බලපත්‍ර ගාස්තු ගෙවිය යුතු බවට දීර්ඝ

ව්‍යාපාර ලැයිස්තු ගැසට් පත්‍රයේ පළකරනු ලබයි. අන්තරායකාරී හා අප්‍රසන්න ව්‍යාපාර හඳුනාගෙන එම වෙළඳාම් අධීක්ෂණයට, නියාමනයට, පරීක්ෂා කිරීමට හා පාලනය කිරීමට අවශ්‍ය අතුරු ව්‍යවස්ථා සෑම පළාත් පාලන ආයතනයක් විසින් ම සකස් කරගත යුතුය. එසේ නීතියේ නියම කොට ඇති පරිපාටිය අනුගමනය කිරීමෙන් පසුව පමණි බලපත්‍ර ගාස්තු පනවා අයකිරීම් කළහැකි වන්නේ. තවදුරටත් මෙම ආයතන පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය වූයේ නීතියේ පැහැදිලිව දැක්වෙන පරිදි බලපත්‍ර ගාස්තු අයකළ හැක්කේ හෙවත් උපචිත වන්නේ බලපත්‍රයක් නිකුත් කිරීමෙන් පසුව වුව ද බොහෝ ආයතන හිඟ බලපත්‍ර ගාස්තු වසර ගණන් ආදායම් ලේඛණ වල පවත්වගෙන යන බවයි. මෙයින් පෙනීයන්නේ කිසිදු නීතියක් නොමැතිව බලපත්‍ර ගාස්තු අවිධිමත්ව පනවන පළාත් පාලන ආයතන බලපත්‍රයක් නිකුත් නොකර රිසිට් පතක් දී මුදල් එකතු කර ගැනීමෙන් අදාල ව්‍යාපාර මහජන සෞඛ්‍යයට අහිතකර ද යන්න ගැන කුමන සොයා බැලීමක් වත් නොකරන බවත් ණයට බලපත්‍ර නිකුත් කර ඇති බවත්ය. මෙම තත්වය මෙරට නීතිය බරපතල ලෙස ප්‍රසිද්ධියේ උල්ලංඝණය කිරීමක් නොවන්නේ කෙසේද ?

(කරුණාකාර (1) ටී. ඕ. ඩී. ජෙන්සන් එරෙහිව දෙහිවල ගල්කිස්ස නගර සභාව 56 නව නීති වාර්තා 445. (2) අප්පුවා එදිරිව හේමපාල 39 නව නීති වාර්තා 445. (3) ගාල්ල නගරාධිපති එදිරිව ද එස්ටේට් ඇන්ඩ් මෝටර් ඉංජිනියරින් කම්පනි - 42 නව නීති වාර්තා 179 (4) පොල්හේන රිප් ගාඩන් එදිරිව ආදායම් පරීක්ෂක මාතර නගර සභාව 2004 (iv) ශ්‍රී ලංකා නීති වාර්තා 362 බලන්න)

ii. බලය පවරන ලද බලපත්‍ර ගාස්තු;

මේ ගණයට අයත් බලපත්‍ර ගාස්තු ලෙස 184 වන අධිකාරය වූ 1887 අංක 6 දරන බනිජ තෙල් ආඥා පනත යටතේ විෂයභාර අමාත්‍යවරයා විසින් පවරන ලද බලය මත බනිජ තෙල් අලෙවි සැල්වලට බලපත්‍ර ගාස්තු නියමකර අයකර ගැනීමට ඇති විධිවිධානයන් සහ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ විෂයභාර අමාත්‍යවරයා විසින් පරිසර බලපත්‍ර ගාස්තු පනවා ඒවා අයකර ගැනීම පළාත් පාලන ආයතන වෙත පවරා තිබීම දැක්විය හැක. ඒ අනුව පළාත් පාලන ආයතන එම ගාස්තු වාර්ෂිකව පැනවීම හා ගැසට් නිවේදන මඟින් පළකිරීම අවශ්‍ය නොවන අතර නියමිත ස්ථානවලින් ඒවා එකතුකර ගැනීම පමණක් කළ යුතුවේ.

iii. ප්‍රසිද්ධ රැඟුම් බලපත්‍ර;

1912 අංක 07 දරණ ප්‍රසිද්ධ රැඟුම් පාලන ආඥාපනතට අනුව බොහෝ පළාත් පාලන ආයතන ප්‍රසිද්ධ රැඟුම් සඳහා ගාස්තු පනවා අයකිරීම කරනු ලැබේ. යථෝක්ත නීතියේ 3 වන වගන්තිය ප්‍රකාර අමාත්‍යවරයා විසින් පනවනු ලබන රීති ප්‍රකාර බලපත්‍ර නිකුත් කිරීම හා ඊට අදාල ගාස්තු අයකිරීම සිදුකළ යුතුය. මහා නගර සභා සම්බන්ධයෙන් පමණක් අමාත්‍යවරයා විසින් පනවන රීති බල නොපවත්නා අතර මහා නගර සභා වෙත එම ආඥා පනතේ 272 - වගන්තියේ 18 වන ඡේදය පරිදි අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට දෙන ලද බලය ප්‍රකාර ප්‍රසිද්ධ රැඟුම් සඳහා ද අතුරු ව්‍යවස්ථා පැනවීමටත් අමාත්‍යවරයා සතු බලතල එම ආයතන වෙත පවරාදීමත් යථෝක්ත පනත මගින් සිදුකර ඇත.

කෙසේ වෙතත් සෙසු පළාත් පාලන ආයතන සඳහා බල පවත්වනුයේ 1914 දී පමණ සකස් කළ රීති වන අතර ඉන් පසුව රීති පනවා හෝ සංශෝධනය කර නැති හෙයින් එකල පැවති ආයතනවලට හැර සෙසු ආයතන වලට සහා තීරණයන් මත මෙම බලපත්‍ර ගාස්තු පනවා අයකිරීම නීතියට අනුකූල නොවේ.

iv. සමාජ ශාලා බලපත්‍ර;

ලංකාවේ පළාත් පාලන ආයතන වෙත සමාජ ශාලා සඳහා බලපත්‍ර නිකුත්කර ගාස්තු අයකිරීමේ බලය 1975 අංක 17 දරණ සමාජ ශාලා සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ පනතේ 4 වන වගන්තියෙන් පැවරී ඇත. එහිදී අමාත්‍යවරයා විසින් නියම කරන ලද උපරිමයකට මෙම ගාස්තු අයකර ගැනීම පළාත් පාලන ආයතනවල කාර්යය වේ. එහෙත් සමහර පළාත් පාලන ආයතන ගාස්තු නියම කරමින් තමන් විසින් ගැසට් නිවේදන ප්‍රසිද්ධ කරනු දක්නට ලැබේ. මෙම නිවේදන කිසිවක් නීතියට අනුකූල නොවන අතර පළාත් පාලන ආයතනවලට ඇමතිවරයා පනතින් නියම කර ඇති සමාජශාලා බලපත්‍ර ගාස්තු අයකරනු විනා පැනවීමට බලයක් දී නැත.

v. වෙන්දේසිකරුවන් හා බ්‍රෝකර්වරුන්ගේ බලපත්‍ර;

ලංකාවේ පළාත් පාලන ආයතන වෙත වෙන්දේසි කරුවන්ගෙන් හා බ්‍රෝකර්වරුන්ගෙන්ද වෙන්දේසිකරු හා බ්‍රෝකර්වරුන් ගෙන් ද වාර්ෂික බලපත්‍ර නිකුත්කර ගාස්තු අයකර ගැනීමට 1889 අංක 15 දරණ වෙන්දේසිකරුවන් හා බ්‍රෝකර්වරුන්ගේ ආඥා පනතේ 2 වන වගන්තියෙන් බලය පැවරී ඇත. එම ආඥා පනතේ 4 වන වගන්තියෙන් ඒ ඒ පළාත් පාලන ආයතන සඳහා විෂයභාර අමාත්‍යවරයා මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ එකඟතාව මත වාර්ෂික බලපත්‍ර ගාස්තු පරිමාව නියම කරගත යුතු බව දක්වා ඇත. එසේම එම වගන්තියේ මහා නගර සභා සම්බන්ධයෙන් රු 250/- ක උපරිමයක් ද සෙසු පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් රු 60/- ක උපරිමයක් ද සහිත ගාස්තු චක්‍රයක් දක්වා ඇත. මෙයට ශතවර්ෂ 1 1/4 ක කාලයක් ගතවී ඇත ද අද දක්වා මෙම ගාස්තු කාලානුරූපව සංශෝධනය කිරීමට පළාත් පාලන බලධාරීන් ක්‍රියාකොට නොමැති වීම විමතියට කරුණකි.

vi. ප්‍රචාරක දැන්වීම් පුවරු බලපත්‍ර ගාස්තු;

මහා නගර සභා ආඥා පනත 247 අ, නගර සභා ආඥා පනත 164 , ප්‍රාදේශීය සභා පනත 149 වගන්ති ප්‍රකාර ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා ද එම ස්ථානයේ වාර්ෂික වටිනාකම පදනම් කරගෙන බලපත්‍ර ගාස්තු නියම කොට ඒ සම්බන්ධව වූ අතුරු ව්‍යවස්ථා විධිවිධාන ප්‍රකාර වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමේ බලය පළාත් පාලන ආයතන වෙත ලැබී ඇත. මේ අනුව ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා මහා නගර සභාවක රු 5000 /- ක උපරිමයකට යටත්ව ද, නගර සභා සහ ප්‍රාදේශීය සභා සඳහා රු 1000/- ක උපරිමයකට යටත්ව ද වාර්ෂික බලපත්‍ර ගාස්තු අයකර අතුරු ව්‍යවස්ථා විධිවිධාන සපුරා තිබේ නම් බලපත්‍ර නිකුත් කළ හැකිය. මෙබඳු ස්ථාන, දේපල තක්සේරු කිරීම පිළිබඳ විධිවිධාන වරිපනම් හා තක්සේරු ආඥා පනතේ 15 (2) වගන්තිය ප්‍රකාර පැහැදිලිව ලබාදී ඇත. එහෙත් වර්තමාන ප්‍රවණතාව වන්නේ දැන්වීම් පුවරුවේ වර්ග ප්‍රමාණය අනුව ගාස්තුව තීරණය කිරීමය. මේ සම්බන්ධව පනවා ඇති සම්මත අතුරු ව්‍යවස්ථා පවා මෙම සාවද්‍ය මතයට තහවුරු කරමින් සකස් වී තිබීම දෝෂ සහගත පරිචයකි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඇතැම් දැන්වීම් පුවරු සඳහා අති විශාල මුදල් ප්‍රමාණයන් නීතියට පටහැනි අයුරින් අයකිරීම සිදුවේ.

4.4 සමහර සේවාවන් වෙනුවෙන් වූ ගාස්තු

i. ලියාපදිංචි කිරීමේ හා සහතික කිරීමේ ගාස්තු;

පළාත් පාලන ආයතන බල ප්‍රදේශයන්හි නිශ්චල දේපල බෙදී ඒවායේ අයිතිය වෙනස් වන අවස්ථාවන්හිදී ඔප්පු සාරාංශයක් නොතාරිස්වරයෙකු විසින් සහතික කර ඉදිරිපත් කළ පසු එහි නව අයිතිය වරිපනම් ලේඛනයෙහි සංශෝධනය කිරීම හෝ ඇතුළු කිරීම ලියාපදිංචි කිරීමක් ලෙස සිදුකරනු ලැබේ. මෙය ඉතා සරල ක්‍රියාමාර්ගයක් වන අතර ඒ සඳහා ආදායම් පරීක්ෂකවරයා ලුහුඬු කේෂ්ත්‍ර පරීක්ෂාවක් කිරීම පමණක් අවශ්‍ය වේ. සභා සම්මුතියක් මගින් මෙහිදී ලියාපදිංචි කිරීම් සඳහා සාධාරණ මුදලක් අයකිරීම සාමාන්‍ය පරිචය ලෙස පැවතුනි. එහෙත් වර්තමානයේ මහා නගර සභා, නගර සභා මෙන්ම ප්‍රාදේශීය සභා ද මෙම කාරණය බල ප්‍රදේශයේ ජනාතව ට මහත් හිරිහැරයක් වන ලෙස ඉතා ඉහළ මුදල් අයකිරීමේ ආදායම් මාර්ගයක් බවට පත්කර ගෙන ඇත.

එම අදාල ආකෘති පත්‍රය විකිණීම සිදුකරන අතර එය රු 500/-, 2500/- අතර ගණන්වලට අලෙවිකරණු ලබයි. එසේම ලියාපදිංචිය සඳහා ද නේවාසික හා වාණිජ ස්ථාන ලෙස බෙදා ඒ ඒ දේපල වලින් වර්තමාන වටිනාකමින් යම් ප්‍රතිශතයක් මත විශාල ලෙස මුදල් අය කිරීම පිණිස ගැසට් නිවේදන පළකර තිබීම දක්නට ලැබේ. මෙසේ දේපල බෙදී ලියාපදිංචි වී සංවර්ධනය වීම පළාත් පාලන ආයතනයකට ආශිර්වාදයකි. ඉඩම් සංවර්ධනය වී දේපල ඇති වී සිය වරිපනම් හා බදු පරිමාව වර්ධනය වීමට ඉවහල් වන එබඳු ක්‍රියාමාර්ග දිරිගැන්වීම වෙනුවට නීත්‍යානුකූල නොවන ක්‍රියාමාර්ග තුලින් අධෛර්ය කිරීම බෙහෙවින් නිශේධනාත්මක ප්‍රවණතාවයකි.

ii. විදි රේඛා සහතික නිකුත් කිරීමේ ගාස්තු;

පළාත් පාලන ආයතන බල ප්‍රදේශයන්හි පදිංචි ජනතාව සිය දේපලෙහි ඉදිකිරීමක් හෝ සංවර්ධනය කිරීමක් අපේක්ෂාවෙන් බැංකු ණය ලබාගැනීමේදී එකී මූල්‍ය ආයතන අනිවාර්යයෙන්ම විදි රේඛා සහ නොපවරා ගැනීම් සහතික අදාල පළාත් පාලන ආයතනයෙන් ලබාගෙන හෝ ඉදිරිපත් කරන ලෙස සිය සේවා දායකයින්ට දැනුම් දෙති. මෙහිදී ඔවුන් පළාත් පාලන ආයතන වෙත පැමිණෙන්නේ ඒ කෙබඳු ලියවිල්ලක්ද යන්න පිළිබඳව කිසිදු දැනුමකින් තොරවය.

ලංකාවේ පළාත් පාලන ආයතන අතුරින් විදි රේඛා තීරණය කොට අනුමත කර ඇත්තේ කොළඹ මහා නගර සභාව ඇතුළු තවත් ආයතන ඉතා සීමිත ප්‍රමාණයක් පමණි. සෙසු කිසිම පළාත් පාලන ආයතනයක විදි රේඛා නියම කොට සම්මත කර නැත. එතෙකුදු වුවත් අද සෑම පළාත් පාලන ආයතනයක්ම ණය මුදලක් අපේක්ෂාවෙන් බැංකුවට යන බදු ගෙවන්නන්ගෙන් ඉතා අසාධාරණ විශාල මුදලක් කිසිසේත් භෞතිකව නොපවතින කරුණක් වෙනුවෙන් අයකිරීම මවිතය දනවන සුළු ක්‍රියාවකි. පළාත් පාලන ආයතන මෙහිදී කළ යුත්තේ තම ආයතනය විදි රේඛා නියම කොට නොමැති බව ඉතා කෙටි නිවේදනයකින් දැනුම් දීමයි. මෙය නීතිය ඉදිරියේ අසාධාරණ ලෙස පොහොසත් වීමක් (injust enrichment) නමින් හැඳින්වෙන චෝදනාව එල්ලකළ හැකි වරදකි.

iii. නොපවරාගැනීම් සහතික ගාස්තු;

මෙම සහතිකය ද බැංකු ණය අපේක්ෂාවෙන් බැංකු හා මූල්‍ය ආයතන වෙත යන පාරිභෝගිකයින්ගෙන් අපේක්ෂා කරන සහතිකයකි. මෙහි අර්ථය වන්නේ වරිපනම් නොගෙවීම මත යථෝක්ත දේපළ පවරාගැනීමට ලක්වූ දේපලක් ද යන්න පිළිබඳව අදාල පළාත් පාලන ආයතනය විසින් නිකුත් කළ යුතු සහතිකයකි. මෙයද අතිශය සරල සහතිකයකි. වරිපනම් ලේඛණය බලා ඒ බව දැනුම්දීම එහිදී කළයුතු වුවත් මෙමගින් ද ඉතා අසාධාරණ ලෙස මුදල් අයකිරීමට පළාත් පාලන ආයතන පෙළඹී ඇති බව නිරීක්ෂණය විය.

iv. ගිනි වැලැක්වීමේ ගාස්තු;

ගිනි නිවීමේ හා වැලැක්වීම් තාක්ෂණය සහිත පළාත් පාලන ආයතන එකී ආයතන ආශ්‍රිතව පිහිටි කුඩා පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල පිහිටි දේපළ, කර්මාන්ත ශාලා හා දේපල වල ආරක්ෂාව සඳහා ගිනි නිවීම් ප්‍රවීණත්වය හිමි ආයතනය සමඟ ගිවිසුම්ගතව ගිනි වැලැක්වීම් සේවා ලබාගැනීම සිදුවේ. මීට ගිනි නිවීම් සේවා සම්මත අතුරු ව්‍යවස්ථා මඟින් ඉඩසලසා ඇත. ඒ අනුව ගිනි නිවීම් සේවාව හා වැලැක්වීමේ උපාය මාර්ග පිළිබඳ සිය ආයතන බල ප්‍රදේශයේ ආයතන ආවරණ සඳහා වාර්ෂිකව කිසියම් මුදලක් ගෙවීම දැකිය හැකිය. මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථා ප්‍රකාර මෙම රැඳවුම් ගාස්තුව මව් නගර

සභාවේ සිට සැතපුම් 25 ක අර්ධ විශ්කම්භයක් සහිත ප්‍රදේශයක් සඳහා වාර්ෂිකව රු 10,000/- කි. එය ස්ථානීය ගිනි නිවීම් සේවා ගාස්තුවලට අමතර වශයෙනි.

vi. වැසිකිළි අප ජල ප්‍රවාහන සේවා

අප ජල ප්‍රවාහන සේවා පහසුකම් ඇති ආයතන සිය බල ප්‍රදේශ තුළ හා ඉන් පිටත නේවාසික හා ව්‍යාපාරික ස්ථාන වලින් ඉවත් කරන අප ජල පරිමාව මත පදනම් කරගත් ගාස්තු අය කිරීම සිදුකෙරේ. කොළඹ, දෙහිවල, ගල්කිස්ස හා කොලොන්නාව නගර සභා බල ප්‍රදේශවල මලාපවහන පද්ධති බොහෝ ප්‍රදේශ ආවරණය වන ලෙස ක්‍රියාත්මක වුවද රටේ බොහෝ පළාත් වල මලාපවාහන සේවා නොමැති හෙයින් මෙම අප ජල ප්‍රවාහන ගලි බවුසර් සැපයීම් සේවාව ක්‍රියාත්මක වේ. මෙම ගාස්තු සභාව අනුමත කර ගැසට් නිවේදන මගින් ප්‍රසිද්ධ කිරීමෙන් අනතුරුව අදාල අයකිරීම් සිදුකෙරේ.

vii. ආදාහනාගාර ගාස්තු

ආදාහනාගාර පහසුකම් සහිත පළාත් පාලන ආයතන මෘතදේහ ආදාහනය සඳහා ඊට වැයවන පිරිවැය පදනම් කර ආදාහනාගාර ගාස්තු නියම කර සභා සම්මුතියක් මගින් අනුමත කර ගැසට් නිවේදනයක් මගින් ප්‍රසිද්ධියට පත්කර අදාල ගාස්තු අයකරනු ලැබේ. මෙය පළාත් පාලන ආයතනය සැපයීමට බැඳී සිටීම මූලික සේවාවකි.

මෙම පරිච්ඡේදයෙහි අවධානය යොමුකරන ලද්දේ ලංකාවේ පළාත් පාලන ආයතන වෙත නීතියෙන් පැවරී ඇති ප්‍රධාන ස්වයං උත්පාදන ආදායම් පිළිබඳ නෛතික ස්වරූපය පැහැදිලි කිරීමට ය. එම නෛතික විධිවිධාන සැකෙවින් හෝ විස්තර කිරීම අවශ්‍ය වූයේ මෙම අධ්‍යයනයේ මුඛ්‍ය පරමාර්ථය වන පළාත් පාලන ආයතනයන්හි වරිපනම්, බදු, කුලී, බලපත්‍ර ගාස්තු හා සේවා ගාස්තු පැනවීම හා අයකිරීම පිළිබඳව පවත්නා වර්තමාන පරිචයන් හි ඌණතා හඳුනාගැනීම පහසුකරලීමට යි.

05 පරිච්ඡේදය

5. පර්යේෂණ අධ්‍යයනයේදී අනාවරණය වූ කරුණු

5.1 වරිපනම්

මහා නගර සභා;

පර්යේෂණයට බඳුන් වූ මහා නගර සභාවන්හි වරිපනම් පැනවීම ඊට අදාල නෛතික පරිපාටිය සම්පූර්ණ කිරීම, ව්‍යවස්ථාපිත ගැසට් නිවේදන පළකිරීම හා වරිපනම් අය කිරීම පිළිබඳව සියළු කරුණු තියුණු පරීක්ෂාවට භාජනය කරන ලදි. එහිදී අනාවරණය වූ පොදු නිරීක්ෂණ සහ ඒ ඒ මහා නගර සභා සම්බන්ධව පවත්නා යථා ස්වරූපය මෙහිදී සමාලෝචනය කෙරේ.

වරිපනම් පැනවීම:

මෙම පර්යේෂණය සඳහා දිවයිනේ මහා නගර සභා 12 ක් නියැදිය වශයෙන් තෝරාගන්නා ලදි. එකී සියළුම ආයතන 2016 වර්ෂය සඳහා වරිපනම් පැනවීම සිදුකර ඇතිබව සනාථ විය. ඒ අතුරින් කොළඹ හා රත්නපුර මහා නගර සභා හැර සෙසු ආයතන සියල්ල එකී පැනවීම් ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර තිබුණි. ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කරන ලද නිවේදන අතුරින් හම්බන්තොට සහ බදුල්ල මහා නගර සභා වල වරිපනම් පැනවීම පමණක් නිවැරදිව පැවති බව නිරීක්ෂණය විය. කොළඹ හා රත්නපුර මහා නගර සභා හැර (ඒවාහි පරීක්ෂා කිරීම සඳහා ගැසට් නිවේදනයක් පළකර නැත.) සෙසු සියළු ආයතනවල අදාල පැනවීම් දෝෂ සහගත බව නිරීක්ෂණය විය.

සෑම පළාත් පාලන ආයතනයක් ම වරිපනම් පැනවීමේදී අනුගමනය කළ යුතු නෛතික ක්‍රියා පරිපාටිය අදාල නීතියෙහි මැනවින් පෙන්වා දී ඇත. ඒ අනුව ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥා පනතේ 230 වන වගන්තියේ (1) වන උප වගන්තිය අනුව සෑම මහා නගර සභාවක් විසින්ම, කලින් කල, අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව, මහා නගරය තුළ පිහිටි සෑම වර්ගයකට ම අයත් සියළුම ගෙවල් වල හා

ගොඩනැගිලි වල ද සියළුම ඉඩම් වල හා කවර වූ හෝ ගෙපත් වලද වාර්ෂික වටිනාකම තක්සේරු කළ යුතුය.

තවද මහා නගර සභා ආඥා පනතේ 238 (1) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් විධානය කරනු ලැබූ විට තක්සේරුවක් සකස් කළ යුතුවේ. එහෙත් වාර්ෂිකව තක්සේරුවක් සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීම ප්‍රායෝගික නොවන හෙයින් එසේ අනුමැතිය ලබාදෙනු නොලැබේ. එසේ වුවද මහා නගර සභා ආඥා පනතේ 238 වන වගන්තිය අනුව පවත්නා වර්ෂයේ තක්සේරුව අනුගාමී වර්ෂයේ තක්සේරුව ලෙස සභාවේ යෝජනා සම්මතයක් මගින් පිළිගනු ලැබිය හැකිය. එසේ නොකළ හොත් අනුගාමී වර්ෂය සඳහා සභා බල ප්‍රදේශයේ දේපල සඳහා වාර්ෂික තක්සේරුවක් නොපවතී. ඒ අනුව වලංගු තක්සේරුවක් නොමැතිව වරිපනම් නියම කිරීම ශුන්‍ය හා බල රහිත වුවක් බවට පත්වේ. ඊට හේතුව ඕනෑම තක්සේරුවක් බල පවත්වන්නේ වර්ෂයක කාලයක් සඳහා පමණක් වීමයි. වරිපනම් ප්‍රතිශතය යෝජනා සම්මතයක් මගින් තීරණය කරනු ලැබුව ද වලංගු වාර්ෂික තක්සේරුවක් නොමැති වූ බැවින් එක් එක් වරිපනම් ගෙවන්නා විසින් ගෙවනු ලැබිය යුතු වරිපනම් මුදල ශුන්‍ය අගයක් ගනී. එහි ප්‍රතිඵලය වන්නේ අදාල පළාත් පාලන ආයතනයට වරිපනම් ලෙස එකී වර්ෂය සඳහා කිසිම මුදලක් අයකරගත නොහැකි වීමයි. නියැදි ගත පළාත් පාලන ආයතන අතුරින් මෙසේ පවත්නා වර්ෂයේ තක්සේරුව අනුගාමී වර්ෂය සඳහා බලපවත්නා බවට සම්මත කරනු ලබන බව අදාල නිවේදනයේ සඳහන් කර තිබුණේ හම්බන්තොට මහා නගර සභාව පමණි. මෙම ප්‍රබල දෝෂය අඩුවැඩි වශයෙන් ලංකාවේ සියළුම මහා නගර සභා විසින් සිදුකරනු ලබන වැරදි සහගත ක්‍රියාවක් බව පෙනේ.

වරිපනම් හා බදු පැනවීම පිළිබඳ නෛතික බලය පැවරී ඇත්තේ සභාවට යි. එහෙත් ඇතැම් මහා නගර සභාවන් හි වරිපනම් පැනවීම කර ඇත්තේ සභාව විසින් නොව නාගරික කොමසාරිස්වරයා විසින් බව පෙනේ. සභාව විසින් වරිපනම් පනවනු ලැබූයේ නම් සභා තීරණ අංකය දිනය ආදිය සමඟ සභා තීරණයේ පිටපත ද ගැසට් නිවේදනයට ඇතුලත් විය යුතුය. මෙම තත්වය මහනුවර මහා නගර සභාවේ 2016 ගැසට් නිවේදනයේ ද දැකිය හැකිය.

එසේම ඇතැම් මහා නගර සභා විසින් වරිපනම් පැනවීමේදී නීතියේ සඳහන් කර ඇති සීමා ඉක්මවා ක්‍රියාකර ඇති බවද නිරීක්ෂණය විය. නිදසුන් වශයෙන් අනුරාධපුර මහා නගර සභාව 2016 වර්ෂය සඳහා වරිපනම් නිවේදනය පළකර ඇති 2015.12.18 දිනැති අංක 1946 දරණ ගැසට් නිවේදනය දැක්විය හැකිය. එහි කිසියම් දේපලක් සම්බන්ධයෙන් අයවිය යුතු වරිපනම් ඒ ඒ කාර්තුවේ අවසාන දිනයට පෙර ගෙවීම පැහැර හරින බදුගෙවන්නන්ට නේවාසික දේපලක් සඳහා 20% දඩ මුදලක් ද වානිජ දේපල සඳහා 25% ක දඩ මුදලක් ද අයකරන බව දන්වා ඇත. මෙබඳු දඩ පැනවීමට බලයක් මහා නගර සභා සඳහා ලබා දී නැත . ඒ ඒ කාර්තුව තුළ වරිපනම් නොවන්නේ නම් බදු ගෙවන්නන්ට 5 % ක වට්ටම නොලැබීම පමණක් සිදුවේ. මෙබඳු පැනවීම් බලාතික්‍රමණයට යටත් වේ.

ඉහත සඳහන් කළ දෝෂය යාපනය හා මඩකලපුව මහා නගර සභාවන්හි අදාල ගැසට් නිවේදනයන්හි ද එලෙසම දැකිය හැකිය. මෙම සභා දෙකෙහිම අදාල සභා තීරණය හෝ නාගරික කොමසාරිස්වරුන් සභාව වෙනුවට තීරණ ගන්නේ නම් එම තීරණ වල පිටපත් හෝ යොමු අංක හා දින ආදිය කිසිවක් සඳහන් නොවේ. මෙම පරිචය බෙහෙවින් අවිධිමත් වූවකි.

කිසියම් සභාවක් වරිපනම් පැනවීමේදී සභාවේ සම්මත කරනු ලබන යෝජනාවක් තිබිය යුතුය. මෙම යෝජනාව එක් යෝජනාවක් හෝ යෝජනා 3 ක් ලෙස පැනවීම කළ යුතුය. එහිලා පහත සඳහන් කරුණු ඊට ඇතුළත් විය යුතුය.

1. පවත්නා වර්ෂයේ දේපල තක්සේරුව අනුගාමී වර්ෂයේ තක්සේරුව ලෙස පිළිගැනීමේ යෝජනාව.
2. වරිපනම් ප්‍රතිශතය තීරණය කිරීමේ යෝජනාව
3. වරිපනම් කාර්තු වශයෙන් අයකළ යුතුනම් සභාව එසේ කළයුතු බව යෝජනාවකින් සම්මත කළ යුතුය.

තවද ගම්පහ මහා නගර සභාව සහ මහනුවර මහා නගර සභාව අදාල කාර්තුව තුළ නියමිත වරිපනම් නොගෙවන විට ඉඩම් හා වාසස්ථාන වෙනුවෙන් 15% ක් ද වාණිජ දේපළ වෙනුවෙන් 20% ක් ද, වරෙන්තු ගාස්තු වශයෙන් අයකරන බව දක්වා ඇත. මහා නගර සභාවක වරිපනම් ගෙවීම කාර්තු 3 කට වඩා හිඟ පවත්නා විට එම වරිපනම් අයකර ගැනීම සඳහා

නිසි නිළධාරියෙකුට බලපත්‍රයක් (වරෙන්තුවක්) නිකුත් කිරීමේ බලය නාගරික කොමසාරිස්වරයා සතුවේ. එහෙත් වරෙන්තුව නිකුත් කළ පසුව වුව දේපළ හිමියන්ට අදාල වරිපනම් සභාවට ගෙවීමට නිදහස තිබේ. එහෙත් එසේ නිකුත් කළ වරෙන්තුව ක්‍රියාත්මක කළ හොත් පමණක් එකී දේපළ සඳහා බලපත්‍රය ක්‍රියාත්මක කිරීමේ වියදම වශයෙන් නේවාසික දේපල සඳහා 15% ක් ද, වාණිජ දේපළ සඳහා 20% ක් ද, වරෙන්තු ගාස්තුවක් ලෙස අදාල වරිපනම් මත ගෙවිය යුතු වේ.

ඒ හැර මෙසේ වරෙන්තු ගාස්තු පැනවීම ස්ථිර වශයෙන්ම ඉතාමත් සාවද්‍ය හා අසාධාරණ වූ බලාතික්‍රමණයට යටත් වන වරදකි. (ගම්පහ මහා නගර සභාවේ 2015.12.18 හා මහනුවර මහා නගර සභාවේ 2015.12.04 දිනැති ගැසට් නිවේදන බලන්න.) මහා නගර සභාවක වරිපනම් ප්‍රතිශතය තීරණය කිරීමේ ක්‍රමවේදයක් පවතී. එතෙකුදු වුවත් කිසිම සභාවක් එම ප්‍රතිශතය තීරණය කිරීමේ සමීකරණය දැන නොසිටි බව නිරීක්ෂණය විය. ඒ මෙසේය;

<u>වරිපනමින් පියවාගත යුතු වියදම</u> x 100 = ප්‍රතිශතය %

සියළු දේපල වල වාර්ෂික

වරිපනම් වටිනාකම්වල එකතුව

<u>1,000,000</u> x 100 = 5 %

20,000,000

මෙම සමීකරණය මත වරිපනම් ප්‍රතිශතය නියම කිරීම නියැදිගත එකම මහා නගර සභාවක හෝ දැකිය හැකි නොවීය.

ඕනෑම වරිපනමක් හෝ බද්දක් පැනවීමේලා අනුගමනය කළයුතු මූලික මූලධර්මයක් වනුයේ එම වරිපනම හෝ බද්දක් පැනවීම බලයානුකූල (Intra vires) වියයුතු බවයි.

බලයානුකූලවීම දෙයාකාර වේ.

1. සත්තාවී බලයානුකූල වීම (Substanative Intra vires)
2. පරිපාටිමය බලයානුකූල වීම (Procedural Intra vires)

1 . සත්තාවී බලයානුකූල වීම

සත්තාවී බලයානුකූල වීම හෝ හරයාත්මක බලයානුකූල වීම යනුවෙන් අදහස් කරනු ලබන්නේ වරිපනමක් හෝ බද්දක් පැනවීමට යම් නීතියක් මගින් බලය පවරා තිබීම සහ අදාල පැනවීම නීතියෙහි දක්වා ඇති විධිවිධාන තුළම පැවතිය යුතු බවයි· බලය ඉක්මවා වරිපනමක් පනවා ඇති අවස්ථාවක අධිකරණය මගින් අදාල බලධාරියා බලාතික්‍රමණය (Ultra vires) කර ඇතැයි තීරණය කරනු ලැබේ. එම නිසා ප්‍රථමයෙන්ම වරිපනමක් හෝ බද්දක් පැනවීමට බලය පවරා තිබීම ඉතා හොඳින් පරීක්ෂාකර බලා පැනවීමේ තීරණය ගත යුතුය. වරිපනම් පැනවී මට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වන ව්‍යවස්ථාව හා මහා නගර සභා ආඥා පනතේ 230 වගන්තියේ (1) උප වගන්තියේ විධිවිධාන අදාල වේ. එසේම නීතිය මගින් වරිපනම් හා බදු පැනවීමේ බලය සීමා කිරීම් සැලකිල්ලට ගත යුතුය. වරිපනම් පැනවීම අදාල බල ප්‍රදේශයට පමණක් සීමා කර තිබේ. තවද වරිපනම් සඳහා අවස්ථා කිහිපයකදීම අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා තිබීම අවශ්‍ය වේ.

230 - (1)	දේපල තක්සේරු කිරීම සඳහා
230 - (1 අ)	බල ප්‍රදේශයේ එක් එක් කොටස් සඳහා වෙන් වෙන් වරිපනම් ප්‍රමාණයක් පැනවීම
230 - (1 අආ)	යම් වාර්ෂික වටිනාකමකට අඩු දේපල වරිපනම් ගෙවීමෙන් නිදහස් කිරීම
230- (1 ආ)	නියම කරනු ලබන වරිපනම් සම්පූර්ණයෙන්ම හෝ කොටසක් අත්හැරීමට නියම කිරීමේ බලය
238 (1)	අළුත් තක්සේරුවක් සඳහා අනුමැතිය ලබාගත යුතුවීම.
238 (2)	වාර්ෂික වටිනාකම් තක්සේරුව ප්‍රතිශෝධනය කිරීමට ඇති බලය

එසේම වරිපනම් හෝ බදු අතීතයට බලපාන ලෙස පැනවිය නොහැකිය. එබැවින් අදාල වර්ෂය ආරම්භයට පෙර සභාව පැනවීම් කර ගැසට් මගින් වර්ෂය ආරම්භවීමට පෙර ව්‍යවස්ථාපිත නිවේදන පළකළ යුතුය. තවද වරිපනම් හෝ බදු පැනවීමේ බලය පවරා ඇත්තේ පළාත් පාලන ආයතනවල සභාවන්ට පමණි. බලයක් නොමැතිව වරිපනමක් හෝ බද්දක් පනවා

ඇතිවිට සභාව සත්තාවී බලාතික්‍රමණයක් (Substanative ullra vires) කර ඇතැයි අධිකරණය තීරණය කරනු ලැබේ.

2 . පරිපාටිමය බලයානුකූල වීම

පරිපාටිමය බලයානුකූල වීම යනුවෙන් අදහස් කරනුයේ නීතියෙන් නියම කර ඇති පරිපාටියට අදාලව බදු පැනවීමයි. මෙය (Procedural Intra vires) ලෙසින් නීතියෙහි දැක්වේ. මෙහිදී වරිපනම් පැනවීමට අදාල පරිපාටිය කුමක්ද යන්න විමසා බැලිය යුතුවේ.

I. සභාවක් විසින් තීරණය කරනු ලැබිය යුතු යයි යම් නීතියකින් බලය පවරණු ලැබ ඇති සියළු කරුණු සහ ප්‍රශ්ණ සභා රැස්වීමක බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතුය. (මහා නගර සභා ආඥා පනතේ 21 වන වගන්තියේ (1) වන උප වගන්තිය)

II. වරිපනමක් හෝ බද්දක් පැනවීමේ යෝජනාව ප්‍රථමයෙන් සභාවේ න්‍යාය පත්‍රයට ඇතුළත් විය යුතුය.

III. පසුව නියමිත සභා රැස්වීමේදී යෝජනාව ඉදිරිපත් කළ යුතුය.

IV. යෝජනාව වෙනත් සභිකයෙකු විසින් ස්ථිර කළ යුතුය.

V. අවසානයේදී යෝජනාව සම්බන්ධව ඡන්දය විමසිය යුතුය.

- එහිදී සභා රැස්වීමේ ගණපූර්ණය තිබිය යුතුය.
- මහා නගර සභාවක ඡන්දය දෙන සභිකයින්ගෙන් බහුතරය පක්ෂව ඡන්දය දෙන ලද්දේ නම් යෝජනාව සම්මත වේ.

VI. යෝජනාව සම්මත වූ පසු නියම කර තිබේ නම් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතුය.

VII. වරිපනම්, බදු හා බලපත්‍ර ගාස්තු පැනවීම් අනු නීති ලෙස සලකනු ලබන බැවින් ඒවාට නීතිමය බලයක් ලැබෙන්නේ ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබුවහොත් පමණි. (අර්ථ කථනය ආඥා පනතේ 17 වගන්තිය බලන්න.)

VIII. මෙසේ නීතියෙන් නියම කර ඇති පරිපාටියෙහි සියළු පියවර අනුගමනය කර නොමැති නම් සභාව පරිපාටිමය බලාතික්‍රමණය (Procedural Ultra vires) කර ඇතැයි අධිකරණය තීරණය කරනු ලැබේ.

මෙම සියළු නෛතික විධිවිධාන මෙහි සඳහන් අණ පනත්වල පැහැදිලිව දක්වා ඇතත් බොහෝ පළාත් පාලන ආයතනයන්හි නිලධාරීන් ඒ පිළිබඳව නිසි අවබෝධයකින් කටයුතු කර නොමැති බව මෙම අධ්‍යයනයේදී තෝරාගත් පළාත් පාලන ආයතනවල වරිපනම් පිළිබඳ කරනු ලැබූ කරුණු සොයා බැලීම්වලදී අනාවරණය විය. මේ සම්බන්ධව එක් එක් සභාවේ ක්‍රියාකාරීත්වය ඒ ඒ සභා වෙන් වෙන් වශයෙන් ගෙන විශ්ලේෂණය කෙරේ.

5.1.1 කොළඹ මහා නගර සභාව

කොළඹ මහා නගර සභාවේ වරිපනම් හැර 2016 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු, කර්මාන්ත බදු හා ව්‍යාපාර බදු පැනවීම 2015 ඔක්තෝම්බර් මස 26 වැනි දින පැවති මහා සභා රැස්වීමේදී සම්මත කරන ලද බව 2015.12.04 දින අංක 1944 දරණ ගැසට් පත්‍රය මගින් නිවේදනය කර ඇත.

එතෙකුදු වුවත් කොළඹ මහා නගර සභාව 2016 වර්ෂය සඳහා වරිපනම් පැනවීම ගැසට් පත්‍රයේ පළ කර නැත. මේ සම්බන්ධව තොරතුරු පරීක්ෂා කිරීමේදී අනාවරණය වූයේ සිරිතක් ලෙස කොළඹ මහා නගර සභාව වරිපනම් නිවේදන දේපල හිමියන්ට යැවීම පමණක් සිදුකරන අතර, එම පැනවීම පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු නොලබන බවයි. මෙය නීතියට පටහැනි ක්‍රියාමාර්ගයකි. අර්ථ නිරූපන ආඥා පනතේ (2 වන අධිකාරය) 17 (1) (ඊ) ඡේදය අනුව සියළුම නීති, අනු නීති පැනවීම් ආදිය ගැසට් පත්‍රයේ පළ කළ යුතුය. එසේ පළ නොකළ හොත් අදාල පැනවීම නීතිය ඉදිරියේ වලංගු නොවේ. මේ අනුව කොළඹ මහා නගර සභාව 2016 වසර සඳහා සභාව මගින් වරිපනම් පනවා තිබුණේ වී නමුත් එම තීරණය ගැසට් පත්‍රයේ විධිමත් ලෙස සභා තීරණය ද සමඟ ගැසට් කර නොමැති හෙයින් වරිපනම් අයකිරීම් ක්‍රියාත්මක කළ නොහැකිය. මෙය අතිශය බරපතල තත්වයකි. නීති දෙපාර්තමේන්තුවක් සහ වෘත්තීය ගණකාධිකාරීවරුන් හා තක්සේරුකරුවන් සහිත කොළඹ මහා නගර සභාව මෙබඳු ක්‍රියා මාර්ගයක් සිය ප්‍රධාන ආදායම් මාර්ගය වූ වරිපනම් පැනවීම විෂයෙහි අනුගමනය කර තිබීම අතිශයින් පුදුම සහගත සාවද්‍ය ක්‍රියාවකි. සභා තීරණය ගැසට් පත්‍රයේ පළ නොවීම තුළින් ප්‍රවර්තන වර්ෂය සඳහා අනුමත තක්සේරුවක් තිබේද යන්න බදු ගෙවිය යුතු කාල සීමා හා අදාල වට්ටම් ආදිය පිළිබඳ තොරතුරු ප්‍රකාශයට පත් නොවේ.

5.1.2 දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව 2016 වර්ෂය සඳහා වරිපනම් අයකිරීම 2015.07.02 දින පැවති මහා සභා රැස්වීමේදී පැනවීම් සිදුකර ඊට අදාල ගැසට් නිවේදනය 2015.08.21 දින අංක 1929 දරණ ගැසට් පත්‍රයේ පළකර ඇත.

එහෙත් 2015 වර්ෂයේ වාර්ෂික තක්සේරුව 2016 වර්ෂය සඳහා සභාව පිළිගෙන සම්මත කර නැත. මහා නගර සභා ආඥා පනතේ 238 වගන්තිය අනුව ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික තක්සේරුව අනුගාමී වර්ෂයේ තක්සේරුව ලෙස සභාව විසින් සම්මත කළ යුතු බව පැහැදිලිව දක්වා ඇතත් මෙම මහා නගර සභාව එකී මූලික විධිවිධානය කඩකර ඇත. ඒ අනුව අදාල ගැසට් නිවේදනය ශූන්‍ය හා බල රහිත වේ. එහි ප්‍රතිඵලය වන්නේ 2016 වර්ෂය සඳහා දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවට වරිපනම් වශයෙන් කිසිදු මුදලක් අයකිරීමට, නීත්‍යානුකූල බලයක් නොමැති වීමය.

තවද අදාල සභා තීරණයේ IV වැනි ඡේදය ප්‍රකාර අදාල කාර්තුව තුල වරිපනම් ගෙවීම් නොකරන විට වාණිජ නොවන දේපල හා මුඩු ඉඩම් සඳහා 15 % ක වරෙන්තු ගාස්තුවක් ද, වාණිජ දේපල සඳහා 20 % ක වරෙන්තු ගාස්තුවක් ද අයකරන බව දක්වා ඇත. අදාල කාර්තුවේ අවසාන දිනට ප්‍රථම වරිපනම් ගෙවීම් නොකරන විට පවත්නා නීතිය අනුව බදු ගෙවන්නන්ට අදාල වට්ටම් මුදල අහිමි වේ. එහෙත් ඔහු වරෙන්තු ගාස්තු ගෙවීමකට භාජනය නොවේ. වරෙන්තු ගාස්තුවක් උපචිත වන්නේ වරිපනම් ගෙවීම් දිගින් දිගට පැහැර හැරිවිටක නාගරික කොමසාරිස්වරයා ආඥා පනත් 252 වගන්තිය ප්‍රකාර එම හිඟ අයකර ගැනීම සඳහා බදු අයකරන නිලධාරියාට වරෙන්තුවක් නිකුත්කර එම නිලධාරියා වරෙන්තුව ක්‍රියාත්මක කිරීමෙන් පසුවය. එසේ නොමැතිව වරෙන්තු ගාස්තු අදාල කාර්තුව අවසානයේදී අයකිරීමට හෝ බිල්කල ආදායමට එකතු කිරීමට නාගරික කොමසාරිස්වරයාට නීතියෙන් බලයක් ලබාදී නොමැත. ඒ අනුව මෙම ක්‍රියාමාර්ග බලාතික්‍රමණ හෙවත් නීතියේ බලය ඉක්මවා ක්‍රියා කිරීමේ වරදට යටත්වේ. මෙම කරුණු නීතිය ඉදිරියේ අභියෝගයට ලක් කරණු ලැබිය හැකි අතර එසේ වූ විට සභාවටත් නගරාධිපතිවරයාටත් බරපතල ප්‍රතිවිපාක වලට මුහුණදීමට සිදුවිය හැකිය.

5.1.3 ගම්පහ මහා නගර සභාව

ගම්පහ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා විසින් 2015.12.18 දිනැති අංක 1946 දරන ගැසට් පත්‍රයේ 2016 වර්ෂය සඳහා වරිපනම් පැනවීම පිළිබඳ නිවේදනය පළකර ඇත. මෙම නිවේදනයේ අන්තර්ගතය අතිශයින් අක්‍රමවත්ය. එය ව්‍යවස්ථාපිත නිවේදනයකට කිසිසේත් යෝග්‍ය නොවන යෙදුම් වලින් ගහණය. කෙසේ වෙතත් එමගින් අදාල වරිපනම් පැනවීම 2015.09.11 දින පැවති මහා සභාවේදී සම්මත කරන ලද බව සඳහන් වේ. එතෙකුදු වුවත් නිවේදනය සමඟ සභා යෝජනාව පළකර නොමැත.

එසේම එහි මුඛ්‍ය දෝෂය වන්නේ 2016 වසර සඳහා පිළිගත් වාර්ෂික තක්සේරුවක් නොමැති වීමයි. ඉහත දී ද පෙන්වා දෙන ලද පරිදි වරිපනම් පැනවීම සඳහා ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික තක්සේරුව අනුගාමී වර්ෂයේ වාර්ෂික තක්සේරුව ලෙස සභා යෝජනාවක් මගින් සම්මත කරගත යුතුවීම අත්‍යාවශ්‍ය කරුණකි. මෙහි එවැන්නක් සිදුවී නැති හෙයින් වරිපනම් ප්‍රතිශතය හා ගෙවිය යුතු කාලය සඳහන් වුවද වාර්ෂික තක්සේරුවක් නොමැතිව වරිපනම් පැනවිය නොහැකිය. එබැවින් සත්‍ය වශයෙන්ම 2016 වර්ෂයට ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශයේ කිසිදු දේපලකින් මොනම මුදලක්වත් අයකළ නොහැකිය. එනම් යථෝක්ත නිවේදනය ශුන්‍ය හා බල රහිත වූවකි.

තවද එම නිවේදනයෙහිම අවසාන ඡේදයෙහි ඒ ඒ කාර්තුවේ අවසාන දිනයට පසුව කරනු ලබන ගෙවීම් වලදී ඉඩම් හා වාසස්ථාන දේපල සම්බන්ධයෙන් 15 % ක ගාස්තුවක් ද, අනෙකුත් දේපල වෙනුවෙන් 20 % ක අමතර ගාස්තුවක් ද, වරෙන්තු ගාස්තු වශයෙන් අයකරනු ලබන බව නිවේදනය කොට ඇත. මෙම විධානය කර ඇත්තේ මහා නගර සභා ආඥා පනතේ නාගරික කොමසාරිස්වරයාට පැවරී අති බලයක් මත නොවේ. මෙබඳු ප්‍රතිපාදනයක් නීතියෙහි දක්වා නැත. ඒ ඒ කාර්තුවට අදාල වරිපනම් මුදල කාර්තුවේ අවසාන දිනට ප්‍රථම නොගෙවනු ලැබුවහොත් බදු ගෙවන්නනාට ඊට හිමිවන 05 % ක වට්ටම මුදල අහිමි වේ. ඒ හැරෙන්නට ඒ වනවිට ක්‍රියාත්මක කර නැති වරෙන්තුවකට වරෙන්තු ගාස්තු නියම කිරීම සත්‍ය වශයෙන්ම මවිතය දනවන සුළු ක්‍රියාමාර්ගයකි. එය බරපතල බලාතික්‍රමණයකි.(Substantive ultra vires) මෙම තත්වය මත කිසියම් බදු ගෙවන්නෙකු අධිකරණ ක්‍රියා මාර්ගයක් ගත හොත්

කොමසාරිස්වරයාට අතිශය බරපතල ප්‍රතිවිපාකයෙන්ම මුහුණදීමට සිදුවිය හැකිය. (බලන්න නනීවා පර්ඩිනැන්ඩස් එදිරිව කොළඹ මහා නගර සභාව - 44 නනීවා – 519)

5.1.4 කුරුණෑගල මහා නගර සභාව

2016 වර්ෂය සඳහා කුරුණෑගල මහා නගර සභාව විසින් වරිපනම් පනවන ලද බව 2015-11-20 දිනැති අංක 1942 දරණ ගැසට් පත්‍රයෙහි සභාවේ නාගරික කොමසාරිස් විසින් නිවේදනයක් මගින් දන්වා ඇත. සභා යෝජනාව ඊට ඇතුළත් නොවේ. මෙම නිවේදනය බෙහෙවින් අසම්පූර්ණ වුවකි. එහි දේපළ සඳහා වාර්ෂික තක්සේරුවක් සඳහන් කර නැත. ගෙවීම් කළ යුතු දින සඳහන් කර ඇති අතර අදාළ ප්‍රතිශතය ද දන්වා තිබේ. නියමිත දිනට පසුව සිදුකරන ගෙවීම් සඳහා 15% -20% දක්වා වරෙන්තු ගාස්තු අය කරන බවත් සංවර්ධනය නොකළ ඉඩම් සඳහා 20% ක වරෙන්තු ගාස්තු පනවන බවත් දක්වා ඇත. මෙය නීතියේ බල සීමාව බරපතල ලෙස උල්ලංඝණය කිරීමකි. මේ අනුව මෙම නිවේදනය දෝෂ සහගත වුවක් වන අතර එය එනයින්ම ශූන්‍ය හා බල රහිත වුවක් බව සඳහන් කළ යුතුව ඇත.

5.1.5 මහනුවර මහා නගර සභාව

මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා විසින් 2015.12.04 දිනැති ගැසට් පත්‍රයේ පළකර ඇති 2016 සඳහා වූ වරිපනම් පැනවීමේ නිවේදනය ප්‍රකාර අදාළ පැනවීම සභාව විසින් සිදුකර ඇති බවක් නොපෙනේ. එයින් බැලූ බැල්මට ගම්‍ය වන්නේ නාගරික කොමසාරිස්වරයා විසින් වරිපනම් පනවා එය නිවේදනය කර ඇති බවකි. සභා සම්මුතියක් ලබා තිබේ නම් එහි අංකය, දිනය හා යෝජනාවේ පිටපත සහා තීරණයට අමුණා ගැසට් පත්‍රයේ මුල් නිවේදනයන් සමග පළකළ යුතුවේ. ඒ අනුව මෙම යෝජනාව අවිධිමත් හා බලාතික්‍රමණයට ලක්වන්නක් බව පෙනේ.

එසේම එහි 2 වන අංකය යටතේ ගෘහස්ථ නොවන දේපළ යටතට තනාගෙන යන ගොඩනැගිලි ඇතුලත් කිරීම නීත්‍යානුකූල නොවේ. (මහා නගර සභා ආඥා පනතේ 240 වන වගන්තිය බලන්න.) එසේම එහි 3 වන අංකය යටතේ අස්වද්දන ලද කුඹුරු ඉඩම්

සම්පූර්ණයෙන්ම වරිපනම් අයකිරීමෙන් නිදහස් කර ඇත. මෙය 230 (1 ආ) උප වගන්තියේ විධිවිධාන මත අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව ගතයුතු තීරණයකි. එසේම මහනුවර මහා නගර සභා බල ප්‍රදේශයේ බදු ගෙවන්නන් ඒ ඒ කාර්තුවේ අවසාන දිනට වරිපනම් නොගෙවන්නේ නම් එකී දේපල මත, ගෘහස්ත දේපලක් නම් 15% ක ද, ගෘහස්ත නොවන දේපල සඳහා 20% ක් ද, වරෙන්තු ගාස්තු ලෙස අයකරන බව නිවේදනය කොට ඇත. කිසියම් මහා නගර සභාවකට අයවිය යුතු වරිපනම් කාර්තු තුනකට එපිට දිනකට පවත්නා හිඟ මුදල අයකර ගැනීම සඳහා දේපල තහනම් කරන නිලධාරියෙකු වෙත වරෙන්තුවක් (බලපත්‍රයක්) නිකුත් කර එය ක්‍රියාත්මක කර වූ පසු පමණක් මෙසේ වරෙන්තු ගාස්තු උපචිත වේ. එසේ නොමැතිව වරෙන්තුව නිකුත් කළ පසුව ද අදාල බදුගෙවන්නාට නගර සභාවට එම බදු මුදල ගෙවීමේ නිදහස පවතී. එසේ නොමැතිව ඒ ඒ කාර්තුවේ අවසාන දිනට වරිපනම් නොගෙවීම මත වරෙන්තු ගාස්තු පැනවීමේ හෝ අයකිරීමේ බලයක් නාගරික කොමසාරිස්වරයාට පැවරෙන විධිවිධාන කිසිවක් මහා නගර සභා ආඥා පනතේ සඳහන් නොවේ. ඒ අනුව මෙය ඉතා බරපතල බලාතික්‍රමණයක් බව පෙනේ.

මීට අමතරව දිවයිනේ ප්‍රධාන නගර අතුරින් මුලින්ම සිටින මධ්‍යම පළාතේ අගනුවර ලෙස සැලකෙන මහනුවර නගරයේ 2016 වර්ෂය ට වරිපනම් පැනවීමේදී එම වර්ෂය සඳහා අනුමත වාර්ෂික තක්සේරුවක් නොමැති වීම කොතරම් බරපතල තත්වයක් වන්නේද? මහා නගර සභා ආඥා පනතේ 238 (1) වගන්තිය ප්‍රකාර ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික තක්සේරුව අනුගාමී වර්ෂයේ වාර්ෂික තක්සේරුව සඳහා සභා සම්මුතියක් මගින් පිළිගෙන ඒ අනුව වරිපනම් පැනවීම සිදුකළ යුතු බව දක්වා ඇත.

පූර්වෝක්ත ගැසට් නිවේදනය මගින් එබඳු පිළිගැනීමක් සිදුකර නොමැති හෙයින් 2016 වර්ෂය සඳහා මහනුවර මහා නගර සභාවේ වරිපනම් පැනවීම් ශුන්‍ය හා බල රහිත වේ. ශුන්‍ය අගයක් ඇති වාර්ෂික තක්සේරුව මත පනවනු ලබන බදු ප්‍රතිශතයන්හි ප්‍රතිඵලය ද ශුන්‍ය වන හෙයින් නගරයේ කිසිම දේපලකින් කිසිදු වරිපනමක් අයකළ නොහැකිය. මේ පසුබිම යටතේ කිසියම් නගර වැසියෙකු සභාවේ මෙම සාවද්‍ය ක්‍රියාමාර්ග අභියෝගයට ලක්කළ හොත් නාගරික කොමසාරිස්වරයාට බරපතල ප්‍රතිවිපාක වලට මුහුණදීමට සිදුවන බව පෙන්වා දිය හැකිය.

5.1.6 දඹුල්ල මහා නගර සභාව

2016 වර්ෂය සඳහා වූ දඹුල්ල මහා නගර සභාවේ වරිපනම් පැනවීමට අදාල නිවේදනය 2016.01.01 දිනැති අංක 1948 දරණ ගැසට් පත්‍රයෙහි නාගරික කොමසාරිස්වරයා නමින් පළකර ඇත. මීට අදාල සභා සම්මුතිය / යෝජනාව හෝ කොමසාරිස්වරයා අදාල පැනවීම කළේනම් එම තීරණය හෝ නිවේදනය සමග පළකර නැත. මෙම නිවේදනය පළකරන කාලය වනවිට මෙම සභාවේ නගරාධිපති ඇතුළු සභිකයින්ගේ නිල කාලය අවසන් වී සභාවේ කාර්ය හා කර්තව්‍ය, බලතල නාගරික කොමසාරිස්වරයා වෙත පැවරී පැවති බව අනාවරණය විය.

එසේ නම් මෙම වරිපනම් පැනවීමේදී කොමසාරිස්වරයාට සභාවේ බලතල පැවරුණ බලදායී වගන්තිය අදාල තීරණයේ සහ ගැසට් නිවේදනයේ ද සඳහන් විය යුතුය. නොඑසේ නම් එම නිවේදනය නීතිය ඉදිරියේ වලංගුභාවය අහිමිකර ගනී. තවද මෙම නිවේදනයේ සඳහන් පරිදි 2016 සඳහා මහා නගර සභා බල ප්‍රදේශයේ දේපලවල වාර්ෂික තක්සේරුව ලෙස සලකා ඇත්තේ 2012 වර්ෂයේ වාර්ෂික තක්සේරුවයි. මෙය සම්පූර්ණයෙන්ම නීතියට පටහැනි ක්‍රියාවකි.

නගර සභා ආඥා පනතේ 238 වන වගන්තිය ප්‍රකාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබ නව තක්සේරුවක් කිසියම් මහා නගර සභාවක දේපල විෂයෙහි බල නොපවත්නා විට ප්‍රවර්තන වර්ෂයේ තක්සේරුව අනුගාමී වර්ෂයේ තක්සේරුව වශයෙන් සභා සම්මුතියක් මගින් අනුමත කොට පිළිගත යුතු බව දක්වා ඇත. එහෙත් ඉඳුරා ඊට පටහැනිව මීට වසර හතරකට පෙර වූ තක්සේරුවක් අනුගාමී වර්ෂය සඳහා යොදාගන්නා බව පැවසීමෙන් සමස්ථ වරිපනම් පැනවීම් ක්‍රියාවලියම ශූන්‍ය හා බල රහිත බවට පත්වී ඇත.ඉහත කරුණු අනුව දඹුල්ල මහා නගර සභාව 2016 වසර වෙනුවෙන් කර ඇති වරිපනම් පැනවීම නීතියට අනුකූල නොවන්නක් වන හෙයින් එමගින් බදු ගෙවන්නන් ගෙන් 2016 වර්ෂය සඳහා වරිපනම් අයකළ නොහැකි බව සැලකිය යුතුවේ.

5.1.7 රත්නපුර මහා නගර සභාව

රත්නපුර මහා නගර සභාව 2016 වසර සඳහා විධිමත් පරිදි වරිපනම් පනවා නොමැති බව නිරීක්ෂණය විය. ඊට ආදළව 2015-12-16 දිනෙන් යුතුව නාගරික කොමසාරිස් විසින් පළකරන ලද පුවත්පත් දැන්වීමක් පමණක් ආදළ නිළධාරීන් විසින් ඉදිරිපත් කරන ලදි. එය ද ඉතා

අසම්පූර්ණ වුවකි. ඒ අනුව 2016 වර්ෂය සඳහා දේපළ තක්සේරුවක් සභාව අනුමත කර නැත. වරිපනම් පැනවීමට බලය ලැබෙන නීතියේ සඳහන් වගන්ති කිසිවක් සඳහන් කර නැත.

වරිපනම් ප්‍රතිශතය හා ගෙවිය යුතු දින සඳහන් වේ. තවද නියමිත දිනට පෙර නොගෙවූ වරිපනම් සම්බන්ධයෙන් 15% - 20% දක්වා වරෙන්තු ගාස්තු අය කරන බව දක්වා ඇත. මෙය නීතියේ බලය ඉක්මවා ක්‍රියා කිරීමකි. වරිපනම් විධිමත් ලෙස පනවා අදාළ සභා යෝජනා සම්මුතිය ද සමග නිසි නිවේදනය ගැසට් පත්‍රයේ පළ කිරීම අනිවාර්ය අවශ්‍යතාවකි. ඒ කිසිවක් සිදුකර නොමැති මෙම පැනවීම ශුන්‍ය හා බල රහිත වන බව පෙන්වාදිය යුතුව ඇත.

5.1.8 බදුල්ල මහා නගර සභාව

2016 වර්ෂය සඳහා බදුල්ල මහා නගර සභාව විසින් වරිපනම් පැනවීම පිණිස 2015 ඔක්තෝම්බර් මස 01 දින පැවති සභා රැස්වීමේදී සම්මත කරන ලද යෝජනාව විධිමත් පරිදි 2015. 11. 20 දිනැති අංක 1942 දරන ගැසට් පත්‍රයෙහි පළකරන ලද නිවේදනය මඟින් ප්‍රකාශයට පත්කරනු ලැබ ඇත. මෙම නිවේදනය එහි අඩංගු විය යුතු සියළු කරුණු වලින් සමන්විතව නගරාධිපතිවරයාගේ නමින් පළ කරනු ලැබ ඇත. මෙම යෝජනාවෙහි ඇති එකම දෝෂය ලෙස පෙනී යන්නේ නිවේදනයේ සඳහන් කාලසීමාව තුළ වරිපනම් නොගෙවන හිස් ඉඩම් හා නිවාස වෙනුවෙන් 15% ක වරෙන්තු ගාස්තුවක් ද, වාණිජමය දේපළ වෙනුවෙන් 20 % ක වරෙන්තු ගාස්තුවක් ද අයකරන බව දක්වා තිබීමයි. මෙය හිඟ බදු වෙනුවෙන් වරෙන්තුවක් නිකුත් කර එය ක්‍රියාත්මක කිරීමෙන් පසු වරෙන්තු ගාස්තු අයකරන බව සඳහන් කළේ නම් යෝග්‍ය වේ. කෙසේ වෙතත් මීට අදාල සභා යෝජනාව බෙහෙවින් නිවැරදිය.

5.1.9 හම්බන්තොට මහා නගර සභාව

2016 වර්ෂය සඳහා හම්බන්තොට මහා නගර සභාව විසින් වරිපනම් පැනවීම සඳහා 2015 ඔක්තෝම්බර් මස 14 දින පැවති මහා සභා රැස්වීමේදී යෝජනා සම්මත කරනු ලැබ ඇත. එකී යෝජනාව රැගත් 2016 වරිපනම් පැනවීමේ නිවේදනය 2015.12.04 දිනැති අංක 1944 දරන ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර ඇත. මෙම නිවේදනය හා සභා යෝජනාව උපලේඛන අංක 04 හි දැක්වේ. නියැදිගත මහා නගර සභා අතුරින් නිවැරදිව වරිපනම් පැනවීමේලා සම්මත

කරන ලද සභා යෝජනා හා ගැසට් නිවේදන අතුරින් දෙවන නිරවද්‍ය යෝජනාව හා නිවේදනය මෙය වීම විශේෂත්වයකි. එය එවක සිටි නගරාධිපතිවරයා නමින් ගැසට් පත්‍රයේ පළකර ඇත.

ලංකාවේ ඉතා ලාබාල මහා නගර සභාවක් වූ හම්බන්තොට මහා නගර සභාව මෙසේ නිරවද්‍ය බදු හා බලපත්‍ර ගාස්තු පැනවීමට සමත්ව සිටීම බෙහෙවින් ආදර්ශමත් ප්‍රයත්නයක් ලෙස හැඳින්විය හැකිය. එහි ගෞරවය සභාවටත් විශේෂයෙන් නාගරික කොමසාරිස් වරයා ප්‍රධාන කාර්ය මණ්ඩලයටත් හිමිවිය යුතුය. මෙම නිවේදනයෙහි අඩංගු බදු යෝජනා අතුරින් විනෝද බදු පනවා තිබීම හා එය ගැසට් පත්‍රයේ පළකර තිබීම මුළුමනින්ම වැරදි හා දෝෂ සහගත වන අතර සෙසු නිවේදන වලද යම් යම් අඩුපාඩු දැකිය හැකිය. එතෙකුදු වුවත් සමස්ථයක් වශයෙන් සලකා බලන කල මෙම මහා නගර සභාවේ ව්‍යවස්ථාපිත යෝජනා සම්මතය හා ගැසට් නිවේදන ප්‍රකාශයට පත්කිරීම නිවැරදි හා යහපත් මට්ටමක පවතින බව සඳහන් කළ හැකිය.

5.1.10 මඩකලපුව මහා නගර සභාව

මඩකලපුව මහා නගර සභාව විසින් 2016 වර්ෂය සඳහා වරිපනම් පැනවීම සඳහා වූ යෝජනාව සම්මත කරන ලද බව නාගරික කොමසාරිස්වරයා නමින් පළකර ඇති 2015.12.18 දිනැත අංක 1944 දරන ගැසට් නිවේදනයේ සඳහන් වේ. එහෙත් අදාල සභා යෝජනාව හෝ තීරණය නිවේදනය සමග පළ කර නැත. එසේම වරිපනම් පැනවීමට අදාල නිවේදනයේ වරිපනම් පැනවීමට අමතරව බලපත්‍ර ගාස්තු, කර්මාන්ත බදු, ව්‍යාපාර බදු හා වෘත්තීය බදු ආදිය පිළිබඳ නියමයන්ද අන්තර්ගත කොට ඇත. මෙය බෙහෙවින් සාවද්‍ය ක්‍රියාමාර්ගයකි. මේ සඳහා වෙන වෙනම නිවේදන හා සභා යෝජනා පළකළ යුතුය.

තවද මෙම නිවේදනයේ 6 වන ඡේදය මගින් 2016 වර්ෂයේ හා ඉන් පසු සියලුම වර්ෂ වල වරිපනම් සෑම අවුරුද්දකම අප්‍රේල් මස 30 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බව දක්වා ඇත. මෙය නීතියට පටහැනි විධානයකි. එසේම තවද මෙම නිවේදනයේ අදාල කාර්තුවට පෙර හා වර්ෂය මුල් මාසයේ වරිපනම් ගෙවීම් වෙනුවෙන් නීතියෙහි සඳහන් වට්ටම් පිළිබඳව ද සඳහන් කර නැත. එහි 7 වන වගන්තිය මගින් වරිපනම් සම්බන්ධ දැන්වීම් ලද පසු නියමිත දින අදාල ගෙවීම් කිරීම පැහැර හරින විට 10% ක දෙපාර්තමේන්තු ගාස්තුවක් අයකරන බවද, එහි 8 වන වගන්තිය මගින් අදාල ගෙවීම් පැහැර හැරීමේදී අධිකරණයේ නඩු පවරනු

ලබන බවත් සඳහන් වේ. මෙම ක්‍රියා මාර්ග බොහොමයක් නීතිය ඉක්මවා සිදුකරන ලද පැනවීම් හා විධාන බව සඳහන් කළ යුතුව ඇත. මෙම විධිවිධාන බලාතික්‍රමණයට යටත් වන හෙයින් ඊට එරෙහිව බදු ගෙවන්නන්ට අධිකරණය ඉදිරියට යාමට ඉඩ ප්‍රස්ථා උපචිතව ඇත.

මඩකලපුව මහා නගර සභාවේ වරිපනම් නිවේදනයෙහි ඉහත දැක්වූ දෝෂ සහගත තත්වයන්ට අමතරව එහි ඇති ඉතා තීරණාත්මක වරද වනුයේ 2016 වර්ෂය සඳහා සභා බල ප්‍රදේශයේ දේපල කිසිවකට තක්සේරුවක් පනවා නොමැතිවීමයි. සාමාන්‍යයෙන් මෙහිදී ආඥා පනතේ 238 වගන්තියෙන් බලය පැවරී ඇති පරිදි 2015 වර්ෂයේ එනම් ප්‍රවර්තන වර්ෂයේ තක්සේරුව ඉදිරි වර්ෂයේ එනම් අනුගාමී වර්ෂයේ තක්සේරුව ලෙස සභා සම්මත කර එම යෝජනාව නිවේදනය සමඟ ගැසට් පත්‍රයේ පළකිරීම කළයුතු වුවත් මෙම සභාවේ කොමසාරිස්වරයා එවැන්නක් සිදුකර නැත. එබැවින් මඩකළපුව මහා නගර සභාවට 2016 වර්ෂය සඳහා වරිපනම් ලෙස කිසිම මුදලක් අයකර ගැනීම නීත්‍යානුකූල නොවේ.

5.1.11 අනුරාධපුර මහා නගර සභාව

අනුරාධපුර මහා නගර සභාව 2016 වර්ෂය සඳහා වරිපනම් පැනවීම 2015.11.03 දින පැවති සභා රැස්වීම් යෝජනා සම්මතයකින් අනුමත කර එම නිවේදනය 2015.12.18 දිනැති අංක 1946 දරන ගැසට් පත්‍රයෙහි පළකර ඇත. මෙම ගැසට් නිවේදනය සමඟ අදාල සභා යෝජනාවන් ද පළකර තිබේ. මෙම ආයතනයත් 2016 වසර සඳහා වරිපනම් පැනවීමේදී සභාව සම්මත කර ඇති නිවේදනය බොහෝ දුරට නිවැරදි බව පෙනේ. එහි 2015 වර්ෂයේ දේපල වල වාර්ෂික තක්සේරුව 2016 වර්ෂය සඳහා පිළිගැනීම සිදුකර ඇත. එහෙත් ඒ බව නිවේදනයේ සඳහන් නොවේ. මෙහිදී සභා යෝජනාව සමඟ නිවේදනය පළකර ඇති නිසා එහි නීත්‍යානුකූලභාවය රැකී ඇත. එහෙත් නිවේදනයේ ද ඒ බව පැහැදිලිව දැක්විය යුතුව තිබුණි. තවද යථෝක්ත සභා යෝජනාවෙහි නොව ගැසට් නිවේදනයෙහි, වරිපනම් අදාල කාර්තුව තුළ ගෙවීම පැහැර හරින්නේ නම් නේවාසික දේපල සඳහා 20 % ක දඩ මුදලක් හා වාණිජ දේපල සඳහා 25 % ක දඩ මුදලක් ද අයකරගත යුතු බව දක්වා ඇත. මෙබඳු බලයක් මහා නගර සභාවක නගරාධිපතිවරයාට හෝ සභාවකට පවරා ඇත. අදාල කාර්තුව තුල නියමිත වරිපනම් ප්‍රමාණය නොගෙවනු ලැබූ විටක ඊට අදාල වට්ටම් ප්‍රමාණය අහිමි වීම සිදුවේ. එසේ නොමැතිව දඩ අයකිරීමට ඉඩ සලසන විධි විධානයක් නීතියෙහි දක්වා නැත. බදු ගෙවීම

කාර්තු 3 කට වඩා පැහැර හැරී විටක නාගරික කොමසාරිස්වරයාට ආඥා පනතේ 252 වන වගන්තිය යටතේ වරෙන්තුවක් බදු අයකරන නිලධාරියා වෙත නිකුත් කළ හැකිය. ඔහු එම වරෙන්තුව ක්‍රියාත්මක කිරීමෙන් පසුව වරෙන්තු ගාස්තු වශයෙන් මුඩු ඉඩම් සහ වාසස්ථානවලින් 15 % වරෙන්තු ගාස්තුවක් ද මුඩු ඉඩම් හා වාසස්ථාන නොවන දේපල වලින් 20 % ක වරෙන්තු ගාස්තුවක් ද අයකළ හැකිය. එහෙත් බදු එකතු කරන්නා අදාල වරෙන්තුව ක්‍රියාත්මක කිරීමට පෙරාතුව වරෙන්තු ගාස්තු අයකිරීම උපචිත නොවේ. (බලන්න 49 නනිවා - 420) එහෙත් 20% හා 25% ක් වශයෙන් නේවාසික හා වාණිජ දේපල වලින් දඩ මුදල් අයකිරීම නීතියට පටහැනි වූවකි. එබැවින් අදාල ගැසට් නිවේදනය සාවද්‍ය හා දෝෂ සහිත නිවේදනයක් වන්නේය.

5.1.12 යාපනය මහා නගර සභාව

2016 වර්ෂය සඳහා යාපනය මහා නගර සභාව වරිපනම් පනවා ඇති බව නාගරික කොමසාරිස්වරයාගේ 2016.01.01 දිනැති අංක 1948 දරණ ගැසට් පත්‍රයේ පිටු අංක 90 හි පළ කර ඇත. එහෙත් එම නිවේදනයේ සභා තීරණය ගත් දිනය හෝ එහි අංකය සඳහන් නොවේ. එසේම අදාල සභා යෝජනාවද එහි අන්තර්ගත නොවේ. එම නිසා සභාව අදාල පැනවීම සිදුකර ඇති ආකාරය අවබෝධ කොටගත නොහැකිය. සභාවේ දී කරණු ලැබූ කරුණු විමසීමේ දී පෙනීගියේ 2014 වසරේ ජුනි මස පමණ සභාවේ නිල කාලය අවසන්ව පාලනය නාගරික කොමසාරිස්වරයා වෙත පැවරුණ බවයි. ඒ අනුව මෙම නිවේදනයේ අන්තර්ගතය සාවද්‍ය වේ. තවද සභාවේ බලතල නාගරික කොමසාරිස්වරයාට පැවරෙන බලදායී වගන්තිය මෙම නිවේදනයේ නොමැත. ඒ අනුව මෙය අසම්පූර්ණ හා සාවද්‍ය නිවේදනයක් වන අතර එය අධිකරණයේ අභියෝගයට ලක්විය හැකි බව ද පෙන්වා දෙනු කැමැත්තෙමු.

කෙසේ වෙතත් මෙම නිවේදනය ප්‍රකාර නාගරික කොමසාරිස්වරයා ප්‍රකාශයට පත්කර ඇත්තේ මහා නගර සභා ආඥා පනත් 238 වගන්තිය ප්‍රකාර 2013 වර්ෂයේ වාර්ෂික තක්සේරුව 2016 වර්ෂය සඳහා පිළිගැනීමට සභාව විසින් තීරණය කරන ලද බවයි. මෙය ම.න.ස ආඥා පනතේ 238 වගන්තියට මුළුමනින්ම පටහැනි සඳහනකි. එහි කියවෙන්නේ ඉහතින් වූ වර්ෂය හෙවත් ප්‍රවර්තන වර්ෂයේ තක්සේරුව පසුව එළඹෙන වර්ෂය හෙවත් අනුගාමී වර්ෂය සඳහා වූ තක්සේරුව ලෙස සභාව සම්මත කළ යුතු බවයි. ඒ අනුව මෙම බදු පැනවීම මුළුමනින්ම

සාවද්‍ය හා දෝෂසහගතය. 2016 වර්ෂය සඳහා වලංගු තක්සේරුවක් නොමැතිව කිසිම මුදලක් වරිපනම් ලෙස අයකළ නොහැකිය. එසේම මෙම නිවේදනයේ 4 වන ඡේදයෙන් ඒ ඒ කාර්තුවල නියමිත දිනවලට පසුව ගෙවන ගෙවීම් සඳහා පිළිවෙලින් නේවාසික ස්ථාන සඳහා 15 % ක ද, සෙසු දේපල සඳහා 20 % ක ද වරෙන්තු ගාස්තුවක් අයකරන බවයි. මෙබඳු වරෙන්තු ගාස්තු අයකිරීමේ බලයක් නාගරික කොමසාරිස්වරයාට නීතියෙන් ලබාදී නොමැත. මෙම මුළුමනින්ම නීතියෙහි සඳහන් විධිවිධාන වරදවා වටහාගැනීමේ ප්‍රතිඵලයකි. ඒ අනුව මෙම නිවේදනයේ අන්තර්ගතය බලාතික්‍රමණයට යටත්වන හෙයින් එය නීතිය ඉදිරියේ අභියෝගයට ලක්විය හැකිය.

එබැවින් යාපනය මහා නගර සභාව වැනි කීර්තිමත් ඉතිහාසයක් ඇති ඉතා පළපුරුදු ප්‍රවීණ නිලධාරීන්ගෙන් පාලනය වූ ආයතනයක් වර්තමානයේ මෙබඳු නීතියට පටහැනි දෝෂ සහගත නිවේදන පළකිරීම එම නගරයේ වැදගත් බුද්ධිමත් ජනතාවට කරන බලවත් නිගරුවකි. මේ පිළිබඳව අදාල බළධාරීන්ගේ ක්ෂණික අවධානය යොමුවිය යුතුය.

5.2 බලපත්‍ර ගාස්තු

මහා නගර සභා ආඥා පනතේ 247.අ වගන්තිය ප්‍රකාර එම සභාව විසින් නිකුත් කරනු ලබන බලපත්‍ර වෙනුවෙන් ගාස්තුවක් ඒ සභාව විසින් නියම කොට අයකරගත හැකිය. මේ සඳහා අනිවාර්යයෙන්ම අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතුය. කිසියම් කර්මාන්තයක් (Trade) සඳහා බලපත්‍ර නිකුත් කළ යුත්තේ එයින් මහජන සෞඛ්‍යයට බලපෑමක් ඇති නොවන ආකාරයට එකී කර්මාන්තය පිහිටි පරිශ්‍රය තබාගැනිමට වගබලා ගැනීම සඳහා ය. ඒ අනුව අතුරු ව්‍යවස්ථා මගින් නියම කරණු ලබන කොන්දේසි වලට අනුකූලව අදාල පරිශ්‍රය පවත්වාගෙන යන්නේ නම් පමණක් බලපත්‍රයක් නිකුත් කළ යුත්තේය. එබැවින් අතුරු ව්‍යවස්ථා නොමැති කිසිදු කර්මාන්තයක් සම්බන්ධයෙන් බලපත්‍ර නිකුත් කළ නොහැකිය. තවද බලපත්‍රයක් කිසියම් කර්මාන්තයක් (Trade) වෙනුවෙන් නිකුත් කිරීමේදී,

i. ඒ ස්ථානයේ වාර්ෂික වටිනාකම

ii. කර්මාන්තයේ ව්‍යාපාර පිරිවැටුම

iii. ඒ කර්මාන්තයෙන් උපයනු ලැබිය හැකි ලාභය

iv. ඒ කර්මාන්තය කරගෙන යාමේදී සපයනු ලබන බඩුවල හෝ සේවා වල අත්‍යාවශ්‍ය ස්වභාවය යන කරුණු සැලකිල්ලට ගත යුතුය.

නීතියේ මෙසේ සඳහන් වුවද, අපගේ බහුතර පළාත් පාලන ආයතන මෙම විධි විධාන කිසිවක් බලපත්‍ර ගාස්තු නියම කිරීමේලා සැලකිල්ලට ගන්නා බවක් නොපෙනේ.

තවද බොහෝ පළාත් පාලන ආයතන විසින් බලපත්‍ර ගාස්තු නිකුත් කිරීමේදී අනුගමනය කළයුතු උපරිම ගාස්තු සහ එම පරිශ්‍රයන් හි වාර්ෂික වටිනාකම් නිරූපිත 247 අ වගන්තියේ විධිවිධාන සැලකිල්ලට නොගෙන එය වෙනස් කර ඊට හාත්පසින්ම වෙනස් උපලේඛණයක් ගැසට් පත්‍රයේ පළකරණු ලබන බව පෙනේ. මෙය නීතිය අභිබවා ක්‍රියාකරන අවස්ථාවකි.

" මහා නගර සභාවකට බලපත්‍ර දීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හෝ පාලනය කිරීම පිණිස අතුරු ව්‍යවස්ථා සෑදීමට සභාවට බලය ඇත්තා වූ යම් කරුණකට අදාලව බලපත්‍ර නිකුත් කිරීමේ බලධාරියාගේ අභිමතය පරිදි යම් නිශ්චිත අවස්ථානුගත තත්වයන් යටතේ එම බලපත්‍ර ප්‍රතික්ෂේප කිරීම හෝ එකී අතුරු ව්‍යවස්ථා අනුව ක්‍රියා නොකිරීම හේතුකොට ගෙන එම බලපත්‍ර අවලංගු කිරීම හෝ අත්හිටුවීම නීත්‍යානුකූල වන්නේය." (මහා නගර සභා 272 වන වගන්තිය (31) උප වගන්තිය)

මේ අනුව පැහැදිළි වන ප්‍රධාන කරුණ වන්නේ අතුරු ව්‍යවස්ථාවක් නොමැතිව කිසිම බලපත්‍රයක් නිකුත් කිරීමට ප්‍රතිපාදන නොමැති බවයි. එතෙකුදු වුවත් මෙරට වර්තමානයේ සෑම පළාත් පාලන ආයතනයක්ම අතුරු ව්‍යවස්ථාවක් මගින් කිසිසේත් ආවරණය නොවන කර්මාන්ත (Trade) සඳහා බලපත්‍ර නිකුත් කරන නියාගෙන් රිසිට් පත් පමණක් නිකුත්කර මුදල් අයකිරීම සිරිතක් කොට ගෙන ඇත.

මෙය ඉතා සාවද්‍ය හා නීති විරෝධී ක්‍රියාවකි. මීට අමතරව මෙම අධ්‍යයනයේදී පරීක්ෂාවට ලක්වූ බොහෝ පළාත් පාලන ආයතනයන්හි ආදායම් ලේඛණයන්හි හිඟ බලපත්‍ර ගාස්තු විශාල වශයෙන් පවත්වාගෙන යනු ලබන බව පෙනේ. මෙයද බොහෝ ආයතනවල නිලධාරීන්ගේ සාවද්‍ය වැටහීම හේතුකොට ගෙන හා වැරදි උපදෙස් හා මඟ පෙන්වීම මත සිදුවන ක්‍රියාවකි. කිසියම් කර්මාන්තයක් සඳහා බලපත්‍රයක් නිකුත්කළ යුත්තේ අදාල වෙළඳ ස්ථානය ඊට නියමිත අතුරු ව්‍යවස්ථාවේ දැක්වෙන විධිවිධාන, කොන්දේසි සියල්ල සපුරා ඇති විටකය.

එබඳු ස්ථානයකට නියමිත බලපත්‍රය නිකුත් කිරීමෙන් පසු අදාල බලපත්‍ර ගාස්තුව අයකෙරේ. එසේ අදාල අවශ්‍යතා සපුරා නැති කර්මාන්ත හෝ වෙළඳම් සම්බන්ධයෙන් නිසි අවසරය නොමැතිව අදාල කර්මාන්තය කරගෙන යන බවට නීතිමය ක්‍රියාමාර්ග ගෙන නිසි ප්‍රතිචාර නොමැතිවිට එම ස්ථානය වසා දැමීමේ නියෝගයක් (Closing Order) අධිකරණය විසින් නිකුත් කරනු ඇත. එබඳු පැහැදිලි නීතිමය පදනමක් පැවතිය දී හිඟ බලපත්‍ර ගාස්තු ඇතිවන්නේ නම් ඊට හේතුව එම පළාත් පාලන ආයතනය ණය පදනම මත බලපත්‍ර නිකුත්කර තිබීමයි. එහෙත් කිසිම පළාත් පාලන ආයතනයකට මොනම තත්වයක් යටතේ වත් එබඳු ක්‍රියාමාර්ගයක් ගත නොහැකිය. එසේ නම් මීට හේතුව නිලධාරීන්ගේ අධික නොසැලකිලිමත් බව හා අනවබෝධයයි.

වෙළඳ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය තුල සුලභව දැකිය හැකි තවත් වැදගත් කරුණක් වන්නේ බොහෝ පළාත් පාලන ආයතන බලපත්‍ර ගාස්තු පැනවීමේදී හා ගැසට් නිවේදන පළකිරීමේදී ද බලපත්‍ර ගාස්තු, කර්මාන්ත බදු හා ව්‍යාපාර බදු සහ වෘත්තීය බදු යන ආදායම් වර්ග සියල්ල මිශ්‍රකර ගැසට් නිවේදනවල පළකිරීමයි. මෙම සාවද්‍ය ක්‍රියාවලිය ඇති වීමට හේතුව වන්නේ මෙම නිවේදන පළකරන නාගරික කොමසාරිස්වරුන්, සභා ලේකම්වරුන් හෝ එම සභාවල අදාල විෂයභාර නිලධාරීන් තුල මෙම ආදායම් මාර්ග අතර පවතින වෙනස් කම් හා බලපත්‍ර ගාස්තු, කර්මාන්ත බදු හෝ ව්‍යාපාර බදු අදාල වන කර්මාන්ත හෝ ව්‍යාපාර පිළිබඳ මූලික අවබෝධයක් නොමැතිවීමයි. මහා නගර සභා සම්බන්ධයෙන් මෙම තත්වය කොතරම් පසුගාමී තත්වයක පවතී ද යන්න නියැදියේ ඇති මහා නගර සභා 12 අතුරින් නිවැරදිව බලපත්‍ර ගාස්තු පනවා තිබූයේ එක් ආයතනයක් පමණත් වීමෙන් පැහැදිලි වේ. එය ප්‍රතිශතයක් ලෙස ගත්කල එය 0.12% කි. බොහෝ දුරට සාමාන්‍ය තත්වය ද මීට ආසන්න අගයක් ගැනීම පුදුමයට කරුණක් නොවේ.

මීට අමතරව ඇතැම් පළාත් පාලන ආයතන බලපත්‍ර ගාස්තු පැනවීම පිළිබඳ අධිකාරී බලය සභාව සතු වුවද එය එම ආයතනයේ විධායක ප්‍රධානියා හෝ පරිපාලන ප්‍රධානියා විසින් සිදුකරනු ලැබ තිබීමද දක්නට ලැබේ. මෙම තත්වය සභා ක්‍රියාකාරීව පවතින විට මෙන්ම එසේ නොමැති අවස්ථාවල පවා දැකිය හැකි විය. මේ හැර ඇතැම් ආයතන බලපත්‍ර ගාස්තු හා සෙසු බදු පැනවීම් නිවේදන සියල්ල පළකර ඇතත් ඒවා පළ කලේ කවුරුන්ද යන්න ගැන

කිසිදු සඳහනක් කර නැත. මෙබඳු දෝෂ සහිත සභා තීරණ මෙන්ම ගැසට් නිවේදන ද බහුලව පළකර තිබෙනු දැකිය හැකි හෙයින් එබඳු සියළු පැනවීම් නීතිය ඉදිරියේ නිසැකවම අභියෝගයට ලක්විය හැකිය. එබැවින් මෙහිලා සෘජු අධීක්ෂණ වගකීම උසුලන පළාත් පාලන කොමසාරිස්වරුන්, දිස්ත්‍රික් භාර සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන්, ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරීන් හා විමර්ශන නිලධාරීන් සිය විශේෂ අවධානය යොමුකළ යුතුය. එහෙත් එබඳු නිලධාරීන්ගේ අවධානය පසුගිය වසර ගණනාවක් තුළ මේ කෙරෙහි යොමුවී ඇති බවක් නොපෙනේ. මධ්‍යම පළාතේ ප.ප.කො වරයා පමණක් මේ ගැන ආදාල නිලධාරීන්ගේ අවධානය යොමු කරවා ඇත. මීළඟට නියැදිගත එක් එක් මහා නගර සභාවේ වෙළඳ බලපත්‍ර ගාස්තු පැනවීම පිළිබඳ පවතින තත්වය විශ්ලේෂණය කිරීම වැදගත් වේ.

5.2.1 කොළඹ මහා නගර සභාව

කොළඹ මහා නගර සභාව 2016 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම 2015 ඔක් මස 26 දින පැවති මහා සභා රැස්වීමේදී අනුමත කරන ලද බව 2015.12.04 දින අංක 1944 දරන ගැසට් පත්‍රයේ නිවේදනය පළකරමින් සඳහන් කර ඇත. එහෙත් එම නිවේදනය සමඟ අදාල සභා යෝජනාව හෝ තීරණය පළකර නැත. එය සැලකිය යුතු ඌණ තත්වයකි. මේ හැර මෙම බලපත්‍ර ගාස්තු පැනවීම පිළිබඳ නිවේදනය තුළම කර්මාන්ත බදු, ව්‍යාපාර බදු සහ ඇතැම් ඉඩම් විකිණීම විෂයෙහි බදු අය කිරීමක් ද පනවා ඇත. මෙය අතිශයින් සාවද්‍ය ක්‍රියා මාර්ගයකි. මේ එක් එක් ආදායම් විෂයෙහි වෙන වෙනම නිවේදන ඊට අදාල සභා යෝජනාව / තීරණය සමඟ ප්‍රසිද්ධ කළ යුතුය.

මෙහිදී සභාව විසින් පැනවිය යුතු ආදායම් සමඟ ඇමතිවරයා මහා නගර සභා ආඥා පනතේ 247 (ඉ) වගන්තිය මඟින් පනවා ඇති "ඇතැම් ඉඩම් විකිණීම විෂයෙහි වූ බද්ද" නැවත සභාව විසින් පනවා නිවේදනය කොට තිබීම ඉතාමත් සාවද්‍ය කාර්යයකි. එබඳු බද්දක් පැනවීමට බලයක් කොළඹ මහා නගර සභාවට නීතියෙන් පවරා දී නැත. ඒ අනුව මෙය බලාතික්‍රමණයට යටත් වන බලය ඉක්මවා කටයුතු කිරීමකි.

මේ අනුව මෙම ගැසට් නිවේදනය විධිමත් නොවන අතර නීතිය ඉදිරියේ අභියෝගයට ලක්වීමට ඉඩකඩ පවතින බව පෙන්වා දිය හැකිය. එම නිවේදනය යටතේ ඇති උපලේඛන

අංක 01 සමඟ වූ ලේඛනය මහා නගර සභා ආඥා පනතේ 247 (අ) වගන්තිය ප්‍රකාර බලපත්‍ර ගාස්තු අයකිරීමට අදාල කාර්යයන් පිළිබඳ ලැයිස්තුව වශයෙන් සඳහන් කර ඇත. එහෙත් එහි ඇති අදාල දේපල වල වාර්ෂික වටිනාකම් හා බලපත්‍ර ගාස්තුව දැක්වෙන වක්‍රය ආඥා පනතේ දැක්වෙන අදාල සටහනට වඩා වෙනස් වූවක් බව පෙනේ. ආඥා පනතේ සඳහන් වාර්ෂික වටිනාකම් මට්ටම් තුනක ව්‍යුහය මට්ටම් පහක ව්‍යුහයක් ලෙස පරිශ්‍රයක වටිනාකම රුපියල් 1 ක සිට රු50,001 ට වැඩි ලෙස දක්වා ඇත. මෙය නීතියේ දැක්වෙන ප්‍රතිපාදන වලට පටහැනි වූවකි. ඒ අනුව එය නීතියේ විධිවිධාන ඉක්මවා ක්‍රියාකිරීමක් බව පෙනේ. එසේම අදාල උපලේඛනයෙහි බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත / වෙළඳ ව්‍යාපාර 148 ක් සඳහන් ය. මෙම දීර්ඝ ලැයිස්තුව තුල නියම වශයෙන් බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත / වෙළඳාම් මෙන්ම කර්මාන්ත බද්දට හා ව්‍යාපාර බද්දට යටත් වියයුතු කර්මාන්ත හා ව්‍යාපාර රාශියක් අඩංගු වී ඇත. මෙම වාර්තාවෙහි මීට ප්‍රථම ද සඳහන් කර ඇති පරිදි පළාත් පාලන ආයතනයකට බලපත්‍රයක් නිකුත් කළ හැක්කේ අතුරු ව්‍යවස්ථාවක් මගින් ආවරණය වන වෙළඳාමක් හෝ කාර්යයක් සම්බන්ධයෙන් පමණි.

කොළඹ මහා නගර සභාවේ ක්‍රියාත්මක වන්නේ 1900 - 1953 අතර කාලයේ සම්මත කරන ලද ඉතා සීමිත විෂය පථයකට අයත් අතුරු ව්‍යවස්ථා 45 ක් පමණ ප්‍රමාණයකි. මෙම අතිශය පැරණි යාවත්කාලීන නොවූ සීමිත පරාසයක වූ අතුරු ව්‍යවස්ථා මගින් මෙම උපලේඛන අංක 01 හි සඳහන් වෙළඳාම් හා කර්මාන්ත 148 ක තරම් ප්‍රමාණයකට බලපත්‍ර නිකුත් කරන්නේ කෙසේද? ඒ හැරත් මෙම උප ලේඛනයෙහි දැක්වෙන බොහෝ නවීන හා සමාජයේ බහුල ලෙස ප්‍රචලිත වෙළඳාම් සඳහා කිසිම අතුරු ව්‍යවස්ථාවක් හෝ නීතියක් නොමැතිව බලපත්‍ර නිකුත් කරන්නේ කෙසේද? කොළඹ මහා නගර සභාව අමාත්‍යවරයා විසින් ගැසට් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථා ද වැළඳ ගෙන නොමැති හෙයින් දැනට බලාත්මක පැරණි අතුරු ව්‍යවස්ථා මගින් 148 ක් තරම් වූ අළුත් වෙළඳ ක්ෂේත්‍ර ආවරණය කරන්නේ හෝ එකී වෙළඳ පරිශ්‍රයන් පරීක්ෂා කරනු ලබන්නේ කෙසේද ? යන්න ප්‍රශ්න සහගතය. එසේම අංක 83 වෙඩි බෙහෙත් ගබඩා කිරීම 97 වෙඩි බෙහෙත් නිෂ්පාදනය සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ බලයත් කොළඹ මහා නගර සභාවට ලබාදී නැත.

එබැවින් ඉහත ගැසට් නිවේදනය දෝෂ සහිත හා බල රහිත වූ නිවේදනයක් ලෙස සැලකීමට සිදුවේ. මෙවැනි තත්වයක් උද්ගතවීමට හේතුව වන්නේ බලපත්‍ර ගාස්තු හා බදු අතර පවතින

වෙනස හා ඒ පිළිබඳ නෛතික ස්වරූපය නිලධාරීන් විසින් අවබෝධ කොට ගෙන නොමැතිවීමයි.

5.2.2 දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව 2016 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීමට අදාල සභා සම්මුතිය 2015 ජූලි මස 02 දින පැවති මහා සභා රැස්වීමේදී සම්මත කර 2015.08.21 දිනැති අංක 1929 දරණ ගැසට් පත්‍රයේ නගරාධිපතිවරයා විසින් පළකර ඇත. මෙම නිවේදනය සමඟ අදාල සභා යෝජනාවද පළකර තිබේ. එකී යෝජනාවෙහි සඳහන් වන්නේ 2016 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම යනුවෙනි. එසේම මෙය බලපත්‍ර මත ගාස්තු පැනවීම ලෙස සභා යෝජනාවේද සඳහන්ව ඇත. එහෙත් ආඥා පනතේ 247 (අ) වගන්තියෙහි සඳහන් වන්නේ ඇතැම් බලපත්‍ර ගාස්තු අයකර ගැනීම යනුවෙනි. ඒ අනුව මෙසේ සාවද්‍ය ලෙස තොරතුරු සඳහන් කිරීමේ නැඹුරුවක් මෙහි පවතින බව පෙනීයයි.

මෙය අයිතම 138 කින් සමන්විත ඉතා දීර්ඝ ලැයිස්තුවක් ලෙස ගැසට් පත්‍රයේ පළවේ. මෙම ලැයිස්තුවේ දැක්වෙන සියළු වෙළඳාම් / කර්මාන්ත (Trade) සඳහා අතුරු ව්‍යවස්ථා පැවතිය යුතු වුවද සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳගෙන ඇති දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව උපරිම වශයෙන් වැළඳ ගෙන ඇත්තේ අතුරු ව්‍යවස්ථා 42 ක් පමණි. එයිනුත් වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම සඳහා අදාල වන්නේ අතුරු ව්‍යවස්ථා උපරිම වශයෙන් 20 - 25 ක් අතර ප්‍රමාණයක් විය හැකිය. එසේ නම් වෙළඳාම් / කර්මාන්ත 138 ක් සඳහා බලපත්‍ර නිකුත් කිරීමක් අපේක්ෂා කරන්නේ කෙසේද ? මෙම වෙළඳාම් 138 න් 45 ක් ගබඩා කිරීම් ලෙස දක්වා ඇත. එහෙත් ගබඩා කිරීම වෙළඳ ව්‍යාපාරයක් නොවේ. ව්‍යාපාරයක් යනු කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් නිපදවා හෝ මිලට ගෙන ලාභයක් අපේක්ෂාවෙන් විකිණීමයි.

ගබඩා කිරීම ව්‍යාපාරයක් වීමට නම් කිසියම් ව්‍යවසායකයෙකු විශාල එමෙන්ම යෝග්‍ය ගුදම්, ගබඩා පහසුකම් සපයා නිෂ්පාදකයින්, ආනයනකරුවන් ආදීන්ගේ භාණ්ඩ යම් කාලයක් සිය භාරයේ ආරක්ෂිතව තබාගෙන සිට අවශ්‍ය අවස්ථා වලදී පිටතට ලබාදී ඊට නියමිත ගාස්තු ලබාගැනීම කළයුතුය. දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව ඉහත අවස්ථා 45 දීම කිසියම් ව්‍යාපාරිකයෙකු වෙළඳාම පිණිස සිය ව්‍යාපාරයෙහි කිසියම් භාණ්ඩයක් අසුරා තබාගැනීම අදහස් කොට ඇත. මෙය ඉතාමත් වැරදි සහගත වර්ගීකරණයකි.

මේ හැර මෙම බලපත්‍ර නිකුත් කළ යුතු කර්මාන්ත / වෙළඳාම් ලැයිස්තුවෙහි වෙඩි බෙහෙත් සහ පුපුරණ ද්‍රව්‍ය ගබඩාකොට තැබීම (122) දක්වා ඇත. මේ පිළිබඳ බලපත්‍ර බලධාරියා වන්නේ රජයේ දිසාපතිවරයාය. ඊට බලපත්‍ර දීමේ බලය දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවට පවරා නැත. මෙය බලාතික්‍රමණයට පාදක වන්නකි. එසේම මෙම ලේඛනයෙහි ජාත්‍යන්තර පාසල් (131) දේශීය හා බටහිර වෛද්‍ය ප්‍රතිකාර කරනු ලබන පෞද්ගලික රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථාන (132) සන්නිවේදන කුළුණු පවත්වාගෙන යන ස්ථාන (133) පෞද්ගලික අධ්‍යාපන ආයතන (136) සිනමා ශාලා හා රෝහල් (137) ආදිය ඇතුළු එබඳු ස්ථාන ගණනාවක් දක්වා ඇත. මෙම බොහෝ කරුණු මහා නගර සභාවේ විෂය පථයට අයත් ඒවා නොවේ. එබඳු ආයතනවල කාර්යයන් විෂයෙහි බලපත්‍ර නිකුත් කරන්නේ මහා නගර සභාවේ කුමන අතුරු ව්‍යවස්ථාවක් යටතේ ද? යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවේ.

මේ අනුව බලනකල දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ 2016 වසර සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම වෙනුවෙන් වූ තීරණය හා ගැසට් නිවේදනය අතිශයින් දෝෂ සහගත හා නීතිය ඉදිරියේ අභියෝගයට ලක්කිරීම ඉඩ ඇති බලය ඉක්මවා යමින් සභාව හා නගරාධිපතිවරයා විසින් සිදුකර ඇති නීතියට අනුකූල නොවන පැනවීමක් බව පෙනේ.

5.2.3 ගම්පහ මහා නගර සභාව

ගම්පහ මහා නගර සභාව 2016 වර්ෂය සඳහා 2015.12.18 දිනැති අංක 1946 දරණ ගැසට් පත්‍රයෙහි පළකරන ලද නිවේදනය පරිදි බලපත්‍ර ගාස්තු පනවා ඇති බව නිවේදනය කර ඇත. 2015 සැප්තැම්බර් මස 11 වන දින පැවති මහා සභාවේදී මේ පිළිබඳව යෝජනා සම්මත කරන ලදුව අදාල සභා යෝජනාවද ගැසට් නිවේදනය සමඟ පළකර ඇත.

මීට අදාලව පළකර ඇති උපලේඛනය පරීක්ෂා කිරීමේදී එහි ප්‍රධාන කොටස් තුනක් යටතේ බලපත්‍ර ලබාගත යුතු කාර්යයන් දක්වා තිබේ.

1.	පීඩාකාරී කර්මාන්ත හෝ ව්‍යාපාර	- 80
2.	අන්තරාදායක කර්මාන්ත හෝ ව්‍යාපාර	- 78
3.	අන්තරාදායක හා පීඩාකාරී කර්මාන්ත ව්‍යාපාර	- 38
	බලපත්‍ර ලබාගත යුතු මුළු කර්මාන්ත / ව්‍යාපාර සංඛ්‍යාව	196

මෙහිදී අදාල උපලේඛනයෙහි කර්මාන්ත හෝ ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන පරිශ්‍රයන්හි වාර්ෂික වටිනාකම් මහා නගර සභා ආඥා පනතේ 247 ආ (2) වගන්තියේ, සටහනේ දැක්වෙන ප්‍රමාණයන් ඉක්මවා සඳහන් කර ඇති බව පෙනේ. එහි දැක්වෙන්නේ පියවර තුනකින් යුතුව රුපියල් 1500 දක්වා, රු 1500/- - රු 2500/- දක්වා සහ රු 2500/- ඉක්මවන විට යනාදි වශයෙනි. එහෙත් මෙම නිවේදනයේ පියවර 13 ක් යටතේ පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම රු 2500/- දක්වා සිට රු 185,000/- ට වැඩි ලෙස දක්වා ඇත. මෙය පවත්නා නීතියේ විධිවිධාන අභිබවා යමින් සිදුකර ඇති වෙනස් කමකි. එහෙත් අදාල බලපත්‍ර ගාස්තුවේ වෙනසක් සිදුකොට නොමැති වීම වැදගත් කරුණකි.

දෙවනුව උපලේඛනයේ පළමු ගණයට අයත් පීඩාකාරී කර්මාන්ත ගණයට ආපන ශාලාවක් පවත්වාගෙන යාම (1) තේ කඩයක් පවත්වාගෙන යාම (2) බේකරියක් පවත්වාගෙන යාම (3) තේ සහ බත් කඩයක් පවත්වාගෙන යාම (4) හෝටලයක් පවත්වාගෙන යාම (6) නවාතැන් පළක් පවත්වාගෙන යාම (7) ආදී කාර්යයන් ගණනාවක් දක්වා ඇත. මෙම කාර්යයන් ගෙන් සිදුවන පීඩාකාරී බව කුමක්ද ? මේ කිසිම කාර්යයක් පීඩාකාරී කර්මාන්ත ගණයට නොවැටේ. නමුත් ඒවා පිහිටි පරිශ්‍රයන් අදාල අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ එකී කාර්යය සඳහා සුදුසු බවට සහතික වී බලපත්‍ර නිකුත් කිරීම සඳහා විෂය වන්නේය.

බලපත්‍ර ලබාදීමේ තීරණය සඳහා කිසියම් කර්මාන්තයක් එනම් හමි පදම් කිරීම, ගව ගාලක් පවත්වාගෙන යාම, කිරි පට්ටි පවත්වාගෙන යාම, මාළු වෙළඳාම් කරන ස්ථානයක් පවත්වගෙන යාම, ලේත් මැෂින්, බෙලෙක් වැඩ පළවල්, ශබ්දවාහිනී යන්ත්‍ර ක්‍රියාකරවීම ආදී දේ සඳහා වෙන වෙනම අතුරු ව්‍යවස්ථා අනුමත කොට ගෙන තිබිය යුතුය. එමෙන්ම කිසියම් කර්මාන්තයක් අන්තරාදායක වන්නේ නම් එනම් රසායනික ද්‍රව්‍ය නිපදවීම කළුගල් වැඩ පළවල්, ගල් , උළු පෝරණු යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම, මෝටර් වාහන සර්විස් කිරීම, ගිනි පෙට්ටි නිශ්පාදන, ඇසිඩ් වර්ග නිපදවීම යානාදී කර්මාන්ත පවත්වාගෙන යනු ලබන ස්ථානයන්හි යෝග්‍යතාව හා මහජන සෞඛ්‍යයට ඇති අන්තරායකාරී බව නැති කිරීමට අදාල විධිවිධාන ඇතුලත් අතුරු ව්‍යවස්ථා වෙන වෙනම සම්මත කොට ගෙන තිබිය යුතුය.

එහෙත් එබඳු අතුරු ව්‍යවස්ථා කිසිවක් ගම්පහ මහා නගර සභාව සම්පාදනය කොට නැති අතර සම්මත අතුරු ව්‍යවස්ථාවන්හිද එබඳු කර්මාන්ත සම්බන්ධයෙන් ඉතා සීමිත අතුරු ව්‍යවස්ථා සංඛ්‍යාවක් පමණක් පැවතීම හේතුකොට ගෙන මෙම කාර්යයන් උදෙසා බලපත්‍ර නිකුත් කිරීම ගම්පහ මහා නගර සභාව කුමන නීතියක් පදනම් කරගන්නේ ද යන ප්‍රශ්නය පැන නගී. සම්මත නීතියකින් හෝ අතුරු ව්‍යවස්ථාවකින් තොරව කිසිදු බලපත්‍රයක් නිකුත් කිරීම නීත්‍යානුකූල නොවේ. ඒ අනුව විෂයයන් 196 ක් සඳහා බලපත්‍ර ලබාදීමට සභාව ගෙන ඇති තීරණය පවතින නීතිය අනුව ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැක්කක් නොවන බව පෙනේ. මෙම ලේඛනයේ ඇති බොහෝ කරුණු කර්මාන්ත බදු (Trade Tax) හෝ ව්‍යාපාර බදු (Bissuness Tax) සඳහා අනුගත කළහැකි බව පෙනේ. එබැවින් මෙය අවිධිමත් හා සිය බල අධිකාරය ඉක්මවා පනවන ලද නීතිය ඉදිරියේ අභියෝගයට ලක්විය හැකි බලපත්‍ර ගාස්තු පැනවීමක් ලෙස සැලකිය යුතුවේ.

5.2.4 කුරුණෑගල මහා නගර සභාව

කුරුණෑගල මහා නගර සභාව 2016 වර්ෂය සඳහා විධිමත් ලෙස බලපත්‍ර ගාස්තු පනවා ගැසට් පත්‍රයේ පළකර ඇති බව නිරීක්ෂණය නොවිය. එම සභාව 2016 වසර සඳහා වරිපනම් පමණක් ගැසට් පත්‍රයේ පළ කර තිබුණි. බලපත්‍ර ගාස්තු පැනවීමට අදාල තොරතුරු ලබා ගැනීමට අවස්ථා කිහිපයකදීම අදාල නිළධාරීන් ඇමතුවද ඊට නිසි ප්‍රතිචාර නොලැබුණි.

5.2.5 මහනුවර මහා නගර සභාව

මහනුවර මහා නගර සභාව 2016 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම 2015.11.24 වැනි දින සභා තීරණය මගින් සිදුකර 2016.01.01 දින අංක 1948 දරණ ගැසට් පත්‍රය මගින් එකී බලපත්‍ර ගාස්තු පැනවීම නගරාධිපතිවරයාගේ නමින් ප්‍රකාශයට පත්කර ඇත. මෙම නිවේදනය මගින් මහා නගර සභා ආඥා පනතේ 247 අ, 247 ආ සහ 247 ඇ වගන්ති ප්‍රකාර උපලේඛනයෙහි දැක්වෙන පීඩාකාරී අන්තරාදායක සහ අන්තරාදායක වෙළඳ ව්‍යාපාර හා කර්මාන්ත විෂයෙහි **බලපත්‍ර සහ ගාස්තු පැනවීම** ලෙස දක්වා ඇත. මෙය ඉතාම දෝෂ සහගත යෙදුමකි. ඉහත වගන්ති වලින් බලපත්‍ර ගාස්තු, කර්මාන්ත බදු ව්‍යාපාර හා වෘත්තීය බදු පැනවීම් අදහස් වූවත් ඉන් අනතුරුව සඳහන් කර ඇත්තේ අන්තරාදායක කර්මාන්ත බදු හා ව්‍යාපාර සඳහා බලපත්‍ර සහ ගාස්තු පැනවීමක් ගැනය. එබැවින් මෙය අතිශය ව්‍යාකූල නිවේදනයකි. කෙසේ වෙතත්

මෙම නිවේදනය සමඟ අදාල සභා යෝජනාව / තීරණය අමුණා තිබිය යුතු වුවත් එවැන්නක් අමුණා නැත. මෙම සාවද්‍ය නිවේදනය නගරාධිපතිවරයාගේ නමින් පළකිරීම ද නොකළ යුතුව තිබුණි.

අදාල උපලේඛනයෙහි විෂයයන් 149 ක් සම්බන්ධයෙන් බලපත්‍ර ගාස්තු පනවනු ලැබ ඇත. මෙම උප ලේඛනයෙහි ද කොළඹ හා ගම්පහ මහා නගර සභාවන්හි මෙන්ම කර්මාන්ත පරිශ්‍රයන්හි වාර්ෂික වටිනාකම් මහා නගර සභා ආඥා පනතේ 247 අ වගන්තියේ විධි විධාන වලට පටහැනිව අවමය රු 5000/- දක්වා සිට උපරිමය රු 75000 /- ට වැඩි ලෙස පියවර 7 කින් දක්වා ඇත. එහෙත් බලපත්‍ර ගාස්තුවෙහි වෙනසක් සිදුකර නොතිබීම වැදගත් කරුණකි. මෙම ලේඛණයෙහි බලපත්‍ර ගාස්තු වලට අදාල නොවන වෘත්තීන් කිහිපයක් ද ඇතුලත්වේ.

උදා :-

(92) - පෞද්ගලික පශුවෛද්‍ය හලක් පවත්වාගෙන යාම.

(95) - පෞද්ගලික දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම

(127) - උපකාරක පන්ති පවත්වාගෙන යාම

(130) - ජාත්‍යන්තර පාසලක් පවත්වාගෙන යාම

(131) - ළදරු පාසලක් පවත්වාගෙන යාම

(132) - දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම

මෙබඳු අවස්ථා ගණනාවක් හා කර්මාන්ත බදු සඳහා අයත්විය යුතු විෂයයන් රාශියක් ද බලපත්‍ර ගාස්තු පැනවීමට යටත් කර ඇත. එසේම 247 අ වගන්තියට ඇතුලත් නොවන්නා සේම ලංකාවේ පළාත් පාලන ආයතනයන්හි විෂය පථයට අයත් නොවන සමහර කාර්යයන් සම්බන්ධයෙන්ද බලපත්‍ර ගාස්තු නියම කර තිබේ.

උදා:-

(71) ප්‍රධාන වශයෙන් වෙඩි බෙහෙත් හෝ රතිඤ්ඤා විකිණීම.

මේ සම්බන්ධයෙන් පුපුරණ ද්‍රව්‍ය ආඥා පනත යටතේ රජය මගින් බලපත්‍ර නිකුත් කරනු ලැබේ. පළාත් පාලන ආයතනවලට මෙම කාර්යය සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ බලතල පවරා නැත. (කරුණාකර මහා නගර සභා ආඥා පනත 2 වන උපලේඛණය බලන්න.) නගරය තුල එබඳු

ව්‍යාපාර සඳහා නිසි බලධරයා නිකුත් කරනු ලබන (රජය) බලපත්‍ර ගාස්තු සභාවට ලැබිය යුතුවේ.

උදා:-

(128) බණිජ තෙල් ගබඩා කිරීම.

(129) භූමිතෙල් සිල්ලර වෙළඳාම.

බණිජ තෙල් ආඥා පනතේ විධිවිධාන යටතේ බණිජ තෙල් විකිණීම, ප්‍රවාහනය කිරීම, ගබඩා කිරීම ආදී කටයුතු සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ බලය එම විෂයභාර අමාත්‍යවරයා විසින් 1975 වර්ෂයේදී පළාත් පාලන ආයතන වෙත පවරාදී තිබේ. බණිජතෙල් ආඥා පනත යටතේ පනවා ඇති රෙගුලාසි වලට අනුකූලව එම බලපත්‍ර නිකුත් කළ යුතුය. ඊට අදාල කරගත යුතු ගාස්තු ආදිය එකී රෙගුලාසි වල නියම කර තිබේ. එසේ වුවද මෙම බලපත්‍ර ගාස්තු පැනවීම මගින් මහනුවර මහා නගර සභාව බලාතික්‍රමණය කර තිබේ. මේ සම්බන්ධයෙන් මෙහි බලපෑමට ලක්වන පාර්ශව නීතිමය පියවර ගත හොත් සභාවට එහි ප්‍රතිවිපාක වලට මුහුණදීමට සිදුවේ. ඒ අනුව මහනුවර මහා නගර සභාව 2016 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීමේ පරිපාටිය මෙන්ම එහි හරයද දෝෂ සහගත වන අතර නිවේදනය බොහෝ අඩුපාඩු වලින් ගහණ වූවකි. මෙමගින් බලපත්‍ර ගාස්තු අයකිරීම අතිශය අවදානම්කාරී ක්‍රියා මාර්ගයක් ලෙස දැක්විය හැකිය.

5.2.6 දඹුල්ල මහා නගර සභාව

2016 වර්ෂය සඳහා වූ බලපත්‍ර ගාස්තු පැනවීම පිළිබඳ ගැසට් නිවේදනය එහි නාගරික කොමසාරිස්වරයා විසින් 2016.01.01 දිනැති අංක 1948 දරණ ගැසට් පත්‍රයේ පළකර ඇත. මෙම නිවේදනය පළකර ඇත්තේ (එම සභාවේ) කළමනාකරණ කමිටු තීරණයක් ලෙසිනි. සභාව ක්‍රියාත්මක නොවන අවස්ථාවක නාගරික කොමසාරිස්වරයාට මහා නගර සභා ආඥා පනතේ 286 අ වගන්තිය යටතේ සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය පැවරේ. ඒ අනුව බලපත්‍ර ගාස්තු පැනවීමේ බලධාරීත්වය හිමි සභාවේ කාර්ය ඉටුකිරීමේදී නාගරික කොමසාරිස්වරයාට තමාට එම බලය හිමිවන බලදායී වගන්තිය පැනවීම් තීරණයෙහි මෙන්ම ගැසට් නිවේදනයේ ද පැහැදිලිව සඳහන් කර පැනවීම කළ යුතුවේ. කිසිම මහා නගර සභාවක කළමනාකරණ කමිටුවකට බලපත්‍ර ගාස්තු හෝ වෙන කිනම් බද්දක් පැනවීමේ බලයක් ලබාදී

නැත. එහෙත් මෙහිදී පැනවීම කර ඇත්තේ එම කමිටුවයි. එබැවින් මෙම පැනවීම සහ මුලින්ම නීතියට පටහැනි වූවකි.

එසේම මෙම නිවේදනය මගින් අදාල නීතිමය වගන්ති සඳහන් කර 2016 වර්ෂයට බලපත්‍ර ගාස්තු හා ව්‍යාපාර බදු පමණක් පනවා ඇත. නමුත් කර්මාන්ත බද්දක් පැනවූ බවක් එම නිවේදනයේ සඳහන් නොවේ. බලපත්‍ර ගාස්තු පනවා ඇතැයි සඳහන් දීර්ඝ ලේඛනයේ අංක 90 ට පසු 247 (ආ) වගන්තිය යටතේ පහත සඳහන් ව්‍යාපාර වලින් කර්මාන්ත බද්දක් අයකරනු ලබන බව සඳහන් කර ඇත. එහෙත් කර්මාන්ත බද්දක් පැනවූ බවට මෙම නිවේදනයේ සඳහනක් නැත.

බලපත්‍ර ගාස්තු පැනවූ ව්‍යාපාර 90 ක් මෙම ලේඛණයේ දැක්වේ. එහි වෙළඳ පරිශ්‍රයන්හි වාර්ෂික වටිනාකම් ආඥා පනතේ 247 අ (2) උප වගන්තියෙහි දැක්වෙන ආකාරයට පටහැනිව කොළඹ හා මහනුවර මහා නගර සභාවන්හි පරිදිම සඳහන් කර තිබේ. එහි ගබඩා කිරීමේ ස්ථාන 10 ක් තිබේ. ගබඩා කිරීම කර්මාන්තයක් හෝ වෙළඳාමක් නොවේ. එයට බලපත්‍ර දීම සිදුකළ නොහැකිය. මේ හැර 77 ප්‍රධාන වශයෙන් වෙඩි බෙහෙත් හෝ රතිඤ්ඤා විකිණීම සඳහා බලපත්‍ර ගාස්තු පනවා ඇත. මෙය පළාත් පාලන ආයතන විෂය පථයට ගැනෙන කාර්යයක් නොවේ. එය පුපුරණ ද්‍රව්‍ය ආඥා පනත යටතේ දිසාපතිවරයාගේ අධිකාරීත්වය යටතේ බලපත්‍ර නිකුත්කරනු ලබන කාර්යයකි. ඒ අනුව මෙම පැනවීම බලාතික්‍රමණයට යටත්වේ. තවද, අංක 16 හා 17 යටතේ සීනි හා පිටි වියලි ධාන්‍ය ලෙස හඳුන්වා බලපත්‍ර ගාස්තු පනවා ඇත. මෙය සාවද්‍ය යෙදුමකි. එසේම අංක 22 මිනිපෙට්ටි සාප්පුවක් පවත්වාගෙන යාම 23 රූපලාවන්‍ය ආයතනයක් හෝ මනාලියන් හැඩගැන්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම අංක 48 පිහිණුම් පාසැලක් පවත්වාගෙන යාම. 51 තක්සේරු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම සඳහා 59 මුද්‍රණාලයක් පවත්වාගෙන යාම 62 ඇඟළුම් කම්හලක් හෝ ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම ආදී බලපත්‍ර ගාස්තු පැනවීමට අදාල නොවන කර්මාන්ත, වෘත්තීන් හා ව්‍යාපාර ගණනාවක් මෙහි අන්තර්ගතව ඇත.

තවද මහා නගර සභාවක සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳ ගෙන ඇති විටක බලපත්‍ර නිකුත් කිරීම පිණිස අදාල කරගත හැකි අතුරු ව්‍යවස්ථා උපරිම වශයෙන් ගතහොත් ඇත්තේ 25 ක් පමණය. එහෙත් මෙම ලේඛණයේ වෙළඳ ව්‍යාපාර / කර්මාන්ත 90 ක් සඳහා බලපත්‍ර ගාස්තු

පනවා ඇත. නියමිත අතුරු ව්‍යවස්ථාවකින් තොරව එකදු බලපත්‍රයක් හෝ නිකුත් කිරීම නීත්‍යානුකූල නොවේ.

ඒ සමගම යටකී ලැයිස්තුවෙහි අන්තරායදායක හා පීඩාකාරී වෙළඳාම් / කර්මාන්ත වශයෙන් සැලකිය යුතු තරම් සංඛ්‍යාවක් දක්වා ඇත. එහෙත් බලපත්‍ර නිකුත් කිරීමට නම් ඒ සියළු කර්මාන්ත සඳහා වෙන වෙනම අතුරු ව්‍යවස්ථා තිබිය යුතුවේ. ඒ අනුව දඹුල්ල මහා නගර සභාවේ 2016 වර්ෂය සඳහා වූ බලපත්‍ර ගාස්තු පැනවීම් තීරණය හා අදාල ගැසට් නිවේදනය මුළුමනින්ම දෝෂ සහිත හා නීතියේ විධිවිධාන වලට පටහැනි වූවක් බව පෙනේ.

5.2.7 රත්නපුර මහා නගර සභාව

2016 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම සම්බන්ධ සභා සම්මුතියට රත්නපුර මහා නගර සභාව විසින් 2015 - සැප්තැම්බර් මස 04 වැනි දින පැවති රැස්වීමේ සම්මත කර 2015.11.13 දිනැති අංක 1941 දරණ ගැසට් පත්‍රයෙහි නගරාධිපතිවරයාගේ නමින් පළකර ඇත.

මෙම නිවේදනය සමඟ පළකර ඇති සභා යෝජනාවේ බලපත්‍ර ගාස්තු පනවනු ලබන්නේ මහා නගර සභා ආඥා පනතේ 247 (අ) වගන්තිය යටතේ බව දැක්වේ. මෙය මහා නගර සභා ආඥා පනතේ 247 අ වගන්තිය විය යුතුය. මෙම පරිපාටිමය දෝෂය නිසා, ඇති විය හැකි අධිකරණ කටයුතු වලදී මේ සම්බන්ධයෙන් දුෂ්කරතා ඇති වීමට ඉඩ තිබේ. තවද බලපත්‍ර ගාස්තු පනවා ඇති කර්මාන්ත / වෙළඳාම් 123 ක දීර්ඝ ලැයිස්තුවෙන් කර්මාන්ත හෝ වෙළඳාම් 53 ක් ම ගබඩා කිරීම් වේ. මීට ඉහත දී ද සඳහන් කර ඇති පරිදි ගබඩා කිරීම කර්මාන්තයක් හෝ වෙළඳාමක් නොවේ. එවැන්නක් සඳහා අතුරු ව්‍යවස්ථා නොමැති හෙයින් බලපත්‍ර නිකුත් කිරීමද නීත්‍යානුකූල නොවේ. එසේම විෂයාංක 11 යටතේ ඇති පශු ගිලන් හලක් පවත්වා ගෙන යාම කර්මාන්තයක් නොව වෘත්තියකි. තවද 107 ගිනි කෙළි භාණ්ඩ ගබඩාකිරීම. 108 කි. ග්‍රෑ 2 කට අධික ප්‍රමාණයකින් වෙඩි බෙහෙත් හා පුපුරන ද්‍රව්‍ය ගබඩා කිරීම 115 පුපුරණ ද්‍රව්‍ය , රසායනික ද්‍රව්‍ය නිපදවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම ආදිය මහා නගර සභාවේ විෂය පථයට අදාල බලපත්‍ර නිකුත් කිරීම් නොවේ. රජයේ දිසාපතිවරයා ඒ පිළිබඳ බලපත්‍ර නිකුත්කිරීමේ අධිකාරය දරයි. ඒ අනුව ඒ සඳහා බලපත්‍ර ගාස්තු පැනවීමෙන් මහා නගර සභාව බලාතික්‍රමණය කර ඇත.

මෙම ලැයිස්තුවේ අඩංගු විෂයයන් 123 අතරින් බලපත්‍ර සත්‍ය වශයෙන්ම නිකුත් කළ හැකි වන්නේ අතුරු ව්‍යවස්ථා මගින් ආවරණය වන කර්මාන්ත හෝ වෙළඳාම් සම්බන්ධයෙන් පමණි. රත්නපුර මහා නගර සභාව, මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳගෙන තිබේ නම් උපරිම වශයෙන් වෙළඳ බලපත්‍ර නිකුතුව සඳහා යොදා ගත හැකිවන්නේ අතුරු ව්‍යවස්ථා 25 ක් පමණ ප්‍රමාණයකි. එවිට සෙසු විෂයන්ට බලපත්‍ර ලබාදීම බරපතල ගැටළුවක් බවට පත්වේ. එබැවින් බලපත්‍ර පැනවීම් ලේඛනයේ ඇති බහුතර කාර්ය සංඛ්‍යාවක් කර්මාන්ත බදු අයකළ යුතු කාර්යයන් නිසා ඊට අඩංගු කළ යුතුය.

මේ හැර වෙළඳ බලපත්‍ර ගාස්තු පැනවීම සිදුකිරීමේදී රත්නපුර මහා නගර සභාව 247 අ වගන්තියේ දක්වා ඇති බලපත්‍ර ගාස්තු වල උපරිම සීමාවන්ට ලොකු කුඩා සියළු ව්‍යාපාර වග විභාගයකින් තොරව ඇතුලත් කොට ඇත. සමහර විට මෙම තත්වය හේතුකොට ගෙන කුඩා ව්‍යාපාර, අත්‍යාවශ්‍ය සේවා, ආන්තික ලාභ සහිත ව්‍යාපාර ආදියට බලවත් අසාධාරණයක් වීමට ඉඩ ඇත. ආඥා පනතේ 247 අ (2) උපවගන්තියේ මෙම කරුණ මැනවින් පැහැදිලි කර ඇත. ඉහත දැක්වූ කරුණු මත ඉහත බලපත්‍ර ගාස්තු පැනවීම් නීත්‍යානුකූල නොවන බව පෙන්වා දිය හැකිය.

5.2.8 බදුල්ල මහා නගර සභාව

2016 වර්ෂය සඳහා බදුල්ල මහා නගර සභාව 2015 ඔක්තෝම්බර් මස 01 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී බලපත්‍ර ගාස්තු පැනවීමට අදාල සභා යෝජනාව සම්මත කර 2015.12.04 දිනැති අංක 1944 දරණ ගැසට් පත්‍රයෙහි බදුල්ල මහා නගර සභාවේ නගරාධිපතිවරයා නමින් එකී නිවේදනය ප්‍රකාශයට පත්කර ඇත. එම ගැසට් නිවේදනය සමග සභා යෝජනාව ද පළකර ඇත. මෙම සභා යෝජනාවේ බලපත්‍ර ගාස්තු සම්බන්ධ බලදායී වගන්තිය ලෙස 247 (අ) වන වගන්තිය සඳහන් කර තිබේ. එසේ වුවද මහා නගර සභා ආඥා පනතේ එවැනි අංකයක් සහිත වගන්තියක් නැත. සෑම පළාත් පාලන ආයතනයක් විසින්ම බදු, බලපත්‍ර ගාස්තු ආදිය පැනවීමේදී නිවැරදි වගන්ති සඳහන් කර නොමැති නම් අධිකරණ කටයුතු වලදී අවාසි සහගත තත්වයන් උද්ගතවීමට ඉඩ තිබේ. මෙම බලපත්‍ර ගාස්තු පනවා ඇති ලේඛනයේ කර්මාන්ත / වෙළඳාම් සංඛ්‍යාව 187 කි. ඊට අදාල දෙවන උපලේඛනයේ අප්‍රසන්න හා අන්තරායදායක ව්‍යාපාර 25 ක් දක්වා ඇත.

මේ අනුව බලපත්‍ර නිකුත් කිරීමට යෝජිත ව්‍යාපාර මුළු සංඛ්‍යාව 212 ක් වුවද මේ එක් එක් කර්මාන්තය / වෙළඳ ව්‍යාපාරය සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා තිබේද යන්න අවිනිශ්චිතය. අතුරු ව්‍යවස්ථා නොමැතිව බලපත්‍ර නිකුත් කිරීම සාවද්‍ය පරිචයකි. මක්නිසාද යත් කිසියම් වලංගු නීතියක විධිවිධාන යටතේ මිස කිසියම් පරිශ්‍රයක බලපත්‍ර ලබාගත යුතු කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කළ නොහැකි වන හෙයිනි. එසේම මෙම දීර්ඝ ලැයිස්තුව තුළ බලපත්‍ර ගාස්තු පැනවීමේ බලය මහා නගර සභා සතු නොවන කාර්යයන් හා කර්මාන්ත බදු, ව්‍යාපාර බදු ආදිය සඳහා විෂය වන කාර්යයන් රාශියක් ද ඇතුලත්ව පවතී.

උදා - විෂය අංක 93 යටතේ රා තැබෑරුමක් පවත්වාගෙන යාම. 72 යටතේ රටබීම ගබඩා කිරීමේ ස්ථානයක් 73 රටබීම නිෂ්පාදනාගාරයක් සහ 74 බියර් ගබඩා කිරීමේ ව්‍යාපාරයක් සඳහා බලපත්‍ර ගාස්තු පනවා ඇත. එසේ වුවද මත්පැන් විකිණීමට අදාලව බලපත්‍ර නිකුත් කිරීමේ බලයක් පළාත් පාලන ආයතන වලට පවරා දී නැත. එම කාර්යයන් සම්බන්ධයෙන් බලපත්‍ර නිකුත් කිරීම සුරා බදු ආඥා පනත යටතේ සුරා බදු දෙපාර්තමේනතුව මගින් කරනු ලැබේ. කෙසේ වුවද මත්පැන් නිෂ්පාදනාගාර වලට හා ඒවා විකුණන ස්ථාන වලට බලපත්‍ර නිකුත් කිරීම පළාත් පාලන නීතිය අනුව බලාතික්‍රමණයකි.

එසේම අංක 90 ඉංග්‍රීසි බෙහෙත් වෙළඳාම 91 සිංහල බෙහෙත් වෙළඳාම 97 පෞද්ගලික රෝහලක් පවත්වාගෙන යාම 98 පෞද්ගලික රෝහලක් (ආයුර්වේද) පවත්වාගෙන යාම 121 ශාරීරික ව්‍යායාම කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම 158 හා 159 යටතේ බණිජ තෙල් අළෙවිය ආදිය සඳහා ද පළාත් පාලන ආයතන මගින් බලපත්‍ර නිකුත් කළ නොහැකිය. එබැවින් බලපත්‍ර නිකුත් කිරීමට පැනවීම් කර ඇති එහෙත් පළාත් පාලන ආයතන වෙත බලපත්‍ර නිකුත් කිරීම පැවරී නැති කාර්යයන් ගණනාවක් මීට ඇතුළත් වීම හේතුවෙන් මෙම පැනවීම නීත්‍යානුකූල වූවක් නොවන්නේ ය. මෙම දෝෂ සහගත තත්වයන් කෙරෙහි බදුල්ල මහා නගර සභාව මෙන්ම ඌව පළාතේ පළාත් පාලන බලධාරීන් ද වගකීම දැරිය යුතුවේ.

5.2.9 හම්බන්තොට මහා නගර සභාව

හම්බන්තොට මහා නගර සභාව 2016 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම 2015 ඔක්තෝම්බර් මස 14 දින පැවති මහා සභා රැස්වීමේදී අනුමත කර 2015.12.04 දිනැති අංක 1944 දරණ ගැසට් පත්‍රයේ නගරාධිපතිවරයාගේ නමින් ප්‍රකාශයට පත්කර ඇත. මෙම ගැසට් නිවේදනය විධිමත් පරිදි පළකර ඇත. එහි ඇති "බලපත්‍ර මත ගාස්තු පැනවීම" යන්න බලපත්‍ර ගාස්තු පැනවීම ලෙස නිවැරදි විය යුතුය. මෙම නිවේදනය සමඟ අදාල සභා යෝජනාවද පළකර ඇත. එහි බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත ලෙස කාර්යයන් 18 ක් දක්වා ඇත. උපලේඛණයේ ඇති විෂයයන් අතුරු ව්‍යවස්ථා යටතට ගැනෙන කර්මාන්ත බව පෙනේ. මෙහි ආඥා පනතේ අදාල ඡේද නිවැරදිව දක්වා ඇති අතර කර්මාන්ත විෂයෙහි බලපත්‍ර ගාස්තු පැනවීම ද බෙහෙවින් කල්පනාකාරීව සිදුකර ඇති බව පෙනේ. ලංකාවේ මහා නගර සභා අතර ඉතා ලාබාල ආයතනයක් වන හම්බන්තොට මහා නගර සභාව බෙහෙවින් ආදර්ශමත් ලෙස බලපත්‍ර ගාස්තු පැනවීම සිදුකර තිබීම සම්බන්ධව එහි කොමසාරිස්වරයා ඇතුළු කාර්ය මණ්ඩලයට ප්‍රශංසාව හිමිවිය යුතුය.

5.2.10 මඩකලපුව මහා නගර සභාව

මඩකලපුව මහා නගර සභාව විසින් 2016 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම, ඒ සඳහා වූ සභා අනුමැතිය මත 2015.12.18 දිනැති අංක 1946 දරන ගැසට් පත්‍රයෙහි නාගරික කොමසාරිස් නමින් පළකර ඇත. මේ නිවේදනය වරිපනම් ඇතුළු සියළු බලපත්‍ර ගාස්තු හා බදු පැනවීම සඳහා පොදුවේ පළකර ඇති නිවේදනයකි. එය කිසිසේත් විධිමත් ක්‍රියාමාර්ගයක් නොවේ. සභාව විසින් පනවනු ලැබූ ආදායම් වර්ග සඳහා වෙන වෙනම නිවේදන, සභා තීරණ ද සමඟ නිවැරදි නීතිමය ප්‍රතිපාදන සහිතව පළකල යුතුය. මෙහි සභා තීරණය හෝ යෝජනාව ද නැත.

බලපත්‍ර ගාස්තු පනවා ඇති කර්මාන්ත ලේඛණය විෂයයන් 169 කින් යුක්ත වේ. මේ අතුරින් අංක 1 ශාලා කුලියට දීම, අංක 65 ඇඟලුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම ආදිය ව්‍යාපාර බදු ගණයට අයත් වේ. අංක 152 ඉංග්‍රීසි ඖෂධ බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම. 153 ආයුර්වේද බෙහෙත් වර්ග විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම සම්බන්ධ බලපත්‍ර නිකුත් කිරීම පළාත් පාලන ආයතනයක කාර්යයන් නොවේ. එසේම අංක 117 රා විකුණන

ස්ථානයක් පවත්වගෙන යාම 118 මත් පැන් බීර වර්ග ගබඩා කර විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම ආදී වෙළඳාම් සඳහා බලපත්‍ර ලබාදීමේ බලය පළාත් පාලන ආයතන වෙත පවරා නැත. එය සුරාබදු ආඥාපනත යටතේ සුරා බදු කොමසාරිස් ජනරාල්වරයාගේ අධීක්ෂණය යටතේ පවතින කරුණකි. තවද අංක 120 ඉන්ධන විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා අදාල විෂයභාර අමාත්‍යවරයා ඛණිජ තෙල් ආඥා පනත යටතේ නියෝග පනවා බලපත්‍ර ගාස්තු නියමකර ඒවා අයකර ගැනීමේ බලය මහා නගර සභා වෙත පවරා දී ඇත. එබැවින් එබඳු ස්ථානවලට බලපත්‍ර ගාස්තු පැනවීම බලාතික්‍රමණයට. යටත් වූවක් වේ.

මෙම ලේඛනයේ ඇති විෂයයන් 169 අතුරින් අතුරු ව්‍යවස්ථා පවත්නේ කොපමණ සංඛ්‍යාවක් ද යන්න සොයා බැලීම වැදගත් වේ. මහා නගර සභාව මෙම සියළුම විෂයයන්ට අතුරු ව්‍යවස්ථා පනවා නොමැති නම් ඒ සඳහා බලපත්‍ර නිකුත් කිරීම නීත්‍යානුකූල නොවේ. එබැවින් මේ තුළ ඇති කර්මාන්ත බහුතරය කර්මාන්ත බදු හා ව්‍යාපාර බදු යටතට ගත යුතුව ඇත. මෙම කරුණු මත මෙම පැනවීම හා අදාල නිවේදන දෝෂ සහිත හා නීතියට පටහැනි බව පෙන්වා දිය හැකිය.

5.2.11 අනුරාධපුර මහා නගර සභාව

අනුරාධපුර මහා නගර සභාව 2016 වසර සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම 2015.11.03 දින අංක 1946 ගැසට් පත්‍රයෙහි නගරාධිපතිවරයාගේ නමින් පළකර ඇත. බලපත්‍ර ගාස්තු කර්මාන්ත බදු ව්‍යාපාර බදු ආදී සියල්ල මෙම නිවේදනයෙන් පනවා ඇත. එය ඉතා අවිධිමත් ය. ගැසට් නිවේදනයේ ඒ ඒ ආදායම් වලට අදාල ආඥා පනතේ වගන්ති සඳහන් කර ඇත්තේ සාවද්‍ය අයුරිනි. උදා - 247 (ආ), 247 (ආ), 247 (අ.ආ), 247 (ඇ) යනුවෙනි. මෙබඳු අංක දරණ වගන්ති මහා නගර සභා ආඥා පනතේ නැත.

බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් අදාල වන්නේ මහා නගර සභා ආඥා පනතේ 247 අ වගන්ති යයි. මෙබඳු නොසැලකිලිමත් කම් නිසා අධිකරණමය ක්‍රියාමාර්ගයන්හිදී බරපතල ගැටළු උද්ගතවිය හැකිය. අනුරාධපුර මහා නගර සභාව මගින් ප්‍රකාශිත බලපත්‍ර ගාස්තු පැනවූ කර්මාන්ත ලේඛනය විෂයයන් 73 කින් ද පීඩාකාරී හා අන්තරායදායක කර්මාන්ත 21 කින් ද යුක්ත වේ. මේ ලේඛනයේ අඩංගු සැම කර්මාන්තයකටම අතුරු ව්‍යවස්ථා තිබේද යන්න

පිළිබඳව විමසීමකින් තොරව කර්මාන්ත බදු සඳහා යෝග්‍ය වන කර්මාන්ත රැසක් මීට ඇතුලත් කර ඇති බව පෙනේ. එසේම බලපත්‍ර ගාස්තු පනවා ඇති කර්මාන්ත 73 න් 23 ක් ම ගබඩා කිරීම් වේ. ගබඩා කිරීම කර්මාන්තයක් හෝ වෙළඳාමක් නොවේ. ඊට සම්බන්ධ අතුරු ව්‍යවස්ථා නොමැත. එබැවින් ඒ සඳහා බලපත්‍ර ලබාදීම නිවැරදි නොවේ. ඉහත කරුණු අනුව අනුරාධපුර මහා නගර සභාවේ 2016 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම් හා ඊට අදාල නිවේදන පළකිරීම දෝෂ සහගත හා නීතියට පටහැනි හෙයින් ඒවා සාවද්‍ය නිවේදන සේ සැලකිය යුතුවේ.

5.2.12 යාපනය මහා නගර සභාව

යාපනය මහා නගර සභාව 2016 වසර සඳහා බලපත්‍ර ගාස්තු පැනවීමට තීරණය කර ඇති බව නාගරික කොමසාරිස්වරයා විසින් 2016 ජනවාරි මස 01 දින අංක 1948 දරණ ගැසට් පත්‍රය මගින් නිවේදනය කර ඇත. එහෙත් එම සභා තීරණය ගත් දිනය හෝ එහි අංකය අදාල නිවේදනයේ දක්වා නැත. එසේම අදාල සභා යෝජනාවද නිවේදනය සමඟ පළකර නැත. එම නිසා සභාව අදාල බලපත්‍ර ගාස්තු පනවා ඇති ආකාරය පිළිබඳ විස්තර ලබාගත නොහැකිය.

කෙසේ වෙතත් මේ පිළිබඳව වැඩිදුර කරුණු සොයා බැලීමේදී පෙනී ගියේ 2014 වසරේ ජූනි මස පමණ සභාවේ නිල කාලය අවසන්ව පාලනය නාගරික කොමසාරිස්වරයා වෙත පැවරුණ බවයි. ඒ අනුව මෙම නිවේදනයේ අන්තර්ගතය සාවද්‍ය වේ. බලපත්‍ර ගාස්තු පැනවීමේ බලධාරීත්වය දරණ සභාවේ බලය නාගරික කොමසාරිස්වරයා වෙත පැවරුණ බලදායී වගන්තිය මෙම නිවේදනයේ සඳහන් නොවේ. ඒ අනුව මෙය අසම්පූර්ණ හා දෝෂ සහිත නිවේදනයක් වන හෙයින් අධිකරණ කටයුතු වලදී අභියෝගයට ලක්විය හැකිය. ඒ හැර මෙම නිවේදනය සියළු බදු හා බලපත්‍ර ගාස්තු සඳහා පොදුවේ පළකරන ලද්දකි. එය විධිමත් නොවන අතර ඒ ඒ ආදායම් මාර්ගය සඳහා අදාල සභා තීරණය ද සමඟ වෙන වෙනම නිවේදන පළකළ යුතුය. මෙහි උපලේඛනයේ I වන කොටසෙහි බලපත්‍ර ගාස්තු පනවා ඇති කර්මාන්ත 113 ක් දැක්වේ. එයින් කර්මාන්ත 24 ක් ගබඩා කිරීම් වේ. ගබඩා කිරීම් කර්මාන්තයක් හෝ වෙළඳාමක් නොවේ. එබැවින් ඒ සඳහා බලපත්‍ර නිකුත් කිරීමට මහා නගර සභාවට නීතියක් ප්‍රකාර පැවැරුණු බලයක් නොමැත.

තවද මෙම ලේඛනයෙහි ඇති කාර්යයන් අතුරින් සෑහෙන සංඛ්‍යාවක් කර්මාන්ත බදු සඳහා විෂය වන ඒවා වේ. එබඳු කර්මාන්ත සඳහා බලපත්‍ර නිකුත් කිරීමට අතුරු ව්‍යවස්ථා පනවා නොමැති හෙයින් ඒ සඳහා බලපත්‍ර නිකුත් කිරීම නීත්‍යානුකූල නොවේ. ඒ අනුව මෙම පැනවීම් හා ඊට අදාල නිවේදනය සාවද්‍ය හා දෝෂ සහගත වූවක් බව පෙනීයයි.

5.3 ව්‍යාපාර බදු

ව්‍යාපාර බදු (Buisness Tax) මහා නගර සභා ආඥා පනතේ 247 ඇ වගන්තිය ප්‍රකාර එම ආඥා පනතේ විධිවිධාන යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ යම් බලපත්‍රයක් අවශ්‍ය නොවන සහ ආඥා පනතේ 247 ආ වගන්තිය යටතේ කිසිම බද්දක් නොගෙවිය යුතු යම් වෙළඳ ව්‍යාපාරයක් මහා නගර සභා සීමා බල ප්‍රදේශය තුළ යම් තැනැත්තෙකු විසින් කරගෙන යනු ලබන විට සභාවේ යෝජනා සම්මුතියක් මගින් ඒ තැනැත්තා විෂයෙහි වාර්ෂිකව නියම කළ හැකි බද්දකි. එය ව්‍යාපාර බද්ද යනුවෙන් හැඳින්වේ. වෙනත් වචන වලින් පවසන්නේ නම් වෙළඳ බලපත්‍රයක් හෝ කර්මාන්ත බද්දක් අයකිරීමට හෝ වෘත්තීය බද්දකට යටත් නොවන ව්‍යාපාර සම්බන්ධයෙන් ව්‍යාපාර බද්දක් නියම කිරීමේ බලය පළාත් පාලන ආයතන වෙත ඇත්තේය.

මෙම බද්ද අයකිරීමේ පදනම ඉතා සරලය. ඒ අනුව බද්ද ගෙවිය යුතු වර්ෂයට ඉහතින් අන්තිමට වූ වර්ෂය තුළ ඒ වෙළඳ ව්‍යාපාරයෙන් ලද ලැබීම් අනුව ඒ බද්ද නියම කළ යුතුය. එසේම එම බද්ද මහා නගර සභා ආඥා පනතෙහි දක්වා ඇති පහත දැක්වෙන ප්‍රමාණයන් නොඉක්මවිය යුතුය.

සටහන් අංක 14: ව්‍යාපාර බද්ද අයකිරීමේ පදනම

	I වන තීරය වෙළඳ ව්‍යාපාරයෙන් ගතවූ වර්ෂයේදී ලත් ලැබීම්	II වන තීරය ගෙවිය යුතු බද්ද රු.
i	රු. 6,000 නොඉක්මවන විට	නැත
ii	රු. 6,000 ඉක්මවන නමුත් රු 12,000 නොඉක්මන විට	90
iii	රු 12,000 ඉක්මවන නමුත් රු 18,750 නොඉක්මවන විට	180
iv	රු 18,750 ඉක්මවන නමුත් රු 75,000 නොඉක්මවන විට	360
v	රු 75,000 ඉක්මවන නමුත් රු 1,50,000 නොඉක්මවන විට	1200
vi	රු 1,50,000 ඉක්මවන විට	3000

මෙම ව්‍යාපාර බද්දට අයත්වන ව්‍යාපාර වල ස්වභාවය ආඥා පනතේ සවිස්තරව දක්වා ඇත. මෙම බද්ද අයකිරීමට අදාල නීතිමය ප්‍රතිපාදන පැහැදිලිව දක්වා තිබුණ ද දිවයිනේ පළාත් පාලන ආයතන අතුරින් ඉතා සීමිත ප්‍රමාණයක් පමණක් නියමිත ආකාරයට මෙම බද්ද පනවනු ලැබේ. බොහෝ පළාත් පාලන ආයතන මීට අදාලව ගැසට් නිවේදන පළකරනු ලැබුවත් ඊට අදාල සභා යෝජනාව නිවැරදිව ලබාගැනීමට අපොහොසත් වීම හෝ නොදැනීම නිසා එකී පැනවීම් නිරවද්‍ය නොවේ. වර්තමානයේ පළාත් පාලන ආයතන අති බහුතරය සිදුකරනුයේ, සියළු බදු හා බලපත්‍ර ගාස්තු අඩංගු වන (බලපත්‍ර ගාස්තු, කර්මාන්ත බදු, ව්‍යාපාර බදු ආදිය) සියල්ල මිශ්‍රවූ සංකීර්ණ ගැසට් නිවේදන නිකුත් කරණු ලැබීමයි. මෙය අතිශය සාවද්‍ය පරිචයකි.

මෙම අධ්‍යයනය සඳහා වූ නියැදිගත මහා නගර සභා 12 න් ව්‍යාපාර බදු නිවැරදිව පනවා තිබුණේ ආයතන 04 ක් පමණක් බව එනම් කොළඹ, රත්නපුර, මඩකලපුව හා හම්බන්තොට මහා නගර සභා පමණක් බව නිරීක්ෂණය විය. එය එම මුළු ආයතන සංඛ්‍යාවෙන් .33 % කි. මෙය අතිශයින් අසතුටුදායක තත්වයකි. මෙහිදී ව්‍යාපාර බදු පැනවීම දෝෂ සහගත වීමට හේතුවී ඇත්තේ මහා නගර සභා ආඥා පනතේ 247 ඇ (1 අ) උප වගන්තිය යටතේ සඳහන් කර ඇති වෘත්තීය බද්ද මේ සමඟ පනවා සාවද්‍ය ලෙස අයකිරීමයි. වෘත්තීය බදු අයකිරීමට පළාත් පාලන ආයතන වෙත බලය ලබාදී ඇත්තේ එකී වෘත්තීය බද්දේ උපරිම සීමාව

අමාත්‍යවරයා විසින් නියෝගයක් මගින් නිශ්චය කර ඇති ප්‍රමාණයක් නොඉක්මවන බද්දක් ඒ මහා නගර සභාව විසින් යෝජනා සම්මතයක් මගින් නියම කොට වාර්ෂිකව අයකර ගනු ලැබිය හැකිය යන ව්‍යතිරේකය මතය. එහෙත් එම ව්‍යතිරේකය (Proviso) පිළිබඳව කිසිදු තැකීමක් නොමැතිව බොහෝ මහා නගර සභා සහ සෙසු පළාත් පාලන ආයතන ව්‍යාපාර බදු ලෙස බොහෝ වෘත්තිකයින් ගෙන් වෘත්තීය බද්ද අයකර ගනී. මෙහිදී අමාත්‍යවරයා උපරිම බදු සීමා නිශ්චය කොට නියෝග පනවා නොමැති බව බොහෝ දෙනා අවබෝධකොට ගෙන නොමැත. මෙම ක්‍රියාවලියෙහි ඇති බලවත් විමතිය දනවන කරුණු නම් දිවයිනේ කිසිදු නීතිඥයෙකු, වෛද්‍යවරයෙකු, මිනින්දෝරුවෙකු, ඉංජිනේරුවරයෙකු, සැලසුම් ශිල්පියෙකු, ගණකාධිකාරීවරයෙකු හෝ විගණකවරයෙකු මීට නීතිය ඉදිරියේ අභියෝග නොකර එම නීතියට පටහැනි බද්ද ගෙවීමයි.

ලංකාවේ සිවිල් සමාජය තුළ සිටින ප්‍රබුද්ධ සමාජ ස්ථර තුළ පවා පළාත් පාලනය පිළිබඳව ඇති දිළිඳු අවබෝධයේ පරිමාව මෙයින් මනාව ස්ථුට වේ. මෙසේ වෘත්තිකයන් සඳහා ව්‍යාපාර බද්ද පනවා අයකරන මහා නගර සභා අතර ගම්පහ, අනුරාධපුරය, මහනුවර, බදුල්ල හා යාපනය ද වීය. මේ එක් එක් ආයතනයෙහි ව්‍යාපාර බදු පැනවීමේ පවතින තත්වය සංක්ෂිප්තව විමසා බැලීම යෝග්‍යවේ.

5.3.1 කොළඹ මහා නගර සභාව

2016 වර්ෂය සඳහා කොළඹ මහා නගර සභාව ව්‍යාපාර බදු පැනවීමට අදාලව 2015.10.26 වැනි දින සම්මත කරන ලද සහා සම්මුතිය ප්‍රකාර පළකරන ලද ගැසට් නිවේදනය 2015.12.04 දින අංක 1944 දරණ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත්කර ඇත. එම නිවේදනය බලපත්‍ර ගාස්තු, කර්මාන්ත බදු, ව්‍යාපාර බදු ආදී සියළු ආදායම් පැනවීම සඳහා පළකරන ලද පොදු නිවේදනයකි. එහි උපලේඛණ අංක 03 යටතේ ව්‍යාපාර වර්ග 08 ක් සඳහා ව්‍යාපාර බදු පනවා ඇත. මහා නගර සභා ආඥා පනත 247 ඇ වගන්තිය විධිවිධාන ප්‍රකාර අදාල ගාස්තු චක්‍රය ද ඊට අනුබද්ධව පළකර තිබේ. මෙම පැනවීම සුළු දුර්වලතා පැවතියද බොහෝ දුරට නිවැරදි වූවක් බව පෙන්වා දිය හැකිය.

5.3.2 දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව

2016 වර්ෂය සඳහා දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව ව්‍යාපාර බදු පැනවීමට අදාල යෝජනාව 2015 ජූලි මස 02 වැනි දින අනුමත කරන ලද සභා සම්මුතිය ප්‍රකාර අදාල බදු පැනවීම් ගැසට් නිවේදනය 2015.08.21 දිනැති අංක 1929 දරන ගැසට් පත්‍රයේ පළකර ඇත. එම නිවේදනය සමග සභා යෝජනාවද නගරාධිපතිතුමාගේ නමින් පළකරනු ලැබ ඇත. යෝජනාව හා නිවේදනය නිවැරදි බව පෙනේ. එහෙත් ව්‍යාපාර බදු පනවනු ලබන විෂයයන් පිළිබඳ උප ලේඛණයක් ඒ සමඟ දක්වා නැත. එබැවින් බදු ගෙවන්නන්ට තම ව්‍යාපාරය මෙම බද්දට යටත් වන්නේ ද, යන්න පිළිබඳ දැනගැනීමට ඇති ඉඩකඩ මෙයින් ඇහිරී ඇත. ආදායම් පරීක්ෂක නිලධාරීන් විසින් කරනු ලබන දැනුම්දීමක් හෝ නිවේදනයක් මත බදු ගෙවනු විනා බද්දට යටත්වන ව්‍යාපාර වර්ගය ව්‍යාපාරික ප්‍රජාවට දැනගැනීමට ක්‍රමයක් නොමැත. මෙම බද්දට යටත්වන ව්‍යාපාර ලේඛනයන් පළකළේ නම් මෙය අංග සම්පූර්ණ පැනවීමක් ලෙස සැලකිය හැකිව තිබුණි.

5.3.3 ගම්පහ මහා නගර සභාව

2016 වර්ෂය සඳහා ගම්පහ මහා නගර සභාව ව්‍යාපාර බදු පැනවීමට අදාලව 2015.09.11 දින පැවති සභා රැස්වීමේදී යෝජනා සම්මතය ලබාගෙන ඇත. ඒ අනුව ව්‍යාපාර බදු පැනවීමේ ගැසට් නිවේදනය 2015.12.18 දිනැති අංක 1946 දරණ ගැසට් පත්‍රයෙහි නාගරික කොමසාරිස්වරයා නමින් පළකර ඇත. එසේම අදාල සභා යෝජනාව ද පැහැදිලිව අමුණා ඇත. මෙම ගැසට් නිවේදනයේ ආඥා පනතේ ව්‍යාපාර බදු පැනවීමට අදාල බලදායී වගන්තිය ලෙස දක්වා ඇත්තේ 247 (අ) (1) යනුවෙනි. එය සම්පූර්ණයෙන් වැරදි සහගතය. ආඥා පනතේ එබදු වගන්තියක් නැත. එසේම සභා සම්මත යේජනාවේ ද බලදායී වගන්තිය ලෙස දක්වා ඇත්තේ 247 (ඇ) (1) යනුවෙනි. එයද වැරදි සහගතය. එහි නිවැරදි යෙදුම වන්නේ 247 ඇ වේ. එසේම යෝජනාවේ තැනෙක 247 (ආ) (1) වගන්තිය යනුවෙන් ද සඳහන්ය. එය 247 ආ ලෙස නිවැරදි විය යුතුය. මෙබඳු වැරදි හේතුකොට ගෙන අධිකරණය ඉදිරියේ සභාවට බලවත් දුෂ්කරතාවයන්ට මුහුණදීමට සිදුවිය හැකිය. ඒ සමඟ ඇති උපලේඛනයේ ව්‍යාපාර බදු පනවා ඇති ව්‍යාපාර වර්ග 37 ක් ඇතුලත් කර තිබේ. එම ලේඛනය තුළ මෙහි මුලදී සඳහන් කළ පරිදිම ලංකාවේ පළාත් පාලන ආයතන සඳහා මෙතෙක් බලාත්මක කර නැති වෘත්තිකයන් සඳහා ද ව්‍යාපාර බදු පනවා ඇත.

උදා :- විෂයාංක (08) ගණන් පරීක්ෂකවරුන් (09) ගෘහ නිර්මාණ ශිල්පීන් (10) සැලසුම්කරුවන් (29) දන්ත කාර්මිකයන් (36) මිනින්දෝරුවන් (37) විශේෂඥ වෛද්‍ය සේවය.

මෙම වෘත්තිකයන්ට බදු පැනවීමට අවශ්‍ය විධිවිධාන මෙතෙක් සලසා නැත. එබැවින් මෙය පවත්නා නීතිය ඉක්මවා ක්‍රියාකර තිබීමේ බලාතික්‍රමණයකි. මෙම වෘත්තීන්ට අයත් තැනැත්තෙකු මේ සම්බන්ධව අධිකරණ ක්‍රියා මාර්ගයක් ගතහොත් සභාවට හා නාගරික කොමසාරිස්වරයාට අනපේක්ෂිත ගැටළු වලට මුහුණපෑමට සිදුවිය හැකිය.

5.3.4 කුරුණෑගල මහා නගර සභාව

කුරුණෑගල මහා නගර සභාව 2016 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පනවා ඇති බව වාචිකව එහි නිළධාරීන් පැවසුව ද ඊට අදාල තොරතුරු ලබා දීමට කටයුතු කළේ නැත.මීට අදාල පැනවීම සභාව විසින් කළ බව පැවසුව ද සභා යෝජනා හෝ තීරණ ලබාගත නොහැකි විය. එසේම මෙම මහා නගර සභාව 2016 වර්ෂය සඳහා වරිපනම් පැනවීම පමණක් ගැසට් පත්‍රයේ පළකර ඇතත් සෙසු පැනවීම් ගැසට් පත්‍රයේ පළකර ඇති බව සනාථ නොවුණි. එබැවින් එය 2016 වසර සඳහා ව්‍යාපාර බදු පනවා නොමැති බවට වාර්තා කරන ලදි.

5.3.5 මහනුවර මහා නගර සභාව

2016 වසර සඳහා මහනුවර මහා නගර සභාව විසින් 2015.11.24 දින පැවති සභා රැස්වීමේදී වෙළඳ බලපත්‍ර කර්මාන්ත බදු හා ව්‍යාපාර බදු පැනවීම අනුමත කර ඇත. ඊට අදාල නිවේදනය 2016.01.01 අංක 1948 දරන ගැසට් පත්‍රයෙහි නගරාධිපතිවරයා නමින් ප්‍රකාශයට පත්කර ඇත. එය සියළු ආදායම් වර්ග පැනවීමට යොදාගත් පොදු නිවේදනයකි. එසේම සභා යෝජනාව නිවේදනය සමඟ පළකර නොමැතිවීම ඌණතාවයකි. මෙම නිවේදනය බෙහෙවින් සංකීර්ණ හා ව්‍යාකූල ස්වරූපයක් ගනී. එක් එක් ආදායම් මාර්ග උපලේඛන යටතේ හෝ දක්වා නැත. සාමාන්‍ය පුද්ගලයෙකුට එය අවබෝධකොට ගැනීම පවා පහසු නැත. සමහර විට මෙය මහා නගර සභාවේ බදු අය කරන කාර්ය මණ්ඩලවල පහසුව සඳහා සහ නීතිමය අවශ්‍යතාවය සපුරාලීම සඳහා ම සිදුකළා විය හැකිය.

කෙසේ වෙතත් ව්‍යාපාර බද්ද පනවා ඇති ව්‍යාපාර වර්ග 08 ක් ඒ සමඟ වූ ලේඛනයේ දක්වා ඇත. ඒ අතුරින් (05) උපදේශක සේවා සපයන්නන් (08) ගිණුම් විගණන කාර්යාලයක් පවත්වාගෙන යාම ආදිය වෘත්තීන්ට අයත්වේ. එබැවින් මෙය නීතියෙහි සඳහන් සීමා ඉක්මවා පැනවීම සිදුකර ඇති නිසා බලාතික්‍රමණයට යටත්වේ. මේ සම්බන්ධයෙන් පීඩාවට පත්වන තැනැත්තන් ගෙන් අධිකරණය ඉදිරියේ සභාවට අභියෝග ඉදිරිපත්වීමේ හැකියාව ඇත. මේ හැර මෙම නිවේදනයේ සඳහන් සියළු බදු හා බලපත්‍ර ගාස්තු මත 10% ක මුදලක් ආරක්ෂක ගාස්තුවක් ලෙස පනවා අය කිරීමට ද රජයේ බදු හෝ ගාස්තු අය කිරීමට ද තීරණය කර ඇත. මෙය ලංකාවේ කිසිම පළාත් පාලන ආයතනයක නොමැති ක්‍රියාවකි. යම් බද්දක් මත සැඟවුණු ගාස්තු අය කිරීම ඉතා සාවද්‍ය හා නීතියට පරිබාහිර ක්‍රියා මාර්ගයකි .

5.3.6 දඹුල්ල මහා නගර සභාව

2016 වර්ෂය සඳහා දඹුල්ල මහා නගර සභාව ව්‍යාපාර බද්ද පැනවීමට අදාල නිවේදනය 2016.01.01 දින අංක 1948 දරන ගැසට් පත්‍රයේ නාගරික කොමසාරිස්වරයා නමින් පළකර ඇත. මෙම කාලයේදී සභාවේ සභිකයින්ගේ ධුර කාලය අවසන් වීම නිසා එම කාර්යයන් පැවරී තිබූ නාගරික කොමසාරිස්වරයා මෙම බද්ද පැනවීම පිළිබඳ තීරණය ගත යුතු වූවත් මෙය තීරණය කර ඇත්තේ 2015.11.26 දින පැවති කළමනාකරණ කමිටුවයි. මෙය සම්පූර්ණයෙන්ම නීතියට පටහැනි වන්නේ එබඳු කමිටුවකට බදු පැනවීම පිළිබඳ බලය නීතියෙන් පැවරී නැති හෙයිනි. එසේම නාගරික කොමසාරිස්වරයා සභාවේ කර්තව්‍ය ඉටුකිරීමේ බලය ලබා ඇති හෙයින් මෙම නිවේදනය පළකිරීමේදී ඊට අදාල බලදායී වගන්තිය අනිවාර්යයෙන් එහි අඩංගු කළ යුතුය. නොඑසේනම් එය බල රහිත නිවේදනයක් වන්නේය. මෙහිදී සිදුවී ඇත්තේ එයයි. තවද ව්‍යාපාර බදු පනවා ඇති ව්‍යාපාර වර්ග 09 ක ලේඛනයක් ඒ සමඟ පළකර ඇත. එහි අංක (05) උපදේශක සේවා සපයන්නන් (08) ගිණුම් විගණන කාර්යාල මෙම ව්‍යාපාර බද්දට යටත් කර ඇත. ඒවා ව්‍යාපාර නොව වෘත්තීන්ය. වෘත්තීකයින් හට බදු පැනවීමේ ප්‍රතිපාදන මහා නගර සභා ආඥා පනතේ ඇතත් එය ක්‍රියාත්මක නොවන්නකි. එබැවින් මෙය නාගරික කොමසාරිස්වරයා සිය බලසීමාව ඉක්මවා ක්‍රියාකර ඇති බලාතික්‍රමණයට යටත්වන පැනවීමකි. මෙහිදී අගතියට පත්වන පාර්ශව විසින් නීතිමය පියවර ගත හොත් නාගරික කොමසාරිස්වරයාට එහි අනිටු ප්‍රතිවිපාක වලට මුහුණ පෑමට සිදුවිය හැකිය.

5.3.7 රත්නපුර මහා නගර සභාව

2016 වර්ෂය සඳහා රත්නපුර මහා නගර සභාව ව්‍යාපාර බද්ද පැනවීම 2015.09.04 දින පැවති සභා රැස්වීමේදී අනුමත කරන ලැබ 2015.11.13 දිනැති අංක 1941 දරණ ගැසට් පත්‍රයෙහි නගරාධිපතිවරයාගේ නමින් ප්‍රකාශයට පත්කර ඇත. ඒ සමග අදාල සභා යෝජනාවද පළකර තිබේ. මෙම සභා යෝජනාවෙහි ව්‍යාපාර බද්ද සඳහා වන බලදායී වගන්තිය 247 (ඇ) ලෙස ද කර්මාන්ත බද්ද සඳහා බලදායී වගන්තිය 248 (අ) ලෙස ද දක්වා තිබීම සාවද්‍ය වේ. එබඳු වගන්ති මහා නගර සභා ආඥා පනතේ නැත. එය නිවැරදිව සඳහන් විය යුත්තේ 247 ඇ, හා 247 ආ ලෙසිනි. මෙබඳු ඌණතා හේතුකොට ගෙන යම් තැනැත්තෙක් අධිකරණය ඉදිරියේ සභා තීරණයට අභියෝග කළහොත් ඉන් අයහපත් ප්‍රතිවිපාක උද්ගත වීමට ඉඩ ඇත. තවද අදාල උපලේඛනයේ සඳහන් වන්නේ පෙර වර්ෂයේ ලැබීම් මත ගෙවිය යුතු බද්දේ ප්‍රමාණය පමණි. එහි මෙම ව්‍යාපාර බද්ද අයත්වන ව්‍යාපාර ගණ කවරේද? යන්න ලේඛනයක් ලෙසින් ප්‍රකාශයට පත්කළ යුතුය. එසේ නොමැති වූ විට බද්දට යටත්වන ව්‍යාපාරිකයින් කුමන ව්‍යාපාර කුමන ආදායම් පදනම් මත බද්දට යටත් කොට තිබේද යන්න අවබෝධ කොට ගත නොහැකිව බදු ගෙවීම පැහැර හැරීමට පවා පෙළඹිය හැකිය. මෙවැනි අවස්ථාවක සභාවේ ආදායම් පරීක්ෂකවරයා වාචිකව කරන පැහැදිලි කිරීම් මත සිය බදු ගෙවීම් සංවිධානය කරගැනීමට ව්‍යාපාරිකයින්ට බලකිරීමක් මෙයින් දිස්වේ. මෙය නීතිය ඉදිරියේ ඇතැම් විට ප්‍රශ්න කිරීමට ලක්විය හැකි පැනවීමක් වන්නේ එබැවිනි. කෙසේ වෙතත් මෙහි වෙනත් තාක්ෂණික දෝෂ නිරීක්ෂණය නොවූ බවද මෙහිලා සඳහන් කළ හැකිය.

5.3.8 බදුල්ල මහා නගර සභාව

බදුල්ල මහා නගර සභාව මගින් 2016 වර්ෂය සඳහා වූ ව්‍යාපාර බදු පැනවීම සඳහා 2015.10.01 දින පැවති සභාවේදී අනුමැතිය ලබා 2015.12.04 දිනැති අංක 1944 දරණ ගැසට් පත්‍රයේ ඊට අදාල නිවේදනය නගරාධිපතිවරයා නමින් පළකර ඇත. ඒ සමගම අදාල සභා යෝජනාවද පළකර තිබේ. උක්ත යෝජනාවේ බලදායී වගන්ති සාවද්‍ය ලෙස සඳහන් කර ඇත. එය **247 (ඇ) වැනි** ලෙසද අනතුරුව කර්මාන්ත බද්ද **247(ආ) වැනි** ලෙසද දක්වා ඇත. එය නිවැරදි ස්වරූපය විය යුත්තේ **247 ඇ** වන හා **247 ආ** වන ලෙසිනි. මෙබඳු කරුණු පිළිබඳව අදාල කාර්ය මණ්ඩල දක්වන නොසැලකිල්ල හේතුකොට ගෙන මෙම තීරණ නීතිය ඉදිරියේ අභියෝගයට ලක්විය හැකිය.

බදුල්ල මහා නගර සභා ප්‍රදේශයේ ව්‍යාපාර බද්ද අදාල වන ව්‍යාපාර 01 වන උපලේඛනයෙහි දැක්වේ. එබඳු ව්‍යාපාර වර්ග 45 ක් එහි ඇතුලත් වී තිබේ. මෙහි දැකිය හැකි ප්‍රධාන දෝෂය වන්නේ ඊට වෘත්තීය බදු මූලයන් රාශියක් ඇතුලත් කර තිබීමයි. මහා නගර සභා ආඥා පනත 247 ඇ (1 අ) උප වගන්තිය යටතේ අමාත්‍යවරයා යම් වෘත්තීයක යෙදෙන තැනැත්තෙකුගෙන් අයකළ යුතු උපරිම බදු ප්‍රමාණය මේ දක්වා නියෝගයක් මගින් නිශ්චිතව පනවා නැති හෙයින් පළාත් පාලන ආයතන මගින් වෘත්තීය බදු පැනවිය නොහැකිය. තත්වය එසේ පැවතියදී මෙම නිවේදනයේ උපලේඛන අංක 01 හි පහත සඳහන් වෘත්තිකයින් ඇතුලත් කර ඇත.

22 පෞද්ගලික වෛද්‍යවරු (බටහිර) (23) පෞද්ගලික වෛද්‍යවරු (ආයුර්වේද) (24) ගණන් පරීක්ෂකවරු (පෞද්ගලික) (25) ගණකාධිකාරීවරුන් (27) ගෘහ නිර්මාණ ශිල්පීන් (30) මිනින්දෝරුවන් (36) දන්ත වෛද්‍යවරුන් (43) පෞද්ගලික ඉංජිනේරුවරුන් 44 පශු වෛද්‍යවරුන් මෙම වෘත්තිකයින්ගෙන් බදු අයකිරීමේ බලයක් බදුල්ල මහා නගර සභාවට පැවරී නැත. තවද එම උපලේඛනයේ අංක 45 යටතේ සමාජ ශාලාවක් යනුවෙන් සඳහන් කර තිබේ. සමාජශාලා වලට බලපත්‍ර දීම සඳහා විශේෂ නීතියක් සම්මත කර ඇති අතර එය " 1975 අංක 17 දරණ සමාජශාලා වලට බලපත්‍ර දීමේ නීතියයි" ඒ යටතේ පළාත් පාලන ආයතන මගින් සමාජශාලා වලට බලපත්‍ර නිකුත් කිරීමට විධිවිධාන සලසා තිබේ. මේ අනුව මෙම පැනවීම මෙන්ම ගැසට් නිවේදනය ද ඉතා බරපතල ලෙස සභාවේ බලය ඉක්මවා කටයුතු කරමින් ව්‍යාපාර බදු 2016 වර්ෂය සඳහා පනවා ඇත. මෙය බලාතික්‍රමණයට යටත්වන අතර මෙකී නීතියට පටහැනි තත්වයන් හේතුකොට ගෙන මෙම බදු අයකිරීම කළ නොහැකි බවද සඳහන් කළයුතුව ඇත.

5.3.9 හම්බන්තොට මහා නගර සභාව

හම්බන්තොට මහා නගර සභාව විසින් 2016 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම 2015.10.14 පැවති සභා රැස්වීමේදී අනුමත කරනු ලැබ නගරාධිපතිවරයාගේ නමින් 2015.12.04 වැනි දින අංක 1944 දරණ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ ඇත. එම ගැසට් නිවේදනය හා ඒ සමඟ අමුණා ඇති සභා තීරණය නිවැරදිව සකස් කර ඇත. එතෙකුදු වුවත් ව්‍යාපාර බදු පනවා ඇති

ව්‍යාපාර ලැයිස්තුව දැක්වෙන උපලේඛනයේ 1 වන කොටස දෝෂ සහගත බව පෙනේ. එම ලේඛනයේ ව්‍යාපාර 84 ක් අඩංගුවේ.

එම ව්‍යාපාර වර්ගීකරණය අතිශයින් අක්‍රමවත් හා සාවද්‍යවේ. එහි ගබඩා කිරීම් ව්‍යාපාර 22 ක් ඇතුලත්ව ඇත. මෙහි හුදෙක් සඳහන් වන්නේ කිසියම් ව්‍යාපාරිකයෙක් අළෙවි කිරීම් අපේක්ෂාවෙන් සිය වෙළඳ පරිශ්‍රය තුල ඔහුගේ විකුණුම් ද්‍රව්‍ය තොග රැස්කර තබා ගැනීමයි. එය ගබඩා කිරීමක් ලෙස නොසැලකේ. ව්‍යාපාරික වශයෙන් ගබඩා කිරීම යනු ගුදම් (ware house stores complex) වශයෙන් වෘත්තීය ලෙස ගබඩා කිරීම් පිළිබඳ විශේෂඥතාවයක් දක්වන ගබඩාකරුවන්ගේ කර්මාන්තයකි. එය වෙනම ව්‍යාපාරයකි. මෙහි සඳහන් සාපේක්ෂ වශයෙන් කි. ගෑ 100 - 500 අතර වැනි ප්‍රමාණයක් සිය පරිශ්‍රය තුල තබාගැනීම ගබඩා කිරීමක් නොවේ. එබඳු කර්මාන්ත සියල්ල කර්මාන්ත බද්දට යටත් කිරීම සුදුසුවේ. එසේම මාළු වෙළඳාම, පළතුරු වෙළඳාම, සහල් හා ධාන්‍ය වෙළඳාම හා ස්වර්ණාභරන අලෙවිය, විදුලි උපකරණ අළුත්වැඩියාව වැනි කර්මාන්ත රැසක් මෙම ලේඛනයේ ඇතුළත්ව තිබේ. ඒ සියල්ල කර්මාන්ත බද්ද යටතට ඇතුළත් විය යුතුව ඇත. ඒ හැර මෙම ලේඛනයේ විෂයාංක 59 පෙට්‍රල් ගබඩා කිරීම හා විකිණීම 60 ඩීසල් ගබඩා කිරීම හා විකිණීම 61 භූමිතෙල් ගබඩා කිරීම හා විකිණීම 62 ලිහිසි තෙල් හා ගෑස් ගබඩා කිරීම ආදිය සඳහා පළාත් පාලන ආයතනයකට බදු පැනවීමට බලය පවරා නැත. ඛනිජ තෙල් ආඥා පනත යටතේ විෂයභාර අමාත්‍යවරයා විසින් එකී ස්ථාන සඳහා බලපත්‍ර ලබාදීමේ බලය මහා නගර සභා හා නගර සභා වෙත පවරා ඇත. ඊට අනුරූප වන ගාස්තු ඇමතිවරයා විසින් අදාල නීතිය යටතේ සකස් කළ රීති මගින් පනවා ඇත. මහා නගර සභාවේ කාර්ය වන්නේ ඒ අනුව සුදුසු ස්ථාන සඳහා බලපත්‍ර නිකුත්කර නියමිත ගාස්තු ලබාගැනීමයි.

ඒ අනුව මෙම ලේඛණයෙහි සඳහන් ව්‍යාපාර අතුරින් බලපත්‍ර නිකුත් කළ යුතු හා කර්මාන්ත බද්ද අයකළ යුතු ව්‍යාපාර ඉවත්කර සෙසු ව්‍යාපාර 247 ඇ වගන්තිය යටතේ ව්‍යාපාර බදු අයකිරීම සඳහා යොදාගත හැකිය. ඒ හැර මෙම ලේඛනයෙහි 75 ගණකාධිකාරී සේවා යන්න වෘත්තීයකට අයත්වන බැවින් ඒ සඳහා ව්‍යාපාර බදු පැනවිය නොහැකිය. මේ අනුව හම්බන්තොට මහා නගර සභාවේ 2016 සඳහා ව්‍යාපාර බද්ද පැනවීමට අදාළ වන සභා තීරණය නිවැරදි වන අතර ගැසට් නිවේදනය දෝෂ සහගත බව පෙනීයයි.

5.3.10 මඩකලපුව මහා නගර සභාව

2016 වර්ෂය සඳහා මඩකලපුව මහා නගර සභාව ව්‍යාපාර බද්ද පැනවීමට තීරණය කරන ලද බව නාගරික කොමසාරිස් නමින් පළකර ඇති 2015.12.18 දිනැති අංක 1946 දරණ ගැසට් පත්‍රයේ පළකර ඇති නිවේදනය මගින් දක්වා ඇත. එහෙත් ඒ වනවිට මඩකලපුව මහා නගර සභාවේ නගරාධිපති ඇතුළු සභික මණ්ඩලය ක්‍රියාත්මක වූයේ නම් සභාව මෙම යෝජනා අනුමත කළ දිනය හා එම යෝජනාවේ පිටපත මීට අමුණා තිබිය යුතුය.

එසේ නොමැතිව සභාවේ බලතල කොමසාරිවරයා වෙත පැවරී තිබුයේ නම් එසේ බලතල පැවරුණු බලදායී වගන්තිය මෙම ගැසට් නිවේදනයේ සඳහන් කිරීම අත්‍යවශ්‍ය කරුණකි. එසේ නොමැති වූ විට නිවේදන බල රහිත හා නීතිය ඉදිරියේ වලංගු භාවයක් නොමැති හුදු කඩදාසි බවට පත්වේ. කෙසේ වෙතත් මෙම නිවේදනය තුළ බලපත්‍ර ගාස්තු, කර්මාන්ත බදු හා ව්‍යාපාර බදු ආදී ආදායම් සියල්ල පනවා ඇති බව සඳහන්ය. එය පොදු යෝජනාවන් වන අතර ව්‍යාකූල භාවයෙන් යුක්තය. මෙහි III වන වගුව මගින් ව්‍යාපාර බද්ද පනවන ලද ව්‍යාපාර වර්ග 21 ක් සඳහන් කර ඇත. මේ අතුරින් විෂයාංක 3 විගණන ආයතන වාත්තීයකට අදාල වන හෙයින් එයින් ව්‍යාපාර බද්ද අයකිරීමට මහා නගර සභාවට බලය පැවරී නැත. ඉහත කරුණු අනුව මෙම බද්ද පැනවීම පිළිබඳව හා එහි හරයාත්මක කරුණු පිළිබඳව ඇති ඌණ දැනුම හේතුවෙන් 2016 වර්ෂය සඳහා වූ මඩකලපුව මහා නගර සභාවේ ව්‍යාපාර බද්ද පැනවීම නීත්‍යානුකූල නොවන බව පෙන්වා දිය හැකිය.

5.3.11 අනුරාධපුර මහා නගර සභාව

අනුරාධපුර මහා නගර සභාව 2016 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම 2015.11.03 දී පැවති සභා රැස්වීමේදී අනුමත කර 2015.12.18 දිනැති අංක 1946 දරන ගැසට් පත්‍රයෙහි නගරාධිපතිවරයා නමින් පළකර ඇත. මෙය සියළු බදු හා බලපත්‍ර ගාස්තු පැනවීම සඳහා පොදුවේ පළකරන ලද නිවේදනයකි. ඒ සමඟ අදාල සභා යෝජනාව / තීරණය පළකර නැත. මෙම නිවේදනයේ බදු හා බලපත්‍ර ගාස්තු පැනවීම පිළිබඳ මහා නගර සභා ආඥා පනතේ බලදායී වගන්ති සියල්ල සාවද්‍ය ලෙස සටහන් කර ඇත. උදා - ව්‍යාපාර බදු 247 (ඇ) වගන්තිය ලෙසිනි. මෙය නිවැරදිව සටහන් කළ යුත්තේ 247 ඇ ලෙසිනි.

මෙම නිවේදනය ඒ ඒ ආදායම් වර්ග සඳහා වෙනම නිවේදන ලෙස නොව එක් පොදු නිවේදනයක් ලෙස පළකර තිබීමෙන් මෙය සංකීර්ණ හා වියවුල්කාරී බවකට පත්ව ඇත. එහි ව්‍යාපාර බද්ද සඳහා වන ව්‍යාපාර වර්ග 35 ක් දක්වා ඇත. ඒ අතර යම් යම් වෘත්තීන්ට අදාල ක්ෂේත්‍රයන්ද ව්‍යාපාර බද්ද සඳහා ඇතුළත් කර ඇත. උදා - 06 ගෘහ නිර්මාණ ශිල්පය 10 ගිණුම් උපදේශන සේවා 20 වෛද්‍ය උපදේශන සේවා 29 පශු වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම. 30 දන්ත කාර්මික ස්ථානයක් පවත්වාගෙන යාම. මෙම කාර්යයන් සඳහා බදු අයකිරීමට පළාත් පාලන ආයතන වෙත බලය පැවරී නැත. එබැවින් මෙය බලාතිත්‍රමණයට නතුවේ. මෙම දෝෂ සහගත තත්වයක් හේතුකොට ගෙන මෙය අවිධිමත් ආදායම් පැනවීමක් ලෙස හඳුන්වාදිය හැකිය.

5.3.12 යාපනය මහා නගර සභාව

2016 වර්ෂය සඳහා යාපනය මහා නගර සභාව විසින් ව්‍යාපාර බද්ද පනවා එය ප්‍රසිද්ධ කරන බව 2016.01.01 දිනැති අංක 1948 දරණ ගැසට් පත්‍රයෙහි නිවේදනයන් මගින් ප්‍රකාශයට පත්කර තිබුණි. එහෙත් සභා සම්මුතිය ලබාගත් දිනය එම නිවේදනයේ සඳහන් වී නැත. එසේම මෙම ආදායම් පැනවීම මහජන නියෝජිතයින්ගෙන් සැදි සභාවක් නොමැති කාලයක නාගරික කොමසාරිස්වරයාට පැවරුණු බලතල පරිදි සිදුකළේ නම් මෙම ගැසට් නිවේදනයෙහි ඊට අදාල බලදායී වගන්තිය සඳහන් කිරීම අත්‍යාවශ්‍ය වේ.

වැඩිමනත් කරුනු සොයා බැලීමේදී අනාවරණය වූයේ 2014 ජූනි මාසයෙන් පසු මන්ත්‍රීවරුන්ගේ ධුර කාලය අවසන් වී කොමසාරිස්වරයාට සභාවේ බලතල පැවරුන බවයි. එහෙත් ඒ බව මෙම නිවේදනයේ සඳහන් නොවේ. එබැවින් මෙය දෝෂ සහගත හා නීතියට පටහැනි තත්වයන් ගෙන් යුතු වන හෙයින් 2016 වර්ෂය සඳහා යාපනය මහා නගර සභාව පනවා ඇති ව්‍යාපාර බද්ද අධිකරණ ක්‍රියාමාර්ග ඉදිරියේ අභියෝගයට ලක්විය හැකිය.

මෙහි උපලේඛන අංක 111 හි ව්‍යාපාර බදු සඳහා ව්‍යාපාර වර්ග 36 ක් ගැසට් මගින් ප්‍රකාශයට පත්කර ඇත. එම 36 අතුරින් ව්‍යාපාර සෘහෙන සංඛ්‍යාවක් යම් යම් වෘත්තීන්ට අයත්වේ. උදා - 01 නීතීඥවරුන්, 11 නීති උපදේශකයින්, 12 නොතාරිස්වරුන්, 13 වෛද්‍යවරුන්, 20 ආදායම් බදු උපදේශකයින්, 23 ගෘහ නිර්මාණ ශිල්පීන්, 26 දන්ත වෛද්‍යවරුන්, 27 විගණකවරුන්, 28

ගණකාධිකාරීන්, 31 අක්ෂි වෛද්‍යවරු, 32 ඉංජිනේරුවන්, 33 වෛද්‍ය විශේෂඥවරු, 34 ශල්‍ය වෛද්‍යවරු.

ඉහත වෘත්තිකයන් 14 ක් වූ තැනැත්තන් කිසිවකු ව්‍යාපාර බදු ගෙවීමට යටත් නොවේ. වෘත්තිකයින්ගෙන් වෘත්තීය බදු අයකිරීම සඳහා මේ දක්වා නීතියෙහි විධිවිධාන සකස් කොට නැත. එබැවින් මහා නගර සභාවකට එම වෘත්තිකයන් විෂයෙහි බදු පැනවිය නොහැකිය. කෙසේ වෙතත් උක්ත පසුබිම තුළ මෙම බදු පැනවීම බෙහෙවින් දෝෂ සහගත හා නීත්‍යානුකූල නොවන්නක් ලෙස හැඳින්විය හැකිය.

5.4 කර්මාන්ත බදු (Trade Tax)

පළාත් පාලන නීතියට අනුව මිලදී ගෙන විකිණීම හෝ නිෂ්පාදනය කර විකිණීම ව්‍යාපාරයක් හෝ ව්‍යාපාරයක කොටසක් ලෙස සලකනු ලැබේ. එවැනි වෙළඳාම් පවත්වාගෙන යන ස්ථානයේ වාර්ෂික වටිනාකම මත බද්දක් ගෙවීම සඳහා එකී වෙළඳාම කරගෙන යනු ලබන තැනැත්තා බැඳී සිටී. කෙසේ වෙතත් මෙම බද්ද මහා නගර සභාව විසින් වාර්ෂිකව පැනවිය යුතුය. මහා නගර සභා ආඥා පනතේ 247 ආ වගන්තිය මගින් ඊට ප්‍රතිපාදන සලසා ඇත. එහි දැක්වෙන්නේ " යම් මහා නගර සභාවක පාලන සීමා තුළ කරගෙන යන යම් කර්මාන්තයක් වෙනුවෙන් බද්දක් නියම කොට අයකිරීම ඒ මහා නගර සභාව විසින් කළහැකිය. එසේම මෙම කර්මාන්ත බද්ද ඒ කර්මාන්තය කරගෙන යන ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුව සභාව විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණයක වාර්ෂික බද්දක් විය යුතුය. එසේ වුවද එවැනි යම් ස්ථානයක වාර්ෂික වටිනාකම හා ඊට අයකළ යුතු බද්ද පහත සටහනේ දැක්වෙන සීමාවන් තුළ විය යුතුය.

සටහන් අංක 15 : කර්මාන්ත බද්ද අයකිරීමේ පදනම

වාර්ෂික වටිනාකම	අයකළයුතු බද්දේ උපරිමය
1. රු. 1500 නොඉක්මන විට	රු.2000
2. රු. 1500 ඉක්මවන නමුත් රු. 2500 නොඉක්මවන විට	රු.3000
3. රු. 2500 ඉක්මවන විට	රු.5000

එසේම යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීමට අවශ්‍ය වන කර්මාන්තයක් සඳහා මෙම බද්ද නියම කිරීම හෝ බදු අයකිරීම නොකළ යුතු බව ද නීතියෙන් නියමකර ඇත. තවද මෙම බද්ද ගෙවිය යුතු දිනය සභාව විසින් හෝ අතුරු ව්‍යවස්ථාවක් මගින් නිශ්චය කළ යුතු අතර එදිනට කර්මාන්තය කරගෙන යන තැනැත්තා එම බද්ද ගෙවිය යුතුය.

කිසියම් මහා නගර සභාවක් මෙසේ පනවන ලද බද්දක් ගෙවන ලෙස ඉල්ලා සිටි දිනය ඉකුත් වීමෙන් දින හතක් ඇතුලත එම බද්ද ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් අදාල බල ප්‍රදේශයේ මහේස්ත්‍රාත්වරයා වෙත නාගරික කොමසාරිස්වරයා විසින් වාර්තා කළ යුතුය. එවිට අධිකරණය එම මුදල දඩයක් ලෙස අයකර සභාවට ගෙවිය යුතුය. මෙම බද්ද මහා නගර සභා ආඥා පනතට 1979 අංක 42 පනතින් කරන ලද සංශෝධනයකින් හඳුන්වා දෙන ලද ඉතා සරල බද්දකි. එහෙත් බොහෝ පළාත් පාලන ආයතන වාර්ෂිකව ගැසට් නිවේදන පළ කළත් සභා සම්මුතියක් මගින් සභාවේ අනුමැතිය ලබාගන්නේ කලාතුරකිනි. ඇතැම් පළාත් පාලන ආයතන වෙළඳ බලපත්‍රවලට යටත් වන වෙළඳාම් සඳහා ද කර්මාන්ත බදු පනවනු දැකිය හැකිය. එසේම ව්‍යාපාර බද්ද පැනවිය යුතු ව්‍යාපාර සඳහා ද කර්මාන්ත බද්ද පනවා තිබෙනු නිරීක්ෂණය විය.

මෙහිදී සඳහන් කළ යුතු තවත් කරුණක් වන්නේ ඇතැම් මහා නගර සභා පුපුරණ ද්‍රව්‍ය ආඥාපනත යටතේ රජයේ දිසාපතිවරයා විසින් බලපත්‍ර නිකුත් කළ යුතු ව්‍යාපාර සඳහා ද ඛණිජ තෙල් ආඥා පනත යටතේ මහා නගර සභාව විසින් බලපත්‍ර නිකුත් කළ යුතු එහෙත් අමාත්‍යවරයා විසින් ගාස්තු නියම කර ඇති මෙබඳු ස්ථාන සඳහා ද කර්මාන්ත බද්ද පනවා ඇති බවයි. කර්මාන්ත බද්ද පැනවීමට සභාවකට ලැබී ඇති ඉඩප්‍රස්ථාව අතිශයින් වැදගත් වන්නේ බොහෝවිට අතුරු ව්‍යවස්ථා පනවාගෙන නැති කර්මාන්ත හා ව්‍යාපාර විෂයෙහි කර්මාන්ත බද්ද පනවාගත හැකි වීමයි. නොඑසේනම් අතුරු ව්‍යවස්ථා නොමැති එහෙත් නගරයක් තුළ ඇති බොහෝ කර්මාන්ත කෙරෙහි බද්දක් පැනවීමේ අවස්ථාව නොමැති වීමට පළාත් පාලන ආයතනවලට සිදුවිය හැකිව තිබුණි. මීළගට මෙම අධ්‍යයනයේදී පරීක්ෂාවට භාජනය කළ මහා නගර සභාවන්හි කර්මාන්ත බද්ද පැනවීම සිදුකර ඇති ප්‍රායෝගික ස්වරූපය ඉතා සංක්ෂිප්තව විමසා බැලීම යෝග්‍ය වේ.

5.4.1 කොළඹ මහා නගර සභාව

කොළඹ මහා නගර සභාව 2016 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පනවා ඇත්තේ 2015 දෙසැම්බර් මස 04 වන දිනැති අංක 1944 දරණ ගැසට් පත්‍රය මඟින් නගරාධිපතිවරයා විසින් පොදුවේ සියළු බදු පනවා ඇති නිවේදනයේම කොටසක් ලෙසිනි. මෙය අදාල සභා යෝජනාව / තීරණය සමඟ වෙනම බදු පැනවීමේ නිවේදනයක් ලෙස ගැසට් පත්‍රයේ පළකළ යුතුවේ. එබැවින් මෙය අවිධිමත් නිවේදනයක් ලෙස සැලකීමට සිදුවේ. තවද මීට අදාල උපලේඛන අංක 02 හි මහා නගර සභා ආඥා පනතේ **247 (ආ) වගන්තිය ප්‍රකාර ව්‍යාපාර විෂයෙහි බදු** යනුවෙන් සඳහන් කර ඇත. මෙය අතිශයින් සාවද්‍ය යෙදුමකි. එය සඳහන් කළ යුත්තේ මහා නගර සභා ආඥා පනතේ **247 ආ වගන්තිය යටතේ ඇතැම් කර්මාන්ත විෂයෙහි බදු** යනුවෙනි. ඒ අනුව අදාල වගන්තිය හා මාතෘකාව වැරදි ලෙස සඳහන් කර තිබීම හේතුකොට ගෙන මෙය පරිපාටිමය බලාතික්‍රමණයට යටත් වන අතර එසේම එය නීතිය ඉදිරියේ ඇති වලංගුභාවය අහෝසි කර ගනී.

තවද ඒ සමඟ ඇති පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම හා බලපත්‍ර ගාස්තුව දැක්වෙන සටහන ද මහා නගර සභා ආඥා පනතෙහි දක්වා ඇති අදාල සටහනට පටහැනි ආකාරයට සකස් කර ඇත. නීතියෙහි දැක්වෙන විධිවිධාන අභිබවා කිසියම් ස්ථානයක වාර්ෂික වටිනාකම රුපියල් 01 සිට රුපියල් 50,001 දක්වා ව්‍යාප්ත වන ලෙස සඳහන් කර තිබීම සාවද්‍ය වේ. රුපියල් 01 ක වාර්ෂික වටිනාකමක් ඇති පරිශ්‍ර කොළඹ නගරයේ තිබේද යන ප්‍රායෝගික ගැටළුව මෙහිදී පැනනගී. මහා නගර සභා ආඥා පනතේ එය සඳහන් වන්නේ අවම වාර්ෂික වටිනාකම රුපියල් 1500/- නොඉක්මවන විට යනුවෙනි. එසේම එහි උපරිම වාර්ෂික වටිනාකම රුපියල් 2500/- ඉක්මවන විට යනුවෙනි. ඒ අනුව මෙම වාර්ෂික වටිනාකම් දැක්වෙන සටහන ද නීතියේ දැක්වෙන සීමාවන් ඉක්මවා ගිය ස්වරූපයක් පෙන්නුම් කරයි.

එසේම මීට අදාල කර්මාන්ත (Trade) ලැයිස්තුවද කර්මාන්ත වර්ග 194 කින් යුක්ත ඉතා දීර්ඝ වූවකි. මෙහි අඩංගු ඇතැම් අයිතමයන් කර්මාන්ත ගණයට නොව ව්‍යාපාර (Buisness) ගණයට අයත් ඒවා වන අතර ඇතැම් කාර්යයන්, උදාහරණ ලෙස (155) ගිනි අවි වෙළඳාම, සම්බන්ධව බලපත්‍ර ලබාදීම රජයේ දිසාපතිවරයාට අයත් කාර්යයක් වේ. මෙසේ කර්මාන්ත (Trade) යන්න නිවැරදිව වටහා නොගෙන මෙම ව්‍යාපාර වර්ගීකරණය කර ඇති හෙයින් එම ලේඛන බෙහෙවින් ව්‍යාකූලත්වයකට පත්ව ඇත.

උදාහරණ වශයෙන් මෙම ලේඛනයේ සඳහන් කරන ලද උපකරණ ගබඩා කිරීම 2 භාණ්ඩ ප්‍රදර්ශනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. (13) වාණිජමය කාර්යයන් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම. (43) සංචාරක සේවා ස්ථානයක් පවත්වාගෙන යාම. (47) ගුවන් සේවා කාර්යාලයක් පවත්වාගෙන යාම. (46) විදේශ රැකියා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. (48) වාණිජමය කටයුතු සඳහා ආයතනයක් හෝ කාර්යාලයක් පවත්වාගෙන යාම. (74) පරිගණක යන්ත්‍ර පුහුණු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම. (118) ගෘහ නිර්මාණ ශිල්පීය හෝ සැලසුම් කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම. (119) රක්ෂණ සමාගම් පවත්වාගෙන යාම. (127) රක්ෂණ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම. (122) උපදේශක සේවා ස්ථානයක් ලෙස වර්ගීකරණය කිරීම කොතෙක් දුරට නිවැරදි වන්නේ ද යන්න සොයා බැලිය යුතුව ඇත.

මේ අනුව මෙම කර්මාන්ත බද්ද පැනවීමේ 2016 වසර සඳහා වූ නිවේදනය සාවද්‍ය හා දෝෂ සහගත අවස්ථාවන්ගෙන් බහුල බව පෙනේ. එසේම මෙහි ඉංග්‍රීසි පරිවර්තනයේ ද බොහෝ වැරදි සහගත තොරතුරු අඩංගු වී ඇති බව වැඩිදුරටත් කරුණු පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය විය.

5.4.2 දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව

2016 වර්ෂය සඳහා දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව 2015 ජූලි මස 02 වන දින සභාවේ අනුමැතිය ලබා ඊට අදාල නිවේදනය 2015.08.21 දිනැති අංක 1929 දරණ ගැසට් පත්‍රයෙහි නගරාධිපතිවරයාගේ නමින් ප්‍රකාශයට පත්කර ඇත. මෙම නිවේදනය මඟින් සභාව ඊට අදාල යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත දැන්වීම පමණක් සිදුකර ඇත. ඊට අමුණා ඇති සභා යෝජනාව ඉතාමත් සවිස්තරාත්මක කර්මාන්ත බද්ද පැනවීම ගැන සඳහන් කර ඇති හෙයින් එහි නීතිමය දෝෂයක් ඇතැයි සඳහන් කළ නොහැකිය. එහෙත් එය කර්මාන්ත බද්ද පැනවීම ගැන පරිපූර්ණ නිවේදනයක් නොවන බව පෙනේ.

කෙසේ වෙතත් මෙම යෝජනාවට අනතුරුව ඇති උපලේඛනය මඟින් වාර්ෂික වටිනාකම් හා ඊට අනුරූප බද්ද කොපමණ ද යන්න දක්වා ඇත. එය 247 ආ වගන්තියෙහි දී ඇති වාර්ෂික වටිනාකම් ව්‍යුහය නොවේ. ඊට සම්පූර්ණයෙන්ම වෙනස් ව්‍යුහයක් සහිතව ආඥා පනතෙහි දැක්වෙන බදු අනුප්‍රමාණ ඊට ගලපා ඉදිරිපත්කර ඇත. මෙය කොතෙක් දුරට නීතියට එකඟද යන්න විමසා බැලිය යුතුව ඇත.

මෙම බදු නිවේදනය, සභා සම්මුතිය හා ගාස්තු චක්‍රයට අමතරව මෙම බද්ද අයත්වන කර්මාන්ත කවරේද යන්න මෙම නිවේදනයෙහි සඳහන් නොවේ. ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් පමණක් සභා යෝජනාවේ දැක්වේ. බද්ද අයත්වන කර්මාන්ත වර්ග පිළිබඳව බදු ගෙවන ජනතාවට දැනගැනීමට කිසිම මාර්ගයක් නොමැති තත්වයක් මේ තුළ විද්‍යාමාන වේ. මෙය බදු පැනවීමේ මූලධර්ම වලට පටහැනි ප්‍රබල අඩුපාඩුවකි. මීට අදාල වන ව්‍යාපාරිකයින්ට මහා නගර සභාවේ නිලධාරීන් ඉල්ලා සිටින බදු ප්‍රමාණය තමා නොදන්නා පදනමක් මත සභාවට ගෙවීමට සිදුවේ. මේ අනුව මෙම බද්ද පැනවීම අසම්පූර්ණ මෙන්ම සාවද්‍ය බව පෙනේ. මීට හේතුකාරක වූ කරුණු පැහැදිලි කිරීමට සභාවේ විෂය භාර නිලධාරීන් අසමත් වූ බවද නිරීක්ෂණය විය.

5.4.3 ගම්පහ මහා නගර සභාව

2016 වර්ෂයට අදාලව ගම්පහ මහා නගර සභාව විසින් 2015 සැප්තැම්බර් මස 11 වන දින පැවති මහා සභාවේ දි බද්දක් පැනවීම සම්මත කර ඇති අතර එය 2015-12-18 දිනැති අංක 1946 දරන ගැසට් පත්‍රයේ පළකර ඇත. නාගරික කොමසාරිස් වරයා නමින් පළ කර ඇති එම නිවේදනය සමග අදාල සභා යෝජනාවන් ඇතුලත් කර තිබේ. මෙම මහා නගර සභාව ද ඇතැම් කර්මාන්ත විෂයෙහි බදු අය කිරීම පිණිස මහා නගර සභා ආඥාපනේ 247 ආ (1) වගන්තියෙහි දැක්වෙන වාර්ෂික වටිනාකම් ව්‍යුහය වෙනස් කර ඇත.එය වර්තමාන වටිනාකම් අනුව වෙනස් කර ඇති බව හැඟේ. එහෙත් එය වෙනස් කිරීම ම.න.ස ආඥා පනේ 287 වන වගන්තිය ප්‍රකාර ඇමතිවරයා විසින් කරනු ලබන නියමයක් මගින් සංශෝධනය කරගත හැකිව තිබුණි. කෙසේ වෙතත් මෙහිදී අදාල බදු ප්‍රමාණය ඉක්මවා නොමැතිවීම වැදගත් කරුණකි.

මෙම නිවේදනයට යා කොට ඇති ලේඛනයෙහි කර්මාන්ත 176 ක් සඳහා කර්මාන්ත බද්ද පනවා ඇත. එම කර්මාන්ත හෝ වෙළඳාම් අතරින් 20 ක් ගබඩා කිරීමය. වෙළඳාම සඳහා කිසියම් භාණ්ඩයක තොගයක් අදාල තැනැත්තා භාරයේ තබා ගැණීම වෙළඳාමක් හෝ කර්මාන්තයක් නොවේ .සෙසු පලාත් පාලන ආයතන මෙන්ම මෙහිද එම දෝෂය දක්නට ලැබේ.

එසේම වෘත්තීන් සඳහා බදු අයකළ නොහැකි වුවද මෙම නිවේදනයෙහි එබඳු වෘත්තීන් ගණනාවක් අඩංගු වේ. (174) ජ්‍යෝතිෂ්‍ය කටයුතු (165) බටහිර බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම (B4)දත් බැඳීම (A5) චිත්‍රපට සංරක්ෂණය එසේම මත්පැන් අලවිය (III)විදුලි සංදේශ කුළුණු ආදිය සඳහා කර්මාන්ත බදු පැනවීම නිතියේ බල සීමාවට ඉක්මවා ක්‍රියා කිරීම වේ. එබැවින් මෙම පැනවීම සම්පූර්ණයෙන්ම නිවැරදි යයි සඳහන් කළ නොහැකිය.

5.4.4 කුරුණෑගල මහා නගර සභාව

කුරුණෑගල මහා නගර සභාව 2016 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පනවා ඇති බව සඳහන් කළ ද ඊට අදාල ගැසට් නිවේදන පළකර ඇති බව අනාවරණය නොවුණි. එබැවින් කුමන ආකාරයට එම නිවේදන පළකර තිබේද යන්න විමර්ශනය කිරීමට අවස්ථාව නොලැබුණි. මේ සම්බන්ධව අවස්ථා ගණනාවකදි විමසීම් කළ ද අදාල ගැසට් නිවේදන කිසිවක් ලබා ගත නොහැකි විය.

5.4.5 මහනුවර මහා නගර සභාව

මහනුවර මහා නගර සභාව 2016 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම 2015.11.24 දින සභා රැස්වීමේදී අනුමත කර 2016.01.01 දිනැති අංක 1948 දරණ ගැසට් පත්‍රයේ නගරාධිපතිවරයා නමින් පළකර ඇත. මෙහිදී බලපත්‍ර ගාස්තු හා බදු පැනවීමට යොදාගෙන ඇත්තේ එක් පොදු නිවේදනයක් පමණි. ඒ සමග අදාල සභා යෝජනා ද පළකර නොමැත. මෙසේ පොදු නිවේදනයකින් සියලු ආදායම් පැනවීම ඉතාම ව්‍යාකූල හා සංකීර්ණ තත්වයකි. බද්දට යටත් වන ව්‍යාපාරික බදු ගෙවන්නන්ට ඒ පිළිබඳ සම්පූර්ණ තොරතුරු ලැබෙන පරිදි අංග සම්පූර්ණ බදු පැනවීම් නිවේදනයක් ඊට අදාල සභා යෝජනාව සමග ගැසට් පත්‍රයේ පළකළ යුතුය.

මෙම දීර්ඝ ලේඛනයේ කර්මාන්ත බද්දට අයත් කාර්යයන් 167 ක් ඇත. එයින් 12 ක් ගබඩා කිරීමේ කර්මාන්තයන්ය. තමා අලෙවි කරන භාණ්ඩ සිය පරිශ්‍රය තුල තොග වශයෙන් තබාගැනීම ගබඩා කිරීම් කර්මාන්තය ලෙස සැලකිය නොහැකිය. කර්මාන්ත ලැයිස්තුවේ අවසානයේ ඇති පොදු ගාස්තු චක්‍රය බලපත්‍ර ගාස්තු හා කර්මාන්ත බදු සඳහා යොදාගෙන ඇත. එහි වාර්ෂික වටිනාකමේ ව්‍යුහය වෙනස් කොට ඇති අතර අවමය රුපියල් 5000/- සිට උපරිමය රුපියල් 75000/- දක්වා විහිදී ඇත. මෙය පනතේ නියමයන් ඉක්මවා යාමකි. එහෙත් එහි ඇති බදු ප්‍රමාණයන්හි වෙනසක් සිදුකර නොමැත. මෙම දීර්ඝ ලැයිස්තුවෙහි

ව්‍යාපාර බදු සඳහා අදාල කරගත යුතු කර්මාන්ත අතුරින් සෑහෙන සංඛ්‍යාවක් පවතින බවද නිරීක්ෂණය විය. මේ අනුව මහනුවර මහා නගර සභාවේ 2016 සඳහා වූ කර්මාන්ත බදු පැනවීම විධිමත් හා නීත්‍යානුකූල නොවන බව පෙන්වා දිය යුතුව ඇත.

5.4.6 දඹුල්ල මහා නගර සභාව

2016 වර්ෂය සඳහා වූ කර්මාන්ත බද්ද පැනවීම පිළිබඳ ගැසට් නිවේදනය එහි නාගරික කොමසාරිස්වරයා විසින් 2016.01.01 දිනැති අංක 1948 දරණ ගැසට් පත්‍රයේ පළකර ඇත. මෙම නිවේදනය පළකර ඇත්තේ දඹුල්ල මහා නගර සභාවේ කළමනාකරණ කමිටු තීරණයක් ලෙසිනි. බදු පැනවීම සඳහා බලය පැවරී ඇති මෙබඳු අංශයක් මහා නගර සභා ආඥාපනතේ සඳහන් වී නොමැත.

සභාවේ නගරාධිපති ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ ධූර කාලය අවසන්වූ පසු නැවත ඡන්දයකින් පසු එම නිලයන් පත්කරන තෙක් නාගරික කොමසාරිස්වරයාට සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම පිණිස 286 අ වගන්තියෙන් බලය පැවරී ඇත. එහිදී ඔහු එම කර්මාන්ත බද්ද පැනවීමේදී තමාට එම බලතල ලැබී ඇති බලදායී වගන්තිය අනිවාර්යයෙන් සඳහන් කළ යුතුය. මෙම නිවේදනයේ එවැන්නක් සඳහන් නොවේ. මහා නගර සභා ආඥා පනත අනුව කර්මාන්ත බද්ද පැනවිය යුත්තේ සභාව මිස කළමනාකරණ කමිටුවක් නොවේ. එහෙත් මෙහිදී එය පනවා ඇත්තේ කළමනාකරණ කමිටුව වන හෙයින් එම පැනවීම සහමුලින්ම නීතියට පටහැනි වූවකි.

එසේම මෙම නිවේදනය මගින් අදාල නීතිමය වගන්ති නිශ්චිතව සඳහන් කොට 2016 වර්ෂයට කර්මාන්ත බද්ද පැනවිය යුතුවේ. ඒ නිවේදනය මගින් 2016 වර්ෂයට බලපත්‍ර ගාස්තු සහ ව්‍යාපාර බදු පනවා ඇතිමුත් කර්මාන්ත බද්ද පනවා ඇති බවක් නොපෙනේ. එහෙත් එහි දැක්වෙන දීර්ඝ පොදු ව්‍යාපාර ලැයිස්තුවේ අංක 91 සිට කර්මාන්ත බද්ද අයකරන බව දක්වා ඇත. එම ලැයිස්තුවෙහි 91 සිට 305 දක්වා කර්මාන්ත බද්දට යටත් විෂයයන් 215 ක් දැක්වේ. එය අවසානයේ බලපත්‍ර ගාස්තු හා කර්මාන්ත බද්ද සඳහා වූ පොදු ගාස්තු චක්‍රයක් ද දැක්වේ. එය මහා නගර සභා ආඥා පනතේ 247 ආ වගන්තියේ සඳහන් වාර්ෂික වටිනාකම් ව්‍යුහයට වඩා වෙනස් වූවක් වන අතර ඊට අනුරූපව බද්දේ ප්‍රමාණය ද දක්වා ඇත. එහි දක්වා ඇති බද්දේ ප්‍රමාණය නීතිය තුල පැවතීම සාධනීය ලක්ෂණයකි.

මෙම කර්මාන්ත බදු ලැයිස්තුවේ (93) රා එකතු කිරීම හා විකිණීම. (94) රා බෝතල් විකිණීම. (95) රට බීම විකිණීම. (96) බියර් ගබඩා කිරීම හා විකිණීම ලෙස දක්වා ඇත. මෙම කාර්යයන් සඳහා පළාත් පාලන ආයතන වෙත බදු පැනවීමේ බලයක් පැවරී නැත. සුරාබදු ආඥා පනතේ විධිවිධාන ප්‍රකාර රජයේ දිසාපතිවරයා ඒ සඳහා බලපත්‍ර ලබාදීමේ අධිකාරය දරයි. එසේම මෙහි අඩංගු කර්මාන්ත අතුරින් 32 ක් ගබඩා කිරීමය. මීට ඉහත දී ද පෙන්වා දී ඇති පරිදි ගබඩා කිරීම් කර්මාන්තයක් හෝ වෙළඳාමක් ලෙස නොසැලකේ. එය බඩු ගබඩා පවත්වාගෙන යාම පිළිබඳ ව්‍යාපාරයකි. යම් වෙළෙන්දෙකු තමා අලෙවි කරණ භාණ්ඩ තොගයක් තම පරිශ්‍රය තුළ තබාගැනීම ගබඩා කිරීමක් නොවේ. මෙම දීර්ඝ ලේඛනය තුළ බලපත්‍ර ගාස්තු අයකළ යුතු කර්මාන්ත මෙන්ම ව්‍යාපාර බද්ද අයකළ යුතු ව්‍යාපාර ගණනාවක් ඇත. මේ අනුව දඹුල්ල මහා නගර සභාවේ 2016 වර්ෂය සඳහා වූ කර්මාන්ත බද්ද පැනවීම දෝෂ සහගත හා සාවද්‍ය වූවක් බව පෙනේ.

5.4.7 රත්නපුර මහා නගර සභාව

2016 වර්ෂය සඳහා රත්නපුර මහා නගර සභාව කර්මාන්ත බද්ද පැනවීම පිණිස 2015 සැප්තැම්බර් මස 04 දින පැවති සභා රැස්වීමේදී අනුමැතිය ලබා 2015 නොවැම්බර් මස 13 දින ගැසට් පත්‍රයේ ඊට අදාල නිවේදනය සහා යෝජනාව ද සමග නගරාධිපතිවරයාගේ නමින් ප්‍රකාශයට පත්කර ඇත. එහි සභා තීරණයේ කර්මාන්ත බද්ද පැනවීමට අදාල බලදායී වගන්තිය 247 (ආ) යනුවෙන් සාවද්‍ය ලෙස සටහන් කර ඇත. එය 247 ආ ලෙස නිවැරදිව සඳහන් කළයුතුය. ඒ හැර මෙම නිවේදනය වෙනත් අඩුපාඩු වලින් යුක්ත නොවන බව පෙනේ. මේ සමඟ ඇති බද්දට යටත්වන කර්මාන්ත ලේඛනය කර්මාන්ත 70 කින් සමන්විතය. එයින් කර්මාන්ත 4 ක් ගබඩා කිරීම වේ. අංක (51) කර්මාන්තය සඳහා බද්දක් සඳහන් කර නැත. අංක (59) මත්පැන් හලක් යන්න සුරාබදු ආඥා පනත යටතට ගැනෙන්නෙකි. මෙම අඩුපාඩු හැරුණු විට මෙම කර්මාන්ත බද්ද පැනවීම සාමාන්‍යයෙන් බොහෝදුරට නිවැරදි බව පෙනේ. මෙහි ඉහත දක්වා ඇති ඌණතා ගැන සැම නිලධාරියෙක්ම සැලකිලිමත් වීම වැදගත්වේ.

5.4.8 බදුල්ල මහා නගර සභාව

බදුල්ල මහා නගර සභාව පොදු නිවේදනයක් මගින් 2015.12.04 දින අංක 1944 දරණ ගැසට් පත්‍රය මගින් බදු, බලපත්‍ර ගාස්තු හා ව්‍යාපාර බදු පැනවීමට ක්‍රියාකර තිබුණි. එහෙත් නිශ්චිත ලෙස කර්මාන්ත බද්දක් පනවා හෝ ගැසට් පත්‍රයේ පළකර නොතිබුණි. මේ සම්බන්ධව සභාවේ ආදායම් පරීක්ෂක විමසීමේදී අනාවරණය වූයේ කර්මාන්ත බද්ද හා වෙළඳ බලපත්‍ර සඳහා ගාස්තු හා බදු අයකරනු ලබන පදනම හා වාර්ෂික වටිනාකම පදනම් කර එම බදු නියම කිරීම සමාන හෙයින් කර්මාන්ත බද්ද වෙනම පනවනු නොලබන අතර සියළු ව්‍යාපාර එකට පොදුවේ ගැසට් කර අවස්ථානුකූලව බදු හා බලපත්‍ර ගාස්තු අයකරන බවයි. මෙය සම්පූර්ණයෙන්ම නීතියට පටහැනි සාවද්‍ය ක්‍රියා මාර්ගයක් බව සඳහන් කළ යුතුව ඇත.

5.4.9 හම්බන්තොට මහා නගර සභාව

2016 වර්ෂය සඳහා හම්බන්තොට මහා නගර සභාව කර්මාන්ත බද්ද පැනවීම පිණිස වූ සභා යෝජනාව 2015.10.14 දින පැවති සභා රැස්වීමේදී අනුමත කරන ලදුව නගරාධිපතිතුමාගේ නමින් 2015.12.04 දින ගැසට් පත්‍රයේ නිවේදනයක් මගින් ප්‍රකාශයට පත්කර ඇත. මෙම නිවේදනය සංක්ෂිප්ත වූවක් වන අතර ඒ සමග අදාල සභා යෝජනාවද පළකර තිබේ. අනතුරුව ඇති උපලේඛණයේ I කොටසේ කර්මාන්ත බදු වලට අදාල වන විෂයයන් 27 ක් දක්වා ඇත. මෙම කර්මාන්ත කල්පනාකාරීව මේ සඳහා තෝරාගෙන ඇති බව පෙනේ. මෙම ලේඛනයේ ඇති කර්මාන්ත ලේඛනය නිවැරදිව සකස් කර ඇත. මෙය සෙසු මහා නගර සභා සමඟ සංසන්දනාත්මකව බලන කල නිවැරදි බව අතින් ඉදිරියෙන් සිටින ආයතනයක් බව සඳහන් කළ හැකිය.

5.4.10 මඩකලපුව මහා නගර සභාව

මඩකලපුව මහා නගර සභාව 2016 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද ද ඇතුළුව බදු හා බලපත්‍ර ගාස්තු පැනවීම සම්බන්ධ නිවේදනයක් 2015.12.18 වැනි දින අංක 1946 දරණ ගැසට් පත්‍රය මගින් නාගරික කොමසාරිස් නමින් පළකර ඇත. මෙය ඉතා අවිධිමත් සියළු බදු හා බලපත්‍ර ගාස්තු එකට මිශ්‍රකර පොදුවේ පළකරන ලද නිවේදනයකි. මීට අදාල තීරණ සභාවේ අනුමත

කළ බව නිවේදනයේ සඳහන් වුවද එකල සභාවක් පැවතියේ ද යන්න හෝ සභා යෝජනාවේ දිනය හෝ සඳහන් කර නැත.

එසේම සභාවේ සභිකයන්ගේ නිලකාලය අවසන් වීම මත කොමසාරිස්වරයාට සභාවේ බලතල පැවරී තිබුණි නම් ඊට අදාල බලදායී වගන්තිය හෝ මෙම නිවේදනයේ දක්වා නැත. ඒ අනුව මෙම නිවේදනය සම්පූර්ණයෙන්ම නීතියට පටහැනි වූවක් බව පෙනේ. මෙහි දක්වා ඇති දීර්ඝ ලැයිස්තුවේ කවර කොටස් කවර ආදායම් වලට අදාල වන්නේද යන්න සඳහන් නොවේ. එය ඉතා ව්‍යාකූල හා සංකීර්ණ ලේඛනයකි. නගරයේ බදු ගෙවන්නන්ට හා ව්‍යාපාරිකයන්ට තමත් ගෙවිය යුතු බදු කුමන පදනමක් මත කුමන ආදායම් වර්ගයකට අයත්වන්නේ ද යන්න අවබෝධ කොට ගැනීම අසීරුය. ප්‍රධාන නිලධාරීන් හා කොමසාරිස්වරයා දක්වා ඇත්තේ දැඩි නොසැලකිලිමත් හා අවිධිමත් බවක් බව පෙන්වා දෙනු කැමැත්තෙමි.

5.4.11 අනුරාධපුර මහා නගර සභාව

2016 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු හා බදු පැනවීමට 2015.11.03 දින පැවති සභාවේ ගත් තීරණය පරිදි 2015.12.18 දිනැති අංක 1946 දරණ ගැසට් පත්‍රයේ නගරාධිපති නමින් පළකර ඇති ගැසට් නිවේදනයේ සඳහන් යෝජනාව මගින් ක්‍රියාකර ඇත. මෙම යෝජනාව ඉතා ව්‍යාකූල හා සංකීර්ණ වූවකි. එහි සඳහන් බලදායී වගන්ති දැක්වෙන අංක සියල්ල සාවද්‍ය ලෙස සඳහන් කර ඇත. කුමන අදායම් සඳහා කුමන උපලේඛන අයත් වන්නේ ද යන්න අවබෝධ කොටගත නොහැකිය. ඊට අදල සභා තීරණ ද ඇතුලත් කොට නැත.

ඒ අනුව කර්මාන්ත බද්දක් පනවා ඇති බවක් අවබෝධ කරගත නොහැකිය. මෙහිදී අනුරාධපුර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් ඇතුළු නිලධාරී මණ්ඩලය දක්වා ඇත්තේ අතිශයින් බරපතල නොසැලකිලිමත් භාවයකි. මෙබඳු නිවේදන පළකර කිසිදු ආදායමක් අයකළ නොහැකි බව සඳහන් කරනු කැමැත්තෙමි.

5.4.12 යාපනය මහා නගර සභාව

2016.01.01 දිනැති අංක 1948 දරණ ගැසට් නිවේදනය මගින් නාගරික කොමසාරිස්වරයා නමින් බලපත්‍ර ගාස්තු, කර්මාන්ත බදු හා ව්‍යාපාර බදු පැනවීමට තීරණය කර ඇත. මෙම ආදායම් සියල්ල පොදුවේ එක් නිවේදනයකින් පනවා ඇත.

මෙහි කර්මාන්ත බදු පනවා ඇති උපලේඛනයේ දෙවන II කොටසෙහි කර්මාන්ත බද්ද පනවන ලද ව්‍යාපාර 104 ක් දක්වා ඇත. එහි විෂයයන් 8 ක් යටතේ ගබඩා කිරීම් දක්වා ඇත. මීට ඉහත දී ද පෙන්වා දී ඇති පරිදි ගබඩා කිරීම් කර්මාන්ත ලෙස දැක්විය නොහැකිය. ඒ හැර සෙසු කර්මාන්ත මෙම බද්දට අදාල ඒවා බව පෙනේ. කෙසේ වෙතත් සභාවේ බලතල කොමසාරිස්වරයා විසින් ක්‍රියාත්මක කරනු ලබන නිසා ඊට අදාල බලදායී වගන්තිය බදු පැනවීම් නිවේදනයෙහි සඳහන් කිරීම අත්‍යාවශ්‍යවේ. එහෙත් මෙහි එය දක්වා නොමැත. එබැවින් මෙය විධිමත් හා නීත්‍යානුකූල නිවේදනයන් ලෙස සැලකිය නොහැකි බව පෙනේ. එසේම මෙබඳු නිවේදනයක් පැනවීම මගින් කර්මාන්ත බදු අය කිරීම නීත්‍යානුකූල නොවේ. මේ පිළිබඳව නාගරික කොමසාරිස්වරයා ඇතුළු නිලධාරීන් දක්වා ඇති නොසැලකිලිමත්භාවය අතිශයින් කණගාටුදායක බව පෙනේ. එබැවින් මෙබඳු නිවේදනයකින් කර්මාන්ත බදු අයකළ නොහැකි වීම හේතුකොට ගෙන අගතියට පත් ව්‍යාපාරිකයින් අධිකරණය ඉදිරියේ අදාල පැනවීම් අභියෝගයට ලක් කළහොත් නාගරික කොමසාරිස් වරයාට අනපේක්ෂිත ප්‍රතිවිපාක වලට මුහුණදීමට සිදුවිය හැකිය.

5.5 පළාත් පාලන ආයතන විසින් අයකළ හැකි සෙසු බදු

මෙම අධ්‍යයන වාර්තාවේ විෂය පථයට අදාල වන ප්‍රධාන ආදායම් මාර්ග පිළිබඳව මේ වන විට ප්‍රමාණවත් පරිදි, පර්යේෂණයේදී අනාවරණය වූ කරුණු ඉහත පරිච්ඡේදයේ දක්වා ඇත. ඒ යටතේ වරිපනම්, බලපත්‍ර ගාස්තු, ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු පිළිබඳව සාකච්ඡා කරන ලදි. එසේ වුවත් යථෝක්ත ප්‍රධාන ආදායම් මූලයන්ට අමතරව තවත් ආදායම් මාර්ග ගණනාවක් පළාත් පාලන ආයතන වලට පැවරී තිබේ.

ඒ අනුව එම ආයතන විසින් අයකළ හැකි බදු, කුලී හා ගාස්තු මූලයන් ගණනාවක් තිබේ. මෙහිදී සලකා බැලීමට අදහස් කරනුයේ ඒ අතුරින් බදු වශයෙන් සැලකෙන පළාත් පාලන ආයතන විසින් වාර්ෂිකව පැනවිය යුතු බදු සහ රජය විසින් (විවිධ විෂයභාර අමාත්‍යවරුන්) දැනටමත් පනවා ඇති එහෙත් පළාත් පාලන ආයතන විසින් වාර්ෂිකව අවස්ථානුකූලව අයකර ගත යුතු බදු ගාස්තු කිහිපයක් පිළිබඳව පළාත් පාලන ආයතන පද්ධතිය තුළ දැනට පවතින

තත්වයයි. ඒ අතුරින් ප්‍රධාන ස්ථානයෙහි ලා ගැනෙන ආදායම් මූලයන් කිහිපයක් ඇත. ඒවා නම්,

1. විනෝද බදු
2. වාහන හා සත්ව බදු
3. සංවර්ධනය නොකළ ඉඩම් මත බදු
4. ඇතැම් ඉඩම් විකිණීම් විෂයෙහි බදු ආදිය වේ.

මේ එක් එක් බදු විශේෂය පිළිබඳව සංක්ෂිප්තව සලකා බලමු.

5.5.1 විනෝද බදු

1946 අංක 12 දරන විනෝද බදු ආඥා පනතේ (267 වන අධිකාරය) 2 වන වගන්තියේ ප්‍රතිපාදන අනුව දිවයිනේ සියළුම පළාත් පාලන ආයතන වලට විනෝද බදු පැනවීමට බලය ලබාදී ඇත. කෙසේ වෙතත් එය වලංගු වන්නේ ආඥා පනතේ 2 වන වගන්තියේ (2) වන උප වගන්තිය ප්‍රකාර පළාත් පාලන අමාත්‍යවරයා විසින් සිය අනුමැතිය ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසුව පමණි. මේ අනුව කිසියම් පුද්ගලයෙකු වෙත නිකුත් කරනු ලබන ප්‍රවේශ පත්‍රයේ මුහුණත වටිනාකමින් 5% සිට 25% දක්වා බද්දක් අයකළ හැකිය. එතෙකුදු වුවත් 1987 න් පසුව පළාත් පාලන ආයතන මෙම බද්ද නිසි පරිදි පනවා නැති බව නිරීක්ෂණය විය. එහෙත් නිතර පළවන ගැසට් නිවේදන වල සඳහන් වන්නේ සභා තීරණයක් පමණක් වන අතර මෙම බද්ද පැනවීමේ පරිපාටිය හරි හැටි අනුගමනය නොකිරීම නිසා එම පැනවීම් වල කිසිදු නෛතික වලංගුතාවයක් නොමැති වීම, තවදුරටත් නිරීක්ෂණය විය. මීට හේතු වී ඇත්තේ පළාත් පාලන ආයතන වල නිලධාරීන් විනෝද බදු ආඥා පනතේ විධිවිධාන ගැන නොදැන සිටීම බව අපගේ කරුණු විමසීම් වලදී අනාවරණය විය. මෙම අධ්‍යයනයේදී පරීක්ෂාවට ලක්කල පළාත් පාලන ආයතන 48 ක් අතුරින් ආයතන 12 ක විනෝද බද්ද පනවා තිබූ අතර ඒ සියළු ආයතන නීතියට පටහැනි ලෙස අමාත්‍යවරයාගේ අනුමැතිය රහිතව මෙම බදු පැනවීමේ නිවේදනය ගැසට් පත්‍රයේ පළකර තිබුණි.

මෙම බද්දට සමගාමීව යටකී බොහෝ ආයතන ප්‍රසිද්ධ රඟදැක්වීමේ බලපත්‍ර ගාස්තු ද සභාව විසින් පනවා නිවේදන පළකර තිබුණි. එහෙත් 1912 අංක 07 දරණ ප්‍රසිද්ධ රඟදැක්වීම් ආඥා පනතේ (176 වන අධිකාරය) විධිවිධාන අනුව මෙම ගාස්තු ද ඇමතිවරයා විසින් පැනවිය

යුතුය. මීට අදාලව නීතියට පටහැනි නිවේදන පළකර තිබූ ආයතනයන්හි නිලධාරීන් එබඳු විශේෂිත නීතියක් පිළිබඳව අවබෝධයකින් තොරව හුදෙක් සභා තීරණ මගින් මෙම බලපත්‍ර ගාස්තු පනවා ගැසට් මගින් නිවේදනය කර අයකරමින් සිටී. මවිතයට කරුණ වන්නේ රටේ සෑම ප්‍රදේශයකම ජනතාව විශේෂයෙන් කලාකරුවන්, සමාජ සේවා සංවිධාන හා රාජ්‍ය ආයතන පවා මෙම ගාස්තු හා බදු ගෙවා සිය කාර්යයන් පවත්වාගෙන යෑමය. මෙම කරුණට අදාලව කරනු ලැබූ කරුණු විමසීම් වලදී පළාත් පාලන දෙපාර්තමේන්තුවල හා පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලවල වගකිවයුතු නිලධාරීන් පවා මෙහි නිවැරදි පැනවීම් පරිපාටිය පිළිබඳව දැනුවත්ව සිටින බවක් අනාවරණය නොවුණි.

5.5.2 වාහන හා සත්ව බදු

මෙය සෑම පළාත් පාලන ආයතනයකටම වාර්ෂිකව පැනවිය හැකි බද්දකි. මහා නගර සභා ආඥා පනත 245, නගර සභා ආඥා පනත 163, ප්‍රාදේශීය සභා පනතේ 148 වගන්ති වලින් මීට බලය ලබා දී ඇත. මෙම බද්දෙහි උපරිම සීමා පනතේ උපලේඛන මගින් නිශ්චිතවම දක්වා ඇත. එම මූල්‍ය සීමා වර්තමානයට සරිලන සේ සංශෝධනය වී නැත. එය ආඥා පනතට සංශෝධන ගෙන ඒමෙන් හෝ පළාත් සභා ප්‍රඥප්තියක් මගින් ඉතා පහසුවෙන් යාවත්කාලීන කළ හැකි වුවත් කිසිම ආයතනයක් ඒ ගැන අවධානය යොමුකර නොතිබීම අවාසනාවකි. මේ නිසා ඇතැම් ආයතන මෙම බද්ද නොපනවන අතර ඇතැම් ආයතන නීතියේ සීමා ඉක්මවා වැඩිපුර මුදල් අයකරනු දැකිය හැකිය.

මෙම අධ්‍යයනයේදී පරීක්ෂාවට ලක්කල පළාත් පාලන ආයතන 48 අතුරින් ආයතන 26 ක් මෙම බද්ද පනවා තිබූ අතර එයින් පළාත් පාලන ආයතන 14 ක් නීතියට පටහැනි අයුරින් එය පනවා තිබූ බව නිරීක්ෂණය විය. මෙම බද්ද පැනවුවද එහි ඵලදායීතාවය ඉතා අඩු ප්‍රතිශතයක් ගනී. විශාල හිඟ මුදල් ප්‍රමාණ ආදායම් ලේඛන වල පවතින බව ද නිරීක්ෂණය විය.

5.5.3 සංවර්ධනය නොකළ ඉඩම් මත බදු

පළාත් පාලන ආයතන පාලනය වන ප්‍රධාන ව්‍යවස්ථාවන්ට අනුව (මහා නගර සභා ආඥා පනත, නගර සභා ආඥා පනත, ප්‍රාදේශීය සභා පනත) එම ආයතන බල ප්‍රදේශය තුළ ඇති සංවර්ධනය නොකරන ලද ඉඩම් සඳහා බදු පැනවීමට බලය ලබා ඇත්තේය.

මහා නගර සභා ආඥා පනත 247 ඈ, නගර සභා ආඥා පනත 165 ඈ සහ ප්‍රාදේශීය සභා පනත 153 වගන්ති බලන්න. මෙම බද්ද වාර්ෂිකව පැනවිය යුතු අතර සිය බල ප්‍රදේශය තුළ පිහිටි සංවර්ධනය නොකරන ලද සෑම ඉඩමක් සඳහාම යෝජනාවක් සම්මත කොට මෙම වාර්ෂික බද්ද පැනවිය යුතුය. මෙම බද්දෙහි උපරිම සීමාව එම ඉඩමෙහි බිම් වටිනාකමින් (වෙළඳපළ) 2% කි. මෙමගින් ප්‍රදේශය තුළින්ම විශාල මුදලක් බදු වශයෙන් උපයාගත හැකි බලය ලැබී තිබුණත් පළාත් පාලන ආයතන බහුතරය නිසි පරිදි ක්‍රියාත්මක නොවීම පුදුම සහගතය. මෙය පළාත් පාලන ආයතනයක් විසින් පැනවිය යුතු බවට නීතියේ දක්වා ඇත්තේ වී නමුදු එය පැනවීමට බොහෝ පළාත් පාලන ආයතන ක්‍රියාකර නැත. එහි ඇති මවිතයට කරුණ වන්නේ එම බද්ද නොපැනවීම තුළ සභාවට සිදුවී ඇති අලාභය ගණනය කර යටත් පිරිසෙයින් ඊට හේතු විමසීමටවත් විගණකාධිපති දෙපාර්තමේන්තුව හෝ පළාත් සභාව කිසිම අවස්ථාවක ක්‍රියාකර නොතිබීමයි.

මෙම අධ්‍යයනය සඳහා උපයෝගී කොටගත් ආයතන 48 ක් අතරින් මෙම බද්ද පනවා තිබුණේ ආයතන 09 ක් පමණි. කොළඹ මහා නගර සභාව පවා මෙම බද්ද පනවා නොතිබුණ අතර එසේ පැනවූයේ නම් එහි දළ ආදායම රුපියල් මිලියන ගණනාවක් විය හැකිව තිබුණි. දෙහිවල ගල්කිස්ස සහ කඩුවෙල මහා නගර සභා 2012 වසරේදී මෙමගින් පිළිවෙලින් රුපියල් මිලියන 60 සහ 75 බැගින් උපායාගෙන තිබූ බව වාර්තා වී ඇත. පළාත් පාලන ආයතන බහුතරයක පොදු මැසිවිල්ල වනුයේ සිය සේවා සම්පාදනය සඳහා ප්‍රමාණවත් මුදලක් නොමැති වීම බවයි. එහෙත් මෙබඳු බදු පැනවීමට කටයුතු නොකිරීම තුළ වාර්ෂිකව අහිමිවන ආදායම කොතෙක් දැයි සොයා බැලීමට එම ආයතන හෝ අධීක්ෂණ බලධාරීන් උත්සුක නොවීම තුළින් පළාත් පාලන ආයතන බල ප්‍රදේශයන්හි වටිනා ඉඩම් නිශ්ක්‍රීයව තිබී වසංගත රෝග බෝ වීමට පවා පාදක වීමට හේතුකාරක වී ඇත.

5.5.4 ඇතැම් ඉඩම් විකිණීම් විෂයෙහි බදු

මෙය පළාත් පාලන ආයතනයක සභාව විසින් වාර්ෂිකව පැනවිය යුතු බද්දක් නොවේ. මක් නිසාද යත්; එය මහා නගර සභා ආඥා පනතේ 247 ඉ, නගර සභා ආඥා පනත 165 ඈ, ප්‍රාදේශීය සභා පනත 154 වගන්ති ප්‍රකාර අමාත්‍යවරයා විසින් පනවා ඇති බද්දක් වීමයි. මෙය පැනවීමට සභාවට බලය පවරා නැති අතර ලේකම් / නාගරික කොමසාරිස්වරයා විසින් කළ යුත්තේ එබඳු ඉඩම් විකිණීම හෝ වෙන්දේසි කිරීම් සිදුකළ විට එම බද්ද එනම් ඉඩම විකුණා ලත් මුදලින් 1% ක් සභාවට ගෙවන ලෙස අදාල විකුණුම්කරුට, බ්‍රෝකර් වරයාට, හෝ වෙන්දේසිකරුට ඔහුගේ අනුයෝජිතයාට හෝ සේවකයාට දැනුම් දීමයි. එසේ ඉල්ලා සිටි දින සිට දින 14 ක් තුළ ඒ බද්ද නොගෙවුවහොත් ඒ පැහැර හැරීම සභාව පිහිටි ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා වෙත වාර්තා කළ යුතුය. එවිට අධිකරණය එම බදු මුදල දඩයක් ලෙස අයකර සභාවට බැර කරනු ලැබේ.

මෙම නීතිමය තත්වය වටහාගෙන නොමැති බොහෝ පළාත් පාලන ආයතන නීතියේ බලය ඉක්මවා කටයුතු කරමින් සභාව මගින් මෙම බද්ද නැවත නැවත පනවා ගැසට් පත්‍රයේ පළකරනු ලැබේ. එහෙත් මෙම තත්වය කිසිම විගණක වරයෙකු හෝ පළාත් පාලන බලධාරියෙකු විසින් විමසුමට ලක්කර ඇති බවක් ද නිරීක්ෂණය නොවීය.

5.6 නගර සභා

මෙම අධ්‍යයනය සඳහා වූ නියැදිගත නගර සභාවන්හි බදු හා ආදායම් පැනවීම හා අයකිරීම පිළිබඳව පවතින තත්වය ද විමර්ශනයට භාජනය කරන ලදි. ඒ අනුව අධ්‍යයනයට භාජනය වූ නගර සභා 15 සටහන් අංක 16 හි පහත සඳහන් පරිදි දක්වා ඇත.

සටහන් අංක 16: අධ්‍යයනයට භාජනය කරන ලද නගර සභා

01	සීතාවකපුර නගර සභාව	06	පුත්තලම නගර සභාව	11	හපුතලේ නගර සභාව
02	පැලියගොඩ නගර සභාව	07	ගම්පොල නගර සභාව	12	ත්‍රිකුණාමලය නගර සභාව
03	ජා ඇල නගර සභාව	08	තලවකැලේ - ලිඳුල නගර සභාව	13	කාතන්කුඩි නගර සභාව
04	හොරණ නගර සභාව	09	ඇඹිලිපිටිය නගර සභාව	14	පේදුරුතුඩුව නගර සභාව
05	කුලියාපිටිය නගර සභාව	10	හික්කඩුව නගර සභාව	15	වව්නියාව නගර සභාව

නියැදිගත නගර සභා සමූහය ආශ්‍රයෙන් සිදුකළ විමර්ශනයේදී ද අනාවරණය වූ ප්‍රමුඛ කරුණ වූයේ මහා නගර සභාවන්හි මෙන්ම නගර සභාවන්හි ද වරිපනම්, බලපත්‍ර ගාස්තු හා බදු පැනවීම ඉතා අසතුටුදායක තත්වයක පවතින බවයි. ඒ පිළිබඳ විස්තරාත්මක පැතිකඩ සටහන් අංක 06 හි දැක්වේ.

ඒ අනුව නියැදිගත නගර සභා 15 අතුරින් සියල්ලම පිළිවෙලින් වරිපනම්, බලපත්‍ර ගාස්තු, ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු පනවා තිබුණි. ඒ අතුරින් වරිපනම් නිවැරදිව පනවා තිබූ එකදු නගර සභාවක්වත් නොතිබුණි. බලපත්‍ර ගාස්තු නිවැරදිව පනවා තිබූ එකදු නගර සභාවක් වත් නොතිබුණි. ව්‍යාපාර බදු පැනවීම තලවකැලේ - ලිඳුල, කාන්තන්කුඩි හා වව්නියාව යන නගර සභා නිවැරදිව සිදුකර තිබුණි. එය මුළු නියැදියෙන් 33% ක අගයකි. කර්මාන්ත බද්ද නිවැරදිව පනවා තිබූයේ හොරණ, තලවකැලේ - ලිඳුල, හා කාතන්කුඩි යන නගර සභා පමණි. එය මුළු නියැදියෙන් 20% ක අගයකි. විනෝද බද්ද පනවා තිබූයේ ආයතන හතරක් පමණි. ඒ සියල්ලම සාවද්‍ය වේ. වාහන හා සත්ව බද්ද පනවා තිබූයේ ආයතන පහක් පමණි. ඒ අතුරින් සීතාවකපුර, කුලියාපිටිය, ඇඹිලිපිටිය හා හික්කඩුව යන නගර හතර නිවැරදිව පැනවීම් කර තිබුණි.

ආදායම් පැනවීම පිළිබඳ නගර සභාවන්හි මෙම කාර්ය සාධනය ඉතාමත් අසතුටුදායක වූවකි. එයට හේතුව සාවද්‍ය පැනවීම් සිදුකර බදු හා ගාස්තු අයකිරීම රටේ උත්තරීතර නීතියේ විධිවිධාන පවා උල්ලංඝණය කිරීමක් හා පවතින නීතියේ ප්‍රතිපාදන ඉක්මවා ක්‍රියාකිරීමක් මේ තුලින් සිදුවී ඇති හෙයිනි. මේ පිළිබඳව ඒ ඒ නගර සභාවන් සම්බන්ධයෙන් පවතින තත්වය මිළඟට සංක්ෂිප්තව විමසා බලමු.

5.6.1 වරිපනම් පැනවීම

5.6.1.1 සීතාවකපුර නගර සභාව

2016 වර්ෂය සඳහා සීතාවකපුර නගර සභාවේ ලේකම් විසින් 2015 නොවැම්බර් මස 11 දින තීරණ අංක 2211 යටතේ තීරණය කර එය 2015 නොවැම්බර් මස 27 වැනි දින අංක 1943

දරණ ගැසට් පත්‍රයේ පළකර ඇත. එතෙකුදුවුවත් වරිපනම් පැනවීමේදී 2015 වර්ෂයේ තක්සේරුව 2016 වර්ෂයේ තක්සේරුව ලෙස පිළිගැනීමට බලය පැවරී ඇත්තේ නගර සභා ආඥා පනතේ 166 වගන්තිය සමග කියවිය යුතු මහා නගර සභා ආඥා පනතේ 238 (1) උප වගන්තියෙනි. එහෙත් මහා නගර සභා ආඥා පනතේ බලදායී වගන්තිය සඳහන් නොකිරීම හේතුවෙන් පැනවීම ශූන්‍ය හා බලරහිත වේ. මෙම තීරණය සාවද්‍ය වීම හේතුවෙන් 2016 වර්ෂය සඳහා කිසිදු දේපළකට වාර්ෂික වටිනාකමක් නොමැත. මෙම ඡේදයේ බලදායී වගන්තිය ලෙස දක්වා ඇත්තේ නගර සභා ආඥා පනතේ 160 වගන්තියයි. මෙය සාවද්‍ය යෙදුමකි. එය 166 වන වගන්තිය ලෙස සඳහන් විය යුතුය.

එසේම යෝජනාවේ දෙවන ඡේදයෙහි අදාල වරිපනම් ප්‍රමාණය ඒ ඒ කාර්තුවේ අවසාන දිනට ප්‍රථම ගෙවා අවසන් නොකරන සෑම බද්දක් වෙනුවෙන්ම අධිගාස්තු අයකරනු ලබන බව දක්වා ඇත. එහෙත් මෙය යථාර්තයක් වන්නේ අදාල හිඟ අයකරගැනීම සඳහා ලේකම්වරයා විසින් වරෙන්තුවක් නිකුත් කර එය ක්‍රියාත්මක කිරීමෙන් පසුවය. අදාල කාර්තු අවසානයට පෙර නොගෙවීමෙන් සිදුවිය හැක්කේ නියමිත වට්ටම් ප්‍රමාණය නොලැබී යාම පමණි. එම තත්වය නිවේදනයේදී පැහැදිලි විය යුතුය. මේ අනුව මෙම පැනවීම නීත්‍යානුකූල නොවේ.

5.6.1.2 පෑලියගොඩ නගර සභාව

2016 වර්ෂය සඳහා පෑලියගොඩ නගර සභාවේ ලේකම්වරිය, සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ නිලධාරී ලෙස "වරිපනම් බදු" නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට තීරණය කරන බව 2015.12.11 දිනැති අංක 1945 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කර ඇත. මෙම නිවේදනය පහත සඳහන් හේතු මත මුළුමනින්ම සාවද්‍ය හා නීතියට පටහැනි වූවකි. තවද මෙම නිවේදනය පළකළ තැනැත්තෙකුගේ නමක් තනතුරක් හෝ කිසිදු විස්තරයක් මෙම නිවේදනයේ නොමැත.

i. නිවේදනයේ " නගර සභා ආඥා පනත" වෙනුවට නගර සභා පනත යනුවෙන් සඳහන් කර ඇත. එබඳු පනතක් නොමැත.

ii. ලේකම්වරියට බලය පැවරෙන නගර සභා ආඥා පනතේ 184 අ වන වගන්තිය වෙනුවට තීරණයේ සඳහන් කර ඇත්තේ 189 (අ) වන වගන්තියකි. 189 (අ) වන වගන්තියක් නගර සභා ආඥා පනතේ නැත.

iii. මෙම තීරණය ගෙන ඇත්තේ කවදාද, තීරණ අංකය කුමක්ද යන්න එහි සඳහන් කර නැත.

iv. ගැසට් නිවේදනයේ දෙවන ඡේදයේ සඳහන් කර ඇත්තේ 1939 අංක 61 දරන " නගර සභා ආඥා පනතේ " 166 වගන්තිය යටතේ පෑලියගොඩ නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර..... යනුවෙනි. එය අතිශය සාවද්‍ය ප්‍රකාශයකි. 1939 අංක 61 දරන ප්‍රාදේශීය සභා ආඥා පනතක් නැති අතර කිසි කලෙක ප්‍රාදේශීය සභා පනතකින් නගර සභාවක වරිපනම් පැනවීමට බලයක් පවරා නැත.

v. දෙවන ඡේදයේම 2015 වර්ෂය සඳහා වූ තක්සේරුව " වර්ෂය" සඳහා වූ තක්සේරුව ලෙස සම්මත කළයුතු බවටත්, එකී තක්සේරුව මත 1939 අංක 61 දරණ " නගර සභා පනතේ" 184 (අ) වගන්තිය සමඟ කියවිය යුතු 160 (1) වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර..... වරිපනම් ප්‍රතිශත නියම කළයුතු බව දක්වා තිබේ. මෙබඳු පනතක් හෝ 184 (අ) යනුවෙන් වගන්තියක් නගර සභා සඳහා වරිපනම් පැනවීමට අදාල නොවේ.

මෙම ඡේදය නීත්‍යානුකූල නොවේ. නගර සභා ආඥා පනතේ 166 වන වගන්තිය සමඟ කියවිය යුතු මහා නගර සභා ආඥා පනතේ 238 වගන්තියේ (1) වන උප වගන්තිය අනුව පවත්නා වර්ෂයේ වාර්ෂික වටිනාකම් අනුගාමී වර්ෂයේ වාර්ෂික වටිනාකම් ලෙස පිළිගැනීමට නගර සභාවලට බලය පවරා තිබේ. එසේ වුවද මෙම නිවේදනයේ මහා නගර සභා ආඥා පනතේ 238 (1) උප වගන්තිය සම්බන්ධයෙන් කිසිදු සඳහනක් කර නොමැති බැවින් 2015 වර්ෂයේ වාර්ෂික වටිනාකම් 2016 වර්ෂයේ වාර්ෂික වටිනාකම් ලෙස පිළිගැනීම බලරහිත හා ශූන්‍ය වේ. මේ අනුව 2016 වර්ෂය සඳහා පෑලියගොඩ නගර සභාවේ ලේකම්වරිය විසින් කරනු ලැබ ඇති වරිපනම් පැනවීම, එම ගැසට් නිවේදන හා එහි අන්තර්ගතය මුළුමනින්ම සාවද්‍ය හා බලරහිත මෙන්ම නීතියට පටහැනි වූවක් වේ. මෙබඳු නිවේදනයකින් සභාවට කිසිදු වරිපනමක් අයකිරීම

නීත්‍යානුකූල නොවේ. මෙය අතිශයින් බරපතල තත්වයක් බැවින් මෙබඳු නොසැලකිලිමත් ව්‍යවස්ථාපිත නිවේදන ගැසට් පත්‍රවල පළකිරීම පිළිබඳව වැඩිදුර විමර්ශන කිරීම වැදගත් වේ.

5.6.1.3 ජා ඇල නගර සභාව

2016 වර්ෂය සඳහා ජා ඇල නගර සභාව විසින් වරිපනම් බදු පැනවීම සිදුකර ඇත්තේ එම සභාවේ ලේකම්වරිය විසින් 2015.11.27 දිනැති අංක 1943 දරණ ගැසට් පත්‍රයේ පළකර ඇති නිවේදනයකිනි. ඊට පාදක වූ යෝජනාව හෝ තීරණය ගත් දිනයක් හෝ අංකයක් එහි සඳහන් නොවේ. නිවේදනයේ පළමු ඡේදයේ ගැලපීම දෝෂ සහගතවේ. මෙම නිවේදනය හා අදාල පැනවීම පහත සඳහන් හේතු නිසා මුළුමනින්ම සාවද්‍ය හා නීතියට පටහැනි වූවක් වේ.

i. ගැසට් නිවේදනයේ පළමු ඡේදයෙහි 1939 අංක 61 දරණ නගර සභා පනතක් ගැන කියවේ. එබඳු පනතක් නොමැත.

ii. නගර සභා පනතේ 184 (අ) වගන්තිය යනුවෙන් සඳහන් වේ. එබඳු පනතක් හෝ වගන්තියක් නගර සභා ආඥා පනතේ දක්නට නොමැත.

iii. දෙවන ඡේදයෙහි සඳහන් පරිදි වරිපනම් පැනවීමේදී 2015 වර්ෂයේ බල පැවැත්වූ තක්සේරුව 2016 වර්ෂයේ තක්සේරුව ලෙස පිළිගැනීමට බලය පැවරී ඇත්තේ නගර සභා ආඥා පනතේ 166 වන වගන්තිය සමග කියවිය යුතු මහා නගර සභා ආඥා පනතේ 238 (1) වන උප වගන්තියෙනි. එසේ වුවද මහා නගර සභා ආඥා පනතේ බලදායී වගන්තිය සඳහන් නොකිරීම හේතුවෙන් මෙම පැනවීම ශුන්‍ය හා බලරහිත වේ. මෙම තීරණය සාවද්‍යවීම හේතුවෙන් 2016 වර්ෂයේ නගරයේ කිසිදු දේපලකට වාර්ෂික වටිනාකමක් නොමැත. වාර්ෂික වටිනාකමක් නොමැති දේපලක වටිනාකම ශුන්‍ය වේ. ඒ මත කිසිදු බද්දක් පැනවිය නොහැකිය. එම වර්ෂය සඳහා සභාවට නීත්‍යානුකූලව කිසිදු වරිපනමක් අයකළ නොහැකිය.

iv. වරිපනම් නිවේදනය පනවා ඇත්තේ **ජා ඇල මහා නගර සභාව** නම්වූ ආයතනයක් විසින් බව නිවේදනයේ පහතින් සඳහන් වේ. එබඳු ආයතනයක් දිවයිනේ පළාත් පාලන ආයතන අතර නැත.

මෙය ඉතා බරපතල තත්වයකි. පළාත් පාලන බලධාරීන්ගේ ක්ෂණික අවධානය මේ කෙරෙහි යොමුවිය යුතුය.

5.6.1.4 හොරණ නගර සභාව

2016 වර්ෂය සඳහා හොරණ නගර සභාව වරිපනම් පනවා ඇත්තේ සභාවේ ලේකම්වරයා විසින් 2015.11.13 දිනැති අංක 1941 දරණ ගැසට් පත්‍රයේ පළකර ඇති නිවේදනයක් මගිනි. මෙම නිවේදනයට පාදක කොටගත් තීරණ හෝ යෝජනා කිසිවක් ගැන සඳහන් නොවේ. පහත සඳහන් හේතු මත මෙම වරිපනම් පැනවීම, නීත්‍යානුකූල හා නිවැරදි වූවක් නොවේ.

I. ගැසට් නිවේදනය ප්‍රකාර වරිපනම් පැනවීමට අදාලව 2013 වර්ෂයේ වාර්ෂික වටිනාකම්, 2016 වර්ෂයේ වාර්ෂික වටිනාකම් ලෙස පිළිගෙන තිබේ. නගර සභා ආඥා පනතේ 166 වන වගන්තිය අනුව " යම් වරිපනම් බද්දක කාර්යය සඳහා යම් නිශ්චිත දේපලක් තක්සේරු කිරීම, මහා නගර සභා සීමා ඇතුලත වූ නිශ්චල දේපල සම්බන්ධයෙන් වූ මහා නගර සභා ආඥා පනතේ 235 වන වගන්තියේ සඳහන් කර ඇති ආකාරයෙන් මඳ වෙනස් කිරීම් සහිතව කළයුතු අතර 233 වන, 242 වන, 243 වන වගන්තිවල හා 236 වන වගන්තියේ සිට 241 වන වගන්තිය දක්වා වගන්ති වල සියළු විධිවිධාන සමඟ මේ ආඥා පනතේ කාර්යයන් සඳහා කරනු ලබන එබඳු සෑම තක්සේරු කිරීමක් සම්බන්ධයෙන්ම, අවශ්‍ය මඳ වෙනස් කිරීම් සහිතව අදාල විය යුතුය, මහා නගර සභා ආඥා පනතේ 238(1) උප වගන්තියේ විධිවිධාන අනුව විශේෂ අවස්ථා වලදී අවශ්‍යයයි සලකනු ලැබිය හැකි යම් වෙනස් කිරීම් සමඟ ඉහතින් වූ වර්ෂය සඳහා ඇගයුම හෝ තක්සේරුව වශයෙන් සභාව විසින් සම්මත කළ යුතුය."

   එතෙකුදු වුවත් ලේකම් වරයා යථෝක්ත වගන්තිවල විධිවිධාන නොසලකා 2013 වර්ෂයේ වාර්ෂික වටිනාකම් 2016 වර්ෂය සඳහා වූ වාර්ෂික වටිනාකම් ලෙස සඳහන් කර තිබේ. මෙසේ ව්‍යවස්ථාපිත විධිවිධාන නොසලකා හැර ඇති උක්ත තීරණය නීතියට පටහැනි තීරණයක් බව සඳහන් කළ හැකිය.

5.6.1.5 කුලියාපිටිය නගර සභාව

2016 වර්ෂය සඳහා කුලියාපිටිය නගර සභාව වරිපනම් පැනවීම සිදුකර ඇත්තේ 2015.11.26 දින සභාවේ කර්තව්‍ය ඉටුකරන නිලධාරිනිය ලෙස ලේකම්වරිය විසින් ගනු ලැබ ඇති තීරණයන්

2015.11.27 දින දැන්වීමක් මගින් 2016.01.01 දින අංක 1948 දරන ගැසට් පත්‍රයේ පළකිරීම මගිනි.

මෙම නිවේදනය පරීක්ෂා කිරීමේදී පෙනීයන්නේ මෙය පැහැදිලිව අර්ථය ප්‍රකාශ වන පරිදි සකස් කර නැති බවයි. අවසානයේදී සිදුවී ඇත්තේ යථෝක්ත තීරණය මගින් බද්දක් පනවා අයකිරීමට තීරණයක් ගෙන නොතිබීමයි.

i. මෙහි පළමු ඡේදයේ **"255 වන අධිකාරය වන වගන්තිය සමඟ කියවිය යුතු"** කුමන වගන්තියක් ද යන්න සඳහන් නොවේ.

ii. එහිම **"252 වන අධිකාරය වන මහා නගර සභා ආඥා පනතේ, 238 වන මහනගර සභා 238 වන වගන්තිය.....ii යනුවෙන් සඳහන්ය..** මේ කුමක්ද 238 ලෙස මහා නගර සභා ආඥා පනතක් නැත.

iii. එහිම **"238 වගන්තියේ (1) වන උප වගන්තියෙන් නගර සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර "** යනුවෙන් සඳහන් වේ. මහා නගර සභා ආඥා පනතේ 238 (1) උප වගන්තියෙන් නගර සභා වලට බලතල පැවරීමක් කර නැත. එයින් සිදුකර ඇත්තේ ප්‍රවර්තන වර්ෂයේ තක්සේරුව අනුගාමී වර්ෂය සඳහා වූ තක්සේරුව ලෙස අනුමත කිරීමට මහා නගර සභාවට බලය ලබාදීමයි.

iv. ලේකම්වරියගේ තීරණයේ **"2015 වර්ෂයේ වාර්ෂික තක්සේරුව 2016 වර්ෂය සඳහා සම්මත කළ යුතු බවටත්"** යනුවෙන් සඳහන් කළ ද ලේකම්වරිය එය අනුමත කරන බව තීරණයේ දක්වා නැත.

v. එසේම එහි **"255 වන අධිකාරීය වන නගර සභා ආඥා පනතේ 184 (අ) වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 166 වන වගන්තිය"** යනුවෙන් සඳහන් වේ. " 255 වන අධිකාරී" නොව " අධිකාරය" විය යුතුය. එසේම නගර සභා ආඥා පනතේ 184 (අ) යනුවෙන් වගන්තියක් නැත. එය 184 අ ලෙස සටහන් විය යුතුය. තවද " එම පතේ" යන්න එම ආඥා පනතේ වශයෙන් සඳහන් කළයුතුය.

vi. මෙහිදී තවදුරටත් සැලකිය යුතු කරුණ වන්නේ මෙම තීරණයේ දැක්වෙන පරිදි මහා නගර සභා ආඥා පනතේ 238 වන වගන්තියෙන් නගර සභාවකට වරිපනමක් පැනවීමට බලය නොලැබෙන අතර නගර සභා ආඥා පනතේ 160

වන වගන්තියේ විධිවිධාන අනුව වරිපනම් පැනවීමට හා කාර්තු වශයෙන් ගෙවීමට නියම කළ හැකිවේ. එහෙත් මෙම පැනවීම් වල කිසිදු තැනක නගර සභා ආඥා පනතේ 160 වන වගන්තිය ගැන සඳහනක් නැත.

ඒ අනුව මෙයින් 2016 වර්ෂය සඳහා කුලියාපිටිය නගර සභාවේ වරිපනම් පැනවීමක් සිදුවී නැති බව පැහැදිලිවේ. මෙය නීතිය අභිබවා යමින් ක්‍රියා කරනු ලැබූ අවස්ථාවක් වන අතර එනයින්ම එය නීත්‍යානුකූල හා බල සහිත වූවක් නොවනු ඇත.

5.6.1.6 පුත්තලම නගර සභාව

පුත්තලම නගර සභාව 2016 වර්ෂය සඳහා වරිපනම් පනවා ඇත්තේ 2015.09.30 දින පුත්තලම නගර සභාව විසින් සභා රැස්වීමේදී තීරණ අංක 30 යටතේ සම්මත කරන ලද යෝජනාවක් 2015-12-04 දිනැති අංක 1944 දරන ගැසට් පත්‍රයේ විශේෂ කොමසාරිස් වරයා නමින් පළ කිරීමෙනි. විශේෂ කොමසාරිස් වරයෙකුට වරිපනම් පැනවීමට බලය ලැබෙන ආකාරය පැහැදිලි නැත.

එහෙත් සභා යෝජනාව සටහන් කර තිබෙන්නේ විශේෂ කොමසාරිස් වරයා නගර සභා ආඥා පනතේ 184 (ඇ) වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 160 (1) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාරව **2016 වර්ෂයට ව්‍යාපාර බදු** නියම කරන බවයි. මෙහි 184 (ඇ) ලෙස සඳහන් වගන්තියක් නගර සභා ආඥා පනතේ සඳහන් නොවේ. එය 184 අ විය යුතුය. තවද එකී බලය යටතේ 2016 වර්ෂය සඳහා මෙම යෝජනාව මගින් ව්‍යාපාර බදු පනවන බව දක්වා ඇත. එහෙත් ඊට පසු සඳහන් විස්තර අනුව පනවා ඇත්තේ වරිපනම්ය. මෙය බදුගෙවන්නන් බෙහෙවින් ව්‍යාකූලත්වයට පත්කරන තත්වයකි.

එහි දෙවන ඡේදයෙහි " නගර සභා ආඥා පනතෙහි 166 වන වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර 2015 වසරේ වාර්ෂික තක්සේරුව ලෙස සම්මත කළයුතු බව." සඳහන් වේ. නගර සභා ආඥා පනත් 166 වගන්තියෙන් එබඳු බලයක් පුත්තලම නගර සභාවට පැවරී නැත. එහි ඇත්තේ මහා නගර සභා ආඥා පනතට අදාල වගන්ති සඳහන් කර ඒ අතුරින් නියමිත වගන්තිය යටතේ කටයුතු කළහැකි බවයි. ඒ අනුව මහා නගර සභා ආඥා පනත 238 (1) උප වගන්තිය ප්‍රකාර යථෝක්ත ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික වටිනාකම අනුගාමී වර්ෂයේ

වාර්ෂික වටිනාකම ලෙස සභා සම්මුතීන් මතින් පිළිගත හැකිය. යනුවෙන් සඳහන් වේ. ඒ අනුව තමාට බලය ලද ආකාරය පැහැදිලිව යෝජනාවේත්, නිවේදනයේත් දැක්විය යුතුය. එහෙත් එබඳු කිසිදු සඳහනක් මෙහි දක්වා නැත. ඒ අනුව මෙම පැනවීම සාවද්‍යවේ. තවද යෝජනාවේ දෙවන ඡේදයේ නේවාසික ස්ථාන සඳහා වාර්ෂික වටිනාකමින් 03% ක බද්දක් ද වාණිජ කාර්යයන් සඳහා වූ ස්ථාන වලින් 5%/ක බද්දක් ද අයකරන බව දක්වා ඇත. මෙය කිසිසේත් ප්‍රායෝගික තත්වයක් නොවේ. එය නීතියෙහි විධිවිධාන ඉක්මවා ක්‍රියාකර ඇති අවස්ථාවක් බව පෙනේ. මේ අනුව 2016 වර්ෂය සඳහා පුත්තලම නගර සභාව පනවා ඇති වරිපනම් විධිමත් ලෙස පනවා හෝ නිවේදනය කිරීම හෝ කර නැති බව පෙනේ. මෙබඳු පැනවීමකින් කිසිදු බදු මුදලක් අයකළ හැකි නොවේ.

5.6.1.7 ගම්පොල නගර සභාව

2016 වර්ෂය සඳහා ගම්පොල නගර සභාව වරිපනම් පනවා ඇත්තේ විශේෂ කොමසාරිස් වරයා විසින් 2015 සැප්තැම්බර් මස 29 වැනි දින ගන්නා ලද තීරණයක් 2015.10.30 දින අංක 1939 දරන ගැසට් පත්‍රයේ පළකරණු ලැබ ඇති නිවේදනයක් මගිනි. විශේෂ කොමසාරිස් වරයාට නගර සභාවක වරිපනම් පැනවීමට බලය ලැබී ඇති අකාරය පැහැදිලි නැත. මෙහිදී ප්‍රථමයෙන්ම සඳහන් කර ඇත්තේ විශේෂ කොමසාරිස්වරයා නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) වගන්ති ප්‍රකාරව 2016 වර්ෂය සඳහා **වරිපනම් ගාස්තු** පනවා අයකිරීම යනුවෙනි. මෙබඳු ගාස්තුවක් අයකිරීමට නගර සභාවකට බලයක් පවරා නැත.

දෙවනුව වාර්ෂිකව වරිපනමක් පැනවීම සඳහා එම වර්ෂයට අදාලව සෑම දේපලකම පවත්නා වර්ෂයේ වාර්ෂික වටිනාකම අනුගාමී වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීම හෝ නව තක්සේරුවක් පිළියෙළ කිරීම කරනු ලැබිය යුතුය. මෙහිදී නව තක්සේරුවක් කර නැති බැවින් මෙම දේපල වල දැනට පවත්නා වාර්ෂික වටිනාකම මත බදු ප්‍රතිශතයක් අයකිරීම 2015 සැප්තැම්බර් මස 29 දිනැති තීරණ අංක 2015 – 170 යටතේ පනවා ඇති බව නිවේදනය කර තිබේ.

නගර සභා ආඥා පනතේ 166 වන වගන්තියේ සඳහන් වන්නේ මහා නගර සභා ආඥා පනතේ සඳහන් වන වගන්ති ගණනාවක ප්‍රතිපාදන නගර සභාවක් සඳහා ද අදාල කරගත යුතු බවයි. ඒ අතර මහා නගර සභා ආඥා පනතේ 238 (1) උප වගන්තිය ද වන අතර, ඒ අනුව

ප්‍රවර්තන වර්ෂය වූ 2015 වසරේ තක්සේරුව ලෙස සභා තීරණයක් මගින් පිළිගත යුතු වේ. මෙහි එවැනි විධිමත් පිළිගැනීමක් විශේෂ කොමසාරිස්වරයාගේ තීරණයට ඇතුලත් කර නැත. එබැවින් එම තීරණය ශූන්‍ය හා බල රහිත වේ.

එසේම නිවේදනයේ තවදුරටත් දැක්වෙන්නේ නියමිත කාර්තුව තුළ නොගෙවන සෑම බද්දක් වෙනුවෙන් මහා නගර සභා ආඥා පනතේ 255 වන වගන්තිය ප්‍රකාර එම දේපලෙහි ස්වභාවය අනුව එනම් වානිජ දේපල වලින් 20% ක් සහ නේවාසික සහ අනෙකුත් දේපලවලින් 15% ක අධි ගාස්තුවක් අයකරනු ලබන බවයි. මෙබඳු අධි ගාස්තු අයකිරීමට නගර සභා ආඥා පනතේ ඉඩ සලසා දී නැත. වරිපනම් ගෙවීම දිගටම පැහැර හරිනු ලබන විට ලේකම්වරයා විසින් නිකුත් කරනු ලබන වරෙන්තුවක් ප්‍රකාර එය ක්‍රියාත්මක කළ පසු වරෙන්තු ගාස්තු අයකළ හැකිවේ. එසේ නොමැතිව අධිගාස්තු පැනවීමේ බලයක් විශේෂ කොමසාරිස්වරයාට දී නැත. මෙම නිවේදන පළකිරීමේ බලය විශේෂ කොමසාරිස් වෙත ලැබුණු ආකාරය නිවේදනයේ කිසිම තැනක සඳහන් නොවේ. ඒ අනුව සභාව සතු බලය පැවරීමකින් තොරව මෙසේ බදු පැනවීම් කිරීම නීතිය ඉක්මවා යාමකි. මේ කරුණු අනුව ගම්පොල නගර සභාව 2016 සඳහා පනවා ඇති වරිපනම් අතිශය අවිධිමත් හා දෝෂ සහගත සාවද්‍ය වූවක් බව පෙනේ.

5.6.1.8 තලවාකැලේ - ලිඳුල නගර සභාව

2016 වර්ෂය සඳහා තලවාකැලේ - ලිඳුල නගර සභාව වරිපනම් පනවා ඇත්තේ සභාවේ ලේකම්වරයා විසින් 2015.12.04 දිනැති අංක 1944 දරණ ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනයක් මගිනි. මෙම නිවේදනයට පාදක කරගත් යෝජනාවක් හෝ තීරණයක් පිළිබඳව මෙහි කිසිදු සඳහනක් නොමැත.

එසේම සභිකයින් නොමැති අවස්ථාවක සභාවේ ලේකම්වරයාට නගර සභා ආඥා පනතේ 184 අ වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර නගර සභාවකට අදාල තීරණ ගත හැකිවේ. එසේ තීරණ ගැනීමේදී නගර සභා ආඥා පනතේ සඳහන් බලදායී වගන්තිය ද සඳහන් කරනු ලැබිය යුතුය. මෙහි එවැන්නක් සඳහන් නොවන හෙයින් එය නීත්‍යානුකූල නොවේ.

තවද මෙම නිවේදනයේ " (255 වැනි අධිකාරය) වන නගර සභා ආඥා පනතේ 160 (3) වන වගන්තිය යටතේ ඒ ඒ සීමා කිරීම් වලට යටත්ව තලවාකැලේ - ලිඳුල නගර සභා සීමාව තුල පිහිටි සියලුම නිශ්චල දේපල සඳහා 2015 වර්ෂයේ වාර්ෂික වටිනාකම 2016 වර්ෂයටද බල පවත්වන බවත්, එම වාර්ෂික වටිනාකමින් 21 % ක වරිපනම් බද්දක් 2016 වර්ෂය වෙනුවෙන් තලවාකැලේ - ලිඳුල නගර සභාව විසින් පනවා අයකිරීමට තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ. එම බදු පිළිවෙලින් ඒ ඒ කාර්තුවේ අවසන් දිනට ප්‍රථම ගෙවිය යුතු බවටත් නිවේදනය කරනු ලැබේ." යනුවෙන් ගැසට් පත්‍රයේ පළකර ඇත. නගර සභා ආඥා පනතේ 166 වන වගන්තිය සමඟ කියවිය යුතු මහා නගර සභා ආඥා පනතේ 238 වගන්තිය අනුව ඉදිරි වර්ෂය සඳහා දේපළ තක්සේරු නොකරනු ලැබූ විට පවත්නා වර්ෂයේ වාර්ෂික වටිනාකම් අනුගාමී වර්ෂයේ වාර්ෂික වටිනාකම් ලෙස පිළිගනු ලැබිය යුතුය. එසේ වුවද අදාල බලදායී වගන්තිය සඳහන් නොකර " 2015 වර්ෂයේ වාර්ෂික වටිනාකම් 2016 වර්ෂයටද බලපවත්නා බව ලේකම් මහතා සඳහන් කර තිබේ." මෙය නීත්‍යානුකූල නොවේ. මහා නගර සභා ආඥා පනතේ පූර්වෝක්ත 238 වගන්තිය පිළිබඳ අනිවාර්යයෙන් එහි සඳහන් කළ යුතුය. නගර සභා ආඥා පනතේ 170 (1) උප වගන්තියේ වරිපනම් බදු සහ බදු අයකර ගැනීමට අදාල ප්‍රතිපාදන සඳහන් කර තිබේ. එසේ වුවද ලේකම් මහතාගේ තීරණයට " මෙහි පළමු වැනි ඡේදය ප්‍රකාර ගෙවිය යුතු බදු මුදල් නොගෙවන අයගේ සෑම ව්‍යාපාරික දේපලක්" වෙනුවෙන් 20% ක හා සෙසු දේපල වෙනුවෙන් 15% ක වරෙන්තු ගාස්තු අයකරන බව දක්වා තිබේ. වරෙන්තුවක් නිකුත් නොකර හෝ නිකුත් කරනු ලැබූ වරෙන්තුවක් ක්‍රියාත්මක නොකර කිසිම තැනැත්තෙකුගෙන් වරෙන්තු ගාස්තුවක් අයකළ නොහැක.

ඉහත කරුණු සලකා බලන කල 2016 වර්ෂය සඳහා තලවාකැලේ ලිඳුල නගර සභාව විසින් පනවා නිවේදනය කර ඇති වරිපනම් පිළිබඳව එකී පැනවීම හෝ ව්‍යවස්ථාපිත නිවේදනය යන කිසිවක් නීත්‍යානුකූල නොවන අතර බලරහිත හා ශූන්‍ය වේ. එබැවින් එබඳු වරිපනම් අයකිරීම නීතියට පටහැනි ක්‍රියාමාර්ගයකි.

5.6.1.9 ඇඹිලිපිටිය නගර සභාව

2016 වර්ෂය සඳහා ඇඹිලිපිටිය නගර සභාව විසින් වරිපනම් පනවා ඇත්තේ ලේකම්වරිය විසින් 2015 ඔක්තෝම්බර් මස 07 දින කරන ලද තීරණයක් ප්‍රකාරවය. එකී තීරණය ද ගැසට් නිවේදනයේ පළකර තිබේ. එම තීරණය "යෝජනාව" ලෙස සඳහන් කර තිබීම සාවද්‍ය වේ. "නගර සභා ආඥා පනතේ 184 (අ) වන වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ 160 වන වගන්තියේ විධිවිධාන අනුව 2016 වර්ෂය සඳහා වරිපනම් පනවන බව නිවේදනයේ දැක්වේ. මෙහි නගර සභා ආඥා පනතේ 184 (අ) යනුවෙන් වගන්තියක් නැත. එය 184 අ ලෙස නිවැරදි විය යුතුය. ලේකම්වරියගේ "යෝජනාවේ" (මෙය තීරණය යනුවෙන් නිවැරදි විය යුතුය.) දෙවන ඡේදයේ "නගර සභා ආඥා පනතේ 166 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ ඇඹිලිපිටිය නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නාගරික ප්‍රදේශය ඇතුලත පිහිටියා වූ නිවාස වල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2016 වර්ෂය සඳහා වූ තක්සේරුව / සත්‍යෙක්ෂණය පවත්නා වර්ෂය සඳහා තක්සේරුව ලෙස සම්මත කළයුතු බවටත් එකී තක්සේරුව මත නගර සභා ආඥා පනතේ 160 (1) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපල මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් 05% ක වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්" යනුවෙන් සඳහන් වේ.

එසේ වුවත් එහි නගර සභා ආඥා පනතේ 166 වගන්තිය සමග කියවිය යුතු මහා නගර සභා ආඥා පනතේ 238(1) වගන්තියේ විධිවිධාන මත ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික වටිනාකම් අනුගාමී වර්ෂය සඳහා යොදාගැනීමට සභාව අනුමත කළයුතු බවට වන අත්‍යාවශ්‍ය සඳහන අඩංගු වී නැත. එබැවින් දැනට පනවා ඇති වරිපනම් ප්‍රතිශතය බල රහිත හා ශුන්‍ය වේ. මක් නිසාද යත් පැහැදිලිව පසුගිය වර්ෂයේ තක්සේරුව 2016 වසරට වූ තක්සේරුව ලෙස සභා සම්මත කළයුතුවේ. එම විධිවිධානය මෙම නිවේදනයේ තීරණයට ඇතුළත් වී නැත. එබැවින් 2016 වසරට විධිමත් තක්සේරුවක් ඇඹිලිපිටිය නගර සභා බල ප්‍රදේශයේ දේපල සඳහා නොමැත. මේ තත්වය හේතුකොට ගෙන වරිපනම් අයකළ නොහැකිය. මෙය ඉතා අසතුටුදායක තත්වයක් වන හෙයින් පළාතේ පළාත් පාලන බලධාරීන් මේ සම්බන්ධව දැඩි අවධානය යොමුකළ යුතුවේ.

5.6.1.10 හික්කඩුව නගර සභාව

2016 වර්ෂය සඳහා හික්කඩුව නගර සභාව විසින් වරිපනම් පනවා ඇත්තේ 2015.12.23 වන දිනැති අංක 1947 දරණ ගැසට් පත්‍රයෙහි සභාවේ ලේකම්වරයා විසින් පළකරන ලද නිවේදනයක් මගිනි.

මෙම නිවේදනය පළකිරීමට පාදක වූ තීරණයක් හෝ යෝජනාවක් පිළිබඳ සඳහනක් නිවේදනයේ දක්නට නොමැති වීම අඩුපාඩුවකි. මෙම නිවේදනයේ පළමු ඡේදයෙහි නගර සභා ආඥා පනතේ 166 වන වගන්තිය සමග කියවිය යුතු මහා නගර සභා ආඥා පනතේ 238 (1) උපවගන්තිය ප්‍රකාර වරිපනම් පනවනු ලබන බව සඳහන් කර ඇත. එහෙත් එහි සභාවක සභිකයින් ක්‍රියාත්මක නොවන අවස්ථාවක සභාවේ බලතල ලේකම්වරයා වෙත පැවරෙන විධිවිධාන නගර සභා ආඥා පනතෙහි ද පැහැදිලිව දක්වා ඇතත් සභාවේ බලතල පාවිච්චි කරමින් වරිපනම් පැනවීමට යාමේදී ප්‍රථම කොට ඒ බව සඳහන් කළ යුතු වුවද 184 අ වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර අදාල පැනවීම් කරන බව සඳහන් කර නැත. එය දෝෂ සහගත තත්වයකි.

එසේම නිවේදනයේ දෙවන ඡේදයෙහි "ඒ වරිපනම් බදු **<u>එකී නගර සභා ආඥා පනතේ 170 වන</u>** වගන්තිය සමග කියවිය යුතු **<u>ඉහත කී නගර සභා ආඥා පනතේ 230 වගන්තියේ (2) වන උප වගන්තියේ (ඇ) ඡේදයේ</u>** විධිවිධාන යටතේ....." මෙහි පළමුව සඳහන් එකී නගර සභා ආඥා පනත, 255 වන අධිකාරය වූ නගර සභා ආඥා පනත බව පෙනේ. එහෙත් දෙවනුව සඳහන්, **<u>ඉහත කී නගර සභා ආඥා පනතේ 230 වගන්තියේ.....</u>** යන්නෙන් දැක්වෙන නගර සභා ආඥා පනත කුමක්ද ?. නගර සභා ආඥා පනතෙහි මෙබඳු විධිවිධානයක් නැත. නිසැකවම එය 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥා පනත විය යුතුය. එහෙත් මෙම ව්‍යවස්ථාපිත නිවේදනයේ එය සාවද්‍ය ලෙස සඳහන් කර තිබේ.

මීට අමතරව අවසාන ඡේදයෙහි වර්ෂයේ නියමිත වරිපනම් ඒ ඒ කාර්තුවේ අවසන් දිනට හෝ ඊට පෙර නොගෙවුවහොත් හිඟ බදු මුදල් අයකර ගැනීම සඳහා නිකුත් කරනු ලබන වරෙන්තුවක් සම්බන්ධයෙන් මුඩු ඉඩම් හා නේවාසික දේපලවලින් 15% ක් ද වාණිජ දේපල වලින් 20% ක් ද වන වරෙන්තු ගාස්තුවක් අයකරන බව සඳහන් කර ඇත. මෙය ලේකම්වරයා සිය බල සීමාව ඉක්මවා ක්‍රියාකළ අවස්ථාවක් ලෙස පෙනේ.

අදාල කාර්තුව තුල වරිපනම් නොගෙවූ බදු ගෙවන්නෙකුට සිදුවන්නේ සිය වට්ටම් මුදල අහිමි වීම පමණි. කාර්තුවක් කාර්තුවක් පාසා වරෙන්තු නිකුත් කිරීමක් සිදුකරනු නොලබන අතර හිඟ අයකර ගැනීම සඳහා නිකුත්කරනු ලැබූ වරෙන්තුවක් අදාල පුද්ගලයා විසින් ක්‍රියාත්මක කරනු ලැබීමෙන් පසුව පමණක් වරෙන්තු ගාස්තු උපචිත වේ. එසේ නොමැතිව මෙහි දක්වා ඇති පරිදි කාර්තුව අවසානයේ නොගෙවන ලද වරිපනම් වෙනුවෙන් වරෙන්තු ගාස්තු අයකිරීමට ලේකම්වරයාට නගර සභා ආඥා පනතින් බලයක් පවරා දී නැත. මේ අනුව හික්කඩුව නගර සභාවේ ලේකම්වරයා විසින් 2016 වර්ෂය සඳහා පනවා නිවේදනය කර ඇති වරිපනම් අවිධිමත් හා දෝෂ සහගත බව පෙනීයයි.

මෙබදු ඌණතා සමග වරිපනම් අයකිරීමේදී නීතිය හමුවේ නගර සභාවට අභියෝග කිරීමේ හැකියාව බදුගෙවන්නන් සතුව පවතී.

5.6.1.11 හපුතලේ නගර සභාව

2016 වර්ෂය සඳහා හපුතලේ නගර සභාව වරිපනම් පනවා ඇති බවක් හෝ එසේ පැනවූයේ නම් එකී නිවේදනය ගැසට් පත්‍රයේ පළකළ බවක් හෝ නොපෙනේ. නගර සභාව විසින් පුවත් පත් දැන්වීමක් මගින් සභාවට ඒ ඒ කාර්තුවල නියම කරන ලද දිනවලදී වරිපනම් ගෙවිය යුතු බව නිවේදනය කොට තිබුණි. කිසියම් පළාත් පාලන ආයතනයක බදු පැනවීම්, අර්ථ නිරූපන ආඥා පනතේ (2 වන අධිකාරය) 17 (1) (e) වගන්තිය ප්‍රකාර අනිවාර්යයෙන් ගැසට් පත්‍රයේ පළකළ යුතුය. එසේ නොකළ හොත් එය නීතිය ඉදිරියේ වලංගුභාවය අහෝසි කර ගනී. ඒ අනුව හපුතලේ නගර සභාවේ වරිපනම් ක්‍රියාවලිය නීතියට පටහැනි වූවක් බව පෙනීයයි. මේ පිළිබඳව අදාල බලධාරීන්ගේ අවධානය යොමුවිය යුතුවේ.

5.6.1.12 ත්‍රිකුණාමලය නගර සභාව

ත්‍රිකුණාමලය නගර සභාව 2016 වසර සඳහා විධිමත් පරිදි වරිපනම් පනවා නැත. එහි ලේකම්වරයා සඳහන් කරන පරිදි ඔහු විසින් වරිපනම් පැනවීමට තීරණයක් ගත් බවත් ඒ අනුව 2016 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත පරිදි රුපියල් 350,000,000 ක මුදලක් අය කිරීමට අපේක්ෂා කරන බව අනාවරණය විය. මේ සඳහා වරිපනම් දැන්වීම් බෙදාහැර ඇති බවත් ලේඛන සුදානම්ව ඇති බවත් පවසන ලදි. එම අදහස ගණකාධිකාරීවරයා මෙන්ම මෙම අධ්‍යයනයේදී තොරතුරු සැපයූ සෑම නිලධාරියෙකම සනාථ කරන ලදි. මෙම ප්‍රධාන නිලධාරීන්

පළාත් පාලනය පිළිබඳ ඉතා අඩු සේවා කාලයක් හා පළපුරුද්දක් ඇති අය බව ද අනාවරණය විය. එහෙත් ප්‍රධාන ආදායම් පරීක්ෂකවරයාත් ඔහුගේ ඊළඟ නිළධාරියාත් වසර 20 කට වැඩි පළපුරුද්දක් සහිත නිලධාරීන් වූහ.

මෙම සභාවේ ලේකම්වරයාගේ අදහස වූයේ වරිපනම් පැනවීම හුදු පරිපාලන තීරණයක් බවත් එය ගැසට් මගින් පළකිරීම අවශ්‍ය නොවන බවත්ය. මෙම තත්වය සම්බන්ධ කිසිදු විගණන හෝ පරිපාලනමය විමසුමක් හෝ ඉහල නිලධාරීන් වෙතින් ලැබී නොතිබුණි. මෙම ක්‍රියාවලිය මුළුමනින්ම නීති විරෝධී අවිධිමත්, බලරහිත හා ශුන්‍ය ප්‍රතිඵලයක් වූවක් බව සඳහන් කළයුතුය.

5.6.1.13 කාතන්කුඩි නගර සභාව

2016 වර්ෂය සඳහා කාතන්කුඩි නගර සභාව වරිපනම් පනවනු ලබන්නේ එහි ලේකම්වරයා විසින් 2016.05.27 දිනැති අංක 1969 දරණ ගැසට් පත්‍රයෙහි පළකර ඇති නිවේදනයක් මගිනි. 2016 වසරේ ජනවාරි මස 01 දින සිට බලපැවැත්වෙන වරිපනම් පැනවීම පිළිබඳ ගැසට් නිවේදනය මාස 05 කුත් දින 27 කට පසුව මහජනතාව වෙත නිවේදනය කර තිබේ. මෙය මුළුමනින්ම නීතියට පටහැනි ක්‍රියාමාර්ගයකි. පළාත් පාලන ආයතනයකට මොනම කරුණක් යටතේ වත් අතීතයට බලපාන ලෙස නීති පැනවිය නොහැකිය. වරිපනම්, බදු, ගාස්තු පැනවීම අනු නීති පැනවීමකි. එබැවින් එය නීත්‍යානුකූල නොවේ. එසේම එම තීරණය ශුන්‍ය හා බලරහිත වන්නේය. මේ හැර කාතන්කුඩි නගර සභාවේ ලේකම් ගේ වරිපනම් පැනවීම් නිවේදනය අදාල බලදායී වගන්ති ඇතුළු විස්තර නිවැරදිව සඳහන් කොට සකස් කර තිබීම පිළිබඳව ප්‍රශංසා කටයුතුය.

5.6.1.14 පේදුරුතුඩුව නගර සභාව

2016 වර්ෂය සඳහා පේදුරුතුඩුව නගර සභාව වරිපනම් පනවා තිබේ. එහෙත් ඒ නීතියේ සඳහන් විධිමත් ක්‍රියා පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරවය. මෙම පැනවීම ආයතනයේ අභ්‍යන්තර පරිපාලනමය කරුණක් බවත් එය නගරයේ බදුගෙවන්නන්ගේ දැනගැනීම පිණිස ප්‍රදේශයේ පළවන පුවත්පතක දැන්වීමක් මගින් ප්‍රසිද්ධ කළ බවත් ලේකම්වරයාගේ කරුණු පැහැදිලි කිරීමේදී අනාවරණය විය. 2016 වසරේ නගරයේ පොදු වරිපනම් ප්‍රතිශතය 12% ක්

වන අතර නව දේපල තක්සේරුවක් 2017 වසරේ තුන්වන කාර්තුවේ සිට ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන යොදා ඇති බවත් අනාවරණය විය.

වරිපනම් පැනවීම විශේෂිත නිවේදනයක් ලෙස ගැසට් පත්‍රයේ අදාල වර්ෂය ආරම්භ වීමට පෙර පැනවීම අත්‍යාවශ්‍ය වේ. එබැවින් 2016 වර්ෂය සඳහා පේදුරුතුඩුව නගර සභාව සිදුකර ඇති වරිපනම් පැනවීම ශුන්‍ය හා බලරහිත වන්නේය. කෙසේ වෙතත් මෙම නිවේදන කිසිවක් ඉංග්‍රීසි හෝ සිංහල භාෂාවන්ගෙන් පළකර නොමැති වීම ව්‍යාවස්ථාමය ප්‍රතිපාදන නොසළකා හැරීමකි.

5.6.1.15 වව්නියාව නගර සභාව

2016 වර්ෂය සඳහා වව්නියාව නගර සභාව වරිපනම් පනවා ඇත්තේ ලේකම්වරයා විසින් 2016 ජනවාරි මස 14 වැනි දිනැති අංක 1950 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනයක් මගිනි. ඊට පාදක වූ තීරණයක් හෝ යෝජනාවක් නිවේදනය සමඟ පළකර නැත. පළාත් පාලන ආයතන විසින් බදු පැනවීම ඇතුළු සියළු උප නීති පැනවීමේදී ඒවා කිසිසේත් අතීතයට බලපාන පරිදි සිදුකිරීමට ප්‍රතිපාදන සැලසී නැත. එබැවින් අදාල වර්ෂය ආරම්භ වීමට පෙර එම පැනවීම් සිදුකර ගැසට් පත්‍රයේ පළකළ යුතුවේ. එහෙත් වව්නියා නගර සභාවේ මෙම පැනවීම සිදුකර ඇත්තේ වර්ෂය ආරම්භ වීමෙන් පසුව බව පෙනේ. එය අතිශයින් දෝෂ සහගත වේ.

තවද මෙම වරිපනම් පැනවීම සඳහා 2016 වර්ෂය සඳහා නගරයේ දේපළ වල තක්සේරුවක් සම්මත කරගෙන නැත. නව තක්සේරුවක් සිදුකර නොමැති බැවින් පවත්නා වර්ෂයේ තක්සේරුව අනුගාමී වර්ෂය හෙවත් 2016 වර්ෂය සඳහා සම්මත කර ගැනීම අත්‍යාවශ්‍ය වේ. මෙය නගර සභා ආඥා පනතේ 166 වගන්තිය සමග කියවිය යුතු මහා නගර සභා ආඥා පනතේ 238 (1) උප වගන්තියේ විධිවිධාන මත විය යුතුය. එහෙත් එසේ කිසිදු තක්සේරුවක් නොමැති දේපල සඳහා වරිපනම් වශයෙන් 15% ක ප්‍රතිශතයක් පැනවුවත් එහි ප්‍රතිඵලය ශුන්‍ය වූවකි. තවද අවසාන ඡේදයේ අදල වරිපනම් ඒ ඒ කාර්තු තුළ නියමිත දිනයට පෙර නොගෙවනවිට ඒ ස්ථාන සම්බන්ධයෙන් නේවාසික දේපල වෙනුවෙන් 15% ක් ද සෙසු සියළු දේපල වෙනුවෙන් 20% ක් ද වරෙන්තු ගාස්තු ලෙස අය කරන බව නියම කර තිබේ. මෙබඳු වරෙන්තු ගාස්තුවක් අය කිරීමට වව්නියාව නගර සභාවේ ලේකම් වරයාට නගර සභා ආඥා පනතින් බලය පවරා නැත. වරෙන්තු ගාස්තුව උපචිත වන්නේ ලේකම්වරයා විසින් හිඟ මුදල්

අයකර ගැනීම සඳහා වරෙන්තුවක් නිකුත් කර එම වරෙන්තුධාරියා එය ක්‍රියාවට නැංවූ පසුවය. එතෙක් කිසිම වරෙන්තු ගාස්තුවක් අයකිරීම නීත්‍යානුකූල නොවේ.

මේ අනුව පරීක්ෂා කිරීමේදී පෙනීයන්නේ 2016 වර්ෂය සඳහා වව්නියාව නගර සභාවේ ලේකම්වරයා විසින් සභාවේ සභිකයින් නොමැතිවිට එහි කාර්යයන් ලේකම්වරයා වෙත පැවරෙන නීතිමය විධිවිධාන පවා සඳහන් නොකර සිදුකර ඇති මෙම පැනවීම හා ඊට සම්බන්ධ නිවේදන ශූන්‍ය හා බල රහිත වන අතර නීතියට පටහැනි ඒවා වන බවයි.

ඉහත විස්තර කරන ලද තත්වය විශ්ලේෂණය කිරීමේදී පෙනී යන්නේ නියැදිගත නගර සභා 15 අතුරින් හපුතලේ නගර සභාව වරිපනම් පනවා නැති අතර සෙසු ආයතන 14 ම වරිපනම් පැනවීම සිදුකර ඇත්තේ සාවද්‍ය හා දෝෂ සහගත ලෙස බවයි. ඒ අනුව එහි ප්‍රතිශතය 0% කි. එනම් නගර සභාවන්හි වැදගත්ම ආදායම් ප්‍රභවය වූ වරිපනම් පැනවීම පිළිබඳ හැකියාව ශූන්‍ය බවයි. මෙය ලංකාවේ පළාත් පාලනය සම්බන්ධ ඉතා බැරෑරුම් ස්වභාවයක් (Alarming Situation) පෙන්නුම් කරන අවස්ථාවක් බැවින් සියළු බලධාරීන්ගේ දැඩි අවධානය ඒ කෙරෙහි යොමුවිය යුතුය.

මීළඟට නියැදිගත නගර සභාවන්හි බලපත්‍ර ගාස්තු පැනවීම පිළිබඳ පවත්නා තත්වය විමර්ශනාත්මකව සොයා බැලීම වැදගත් වේ.

5.6.2 බලපත්‍ර ගාස්තු

5.6.2.1 සීතාවකපුර නගර සභාව

2016 වර්ෂය සඳහා සීතාවකපුර නගර සභාව බලපත්‍ර ගාස්තු පැනවීම සිදුකර ඇත්තේ 2015.11.11 දින ගනු ලැබූ තීරණයක් අනුව යෝජනාවක් අනුමත කිරීමෙනි. එම නිවේදනය 2015.11.27 දිනැති 1943 දරණ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කර ඇත. ඊට අදාල යෝජනාව ද ඒ සමඟ පළකර ඇත.

එම යෝජනාව අනුව නගර සභා ආඥා පනතේ 184 (අ) වගන්තිය අනුව පැවරුණු බලය මත බලපත්‍ර ගාස්තු පනවා ඇති බව ලේකම්වරිය ප්‍රකාශ කර ඇත. එහෙත් නගර සභා ආඥා පනතේ මෙබඳු වගන්තියක් නැත. එය **184 අ වගන්තිය** ලෙස නිවැරදි විය යුතුවේ. මෙම නිවේදනයෙහි අසම්පූර්ණ හා සදොස් අවස්ථා කිහිපයක්ම ඇත.

කෙසේ වෙතත් වෙළඳාම් 117 ක් අන්තරාදායක ව්‍යාපාර 29 ක් අප්‍රසන්න ව්‍යාපාර 24 ක් අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර 19 ක් වශයෙන් වෙළඳ ව්‍යාපාර 189 ක් සඳහා බලපත්‍ර ගාස්තු පනවා ඇත. ඒ අතුරින් 56 ක් ගබඩා කිරීම් ස්ථානයන්ය. මේවා සඳහා බලපත්‍ර නිකුත් කිරීමට අතුරු ව්‍යවස්ථා නොමැත. එය ව්‍යාපාරයක් නොවේ. විෂයාංක 56 හා අප්‍රසන්න අන්තරාදායක ව්‍යාපාර යටතේ විෂයාංක 15 පිළිවෙලින් පෙට්‍රල්, ඩීසල් වෙළඳාම හා භූමිතෙල් වෙළඳාම සම්බන්ධයෙනි. එය බනිජතෙල් ආඥා පනත යටතේ බලය පවරන ලද විෂයකි. නගර සභාවට බලපත්‍ර ගාස්තු පැනවිය නොහැකිය. අංක 98 මත්පැන් අලෙවියයි. මෙය සුරාබදු ආඥාපනත යටතේ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාරයකි.

මෙම ලැයිස්තුවේ සඳහන් වෙළඳාම් රාශියක් කර්මාන්ත බද්දට යටත් කළ හැකිය. ඒවාට අතුරු ව්‍යවස්ථා පනවා නැත. මේ අනුව මෙම පැනවීම බෙහෙවින් දෝෂ සහගත බව පෙනී යයි.

5.6.2.2 පැලියගොඩ නගර සභාව

2016 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීමට අදාලව පැලියගොඩ නගර සභාව සම්බන්ධයෙන් වූ නිවේදනය 2015.12.11 දිනැති අංක 1945 දරණ ගැසට් පත්‍රයේ වූ නිවේදනයකින් ප්‍රකාශයට පත්කර ඇත. එහෙත් එය පනවන ලද අයෙකුගේ නමක් හෝ තනතුරක් හෝ අත්සන් කළ බවට සලකුණක් හෝ නොමැත. මෙම නිවේදනය පළකිරීමේ දී **1939 අංක 61 දරණ නගර සභා පනතක්** සම්බන්ධයෙන් සඳහන් කර ඇති අතර, එම පනතේ 184 වන වගන්තියේ (අ) ඡේදයක් ගැන ද සඳහන් කර ඇත. එසේම එම පනතේ 162 හා 164 වගන්ති..... යනුවෙන් ද එහි දැක්වේ. නගර සභාවක් සම්බන්ධයෙන් බලපත්‍ර ගාස්තු පැනවීමකදී ඉහත සඳහන් යෙදුම් සියල්ල අතිශයින් වැරදි සහගත වේ. එම යෙදුම් පිළිවෙලින්;

" 1939 අංක 61 දරණ නගර සභා ආඥා පනත "

" එම ආඥා පනතේ 162 හා 164 වගන්ති "

"එම ආඥා පනතේ 184 අ වගන්තිය" ලෙස නිවැරදි විය යුතුය.

තවද මෙම නිවේදනයේ පළමු ඡේදයේ **<u>තීරණයක්</u>** ගැන සඳහන් කර දෙවන ඡේදයෙහි **<u>යෝජනාවක්</u>** ගැන සඳහන් කර ඇත. එහිද නැවත **<u>1939 අංක 61 දරණ නගර සභා පනතේ 184 (අ) වගන්තිය සමඟ කියවිය යුතු 162 වගන්තිය හා 164 වැනි වගන්තිය .....</u>** ක් ගැනද සඳහන් වේ. මේ සියල්ල සාවද්‍ය වේ. එය සඳහන් කළ යුත්තේ **<u>1939 අංක 61 දරණ නගර සභා ආඥා පනතේ 184 අ වගන්තිය සමඟ කියවිය යුතු 162 (1) (ආ) ඡේදය හා 164 වන වගන්තිය.....</u>** යනුවෙනි. එසේම මෙම ගාස්තු ඉහත නිවේදනය අනුව පනවා ඇති අතර සඳහන් කර ඇත්තේ "නියම විය යුතු" බවයි. එය විධිමත් පැනවීමක් නොවේ.

වගකිව යුතු ආයතනයක ජ්‍යෙෂ්ඨතම නිලධාරියා විසින් මෙසේ සාවද්‍ය නිවේදන මහජනයා වෙත ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය මගින් දැනුම් දීම කොතරම් බැරෑරුම් තත්වයක් ද මෙම නිවේදනය එහි සාවද්‍ය අන්තර්ගතය හා පැනවූවෙකු නොවීම නිසා බලරහිත වන්නේය.

මෙම නිවේදනයට යා කොට ඇති අප්‍රසන්න ව්‍යාපාර 91 ක් ද අන්තරාදායක ව්‍යාපාර 17 ක් ද දැක්වෙන ලේඛනයක් තිබේ. මේ අනුව පෙනීයන්නේ පැලියගොඩ නගර සභා බල ප්‍රදේශයේ බලපත්‍ර ගාස්තු අයකළ යුතුව ඇති සියළුම වෙළඳාම් අප්‍රසන්නකාරී හෝ අන්තරාදායක ඒවා වන බවයි. එසේ නම් එම සම්පූර්ණ ලැයිස්තුවෙහි ඇතුලත් වෙළඳාම් සියල්ලම ආවරණය කරන වෙන වෙනම වූ විධිමත් අතුරු ව්‍යවස්ථා තිබිය යුතුය. මෙම ලැයිස්තුව විමර්ශනය කිරීමේදී පෙනීගියේ කර්මාන්ත බද්දට යටත්වන කර්මාන්ත විශාල සංඛ්‍යාවක් ඇති බවයි. එසේම ගබඩාකිරීම් 31 ක් බලපත්‍ර ලබාගත යුතු වෙළඳාම් ලෙස අනුමත කොට ඇති බවයි. වෙළඳාම පිණිස එම පරිශ්‍රයේ කිසියම් භාණ්ඩ තොගයක් පවත්වාගෙන යාම ගබඩාකිරීමේ ව්‍යාපාරයක් නොවේ.

එසේම පැලියගොඩ නගර සභාවේ නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථා (1953.09.25 දින සම්මත කරන ලද) 29 ක් හැර වෙනත් අතුරු ව්‍යවස්ථා නොමැති බව තවදුරටත් කරුණු විමසීමේදී අනාවරණය විය. තත්ත්වය එසේ පැවතියදී අතුරු ව්‍යවස්ථා නොමැති වෙළඳාම් කිසිවක් සඳහා (නීතියක් නොමැතිව) බලපත්‍ර ගාස්තු පැනවීම හෝ අයකිරීම නීත්‍යානුකූල නොවේ. තවද මෙම නිවේදනයේ අන්තරාදායක ව්‍යාපාර ලැයිස්තුවේ අංක 05 යටතේ "පෙට්‍රල්, ඩීසල් තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම" යනුවෙන් දක්වා ඇත. එහෙත් ඛනිජතෙල් ආඥා පනතේ විධිවිධාන මත

විෂයභාර අමාත්‍යවරයා විසින් මෙම කරුණට අදාලව බලපත්‍ර නිකුත් කිරීමේ බලය නාගරික පළාත් පාලන ආයතන වෙත පවරා ඇත. මේ සම්බන්ධයෙන් බනිජ තෙල් ආඥා පනත යටතේ පනවා ඇති නියෝගවල සඳහන් කර ඇති බලපත්‍ර ගාස්තු ඉක්මවා ගාස්තු පැනවීම හා අයකිරීම වරදකි. නීතියේ සීමා ඉක්මවා ක්‍රියා කිරීමකි.

5.6.2.3 ජා ඇල නගර සභාව

ජා ඇල නගර සභාව 2016 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම සම්බන්ධයෙන් 2015.11.06 දිනැති අංක 1940 දරන ගැසට් පත්‍රයෙහි ලේකම්වරිය විසින් පළකර ඇති නිවේදනය මගින් සිදුකර ඇත. මෙම නිවේදනයේ ද **1939 අංක 61 දරන නගර සභා පනතක් හා එහි 184 (අ)** වගන්තිය සමඟ කියවිය යුතු **එම පනතේ 162 වැනි වගන්තිය.....** ගැන සඳහන් වේ. එබඳු පනතක් හෝ වගන්තියක් නගර සභාවන්ට බලපත්‍ර ගාස්තු පැනවීමට අදාලව නොමැත.
මෙම නිවේදනයට යාකොට බලපත්‍ර ලබාගත යුතු වෙළඳාම් 157 ක් දක්වා ඇත. ඒ අතර ගබඩා කිරීමේ ස්ථාන 21 ක් ද, අංක 107 යටතේ පෙට්‍රල්, ඩීසල් හෝ වෙනත් බනිජ තෙල් වර්ගයක් විකිණීම සඳහා ගබඩා කිරීම හා අංක 121 යටතේ භූමිතෙල් හෝ වෙනත් බනිජ තෙල් වර්ග (පෙට්‍රල්, ඩීසල් හැර) අලෙවිය සඳහා ගබඩා කිරීම සම්බන්ධයෙන්ද බලපත්‍ර නිකුත් කර ගාස්තු අයකිරීමට ප්‍රතිපාදන සලසා ඇත.

එහෙත් ගබඩා කිරීම යනු වෙළඳ ව්‍යාපාරයක් නොවන අතර ඒ සඳහා බලපත්‍ර නිකුත් කිරීමට නීතියක් නොමැත. බනිජ තෙල් ආඥා පනතේ විධිවිධාන යටතේ බනිජ තෙල් විකිණීමේ ස්ථාන සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ බලය විෂයභාර අමාත්‍යවරයා විසින් නගර සභාවලට පවරා දී ඇත. එම නියෝගවල අයකළ යුතු බලපත්‍ර ගාස්තු නියම කර තිබේ. යථෝක්ත බලය පැවරීම නොසලකා හරිමින් මෙම පැනවීම කර තිබේ. මෙය බලාතික්‍රමණයකි. එසේම මෙම ලේඛනයේ දැක්වෙන බලපත්‍ර ලබාගත යුතු බවට සඳහන් වෙළඳාම් අතර කර්මාන්ත බද්දට යටත් විය යුතු ස්ථාන විශාල සංඛ්‍යාවක් තිබේ. ඒ අනුව මෙම බලපත්‍ර ගාස්තු පැනවීම නිසි අවබෝධයකින් යුක්තව සිදුකරන ලද ක්‍රියාවක් නොවන බව පෙනේ. එබැවින් යටකී තත්වය මත මෙම පැනවීම නීතියට පටහැනිව සිදුකර ඇති බව පෙනේ.

5.6.2.4 හොරණ නගර සභාව

2016 වර්ෂය සඳහා හොරණ නගර සභාවේ බලපත්‍ර ගාස්තු පනවා ඇත්තේ ලේකම්වරයා විසින් 2015.11.13 දින ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනයක් මගිනි. මෙම නිවේදනයට පාදක කරගත් තීරණය මෙහි සඳහන් නොවේ. ගැසට් නිවේදනයේ පළමු ඡේදයේ නගර සභා ආඥා පනතේ **162 (1) වගන්තිය** සමග කියවිය යුතු එම පනතේ **164(1) වගන්තිය** යටතේ මෙම බලපත්‍ර ගාස්තු පනවන බව සඳහන් කර ඇත. එහෙත් සභාවේ සභිකයින් නොමැති වකවානුවක සභාවේ බලතල හා කර්තව්‍යයන් වූ ආදායම් පැනවීම ලේකම්වරයා විසින් ඉටුකරනු ලබන විට ඒ සඳහා ඔහුට බලය පැවරෙන බලදායී වගන්තිය අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුවේ. එහෙත් මෙම නිවේදනයේ කිසිම තැනක ඒ ගැන සඳහන් නොවේ. තවද 162 (1) උප වගන්තියේ (ආ) ඡේදය හා 164 (1) වන උප වගන්තිය යනුවෙන් ඉහතින් සඳහන් කළ වගන්තිය නිවැරදි විය යුතු අතර එහි ඇති **පනතේ** යන්න එම ආඥා පනතේ යනුවෙන් නිවැරදි විය යුතුය. නිවේදනයේ දෙවන ඡේදයේ ද ඉහත සඳහන් කළ සමහර සාවද්‍ය තත්වයන් එසේම දක්වා තිබීම ද 1939 අංක 69 දරන නගර සභා ආඥා පනත ගැන සඳහන් කරුණ ද සාවද්‍ය වේ.

ඒ අනුව මෙම නිවේදනය අවිධිමත් හා බලරහිත බවට පත්වීම දැඩි අවධානයට ලක්විය යුතු කරුණකි. මේ සමඟ ඇති උප ලේඛනයේ බලපත්‍ර ලබාගත යුතු වෙළඳාම් 15 ක් සඳහන් කර ඇත. ඒ අතුරින් අවස්ථා දෙකක් බඩු වෙළඳාම සඳහා ගබඩාකර තබා ගැනීම සම්බන්ධයෙනි. ගබඩා කිරීම යනු වෙළඳ ව්‍යාපාරයක් නොවේ. එසේම අංක 15 යටතේ දක්වා ඇති ගිණිකෙළි හා රතිඤ්ඤා වෙළඳාම පුපුරණ ද්‍රව්‍ය ආඥා පනත යටතට ගැනෙන වෙළඳාමක් හෙයින් ඒ සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ අධිකාරය ඇත්තේ රජයේ දිසාපතිවරයාටය. කෙසේ වෙතත් හොරණ නගර සභාවට අතුරු ව්‍යවස්ථා ආවරණය සහිත වෙළඳාම් තෝරා බේරා ගෙන බලපත්‍ර ගාස්තු පැනවීම සිදුකර තිබීම ගැන ප්‍රසංශාව හිමිවිය යුතුය.

5.6.2.5 කුලියාපිටිය නගර සභාව

2016 වර්ෂය සඳහා කුලියාපිටිය නගර සභාවේ බලපත්‍ර ගාස්තු පනවන බව සඳහන් නිවේදනය 2016.01.01 දිනකි අංක 1948 දරන ගැසට් පත්‍රයේ පළකර ඇත. එහෙත් එය පළකළේ කවරෙකු විසින් ද යන්න යථෝක්ත නිවේදනයේ සඳහන් කර නැත. එසේම නගර සභා ආඥා පනතේ

184 (අ) වැනි වගන්තියක් සමග කියවිය යුතු එම පනතේ 162 වැනි වගන්තිය හා 164 වැනි වගන්තිය ප්‍රකාර බලපත්‍ර ගාස්තු පනවන බව සඳහන් වේ. මේ සඳහන් කිරීම් සියල්ල දෝෂ සහිත හා සාවද්‍ය වේ. නගර සභා **ආඥා පනතේ 184 (අ) යනුවෙන්** වගන්තියක් නැත. එය 184 අ වගන්තිය විය යුතුය. එසේම **එම පනත නොව** " එම ආඥා පනතේ 162 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ආ) ඡේදය සමග කියවිය යුතු 164 වන වගන්තිය" යනුවෙන් සංශෝධනය විය යුතුය.

මෙම නිවේදනයේ උප ලේඛනයෙහි බලපත්‍ර ලබාගත යුතු වෙළඳාම් 85 ක් සම්බන්ධයෙන් ගාස්තු පනවා ඇත. ඒ අතුරින් ගබඩා කිරීම් 28 ක් සඳහා බලපත්‍ර ගාස්තු පනවා ඇත. ගබඩා කිරීම් ව්‍යාපාරයක් වන්නේ ගබඩාවක් හිමි පුද්ගලයෙකු හෝ ආයතනයක් විසින් වෙනත් තැනැත්තෙකුගේ භාණ්ඩ ගබඩාකර ඒ සඳහා ගාස්තුවක් අයකර ගත්තේ නම් පමණි. ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීමට නම් එබඳු ගබඩා විධිමත් කිරීම සඳහා නගර සභාව මගින් අතුරු ව්‍යවස්ථා පනවා තිබිය යුතුය. දැනට මෙබඳු අතුරු ව්‍යවස්ථාවක් කුලියාපිටිය නගර සභාව පනවා නැත.

තවද මෙම උප ලේඛනයේ විෂයාංක 23 යටතේ සඳහන් කර ඇති " පශු වෛද්‍ය ගිලන් හලක් පවත්වා ගෙනයාම" වෘත්තීය කාර්යයකි. ඒ සඳහා බදු හෝ බලපත්‍ර නිකුත් කිරීමේ බලය නගර සභා වෙත පවරා නැත. එසේම විෂයාංක 61 හා 62 යටතේ සඳහන් කර ඇති බනිජ තෙල් ගබඩාකර විකිණීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ බලය විෂයභාර අමාත්‍යවරයා විසින් නාගරික පළාත් පාලන ආයතන වෙත නියෝග මගින් පවරා දී ඇත. ඒ සඳහා වූ බලපත්‍ර ගාස්තු එකී නියෝග වල නියම කර ඇත. එම නියෝග නොසලකා හැර බලපත්‍ර ගාස්තු නියම කිරීම බලාතික්‍රමණය කිරීමකි. මේ කරුණු අනුව 2016 වර්ෂය සඳහා කුලියාපිටිය නගර සභාව පනවා ඇති බලපත්‍ර ගාස්තු අවිධිමත් හා දෝෂ සහගත බව නිරීක්ෂණය වේ.

5.6.2.6 පුත්තලම නගර සභාව

2016 වර්ෂය සඳහා පුත්තලම නගර සභාවේ බලපත්‍ර ගාස්තු පැනවීමට අදාල නිවේදනය එහි විශේෂ කොමසාරිස්වරයා විසින් 2015.12.04 දිනකි අංක 1944 දරන ගැසට් පත්‍රයේ පළකර තිබේ. එය සිදුකර ඇත්තේ 2015 සැප් මස 30 වැනි දින පවත්වන ලද කමිටු රැස්වීමක තීරණ අංක 22 යටතේ බව දැක්වේ. නගර සභා ආඥා පනතේ විධි විධාන අනුව බලපත්‍ර ගාස්තු

පැනවීමේ බලය ඇත්තේ සභාවට මිස කමිටුවලට නොවේ. එබැවින් මෙම නිවේදනය බලරහිත හා ශූන්‍ය වේ.

ඒ හැර මීට අදාල "යෝජනාවෙහි" සඳහන් වන්නේ 255 අධිකාරය වන නගර සභා ආඥා පනතේ **184 (අ) වගන්තිය** සහ **164 (1) වගන්තිය** යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බලපත්‍ර ගාස්තු නියම කිරීමට මා වෙත බලය පැවරී ඇති බවයි. අනතුරුව එහි දෙවන ඡේදයේ නගර සභා ආඥා පනතේ 184 (අ) 9.3 වගන්තිය සමග කියවිය යුතු 164 (1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලය ප්‍රකාර යනුවෙන් දැක්වේ. මෙහිදී " මා" යනු සභාවේ විශේෂ කොමසාරිස්වරයා බව හැගේ. නගර සභා ආඥා පනතේ 184 අ වගන්තිය ප්‍රකාර සභාවේ සභිකයින් නොමැති වකවානුවක එහි බලතල කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ බලය සභාවේ ලේකම්වරයාට හිමිවේ. එහෙත් එම වගන්තිය ප්‍රකාර එම බලය විශේෂ කොමසාරිස්වරයෙකු හට හිමි නොවේ.මේ අනුව පුත්තලම නගර සභාවේ 2016 වසරේ ආදායම් පැනවීම් ප්‍රබල අභියෝගයට ලක්වීමේ අවදානමක් ඇති බව පෙනේ. එබැවින් මෙම ක්‍රියාමාර්ගය නීතියට පටහැනි වූවක් බව පෙනී යයි. තවද ඉහත දෙවන ඡේදයේ දැක්වෙන පරිදි නගර සභා ආඥා පනතේ 184 (අ) 9.3 වගන්තියක් නගර සභා ආඥා පනතේ නොමැති බවද පෙන්වා දිය යුතුව ඇත. මීට අමුණා ඇති උපලේඛනයෙහි බලපත්‍ර ගාස්තු අයකිරීමට අදාල වන වෙළඳාම් 107 ක ලැයිස්තුවක් දක්වා ඇත. එයින් වෙළඳාම් 27 ක් ගබඩා කිරීම් වේ. ගබඩා කිරීම් වෙළඳ ව්‍යාපාරයක් නොවේ. එය ව්‍යාපාරයක් වීමට නම් ගබඩාවක් හිමි අයෙකු හෝ ආයතනයක් වෙනත් තැනැත්තෙකුගේ බඩු ගබඩා කොට තබා ඒ සඳහා ගාස්තුවක් අයකළ යුතුවේ. එසේම එබඳු ස්ථාන විධිමත් කිරීමට නගර සභාව සතුව අතුරු ව්‍යවස්ථාවක් ද තිබිය යුතුය. එසේ නොමැතිව බලපත්‍ර ගාස්තු පැනවිය නොහැකිය. තවද මෙම උප ලේඛනයේ සඳහන් වෙළඳාම් අතුරින් සෑහෙන සංඛ්‍යාවක් කර්මාන්ත බද්දට යටත් විය යුතු ඒවා බව පෙනේ. මෙම ලේඛනයේ විෂයාංක 03 යටතේ අළුත් මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම යන්න දැක්වේ. මේ සඳහා සභාපතිවරයා ඝෝගාතක ආඥා පනත යටතේ බලපත්‍ර නිකුත් කළ යුතුවේ. විෂයාංක 14 ගිණිකෙළි භාණ්ඩ නිෂ්පාදන හා ගබඩා කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම රජයේ දිසාපතිවරයාගේ කාර්යයකි. විෂයාංක 57 හා 58 හා 81 පිළිවෙලින් භූමිතෙල් ගබඩාවක් / ඩීසල් ගබඩාවක් හා පෙට්‍රල් ඩීසල් හෝ වෙනත් බණිජ තෙල් ගබඩාවක් පවත්වාගෙන යාම ලෙස දැක්වේ. මේ සඳහා බලපත්‍ර දීම නගර සභා වෙත

විෂයභාර අමාත්‍යවරයා විසින් බනිජතෙල් ආඥා පනතේ ප්‍රතිපාදන මත පවරා බලපත්‍ර ගාස්තු නියම කරමින් නියෝග පනවා ඇත. ඒ පිළිබඳව නොසලකා පුත්තලම නගර සභාව ඒ වෙනුවෙන් බලපත්‍ර ගාස්තු පනවා ඇතත් එය බලාතික්‍රමණයකි. තවද විෂයාංක 92 යටතේ පෞද්ගලික විගණන ආයතනයක් පවත්වා ගෙන යාම හා විෂයාංක 107 යටතේ ඇස් පරීක්ෂා කිරීම යන්න වෘත්තීය කටයුතු වන අතර වෘත්තීන් සඳහා බදු හෝ බලපත්‍ර ගාස්තු පැනවීමේ බලය නගර සභා වෙත පවරා නැත. ඉහත කරුණු අනුව පෙනීයන්නේ පුත්තලම නගර සභාව 2016 වර්ෂය සඳහා සිදුකර ඇති බලපත්‍ර ගාස්තු පැනවීම විධිමත් හා නීතියට අනුකූලව සිදුවී නොමැති බවයි.

5.6.2.7 ගම්පොල නගර සභාව

2016 වර්ෂය සඳහා ගම්පොල නගර සභාවේ බලපත්‍ර ගාස්තු පනවා ඇත්තේ විශේෂ කොමසාරිස්වරයා ගේ තීරණයක් මත 2015.10.13 දිනැති අංක 1939 දරන ගැසට් පත්‍රයේ ගම්පොල නගර සභාවේ විශේෂ කොමසාරිස්වරයා විසින් පළකරනු ලබන ගැසට් නිවේදනය මගිනි. මෙම නිවේදනයේ විශේෂ කොමසාරිස්වරයාට නගර සභාවේ බලතල හිමිවන ආකාරය, බලදායී වගන්තිය සමග සඳහන් කර නැත. එසේම මෙම නිවේදනයෙහි බලපත්‍ර ගාස්තු සමග ව්‍යාපාර බදු, වාහන හා සත්ව බදු, කර්මාන්ත බදු ආදී බොහෝ බදු එකම නිවේදනයේ අතිශයින් ව්‍යාකූල ලෙස පනවා ඇත. නගර සභාවක සභිකයින්ගේ ධුර කාලය අවසන් වූ විටෙක ලේකම් වරයා ආඥා පනත් 184 අ වගන්තිය ප්‍රකාර බලය භාවිතා කළ යුතුය. මේ වගන්තිය අනුව විශේෂ කොමසාරිස්වරයාට මෙම බලතල නීත්‍යානුකූලව පැවරිය නොහැක.

මෙම නිවේදනයට අදාල කර ඇති ලේඛනයේ බලපත්‍ර ගතයුතු ව්‍යාපාර 15, අන්තරායකාරී වෙළඳාම් 20, අප්‍රසන්න ව්‍යාපාර 29, අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර 10 ක්, නැවත අප්‍රසන්න ව්‍යාපාර 29 ක් ආදි වශයෙන් බලපත්‍ර ගතයුතු වෙළඳ ව්‍යාපාර 303 ක් ඇත. මේ අතුරින් බහුතරයක් වෙළඳ ව්‍යාපාර එනම් 41 ක්ම වෙළඳාම සඳහා බඩු ගබඩාකර තබාගැනීම් වේ. එය බලපත්‍ර ලබාදිය හැකි ව්‍යාපාරයක් නොවේ. මෙම දීර්ඝ ලේඛනයේ ඇති ව්‍යාපාර 303 න් අතුරු ව්‍යවස්ථා පනවා ඇත්තේ වෙළඳාම් ඉතා සීමිත සංඛ්‍යාවකට පමණි. සෙසු සියල්ල කර්මාන්ත බද්දට යටත් කළ යුතු ව්‍යාපාරයන් වේ.

ඉහත කරුණු අනුව කිසිදු බලය පැවරීමකින් තොරව විශේෂ කොමසාරිස්වරයා විසින් ඉතා අවිධිමත්ව මෙම බලපත්‍ර ගාස්තු පැනවීම සිදුකර ඇති හෙයින් මෙය නීතියට පටහැනි පැනවීමක් බව පෙන්වා දිය හැකිය.

5.6.2.8 තලවාකැලේ ලිඳුල නගර සභාව

2016 වර්ෂය සඳහා තලවාකැලේ ලිඳුල නගර සභාව බලපත්‍ර ගාස්තු පනවා ඇත්තේ ලේකම්වරයා විසින් 2015.12.04 දිනැති අංක 1944 දරන ගැසට් පත්‍රයේ පළකර ඇති නිවේදනයක් මගිනි. ඔහුට ඒ සඳහා බලය පැවරුන ආකාරය මෙම නිවේදනයේ සඳහන් නොවේ. සභාවක ලේකම් වරයෙකුට බදු හා බලපත්‍ර ගාස්තු පැනවීමට බලය පැවරී නැත. එය සභාව සතු බලයකි. සභාව සභිකයන් සහිතව ක්‍රියාත්මක නොවන විටක එහි බලතල කාර්ය හා කර්තව්‍ය නගර සභා ආඥා පනතේ 184 අ වගන්තිය යටතේ එහි ලේකම්වරයාට ලැබේ. එය සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමේදී පැහැදිළිව සඳහන් කළයුතුවේ. මෙහිදී අදාල පැනවීම් සඳහා බලය පැවරුන ආකාරය දක්වා නැති හෙයින් මෙම පැනවීම නීතියට පටහැනි හා බලරහිත වූවක් බවට පත්වේ.

තවද මෙහි බලපත්‍ර ගාස්තු කර්මාන්ත බදු, ව්‍යාපාර බදු, සංවර්ධනය නොකළ ඉඩම් මත බදු හා ඇතැම් ඉඩම් විකිණීම් විෂයෙහි බදු හා බලපත්‍ර ගාස්තු මෙම එකම නිවේදනය මගින් පනවා ඇත. මෙය ඉතාමත් අවිධිමත් හා ව්‍යාකූල ආදායම් පැනවීමකි. ඒ හැර මෙම ඡේදයේ අවසන් කොටසෙහි " මෙම පනවා ඇති බලපත්‍ර ගාස්තු හා බදු වලට අමතරව රජය විසින් පනවනු ලබන අනෙකුත් බදු වර්ග ද අයකරනු ලැබේ" යනුවෙන් ද සඳහන් කර ඇත. එය අතිශයින් මවිතය දනවන කරුණකි. රජය පනවන බදු වර්ග මෙම බදුවලට අමතරව නගරයේ වෙළඳ හා ව්‍යාපාර හිමියන්ගෙන් අයකිරීමට නගර සභාවේ ලේකම් වෙත බලය පවරා ද නැත.

තවද එම බලපත්‍ර ලබාගත යුතු බවට පනවා ඇති වෙළඳ බලපත්‍ර ලේඛනයේ ගබඩා කිරීම් 18 ක් ඇතුළත් කොට ඇත. විකිණීම සඳහා භාණ්ඩ තොගයක් තමා සන්තකව තබාගැනීම ගබඩා කිරීමේ ව්‍යාපාරයක් නොවේ. එසේම මෙම ලේඛනයේ 63 හා 64 විෂයාංක යටතේ පෙට්‍රල්, ඩීසල්, ඛණිජ තෙල් අලෙවිය, ඉන්ධන පිරවුම් හලක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ගාස්තු පනවා ඇත. ඛනිජ තෙල් ආඥා පනත යටතේ අමාත්‍යවරයා විසින් නියෝග මගින් මෙම පරිශ්‍ර

සඳහා බලපත්‍ර දීම නගර සභා වෙත පවරා ඊට අයකළ යුතු බලපත්‍ර ගාස්තු නියම කර ඇත. මෙහිදී ලේකම්වරයා එම නීති නොසලකා හැර බලපත්‍ර ගාස්තු පනවා ඇත.

ඉහත කරුණු අනුව පෙනී යන්නේ තලවාකැලේ බිඳුල නගර සභාවේ ලේකම්වරයා 2016 සඳහා පනවා ඇති බලපත්‍ර ගාස්තු පිළිබඳ නිවේදනය ශූන්‍ය හා බලරහිත වූවක් සේම නීතියට පටහැනි වූවක් ද වන බවයි.

5.6.2.9 ඇඹිලිපිටිය නගර සභාව

2016 වර්ෂය සඳහා ඇඹිලිපිටිය නගර සභාවේ බලපත්‍ර ගාස්තු පැනවීම, එහි ලේකම්වරිය විසින් 2015.10.07 දින ගනු ලැබූ තීරණයක් පරිදි 2015.11.06 වන දිනැති අංක 1940 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනයක් මගින් සිදුකර ඇත. මෙම නිවේදනය සමග අදාල තීරණය ද යෝජනාවක් යනුවෙන් සඳහන් කර පළකර තිබේ.

මෙම නිවේදනයේ හා තීරණයේ බොහෝ ස්ථාන වලට ලේකම්වරිය ප්‍රස්තුත පැනවීම සඳහා බලය ලැබී ඇත්තේ නගර සභා ආඥා පනතේ 184 (අ) වගන්තිය යටතේ බව දක්වා ඇත. එබඳු වගන්තියක් නගර සභා ආඥා පනතේ නැත. මෙම බලදායී **<u>වගන්තිය නගර සභා ආඥා පනතේ 184 අ ලෙස නිවැරදි විය යුතු</u>**ය. එසේම මෙහි නගර සභා ආඥා පනත හැඳින්වීමට කිහිප ස්ථානයකම **<u>එම පනතේ</u>** යනුවෙන් දක්වා ඇත. ඒ සියල්ල **<u>එම ආඥා පනතේ</u>** යනුවෙන් නිවැරදි විය යුතුය.

මෙම වැරදි හේතුකොට ගෙන අදාල පැනවීම් සාවද්‍ය වන හෙයින් එය දෝෂ සහගත හා සාවද්‍ය නිවේදනයක් ලෙස සැලකීමට සිදුවේ. මෙහි ඇති උප ලේඛනයේ බලපත්‍ර ලබාගත යුතු කාර්යයන් 37 ක් ඇතුලත් වේ. ඒ අතුරින් 06 ක් විකිණීම සඳහා වෙළඳසැල් හිමියන් විසින් තමා සන්තකයේ බඩු තොගයක් තබාගැනීම් වේ. මෙය ගබඩා කිරීමේ ව්‍යාපාරයක් නොවේ. ඉහත කී අඩුපාඩු හැරුණු විට මෙහි වෙනත් ප්‍රබල අඩුපාඩු නිරීක්ෂණය නොවීය.

5.6.2.10 හික්කඩුව නගර සභාව

2016 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම සම්බන්ධයෙන් හික්කඩුව නගර සභාව ක්‍රියාකර ඇත්තේ 2015. 12. 23 දිනැති අංක 1947 දරණ ගැසට් පත්‍රයේ ලේකම්වරයා විසින් පළකරන ලද නිවේදනයක් මගිනි. මෙම නිවේදනයෙහි අන්තර්ගතය සාවද්‍ය වේ. එහි දක්වා ඇත්තේ

"පහත උපලේඛනයේ I තීරුවේ සඳහන් එක් බලපත්‍රයක් වෙනුවෙන් එම උප ලේඛනයේ II තීරුවේ ඒ එක් එක් ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන....." යනුවෙනි.

මෙම ප්‍රකාශයෙහි කිසිදු අර්ථයක් ඇති බවක් නොපෙනේ. මේ සමඟ ඇති උප ලේඛනයේ බලපත්‍ර ගාස්තු පනවා ඇති වෙළඳාම් 74 ක් දැක්වේ. මේ අතුරින් 09 ක් වෙළඳාම සඳහා සිය පරිශ්‍රයේ බඩු තොගයක් තබාගැනීම සඳහා වූ ස්ථාන සඳහා ගබඩා කිරීම් ව්‍යාපාරයක් සේ සලකා කරන ලද බලපත්‍ර ගාස්තු පැනවීමය. මෙය සාවද්‍ය පරිචයකි.

එසේම මෙම ලේඛනයෙහි විෂයාංක 51 හා 52 පෙට්‍රල්, ඩීසල් හෝ වෙනත් ඛනිජ තෙල් වර්ගයක් ගබඩා කිරීම, පෙට්‍රල් නිකුත් කරන ස්ථානයක් පවත්වාගෙන යාමේ ස්ථානයක් පවත්වාගෙන යාම වෙනුවෙන් බලපත්‍ර ගාස්තු පනවා ඇත. ඛනිජ තෙල් ආඥා පනත යටතේ විෂයභාර ඇමතිවරයා විසින් මෙම බලපත්‍ර නිකුත් කිරීමේ බලය පළාත් පාලන ආයතන වෙත පවරා ඊට අදාල ගාස්තු නියෝග මගින් නියම කර ඇත. එම නියෝග නොසලකා හැර නගර සභාව විසින් බලපත්‍ර ගාස්තු පනවා අයකිරීම බලාතික්‍රමණයට යටත්වන දෝෂ සහගත තත්වයකි.

එසේම මෙම ලේඛනයෙහි සඳහන් අන්තරාකාරී ව්‍යාපාර, අප්‍රසන්න ව්‍යාපාර හා අන්තරායකාරී හා අප්‍රසන්න ව්‍යාපාර වෙනුවෙන් ඒ ඒ ව්‍යාපාර වර්ග සඳහා වෙන වෙනම අතුරු ව්‍යවස්ථා සම්මත කර තිබිය යුතුය. එසේ නොමැති නම් ඒ සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම මෙන්ම අයකිරීම ද නීත්‍යානුකූල නොවේ. මේ කරුණු අනුව 2016 වර්ෂය සඳහා හික්කඩුව නගර සභාව වෙනුවෙන් පනවා ඇති බලපත්‍ර ගාස්තු නිවේදනය දෝෂ සහගත බව පෙනීයයි.

5.6.2.11 හපුතලේ නගර සභාව

2016 වර්ෂය සඳහා හපුතලේ නගර සභාව සම්බන්ධයෙන් බලපත්‍ර ගාස්තු පැනවීම සිදුකර ඇත්තේ වැඩ බලන ලේකම් විසින් 2015.12.11 දිනැති අංක 1945 දරන ගැසට් පත්‍රයේ පළකර ඇති නිවේදනය මගිනි. මෙම නිවේදනයේ සඳහන් වෙළඳ ව්‍යාපාර 106 සඳහා බලපත්‍ර ගාස්තු පනවන බවට ඉහත ඡේදයේ සඳහන් වේ. ලේකම්වරයා විසින් නොයෙක් වෙළඳාම් සඳහා විවිධ ගාස්තු පනවා ඇතත් ඒ සඳහා තමා වෙත බලය පැවරෙන කිසිදු වගන්තියක් සඳහන් කර නැත. නගර සභා ආඥා පනතේ 184 අ වගන්තියෙන් සභාපතිවරයා සහ උප

සභාපතිවරයා විසින් ධූර දැරීම අවසන් කිරීම හේතුවෙන් ස්වකීය කර්තව්‍ය ඉටුකිරීමට නගර සභාවකට නොහැකි වන අවස්ථාවක, ජන්ද විමසීමකින් සභාපති, උප සභාපති, සභික පුරප්පාඩු පුරවන තුරු සභාවේ කර්තව්‍ය, කාර්ය හා බලතල ලේකම්වරයා වෙත පවරනු ලැබ ඇත. ඒ අනුව ගැසට් පත්‍රයේ සඳහන් බලපත්‍ර ගාස්තු පැනවීම සඳහා තමාට බලය පැවරෙන වගන්ති සම්බන්ධයෙන් ලේකම්වරයා කිසිවක් සඳහන් කර නැත. එබැවින් මෙම නිවේදනය මගින් කර ඇති සියලු පැනවීම් ශූන්‍ය හා බලරහිත වේ.

තවද එහි ඇති උප ලේඛනයෙහි විෂයයන් 106 ක් දක්වා ඇත. බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා අතුරු ව්‍යවස්ථාවක් තිබීම අත්‍යාවශ්‍ය වේ. යථෝක්ත ලැයිස්තු අංක 23 සිට අංක 106 දක්වා විෂයයන්ට අදාලව බලපත්‍ර නිකුත් කළ නොහැකිය. එම ව්‍යාපාර වලින් මහජන සෞඛ්‍යයට බලපෑමක් නොවන හෙයිනි. නගර සභා ආඥා පනතේ 164 වන වගන්තියේ විධිවිධාන අනුව, 164 (1) උප වගන්තියේ " පැනවීමට නගර සභාවකට 162 වන වගන්තියෙන් බලය ලැබී ඇති බලපත්‍ර ගාස්තු මේ ආඥා පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් අනුව වූ යම් විශේෂ කාර්යයක් සඳහා යම් ස්ථානයක් හෝ තැනක් පාවිච්චි කිරීමට බලය පවරමින් සභාව විසින් දෙන ලද එක් එක් බලපත්‍රය සම්බන්ධයෙන් පැනවිය යුතුය."යනුවෙන් පැහැදිලිව දක්වා ඇත. එහෙත් හපුතලේ නගර සභා ලේකම් වරයා මෙම තත්වය නිවරදිව වටහාගෙන නැත.

ව්‍යාපාර ලැයිස්තුවේ 81 යටතේ පෞද්ගලික ළදරු පාසැලක් පවත්වාගෙන යාම සඳහා ද අංක 89 යටතේ රේස් ඔට්ටු කාර්යාලයන් පවත්වාගෙන යාම සඳහා ද බලපත්‍ර ලබාගත යුතු බව දන්වා තිබේ. එසේම මෙම ලේඛනයෙන් විකිණීම සඳහා බඩු තොග තබාගෙන ඇති ස්ථාන 26 ක් ගබඩා කිරීම වශයෙන් ද, විෂයාංක 60 මල්වෙඩි, රතිඤ්ඤා, ගිනිකෙළි භාණ්ඩ විකිණීම් ස්ථානයක් සඳහා ද වශයෙන් බලපත්‍ර නිකුත් කිරීමට අදාල නොවන ව්‍යාපාර රාශියක් ඇතුලත් කොට ඇත. මේ අනුව හපුතලේ නගර සභාවේ වැඩ බලන ලේකම්වරයා මෙම විෂය පිළිබඳ ප්‍රමාණවත් දැනුමකින් තොරව මෙම පැනවීම් කර ඇති බව පෙනේ. ඒ සියල්ල අවිධිමත් හා නීතියට පටහැනි පැනවීම් බව පෙනේ.

5.6.2.12 ත්‍රිකුණාමලය නගර සභාව

ත්‍රිකුණාමලය නගර සභාව 2016 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු හෝ වෙනත් ආදායම් පිළිබඳ පැනවීම් කිසිවක් ගැසට් පත්‍රයේ පළකර නැත. පළාත් පාලන ආයතනයක් මගින් පනවනු ලබන

වරිපනම්, බලපත්‍ර ගාස්තු, බදු හා වෙනත් ආදායම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වන ව්‍යවස්ථාවෙහි ප්‍රතිපාදන පදනම් කොට පැනවිය යුතු අතර ඒවා අතුරු නීති ලෙස නීතිය ඉදිරියේ සැලකේ. 2 වන අධිකාරය වූ අර්ථ නිරූපණ ආඥා පනතේ 17 වගන්තියේ (1) වැනි උප වගන්තියේ (ඊ) ඡේදය ප්‍රකාර පළාත් පාලන ආයතනයක අනු නීති සියල්ල ගැසට් පත්‍රයේ පළකිරීම අනිවාර්ය වේ. ත්‍රිකුණාමලය නගර සභාවේ ලේකම්වරයා 2016 වර්ෂයට අදාල ව්‍යවස්ථාපිත නිවේදනය පරිපාලනමය නියෝග ලෙස නම් කර ඇති බවත්, ඒ කිසිවක් ගැසට් පත්‍රයේ පළකර නොමැති බවත් පර්යේෂණ අධ්‍යයනයේදී අනාවරණය විය. මේ අනුව මෙම නගර සභාවට 2016 වර්ෂය සඳහා වරිපනම්, බදු හෝ බලපත්‍ර ගාස්තු ආදී කිසිම ආදායමක් අයකළ නොහැකි වේ. මෙය අතිශය බැරෑරුම් තත්වයකි.

5.6.2.13 කාතන්කුඩි නගර සභාව

2016 වර්ෂය සඳහා කාතන්කුඩි නගර සභාව විසින් බලපත්‍ර ගාස්තු පනවා ඇත්තේ එහි ලේකම්වරයා විසින් 2016.05.27 වන දින අංක 1969 දරන ගැසට් පත්‍රයෙහි පළකරන ලද නිවේදනයක් මගිනි. මෙම නිවේදනය මගින් බලපත්‍ර ගාස්තු පැනවීමේදී එම වර්ෂයේ ජනවාරි මස 01 දින සිට බල පැවැත්වෙන ගාස්තු පනවා ඇත්තේ 2016 මැයි මාසයේ 27 වැනි දින දීය. කිසිම පළාත් පාලන ආයතනයකට අතීතයට බලපාන පරිදි ආදායම් පැනවීම හෝ කිසිම අතුරු නීතියක් සෑදීම කළ නොහැකිය. ඒ අනුව මෙම නිවේදනය සාවද්‍ය හා බලරහිත වූවක් බවට පත්වේ.

තවද මෙම නිවේදනයේ **255 අධිකාරය වන නගර සභා ආඥා පනතේ 184 (අ) වන වගන්තිය** යනුවෙන් සඳහන්වේ. එබඳු වගන්තියක් නගර සභා ආඥා පනතේ නොමැත. එය **" නගර සභා ආඥා පනතේ 184 අ වගන්තිය"** ලෙස නිවැරදි විය යුතුය. කෙසේ වෙතත් මෙම නිවේදනය සමඟ ඇති උප ලේඛනයේ බලපත්‍ර ගාස්තු පනවා ඇති වෙළඳ ව්‍යාපාර ලේඛනය සභාව පිළිගෙන ඇති අතුරු ව්‍යවස්ථා ප්‍රමාණයට සමපාත වන ලෙස නිවැරදිව සඳහන් කර තිබීම යහපත් ලක්ෂණයකි.

5.6.2.14 පේදුරුතුඩුව නගර සභාව

2016 වර්ෂය සඳහා පේදුරුතුඩුව නගර සභාව විසින් බලපත්‍ර ගාස්තු පනවා ඇත්තේ එහි ලේකම්වරයා විසින් 2016.02.19 වන දින අංක 1955 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනයක් මගිනි. මෙම නිවේදනය මගින් 2016.01.01 දින සිට බලපත්‍ර ගාස්තු පනවා එය ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර ඇත්තේ අතීතයට බලපාන පරිදි 2016.02.19 වන දින දීය. මෙය අතිශය සාවද්‍ය හා නීතියට පටහැනි ක්‍රියා මාර්ගයකි.

එසේම මෙම නිවේදනයේ සඳහන් පරිදි ලේකම්වරයාට බලපත්‍ර ගාස්තු පැනවීමට බලය පැවරී ඇති ආකාරය දක්වා නැත. ඒ අනුව සභාව සතු කාර්යයක් එහි මහජන නියෝජිතයන්ගේ ධූර කාලය අවසන්ව ඇති විටෙක ලේකම්වරයාට පැවරෙන ආකාරය ඉහත නිවේදනයේ කිසිම තැනක සඳහන් නොවේ. එබැවින් එය බලරහිත හා ශූන්‍ය පැනවීමක් හා ප්‍රකාශයක් බවට පත්වේ. මේ අනුව සභාවට එම ආදායම් කිසිවක් අයකිරීමට නීතිමය බලයක් නොලැබේ.

තවද මෙයට සම්බන්ධ බලපත්‍ර ගාස්තු පනවා ඇති උපලේඛනයේ වෙළඳ ව්‍යාපාර 72 ක් ඇතුළත්වේ. මේ අතුරින් ව්‍යාපාර විශාල සංඛ්‍යාවක් කර්මාන්ත බද්ද පැනවීම සඳහා අදාල වන ව්‍යාපාර වේ. සභාව වැළඳගෙන ඇති අතුරු ව්‍යවස්ථා ප්‍රමාණයෙන් ආවරණය වන වෙළඳාම් සඳහා පමණක් බලපත්‍ර නිකුත් කළ යුතු වන හෙයින් මෙම ලේඛනය සාවද්‍ය වේ. තවද මෙම නිවේදන කිසිවක් සිංහල හෝ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළකර නොමැති විම ව්‍යවස්ථාපිත වගකීම් නොසලකා හැරීමකි.

5.6.2.15 වව්නියාව නගර සභාව

2016 වර්ෂය සඳහා වව්නියාව නගර සභාව විසින් බලපත්‍ර ගාස්තු පනවා ඇත්තේ එහි ලේකම්වරයා විසින් 2016.01.14 වන දින අංක 1950 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනයක් මගිනි. මෙම නිවේදනය මගින් 2016.01.01 දින සිට බලපත්‍ර ගාස්තු අයකිරීමේ නිවේදනය ගැසට් පත්‍රයේ පළකර ඇත්තේ අතීතයට බලපාන පරිදි 2016 ජනවාරි මස 14 වැනි දින දීය. මෙය නීතියට පටහැනි සාවද්‍ය ක්‍රියා මාර්ගයකි.

එසේම මෙම නිවේදනය ලේකම්වරයා පළ කරනුයේ සභාව ක්‍රියාත්මක නොවන හෙයින් එහි බලතල ක්‍රියාත්මක කිරීමේ නිලධාරියා වශයෙනි. එහෙත් යථෝක්ත නිවේදනයේ කිසිම තැනක

ඔහුට බලය ලැබී ඇති බලදායී වගන්තිය සඳහන් කර නැත. එබැවින් මෙම නිවේදනය ශූන්‍ය හා බලරහිත වේ.

තවද මීට අමුණා ඇති අංක I උප ලේඛනයෙහි බලපත්‍ර ලබා ගතයුතු ව්‍යාපාර 75 ක් ද, අංක II උප ලේඛනයේ ව්‍යාපාර 25 ක්ද, වශයෙන් ව්‍යාපාර 100 ත් ඇතුළත් වේ. මේ අතුරින් අලෙවිය සඳහා බඩු තොග තබාගෙන ඇති ස්ථාන 06 ක් ගබඩා ලෙස දක්වා ඇත. ඊට අමතරව ජනතාවගේ මහජන සෞඛ්‍යයට බලපෑමක් ඇති නොවන ව්‍යාපාර රාශියක් මෙහි ඇතුළත්ව තිබේ. ඒ සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නැති අතර බලපත්‍ර ගාස්තු පැනවිය නොහැකිය. ඒවා කර්මාන්ත බද්ද යටතට ගතයුතුවේ.

එසේම මෙම නිවේදනයේ නගර සභා ආඥා පනතේ 164 (2), 165 වගන්ති 14, 15 ප්‍රකාර බලපත්‍ර ගාස්තු හා බදු පනවා ..... යනුවෙන් සඳහන් වේ. මෙබඳු විධිවිධාන නගර සභා ආඥා පනතේ නොමැති බැවින් මේ පිළිබඳව තවදුරටත් සොයා බැලීම වැදගත් වේ. කෙසේ වෙතත් උක්ත දෝෂ සහගත තත්ත්වය හේතුකොට ගෙන මෙම පැනවීම මෙන්ම අදාල නිවේදනය ද නීත්‍යානුකූල නොවන බව පෙන්වා දෙනු කැමැත්තෙමි.

බලපත්‍ර ගාස්තු යනු ලංකාවේ නගර සභා / පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් සලකා බලන කල ඉතා වැදගත් ස්වයං උත්පාදිත ආදායම් විශේෂයකි. එමගින් නගර සභා බල ප්‍රදේශයක පවත්වාගෙන යනු ලබන මහජනතාවගේ සෞඛ්‍යයට හා සනීපාරක්ෂාවට සෘජුව බලපාන වෙළඳ ව්‍යාපාර මහජනතාවගේ සෞඛ්‍යයට හිතකර ලෙස පවත්වාගෙන යාම සහතික කරන ප්‍රබලතම මෙවලමකි. සෑම බලපත්‍රයක්ම නිකුත් කළ යුත්තේ විධිමත් අතුරු ව්‍යවස්ථාවක ප්‍රතිපාදන මතය. ඒ අනුව මෙතරම් වැදගත් ආදායම් ප්‍රභවයක් හා මහජන සෞඛ්‍ය ආරක්ෂා කරන මෙවලමක් සම්බන්ධයෙන් එම ආයතන කොතරම් දැඩි අවධානයක් යොමුකළ යුතු ද යන්න අමුතුවෙන් විස්තර කළයුතු නොවේ.

තත්ත්වය එසේ වුවද මෙම පර්යේෂණ අධ්‍යයනය සඳහා යොදාගත් දිවයිනේ සියළු පළාත් නියෝජනය වන පරිදි වූ නියැදියට අයත් නගර සභා 15 න් එකදු ආයතනයක හෝ බලපත්‍ර ගාස්තු 2016 වර්ෂයේදී නිවැරදිව පනවා නැත. ඒ අනුව මෙම කරුණට අදාලව නගර සභා පෙන්වා ඇති කාර්ය සාධන ප්‍රගතිය 0% ශූන්‍ය අගයක් ගනී. මීට බලපා ඇති හේතු හා එහි

පසුබිම පිළිබඳ පූර්ණ විග්‍රහයක් ඒ ඒ සභා යටතේ වූ පූර්වෝක්ත විශ්ලේෂණයෙහි ඇතුලත් කොට ඇත. මීළඟට නියැදිගත නගර සභාවන්හි ව්‍යාපාර බද්ද (Buisness Tax) පැනවීම පිළිබඳව පවත්නා තත්වය විමර්ශනයට ලක්කිරීමට අදහස් කෙරේ.

5.6.3 ව්‍යාපාර බද්ද:

5.6.3.1 සීතාවකපුර නගර සභාව

2016 වර්ෂය සඳහා සීතාවකපුර නගර සභාවේ ලේකම් විසින් ව්‍යාපාර බදු පැනවීම පිළිබඳ නිවේදනය ඒ සඳහා වූ යෝජනාවද සමඟ 2015.11.27 දිනැති 1943 දරන ගැසට් පත්‍රයේ පළකරනු ලැබ ඇත. මෙම නිවේදනය සමඟ ඇති යෝජනාවේ නගර සභා ආඥා පනතේ 184 (අ) වගන්තිය අනුව මෙම බදු පැනවීම සිදුකර ඇති බව සඳහන් වේ. එබඳු වගන්තියක් එම ආඥා පනතේ නොමැත. එසේම එහි උප ලේඛන අංක II හි (8) ගණන් පරීක්ෂකවරුන්, (10) ගෘහ නිර්මාණ ශිල්පීන්, (15) සිනමා ශාලා පවත්වන්නන්, (20) ගණකාධිකාරීවරුන්, (21) පෞද්ගලික මිනින්දෝරුවන් ආදී වෘත්තිකයින් හට ව්‍යාපාර බදු පනවා ඇත. අංක (15) සිනමා ශාලා පවත්වන්නන් හැර අන් සියල්ලම වෘත්තීන්ය. ඔවුන්ගෙන් බදු අයකිරීමට නගර සභාවන්ට බලය පවරා නැත. 15 සිනමා ශාලා වලින් අයකරනුයේ විනෝද බද්ද හා ප්‍රසිද්ධ රැගුම් බලපත්‍ර ගාස්තු පමණි. ඔවුනට බදු කිහිපයක් පනවා ද්විත්ව බදු අයකිරීමට නගර සභාවකට බලය ලැබී නැත. එසේම මෙම නිවේදනය අවසානයේ නගර සභා ආඥා පනතේ 165 D යටතේ ඇතැම් ඉඩම් විකිණීම් විෂයෙහි ඇමතිවරයා විසින් පනවා ඇති බද්ද නගර සභාව විසින් නැවත පනවා තිබේ. නගර සභාවේ රාජකාරිය වන්නේ පනවා ඇති එම බද්ද නීතියේ පෙන්වා දී ඇති පරිපාටිය අනුගමනය කර අයකර ගැනීම පමණි. මේ කරුණු අනුව සීතාවකපුර නගර සභාවේ ලේකම් විසින් 2016 වර්ෂය සඳහා පනවා ඇති ව්‍යාපාර බද්ද අවිධිමත් හා දෝෂ සහගත වන හෙයින් එය නීතියට පටහැනි පැනවීමක් බව පෙනේ.

5.6.3.2 පෑලියගොඩ නගර සභාව

2016 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද එම සභාවේ ලේකම්වරිය විසින් 2015.12.11 දිනැති අංක 1945 දරන ගැසට් පත්‍රයේ පළකළ නිවේදනයක් මගින් පනවා ඇත. මෙම නිවේදනය සහමුලින්ම සාවද්‍ය අයුරින් පළකර ඇත. එහි **"1939 අංක 61 නගර සභා පනතේ 165**

<u>වගන්තිය සමග කියවිය යුතු එම පනතේ ආ, 165 වගන්තියෙහි"</u> මෙබඳු පනතක් හෝ වගන්තියක් නගර සභාවන්ට සම්බන්ධව ශ්‍රී ලංකාවේ නැත.

එහි දෙවන ඡේදයේ නැවත **<u>"1939 අංක 61 නගර සභා පනතේ 165 වගන්තිය සමග කියවිය යුතු (ආ) වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය"</u>** යනුවෙන් සඳහන් වේ. මෙබඳු පනත් හෝ වගන්ති දෙකක් මෙම ලේකම්වරිය ව්‍යවස්ථාපිත නිවේදනයක සඳහන් කරන්නේ කුමන පදනමක සිට ද යන්න නිශ්චය කළ නොහැකිය. මෙම පැනවීමට අදාල ව්‍යාපාර බදු උප ලේඛනය පමණක් ඇති අතර එම බද්ද පනවනුයේ කුමන ව්‍යාපාර සඳහා ද යන්න ප්‍රකාශයට පත්කර නැත. එවිට බදු ගෙවන්නන්ට තමන් නොදන්නා තොරතුරු මත පදනම් කොටගත් ව්‍යාපාර සඳහා බදු ගෙවීමට සිදුවේ. කෙසේ වෙතත් මෙම තීරණය අදාල බලදායී වගන්ති හෝ නොමැති නෛතික ප්‍රතිපාදන සාවද්‍ය ලෙස දක්වා ඇති එකක් බැවින් එය නීතියට පටහැනි හා එනයින්ම බල රහිත එකක් ද වේ. මෙයින් සභාවට කිසිම මුදලක් ව්‍යාපාර බදු ලෙස අයකළ නොහැකිය.

5.6.3.3 ජා ඇල නගර සභාව

2016 වර්ෂය සඳහා ජා ඇල නගර සභාවේ ලේකම්වරිය විසින් 2015.11.06 දිනැති අංක 1940 දරන ගැසට් පත්‍රයෙහි පළකරන ලද නිවේදනයක් මගින් ව්‍යාපාර බද්ද පනවා තිබේ. එහි පළමු ඡේදයේ සඳහන් වන්නේ **<u>"1939 අංක 61 නගර සභා පනතේ 184 (ඇ) වගන්තිය සමග ....."</u>** එසේම දෙවන ඡේදයේද **<u>"1939 අංක 61 නගර සභා පනතේ 184 (ඇ) වැනි වගන්තිය සමග ....."</u>** යනුවෙන් දක්වා ඒ අනුව මෙම බද්ද පනවා ඇති බව සඳහන් කර ඇත. මෙවැනි පනතක් නොමැති අතර නගර සභා ආඥා පනතේ නම්, එහිද එබඳු වගන්තියක් නැත. එබැවින් මේ පැනවීම් ශුන්‍ය හා බලරහිත වන්නේය.

ඒ හැර බද්දට යටත් ව්‍යාපාර වශයෙන් (I) දේපළ වෙළඳාම් කරුවන්, වෙන්දේසි කරුවන්(II) බ්‍රෝකර්වරුන් (IX) සැලසුම් ශිල්පීන් (XI) රෝගීන් පරීක්ෂා කිරීමේ චැනල් සේවා දක්වා ඇත. මෙහි (I) හා (II) වෙන්දේසි කරුවන් හා බ්‍රෝකර්වරුන්ගේ ආඥා පනතේ විධිවිධාන යටතේ ඔවුන්ගේ බලපත්‍ර නිකුත් කර බලපත්‍ර ගාස්තු අයකළ යුතුවේ. සෙසු විෂයයන් වෘත්තීන් වේ. එම වෘත්තීන් උදෙසා බදු අයකිරීමේ බලය නගර සභා වෙත පවරා නැත. ඒ අනුව මෙම

නිවේදනය බලාතික්‍රමණයට යටත් වූ නීතියට පටහැනි වූවක් බව පෙනේ. මේ යටතේ ජා ඇල නගර සභාවට ව්‍යාපාර බද්ද වශයෙන් කිසිම මුදලක් අයකළ නොහැකිය.

5.6.3.4 හොරණ නගර සභාව

2016 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම ලේකම්වරයා විසින් 2015.11.13 දිනැති අංක 1941 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනයක් මගින් පනවා ඇත. මෙම නිවේදනය අතිශයින් දෝෂ සහගත බව නිරීක්ෂණය විය. මෙහි පළමු ඡේදයේ සභාවේ බලතල ඉටු කිරීමට ලේකම්වරයාට බලය ලැබෙන බලදායී වගන්තිය කිසිදු ස්ථානයක සඳහන් නොවේ. තවද **"1939 අංක 61 දරන නගර සභා ආඥා පනතේ ..... වගන්තිය ?"** **"කුමන වගන්තියද යන්න නොදැක්වේ. "** එසේම **"එම පනතේ 165 (ආ) 1 වැනි උප වගන්තියේ විධිවිධාන ....."** මෙහි සෑම තැනකම දැක්වෙන එම පනත කුමක්ද? එය නගර සභා ආඥා පනත නම් එසේ සඳහන් නොකිරීම බරපතල අඩුපාඩුවක් වනවා ඇත.

මෙසේ නීතියට අදාලව දක්වා ඇති තොරතුරු රාශියක් ඉතා දෝෂ සහගත ලෙස දක්වා තිබේ. එසේම මෙහි උපලේඛනයේ ගාස්තු චක්‍රය දැක්වෙන අතර බද්ද අයකරන ව්‍යාපාර වර්ග සඳහන් කර නැත. එහිදී බදුගෙවන්නාට සිය ව්‍යාපාරය මීට අදාල කර තිබේද යන්න දැනගත නොහැකිවේ. මෙම දෝෂ හා ඌණතා නීතියට පටහැනි ඒවා වන බැවින් යථොක්ත පැනවීම හේතුකොට ගෙන අදාල නිවේදනය ශුන්‍ය හා බල රහිත වේ. ඒ අනුව හොරණ නගර සභාවට 2016 වර්ෂය සඳහා ව්‍යාපාර බදු වශයෙන් කිසිදු මුදලක් අයකළ නොහැකි වනු ඇත.

5.6.3.5 කුලියාපිටිය නගර සභාව

2016 වර්ෂය සඳහා කුලියාපිටිය නගර සභාව ව්‍යාපාර බද්ද පනවා ඇත්තේ ලේකම්වරයා විසින් 2016.01.01 දිනැති අංක 1948 දරන ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ නිවේදනයක් මගිනි. මෙම ගැසට් නිවේදනය මෙන්ම ඒ සමග ඇති තීරණය ද අතිශය දෝෂ සහගත බව පෙන්වා දිය යුතුව ඇත. තීරණයේ ප්‍රථම කොටසේ **" එකී තක්සේරුව වන 252 වන අධිකාරය වන නගර සභා ආඥා පනතේ 184 (අ) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 165 (අ) 1 වැනි වගන්ති යටතේ"** නගර සභාවට පැවරී ඇති බලතල ගැන සඳහන් වේ. එසේ වුවද නගර සභා ආඥා පනතේ එවැනි වගන්තියක් නැත. ව්‍යාපාර බදු පැනවීමට අදාල වගන්තිය 165 අ

වගන්තියයි. අදාල නොවන වගන්තියක් යටතේ කර ඇති එකී තීරණය ශූන්‍ය හා බලරහිත වේ. යථෝක්ත බද්ද " ව්‍යාපාර බද්දක්" ලෙස සඳහන් කර ඇතත්;

(65) සිනමා ශාලාවක් පවත්වාගෙන යාම.

(85) රේස් ඔට්ටු පළක් පවත්වාගෙන යාම.

(88) පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම.

(9) නොතාරිස් කාර්යාලයක් පවත්වාගෙන යාම.

(110) ගණකාධිකාරී කාර්යාලයක් පවත්වාගෙන යාම වැනි කාර්යයන් ලැයිස්තුවේ සඳහන් කර තිබේ. එහෙත් සිනමා ශාලාවක්, ප්‍රසිද්ධ රැගුම් ආඥා පනතේ විධිවිධාන යටතේ බලපත්‍ර ගාස්තුවක් සහ විනෝද බදු ආඥා පනත යටතේ විනෝද බදු ගෙවනු ලැබේ. එබැවින් එම ව්‍යාපාරය මත තවත් බද්දක් පැනවීමට නෛතික විධිවිධාන නැත.

තවද පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම වෘත්තීය කටයුත්තකි. නගර සභා ආඥා පනතේ 165 අ වගන්තියේ (1 අ) උප වගන්තිය අනුව අමාත්‍යවරයා විසින් නියෝගයක් මගින් නිශ්චය කර ඇති ප්‍රමාණයක් නොඉක්මවන බද්දක් නගර සභා විසින් නියම කර අයකර ගත හැකිය. එහෙත් ඇමතිවරයා එවැන්නක් තවම සිදුකර නැත. එසේම නොතාරිස් කාර්යාලයක්, ගණකාධිකාරී කාර්යාලයක් පවත්වාගෙන යාම වෘත්තීය කාර්යයක් වන බැවින් ඊට ව්‍යාපාර බදු පැනවිය නොහැකිය. මේ හැර මෙම නිවේදනයේ සඳහන් පරිදි ලේකම්වරයාට සභාවේ බලය පැවරී ඇතත් නගර සභා ආඥා පනතේ 184 (අ) වගන්තියෙන් බව සඳහන් වුවත් එබඳු වගන්තියක් එම පනතේ නැත.

මීට අදාල උප ලේඛනයේ ව්‍යාපාර බද්ද සඳහා විෂයවන කාර්යයන් 121 ක් දැක්වේ. මෙයින් මීට නියම ලෙස අදාල විය යුත්තේ කාර්යයන් හතරක් පමණි. අංක 5, 16, 28 හා 30 ඊට අයත්වේ. සෙසු සියලු කාර්යයන් ව්‍යාපාර බලපත්‍ර, කර්මාන්ත බදු හා වෘත්තීය බදු වලට යටත්වන කාර්යයන් වේ. ඒ අනුව මෙම නිවේදනය මුළුමනින්ම දෝෂ සහගත හා නීතියට පටහැනි බව පෙනීයයි. මෙමගින් කුලියාපිටිය නගර සභාවට කිසිම මුදලක් අයකිරීම විධිමත් නොවේ.

5.6.3.6 පුත්තලම නගර සභාව

2016 වර්ෂය සඳහා පුත්තලම නගර සභාව ව්‍යාපාර බද්ද පනවා ඇත්තේ එහි විශේෂ කොමසාරිස්වරයා විසින් 2015 සැප්තැම්බර් මස 30 දින පැවති **කමිටු තීරණ රැස්වීමේදී අනුමත කරන** යෝජනාවක් ලෙසින් 2015.12.04 දිනැති 1944 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනයක් මගිනි.

මෙම නිවේදනය නගර සභාව විසින් අනුමත කළයුතු පැනවීමක් මත සිදුවිය යුතු වුවත් එය සිදුකර ඇත්තේ කමිටු තීරණ රැස්වීමකදීය. මෙවැනි කමිටුවකට හෝ රැස්වීමකට බදු පැනවීමේ බලය පවරා නැත. එසේම එම නිවේදනයේ දෙවන ඡේදය ප්‍රකාර "නගර සභා ආඥා පනතේ 184 (අ) වගන්තිය සමඟ කියවිය යුතු ....." මෙබඳු වගන්තියක් නගර සභා ආඥා පනතේ නැත. එසේම මෙම බද්ද පැනවීමට ක්‍රියාකර ඇත්තේ විශේෂ කොමසාරිස් විසිනි. නගර සභාවක සභාව ක්‍රියාත්මකව නොපවතින විට එහි බලතල, කාර්ය හා කර්තව්‍ය ඉටුකිරීමේ බල නීතියෙන් ලැබෙනුයේ එහි ලේකම්වරයාට පමණි. විශේෂ කොමසාරිස්වරයෙකුට එම බලතල හිමි නොවේ. ඒ අනුව මෙම පැනවීම හා තීරණ ශුන්‍ය හා බල රහිත වන්නේය.

තවද එහි ව්‍යාපාර බද්ද පනවා ඇති විෂයයන් 49 ක් ඇත. ඒ අතුරින් විෂයයන් 08 ක් වෘත්තීන්ය. රටබීම, වයින් වෙළඳාම සුරාබදු දෙපාර්තමේන්තුවේ බලපත්‍ර විෂයයට ගැනේ. ගෝ ඝාතකාගාර ගෝඝාතක ආඥා පනත යටතේ බලපත්‍ර ගාස්තු වලට අදාලවේ. වෙන්දේසි කරුවන් හා බ්‍රෝකර් වරුන් එම ආඥා පනත යටතේ බලපත්‍ර ලබාගැනීමට යටත්වේ. ව්‍යාපාර බද්දට යටත් ආයතන ලෙස එහි ඇත්තේ රක්ෂණ සමාගම් පමණි. සෙසු සියළු වෙළඳාම් බලපත්‍ර ගාස්තු හා කර්මාන්ත බදු යටතට නොගැනෙන ඒවා වේ. ඒ අනුව මෙම නිවේදනය අතිශයින් පදනම් විරහිත නීතියට පටහැනි වූවක් බව පෙන්වා දිය යුතුව ඇත. මෙබඳු නිවේදනයක් මගින් කිසිදු ව්‍යාපාර බදු මුදලක් අයකළ නොහැකිය.

5.6.3.7 ගම්පොල නගර සභාව

2016 වර්ෂය සඳහා ගම්පොල නගර සභාව ව්‍යාපාර බද්ද පනවා ඇත්තේ 2015 ඔක්තෝම්බර් මස 30 දින 1939 දරන ගැසට් පත්‍රයේ එම සභාවේ විශේෂ කොමසාරිස්වරයා විසින් පළකර

ඇති නිවේදනයක් මගිනි. මෙම නිවේදනය මුළුමනින්ම සාවද්‍ය හා බරපතල දෝෂ සහගත වූවකි. මෙසේ බදු පැනවීමට නගර සභාවක සභාව ක්‍රියාත්මක නොවන විටක විශේෂ කොමසාරිස්වරයෙකුට බලයක් පැවරී නැත. මෙම නිවේදනයෙන් නගර සභාවකට පැනවිය හැකි සියළුම බදු හා බලපත්‍ර ගාස්තු පනවා ඉතා සංකීර්ණ නිවේදනයක් පළකර ඇත. ඔහුට එවැන්නක් කිරීමට බලය ලැබුණු ආකාරය පවා එහි සඳහන් කර නැත.

ගැසට් නිවේදනයේ උප ලේඛන 03 හි සාවද්‍ය ප්‍රතිපාදන යටතේ වෙළඳ ව්‍යාපාර හා වෘත්තිය බදු පැනවීමක් කරන බව සඳහන් කර ඇත. මෙම ලේඛනයේ ව්‍යාපාර බද්දට යටත්වන ආයතන 35 ක් දක්වා තිබේ. එයින් හතක් වෘත්තීන්ය, එසේම මත්පැන්, බීම අලෙවිය, සිනමා ශාලාවන් පවත්වාගෙන යාම ආදිය ව්‍යාපාර බද්දට යටත් නොවේ. (මේ පිළිබඳ විස්තර ඉහත පරිච්ඡේදයන්හි පැහැදිළි කොට ඇත.) මෙහි සඳහන් ඇතැම් විෂයයන් කර්මාන්ත බද්දට ඇතුලත් විය යුතු වන අතර ඇතැම් ඒවා බලපත්‍ර ගාස්තු යටතට වැටේ. මේ අනුව මෙම පදනම් විරහිත පැනවීම නීතියට අදාල වූවක් නොවේ. එමගින් කිසිදු බදු මුදලක් අයකිරීම උගහටය.

5.6.3.8 තලවාකැළේ ලිඳුල නගර සභාව

2016 වර්ෂය සඳහා තලවාකැළේ ලිඳුල නගර සභාව ව්‍යාපාර බද්ද පනවා ඇත්තේ එහි ලේකම්වරයා විසින් 2015.12.04 දිනැති අංක 1944 දරන ගැසට් පත්‍රයෙහි පළකරන ලද නිවේදනයක් මගිනි. මෙම නිවේදනය සියලු බදු හා බලපත්‍ර ගාස්තු පැනවීමට සකස් කරන ලද සංකීර්ණ නිවේදනයකි. මෙහි ලේකම්වරයාට බදු පැනවීමට බලය ලැබෙන බලදායී වගන්ති කිසිවක් සඳහන් නොවේ. එබැවින් එම පැනවීම ශූන්‍ය හා බල රහිත වන්නේය.

ව්‍යාපාර බද්ද පනවා ඇත්තේ නගර සභා ආඥා පනතේ 165 ආ (1) උප වගන්තිය ප්‍රකාරව වෙළඳ ව්‍යාපාර හා වෘත්තීන් සඳහා බදු අයකිරීමට සැලසී ඇති ප්‍රතිපාදන මතය. එහෙත් නගර සභා ආඥා පනතේ 165 ආ වගන්තියේ (1 අ) උප වගන්තියේ වෘත්තීන්ගෙන් බදු අයකිරීම සඳහා ඇමතිවරයා නියෝග මගින් බද්දේ උපරිම සීමා නියම කළ යුතු බව දක්වා ඇතත් මේ දක්වාම එබන්දක් සිදුවී නැත. එබැවින් කිසිම නගර සභාවකට මෙම බද්ද අයකළ හැකි නොවේ. එහෙත් වෘත්තීන් (හය) 6 කට අදාලව මෙම ව්‍යාපාර බද්ද පනවා ඇත.

එබැවින් ඉහත පසුබිම මත මෙම බදු පැනවීම නීතියට පටහැනි වන බැවින් එම බදු අයකිරීම නීත්‍යානුකූල නොවේ.

5.6.3.9 ඇඹිලිපිටිය නගර සභාව

2016 වර්ෂය සඳහා ඇඹිලිපිටිය නගර සභාව ව්‍යාපාර බදු පනවනු ලැබ ඇත්තේ 2015.11.06 දිනැති අංක 1940 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනයක් මගිනි. මෙම නිවේදනය සමඟ ඊට පාදක කොටගත් යෝජනාවක් ද පළකර ඇත. මෙය නගර සභා ආඥා පනතේ 184 (අ) වගන්තිය අනුව ලේකම්වරියට පැවරී ඇති බලතල අනුව බව සඳහන් වේ. එහෙත් එබඳු වගන්තියක් නගර සභා ආඥා පනතේ නොමැත. ඒ අනුව මෙම පැනවීම බලරහිත වන්නේය.

තවද එහි උප ලේඛනයක ආඥා පනතේ සඳහන් ව්‍යාපාර බදු ගාස්තු වක්‍රයේ ඇතුලත් කර ඇත. එහෙත් ව්‍යාපාර බද්ද අදාලවන ව්‍යාපාර කවරේද යන්න සඳහන් කර නැත. ඒ අනුව ඇඹිලිපිටිය නගරයේ කිසිදු ව්‍යාපාරිකයෙකුට තමා ව්‍යාපාර බද්ද ගෙවන්නේ කුමන ව්‍යාපාරයකට ද යන්න දැනගත නොහැකිය. සභාවේ නිලධාරීන් වාචිකව දන්වා සිටින අන්දමට ඒවා ගෙවීමට ඔවුනට සිදුවන තත්වයක් මෙහි පවතී. සාමාන්‍යයෙන් බද්ද අදාල නොවන ව්‍යාපාර හා වෘත්තීන් මීට ඇතුළත් කිරීම පළාත් පාලන ආයතනවල වර්තමානයේ පවතින ප්‍රවණතාවයකි. එබැවින් මෙය අවිධිමත් පැනවීමක් බව පෙනේ.

5.6.3.10 හික්කඩුව නගර සභාව

2016 වර්ෂය සඳහා හික්කඩුව නගර සභාව ව්‍යාපාර බද්ද පනවා ඇත්තේ 2015.12.23 දින අංක 1947 දරන ගැසට් පත්‍රයේ පළකර ඇති ගැසට් නිවේදනයක් මගිනි. සභාවේ ලේකම් විසින් මෙම නිවේදනය අනුව ව්‍යාපාර බද්ද පැනවීමේ බලදායී වගන්තිය වන නගර සභා ආඥා පනතේ 165 ආ (1) වගන්තිය සිය නිවේදනයේ කිසිම තැනක සඳහන් කර නැත. එහි සඳහන් ප්‍රතිපාදන තරමක් දුරට අසම්පූර්ණ බව පෙනේ. එසේම ඉහත වගන්තිය යටතේ පැනවිය යුතු ව්‍යාපාර බද්ද තුළට 165 ආ (1අ) යටතේ පැනවිය යුතු වෘත්තීය බද්ද ඇතුලත් කොට ඇත.

ඉහත ප්‍රතිපාදන යටතේ වෘත්තීය බද්ද පැනවීමේදී නගර සභාවක් විසින් ඇමතිවරයා විසින් නියම කරනු ලබන බද්දේ උපරිමය සැලකිල්ලට ගතයුතු බව දක්වා ඇත. එහෙත් මේ දක්වා කිසිම ඇමතිවරයෙක් එසේ නියෝග මගින් වෘත්තීය බද්දේ උපරිමය නියම කොට නැත. එබැවින් නගර සභාවකට වෘත්තීය බදු අයකිරීමට නොහැකිය.

මෙහි උප ලේඛනයේ ව්‍යාපාර බද්දට යටත් ව්‍යාපාර 34 ක් දක්වා ඇත. එයින් 11 ක් වෘත්තීන් සඳහා වේ. එබැවින් එම පැනවීම් විධිමත් හා නීත්‍යානුකූල නොවේ. ඒ හැර රටබීම (මත්පැන්) අලෙවිය හා වෙන්දේසි කරුවන් හා බ්‍රෝකර්වරුන් සඳහා ද ව්‍යාපාර බද්ද පනවා ඇත. වෙන්දේසි කරුවන් හා බ්‍රෝකර්වරුන්ගේ ආඥා පනත යටතේ නගර සභාවක් විසින් ඔවුනට බලපත්‍ර ලබාදිය හැකි අතර ව්‍යාපාර බදු අයකළ නොහැකිය. මත්පැන් අලෙවිය සඳහා සුරාබදු ආඥා පනත යටතේ සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් සුරාබදු අයකරනු ඇති අතර එය පැනවීම නගර සභාවේ ලේකම් වෙත පවරා නැත.

මේ අනුව මෙම ව්‍යාපාර බදු පැනවීම නීතියේ විධිවිධාන ඉක්මවා පැනවීම් කරන ලද අවස්ථාවක් බව පෙනේ. එබැවින් එම බදු අයකිරීමට නීත්‍යානුකූල බලයක් හිමිකඩුව නගර සභාවේ ලේකම්වරයාට නොලැබේ. කෙසේ වෙතත් ඔහු සභාව සතු බදු පැනවීමේ බලය තමා වෙත ලැබී ඇති ආකාරය මෙම නිවේදනයේ නිවැරදිව සඳහන් කොට තිබීම වැදගත් කරුණකි.

5.6.3.11 හපුතලේ නගර සභාව

2016 වර්ෂය සඳහා හපුතලේ නගර සභාව ව්‍යාපාර බදු පනවා ඇත්තේ 2015.12.11 දින අංක 1945 දරන ගැසට් පත්‍රයෙහි සභාවේ ලේකම්වරයා විසින් පළකරන ලද නිවේදනයක් මගිනි. මෙබඳු බදු පැනවීමක් සඳහා ලේකම් වෙත බලය පැවරෙන බලදායී විධිවිධාන මෙම නිවේදනයේ සඳහන් කර නොමැත. එසේම බද්ද පනවා ඇති නීති ප්‍රතිපාදනය දක්වා ඇත්තේ " 255 අධිකාරය 165 ආ 1 වගන්තියට යටත්ව පනවන ලද වෙළඳ ව්‍යාපාර විෂයෙහි වාර්ෂික බදු අයකිරීම ඉහත අංක 1 හා 2 දරන බලපත්‍ර ලේඛනයට ඇතුලත් වී ඇති කර්මාන්ත" යනුවෙනි. මෙය එකම අප්‍රබ්‍රංසයකි. මෙවැනි ප්‍රතිපාදන නගර සභා ආඥා පනතේ දැකිය නොහැකිය.

තවද ව්‍යාපාර බදු පනවා ඇති විෂයයන් 30 අතර වෘත්තීන් 09 ක්, ඇතුලත්වන අතර ඉන්ධන අලෙවිය හා ගබඩා කිරීම, වෙන්දේසි කරුවන් හා තැරැව්කරුවන් සඳහා ව්‍යාපාර බදු අයකිරීමද සිදුකර ඇත. මීට අදාලව ව්‍යාපාර බදු පැනවීමට නගර සභාවන්හි ලේකම්වරුන්ට බලය පැවරී නැත. එබැවින් උක්ත පැනවීම් මෙන්ම එම නිවේදනයද ශූන්‍ය හා බල රහිත වන්නේය. කිසිදු විචාරශීලී අවබෝධයකින් තොරව මෙම නිවේදන පළකිරීම් සිදුකර තිබීම ඉතාම බැරෑරුම් කාර්යයන් වේ. මේ අනුව පනවන ලද නිවේදන මගින් හපුතලේ නගර සභාවට 2016 වර්ෂය සඳහා කිසිදු බදු මුදලක් අයකර ගැනීමට නීත්‍යානුකූල බලයක් හිමි නොවන බව පෙනේ.

5.6.3.12 ත්‍රිකුණාමලය නගර සභාව

2016 වර්ෂය සඳහා ත්‍රිකුණාමලය නගර සභාව ව්‍යාපාර බද්ද පනවා නැත. ඒ අනුව ගැසට් පත්‍රයේ නිවේදන පළකිරීමක් ද සිදුවී නැත. එහෙත් පර්යේෂණ අධ්‍යයනය අතරතුරදී කරණු ලැබූ කරුණු සොයා බැලීම් වලදී පහත සඳහන් තොරතුරු අනාවරණය විය. වර්තමාන නගර සභා ලේකම්වරයා වැඩබලන නිලධාරියෙකු ලෙස මාස හතරක පමණ කාලයක් ලේකම් තනතුරේ කටයුතු කර ඇත. ගණකාධිවරයා වසර හතරක පළපුරුද්ද සහිත නිලධාරියෙකි. ප්‍රධාන ආදායම් පරීක්ෂක හා දෙවන ප්‍රධාන ආදායම් පරීක්ෂකවරයා යන දෙදෙනාම අවුරුදු 20 ක පළපුරුද්ද සහිත නිලධාරීන් වෙති. විෂයභාර නිලධාරීන් මාස කිහිපයක පළපුරුද්දක් සහිත වූවන් වෙති.

මෙම නිලධාරීන්ගේ ඒකමතික පිළිතුරු වූයේ වරිපනම්, බලපත්‍ර ගාස්තු, ව්‍යාපාර බදු, කර්මාන්ත බදු, විනෝද බදු, සංවර්ධනය නොකළ ඉඩම් මත බදු, ප්‍රසිද්ධ රැඟුම් පාලන බලපත්‍ර ගාස්තු හා වාහන හා සත්ව බද්ද 2016 වර්ෂය සඳහා පනවන ලද බවයි. එසේම එහි ඇස්තමේන්තු ගත ආදායම රු 350,000/- බවද සඳහන් කර ඇත. මේ සියළුම නිලධාරීන් පැවසූයේ මෙම බදු, බලපත්‍ර ගාස්තු ආදී කිසිවක් පිළිබඳ නිවේදන ගැසට් පත්‍රයේ පළ නොකළ බවයි. නගර සභාවක් විසින් සිදුකරන ලද සියළු ආදායම් පැනවීම් ගැසට් පත්‍රයේ පළකර ප්‍රකාශයට පත්කළ යුතුය. මෙය අර්ථ නිරූපනය පිළිබඳ ආඥා පනතේ 17 (1 e) උප ඡේදය ප්‍රකාර පැහැදිලිව දක්වා ඇත. එබැවින් මෙසේ පැනවූවායැයි වාචිකව පවසන බදු හා

බලපත්‍ර ගාස්තු කිසිවක් විධිමත්ව පනවා නැත. ඒ අනුව ඒවා ශුන්‍ය හා බලරහිත වේ. මෙම තීරණ පදනම් කොට ගෙන බදු හා බලපත්‍ර ගාස්තු අයකිරීම නීත්‍යානුකූල නොවේ.

5.6.3.13 කාතන්කුඩි නගර සභාව

2016 වර්ෂය සඳහා කාතන්කුඩි නගර සභාව ව්‍යාපාර බද්ද පනවා ඇත්තේ එහි ලේකම් විසින් 2016.05.27 දිනැති අංක 1969 දරන ගැසට් පත්‍රයේ නිවේදනයක් පළකිරීම මගිනි. ඒ අනුව කාතන්කුඩි නගර සභාව වෙළඳ ව්‍යාපාර වර්ග තුනක් පමණක් මෙම බද්දට ගණන් ගන්නා බව දන්වා ඇත. කෙසේ වෙතත් මෙය අසම්පූර්ණ හා දෝෂ සහගත පැනවීමක් බව පෙනේ.

5.6.3.14 පේදුරුතුඩුව නගර සභාව

2016 වර්ෂය සඳහා පේදුරුතුඩුව නගර සභාව ව්‍යාපාර බද්ද විධිමත් පරිදි පනවා ප්‍රසිද්ධ කර නැත. එබැවින් ඊට අදාල ගැසට් නිවේදනයක් ද නොමැත. පර්යේෂණ අධ්‍යයනයේදී සිදුකරන ලද කරුණු විමසීම් වලදී සභාවේ ලේකම්, ගණකාධිකාරී හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහන් කලේ තමන් ගැසට් නිවේදන පළ නොකරන බවත් ප්‍රාදේශීය පුවත්පත් වල දැන්වීමක් පළකරන බවත් ය. මෙම නිවේදනය පරීක්ෂා කිරීමේදී පෙනී ගියේ එම නිවේදනයෙහි සභාව සතු බදු පැනවීමේ බලය ලේකම් වෙත ලැබීම සම්බන්ධ කිසිදු නෛතික ප්‍රතිපාදනයක් සඳහන් නොවන බවයි. එසේම එය අවිධිමත් හා දෝෂ සහගත බවයි. එසේම එබැවින් අර්ථකථනය පිළිබඳ ආඥා පනතේ 17 වන වගන්තියේ (1) උප වගන්තියේ (e) ඡේදය ප්‍රකාර ක්‍රියාකිරීමට පේදුරුතුඩුව නගර සභාවේ ලේකම්වරයා අපොහොසත් වී ඇති බවයි.

තවද එම නිවේදනය බෙහෙවින් සංකීර්ණ වූවක් වන අතර එය දෙමළ භාෂාවෙන් පමණක්ම පවත්නා හෙයින් පොදුවේ මහජනයාට අවබෝධකොට ගැනීමේ දුෂ්කරතාවයක් ද, පවතින බව පෙනීයයි. බදු පැනවීමේ මූලික නීතිමය විධිවිධාන අනුගමනය කර නොමැති හෙයින් මෙන්ම හරයාත්මකව දෝෂ සහගත හෙයින් මෙම පැනවීම නීත්‍යානුකූල නොවේ. එබැවින් එමගින් ආදායම් එක්රැස් කළ නොහැකිය.

5.6.3.15 වව්නියාව නගර සභාව

2016 වර්ෂය සඳහා වව්නියාව නගර සභාව වෙනුවෙන් ලේකම් වරයා විසින් 2016.01.14 දිනැති අංක 1950 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයක් මගින් ව්‍යාපාර බද්ද පනවා ඇත. මෙහිදී බදු පැනවීම සම්බන්ධයෙන් සභාව සතු බලතල ලේකම් වරයා විසින් එම කාර්යය සිදු කිරීමේදී පැවරුණ ආකාරය හෙවත් බලදායි වගන්තිය මෙහි සඳහන් නොවේ. එසේම ලේකම් වරයා විසින් මෙම ව්‍යාපාර බද්ද පනවා ඇත්තේ (255 අධිකාරය වන) නගර සභා ආඥා පනතේ 165 (6) වන වගන්තිය යටතේ බව නිවේදනයේ සඳහන් වේ.

මෙබඳු වගන්තියක් නගර සභා ආඥා පනතේ නැත. ව්‍යාපාර බදු පැනවීමේ අදාල ප්‍රතිපාදනය එකී ආඥාපනතේ 165 ආ (1) වගන්තිය වේ. ඒ අනුව මෙම පැනවීම හා නිවේදනය සාවද්‍ය වේ. තවද අදාල නිවේදනයෙහි ලේකම්වරයා සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමට බල ගැන්වෙන නගර සභා ආඥාපනතේ 184 අ වගන්තිය ගැන හෝ තමා එම සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය හා කර්තව්‍ය ඉටු කරන නිලධාරියා බව ද සඳහන් කර නැත.

එසේම ඊට අදාල ව්‍යාපාර බදු අය කිරීමට යටත් වන ව්‍යාපාර ලේඛණයේ සඳහන් විෂයයන් 23 අතුරින් විෂයයන් 11 ක් ම වෘත්තීය බද්දට යටත් වන ස්ථාන වේ. වෘත්තීන් සඳහා බදු පැනවීමට හා අය කිරීමට නගර සභාවන්ට බලය පැවරී තිබුණද ඊට අදාලව අමාත්‍යවරයා බදු අනුප්‍රමාණ තීරණය කරමින් නියෝග පනවා නැත. එබැවින් එබඳු වෘත්තීන් ගෙන් බදු අය කළ නොහැකිය. ඒ අනුව වව්නියාව නගර සභාව 2016 වර්ෂය සඳහා ප්‍රමාද වී හෝ පනවා ඇති ව්‍යාපාර බදු නිවේදනය සාවද්‍ය හා දෝෂ සහගත බව අනාවරණය වේ. තවද මෙය අතීතයට බලපාන ලෙස පළකර තිබීමද අයෝග්‍ය පරිචයකි.

උක්ත විමර්ශනයේදී අනාවරණය වන ප්‍රමුඛ කරුණ වන්නේ නියැදිගත නගර සභා සියල්ල ව්‍යාපාර බද්ද පැනවීම හා එමගින් ආදායම් ලබාගැනීම සම්බන්ධයෙන් 2016 වර්ෂයේදී දක්වා ඇත්තේ සෘණාත්මක කාර්ය සාධන මට්ටමක් බවයි. මේ අනුව ලංකාවේ නගර සභා කිසිවක් නිවැරදි, නීතියට අනුකූල පරිදි ව්‍යාපාර බදු 2016 වර්ෂය සඳහා පළකිරීමට අපොහොසත් වී ඇති බව පුරෝකථනය කළ හැකිය. මෙය ඉතා බැරෑරුම් හා අවධානම් සහගත, බලධාරීන්ගේ ක්ෂණික අවධානය යොමු විය යුතු කරුණකි.

මීළඟට නගර සභාවක තවත් ප්‍රධාන ස්වයං උත්පාදන ආදායම් මාර්ගයක් (Self Generated Revenue Source) වන කර්මාන්ත බද්ද පැනවීම, නිවේදනය කිරීම හා එහි නීත්‍යානුකූල නිරවද්‍යතාවය පිළිබඳ සංක්ෂිප්තව කරුණු විමර්ශනය කිරීම යෝග්‍ය වේ. කර්මාන්ත බද්ද (Trade Tax) නගර සභා සඳහා හඳුන්වා දෙන ලද්දේ 1979 අංක 42 දරණ මහා නගර සභා සහ නගර සභා (සංශෝධන) පනත මගිනි. ඒ අනුව මීට මේ වනවිට වසර 38 ක ඉතිහාසයක් තිබේ. එබඳු දීර්ඝ කාලපරිච්ඡේදයක් තුළ ලංකාවේ නගර සභා පද්ධතිය මේ සම්බන්ධයෙන් ඇතිකරගෙන ඇති ප්‍රවීණතාවය, ඵලදායීතාවය හා එම බද්ද පැනවීමේ නිරවද්‍යතාවය මෙන්ම එයින් අත්පත් කරගෙන ඇති කාර්යක්ෂමතාවය නියැදිගත නගර සභා 15 ඇසුරින් විමසා බැලේ.

5.6.4 කර්මාන්ත බද්ද

5.6.4.1 සීතාවකපුර නගර සභාව

මෙම නගර සභාව 2016 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පනවා ඇත්තේ 2015.11.27 දිනැති අංක 1943 දරන ගැසට් පත්‍රයෙහි සභාවේ ලේකම්වරිය විසින් පළකරන ලද නිවේදනය මගිනි. මෙම නිවේදනය සමඟ ඊට පදනම් වූ යෝජනාව ද ප්‍රකාශයට පත්කර තිබේ. එහෙත් සභාව ක්‍රියාත්මකව නොපවතින විටක බදු පැනවීමේ සභාව සතු බලය ලේකම් වෙත ලැබීමේ නෛතික ප්‍රතිපාදන මෙම යෝජනාවෙහි දක්වා ඇත්තේ **" 255 වන අධිකාරිය නගර සභා ආඥා පනතේ 184 (අ) වගන්තිය"** වශයෙනි. මෙබඳු වගන්තියක් නගර සභා ආඥා පනතෙහි නැත. එබැවින් එම පැනවීම නීතියට පටහැනි වූවකි.

තවද කර්මාන්ත බද්ද පනවා ඇති කර්මාන්ත 169 ක් වූ දීර්ඝ වෙළඳාම් ලේඛණයේ අන්තර්ගතය පරීක්ෂා කිරීමේදී කර්මාන්ත බද්ද පැනවිය නොහැකි වෘත්තීන්, ව්‍යාපාර, බලපත්‍ර ලැබිය යුතු වෙළඳාම් හා වෙනත් බලධාරීන්ගේ බලපත්‍ර අධිකාරීන්ට යටත් වෙළඳාම් ගණනාවක් (පුපුරණ ද්‍රව්‍ය) මීට අයත්ව ඇති බව නිරීක්ෂණය විය. එසේම මෙම ලේඛනයේ 169 ක් වූ කර්මාන්ත අතුරින් 16 ක් ගබඩා කිරීම් සම්බන්ධයෙනි. වෙළඳාම සඳහා භාණ්ඩ තොගයක් තබාගැනීම ගබඩාකිරීමේ ව්‍යාපාරයක් නොවේ. එසේම ගුප්ත විද්‍යා, ශාස්ත්‍ර කීම ජ්‍යෝතිෂ කටයුතු වෙළඳාමක් හෝ කර්මාන්තයක් නොවූවත් මීට එබඳු ස්ථාන ද ඇතුළත් ව

ඇත. මේ අනුව කර්මාන්ත බද්ද සීතාවකපුර නගර සභාව පනවා ඇති ආකාරය, එහි අන්තර්ගතය, නිරවද්‍යතාවය හා කාර්යක්ෂමතාවය මෙන්ම නීත්‍යානුකූලභාවය ද අතිශයින් දුර්වල හා අවිධිමත් බව සනාථ වේ.

5.6.4.2 පැලියගොඩ නගර සභාව

2016 වර්ෂය සඳහා පැලියගොඩ නගර සභාව කර්මාන්ත බද්ද පනවා ඇත්තේ එහි ලේකම් විසින් 2015.12.11 දිනැති අංක 1945 දරණ ගැසට් පත්‍රයෙහි පළකරන ලද නිවේදනයක් මගිනි. මෙම නිවේදනයෙහි **"1939 අංක 61 දරන නගර සභා පනතක් 189 (අ) වගන්තියක් ගැන සඳහන් වේ.** මෙහි දී ප්‍රමුඛ අවධානය යොමුවිය යුත්තේ 1939 අංක 61 දරන **නගර සභා පනතක්** හෝ එහි **(නගර සභා ආඥා පනතේ) 189 (අ) යනුවෙන් වූ වගන්තියක් මීට අදාල නගර සභා ආඥා පනතේ සඳහන් නොවීම කෙරෙහිය.** එසේම මීට අදාලව ඇති කර්මාන්ත බද්ද පැනවූ කර්මාන්ත පිළිබඳ ලේඛනය බෙහෙවින් අසම්පූර්ණ වූවකි. එහි ඇත්තේ කර්මාන්ත 07 ක් පමණි. එහෙත් ප්‍රායෝගිකව අතුරු ව්‍යවස්ථා වලින් ආවරණය නොවන කර්මාන්ත / වෙළඳාම් රාශියක් බද්දට යටත් කරගැනීමට මෙය ඉතා හොඳ අවස්ථාවකි. එහෙත් එම අවස්ථාවෙන් සභාව කිසිදු ප්‍රයෝජනයක් ගෙන නැත. ඒ අනුව මෙය අවිධිමත් නීතියට පටහැනි පැනවීමක් බව සඳහන් කළ හැකිය.

5.6.4.3 ජා ඇල නගර සභාව

2016 වර්ෂය සඳහා ජා ඇල නගර සභාව කර්මාන්ත බද්ද පනවා ඇත්තේ 2015.11.06 වන දිනැති අංක 1940 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනය මගිනි. මෙම නිවේදනයේ පළමු ඡේදයේ **"1939 අංක 61 දරන නගර සභා පනතේ 184 (2) වගන්තිය සමග.....** යනුවෙන් ද එහි දෙවන ඡේදයේ **1939 අංක 61 දරණ නගර සභා පනතේ 184 (අ) වගන්තිය සමග.....** යනුවෙන් ද සඳහන් බලය මත මෙකී බදු පැනවීම් සිදුකරන බව සඳහන් කර ඇත.

එතෙකුදු වුවත් එබඳු නගර සභා පනතක් ශ්‍රී ලංකාවේ නොමැති අතර 184 (අ) යනුවෙන් වගන්තියක් නගර සභා ආඥා පනතේ නොමැති බවද පෙනේ. 184 (2) යනු කිසිම අදාල බවක් නැති වෙනම කරුණකි. එබැවින් මෙම පැනවීම සාවද්‍ය වන අතර එය ශූන්‍ය හා බලරහිත වන්නේය. මීට අමුණා ඇති කර්මාන්ත බද්දට යටත් ව්‍යාපාර ලේඛනය කර්මාන්ත 148 කින් සමන්විත ඉතා දීර්ඝ වූවකි.

මෙම බද්දට සමහර වෘත්තීන් ද ඇතුලත් කොට ඇත. උදා- (146) මිනින්දෝරු සේවා සැපයීම, (13) සත්ව රෝහලක් / පශු වෛද්‍ය ගිලන් හලක් පැවැත්වීම., (48) ළදරු පාසලක් පවත්වාගෙන යාම, (76) නීතිඥ හා නොතාරිස් කාර්යාලයක් පවත්වාගෙන යාම, (119) ව්‍යාපාරයක් සඳහා කාර්යාලීය පහසුකම් සැපයීම, 108 විෂයාංකය යටතේ වෙන්දේසි හා බ්‍රෝකර් යනුවෙන් සඳහන් කර ඇත. වෙන්දේසි හා බ්‍රෝකර්වරුන් යනුවෙන් සඳහන් වුවද නගර සභාවකට එබඳු කාරණයක් සඳහා කර්මාන්ත බදු පැනවීමක් සිදුකිරීමට බලය පැවරී නැත.

මේ අනුව ඉහත කරුණු පදනම් කොටගෙන විමර්ශනාත්මකව බැලීමේදී පෙනීයන්නේ මෙම පැනවීම් නීතියට පටහැනි ක්‍රියාමාර්ගයක් බවයි. මෙබඳු අයහපත් පරිචයන් පිටු දැකීමට කාර්යමණ්ඩලය, පළාත් සභාව, පළාත් පාලන කොමසාරිස් හෝ පළාත් පාලන සහකාර කොමසාරිස් ඒ පිළිබඳ සොයා බලා කටයුතු කිරීම ඉතා හදිසි අවශ්‍යතාවයකි.

5.6.4.4 හොරණ නගර සභාව

2016 වර්ෂය සඳහා හොරණ නගර සභාව කර්මාන්ත බද්ද පනවා ඇත්තේ එහි ලේකම් විසින් 2015.11.13 දිනැති අංක 1941 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනය මගිනි. මෙම නිවේදනය සෑහෙන දුරට නිවැරදිව සකස් කර පළ කිරීමට උත්සාහ දරා ඇති බව පෙනේ. එහෙත් මෙහි ඇති ප්‍රබල ඌණතාවය වන්නේ නගර සභා ආඥා පනතෙහි ප්‍රතිපාදන මත සභාවක් ක්‍රියාත්මකව නොමැති වකවානුවක බදු පැනවීම සම්බන්ධයෙන් එම සභාව සතු බලය ලේකම්වරයා වෙත පැවරෙන බලදායී ප්‍රතිපාදන මෙම නිවේදනයෙහි ඇතුළත් කර නොමැති වීමයි. ඒ හේතුකොට ගෙන මෙම පැනවීම බලරහිත වන්නේය.

මෙම නිවේදනයට යාකොට ඇති උප ලේඛනයෙහි කර්මාන්ත බද්දට යටත් කර ඇති කර්මාන්ත / වෙළඳාම් 72 ක් දක්වා ඇත. ඒ අතුරින් අංක 70 සිරප් වර්ග, පළතුරු බීම, චට්නි වර්ග නිපදවීම හා ගබඩාකර තැබීම. 68 කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩාකර තබාගැනීම යනුවෙන් වෙළඳාම සඳහා යම් පරිශ්‍රයක තොග තබා ගැනීම ගබඩා කිරීම් ව්‍යාපාර ලෙස සලකා පැනවීම් කර තිබීම විධිමත් නොවේ.

ගබඩා කිරීම කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් නොවේ. ඒ හැර මෙම නිවේදනයෙහි වෙනත් දෝෂ සහගත බවක් නොමැති වීම ප්‍රශංසා කළ යුතුය. එහෙත් ඉහත කී දෝෂ හේතුකොට ගෙන මෙය විධිමත් හා නිරවද්‍ය පැනවීමක් නොවන්නේය.

5.6.4.5 කුලියාපිටිය නගර සභාව

2016 වර්ෂය සඳහා කුලියාපිටිය නගර සභාව කර්මාන්ත බද්ද පනවා ඇත්තේ 2016.01.01 දිනැති අංක 1948 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනය මගිනි. එම නිවේදනය හා ඊට අදාල තීරණය යටකී නිවේදනයට ඇතුලත් කොට තිබේ. නිවේදනයේ මෙන්ම තීරණයේද සඳහන් වන්නේ **" නගර සභා ආඥා පනතේ 184 (අ) වගන්තිය සමග කියවිය යුතු 165 වගන්තිය....."** යනුවෙනි. මෙය මීට ඉහත දී ද නොයෙක්වර පෙන්වා දී ඇති පරිදි දෝෂ සහගත යෙදුමකි. මක් නිසාද යත් නගර සභා ආඥා පනතේ මෙබඳු වගන්තියක් නොමැති හෙයිනි. ඒ අනුව මෙම නිවේදනය හා අදාල පැනවීම ශූන්‍ය හා බලරහිත වන්නේය. තවද ඊට අමුණා ඇති කර්මාන්ත බද්ද පනවා ඇති කර්මාන්ත / වෙළඳාම් ඇතුළත් උපලේඛනය කාර්යයන් 04 කට පමණක් සීමා වී ඇත. කුලියාපිටිය වැනි නගරයක කර්මාන්ත බද්දට යටත් විය යුතු කර්මාන්ත රාශියක් පවතී. ඒ කිසිවක් සඳහා කර්මාන්ත බදු පනවා නොතිබීම විමතියට කරුණකි. මෙහිදී සිදුවී ඇත්තේ ඊට අදාල වියයුතු කර්මාන්ත මහත් රාශියක් ව්‍යාපාර බද්දට යටත්ව හා බලපත්‍ර ගාස්තු යටතට පත්කර තිබීමයි. මෙය ඉතා සාවද්‍ය බදු හා බලපත්‍ර ගාස්තු වර්ගීකරණය කිරීමකි. නීතියෙහි සඳහන් ප්‍රතිපාදන ඉක්මවා යාම හේතුකොට ගෙන මෙහිදී බලාතික්‍රමණයක් ද සිදුවී ඇති බව පෙනේ.

5.6.4.6 පුත්තලම නගර සභාව

2016 වර්ෂය සඳහා පුත්තලම නගර සභාව කර්මාන්ත බද්ද පනවා ඇත්තේ එහි විශේෂ කොමසාරිස්වරයා විසින් 2015.12.04 දිනට අංක 1944 දරන ගැසට් පත්‍රයේ පළකරනු ලැබ ඇති නිවේදනය මගිනි. මෙම නිවේදනය පළකර ඇත්තේ නගර සභාවේ කමිටු තීරණ රැස්වීමකදී කරන ලද යෝජනා හා අනුමත කිරීමක් ලෙසය. නගර සභාවක බදු පැනවීමට කමිටු වලට බලය පවරා නැත.

තවද ඊට අදාල යෝජනාවේ **පළමු හා දෙවන ඡේද අනුව මෙම පැනවීම නගර සභා ආඥා පනතේ 184 (අ) වගන්තිය ප්‍රකාර විශේෂ කොමසාරිස්වරයා විසින් සිදුකර ඇත.** නගර සභාවක ක්‍රියාත්මක නොවන විටක බදු පැනවීමේ සභාව සතු බලය 184 අ වගන්තිය ප්‍රකාරව එහි ලේකම් වෙත ලැබුණද විශේෂ කොමසාරිස්වරයෙකු වෙත එම බලතල පැවරීම සිදුකළ

නොහැකිය. එබැවින් මෙම තීරණය හා අදාල කර්මාන්ත බද්ද පැනවීම මුළුමනින්ම ශූන්‍ය හා බලරහිත වේ.

තවද මෙහි අඩංගු උපලේඛනය අනුව කර්මාන්ත 77 ක් සඳහා බදු පනවා ඇත. මේ අතුරින් කර්මාන්ත පහක් (5) ගබඩා කිරීම් වේ. එය කර්මාන්තයක් නොවේ. එසේම මෙම ලේඛනයේ ව්‍යාපාර බද්දට යටත් විය යුතු විෂයයන් හා වෘත්තීය බද්දට අයත්වන විෂයයන් මෙන්ම බලපත්‍ර ගාස්තු වලට යටත්විය යුතු වෙළඳාම්ද ගණනාවක් ඇත. මේ කරුණු අනුව මෙම නිවේදනය හා පැනවීම මුළුමනින්ම නීතියට පටහැනි හා සාවද්‍ය වූවක් බව පැහැදිලි වේ.

5.6.4.7 ගම්පොළ නගර සභාව

2016 වර්ෂය සඳහා ගම්පොල නගර සභාව කර්මාන්ත බද්ද පනවනුයේ එහි විශේෂ කොමසාරිස්වරයා විසින් 2015.10.30 දිනැති අංක 1939 දරන ගැසට් පත්‍රයේ නිවේදනයක් පළකිරීමෙනි.

මෙම ගැසට් නිවේදනයෙන් බදු පැනවීම පිළිබඳ බලය විශේෂ කොමසාරිස් විසින් ලබාගෙන තිබෙන්නේ කුමන බලදායී වගන්තියක් යටතේ ද? සභාවේ ලේකම් වරයාට එම බලය පැවරීමට නගර සභා ආඥා පනතේ 184 අ වගන්තියෙන් ප්‍රතිපාදන සලසා ඇතත් විශේෂ කොමසාරිස් වරයෙකුට එබඳු බලයක් පැවරීමට නීතියේ ඉඩ සලසා නැත. එබැවින් මෙහිදී විශේෂ කොමසාරිස්වරයා තමාට කර්මාන්ත බද්ද පැනවීමට බලය ලැබුණු ආකාරය නොදක්වා සභාව සතු වගකීම් හා බලතල ක්‍රියාත්මක කිරීම බලාතික්‍රමණයක් මෙන්ම නීතිය බරපතල ලෙස උල්ලංඝණය කිරීමකි. එබැවින් මෙම පැනවීම හා නිවේදනය ශූන්‍ය හා බලරහිත වේ.

තවද කර්මාන්ත බද්ද පනවා ඇති කර්මාන්ත 148 ක් යටකී නිවේදනයෙහි සඳහන් කර තිබේ. එම ලේඛනයෙහි දක්වා ඇති විෂයයන් අතුරින් නමයක් (9) වෘත්තීන් වේ. අටක් (8) අලෙවිය සඳහා වෙළඳ ද්‍රව්‍ය ගබඩාකර තබාගැනීම් වේ. හතරක් (4) (82- 85 දක්වා) රටබීම, රා, මත්පැන් හා මධ්‍යසාර අලෙවිය සම්බන්ධ ස්ථානවේ. මෙකී වෙළඳාම් සඳහා කර්මාන්ත බද්ද පැනවීමට නගර සභා ආඥා පනත යටතේ බලය පැවරී නැත. වෘත්තීන් සඳහා බදු පැනවීමට අවශ්‍ය නෛතික විධිවිධාන නැති අතර ගබඩාකිරීම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් නොවේ. මත්පැන් ආශ්‍රිත කර්මාන්ත සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ බලය සුරාබදු ආඥා පනත යටතේ සුරාබදු දෙපාර්තමේන්තුවට පැවරුණ කාර්යයකි.

මේ හැර ජ්‍යෝතිෂ්‍ය කාර්යාල, තැඹිලි කුරුම්බා විකුණන පුද්ගලයන්, කඩල, වඩේ, බුලත්විට, සාරවිට, විකුණන සමාජයේ ආන්තික කොටස් මත ද කර්මාන්ත බද්ද පැනවීමට තරම් ගම්පොළ නගර සභාවේ විශේෂ කොමසාරිස්වරයා පෙළඹී තිබීම කොතරම් සාධාරණ ක්‍රියා මාර්ගයක් ද? තවද මොහු ගම්පොල තානායම පවත්වාගෙන යාම සඳහා ද කර්මාන්ත බද්ද පනවා ඇත. එය සභාවේ දේපලක් වන අතර නාගරික සංවර්ධන අධිකාරිය එහි කළමනාකරණය භාරගෙන වාර්ෂික බද්දක් / කුලියක් සභාවට ගෙවන ස්ථානයකි. මේ අනුව ගම්පොළ නගර සභාව 2016 වර්ෂය සඳහා පනවා ඇති කර්මාන්ත බද්ද බෙහෙවින් අවිධිමත් හා දෝෂ සහිත නීතිය ඉක්මවා ක්‍රියා කර ඇති ව්‍යායාමයක් බව පෙනේ. මෙම නිවේදනය යටතේ බදු අයකිරීමට නීතියෙන් ඉඩකඩ නොලැබෙනු ඇත.

5.6.4.8 තලවාකැලේ ලිඳුල නගර සභාව

2016 වර්ෂය සඳහා තලවාකැලේ ලිඳුල නගර සභාව කර්මාන්ත බද්ද පනවා ඇත්තේ 2015.12.04 දිනැති අංක 1944 දරන ගැසට් පත්‍රයෙහි සභාවේ ලේකම්වරයා විසින් පළකරන ලද නිවේදනයක් මගිනි. මෙම නිවේදනයෙහි කිසිදු ස්ථානයක සභාව සතු බදු පැනවීමේ බලය ලේකම් වෙත ලැබුණ ආකාරය පිළිබඳ නෛතික විධිවිධාන ගැන සඳහන් කර නැත. එසේම නගර සභාවට අයවිය යුතු සියළුම බදු බලපත්‍ර ගාස්තු ආදිය එකම නිවේදනයකින් පනවා තිබේ. මෙය අවිධිමත් හා සංකීර්ණ ක්‍රියාවකි. නෛතික බලයකින් තොරව පනවා ඇති මේ සියළු බදු, බලපත්‍ර ගාස්තු ආදිය එනයින්ම ශූන්‍ය හා බලරහිත වන්නේය.

ඒ හැර විෂයයන් 46 කින් යුතු කර්මාන්ත බදු පැනවූ වෙළඳාම් ලේඛණය තුළ වෘත්තීය බද්දට යටත් විෂයයන් 03 ක්ද, ප්‍රසිද්ධ රැඟුම් ආඥාපනත යටතේ බලපත්‍ර ගතයුතු සිනමා ශාලා ද, සුරාබදු බලපත්‍ර ගාස්තු පැනවිය යුතු මත්පැන් වෙළඳාමද ආදී අදාල නොවන ව්‍යාපාර, කර්මාන්ත ගණනාවක් විෂයෙහි කර්මාන්ත බද්ද පනවා ඇත. මෙම පැනවීම් නීතිය කෙරෙහි නිසි අවධානයකින් තොරව පනවා ඇති අතර එමගින් බලාතික්‍රමණය සිදුවී ඇති බව පෙනේ. කෙසේ වෙතත් මෙම නිවේදනය මගින් කර්මාන්ත බදු අයකළ නොහැකි අතර එය නීත්‍යානුකූල බවින් තොර බව පෙනීයයි.

5.6.4.9 ඇඹිලිපිටිය නගර සභාව

2016 වර්ෂය සඳහා ඇඹිලිපිටිය නගර සභාව කර්මාන්ත බද්ද පනවා ඇත්තේ එහි ලේකම් විසින් 2015.11.06 දිනැති 1940 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනයක් මගිනි. මෙම නිවේදනය සමඟ යෝජනාවක් ද නිවේදනයට ඇතුළත් කොට තිබේ. තීරණයෙහි හා යෝජනාවෙහි මෙම කර්මාන්ත බද්ද පැනවීමට බලය ලැබී ඇති ප්‍රතිපාදනය ලෙස දක්වා ඇත්තේ නගර සභා ආඥා පනතේ 184 (අ) වගන්තියයි. මෙබඳු වගන්තියක් නගර සභා ආඥා පනතේ නොමැත. සභාවේ මහජන නියෝජිතයින්ගේ ක්‍රියාකාරීත්වය නොමැති විටක එහි බලතල කාර්ය හා කර්තව්‍ය සභාවේ ලේකම්වරයාට හිමිවන්නේ නගර සභා ආඥා පනතේ 184 අ වගන්තිය ප්‍රකාරවය. තවද මෙහි පළමු ඡේදයේ සඳහන් වන්නේ කර්මාන්ත බද්දක් නොව වරිපනම් බදු පැනවීමට පහත සඳහන් පරිදි ක්‍රියා කරන බවය.

එබැවින් මෙම නියමය හා පැනවීම ශූන්‍ය හා බලරහිත වන්නේය. තවද මෙම නිවේදනය සමඟ ඇති උපලේඛනයෙහි කර්මාන්ත බද්ද, පනවා ඇති කර්මාන්ත 23 ක් දක්වා ඇත. ඒ අතර ඇති 21 ගල්මෝල් සඳහා ජාතික පාරිසරික පනතේ විධිවිධාන යටතේ ඇමතිවරයා බලපත්‍ර ගාස්තු පනවා ඇති අතර එම ගාස්තු අයකරගැනීම නගර සභාවන්ට පවරා ඇත. එබැවින් එම ආයතන වෙත කර්මාන්ත බද්දක් පනවා ද්වි බදුකරණයට ලක්කිරීම නිවැරදි නොවේ. මේ අනුව මෙම නිවේදනය නීතියට පටහැනි වුවක් බව සැලකීමට සිදුවේ.

5.6.4.10 හික්කඩුව නගර සභාව

2016 වර්ෂය සඳහා හික්කඩුව නගර සභාව කර්මාන්ත බද්ද පනවා ඇත්තේ සභාවේ ලේකම්වරයා විසින් 2015.12.23 දිනැති අංක 1947 දරන ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනයක් මගිනි. එම නිවේදනයේ මෙම බද්ද පැනවීමට අදාලව ලේකම් වෙත සභාවේ බලතල පැවරෙන ආකාරය නිවැරදිව සඳහන් කර ඇත.

මීට අමුණා ඇති උප ලේඛනයෙහි කර්මාන්ත (143) සඳහා කර්මාන්ත බද්ද පනවා තිබේ. ඒ අතුරින් වෙළඳාම් 15 ක් ගබඩාකිරීම් වේ. ගබඩාකිරීම් වෙළඳාමක් හෝ කර්මාන්තයක් හෝ නොවේ. තවද රටබීම හා මත්පැන් විකිණීම. (2) පුද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම. (18) මුදල් අයකරන ළඳරු පාසලක් පවත්වාගෙන යාම. මෙය වෙළඳාමක් හෝ කර්මාන්තයක් ද, පශු වෛද්‍ය ගිලන් හලක් පවත්වාගෙන යාම (35) මෙය වෘත්තියකි. දත් බඳින

ස්ථානයක් පවත්වාගෙන යාම, 100 නිවාස සැලසුම් සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම ආදී වෘත්තීය බද්දක් අයකිරීමට අදාල කරගත යුතු කර්මාන්ත මෙම උප ලේඛනයන්හි දක්වා ඇත. එසේම දීර්ඝ ලේඛන වල ව්‍යාපාර බදු, බලපත්‍ර ගාස්තු ආදී අංග රාශියකට යොමු වියයුතු කර්මාන්ත ද මෙහි ඇත. ඒ අනුව මෙම නිවේදනය අවිධිමත් හා නීතියට පටහැනි එකක් ලෙස සැලකිය හැකිය.

5.6.4.11 හපුතලේ නගර සභාව

2016 වර්ෂය සඳහා හපුතලේ නගර සභාව කර්මාන්ත බද්ද පනවා ඇත්තේ එහි වැඩ බලන ලේකම්වරයා විසින් 2015.12.11 දිනැති අංක 1945 දරන ගැසට් පත්‍රයේ පළකර ඇති කර්මාන්ත බද්ද පැනවීමට අදාලව විශේෂිත නිවේදනයක් මගිනි. එහෙත් කර්මාන්ත බද්ද පැනවීමට අදාලව විශේෂිත නිවේදනයක් මෙම ගැසට් පත්‍රයෙහි දැකිය නොහැකිවිය. සභාවේ බදු බලපත්‍ර ගාස්තු පැනවීම් ගැසට් පත්‍රය පුරා අවිධිමත් ලෙස විසිරී පවතින හෙයින් අදාල පැනවීම් සිදුවී ඇති ආකාරය හෝ කුමන නීතිමය ප්‍රතිපාදනයක් මත මෙම බද්ද පනවන්නේ ද යන කිසිම තොරතුරක් මෙහි ඇතුළත් නොවේ. එසේම මෙම ලේඛනයේ ඇති කර්මාන්ත තුනක් එනම් 23 සිසිල් බීම නිෂ්පාදනය ගබඩා කිරීම. 24 රසකැවිලි නිෂ්පාදනය හා ගබඩා කිරීම. 25 අයිස්ක්‍රීම්, යෝගට් නිෂ්පාදනය හා ගබඩා කිරීම යන්නෙහි ගබඩා කිරීම කර්මාන්තයක් නොවේ. එසේම එම කර්මාන්ත හා අංක 22 බේකරියක් පවත්වාගෙන යාම, බලපත්‍ර නිකුත් කිරීමට අයත්වන කාර්යයන් වේ.

මේ අනුව මෙම පැනවීම, හා ඊට අදාල නිවේදනය මුළුමනින්ම ශූන්‍ය හා බලරහිත වූවක් බව පෙනේ. මෙවැනි අවිධිමත් හා අසම්පූර්ණ නිවේදන මගින් බදු පැනවීම හෝ අයකිරීම අතිශයින් සාවද්‍ය මාර්ගයකි.

5.6.4.12 ත්‍රිකුණාමලය නගර සභාව

ත්‍රිකුණාමලය නගර සභාව 2016 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පනවා නැති බව පෙනේ. ලේකම් ඇතුළු නිලධාරීන් කිහිප දෙනෙකු එය පනවා ඇති බව පැවසුව ද එයින් අයවැය ලේඛනයේ ඇස්තමේන්තුගත ආදායම් ලෙස කිසිදු මුදලක් පෙන්වා නැත. ඒ අනුව කර්මාන්ත බදු ලෙස කිසිම මුදලක් මෙම නගරය තුළ කර්මාන්ත වලින් අයකළ නොහැකිය. මෙම

ව්‍යවස්ථාපිත ආදායම් නොපැනවීම පිළිබඳව පරිපාලනය වගකීව යුතුවේ. පළාත් බලධාරීන් හෝ විගණනය ඒ පිළිබඳව කිසිදු සොයා බැලීමක් කර ඇති බව අනාවරණය නොවුණි.

5.6.4.13 කාතන්කුඩි නගර සභාව

2016 වර්ෂය සඳහා කාතන්කුඩි නගර සභාව කර්මාන්ත බද්ද පනවා ඇත්තේ 2016.05.27 දිනැති අංක 1969 දරන ගැසට් පත්‍රයේ සභාවේ ලේකම්වරයා විසින් පළකර ඇති නිවේදනයක් මගිනි. මෙම පැනවීම සිදුකර ඇත්තේ 2016 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ගෙවීම් කිරීමට නියම කරමින් වුවද එය අතීතයට බලපැවැත්වෙන පරිදි මාස පහකට (05) පසුව ප්‍රකාශයට පත්කර ඇත. කිසිම පළාත් පාලන ආයතනයකට අතීතයට බලපාන පරිදි අනු නීති පැනවිය නොහැකිය. ඒ අනුව මෙය නීතියෙහි විධිවිධාන ඉක්මවා ක්‍රියාකිරීමකි.

එසේම මෙම පැනවීම සිදුකර ඇත්තේ නගර සභා ආඥා පනතේ 184 (අ) වගන්තියේ හා 165 (ආ) වගන්තියේ බලය මත බව දැක්වේ. නගර සභා ආඥා පනතේ 184 (අ) යනුවෙන් වගන්තියක් නැත. ඒ අනුව මෙම පැනවීම ශූන්‍ය හා බලරහිත වන්නේය. තවද ඒ සමඟ ඇති උපලේඛනයෙහි අංක 49 හා 50 පුද්ගලික පෙර පාසලක් හා පුද්ගලික පාසලක් පැවැත්වීම සම්බන්ධයෙනුත්, අංක 105 වෛද්‍ය රසායනාගාර සේවාවක් සැපයීමත් යන විෂයයන් වෘත්තීන්ට අදාල වන්නාවූ ඒවා වේ. ඒ සඳහා බදු පැනවීමට නගර සභාවලට බලය පැවරී නැත්තේ අමාත්‍යවරයා එම වෘත්තීය බද්දේ උපරිමය නියමයක් මගින් ප්‍රකාශයට පත්කර නැති බැවිනි. අංක 82 බේකරි නිෂ්පාදන බලපත්‍ර ගාස්තු වලට යටත්වන ව්‍යාපාරයකි. අංක 83 ඉන්ධන විකිණීම ඛණිජ තෙල් ආඥා පනතේ විධිවිධාන මත අමාත්‍යවරයා බලපත්‍ර ගාස්තු නියෝගයක් මගින් පනවා අයකර ගැනීමේ බලය නගර සභා වෙත පවරා ඇති ව්‍යාපාරයකි. ඒ සඳහා කර්මාන්ත බදු පැනවීමට නගර සභාවක් කටයුතු කිරීම බලාතික්‍රමණයකි.

මේ කරුණු අනුව කාතන්කුඩි නගර සභාව 2016 වර්ෂය සඳහා පනවා ඇති කර්මාන්ත බද්ද අවිධිමත් හා දෝෂ සහගත වූවක් බව පෙනේ.

5.6.4.14 පේදුරුතුඩුව නගර සභාව

2016 වර්ෂය සඳහා පේදුරුතුඩුව නගර සභාව කර්මාන්ත බදු පනවන බව 2016.02.19 දිනැති අංක 1955 දරන ගැසට් පත්‍රයේ ලේකම් විසින් පළකර ඇති නිවේදනයේ සඳහන් වුවද එය

විධිමත් පරිදි පනවා නැත. ලේකම් ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විමසීමේදී හා අයවැය පරීක්ෂා කිරීමේදී පෙනීගියේ කර්මාන්ත බද්ද පනවා නැති අතර එයින් ලැබෙන ආදායම් ශීර්ෂ හිස්ව තබා ඇති බවයි.

ඒ හැර මෙම ගැසට් නිවේදනය පළකර ඇත්තේ අතීතයට බලපාන අයුරින් 2016 පෙබරවාරි මස 19 වන දින දීය. එසේම එහි කිසිම ස්ථානයක සභාව සතු බදු පැනවීමේ බලය ලේකම් වෙත පැවරුණ ආකාරය පිළිබඳ සඳහනක් නැත. මේ කරුණ අනුව පෙනීයන්නේ පේදුරුතුඩුව නගර සභාව 2016 වර්ෂයේ සඳහා විධිමත් පරිදි කර්මාන්ත බද්ද පනවා නැති බවයි. මෙම නිවේදනය දෙමළ භාෂාවෙන් පමණක් ප්‍රකාශයට පත්කර තිබීම ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විධිවිධාන උල්ලංඝණය කිරීමකි. මේ කරුණු අනුව පේදුරුතුඩුව නගර සභාවට 2016 වර්ෂයේ කර්මාන්ත බදු වශයෙන් කිසිම මුදලක් නීත්‍යානුකූලව අය කළ නොහැකිය.

5.6.4.15 වව්නියාව නගර සභාව

2016 වර්ෂය සඳහා වව්නියාව නගර සභාව කර්මාන්ත බද්ද පනවා නැත. 2016 අයවැයෙහි ද කර්මාන්ත බද්ද ආදායම් ශීර්ෂය හිස්ව පවතී. වව්නියාව නගර සභාවේ ලේකම් විසින් 2016.01.14 දිනැති අංක 1950 දරන ගැසට් පත්‍රයේ පළකර ඇති නිවේදනයේ කර්මාන්ත බද්දට අදාලව කරුණු සඳහන් වූවත් සත්‍ය වශයෙන්ම එය පනවා ගැසට් පත්‍රයේ පළකර නැත. 2016 ජනවාරි 14 දින ආදායම් පැනවීම යනු අතීතයට බලපාන පරිදි කර ලැබූ පැනවීමකි. මේ කරුණු අනුව අනාවරණය වූ පරිදි 2016 වසරේ කර්මාන්ත බද්දෙන් සභාවට අයවිය යුතුව තිබූ ආදායම් අහිමි වීම ගැන වගකීම ලේකම්වරයා වෙත පැවරේ. එහෙත් ඒ පිළිබඳව කිසිදු විමසීමක් උතුරු පළාතේ පළාත් පාලන කොමසාරිස් ගෙන් හෝ විගණනයෙන් ලැබී නොතිබුණි.

මෙම කරුණු විශ්ලේෂණය කිරීමේදී පැහැදිලි වන ප්‍රධාන කරුණු වන්නේ 2016 වසරේ මෙම අධ්‍යයනයට යොදාගත් නියැදියේ සඳහන් කිසිදු නගර සභාවක් නිවැරදිව, විධිමත්ව හා නීතියට අනුකූලව කර්මාන්ත බද්ද පනවා නැති බවයි. මෙම තත්වය අතිශයින් බැරෑරුම් ලෙස පළාත් පාලන ආයතන හා පළාත් පාලන බලධාරීන් අවධානයට ගත යුතු කරුණකි. පළාත් පාලන ආයතනයන්හි කාර්ය සාධනය පරීක්ෂා කොට වාර්ෂිකව ත්‍යාග සහතික ආදිය ප්‍රදානය කර සභාවල කාර්යක්ෂමතාවය මැනීමේ ක්‍රමවේදයන් දැනට ක්‍රියාත්මකව පවතී. එහිදී

අනිවාර්යයෙන්ම මෙම පර්යේෂණ අධ්‍යයනයේදී සිදුකළාක් මෙන්ම නිලධාරීන්ගේ කාර්ය සාධනය ගණනය කිරීමේ ක්‍රමවේදයන් පවතී.

ඒ අනුව මෙම කාර්යය වෙනුවෙන් ද පවත්නා තත්වය විමර්ශනය කිරීමේ හැකියාව ඇත. එහෙත් දීප ව්‍යාප්තව පැතිර ඇති මෙම නීතියේ අවභාවිතය හා නීතියේ ප්‍රතිපාදන නොසලකා ක්‍රියාකිරීම අවධානයට ගෙන ඇති බවක් නොපෙනේ. එබැවින් පළාත් පාලන බලධාරීන් ගේ කඩිනම් අවධානය මේ කෙරෙහි යොමුවිය යුතුවේ.

මීළඟට නියැදි ගත නගර සභාවන්හි විනෝද බද්ද, වාහන හා සත්ව බද්ද, සංවර්ධනය නොකළ ඉඩම් මත පනවන බද්ද ආදිය පිළිබඳව පවත්නා යථා ස්වරූපය සොයා බැලීම වැදගත්වේ. මේ අනුව ඒ ඒ නියැදිගත නගර සභා සම්බන්ධ පූර්වෝක්ත බදු පිළිබඳ පවතින තත්වය විමර්ශනයට භාජනය කෙරේ.

5.6.5 විනෝද බද්ද, වාහන හා සත්ව බද්ද සංවර්ධනය නොකළ ඉඩම් මත පනවන බද්ද :

5.6.5.1 සීතාවකපුර නගර සභාව

2016 වර්ෂය සඳහා සීතාවකපුර නගර සභාව උක්ත ආදායම් පනවා ඇත්තේ 2015.11.27 දිනැති අංක 1943 දරණ ගැසට් පත්‍රයේ සභාව වෙනුවෙන් ලේකම්වරිය විසින් පළකරන ලද නිවේදනයක් මගිනි. මෙම පැනවීමට ලේකම්වරිය ට බලය ලැබී ඇත්තේ නගර සභා ආඥා පනතේ 184 (අ) වගන්තියෙන් බව පුන පුනා දක්වා ඇත. මෙය සාවද්‍ය භාවිතයකි. සීතාවකපුර නගර සභාව 2016 වර්ෂය සඳහා විනෝද බදු පනවා නැත. මෙය ඉතාම නිවැරදි ක්‍රියාමාර්ගයකි. විනෝද බද්ද පනවනු ලබන්නේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා සහා සම්මුතියක් සමඟ කරනු ලබන ඉල්ලීමකදීය. එය වාර්ෂිකව පනවනු නොලැබේ. වාහන හා සත්ව බද්ද පූර්වෝක්ත ගැසට් නිවේදනය සමඟම පනවා ඇත. එය නිවැරදිව සිදුකර ඇතත් බලදායී වගන්තිය ඉහත පරිදි ම සාවද්‍ය ලෙස සඳහන් කර ඇත.

සංවර්ධනය නොකළ ඉඩම් සඳහා වූ බද්ද ද සීතාවකපුර නගර සභාව විසින් නිවැරදිව පනවා ඇතත් එහි ද බලදායී වගන්තිය දෝෂ සහගත ලෙස සඳහන් කර තිබේ. එසේ වූ විට අදාල

පැනවීම බලරහිත වීම නොවැලැක්විය හැකි වන හෙයින් පළාත් පාලන බලධාරීන් මෙම සියුම් කරුණු කෙරෙහි සිය දැඩි අවධානය යොමුකිරීම ඉතා වැදගත්වේ.

5.6.5.2 පෑලියගොඩ නගර සභාව

2016 වර්ෂය සඳහා පෑලියගොඩ නගර සභාව පූර්වෝක්ත බදු පැනවීම් කර ඇත්තේ ලේකම්වරිය විසින් 2015.12.11 දිනැති අංක 1945 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනයක් මගිනි. පෑලියගොඩ නගර සභාව විනෝද බදු, වාහන හා සත්ව බදු හෝ සංවර්ධනය නොකළ ඉඩම් මත බදු 2016 වර්ෂය සඳහා පනවා නැත. විනෝද බදු අමාත්‍යවරයා විසින් පෙර අවස්ථාවකදී පනවා තිබේද යන්න නිශ්චය කර ගැනීම අපහසුවිය. වාහන හා සත්ව බද්ද පැනවීම අනිවාර්ය නොවේ. එහෙත් එමගින් සභාවට සැලකියයුතු ආදායමක් ලබාගත හැකි හෙයින් ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුව තිබුණි. සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද අනිවාර්යයෙන් ම පැනවිය යුතු බද්දකි. එයින් ලදහැකි ආදායම ඉතා විශාල වුවකි. පෑලියගොඩ වැනි නගරයක ඊට ඇති විභව ශක්තිය බෙහෙවින් පුළුල් වේ. එහෙත් මේ පිළිබඳ විගණනය හෝ පළාත් පාලන බලධාරීන් කිසිවෙකු කරුණු විමසා නොතිබීම විමතියට කරුණකි.

5.6.5.3 ජා ඇල නගර සභාව

2016 වර්ෂය සඳහා ජා ඇල නගර සභාව විනෝද බද්දක් පනවා එය 2015.11.06 දිනැති අංක 1940 දරන ගැසට් පත්‍රයේ පළකර ඇත. විනෝද බදු ආඥා පනතේ විධිවිධාන පරිදි විනෝද බද්ද පැනවිය යුත්තේ සභා අනුමැතිය සහිතව අමාත්‍යවරයා විසිනි. එහෙත් එම නීතිමය ප්‍රතිපාදන කෙරෙහි නිසි සැලකිල්ලක් නොදක්වා ලේකම්වරිය 2016 වර්ෂය සඳහා 7.5% ක විනෝද බද්දක්, සිනමාශාලා සඳහා ද 25% ක විනෝද බද්දක් සෙසු සියළු සංදර්ශන සඳහා ද පනවා ඇත. මෙම පැනවීම එහි හරයාත්මක කරුණුමත ම ශූන්‍ය හා බලරහිත වේ. තමාට පැවරී නොමැති කාර්යයක් තමා වෙත නොමැති බලයක් ආරෝපනය කරගෙන ලේකම්වරිය විසින් ක්‍රියාකර තිබීම බලාතික්‍රමණයට විෂය වන්නේය.

මෙම සභාව 2016 වර්ෂය සඳහා වාහන හා සත්ව බද්ද හෝ සංවර්ධනය නොකළ ඉඩම් මත වූ බද්ද පනවා නැති බව පෙනේ. ඊට අදාල ගැසට් නිවේදන හෝ වෙනත් කිසිදු ලියවිල්ලක්

සොයාගැනීම දුෂ්කර විය. කෙසේ වෙතත් මෙමගින් සභාවට විශාල මූල්‍යමය පාඩුවක් සිදුවී ඇත. එහෙත් විගණනය හෝ පළාත් පාලන බලධාරීන් ඒ පිළිබඳව කිසිදු විමසීමක් ද කර නොමැත.

5.6.5.4 හොරණ නගර සභාව

2016 වර්ෂය සඳහා උක්ත බදු පැනවීම් සමහරක් සභාවේ ලේකම්වරයා විසින් 2015.11.13 දිනැති අංක 1941 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදන මගින් සිදුකර ඇත. මෙම සභාව විනෝද බද්දක් මෙම වර්ෂයට පනවා නැත. ඒ පැරණි නගර සභාවක් වන මෙහි අමාත්‍යවරයා විසින් පනවන ලද විනෝද බද්ද ක්‍රියාත්මකව ඇති නිසා විය හැකිය.

වාහන හා සත්ව බද්ද පනවා ඇතත් එය අසම්පූර්ණ බව පෙනේ. නගර සභා ආඥා පනතේ 163 වන වගන්තියේ (3) වන උප වගන්තියේ සඳහන් යථෝක්ත බද්ද සභාව මගින් නියම කරනු ලැබිය හැකි හෝ අතුරු ව්‍යවස්ථා මගින් නියම කළහැකි දිනයකදී වාර්ෂිකව කලින් ගෙවනු ලැබිය යුතුය. එතෙකුදු වුවත් 3 වන උප වගන්තියේ සඳහන් කර ඇති දින හෝ දිනය ලේකම්වරයාගේ නිවේදනයේ සඳහන් කර නැත.

සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද ද මෙම සභාව විසින් පනවා ඇත. එය ද අසම්පූර්ණ බව පෙනේ. මෙම බද්ද පනවනු ලබන සංවර්ධනය නොකළ ඉඩම් යනු කවරේද ? එම නීතියේ දක්වා ඇති විස්තර කවරේද යන්න නිවේදනයේ සඳහන් විය යුතු වුවත් ඒ කිසිදු විස්තරයක් නගර වැසියාට මෙම බද්ද ගෙවීම සඳහා දැනුවත් වීම පිණිස සපයා නැත.

5.6.5.5 කුලියාපිටිය නගර සභාව

මෙම නගර සභාව 2016.01.01 දිනැති අංක 1948 දරන ගැසට් පත්‍රයේ සභාවේ ලේකම්වරිය විසින් පළකරන ලද නිවේදනයක් මගින් වාහන හා සත්ව බද්ද පනවා තිබේ. එය පැනවීම පිණිස වූ ආඥා පනතේ බලදායී වගන්තිය 184 (අ) ලෙස දක්වා තිබීම සාවද්‍ය වේ. ඒ හැර ඒ සම්බන්ධ වෙනත් ගැටළුවක් නොමැත. මෙසේ සාවද්‍ය නීති ප්‍රතිපාදන මත පදනම් වී ඇති නිසා මෙම පැනවීම හා තීරණය නීතිය ඉදිරියේ වලංගුභාවයෙන් තොරය.

කුලියාපිටිය නගර සභාව සඳහා අමාත්‍යවරයා විසින් පෙරදී විනෝද බදු පනවා ඇති හෙයින් මේ වර්ෂය සඳහා සභාව විසින් විනෝද බදු පැනවීමක් කර නොතිබීම බුද්ධිමත් තීරණයකි. එහෙත් සංවර්ධනය නොකළ ඉඩම් සඳහා වාර්ෂිකව පැනවිය යුතු බද්ද පනවා නොමැති වීම බරපතල අඩුපාඩුවකි. මෙයින් සභාවට වන ආදායම් අහිමි වීම සැලකිය යුතු තරම් විශාල වුවකි.

5.6.5.6 පුත්තලම නගර සභාව

2016 වර්ෂය සඳහා මෙම බදු අයකිරීම් සභාවේ **<u>විශේෂ කොමසාරිස්වරයා විසින් නගර සභා ආඥා පනතේ 184 (අ) යන වගන්තියක් මගින්</u>** තමාට පැවරී ඇති බලතල ප්‍රකාර 2015.12.04 දිනැති අංක 1944 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනයක් මගින් සිදුකර ඇත.
නගර සභාවේ සභිකයින් පත්කර නොමැති විටක බදු පැනවීමේ බලය එහි ලේකම් වෙත ආඥා පනතේ 184අ වගන්තිය ප්‍රකාර හිමිවේ. එහෙත් විශේෂ කොමසාරිස්වරයෙකු වෙත එම බලතල පැවරී නැත. එබැවින් මෙම පැනවීම ශූන්‍ය හා බලරහිත වන්නේය.

වාහන හා සත්ව බද්ද අදාල තීරණය යටතේ වූ උප ලේඛනයක දැක්වේ. එය පනවා ඇත්තේ ද 2015.09.30 දින පැවති කමිටු තීරණ රැස්වීමකදීය. මෙවැනි කමිටුවලට නගර සභාවක බදු පැනවීමේ බලයක් පැවරී නැත. මෙම උපලේඛනයද නගර සභා ආඥා පනතේ 163 වගන්තිය සමග කියවියයුතු එහි 3 වන උපලේඛනයේ දැක්වෙන ආකාරයට නොව ඊට වෙනස් අන්දමට පළ කර තිබේ. එහි සාමාන්‍ය පාවිච්චිය සඳහා වූ බයිසිකල් හා වාණිජ කාර්ය සඳහා වූ බයිසිකල් සඳහා වූ බදු පනවා නැත.

මෙම සභාව විනෝද බදු හා සංවර්ධනය නොකළ ඉඩම් මත වූ බදු පනවා නැත. විනෝද බදු අමාත්‍යවරයා විසින් පෙර දී පනවා තිබිය හැකි වුවද සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම සිදුකර නොතිබීමත් ප්‍රබල විභව ආදායම් ප්‍රභවයකින් යුතු පුත්තලම නගර සභාවට එමගින් සැලකිය යුතු ආදායමක් අහිමිව ඇත. ඒ අනුව පුත්තලම නගර සභාව මෙම ආදායම් පැනවීම අවිධිමත් හා දෝෂ සහගත බව පෙනීයයි.

5.6.5.7 ගම්පොළ නගර සභාව

2016 වර්ෂය සඳහා ගම්පොළ නගර සභාව මෙම ආදායම් පනවා ඇත්තේ සභාවේ විශේෂ කොමසාරිස්වරයා විසින් 2015.10.30 දිනැති අංක 1939 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනයක් මගිනි. මෙම නිවේදනයේ බදු පැනවීමේ බලදායී වගන්තියක් සඳහන් කොට නැත. ඒ අනුව විශේෂ කොමසාරිස්වරයා තමාට නීතියෙන් හිමිවී නැති බලතල පාවිච්චිකර තිබීම අතිශයින් දෝෂ සහගතය.

මෙම සභාව විනෝද බදු හා වාහන හා සත්ව බද්ද පනවා ඇත. විනෝද බදු පනවා අයකිරීමට විශේෂ කොමසාරිස්වරයා වෙත බලය පැවරී නැති අතර එය එසේ කිරීමෙන් ඔහු බලාතික්‍රමණයක් සිදුකර ඇත. සංවර්ධනය නොකළ ඉඩම් මත වූ බද්ද ද අත්‍යාවශ්‍යයෙන්ම සභාව විසින් පැනවිය යුතු බද්දකි. එහි විභව ධාරිතාව බෙහෙවින් පුළුල් වූවකි. එහෙත් එය පනවා නොමැති බව පෙනේ. වාහන හා සත්ව බද්ද පැනවීමේදී ආඥා පනතේ 163 වගන්තිය සමග කියවිය යුතු එහි 3 වන උප ලේඛනයට අනුව මෙම පැනවීම අසම්පූර්ණ බව පෙනේ. ඒ අනුව ගම්පොළ නගර සභාව විසින් 2016 වර්ෂය සඳහා පනවා ඇති ආදායම් බෙහෙවින් ව්‍යාකූල තත්වයක ඇති අතර එමගින් ආදායම් ලබාගැනීමට තැත් කිරීම අතිශයින් සංකීර්ණ වූ ක්‍රියා මාර්ගයකි.

5.6.5.8 තලවාකැලේ - ලිඳුල නගර සභාව

මෙම සභාව 2016 වර්ෂය සඳහා පූර්වෝක්ත ආදායම් පැනවීම සිදුකර ඇත්තේ 2015.12.04 දිනැති අංක 1944 දරන ගැසට් පත්‍රයේ ලේකම්වරයා විසින් පළකර ඇති නිවේදනයක් මගිනි. මෙම බදු පැනවීම සභාව විසින් සිදුකර ඇති බව පෙනේ.

ඒ අනුව තලවාකැලේ - ලිඳුල නගර සභාව 2016 වර්ෂය සඳහා පනවා ඇත්තේ උක්ත ආදායම් අතුරින් සංවර්ධනය නොකළ ඉඩම් මත වූ බද්ද පමණි. එය බොහෝදුරට ආඥා පනතේ විධිවිධාන ප්‍රකාර පනවා ඇති බව පෙනේ. වාහන හා සත්ව බද්ද මෙම සභාව විසින් 2016 වර්ෂයට පනවා නැත. එය අනිවාර්යයෙන්ම පැනවිය යුතු බද්දක් නොවුවත් එමගින් යම් ආදායමක් සභාවට නොලැබී ගොස් ඇති බව පෙනේ. විනෝද බද්ද මෙම සභාව සඳහා අමාත්‍යවරයා විසින් කලින් පනවා ඇති බව හැඟේ.

5.6.5.9 ඇඹිලිපිටිය නගර සභාව

2016 වර්ෂය සඳහා මෙම සභාව විනෝද බද්ද සහ වාහන හා සත්ව බද්ද 2015.11.06 දිනැති අංක 1940 දරන ගැසට් පත්‍රයේ සභාවේ ලේකම්වරයා විසින් පළකරන ලද නිවේදනයක් මගින් පනවා ඇත. මෙහි අදාල පැනවීම් සඳහා වූ බලදායී වගන්තිය 184 (අ) ලෙස දක්වා ඇත. එබඳු වගන්තියක් නගර සභා ආඥා පනතේ නොමැති හෙයින් මෙම පැනවීම් ශූන්‍ය හා බල රහිත වේ.

වාහන හා සත්ව බද්ද පැනවීමේදී නගර සභා ආඥා පනතේ 163 වන වගන්තියේ (3) වන උප වගන්තිය ප්‍රකාරව මෙම බද්ද ගෙවිය යුතු දිනය හෝ දින සභාව මගින් හෝ ඒ සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවක් මගින් තීරණය කළ යුතුය. එහෙත් මෙම නිවේදනයේ එබඳු කිසිදු දිනයක් සඳහන් නොවේ. මෙය අවිධිමත් ක්‍රියාවකි. ඇඹිලිපිටිය නගර සභාවේ ලේකම්වරිය විනෝද බදු පනවා ඇති අතර එය විධිමත් නොවේ. අදාල පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් ඇඹිලිපිටිය නගර සභාව කරන ලද තීරණය අනුමත කරන ලද්දේ නම් එකී අනුමැතියට අදාල නිවේදනය අමාත්‍යවරයාගේ නමින් හෝ අමාත්‍යාංශ ලේකම්වරයා නමින් පළකරනු ලැබිය යුතුය. ඇඹිලිපිටිය නගර සභාවේ ලේකම්හට අමාත්‍යාංශයක රාජකාරී කටයුතු පැවරී නැති බැවින් ඇයට එවැනි නිවේදනයක් ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා බලය නොපැවරේ. මෙය බලාතික්‍රමණයට යටත් වන අතර නීතිය ඉදිරියේ වලංගුභාවයක් ද නොමැත.

5.6.5.10 හික්කඩුව නගර සභාව

2016 වර්ෂය සඳහා උක්ත ආදායම් අතුරින් විනෝද බදු හා වාහන හා සත්ව බදු මෙම සභාවේ ලේකම්වරයා විසින් 2015.12.23 දිනැති අංක 1947 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනයක් මගින් පනවා ඇත. මීට අදාල නිවේදනයේ සභාවේ බදු අයකිරීමේ බලය ලේකම්වරයාට පැවරෙන බලදායී වගන්තිය ගැන සඳහන් කර නැත. මෙම නිවේදනය ප්‍රකාර වාහන හා සත්ව බද්ද සම්බන්ධව නීතියේ නියම කර ඇති මුදලට අමතරව තහඩුව හා ලිපිද්‍රව්‍ය ගාස්තුව වශයෙන් රුපියල් 05.00 ක් ද, බලපත්‍ර ලබානොගත් පාපැදි සඳහා මහ මගදී වැටලීම් වලදී බලපත්‍ර ගාස්තුවට අතිරේකව රු 10.00 ක්ද ගෙවිය යුතු බවට නියම කර ඇත. මෙය නීතියේ ප්‍රතිපාදන බරපතල ලෙස උල්ලංඝනය කිරීමක් සේම බලාතික්‍රමණයක්ද වන්නේය. ඊට අදාල බලය තමාට නගර සභා ආඥා පනතේ 184 අ වගන්තියෙන් ලැබී ඇති

බවද අදාල තීරණයෙහි දැක්වේ. මෙවැනි අත්තනෝමතික නීති විරෝධී ක්‍රියාවන් සඳහා බදු ගෙවන ජනතාව අදාල පුද්ගලයිනට එරෙහිව නීතිමට පියවර ගන්නා දිනය වැඩි ඈතක නොවන බව සඳහන් කළ යුතුව ඇත.

හික්කඩුව නගර සභාවේ ලේකම් විසින් තමාට නගර සභා ආඥා පනතේ 184 අ වගන්තියෙන් පැවරී ඇති බලය මත 2016 වර්ෂය සඳහා 10% ක විනෝද බද්දක් පනවා ඇත. ඒ සමගම ඉහත වගන්තියේ බලය මත ම යයි සඳහන් කර ප්‍රසිද්ධ රැඟුම් බලපත්‍ර ගාස්තු ද චිත්‍රපට නාට්‍ය, මැජික්, සර්කස් දර්ශන සඳහා රු 500/- ක් ද, එක් දිනකට වැඩිවන සෑම දිනයකට ම අතිරේක රු 250/-ක් ද, සංගීත සංදර්ශන සඳහා එක් දිනකට රු 500/- ක බලපත්‍ර ගාස්තුවක් ද පනවා ඇත. විනෝද බදු ආඥා පනතේ 2.(2) වගන්තියේ ප්‍රකාර සභාවේ තීරණයක් මත අමාත්‍යවරයා විසින් විනෝද බද්ද පනවා ගැසට් පත්‍රයේ පළකළ යුතුය. සභාවට එය අයකළ හැක්කේ එසේ පැනවීම සිදු කළ පසුවය. මෙහි සඳහන් පරිදි විනෝද බද්ද පැනවීමට සභාවේ ලේකම්වරයාට බලය පැවරී නැත. විනෝද බදු පැනවීම විනෝද බදු ආඥා පනතේ විධිවිධාන අනුව කරනු ලැබිය යුතුය.

ප්‍රසිද්ධ රැඟුම් ආඥා පනතේ (176 වන අධිකාරය) 6 වන වගන්තියේ 10 වන උප වගන්තියේ (අ) ඡේදය ප්‍රකාර ආරක්ෂාව විෂය පිළිබඳ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අදාල ප්‍රසිද්ධ රැඟුම් බලපත්‍ර ගාස්තු ඒ ඒ සභා සඳහා නියම කළ යුතුය. එවිට ආඥා පනතේ දක්වා ඇති අවශ්‍යතා දේ සපුරා ලූ විට පළාත් පාලන ආයතනයට බලපත්‍රය නිකුත් කොට නියම කර ඇති ගාස්තුව අයකර ගතහැකිය. මෙහිදී හික්කඩුව නගර සභාවේ ලේකම්වරයා රටේ පවතින නීතිය කෙරෙහි සැලකිල්ලක් නොදක්වා බරපතල ලෙස නීතිය උල්ලංඝණය කර ඇති බව පෙනේ.

මෙවැනි අතිශය බැරෑරුම් කරුණු පිළිබඳව පළාත් පාලන හෝ විගණන බලධාරීන්ගේ අවධානය යොමු නොවීම බරපතල බේදවාචයකි.

5.6.5.11 හපුතලේ නගර සභාව

2016 වර්ෂය සඳහා හපුතලේ නගර සභාව වාහන හා සත්ව බදු පනවා ඇති අතර විනෝද බදු හා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පනවා නැත. වාහන හා සත්ව බද්ද පැනවීමේදී ලේකම්වරයා " නගර සභා ආඥා පනතේ 162 (1) වගන්තිය යටතේ පහත උපලේඛනයේ දැක්වෙන පරිදි හපුතලේ නගර සභා බල ප්‍රදේශය තුල වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් 2016 වර්ෂය සඳහා පනවා අයකිරීමට තීරණය කර ඇති බව සඳහන් කර ඇත."

උප ලේඛනය :-

01. බස් රථයක් සඳහා	රු.500
02. ලොරි රථයක් සඳහා	රු.500
03. කාරයක් සඳහා	රු.500
04. යතුරු පැදියක් සඳහා	රු.200

මෙම ගාස්තුව රු 500 හා රු 200 ද නැතිනම් රු 50.00 හා රු 20.00 ද යන්න පැහැදිලි නැත. මෙම පැනවීම බලාතික්‍රමණයකි.

නගර සභා ආඥා පනතේ 163 වගන්තිය සමග කියවිය යුතු 3 වන උප ලේඛනයේ දැක්වෙන වාහන හා සතුන් හපුතලේ නගර සභාවේ ලේකම්වරයාගේ උපලේඛනයේ නොමැත. ඔහු වාහන හා සතුන් සඳහා බද්දට යටත් කර ඇත්තේ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වෙත බලපත්‍ර ගාස්තු පනවා අයකිරීමට පාර්ලිමේන්තුව නීතියෙන් පනවා ඇති වාහන වර්ග සඳහා බලපත්‍ර ගාස්තුවකි. මෙය ලංකාවේ බලපවත්නා නීතිය ප්‍රසිද්ධියේ ගැසට් මගින් නිවේදන පනවා උල්ලංඝනය කිරීමකි. මේ පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දන්නේ නම් අතිශය බරපතල තත්වයකට මෙම නිලධාරියාට මුහුණ පෑමට සිදුවනු ඇත.

5.6.5.11 ත්‍රිකුණාමලය නගර සභාව

ත්‍රිකුණාමලය නගර සභාව මෙම කිසිදු බද්දක් විධිමත්ව පනවා ගැසට් මගින් ප්‍රකාශයට පත්කර නැත. එතෙකුදු වුවත් පරීක්ෂණ කණ්ඩායම එහි ආදායම් ලේඛන හා අයවැය ලේඛන පරීක්ෂා කිරීමේදී පෙනීගියේ සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම හෝ කිසිම

ආදායමක් ලැබී නොමැති වුවත් වාහන හා සත්ව බද්ද වශයෙන් 2016 වසර සඳහා රු 10,000/- ක් ඇස්තමේන්තු කර ඇති බවත් විනෝද බදු වශයෙන් රු 1,500,000/- ඇස්තමේන්තු කර ඇති බවයි. මෙයින් පෙනී යන්නේ විධිමත් පැනවීමක් නැතිව වුවත් ත්‍රිකුණාමලය නගර සභාව මෙම බදු ජනතාවගෙන් අවිධිමත් ලෙස අයකරන බවයි.

5.6.5.12 කාතන්කුඩි නගර සභාව

මෙම නගර සභාව 2016 වර්ෂය සඳහා සෙසු බදු හා බලපත්‍ර ගාස්තු පනවා ඇත්තේ 2016.05.27 දිනැති අංක 1969 දරන ගැසට් පත්‍රයේ නිවේදන පළකිරීමෙනි. එහෙත් එහි මෙම ආදායම් මාර්ග කිසිවක් පනවා නැති බව පෙනේ. මෙය සාපේක්ෂ වශයෙන් අළුත් නගර සභාවක් හෙයින් ඒ සඳහා විනෝද බදු කලින් පනවා තිබේද යන්න අවිනිශ්චිතය. වාහන හා සත්ව බද්ද හා සංවර්ධනය නොකළ ඉඩම් සඳහා වූ බද්ද පනවා නොමැති වීමෙන් සභාවට සෑහෙන ආදායමක් අහිමි වී ඇති බව පෙනේ.

5.6.5.13 පේදුරුතුඩුව නගර සභාව

2016 වර්ෂය සඳහා පූර්වෝක්ත එකදු ආදායම් මාර්ගයක් වත් පේදුරු තුඩුව නගර සභාව විසින් පනවා නැත. වාහන හා සත්ව බද්ද පැනවූ බව කරුණු විමසීමේදී සඳහන් වූවත් එය විධිමත් ලෙස පනවා ගැසට් පත්‍රයේ පළකර නැත. එහෙත් එයින් 2016 වර්ෂය සඳහා රු.20,000/- ක් අයවැයින් ඇස්තමේන්තු ගතව ඇත.

විනෝද බද්ද හා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පේදුරුතුඩුව නගර සභාව විසින් පනවා නැති බව නිලධාරීන් විසින් ප්‍රකාශ කරන ලදි. කෙසේ වෙතත් ප්‍රබල විභව ශක්තියක් ඇති මෙම ආදායම් මාර්ග ප්‍රයෝජනයට නොගැනීමෙන් සභාවට විශාල ආදායමක් අහිමිවීම වාර්ෂිකව සිදුවේ.

5.6.5.14 වව්නියාව නගර සභාව

2016 වර්ෂය සඳහා වව්නියාව නගර සභාව විනෝද බද්ද හෝ සංවර්ධනය නොකළ ඉඩම් සඳහා වූ බද්ද පනවා නැත. වව්නියාව නගර සභාව පැරණි පළාත් පාලන ආයතනයක් බැවින් ඒ සඳහා ඇමතිවරයා විනෝද බදු පනවා ඇතැයි නිගමනය කළ හැකිය. සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු පැනවීමක් සිදුකර නැත. වාහන හා සත්ව බද්ද නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාර පනවා නැත. එහෙත් ඇතැම් වාහන සඳහා බදු හා වාර්ෂික ලියාපදිංචි

ගාස්තු පනවා ඇත. උදා - ත්‍රීරෝද රථයක වාර්ෂික ලියාපදිංචි කිරීමේ ගාස්තුව රු 300/- කි. බයිසිකලයක වාර්ෂික බලපත්‍ර ගාස්තුව රු 15/- කි. මෙසේ වාහන හා සත්ව බද්ද ආඥා පනතේ ප්‍රතිපාදන මත නොව සභාවේ ලේකම්වරයාගේ අභිමතය පරිදි පනවා ඇති බව පෙනේ. ත්‍රීරෝද රථ ලියාපදිංචි කිරීම මෝටර් රථ වාහන ආඥා පනත ප්‍රකාර මෝටර් වාහන දෙපාර්තමේන්තුව සතු කාර්යභාරයකි. එවැන්නක් සිදුකිරීමට වව්නියාව නගර සභාවේ ලේකම්වරයා වෙත බලයක් පැවරී නැත. මේ අනුව පෙනී යන කරුණක් වන්නේ රටේ පවතින නීතියේ විධිවිධාන පිළිබඳව කිසිදු සැලකිල්ලකින් තොරව නීතිය අභිබවා යමින් ඇතැම් පළාත් පාලන ආයතන කටයුතු කරන බවයි. මෙය අතිශය බරපතල කාරණයක් වන්නේ එමගින් මෙම ආයතන හෝ ඒවායේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විධිවිධාන කිසිදු වකිතයකින් තොරව උල්ලංඝනය කිරීමයි.

මේ තුලින් විද්‍යාමාන වන ඉතාමත් කණගාටුදායක සත්‍යය නම් රටේ සිවිල් සමාජය එනම් උගත්. බුද්ධිමත්, ප්‍රවීණ, වෘත්තික, රජයේ නිලධාරී, පෞද්ගලික අංශයේ නිලධාරී, නීතිවේදීන් හා සාමාන්‍ය ජනතාව ලංකාවේ බොහෝ පළාත් පාලන ආයතන විසින් නීතියකින් තොරව හිතුවක්කාර ලෙස පනවන වරිපනම්, බලපත්‍ර ගාස්තු හා බදු වලට යටත්කොට ඇති බවත් අඩු වැඩි වශයෙන් ඔවුන් සියළුදෙනා නිශ්ශබ්දව එම අනීතික බදු හා ගාස්තු ගෙවන බවත්ය.
මෙම අයහපත් නීතියට පටහැනි ක්‍රියාමාර්ග සම්බන්ධව වගකිවයුතු පාර්ශව වන පළාත් සභාව සහ විගණන බලධාරීන් මුනිවත රැකීම කෙසේ සාධාරණීකරණය කරන්නේ ද යන්න රට හමුවේ ඇති ප්‍රබල කාලීන ගැටළුවකි. එය මතුපිටට ගැටළුවක් සේ නොපැමිණීම ඊටත් වඩා පුදුම සහගත තත්වයකි.

5.7 ප්‍රාදේශීය සභා:

ඉහත පරිච්ඡේදයන්හි පිළිවෙලින් මහා නගර සභා සහ නගර සභාවන්හි වරිපනම්, බලපත්‍ර ගාස්තු, ව්‍යාපාර බදු, කර්මාන්ත බදු, විනෝද බදු, වාහන හා සත්ව බදු සහ සංවර්ධනය නොකළ ඉඩම් මත බදු යන ආදායම් මූලයන්හි පැනවීම් පිළිබඳව පවතින තත්වය සවිස්තරව ඒ ඒ පළාත් පාලන ආයතනය යටතේ වෙන් වෙන්ව විශ්ලේෂණය කරන ලදි. එහෙත් ප්‍රාදේශීය සභා සම්බන්ධව සලකා බැලීමේදී ඒ ඒ ආදායම් මූලයන් වෙන් වෙන්ව ඒ ඒ ආයතන යටතේ සලකා බැලීම අතිශයින් දුෂ්කර කාර්යයක් වන්නාක් මෙන්ම ප්‍රාදේශීය සභා 21 ක් තරම්

ආයතන සංඛ්‍යාවක වෙන් වෙන්ව කිහිපවරක් එම විස්තර පරිහරණය කිරීමද දුෂ්කර කාර්යයකි. එබැවින් ඒ ඒ ප්‍රාදේශීය සභාව යටතේ ඉහත සඳහන් සියළු ආදායම් මූලයන් පිළිබඳ පවතින තත්වය විශ්ලේෂණාත්මකව විමසුමට ලක් කිරීමට අදහස් කෙරේ. ඒ අනුව පහත සඳහන් නියැදිගත ප්‍රාදේශීය සභාවන්හි තොරතුරු පරීක්ෂාකර අනාවරණය කරගත් තොරතුරු මෙතැන් සිට ඉදිරිපත් කරනු ඇත.

සටහන් අංක 17 : අධ්‍යයනයට භාජනය කරන ලද ප්‍රාදේශීය සභා

01	කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව	08	ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව	15	මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව
02	බියගම ප්‍රාදේශීය සභාව	09	ගලිගමුව ප්‍රාදේශීය සභාව	16	තමන්කඩුව ප්‍රාදේශීය සභාව
03	දොඩංගොඩ ප්‍රාදේශීය සභාව	10	දික්වැල්ල ප්‍රාදේශීය සභාව	17	තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව
04	හලාවත ප්‍රාදේශීය සභාව	11	බෙන්තොට ප්‍රාදේශීය සභාව	18	සේරුවිල ප්‍රාදේශීය සභාව
05	අලව්ව ප්‍රාදේශීය සභාව	12	පස්සර ප්‍රාදේශීය සභාව	19	නානාටන් ප්‍රාදේශීය සභාව
06	යටිනුවර ප්‍රාදේශීය සභාව	13	මොණරාගල ප්‍රාදේශීය සභාව	20	කරච්චි ප්‍රාදේශීය සභාව
07	අඹගමුව ප්‍රාදේශීය සභාව	14	තලාව ප්‍රාදේශීය සභාව	21	මුහුදුබඩ පත්තු ප්‍රාදේශීය සභාව

ඉහත සඳහන් කර ඇති මෙම අධ්‍යයනයේදී විමර්ශනයට භාජනය කරනු ලබන ආදායම් මූලයන් හතෙහි (07) කාර්ය සාධනය සම්බන්ධයෙන් මහා නගර සභා සහ නගර සභා පෙන්නුම් කර ඇත්තේ ඉතා අසතුටුදායක චිත්‍රයකි. ප්‍රාදේශීය සභා සම්බන්ධවද සටහන් අංක 08 හි දැක්වෙන පැතිකඩ පරීක්ෂා කිරීමේදී ආදායම් පැනවීම විෂයෙහි පවතින දුර්වල ස්වභාවය සෑම පළාතකටම හා සෑම ආයතනයකටම පොදු වූවක් බව පෙනේ. කෙසේ වෙතත් මෙම පර්යේෂණ අධ්‍යයනය සඳහා ඇති සීමාවන් සැලකිල්ලට ගනිමින් හැකිතාක් සංක්ෂිප්තව අදාල ආයතනයන්හි ආදායම් පැනවීම් ස්වභාවය පරීක්ෂා කර බලමු.

5.7.1 කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව

2016 වර්ෂය සඳහා කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව උක්ත ආදායම් පැනවීම් සිදුකර ඇත්තේ 2015.12.23 දිනැති අංක 1947 දරන ගැසට් පත්‍රයේ සභාපතිවරයා විසින් පළකරනු ලබන නිවේදන මගිනි. ඒ අනුව වරිපනම්, බලපත්‍ර ගාස්තු, ව්‍යාපාර බද්ද හා

කර්මාන්ත බද්ද පනවා ඇත. සෙසු ආදායම් කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව විසින් පනවා නැත.

i. **වරිපනම්**

කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව ඉහත විස්තර සඳහන් කර ඇති පරිදි වරිපනම් පැනවීම් සිදුකිරීමේදී බලප්‍රදේශය කොටස් දෙකකට බෙදා වරිපනම් සඳහා පදනම් කරගන්නා තක්සේරුව අනුමත කිරීමට උත්සාහ දරා ඇත. එතෙකුදු වුවත් ප්‍රාදේශීය සභා පනතේ ප්‍රතිපාදන මත එම පදනම් දෙකම සාවද්‍ය වේ. සභාවේ සම්මත කර ඇති යෝජනාව අනුව පනතේ 146 (1) වන උප වගන්තිය ප්‍රකාර සභාවේ ප්‍රධාන කාර්යාලීය බල ප්‍රදේශයේ දේපල සඳහා 2009 වර්ෂයේ සිදුකරන ලද වාර්ෂික තක්සේරුව ද උප කාර්යාල බල ප්‍රදේශයේ දේපල සඳහා 2011 වර්ෂයේ සිදුකරන ලද තක්සේරුව ද පදනම් කරගැනීමට පිළිගෙන ඇත.

ප්‍රාදේශීය සභා පනතේ 146 (1) වන උප වගන්තියේ " අමාත්‍යවරයාගේ විධාන මත අළුත් තක්සේරුවක් හෝ සත්‍යෙක්ෂණය කිරීමක් කරන ලද විටෙක දී හැර හෝ දැනට පවත්නා සේවාවක් වැඩි දියුණු කරන ලද විශේෂ අවස්ථාවක දී අවශ්‍යයයි සලකනු ලැබිය හැකි වෙනස් කිරීම් සමග ඉහතින් වූ වර්ෂය සඳහා වූ තක්සේරුව හෝ සත්‍යෙක්ෂණය කිරීම පසුව එළඹෙන වර්ෂය සඳහා තක්සේරුව හෝ සත්‍යෙක්ෂණය ලෙස සභාව විසින් සම්මත කරනු ලැබිය යුතුය."

යථොක්ත වගන්තියේ විධිවිධාන අනුව 2009 වර්ෂයේ තක්සේරුව හෝ 2011 වර්ෂයේ තක්සේරුව 2016 වර්ෂයේ තක්සේරුව ලෙස යොදාගත නොහැකිය. එය නීතියේ විධිවිධාන ඉක්මවා ක්‍රියාකිරීමකි. ඒ අනුව කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව 2016 වර්ෂය සඳහා වරිපනම් පැනවීමට කර ඇති යෝජනාව ශූන්‍ය හා බලරහිත වන්නේය. තවද මෙම යෝජනාවේ 3 වන ඡේදයේ බදු ගෙවිය යුතු දින පිළිබඳ උපලේඛනයක් ගැන සඳහන් වුවත් එබඳු උප ලේඛනයක් මෙම නිවේදනයේ දක්නට නොලැබේ.

ii. **බලපත්‍ර ගාස්තු**

මීට අදාල යෝජනාව අනුව බලපත්‍ර ලැබිය හැකි ව්‍යාපාර සංඛ්‍යාව 13 කි. එහි අංක 11 යටතේ <u>**සංචාරක වෙළඳාමක් පවත්වාගෙන යාමද**</u>, අංක 13 යටතේ <u>**විකිණීම සඳහා ශීතකළ මස් වෙළඳාම**</u> යනුවෙන් ද සඳහන් වේ. මෙහි දැක්වෙන සංචාරක වෙළඳාම එක් නිශ්චිත ස්ථානයක

සිදුකරන්නක් නොවන හෙයින් ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය යටතේ බලපත්‍ර නිකුත් කළ නොහැකිය. ඒ සඳහා පනතේ 126 වන වගන්තියේ (x) ඡේදයෙන් පවරා ඇති බලතල අනුව සංචාරක වෙළඳාම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතු අතර බලපත්‍ර ගාස්තුවද අතුරු ව්‍යවස්ථාවට ඇතුළත් කරනු ලැබිය යුතුය. **විකිණීම පිණිස ශීතකළ මස් වෙළඳාම යනු කුමන කරුණක් ඇයි නොවැටහේ.**

තවද අප්‍රසන්න අන්තරාදායක ව්‍යාපාර සම්බන්ධව බලපත්‍ර නිකුත් කිරීම සඳහා වෙළඳාම් 66 ක් අදාල නිවේදනයේ උප ලේඛණයේ දක්වා ඇත. මෙම වෙළඳාම් සඳහා බලපත්‍ර නිකුත් කිරීමට නම් ඒ ඒ සෑම විෂයයක් සඳහා ම අතුරු ව්‍යවස්ථාවක් බැගින් තිබිය යුතුය. මෙම ලේඛනයේ සඳහන් බොහෝ කරුණු වෘත්තිය බද්දට, කර්මාන්ත බද්දට හෝ වෙනත් ආයතනයන්හි අධිකාරී බලයට යටත් වෙළඳාම් හෝ කර්මාන්ත වේ. එසේම විකිණීම සඳහා භාණ්ඩ තොග තබාගැනීම ගබඩා කිරීම ව්‍යාපාරයක් ලෙස ද දක්වා ඇත.

උදා:- (57) විශේෂඥ වෛද්‍ය සේවා - වෘත්තියකි.

(58) මනාලියන් හැඩගැන්වීම - වෘත්තියකි.

(59) ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යෑම - වෘත්තියකි.

(61) රටබීම හලක් පවත්වාගෙන යාම. - වෘත්තියකි.

(62) වේෂ නිරූපන ආයතනයක් පවත්වාගෙන යාම. - වෘත්තියකි.

ඉහත කරුණු කිසිවකට බලපත්‍ර ගාස්තු පැනවිය නොහැකිය. රට බීම විකිණීම සඳහා බලපත්‍ර දීමේ අධිකාරිය සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාය. මෙම ව්‍යාපාර අතුරින් වෘත්තීය බදු සඳහා විෂයවන ව්‍යාපාර සඳහා එම බද්ද පැනවීම ඉතා කල්පනාකාරීව කළයුතුය.

මනාලියන් හැඩගැන්වීම අන්තරායකාරී හා අප්‍රසන්න ව්‍යාපාරයක් ලෙස බලපත්‍ර ගාස්තු පනවා ඇතත් එම කර්මාන්තය නියාමනය සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නැත. මෙම දීර්ඝ ලේඛනයේ සඳහන් සෑම ව්‍යාපාරයක් වෙනුවෙන්ම අතුරු ව්‍යවස්ථාවක් පනවා තිබිය යුතුය. එහෙත් පරීක්ෂණ කණ්ඩායමේ කරුණු සොයා බැලීම් වලදී පැහැදිලි වූයේ මේ කිසිදු විෂයයක් සඳහා අතුරු ව්‍යවස්ථාවක් පනවා නොමැති බවයි. සම්මත අතුරු ව්‍යවස්ථාවන්හි

අන්තරායකාරී හා අප්‍රසන්න ව්‍යාපාර සඳහා එක් පොදු අතුරු ව්‍යවස්ථාවක් පැවතියත් එයින් මෙහි සඳහන් සියළු විෂයයන් ආවරණය කළ නොහැකිය.

මෙම කරුණු අනුව බලන කළ පැහැදිලි වන්නේ ඉහත බලපත්‍ර ගාස්තු පැනවීම විධිමත් වූවක් නොවන බවයි.

iii. ව්‍යාපාර බදු

මෙම ප්‍රාදේශීය සභාව ව්‍යාපාර 111 ක් සඳහා ව්‍යාපාර බදු පනවා ඇත. මේ අතුරින් ව්‍යාපාර 20 ක් විකිණීම සඳහා යම් ද්‍රව්‍ය තොග ගබඩාකර තබා ගැනීමය. මෙය ව්‍යාපාරයක් නොවේ. එසේම ඒ අතර වෘත්තීය බලපත්‍ර ලබාගත යුතු වෙළඳාම් මෙන්ම කර්මාන්ත බද්ද පැනවිය හැකි ස්ථාන ගණනාවක් එහි තිබේ. මෙහි 26 කැඳ කඩයක් පවත්වාගෙන යෑම, 62 ආයෝජකයින් ආදී පිරිවැටුමක් දැක්විය නොහැකි කාර්යයක් සහ 15 භූමිතෙල් විකිණීම, 70 ඉන්ධන පිරවුම්හල් ආදිය දක්වා ඇත. මේ සඳහා බණිජ තෙල් ආඥා පනත යටතේ අමාත්‍යවරයා විසින් නියෝග මගින් බලපත්‍ර ගාස්තු ද පනවා ඒවා අයතර ගැනීමේ බලය පළාත් පාලන ආයතන වෙත පවරා තිබේ. එහෙත් ඒවා කෙරෙහි ව්‍යාපාර බදු පැනවීමේ බලයක් ප්‍රාදේශීය සභාවන්ට පවරා නැත.

මේ කරුණු අනුව කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව 2016 වර්ෂය සඳහා වූ ව්‍යාපාර බදු පැනවීම බලාතික්‍රමණයට පවා යටත්වන, බෙහෙවින් අවිධිමත් කාර්යයක් බව පැහැදිලි වේ.

iv. කර්මාන්ත බද්ද

කර්මාන්ත බද්ද පැනවීමේදී මෙම ආයතනය කර්මාන්ත (Trade) 24 ක් සඳහා එම බදු පනවා ඇත. මෙය පළාත් පාලන ආයතනයකට සිය බලප්‍රදේශය තුල ඇති අතුරු ව්‍යවස්ථාවකින් නියාමනය කළයුතු නොවන හා ව්‍යාපාරයක් හෝ වෘත්තීයක් නොවන බොහෝ වෙළඳාම් සඳහා බදු පැනවීමට ලැබෙන මහඟු අවස්ථාවකි.

එහෙත් එය නිසි පරිදි අවබෝධ කොට ගෙන සංවිධානය කරගැනීමට වෙනත් බොහෝ පළාත් පාලන ආයතන මෙන්ම කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව ද අසමත්වී ඇත. මීට

අයත් විය යුතු බොහෝ වෙළඳාම් බලපත්‍ර ගාස්තු සඳහාත් ව්‍යාපාර බදු සඳහාත් ලැයිස්තු ගත කර තිබේ. මෙය එතරම් ක්‍රමවත් නොවූවත් මෙම නිවේදනය නිවැරදිව පනවා ඇති බව පෙනේ.

v. විනෝද බද්ද

මෙම ප්‍රාදේශීය සභාව විනෝද බදු පනවා නැත. ඇමතිවරයා විසින් මෙම බද්ද කලින් පනවා තිබෙනු ඇතැයි උපකල්පනය කෙරේ.

vi. වාහන හා සත්ව බද්ද

මෙම බද්ද කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රදේශීය සභාව විසින් 2016 වර්ෂය සඳහා පනවා නැති බව පෙනේ.

vii. සංවර්ධනය නොකළ ඉඩම් මත වූ බද්ද

මෙම බද්ද ඉතා විශාල විභවතාවයක් සහිත ආදායම් මාර්ගයක් සේම අත්‍යාවශයෙන්ම පැනවිය යුතු වූවක් වුවත් මෙම සභාව එම ආදායම් මාර්ගය නොසලකා හරිමින් එය පනවා නැත.

5.7.2 බියගම ප්‍රාදේශීය සභාව

i. වරිපනම්

2016 වර්ෂය සඳහා උක්ත ආදායම් මාර්ග අතුරින් වරිපනම්, බලපත්‍ර ගාස්තු, ව්‍යාපාර බදු සහ කර්මාන්ත බදු පැනවීම 2015.12.04 දිනැති අංක 1944 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනයක් මගින් සභාවේ ලේකම්වරිය විසින් සිදුකර ඇත. මෙහි සඳහන් සියළුම ආදායම් පැනවීමට අදාල තීරණ ලේකම්වරිය සභාව සතු බදු පැනවීමේ බලය මත ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය යටතේ සිදුකරන බව මුලින් සඳහන් කර ඇතත් එකී නිවේදනවල බදු පනවන්නේ කවුරුන්ද, දිනය ආදී විස්තර ඇතුළත් කර නැත. සභාව ක්‍රියාත්මකව නොමැති අවස්ථාවක බදු පැනවීමේ සභාව සතු බලය ලේකම් වෙත පැවරෙන බලදායී වගන්තිය 9.3 ලෙස දැක්වුවද එබඳු වගන්තියක් ප්‍රාදේශීය සභා පනතේ නොමැත. එය 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය ලෙස සඳහන් විය යුතුය. මෙම වරිපනම් නිවේදනය ඉතා ව්‍යාකූල වන අතර අවසාන ඡේදයේ එය සභාව විසින් යෝජනා කරන්නිය යනුවෙන් සඳහන් කර ඇත. සභාවක් ක්‍රියාත්මකව නොපවතින විටක සහ ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියේ විධිවිධාන

ප්‍රකාර පැනවීම් සිදුවන විට ඒ පිළිබඳ නිශ්චිත තීරණය මෙහි සඳහන් නොවේ. " මෙම බද්ද පැනවීමට ..... ලේකම් වශයෙන් මම තීරණය කරමි." යනුවෙන් සඳහන් විය යුතු වූවත් එවැන්නක් දක්නට නැත. උක්ත කරුණු අනුව මෙම වරිපනම් පැනවීම අවිධිමත්, අසම්පූර්ණ හා සාවද්‍ය වූවක් බව පෙනීයයි. ඒ අනුව අදාළ පැනවීම් සාවද්‍ය නෛතික විධිවිධාන මත පනවා ඇති හෙයින් එකී පැනවීම් ශූන්‍ය හා බලරහිත වේ.

ii. බලපත්‍ර ගාස්තු

2016 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීමද උක්ත ගැසට් පත්‍රයේ පළකර ඇති නිවේදනයක් මගින් සිදුකර ඇත. බලපත්‍ර ගාස්තු පනවා ඇති වෙළඳ ස්ථාන 188 ක් එහි ඇති උප ලේඛනයේ දැක්වේ. මෙම පැනවීම සිදුකර ඇත්තේ ප්‍රාදේශීය සභා පනතේ 147 හා 149 වගන්ති යටතේ ලේකම්වරියට පැවරී ඇති බලතල යටතේ එකී පනතේ විධිවිධාන යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති උප ලේඛනයේ නිරූපිත යම් කාර්යයන් සඳහා බව දැක්වේ. ඒ අනුව උප ලේඛන ගත කාර්යයන් 188 සඳහාම අතුරු ව්‍යවස්ථාවන්හි සඳහන් විධිවිධාන යටතේ එම කාර්යයන් පාලනය, අධීක්ෂණය, නියාමනය හා කළමනාකරණය කළහැකි විය යුතුය. එහෙත් මෙම සභාව සතුව ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවන් විනා අන්කිසි අතුරු ව්‍යවස්ථාවක් නොමැති බව කරුණු පරීක්ෂාවේදී අනාවරණය විය.

මෙම උප ලේඛනයේ සඳහන් කාර්යයන් 188 අතුරින් වෙළඳාම් හෝ කර්මාන්ත 41 ක් ම විකිණීම සඳහා ද්‍රව්‍ය තොග රැස්කර තබාගැනීම වේ. ගබඩා කිරීම ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් හෝ වෙළඳාමක් නොවේ. ගබඩා කිරීම අධීක්ෂණය, පාලනය හෝ නියාමනය සඳහා කිසිදු අතුරු ව්‍යවස්ථාවක් ද නැත.

තවද සංචාරක වෙළඳාමට බලපත්‍ර ගාස්තු පැනවීම සඳහා ස්ථාවර ස්ථානයක් නොමැතිව වාර්ෂික වටිනාකම ගණනය කරන්නේ කෙසේද? එසේ නම් ඊට විශේෂිත අතුරු ව්‍යවස්ථාවක් පනවා එහි බලපත්‍ර ගාස්තුව සඳහන් කළ යුතුවේ. අංක 10 ගිණිකෙළි භාණ්ඩ නිෂ්පාදනය - මෙය පුපුරණ ද්‍රව්‍ය ආඥා පනත යටතේ දිසාපතිවරයාගෙන් බලපත්‍ර ලබාගත යුතු විෂයයකි. අංක 111 යටතේ කළුගල් මෝලක් පවත්වාගෙන යාම, ජාතික පාරිසරික පණත යටතේ බලපත්‍ර ගාස්තු විෂයභාර අමාත්‍යවරයා විසින් නියමයක් මගින් නියමකර එම ගාස්තු අයකර ගැනීමේ බලය පළාත් පාලන ආයතන වෙත පවරන ලද්දකි. අංක 131 පශු වෛද්‍ය මධ්‍යස්ථානයක්

පවත්වාගෙන යාම වෘත්තියකි. එයින් බදු අයකිරීමට ප්‍රාදේශීය සභාවේ ලේකම්ට බලය පවරා නැත. තවද අංක 148 ගල්තාර, බිටුමන් නිෂ්පාදනය, අංක 170 ඛනිජ තෙල් නිෂ්පාදනය, අංක 172 දැව් තෙල් විකිණීම හා ගබඩාකිරීම ආදිය සඳහා ඛනිජ තෙල් ආඥා පනත යටතේ අමාත්‍යවරයා විසින් බලපත්‍ර ගාස්තු නියෝග මගින් පනවා ඒවා අයකර ගැනීමේ බලය පළාත් පාලන ආයතන වෙත ලබාදී ඇති කාර්යයකි. ඒ සඳහා පවතින නීතියේ විධිවිධාන නොසලකා හරිමින් බදු පැනවීම බලාතික්‍රමණයකි. තවද අංක 165 විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම සඳහා ප්‍රාදේශීය සභාවේ ලේකම් බලපත්‍ර නිකුත් කරනුයේ කුමන නීතිමය ප්‍රතිපාදනයක් යටතේද?. ඛනිජ තෙල් නිෂ්පාදනය සඳහා ශ්‍රී ලංකාව තුළ අතුරු ව්‍යවස්ථා නොමැති අතර එසේ අතුරු ව්‍යවස්ථා පැනවීමට මූලික නීතිවල ප්‍රතිපාදන ද නොමැත. අංක 167 වූ බියර් නිෂ්පාදනය සඳහා බලපත්‍ර නිකුත් කරනුයේ සුරාබදු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අධිකාරී බලය පිට සුරාබදු කොමසාරිස් විසිනි. එසේම අංක 199 යටතේ වැලිගොඩ දැමීම සඳහා භූ විද්‍යා හා පතල් කැනීම් පනත යටතේ එම කාර්යංශය මගින් බලපත්‍ර නිකුත් කරන අතර ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙත මෙම බලය ලැබුණේ කෙසේද? අංක 180 යටතේ මනාලියන් හැඩගැන්වීම හා රූපලාවන්‍ය කටයුතු කිරීම සම්බන්ධයෙන් බලපත්‍ර නිකුත්කළ හැක්කේ ඊට අදාලව අතුරු ව්‍යවස්ථාවන් තිබුණේ නම් පමණි. එසේ නොමැති වූ එම කර්මාන්තය නියාමනය කරනුයේ කෙසේද?.

මේ කරුණු සලකා බැලීමේදී සහ මෙම බදු පැනවූ බලධාරියෙක් සම්බන්ධ නමක් තනතුරක් හෝ දිනයක් සඳහන් නොවේ. ඒ අනුව එය අවිධිමත් හා බලරහිත කරුණක් වන අතර, එනයින්ම පළාත් පාලන ආයතනය වෙත ලැබිය යුතු ආදායම නිකරුණේ අහිමි වීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් පියවර ගත යුතුව ඇත.

iii. ව්‍යාපාර බදු

පූර්වෝක්ත ගැසට් පත්‍රයේම පළකර ඇති නිවේදනයකින් මෙම ව්‍යාපාර බද්ද බියගම ප්‍රාදේශීය සභා ලේකම්වරිය විසින් විය යුතු බව සඳහන්කර ඇත. එහෙත් අදාළ තීරණයෙහි එය පනවන ලද බවට පැහැදිලිව හා නිශ්චිතව සඳහන් කර නැත.

එසේම එය පැනවූ බලධරයාගේ නමක්, තනතුරක් හෝ දිනයක්ද නිවේදනයේ සඳහන් කර නොමැත. තවද බියගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කුමන ව්‍යාපාර මීට අයත්වන්නේද යන්න ජනතාවට දැනගැනීමට ක්‍රමයක් සලසා නැත. සභාවේ ආදායම් නිලධාරීන් සිය සිතැඟි පරිදි වාචිකව හෝ ලිඛිතව දන්වා සිටින විටෙක ව්‍යාපාර හිමියාට විධිමත් පරිදි දැනුවත් වීමක් නොමැතිව මෙම ව්‍යාපාර බද්ද ගෙවීමට සිදුවී ඇත. මෙය ඉතාම අවිධිමත් හා අසම්පූර්ණ ක්‍රියාවක් බව පෙනේ.

iv. කර්මාන්ත බදු

බියගම ප්‍රදේශීය සභාව 2016 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පනවා ඇත්තේ ද ඉහත සඳහන් ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනයක් මගිනි. මෙම නිවේදනයේ ද තීරණ සහිත නිශ්චිතව බද්ද පැනවීම යන කාරණාව සඳහන් නොවී පහත සඳහන් ආකාරයට වියයුතු බවට හා නියම විය යුතු බව සඳහන් කර ඇත. විය යුතු බව එකකි. නියම කරන බව තවත් එකකි. ඒ අනුව මෙම බද්ද විධිමත් පරිදි පනවා නැති අතර, එය සිදුකරන බලධරයෙකුගේ නමක්, තනතුරක්, ආයතනයක් හෝ දිනයක් නිවේදනය අවසානයේ දක්නට නොමැත. එය අද්භූත (GHOST) පැනවීමක් බව පෙනේ.

මෙහි උප ලේඛනයේ කර්මාන්ත බද්ද පනවා ඇති කර්මාන්ත 79 ක් දැක්වේ. මෙහි දැක්වෙන අංක 54 වාහන ලිහිසි තෙල් අලෙවිය, 58 ඩීසල්, පෙට්‍රල් හෝ වෙනත් බනිජ තෙල් අලෙවිය, 59 එල් පී ගෑස් විකිණීම, 33 ගෘහස්ථ ගෑස් විකිණීම ආදිය බනිජ තෙල් ආඥා පනත යටතේ බලපත්‍ර ලබාගත යුතු කාර්යයන් වේ. ඒ වෙළඳාම් සඳහා විෂයභාර අමාත්‍යවරයා නියෝග පනවා ඒ මගින් බලපත්‍ර ගාස්තු නියම කොට ගැසට් මගින් ප්‍රකාශයට පත්කර ඇත. පළාත් පාලන ආයතන කළ යුත්තේ බලපත්‍ර නිකුත් කර නියමිත ගාස්තු අයකර ගැනීමයි. එසේ නැතිව පවතින නීතිමය ප්‍රතිපාදන අභිබවා බදු පැනවීමට බලයක් ඔවුන් වෙත පවරා නැත. එසේම අංක 61 මත්පැන් වෙළඳාම, 62 බියර් වෙළඳාම සුරාබදු ආඥා පනත යටතේ සුරා බදු කොමසාරිස් ජනරාල් වෙත පැවරුන කාර්යයකි. ප්‍රදේශීය සභාවට ඒ සඳහා බලය පවරා නැත. තවද අංක 21 බෝල මේසයක් පවත්වාගෙන යාම යන්න සුදුවක්ද කර්මාන්තයක්ද, වෙළඳාමක්ද, ව්‍යාපාරයක්ද, නැතිනම් සමාජ ශාලාවක කාර්යන්ද යන්න සොයා බලා පියවර ගත යුතු විෂයකි.

මේ කරුණු අනුව බියගම ප්‍රදේශීය සභාවේ ලේකම් වරිය විසින් පනවා ඇති කර්මාන්ත බද්ද අතිශයින් අවිධිමත් හා සාවද්‍ය එකක් බව පෙනීයයි. බියගම ප්‍රාදේශීය සභාව විනෝද බද්ද, වාහන හා සත්ව බද්ද හෝ සංවර්ධනය නොකළ ඉඩම් මත වූ බද්ද පනවා නැත. මෙම සභාව සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් විනෝද බද්ද පෙර දී පනවා තිබේද යන්න පිළිබඳ තොරතුරු සොයා ගැනීමට නොහැකිවිය.

ඒ අනුව ප්‍රබල විභව ශක්තියකින් යුතු ආදායම් මාර්ග ගණනාවක් බියගම ප්‍රාදේශීය සභාව මගින් නොසලකා හැර ඇති බව පෙනේ.

5.7.3 දොඩංගොඩ ප්‍රාදේශීය සභාව

i. වරිපනම්

දොඩංගොඩ ප්‍රාදේශීය සභාව ආදායම් පැනවීම සිදුකර ඇත්තේ 2015.11.27 දිනැති අංක 1943 දරන ගැසට් පත්‍රයේ ලේකම්වරයා විසින් පළකරන ලද නිවේදන මගිනි. සභාව ක්‍රියාත්මකව නොපවතින විටෙක වරිපනම් පැනවීමට සභාව සතු බලය ලේකම් වෙත පැවරෙන බලදායී වගන්තිය 9.3 ලෙස මෙහි දක්වා තිබේ. මෙබඳු වගන්තියක් ප්‍රාදේශීය සභා පනතේ නොමැත. මීඑය ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය ලෙස සඳහන් විය යුතුය. ඒ අනුව මෙම පැනවීම් ශුන්‍ය හා බලරහිත වේ.

ii. අක්කර බදු

දොඩංගොඩ ප්‍රාදේශීය සභාව 2016 වර්ෂය සඳහා අක්කර බද්ද පැනවීම ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු වන 134 වගන්තියෙන් (3) වන උප වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරෙන බලතල ප්‍රකාර සිදුකරන බව දක්වා තිබේ. එසේ වුවද ප්‍රාදේශීය සභා පනතේ එබඳු වගන්තියක් නොමැත. තවද ප්‍රදේශීය සභා පනතේ 146 (1) උප වගන්තියේ විධිවිධාන අනුව 2016 වර්ෂය සඳහා අක්කර බද්ද යටතට ගැනෙන ඉඩම් වල ප්‍රමාණය සත්‍යෙක්ෂණය කර නැත. ඒ අනුව එකී පැනවීම නීතියේ විධිවිධාන වලට අනුකූල නොවන හෙයින් ශුන්‍ය හා බල රහිත වන්නේය.

iii. බලපත්‍ර ගාස්තු

දොඩංගොඩ ප්‍රාදේශීය සභාව 2016 වසර සඳහා ඉතා සීමිත වෙළඳාම් / කාර්යයන් සංඛ්‍යාවක් එනම් කාර්ය 24 ක් සඳහා බලපත්‍ර ගාස්තු පනවා ඇත. එම ලේඛනයෙහි අංක 18 යටතේ

ගිණිකෙළි භාණ්ඩ නිෂ්පාදනය හා විකිණීම සඳහා බලපත්‍ර ලබාදීමේ බලය පුපුරණ ද්‍රව්‍ය ආඥා පනතේ විධිවිධාන මත පැවරී ඇත්තේ ප්‍රදේශයේ දිසාපතිවරයාටය. ප්‍රාදේශීය සභාවට මේ සඳහා අතුරු ව්‍යවස්ථාවක් හෝ වෙනත් නීතියක් යටතේ බලපත්‍ර ගාස්තු පැනවිය නොහැකිය.

එසේම අංක 19 යටතේ ඇති සමාජ ශාලාවක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ගාස්තු 1975 අංක 17 දරන සමාජ ශාලා වලට බලපත්‍ර ලබාදීමේ පනතේ 4 වන වගන්තියේ ප්‍රතිපාදන යටතේ අමාත්‍යවරයා විසින් ගාස්තු පනවා ඇත. ඒ අනුව ප්‍රාදේශීය සභාවක් බලපත්‍රයක් නිකුත් කිරීමේදී සමාජ ශාලාවකින් වාර්ෂිකව අයකළ හැක්කේ රු 350/- ක ගාස්තුවකි. ඒ හැර අදාල ස්ථානයේ වාර්ෂික වටිනාකම මත බලපත්‍ර ගාස්තු පැනවීමට ප්‍රාදේශීය සභා වෙත බලය පැවරී නැත.

මේ අනුව පූර්වෝක්ත බලපත්‍ර ගාස්තු පැනවීම විධිමත් නොවන බව සඳහන් කළ යුතුව ඇත. මෙම පැනවීම් සියල්ල සිදුකර ඇත්තේ සභාවේ ලේකම් වරයා වෙත ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය යටතේ පැවරෙන බලතල යටතේ බව අදාල නිවේදනයේ දැක්වේ. එබඳු නෛතික ප්‍රතිපාදනයක් ප්‍රාදේශීය සභා පනතේ නොමැත. එබැවින් මෙම පැනවීම් සාවද්‍ය ඒවා වන අතර එනයින්ම ඒවා ශූන්‍ය හා බලරහිත වේ.

iv. **ව්‍යාපාර බදු**

පූර්වෝක්ත ගැසට් පත්‍රයෙහිම දොඩංගොඩ ප්‍රාදේශීය සභාව සඳහා ව්‍යාපාර බදු පැනවීමද ලේකම්වරයා විසින් සිදුකර ඇත. මෙම පැනවීමට අදාල ගැසට් නිවේදනයේ බලදායී වගන්තිය ලෙස ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සඳහන් කර ඇත. එබඳු වගන්තියක් ප්‍රාදේශීය සභා පනතේ නැත. එබැවින් මෙම පැනවීම් ශූන්‍ය හා බල රහිත වේ. එසේම එහි උප ලේඛනයන්හි දක්වා ඇති බද්දට යටත්වන ව්‍යාපාර 96 න් පහත සඳහන් ව්‍යාපාර සඳහා බද්දක් පැනවිය නොහැක.

අංක (06) රේස් ඔට්ටු පොළක් පැවැත්වීම - මේ සඳහා බලපත්‍ර නිකුත් කිරීම Gaming Ordinance No 17 of 1898 යටතේ රජයේ දිසාපති හෝ බලයලත් නිලධාරියා විසින් සිදුකෙරේ.

අංක (08) හා අංක (91) වැලි විකිණීම හා ගබඩාකර තැබීම - මෙය 1992 අංක 33 දරන පතල් හා ඛනිජ සම්පත් පනතේ විධිවිධාන ප්‍රකාර දිසාපතිවරයාගේ අධිකාරිත්වය මත බලපත්‍ර නිකුත් කරන කාර්යයකි.

අංක (35) පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් අලෙවිය.

අංක (36) ඔක්සිජන් LP ගෑස් ආදිය අලෙවිය.

මේ පිළිබඳ විෂයභාර අමාත්‍යවරයා ඛනිජ තෙල් ආඥා පනත යටතේ නියෝග පනවා බලපත්‍ර ගාස්තු නියමකර ඇත. ඒ අනුව පළාත් පාලන ආයතන එම බලපත්‍ර නිකුත් කර නියමිත ගාස්තුව අයකළ යුතු අතර ඊට බදු පැනවීමේ බලයක් එම ආයතන වෙත පැවරී නැත.

(38) කළුගල් කැඩීමේ වැඩපළක් පවත්වාගෙන යාම.

මෙය ජාතික පාරිසරික පනත යටතේ පළාත් පාලන ආයතන වෙත බලය පවරන ලද බලපත්‍ර නිකුත් කළ යුතු කාර්යයකි. ඒ හැර එම ස්ථානවලට ව්‍යාපාර බදු පැනවීමට පළාත් පාලන ආයතනවලට බලය ලබාදී නැත.

අංක (53) - රටබීම හා අරක්කු විකිණීම. (54) රා විකිණීම - මෙම විෂයයන් සුරාබදු ආඥා පනත යටතට ගැනෙන අතර බලපත්‍ර පිළිබඳ බලධාරියා වන්නේ සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාය. ප්‍රාදේශීය සභාවකට මෙහිලා බදු පැනවීමක් කිරීමට බලතල පවරා නැත.

අංක (56) - දන්ත ශල්‍යාගාරයක්, (59) සිංහල බෙහෙත් ශාලාවක්, (60) වෛද්‍ය මධ්‍යස්ථානයක් , (33) පෙර පාසල් පැවැත්වීම. මෙම සියළු කාර්යයන් වෘත්තීය බද්දට යටත්වේ. එහෙත් වෘත්තීය බදු අයකිරීමට පළාත් පාලන ආයතන වලට ඉඩ සැලසී නැත. මක් නිසාදයත් අමාත්‍යවරයා විසින් නියමයක් මගින් වෘත්තීය බද්දේ උපරිමය නිශ්චය කොට නියම කර නැති බැවිනි.

අංක (84) තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම.

මෙය ඉතා සාවද්‍ය පැනවීමකි. තැපැල් කාර්යාල, ප්‍රවාහනය, ලිපි බෙදාහැරීම, භාණ්ඩ ප්‍රවාහනය ආදිය රජය මගින් පවත්වාගෙන යනු ලැබේ. රජය බද්දකට යටත් කළහැකි බලයක් පළාත් පාලන ආයතනවලට පවරා නැත.

ඒ අනුව මෙම ව්‍යාපාර බදු පැනවීම අතිශයින් අවිධිමත් හා දෝෂ සහගත බව පෙනේ.

v. කර්මාන්ත බද්ද

කර්මාන්ත බද්ද පැනවීම 2016 වර්ෂය වෙනුවෙන් පූර්වෝක්ත ගැසට් පත්‍රයේ නිවේදනයක් පළකිරීම මගින් ලේකම්වරයා විසින් සිදුකර ඇත. මෙම බද්ද පැනවීම සඳහා ලේකම් වරයාට බලය පැවරී ඇති බලදායී වගන්තිය 9.3 ලෙස දක්වා ඇත. එබඳු වගන්තියක් අදාල පනතේ නොමැති හෙයින් මෙම පැනවීම් ශූන්‍ය හා බලරහිත වේ. එසේම උපලේඛනයට අනුව කර්මාන්ත 40 ක් සඳහා මෙම බද්ද පනවා ඇත. එහෙත් ව්‍යාපාර බද්ද යටතට පත්කර ඇති බහුතරයක් වූ කර්මාන්ත මීට ඇතුළත් කළහැකිව තිබුණි.

මෙම උපලේඛනයේ අංක (34) යටතේ කළුගල් කැඩීමේ ස්ථානයක් සඳහා කර්මාන්ත බද්ද පැනවීම සිදුකළ නොහැකිය. එය පාරිසරික බලපත්‍ර යටතට ගැනෙන කර්මාන්තයකි. පාරිසරික විෂයභාර අමාත්‍යවරයා නියමයන් මගින් අදාල බලපත්‍ර ගාස්තු පනවා බලපත්‍ර නිකුත් කර ගාස්තුව අයකර ගැනීම් බලය පළාත් පාලන ආයතන වෙත පවරා ඇත.

මේ අනුව සෙසු නීති මගින් සිදුකර ඇති බදු හා බලපත්‍ර ගාස්තු පැනවීම් පිළිබඳව නිසි අවබෝධයක් ඇතිව මෙම කාර්යය සිදුකළ යුතු බව පෙන්වා දීම සුදුසුවේ. මේ අනුව අදාල පැනවීම් සියල්ල දෝෂ සහගත හා අවිධිමත් පැනවීම් වේ.
මෙම සභාව විනෝද බද්ද හා සංවර්ධනය නොකළ ඉඩම් මත වූ බදු පනවා නැත. එහෙත් වාහන හා සත්ව බද්ද පනවා ඇත.

vi. වාහන හා සත්ව බද්ද;

මෙම බද්ද පැනවීම සම්බන්ධ සභා තීරණය ඉහත සඳහන් ගැසට් පත්‍රයේම ලේකම් විසින් පළකරන ලද්දකි. එහෙත් ප්‍රාදේශීය සභා පනතේ 148 වන වගන්තිය සමග කියවිය යුතු හතරවන උපලේඛනයෙහි දැක්වෙන සතුන් හා වාහන මෙම උප ලේඛනයෙහි නොදැක්වේ. එය සංක්ෂිප්තව දක්වා ඇති බව පෙනේ. මෙහි ඇති ප්‍රමුඛ ගැටළුව වන්නේ ලේකම් වරයා විසින් බදු පැනවීමට අදාල බලදායී වගන්තිය 9.3 ලෙසින් සාවද්‍ය අයුරින් දක්වා තිබීමයි. එබැවින් අදාල පැනවීම් නීත්‍යානුකූල නොවේ.

5.7.4 හලාවත ප්‍රාදේශීය සභාව

2016 වර්ෂය සඳහා හලාවත ප්‍රාදේශීය සභාව සියළුම ආදායම් පැනවීම 2015.12.18 දිනැති අංක 1946 දරන ගැසට් පත්‍රයේ ලේකම්වරයා විසින් පළකරන ලද නිවේදන මගින් සිදුකර ඇත. ඒ අතර ප්‍රාදේශීය සභාවක් වාර්ෂිකව පැනවිය යුතු මෙන්ම කිසිසේත් පැනවීම අවශ්‍ය නොවන බදු හා ගාස්තු ද පනවා ඇති බව පෙනීයයි.

i. වරිපනම්

මෙම සභාව 2015 ඔක් මස 21 දින පැවති මෙහෙයුම් කමිටුවක් මගින් වරිපනම් පැනවීමේ යෝජනාව සම්මත කර ඇති බව නිවේදනය කර ඇත. ප්‍රාදේශීය සභා පනතේ බදු පැනවීමේ බලය එබඳු කමිටු වෙත පවරාදී නැත. එබැවින් එය මුළුමනින්ම සාවද්‍යවේ. කෙසේ වෙතත් ඒ සමඟ ඇති යෝජනාව අනුව 2013 වර්ෂයේ තක්සේරුව 2016 වර්ෂය සඳහා පදනම්කොට ගෙන ඇති බව කියවේ. මෙය පනතේ 146 (1) උප වගන්තිය මගින් දක්වා ඇති නියමයන්ට පටහැනි වේ. එසේම මෙහි බදු පැනවීම පිළිබඳව ලේකම් වරයාට සභාවේ බලය පැවරී ඇති බලදායී වගන්තිය 9.3 ලෙස දක්වා ඇත. එබඳු වගන්තියක් ප්‍රාදේශීය සභා පනතේ නොමැත. එබැවින් මෙම පැනවීම ශූන්‍ය හා බලරහිත වන්නේය.

ii. අක්කර බදු

මෙම සභාවේ අක්කර බද්ද පැනවීමද සිදුකර ඇත්තේ කිසියම් කමිටුවක් මගින් ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ඉක්මවා යමිනි. එහිද බදු පැනවීමට අදාල බලදායී වගන්තිය සාවද්‍ය ලෙස සඳහන් වේ. තවද අක්කර බද්ද සඳහා 2016 වර්ෂය සඳහා පදනම් කරගන්නා වූ ඉඩම් වල ප්‍රමාණය සත්‍යක්ෂණය කර නැත. ඒ අනුව එකී පැනවීම නීතියේ විධිවිධාන වලට අනුකූල නොවන හෙයින් ශූන්‍ය හා බල රහිත වන්නේය.

iii. බලපත්‍ර ගාස්තු

2016 වර්ෂයේ හලාවත ප්‍රාදේශීය සභාව බලපත්‍ර ගාස්තු පැනවීම සිදුකර ඇත්තේ ද කිසියම් කමිටුවක් මගිනි. එය සාවද්‍ය ක්‍රියාමාර්ගයකි. මෙහි ඇති බරපතල ගැටළුව නම් බදු පැනවීමට ලේකම් වරයාට බලය පැවරෙන බලදායී වගන්තිය 9.3 ලෙස සඳහන් කිරීමයි. ඒ අනුව මෙම

පැනවීම් කිසිවක් නීත්‍යානුකූල නොවේ. එහි ඇතුලත් උපලේඛනයේ බලපත්‍ර ලබාගත යුතු අප්‍රසන්න ව්‍යාපාර / වෙළඳාම් 20 ක් ඇතුළත්වන අතර එයින් 05 ක් ම විකිණීම සඳහා ද්‍රව්‍ය තොග ගබඩාකර තබාගැනීම් වේ. මෙය වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් නොවන හෙයින් එය සාවද්‍ය වේ. එසේම එහි අංක (19) යටතේ ගිණිකෙළි හෝ රතිඤ්ඤා වෙළඳාම් කිරීම යන්න ඇතුළත්වේ. මෙම කාරණය පුපුරණ ද්‍රව්‍ය ආඥා පනත යටතේ දිසාපතිවරයාගේ අධිකාරය යටතේ බලපත්‍ර ලබාගත යුතු කාර්යයකි. අතුරු ව්‍යවස්ථාවක බලය නොමැතිව ප්‍රාදේශීය සභාව මෙවැනි බලපත්‍ර නිකුත් කිරීම භයානක ප්‍රතිඵල ගෙන දෙන්නකි. මෙහි දැක්වෙන වෙළඳාම් බලපත්‍ර දියහැකි ඒවා නොවේ. එම වෙළඳාම් කර්මාන්ත බද්දට යටත්විය යුතු ඒවා වේ.

මීළඟට අන්තරාදායක වෙළඳාම් 21 ක් සඳහන් කර ඇත. ඊට ද පෙරසේම ගිණිකෙළි හෝ රතිඤ්ඤා නිපදවීම ඇතුළත් වේ. මෙය ද්විත්ව බදුකරණය හා බලාතික්‍රමණයට ද යටත්වන සාවද්‍ය ක්‍රියාවකි. මෙම ලේඛන සඳහන් කාර්යයන් පාලනය අධීක්ෂණය හා නියාමනය සඳහා අතුරු ව්‍යවස්ථා වෙන වෙනම තිබිය යුතු වුවත් බලපත්‍ර ගාස්තු පනවා ඇත්තේ එසේ අතුරු ව්‍යවස්ථා නොමැතිව බව අනාවරණය විය.

අනතුරුව සම්මත අතුරු ව්‍යවස්ථාවල සඳහන් වෙළඳාම් 15 ක් ලේඛනගත කොට ඇත. සත්‍ය වශයෙන්ම මෙම සභාවට බලපත්‍ර නිකුත් කළ හැක්කේ එම කාර්යයන් සඳහා පමණි. මේ අනුව අදාල පැනවීම් විධිමත් නොවන නීතියට පටහැනි සාවද්‍ය ඒවා බව පෙන්වා දිය යුතුව ඇත.

iv. ව්‍යාපාර බදු

ව්‍යාපාර බද්ද පනවා ඇත්තේ ද මෙහෙයුම් කමිටුවක් මගින් වන අතර එය නීතියේ සඳහන් විධිවිධාන අභිබවා යාමකි. එහි ව්‍යාපාර බදු ගෙවිය යුතු අනු ප්‍රමාණ සම්බන්ධ ප්‍රාදේශීය සභා පනතේ ඇති උප ලේඛනය දක්වා ඇතත් එම ව්‍යාපාර කවරේද යන්න සඳහන් කර නැත. එබැවින් බදු ගෙවන ව්‍යාපාරිකයන්ට තම ව්‍යාපාරය සඳහා කුමන පදනමක් මත බදු ගෙවිය යුතුද යන්න දැනගැනීමට ඇති අයිතිය අහිමි වී ඇත. මෙය බෙහෙවින් අවිධිමත්ය. මෙම බදු පැනවීමට ලේකම් වරයාට බලය ලැබෙන බලදායී වගන්තිය සාවද්‍ය ලෙස මෙහි ද සඳහන් කර තිබීම නිසා මේ පැනවීම් බල රහිත වේ.

v. කර්මාන්ත බද්ද

මෙම බද්ද පනවා ඇත්තේ ද මෙහෙයුම් කමිටුවක් මගින් වන අතර එය ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ඉක්මවා කටයුතු කිරීමකි. මෙහි දක්වා ඇති උප ලේඛනයට අනුව ව්‍යාපාර 20 ක් කර්මාන්ත බදු ගෙවිය යුතු කර්මාන්ත ලෙස දක්වා ඇත. එහෙත් මීට ප්‍රදේශයේ පවත්නා බලපත්‍ර නිකුත් කිරීම අවශ්‍ය නොවන බොහෝ වෙළඳාම් ඇතුලත් කළ හැකිව තිබුණි. කෙසේ වෙතත් මෙහිද බලදායී වගන්තිය සාවද්‍ය ලෙස 9.3 ලෙස සටහන් කර ඇති හෙයින් මෙකී පැනවීම් සියල්ල බලරහිත වන්නේය.

vi. විනෝද බද්ද

විනෝද බදු පැනවීමක් හලාවත ප්‍රාදේශීය සභාව සිදුකර නොමැත. එය පෙර පනවන ලද ඇමතිවරයාගේ පැනවීම් වලට යටත්වන බව අනුමාන කළ හැකිය.

vii. වාහන හා සත්ව බද්ද

එයද මෙහෙයුම් කමිටුවක් මගින් පනවා තිබීම දැකිය හැකිය. මෙම බද්ද පනතේ සඳහන් උප ලේඛන සහිතව පනවා ඇත. එහෙත් ප්‍රාදේශීය සභා පනතේ 148 වගන්තියේ (3) වන උප වගන්තිය පරිදි ගෙවිය යුතු දිනය හෝ දින සඳහන් කර නැත. එම දිනය අතුරු ව්‍යවස්ථා මගින් හෝ සභාව විසින් නියම කොට නිවේදනය කළ යුතුය. ඒ අනුව මේ පැනවීම දෝෂ සහගතය. ඒ හැර මෙහිද අදාල බලදායී වගන්තිය සාවද්‍ය ලෙස 9.3 ලෙස සටහන් කර ඇති හෙයින් මෙකී පැනවීම් නීතිය ඉදිරියේ බලරහිත වන්නේය.

viii. සංවර්ධනය නොකළ ඉඩම් මත බදු

මෙම බද්ද ද පනවා ඇත්තේ සභාවේ මෙහෙයුම් කමිටුවක් මගිනි. එසේම බලදායී වගන්තිය සාවද්‍ය ලෙස සඳහන් කර තිබේ. එබැවින් මෙම පැනවීම් නිවේදනයේ ද අදාල බලදායී වගන්තිය සාවද්‍ය ලෙස සඳහන් කර තිබීම එහි නීත්‍යානුකූල බව අහිමි වීමට හේතු වී තිබේ. එය එනයින්ම ශූන්‍ය හා බල රහිත වේ.

මෙම සභාව ඉහත බදු හා ගාස්තු වලට අමතරව I ඉඩම් විකිණීම විෂයෙහි බදු, II ගොඩනැගිලි ඉදිකිරීම මත බදු, III පරිසර බලපත්‍ර ගාස්තු, IV වාහන නවතා තැබීම සඳහා බලපත්‍ර ගාස්තු ආදිය නීතියට පටහැනිව පනවා තිබේ. මෙහි වාහන නවතා තැබීම යටතේ

අළුත් ත්‍රී රෝද රථයක් ගාලට ගෙන ඒමට රු 1000/- ක මුදලක් ද, ත්‍රීරෝද රථයක වාර්ෂික බලපත්‍ර ගාස්තුව ලෙස රු500/- ක් ද, බස් රථයක් සඳහා එක් දිනකට රු 70/- ක් ද වශයෙන් ගාස්තු පනවා ඇත. මෙම ගාස්තු වයඹ පළාත් සභා අමාත්‍යවරයා අනුමත කර ඇති අතුරු ව්‍යවස්ථා අනුව පනවා ඇති බව ද දැක්වේ. කෙසේ වෙතත් මේ පිළිබඳව තවදුරටත් පරීක්ෂා කිරීම වැදගත් වේ. දැනටමත් පනවා ඇති බද්දක් හෝ ගාස්තුවක් නැවත නැවතත් පැනවීම සිදුකර ඇති බවක් පෙනේ.

මේ අනුව හලාවත ප්‍රාදේශීය සභාවේ 2016 වර්ෂය සඳහා ආදායම් පැනවීම් සියල්ල අවිධිමත් හා දෝෂ සහගත හා නීතිය ඉදිරියේ බලරහිත බව පෙනීයයි.

5.7.5 අලව්ව ප්‍රාදේශීය සභාව

2016 වර්ෂය සඳහා අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් ආදායම් පැනවීම 2015.11.13 දිනැති අංක 1941 දරන ගැසට් පත්‍රයේ පළකර ඇති නිවේදන මගින් සිදුකර ඇත.

i. වරිපනම්;

ලේකම්වරිය විසින් ප්‍රාදේශීය සභා පනතේ 134(1) උප වගන්තිය අනුව **" 2016 වර්ෂයට අක්කර බදු නියම කිරීමට මම තීරණය කරමි."** වරිපනම් පැනවීමේ නිවේදනය තුළ පළමුවෙන්ම මෙසේ සඳහන් කිරීම තුල බදුගෙවන්නන් විමතියට පත්වන අතර නැවත දෙවන හා තෙවන ඡේදවල වරිපනම් පැනවීම ගැන සඳහන් කරයි. මෙය අවිධිමත් හා ව්‍යාකූල තීරණයකි. එසේම දෙවන ඡේදයේ **" 2009 වර්ෂය සඳහා වූ තක්සේරුව 2016 වර්ෂය සඳහා තක්සේරුව ලෙස සලකන බවයි."** යනුවෙන් දැක්වේ. මෙය ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තියේ විධිවිධාන වලට පටහැනිවේ. එසේම බදු පැනවීමට ලේකම් වෙත බලය පැවරෙන බලදායී වගන්තිය 9.3 ලෙස සාවද්‍ය අයුරින් සඳහන් කර තිබේ. ඒ අනුව මෙම වරිපනම් පැනවීම ශූන්‍ය හා බලරහිත වේ. තවද මෙම ගැසට් නිවේදනයේ ඉංග්‍රීසි පිටපත අනුව ඉහත කී වැරදි කිසිවක් දක්නට නැත. අක්කර බදු පිළිබඳව හෝ 2009 තක්සේරුවක් පිළිබඳ තොරතුරු එහි නැත. මේ ගැන බලධාරීන් තවදුරටත් කරුණු විමර්ශනය කිරීම වැදගත් වේ.

ii. **අක්කර බද්ද;**

2016 වර්ෂය සඳහා වූ අක්කර බද්ද පැනවීමේදී ද බලදායී වගන්තිය 9.3 ලෙස සාවද්‍ය ලෙස දක්වා ඇත. මෙම ප්‍රාදේශීය සභාව විසින් නිවැරදිව නීතියේ ප්‍රතිපාදන නෙඉක්මවා පැනවීම සිදුකර ඇතත් පනතේ නොමැති වගන්තියකින් එම පැනවීම කර ඇති හෙයින් නීතිය ඉදිරියේ එහි වලංගු භාවයක් නොමැත.

iii. **බලපත්‍ර ගාස්තු;**

අලව්ව ප්‍රාදේශීය සභාව 2016 වර්ෂය සඳහා ඉහත ගැසට් පත්‍රයෙහිම පළකරන ලද නිවේදනයක් මගින් වෙළඳ කාර්යයන් 17 කට ද. අප්‍රසන්න ව්‍යාපාර 61 කට ද, අන්තරාදායක ව්‍යාපාර 20 කට ද, අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර 26 කට ද වශයෙන් ව්‍යාපාර 124 ක් සඳහා බලපත්‍ර ගාස්තු පනවා ඇත. එම නිවේදනයේ ද බදු පැනවීමට ලේකම් වෙත බලය පැවරෙන වගන්තිය සාවද්‍ය ලෙස සඳහන් කර ඇත. එම කාර්යයන් අතුරින් ගබඩා කිරීම් පහක්ද (05), වෘත්තීන් දෙකක් ද (02), ගිණිකෙලි හෝ රතිඤ්ඤා නිපදවීම සඳහා සහ (08), (19) අවස්ථා දෙකකදී ද බලපත්‍ර ගාස්තු පනවා ඇත. එසේම සංචාරක වෙළඳාම (14) සඳහා ද බලපත්‍ර ගාස්තු පනවා ඇත. මෙම කාර්යයන් සඳහා අතුරු ව්‍යවස්ථා නොමැතිව එසේම අධිකාරී බලයක් නොමැතිව බලපත්‍ර නිකුත් කළ නොහැකිය.

තවද මෙම ව්‍යාපාර 124 අතුරින් අතුරු ව්‍යවස්ථා පනවාගෙන ඇත්තේ ව්‍යාපාර කොපමණකටද? අතුරු ව්‍යවස්ථාවක් නොමැතිව කිසිම වෙළඳ ව්‍යාපාරයකට බලපත්‍ර නිකුත් කළ නොහැකිය. මේ අනුව මෙකී බලපත්‍ර ගාස්තු පැනවීම අවිධිමත් හා දෝෂ සහගත බව පෙන්වාදිය හැකිය.

iv. **ව්‍යාපාර බදු;**

ව්‍යාපාර බද්ද පැනවීමේදී ද අදාල බලදායී වගන්තිය සාවද්‍ය ලෙස සඳහන් කර තිබේ. 2016 වර්ෂය සඳහා අලව්ව ප්‍රාදේශීය සභාව ව්‍යාපාර 144 ක් සඳහා ව්‍යාපාර බද්ද පනවා ඇත. මේ අතුරින් වෘත්තීන් (12) දොලහක් සඳහා ද ගබඩා කිරීමේ ස්ථාන (18) ක් දහ අටක් සඳහා ද රතිඤ්ඤා, ගිණිකෙලි, කර්මාන්ත ස්ථාන සඳහා අවස්ථා දෙකකදී ද, ඛනිජ තෙල් ගබඩා කිරීම (110) සඳහා ද, රට බීම අලෙවිය (90) හා (109) මත්පැන් හා බියර් තොග වශයෙන් විකිණීම සඳහා ද, (114) සිනමා ශාලා සඳහා ද, (79) බෝල මේස ක්‍රීඩා කිරීම සඳහා ද ආදී වශයෙන්

ව්‍යාපාර නොවන, අධිකාරී බලයක් නොමැතිව ව්‍යාපාර ගණනාවක් විෂයෙහි ව්‍යාපාර බද්ද පනවා ඇත. මෙය මීට ඉහත අවස්ථා ගණනාවකදී ද පෙන්වා දී ඇති පරිදි මෙය බලාතික්‍රමණ ක්‍රියාවකි. මෙහිදී රටේ බලපවත්නා වෙනත් නීති පිළිබඳව සැලකිල්ලක් නොදක්වමින් තමාට හිමි බලය ඉක්මවා ක්‍රියාකර තිබීම ඉතා අහිතකර ප්‍රතිඵල ගෙනදීමට හේතුවිය හැකිය. එමෙන්ම මෙය නීතිය ඉදිරියේ වලංගුතාවයකින් තොර බවද පෙන්වා දිය යුතුව ඇත.

v. කර්මාන්ත බද්ද;

මෙම බද්ද පැනවීමේ දී ද බලදායි වගන්තිය සාවද්‍ය ලෙස සඳහන් කර ඇත. අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කර්මාන්ත 32 ක් සඳහා බදු පනවා ඇත. එම ලේඛනයේ ගබඩා කිරීම් අවස්ථා දෙකක් දැකිය හැකිය. ඒ හැර මෙහි සඳහන් සෙසු කර්මාන්ත බදු අය කිරීම සඳහා යොදාගෙන තිබීම දෝෂ සහගත නොවේ. මෙහි ව්‍යාපාර බද්ද පැනවීමට හා බලපත්‍ර ගාස්තු සඳහා තීරණය කොට තිබූ කර්මාන්ත රාශියක් මීට ඇතුළත් විය යුතුව තිබුණි. නිවැරදි නෛතික ප්‍රතිපාදන සඳහන් නොවීම නිසා මෙම නිවේදනය බලරහිත වේ.

vi. විනෝද බද්ද;

2016 වර්ෂය සඳහා අලව්ව ප්‍රාදේශීය සභාව විනෝද බදු පනවා ඇත. එය අමාත්‍යවරයා විසින් කරන ලද නියමයකට අනුව පනවන ලද බව සඳහන් කර ඇත. අමාත්‍යවරයා සහා තීරණයක් මත විනෝද බදු ආඥා පනතේ විධිවිධාන යටතේ බද්ද පනවා ගැසට් පත්‍රයේ පළකළ යුතුවේ. මෙහිදී අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙත අමාත්‍යවරයාගේ රාජකාරි ඉටුකිරීම සඳහා බලයක් ලැබී නොමැතිව මෙසේ විනෝද බදු පැනවීම නීත්‍යානුකූල නොවේ.

තවද ප්‍රසිද්ධ රැගුම් බලපත්‍ර ගාස්තු පැනවීමද සභාව මගින් සිදුකර ගැසට් පත්‍රයේ පළකර ඇත. පළාත් පාලන ආයතන වර්ග කර ඒ එක් එක් වර්ගයක් සඳහා ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥා පනතේ විධිවිධාන ප්‍රකාර අමාත්‍යවරයා විසින් එකී බලපත්‍ර ගාස්තු පනවා නියම කර ඇත. පළාත් පාලන ආයතනයේ කාර්යය වන්නේ ඒවා නැවත පැනවීම නොව අදාල ගාස්තු අයකර ගැනීමයි. මෙම කරුණු දෙකින්ම අලව්ව ප්‍රාදේශීය සභාව විසින් නීතියේ විධිවිධාන අභිබවා ක්‍රියාකර ඇති බවට නිදසුන් සපයා ඇති බව පෙනේ. මේ පැනවීම් නීතිය ඉදිරියේ බලරහිත වන්නේය.

VII. වාහන හා සත්ව බද්ද :

මෙම බද්ද පැනවීමේ දී ද ලේකම් වෙත බදු පැනවීම පිළිබඳ සභාව සතු බලය පැවරෙන බලදායී වගන්තිය 9.3 ලෙස සාවද්‍ය අයුරින් දක්වා ඇත. එසේම ප්‍රාදේශීය සභා පනතේ 148 වන වගන්තියේ (3) වන උප වගන්තිය ප්‍රකාර මෙම බද්ද ගෙවිය යුතු දින හෝ දිනය සඳහන් කර නැත. එය සභාව විසින් හෝ අතුරු ව්‍යවස්ථාවක් මගින් තීරණය කොට නිවේදනය කළ යුතු වේ. ඒ අනුව මෙම පැනවීම අසම්පූර්ණ ක්‍රියාවලියක් බව පෙනේ.

එතෙකුදු වුවත් වාහන හා සත්ව බද්ද පැනවීම පිළිබඳව ප්‍රාදේශීය සභා පනතේ 148 වන වගන්තිය සමග කියවිය යුතු හතරවන උප ලේඛනය ප්‍රකාරව බද්ද පනවා ඇති බව පෙනේ. කෙසේ වෙතත් මෙය නීතියට අනුකූල නොවන අවිධිමත් හා දෝෂ සහගත පැනවීමක් බව සඳහන් කළ යුතුව ඇත.

VIII. සංවර්ධනය නොකළ ඉඩම් මත බදු :

මෙම බද්ද පැනවීමේ දී ද අදාල බලදායී වගන්තිය 9.3 යනුවෙන් සාවද්‍ය ලෙස සඳහන් කර ඇත. එයින් මෙම නිවේදනයෙහි නීත්‍යානුකූලභාවය අහිමි වී ඇත. මෙහිදී සංවර්ධනය නොකළ ඉඩම් වල ප්‍රාග්ධන අගයෙන් සියයට දශම දෙකක් ලෙස දක්වා නැවත වරෙන්තු 20% ලෙස සඳහන් කිරීමෙන් කිසියම් අපැහැදිලි තත්වයක් පෙන්නුම් කරයි. සියළු බදු පැනවීම් සරල හා නිශ්චිත විය යුතු වේ. ඒ අනුව මෙම පැනවීම අවිධිමත් හා දෝෂ සහගත බව පෙනේ.

ඉහත සඳහන් ආදායම් පැනවීමට අලවිව ප්‍රාදේශීය සභා ලේකම් විසින් කටයුතු කරන අතරම නීතියට පරිබාහිරව ඉඩම් විකිණීම විෂයෙහි බදු පැනවීම, පාරිසරික පනත යටතේ බලපත්‍ර ගාස්තු පැනවීම, ප්‍රචාරක දැන්වීම් ගාස්තු අයකිරීම, වීදි රේඛා හා නොපවරා ගැනීම් සඳහා සහ සභාවෙන් ඉටුවිය යුතු සාමාන්‍ය සේවා රාජකාරී සඳහා විශාල ගාස්තු ප්‍රමාණයක් ඉතා අසාධාරණ ලෙස අයකිරීම ද මෙම නිවේදනය මගින්ම සිදුකර ඇත. මෙය අතිශය ක්‍රම විරෝධී දෝෂ සහගත ක්‍රියාවලියකි. මේ පිළිබඳව පළාත් පාලන බලධාරීන් සිය අවධානය යොමු කිරීම වැදගත් වේ.

5.7.6 යටිනුවර ප්‍රාදේශීය සභාව

2016 වර්ෂය සඳහා යටිනුවර ප්‍රාදේශීය සභාව 2015.12.11 දිනැති අංක 1945 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදන මගින් ආදායම් පැනවීම් සිදුකර ඇත.

i. **වරිපනම්;**

2016 වර්ෂය සඳහා වරිපනම් පැනවීමේදී ලේකම්වරිය විසින් පළකරන ලද නිවේදනය අනුව 2000.01.07 දිනැති ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළකර ඇති යටිනුවර ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ දියුණුකළ ප්‍රදේශයයි ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශය තුළ පිහිටි දේපල වල වාර්ෂික වටිනාකම් 2016 වර්ෂය සඳහා වූ තක්සේරුව ලෙස සම්මත කළ යුතු බවට තීරණය කර තිබේ. එසේ වුවද ප්‍රාදේශීය සභා පනතේ 146 (1) උප වගන්තියේ සඳහන් පරිදි පවත්නා වර්ෂයේ (2015) වාර්ෂික වටිනාකම් අනුගාමී වර්ෂයේ (2016) වාර්ෂික වටිනාකම් ලෙස සම්මත කරනු ලැබිය යුතුය. මේ අනුව 2000 වර්ෂයේ වාර්ෂික වටිනාකම් 2016 වසරේ වාර්ෂික වටිනාකම් ලෙස පිළිගැනීම නීතියට අනුකූල නොවේ. ඊට අමතරව සභාව සතු බදු අයකිරීමේ බලතල ලේකම් වරිය වෙත ලැබී ඇති බලදායී වගන්තිය ප්‍රාදේශීය සභා පනතේ 9.3 ලෙස දක්වා ඇත. එබඳු වගන්තියක් එකී පනතේ නොමැත. එය ප්‍රාදේශීය සභා පනතේ 9 වගන්තියේ (3) වන උප වගන්තිය ලෙස සඳහන් කළ යුතු වේ. එබැවින් මෙම තීරණය ශූන්‍ය හා බලරහිත වේ.

ii. **අක්කර බදු;**

ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වන උප වගන්තිය ප්‍රකාර අක්කර බද්ද සඳහා ඉඩම් වල ප්‍රමාණය සත්‍යෙක්ෂණය කිරීම සඳහා අමාත්‍යවරයා විසින් විධානය නොකරන ලද්දේ නම් පවත්නා වර්ෂයේ සත්‍යෙක්ෂණය අනුගාමී වර්ෂයේ සත්‍යෙක්ෂණය ලෙස පිළිගනු ලැබිය යුතුය. එහෙත් එබඳු පිළිගැනීමක් මෙහි ලේකම්වරියගේ තීරණයේ ඇතුළත් කර නැත. මෙහිද අදාල බලදායී වගන්තිය සාවද්‍ය ලෙස සඳහන් කර ඇත. ඒ අනුව මෙම පැනවීම ශූන්‍ය හා බල රහිත වේ.

iii. **බලපත්‍ර ගාස්තු;**

පූර්වෝක්ත ගැසට් පත්‍රය මගින්ම වෙළඳ ව්‍යාපාර 103 ක් සඳහා 2016 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පනවා තිබේ. මෙම තීරණය ක්‍රියාත්මක කිරීම පිණිස අතුරු ව්‍යවස්ථා 106 ක් පනවනු ලැබිය යුතු වේ. නීතියක් නොමැතිව බලපත්‍රයක් නිකුත් කළ නොහැකි බැවින් ප්‍රාදේශීය සභාව පිළිගෙන ඇති හෝ පනවා ගෙන ඇති හෝ අතුරු ව්‍යවස්ථා යටතේ පමණක් බලපත්‍ර නිකුත්

කිරීමට සිදුවේ. එසේම මෙම නිවේදනයෙහි ද අදාල පැනවීම් සඳහා වූ බලදායී වගන්තිය සාවද්‍ය ලෙස සඳහන් කර තිබීම හේතුවෙන් මෙම නිවේදනය නීත්‍යානුකූල බවින් තොර බව පෙනීයයි.

අතුරු ව්‍යවස්ථා පැනවීමට ප්‍රාදේශීය සභාවලට බලය පවරනු ලබන ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තියේ (ix) ඡේදයේ අ සිට ද දක්වා අනු ඡේදවල විස්තර කර ඇති කාර්යයන් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවාගෙන නොමැති නම් මහජන සෞඛ්‍ය, සැප විහරණ ක්‍රම ප්‍රශස්ත තත්වයකින් නඩත්තු කළ හැකි නොවේ. බොහෝ පළාත් පාලන ආයතන මෙම තත්වයට මුහුණ දී සිටින බව පෙනේ. යටිනුවර ප්‍රාදේශීය සභාව බලපත්‍ර නිකුත් කිරීමට අදාල උප ලේඛනයේ කර්මාන්ත / ව්‍යාපාර 103 ක් සඳහන් කර ඇති අතර 104 වන විෂය ලෙස "**ඉහත උප ලේඛනයේ සඳහන් නොවූ බලපත්‍ර දීමට සුදුසු යම් ව්‍යාපාරයක් හෝ වෙළඳ ස්ථානයක්**" යනුවෙන් සඳහන් කර තිබේ. මෙය අවස්ථානුකූලව ඕනෑම ව්‍යාපාරයක් සඳහා බලපත්‍ර නිකුත් කිරීම සඳහා ඒකපාක්ෂිකව නතු කර ගැනීමට යොදාගෙන ඇති උපාය මාර්ගයක් බව පෙනේ. එවැනි දේ කිරීමට ප්‍රාදේශීය සභාවක ලේකම්වරයෙකුට නීතියෙන් බලය පවරා දී නැත.

යථෝක්ත ලැයිස්තුවේ ;

(86) බටහිර ඖෂධ අලෙවිසැලක් පවත්වාගෙන යාම

(87) දේශීය ඖෂධ අලෙවිසැලක් පවත්වාගෙන යාම

(88) බටහිර බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම

(89) දේශීය බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම

ආදී කාර්යයන් සඳහා යටිනුවර ප්‍රාදේශීය සභාව මගින් බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කර ඇති බව පැහැදිළිය. මෙහි විෂයාංක (88) හා (89) යටතේ බටහිර වෛද්‍යවරයෙකු හෝ දේශීය වෛද්‍යවරයෙකුට ප්‍රාදේශීය සභාවෙන් ලබාගත් බලපත්‍රයක් නොමැතිව තම වෘත්තීය කරගෙන යාමට නොහැකි තත්වයක් උද්ගත වීමේ ප්‍රවණතාවයක් ඇතිවිය හැකි බව පෙනේ. තවද විෂයාංක (92) යටතේ දන්ත චිකිත්සාගාරයක් පවත්වාගෙන යාම, විෂයාංක (97) පශු වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා ද ප්‍රාදේශීය සභාවෙන් බලපත්‍ර ලබාගැනීම

අනිවාර්ය වනු ඇත. මෙවැනි පැනවීම් බලය ඉක්මවා ක්‍රියා කිරීමක් නැතහොත් බලාතික්‍රමණයක් ලෙස හැඳින්විය හැකිය.

ඒ හැර මෙම ලේඛනයේ සංචාරක වෙළඳාම, (94) ඉන්ධන පිරවුම් හලක් පවත්වාගෙන යාම, (90) ගිණිකෙළි ද්‍රව්‍ය වෙළඳාම, (81) රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම, (26) හා (27) කළුගල් කැඩීමේ ව්‍යාපාර, අංක (15) (16) එළුමස් හා එළ ගව මස් විකිණීම, (19) ගව ඝාතකාගාරයක් පවත්වාගෙන යාම ආදී සඳහා බලපත්‍ර ගාස්තු පනවා ඇත. මෙම කර්මාන්ත / ව්‍යාපාර සඳහා බලපත්‍ර නිකුත් කිරීමට ප්‍රාදේශීය සභාවකට බලය පැවරී නැත. මේ අතුරින් කර්මාන්ත සෑහෙන සංඛ්‍යාවකට ඊට අදාල මව් නීතිය මගින් බලපත්‍ර අධිකාරීන් නියම කොට ඇත. වෘත්තීන්ට හා වෙනත් නීති මගින් බලපත්‍ර ගාස්තු පනවා ඇති ව්‍යාපාර සඳහා නැවත නැවත බලපත්‍ර ගාස්තු පැනවීම අතිශයින් දෝෂ සහගත ක්‍රියාවකි. ඒ අනුව යටිනුවර ප්‍රාදේශීය සභාවේ 2016 වර්ෂය සඳහා පනවා ඇති ආදායම් අතුරින් බලපත්‍ර නිකුත් කිරීමට ද අදාල පැනවීම නීතියට පටහැනි හා අවිධිමත් වූවක් බව පෙනීයයි.

iv. ව්‍යාපාර බද්ද;

යටිනුවර ප්‍රාදේශීය සභාව ව්‍යාපාර බද්ද පැනවීමේ නිවේදනයේ සඳහන් කර ඇත්තේ " **ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 152 (1) උප වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ..... බල ප්‍රදේශය සඳහා 2016 වර්ෂයට අදාලව කර්මාන්ත බදු නියම කිරීමට..... බව තීරණය කරමි."** යනුවෙනි. ව්‍යාපාර බද්ද පැනවීමේ නිවේදනයේ ව්‍යාපාර බද්ද නොව කර්මාන්ත බද්ද යයි සඳහන් කර තිබීමෙන් මෙය වියවුල්කාරී ස්වරූපයක් ගනු ලබයි. එසේම පැනවීමට අදාල බලදායී වගන්තිය ද සාවද්‍ය ලෙස සඳහන් කර ඇත. කෙසේ වෙතත් මෙහි වෙනත් තැනක ව්‍යාපාර බද්දක් ගැන ද සඳහන් වේ. එසේ වුවද තීරණයට අයත් උපලේඛනයේ ව්‍යාපාර පමණක් නොව වෘත්තීන්ද අතුලත් කොට තිබේ. උදා:- විෂයාංක (09) ගණන් පරීක්ෂකවරු හා ගණකාධිකාරීවරු, (15) වෛද්‍යවරුන්, (16) නොතාරිස්වරුන්, (17) නීතිඥවරුන්, (18) මිනින්දෝරුවරුන්, (24) විශේෂඥ වෛද්‍යවරුන් හා (28) ගෘහනිර්මාණ ශිල්පීන්ද ඇතුළත් කර තිබේ.

අමාත්‍යවරයා විසින් ප්‍රාදේශීය සභා පනතේ 152 (2) උප වගන්තියේ විධිවිධාන අනුව වෘත්තීය බදු, නියෝගයක් මගින් නියම කර නැති බැවින් යටෝක්ත වෘත්තිකයින් සම්බන්ධයෙන් ව්‍යාපාර බද්ද පැනවිය හැකි නොවේ. මෙය නීතිය ඉක්මවා ක්‍රියා කිරීමකි. මේ අනුව යටිනුවර ප්‍රාදේශීය සභාව 2016 වර්ෂය සඳහා පනවා ඇති ව්‍යාපාර බද්ද සාවද්‍ය හා අවිධිමත් වූවක් බව පෙනේ.

v. කර්මාන්ත බද්ද;

2016 වසර සඳහා කර්මාන්ත බද්ද පැනවීමේ බලදායී වගන්තිය සාවද්‍ය ලෙස සඳහන් කර ඇත. එසේම මෙම තීරණයට අදාල උප ලේඛනයේ සඳහන් සමහර කාර්යයන් 150 වන වගන්තිය යටතේ වර්ග කළ නොහැකිය. උදා-

අංක (24) වැලිගොඩ දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

(27) ඉඩම් කොටස්කරන කාර්යාලයක් පවත්වාගෙන යාම

(25) රේස් ඔට්ටු පළක් පවත්වාගෙන යාම

(30) ලොතරැයි අලෙවි කිරීම සඳහා කුටියක් පවත්වාගෙන යාම

(34) තාවකාලික වෙළඳ කුටි

(51) පරිගණක මෘදුකාංග නිර්මාණ ශිල්පීන් (මොවුන් වෘත්තිකයන් මිස වෙළෙන්දන් නොවේ.)

(52) පරිගණක නිර්මාණකරු (වෘත්තිකයන්)

(60) ඉහත උප ලේඛනයේ සඳහන් නොවූ බලපත්‍රදීමට සුදුසු ව්‍යාපාරයක් හෝ වෙළඳ සේවා ස්ථානයක්

ඉහත කාර්යයන් සඳහා කර්මාන්ත බද්ද හෙවත් Trade tax පැනවිය නොහැකිය. මක් නිසාද යත් ඒවා වෙළඳාම් හෝ කර්මාන්ත නොවන බැවින් සහ වෙනත් අධිකාරීන් මගින් බලපත්‍ර ක්‍රියාවලියට නතුකර ඇති බැවිනි.

මෙහි අංක (60) හි සඳහන් කරුණ ගැසට් පත්‍රයේ පළකර තිබීමෙන් අසාධාරණ ලෙස පොහොසත් වීමට (Injust enrichment) යටිනුවර ප්‍රාදේශීය සභාව දරන කුට ප්‍රයත්නය ප්‍රසිද්ධියට පත්කර තිබේ. මෙය බරපතල විෂමාචාරයකි. මේ අනුව 2016 වසර සඳහා වූ යටිනුවර ප්‍රාදේශීය සභා කර්මාන්ත බද්ද පැනවීම දෝෂ සහගත හා අවිධිමත් වූවක් බව පෙනේ.

vi. විනෝද බද්ද;

මෙම සභාව විනෝද බද්දක් පනවා නැත.

vii. වාහන හා සත්ව බද්ද;

මෙම නිවේදනයේ ද අදාල බලදායී වගන්තිය සාවද්‍ය ලෙස සඳහන් කර ඇත. තවද මෙම බද්ද පනවා තිබුණද ප්‍රාදේශීය සභා පනතේ 148 (3) උප වගන්තිය අනුව බද්ද ගෙවිය යුතු දිනය හෝ දින අතුරු ව්‍යවස්ථා මගින් හෝ සභාවේ සම්මුතියන් මගින් නියම කොට ප්‍රසිද්ධ කළ යුතුය. එවැන්නක් මෙහිදී සිදුකර නැත. එබැවින් ඉහත කරුණු අනුව මෙය අවිධිමත් පැනවීමක් වේ.

viii. සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද;

මෙම බද්ද පැනවීම සිදුකර තිබුණද එය ඉතා අවිධිමත් වේ. මේ සියළුම බදු පනවා ඇත්තේ ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය හා බලතල යටතේ බව සඳහන් වුවද එබඳු වගන්තියක් අදාල පනතේ නැත. එය ප්‍රාදේශීය සභා පනතේ 9 වගන්තියේ (3) වන උප වගන්තිය විය යුතුය.

මෙම බද්ද පනවා තිබුණද පනතේ 153 වගන්තියේ අන්තර්ගතය සඳහන් (1) වන උප වගන්තිය එහි (අ) (ආ) සහ (ඇ) ඡේද සහ 153 (2) දක්වා මහජනතාවගේ දැනගැනීමට යොමුකර නැත.

ඒ අනුව මෙම පැනවීමද අවිධිමත් වේ. ඉහත ආදායම් පැනවීමට අමතරව යටිනුවර ප්‍රාදේශීය සභාව නීතියට පටහැනි හා ඉතා අසාධාරණ බදු හා ගාස්තු කිහිපයක් පනවා තිබීම ද බරපතල හා සාවද්‍ය ක්‍රියා මාර්ගයකි.

උදා - (1) ප්‍රචාරක දැන්වීම් සහ බැනර් සඳහා බදු අයකිරීම.

මේ යටතේ නිවේදනය අගදී දක්වා ඇත්තේ සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍ර ගාස්තුවක් අයකරන බවයි. එහෙත් උප ලේඛනයෙහි අතුරු ව්‍යවස්ථාවට පටහැනි ගාස්තු දක්වා තිබේ.

(2) පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු පැනවීම.

මෙම ගාස්තු පරිසර විෂයභාර අමාත්‍යවරයා විසින් 2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 පනතින් පනවා ගාස්තු නියම කර ඇත. නැවත පැනවීම නීත්‍යානුකූල නොවේ.

(3) ඇතැම් ඉඩම් විකිණීම මත බදු

මෙය 1987 අංක 15 පනතේ අමාත්‍යවරයා විසින් පනවා ඇත. නැවත පැනවීම බලය ඉක්මවා ක්‍රියා කිරීමකි.

(4) 2016 වසර සඳහා අයවිය යුතු ගාස්තු

i.	ගොඩනැගිලි ඉදිකිරීම අයදුම්පත	රු	500.00
ii.	ඉඩම් අනු බෙදීම් අයදුම්පත	රු	500.00
iii.	සැලසුම් ශිල්පින් ලියාපදිංචි ගාස්තු	රු	3000.00
iv.	වීථි රේඛා, නොපවරා ගැනීම් පෝරම ගාස්තු	රු	500.00
v.	අනතුරුදායක ගස් ඉවත් කිරීමේ පෝරමය	රු	500.00
vi.	පාපැදි බලපත්‍ර අයදුම්පත් ගාස්තු	රු	6.00
vii.	වෙළඳ ව්‍යාපාර, කර්මාන්ත බදු පෝරම ගාස්තු	රු	20.00

මෙබඳු අසාධාරණ ගාස්තු නියම කිරීමට යටිනුවර ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාට බලය පැවරී ඇත්තේ ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙන් බව දක්වා තිබේ. එහෙත් එම පනතේ එබඳු වගන්තියක් නොමැත.

(5) කර්මාන්ත ගිවිසුම් ගාස්තු - රු 50/ - සිට රු 1000/- දක්වා

මෙම ගාස්තු සභාවේ කිසියම් කාර්යයන් ඉටු කිරීමේදී කර්මාන්තකරුවන් හා සැපයුම්කරුවන් ඒ කර්මාන්ත වටිනාකම මත ගෙවිය යුතු ගාස්තුවකි.

(6) ත්‍රිරෝද රථ නැවතීමේ වාර්ෂික බලපත්‍ර ගාස්තුව රු 600.00

මේ අනුව මෙම ප්‍රාදේශීය සභාව ආදායම් පැනවීමේදී ඉතාම අසාධාරණ හා නීති විරෝධී බදු හා ගාස්තු පනවා තිබීම බරපතල තත්වයකි. මෙම ලේකම් වරයා විසින් ගෙන ඇති අන්තනෝමතික ක්‍රියාමාර්ග පිළිබඳව බරපතල නීති කෘත්‍යයන් උපචිත විය හැකිය.

5.7.7 අඹගමුව ප්‍රාදේශීය සභාව

2016 වර්ෂය සඳහා ආදායම් පැනවීම ලේකම්වරයා විසින් 2015.12.23 දින අංක 1947 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදන මගින් සිදුකර ඇත. මේ සියළුම පැනවීම් සභාව වෙනුවෙන් ලේකම්වරයා විසින් කරනු ලැබ ඇති හෙයින් ඔහුට ඒ සඳහා බලය හිමිවන බලදායී වගන්තිය සඳහන් කිරීම අත්‍යාවශ්‍ය වුවද එවැන්නක් මෙම නිවේදනවල දක්නට නැත. එය ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තිය ලෙස දැක්විය යුතුවේ.

i. වරිපනම්;

වරිපනම් පැනවීම පිළිබඳ තීරණයෙහි " එකී පනතේ 137(7) වගන්තිය යටතේ වට්ටම් පිරිනමන බව" දන්වා ඇත.

එහෙත් එබඳු වගන්තියක් ප්‍රාදේශීය සභා පනතේ නැත. එය 134(7) විය යුතුය. ප්‍රාදේශීය සභාවක් විසින් වරිපනම් පැනවීමේ දී ප්‍රාදේශීය සභා පනතේ 146 (1) උප වගන්තිය ප්‍රකාර 2016 වර්ෂය සඳහා නව තක්සේරුවක් කර නොමැති බැවින් ඉහතින් වූ වර්ෂය සඳහා වූ තක්සේරුව පසුව එළඹෙන වර්ෂය සඳහා (2016 වර්ෂය සඳහා) තක්සේරුව ලෙස සභාව විසින් පිළිගනු ලැබිය යුතුය. එසේ වුවද අඹගමුව ප්‍රාදේශීය සභාව සම්බන්ධයෙන් එබඳු කිසිම සඳහනක් කර නොමැති මෙම වරිපනම් පැනවීම ශූන්‍ය හා බලරහිත වන්නේය. මීට අදාලව දියුණු කරන ලද ප්‍රදේශ 10 ක නම් හා යෝජිත වරිපනම් ප්‍රතිශත නිවේදනයේ දක්වා ඇතත් ඒ සියල්ලම බලරහිත වී ඇත.

එසේම වරිපනම් පැනවීමේ තීරණයට:

i. සෑම ව්‍යාපාරික ස්ථානයක් සඳහා 20% ක් ද

ii. අනෙකුත් සෑම ස්ථානයක් සඳහා 15% ක් වූ වරෙන්තු ගාස්තුවක්, නියමිත කාර්තුව තුළ නොගෙවන වරිපනම් වෙනුවෙන් අයකිරීමට තීරණය කර ඇත. එහෙත් වරෙන්තු ගාස්තු අයකළ හැක්කේ නිකුත් කරන ලද වරෙන්තුවක් ක්‍රියාත්මක කළහොත් ඉන් අනතුරුව පමණි.

මේ අනුව අඹගමුව ප්‍රා. ස 2016 වර්ෂය සඳහා වූ වරිපනම් පැනවීම නීතියට පටහැනි වුවක් බව පෙනේ.

ii. **අක්කර බදු :**

2016 වර්ෂය සඳහා අඹගමුව ප්‍රාදේශීය සභාව අක්කර බදු පනවා තිබේ. එහෙත් ප්‍රාදේශීය සභා පනතේ 146(1) වගන්ති ප්‍රකාර නව තක්සේරුවක් /සත්‍යෙක්ෂණයක් සිදුකර නොමැති විටක ඉඩම් පිළිබඳ ප්‍රවර්තන වර්ෂයේ වූ සත්‍යෙක්ෂණය ඉදිරි වර්ෂය සඳහා පිළිගත යුතු බව සහා සම්මුතියක් මගින් අනුමත කර ප්‍රකාශයට පත්කළ යුතුය. මෙහිදී එවැන්නක් සිදුවී නැත. එබැවින් තක්සේරුවක් හෝ ඉඩම් ප්‍රමාණයේ සත්‍යෙක්ෂණයන් නොමැතිවිට අක්කර බදු ප්‍රතිශතය ශුන්‍ය වන්නේය. මෙහිදී සිදු වී ඇත්තේ එයයි.

iii. **බලපත්‍ර ගාස්තු :**

2016 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු, කර්මාන්ත බදු හා ව්‍යාපාර බදු එකම නිවේදනයක් මගින් පනවා ඇත. එහි උපලේඛණ අංක 01 හි බලපත්‍ර ගාස්තු සඳහා වන ව්‍යාපාර 107 ක් සඳහන් කර ඇත. බලපත්‍ර ගාස්තුවක් ප්‍රාදේශීය සභාවකට පැනවිය හැක්කේ ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාර ඒ සඳහා අතුරු ව්‍යවස්ථාවක් තිබේ නම් පමණි. එහෙත් මෙහි සඳහන් ව්‍යාපාර අතුරින් අතුරු ව්‍යවස්ථා ආවරණය ලබන්නේ ව්‍යාපාර කිහිපයක් පමණි. මෙය බෙහෙවින් ප්‍රශ්නකාරි තත්වයක් වුවත් බොහෝ ප්‍රාදේශීය සභා බලධාරින්ට මෙය නිවැරදිව තේරුම් ගතහැකි වී නැත. උදාහරණ වශයෙන් උපලේඛනයෙහි අංක (33) පෙට්‍රල්, ඩීසල් හෝ වෙනත් ඛනිජ තෙල් විකිණීමේ ස්ථාන අංක (55) යටතේ සිනමා ශාලාවක් පවත්වාගෙන යාම අංක (30) ගිණිකෙලි භාණ්ඩ රතිඤ්ඤා නිපදවීම (70) කළුගල් පිපිරවීම හා ගල් කැඩීම යන ව්‍යාපාර සඳහා බලපත්‍ර නිකුත් කිරීමට සෙසු නීති යටතේ වෙනත් බලධාරින් සිටී.

පෙට්‍රල් ,ඩීසල්, සඳහා ඛනිජ තෙල් ආඥාපනත යටතේ අමාත්‍යවරයා බලපත්‍ර ගාස්තු පනවා ඇත.

සිනමාශාලා සඳහා විනෝද බදු ආඥාපනත යටතේ බදු පැනවීම් සිදු කෙරේ. ගිණිකෙලි රතිඤ්ඤු සඳහා පුපුරණ ද්‍රව්‍ය ආඥාපතන යටතේ ක්‍රියා කෙරේ. කළුගල් පිපිරවීම හා කැඩීම පරිසර ආරක්ෂණ බලපත්‍ර යටතට ගැනේ. මෙබඳු වෙනත් නීති මගින් නියාමනය වන කර්මාන්ත සඳහා බලපත්‍ර ගාස්තු පැනවීමට ක්‍රියා කිරීම බලාතික්‍රමණයකි.

iv . ව්‍යාපාර බදු :

ව්‍යාපාර බද්ද ද ඉහත නිවේදනය යටතේම දක්වා ඇත. මෙහි දී පනතේ 152 වගන්තියෙහි සඳහන් උපලේඛණය දක්වා තිබේ. එහෙත් එහි ව්‍යාපාර බද්දට යටත්වන ව්‍යාපාර 32 ක් දක්වා ඇත. එහිදී වෘත්තීන් රාශියකට බදු පනවා තිබේ. එසේම මෙහි දී බදුපැනවීමට ලේකම්වරයාට බලය ලැබුණු බලදායි වගන්ති ද ඇතුලත් නොවේ. ඒ අනුව මෙම පැනවීම් අවිධිමත් හා දෝෂ සහගත ඒවා බව පෙනේ.

v . කර්මාන්ත බදු :

අඹගමුව ප්‍රාදේශීය සභාව 2016 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීමට කටයුතු සිදුකර ඇත්තේ ලේකම්වරයා විසින් කරන ලද ඉහත සඳහන් ආදායම් පැනවීම අනුවමය. උපලේඛයන්හි කර්මාන්ත 59 ක් තිබුණි. එයින් කාර්යයන් 03 ක් ගබඩාකිරීම් වේ. එසේම අංක (55) සිනමා ශාලාවක් පවත්වාගෙනයාම (70) කළුගල් පිපිරවීම අංක (39) පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පවත්වා ගෙනයාම (41) පරිගණක පංති පැවැත්වීම ආදිය සෙසු නීති මගින් බලපත්‍ර නිකුතුව සඳහා ක්‍රියාකළ යුතු කාර්යයන්ය. ඒ නීති ප්‍රතිපාදන අභිබවා ප්‍රාදේශීය සභාව විසින් බදු පනවා තිබීම බලාතික්‍රමණයට අදාල වන්නකි. ඒ අනුව මෙම පැනවීම් ද විධිමත් නොවේ.

vi . විනෝද බදු:

මෙම ආයතනය 2016 සඳහා විනෝද බදු පනවා නැත.

vii . වාහන හා සත්ව බද්ද:

මෙම බද්ද අඹගමුව ප්‍රාදේශීය සභාව 2016 වර්ෂය සඳහා පනවා නැත.

viii . සංවර්ධනය නොකළ ඉඩම් මත බදු:

මෙම බද්ද ද අඹගමුව ප්‍රාදේශීය සභාව විසින් 2016 වර්ෂයට පනවා නැත. ඉහත ආදායම් පැනවීම් වලට අමතරව අඹගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා, ඉතා අසාධාරණ හා ජනතාව පෙළන්නාවූ ශාස්තු ගණනාවක් පනවා තිබේ.

උදා:-

i. ත්‍රිරෝද රථ ලියාපදිංචිය -රු.1250.00

ii. ගොඩනැගිලි ඉදිකිරීම කොටසක් එකතු කිරීමේ ලියාපදිංචි ගාස්තු -රු.2000.00

සිට රු 4750.00 දක්වා

iii. ඉඩම් අනු බෙදුම් ගාස්තු එක් බිම් කොටසකට -රු2500.00

සිට රු.7500.00 දක්වා

iv. දුරකථන, විදුලි සංදේශ කුළුණු පෙරසැරි ගාස්තු මීටර් 1 කට -රු. 5000.00

v. ආවරණ අනුමැතිය සඳහා මීටරයකට -රු.2000.00

	නේවාසික	ව්‍යාපාරික
vi .ගොඩනැගිලි අයදුම්පත් පරීක්ෂණ ගාස්තු	500.00	1000.00
vii .අයදුම්පතේ කාලය දීර්ඝ කිරීමට වසරකට	500.00	750.00
viii .නම සංශෝධනය කිරීමේ පෝරම ගාස්තු	500.00	1000.00
ix .වීටී රේඛා, නොපවරා ගැනීමේ පෝරම ගාස්තු	2500.00	5000.00
x .විදුලිය ලබාගැනීමේ නිර්දේශ ලිපිය	1000.00	1500.00
xi .දැව ප්‍රවාහන ගාස්තු එක් වසරකට ටොන් 15 අඩු	3500.00	
xii .ටොන් 15 ට වැඩි	10,000.00	

	නේවාසික	ව්‍යාපාරික
අනුකූලතා සහතිකය	රු.750/- 3500/- දක්වා	රු.1250/-රු.5750/- දක්වා

මෙසේ සාපරාධී ගාස්තු පැනවීම අඹගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් කර ඇත්තේ කිසිදු නීතියක බලදායි වගන්තියක් සඳහන් නොකරමිනි. අඹගමුව වැනි නොදියුණු ,කඳුකර, දුෂ්කර ප්‍රදේශයක ජනතාවගෙන් අසාධාරණ මුදල් ලබාගෙන අයුතු ලෙස පොහොසත්වීම (Injust.enrichment) මෙම සභාව විසින් සිදුකර ඇති බරපතල හා සාපරාධී ක්‍රියාවකි. මේ සම්බන්ධව රටේ පලාත් පාලන බලධාරීන් නිහඬව සිටීම ජනතාවගේ බලවත් අවාසනාවකි.

විශේෂයෙන් මධ්‍යම පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව හා එම අමාත්‍යාංශය මෙන්ම විගණකාධිපති දෙපාර්තමේන්තුව ද නිහඬව සිටීම විමතියට කරුණකි.

5.7.8 ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව :

2016 වර්ෂය සඳහා මෙම සභාවේ ආදායම් පැනවීම ගැසට් පත්‍ර තුනකින් සිදුකර ඇත. ඒ අනුව වරිපනම් අක්කර බදු, වාහන හා සත්ව බද්ද හා බලපත්‍ර ගාස්තු පැනවීම ලේකම් විසින් 2015-12-18 දිනැති අංක 1946 දරණ ගැසට් පත්‍රයේ පළකර තිබේ. ඒ අනුව වරිපනම් පැනවීම 2015-12-18 දිනැති ගැසට් පත්‍රයේ පළකර ඇති නිවේදනයෙහි දක්වා ඇත. මෙම නිවේදනයේ පළමු ඡේදයෙහි ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු යනුවෙන් සඳහන් වේ. එය සභාව සතු බදු පැනවීමේ බලය ලේකම් වෙත පැවරෙන බලදායි වගන්තිය සාවද්‍ය ලෙස සඳහන් කිරීමකි. එය නිවැරදි විය යුත්තේ 9 වන වගන්තියේ (3) උප වගන්තිය ප්‍රකාර යනුවෙනි. ඒ අනුව එම නිවේදනය සාවද්‍ය හා අවිධිමත් එකක් බව පෙනේ.

i. අක්කර බදු:

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව අක්කර බදු පැනවීමේ නිවේදනයෙහි අවශ්‍ය කරුණු බොහොමයක් සඳහන් කර ඇත. එහෙත් 146 වගන්තියේ (1) වන උප වගන්තිය ප්‍රකාර සත්‍යෙක්ෂණය කළ ඉඩම් ප්‍රමාණය ඉකුත් වර්ෂයේ සඳහන් සත්‍යෙක්ෂණය අනුගාමී වර්ෂයේ නව තක්සේරුවක් නැති විට සභාව විසින් පිළිගත යුතුවේ. මෙම නිවේදයෙහි එවැන්නක් ගැන සඳහන් වී නැත. එසේම බලදායී වගන්තිය ද සාවද්‍ය ලෙස දක්වා ඇත. එබැවින් එය බලරහිත වන්නේය.

ii. බලපත්‍ර ගාස්තු:

බලපත්‍ර ගාස්තු සඳහන් වූ උපලේඛණයෙහි ව්‍යාපාර 78 ක් සඳහන් වේ. දෙවන උපලේඛණයේ අන්තරායදායක ව්‍යාපාර 15 ක් ද අප්‍රසන්න හා අන්තරායදායක ව්‍යාපාර 12 ක් ද සඳහන් කර ඇත. මෙහි ඇති විශේෂ අවශ්‍යතාවය වන්නේ මෙම ව්‍යාපාර (78+15+12= 105) 105 සඳහා වෙන වෙනම අතුරු ව්‍යවස්ථා පනවාගෙන තිබිය යුතු වීමයි. එසේ නොමැතිව මෙම ව්‍යාපාර සඳහා බලපත්‍ර නිකුත් කිරීමට හැකියාවක් ප්‍රාදේශීය සභාවට නොලැබේ. මෙම ලේඛනයේ ඇති,

අංක (3) පශු වෛද්‍ය සායන පැවැත්වීම

(71) සංචාරක වෙළඳාම

(74) පොදු වෙළඳපොළ

(11) ගිණිකෙළි හා රතිඝද්ඝදා නිපදවීම

(09) රූපලාවන්‍යාගාර ආදිය සඳහා බලපත්‍ර නිකුත් කළ නොහැකිය.

මේ අතර පශු සේවා හා රූපලාවන්‍යගාර වෘත්තිය කටයුතු වේ. ඒ සඳහා බලපත්‍ර නිකුත් කළ නොහැකිය. සංචාරක වෙළඳාම සඳහා බලපත්‍ර නිකුත් කළ නොහැකිය. එය සැරිසරණ වාහනයක් වන හෙයින් වාර්ෂික වටිනාකම පදනම් කොට බලපත්‍ර ගාස්තු පැනවිය නොහැකිය. පොදු වෙළඳ පොළවල් සඳහා බලපත්‍ර නිකුත් කළ නොහැකිය. එම ආයතන පලාත් පාලන ආයතන සතු ඒවා වේ. ගිණිකෙළි රතිඝද්ඝදා ආදිය පුපුරණ ද්‍රව්‍ය ආඥා පනත යටතේ දිසාපතිවරයා බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

ඒ අනුව මෙම පැනවීම විධිමත් නොවේ. මෙහි සඳහන් ඇතැම් ව්‍යාපාර, කර්මාන්ත බද්ද යටතට ගැනෙන කාර්යයන් වේ.

iii. ව්‍යාපාර බදු:

ඇහැළියගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් 2016-01-22 දැනැති අංක 1951 දරණ ගැසට් පත්‍රයේ පළකර ඇති ගැසට් නිවේදනයක් මගින් ව්‍යාපාර බද්ද පනවා ඇත.

මෙම නිවේදනයෙහි බදු පැනවීම පිණිස සභාව සතු බලතල ලේකම් වෙත ලැබෙන බලදායි වගන්තිය 9.3 ලෙස දක්වා ඇත. මෙය සාවද්‍ය වේ. නිවැරදි භාවිතාව නම් ප්‍රා ස. පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය ලෙස විය යුතුයි.

මෙහි එම ව්‍යාපාර කවරේද යන විස්තර නිවේදනයේ සඳහන් කර නැත. එසේ වු විට මහජනතාවට සිය ව්‍යාපාර සඳහා බද්ද වශයෙන් කුමන මුදලක් කවර පදනමක් මත ගෙවිය යුතු ද යන්න දැනගත නොහැකිය. මෙය සාවද්‍ය පරිචයක් වේ. මෙය අතීතයට බලපාන ලෙස පළවූ නිවේදනයක් ද වන හෙයින් අවිධිමත් හා බලරහිත වන්නේය.

iv. කර්මාන්ත බද්ද:

මෙම පැනවීමට අදාල තීරණය ද උක්ත ගැසට් පත්‍රයේම පළවේ. මෙය ද අතීතයට බල පැවැත්වෙන බද්දක් සේ පනවා ඇත. මීට අදාල උපලේඛණයෙහි කර්මාන්ත බද්දට යටත් කර ඇති ව්‍යාපාර 17 ක් දැක්වේ. ඇත්ත වශයෙන්ම මෙය ඉතා සීමිත ව්‍යාපාර ලේඛනයකි. ප්‍රාදේශීය සභාවකට අතුරු ව්‍යවස්ථා නොමැතිව බලපත්‍ර ගාස්තු අයකළ නොහැකි බොහෝ කර්මාන්ත/ව්‍යාපාර මෙම බද්දට යටත් කළ හැකිය. මෙහිදී එය සිදු වී නැත.

v. විනෝද බද්ද:

මෙම සභාව විනෝද බද්දක් පනවා නැත. නමුත් ප්‍රසිද්ධ රැඟුම් බලපත්‍ර ගාස්තු අවිධිමත් ලෙස ලේකම්වරිය විසින් පනවා, ඇමතිතුමා විසින් නොව සභාවේ ලේකම් විසින්ම නියම කර ප්‍රසිද්ධ කර ඇත.

vi. වාහන හා සත්ව බද්ද:

මෙම බද්ද සභාව වෙනුවෙන් ලේකම්වරිය විසින් පනවා ප්‍රසිද්ධ කර ඇත. එය අංක 1946 දරණ 2015-12-18 දිනැති ගැසට් පත්‍රය මගින් පනවා ඇත. මෙම පැනවීමේ දී ප්‍රාදේශීය සභා පනතේ 148 වගන්තියේ (3) වන උප වගන්තිය ප්‍රකාර බද්ද ගෙවිය යුතු දිනය හෝ දින නිවේදනයට ඇතුලත් කර නැත. මෙම නිවේදනයේ බදු පැනවීමේ බලදායි වගන්තිය පනතේ 9.3 ලෙස සාවද්‍ය ලෙස දක්වා ඇත. එය ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය ලෙස සටහන් විය යුතුය.

මේ හැර ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව 2016 වසර සඳහා, 2016-01-14 දිනැති අංක 1950 දරණ ගැසට් නිවේදනය මගින් ප්‍රාදේශීය සභාව විසින් ජනතාව වෙත අවශ්‍යයෙන්ම ඉටුකළ යුතු සාමාන්‍ය සේවා සඳහා ඉතා අසාධාරණ අධික ගාස්තු පනවා සිය ප්‍රදේශවාසි ජනතාව වෙත අනවශ්‍ය හා අයුතු පීඩනයක් එල්ලකර ඇත.

උදා :-

i.	අනතුරුදායක කොස් ගස් එකක් සඳහා පරීක්ෂණ ගාස්තුව	රු. 500.00
ii.	කොස් නොවන වෙනත් ගස් සඳහා පරීක්ෂණ ගාස්තුව	රු. 250.00
iii.	ප්‍රසිද්ධ රැඟුම් බලපත්‍ර ගාස්තුව	රු. 500.00
iv.	සුනඛයින් ලියාපදිංචි කිරීම	රු. 60.00

v. විදිරේබා නිකුත් කිරීම රු. 500.00

(ප්‍රාදේශීය සභා පනතේ වීටී රේබා පිළිබඳ සඳහන් නොවේ)

මෙබඳු අසාධාරණ හා නීතියට පටහැනි ගාස්තු රැසක් කිසිදු නෛතික බලයකින් තොරව ලේකම්වරිය විසින් පනවා තිබීම ඉතාම සාවද්‍ය ක්‍රියා මාර්ගයකි. සබරගමුව පළාතේ පළාත් පාලන නිලධාරීන්ගේ අවධානයට මෙම සාවද්‍ය පැනවීම් කිසිවක් යොමු වී නැත.

5.7.9 ගලිගමුව ප්‍රාදේශීය සභාව:

2016 වර්ෂය සඳහා ගලිගමුව ප්‍රාදේශීය සභාව ආදායම් පැනවීම් සිදුකර ඇත්තේ 2015-09-11 දිනැති අංක 1932 දරණ ගැසට් පත්‍රයේ පළකර ඇති නිවේදන මගිනි.

i. වරිපනම්:

මෙම නිවේදනයෙනි සඳහන් වන්නේ මෙම වරිපනම් පැනවීමේ යෝජනාව 2015 ජූලි මස 29 වැනි දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ දී සභා සම්මත වූ බවකි. මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට වරිපනම් හෝ වෙනයම් බද්දක් හෝ ආදායම් අයකිරීම අනුමත කිරීමේ බලයක් නැත. එය ප්‍රාදේශීය සභාව සතු බලයකි. මෙහි සඳහන් පරිදි 2015-09-11 දින ගැසට් පත්‍රයේ මෙම නිවේදනය පළ කර ඇත්තේ සභාවේ ලේකම්වරියයි. එසේ නම් සභාව වෙනුවෙන් බදු පැනවීමට ඇය කටයුතු කළ යුතුවේ. එහෙත් ඒ බවක් හෝ ලේකම්වරිය අදාල වරිපනම් පැනවීමට තීරණය කළ බව හෝ අදාල බලදායි වගන්තිය හෝ ගැසට් නිවේදනයේ සඳහන් නොවේ. එම තත්වය බෙහෙවින් ව්‍යාකූල ස්වරූපයක් ගනී.

තවද, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි සියළු ගෘහස්ථ කෘෂි කාර්මික හා ව්‍යාපාරික නොවන අනෙකුත් දේපලවලට 4% ක වරිපනම් බද්දක් හා ව්‍යාපාරික හා රජයේ දේපල වල වාර්ෂික වටිනාකමින් 4.5% ක වරිපනම් බද්දක් ද පනවන බව පූර්වෝක්ත නිවේදනයෙන් දැක්වේ. ප්‍රාදේශීය සභාවන්ට දේපලවල ස්වභාවය මත විවිධ ප්‍රතිශතයන් සහිතව වරිපනම් පැනවීම සඳහා ප්‍රතිපාදන නොමැත. ඉහත පැනවීම අනුව ගෘහස්ථ, කෘෂිකර්ම ව්‍යාපාරික නොවන දේපලවලට වරිපනමක් පනවා ඇත. එසේම ව්‍යාපාරික හා රජයේ දේපලවලට ද

වරිපනම් පනවා ඇත. එහිදී නේවාසික දේපල හා කෘෂිකාර්මික දේපල සඳහා වරිපනම් පනවා නැත.

ඒ අතර මෙම පැනවීමේ දී නව තක්සේරුවක් බලාත්මක නොවන නිසා ප්‍රවර්තන වර්ෂයේ තක්සේරුව අනුගාමී වර්ෂය සඳහා එනම් 2016 වසර සඳහා තක්සේරුව ලෙස පිළිගන්නා බවට සභාව අනුමත කළ යුතුය. එවැනි කිසිදු සඳහනක් මෙහි දක්නට නැත. ඒ අනුව පිළිගත් දේපල තක්සේරුවක් නැතිව මෙම වරිපනම් පනවා ඇති හෙයින් එය ශූන්‍ය හා බලරහිත වේ.

ප්‍රාදේශීය සභාවන්හි ලේකම්වරුන්ට බදු පැනවීමේ සභාව සතු බලය පැවරෙන පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය මෙම කිසිදු බදු පැනවීම් නිවේදනයක සඳහන් නොකිරීම බරපතල ඌණතාවයකි. මේ අනුව පෙනී යන්නේ ගලිගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම්වරිය කිසිදු අවබෝධයකින් තොරව මෙම සාවද්‍ය නිවේදනය පළකර ඇති බවයි. මෙහි අවසාන ඡේදය කාර්තුව අනුව වරිපනම් නියමිත කාර්තුව තුළ ගෙවීමට අපොහොසත් වුවහොත් 10% ක අධි ගාස්තුවක් අයකරන බවද සඳහන් වේ. ඒ සඳහා ප්‍රාදේශීය සභා පනතින් විධිවිධාන නොමැත.

ii. අක්කර බදු:

අක්කර බද්ද පැනවීම සිදුකර ඇත්තේද මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවක් මගිනි. එබඳු කාරක සභාවන්ට අක්කර බදු පැනවීමේ බලය පැවරී නැත. මෙමගින්ද ලේකම්වරිය සභාවේ බදු පැනවීමේ බලදායි වගන්තිය සඳහන් නොකිරීම බරපතල ඌණතාවයකි.

එසේම අක්කර බද්ද පැනවීමේ දී ප්‍රාදේශීය සභා පනතේ 146 වගන්තියේ (1) වැනි උප වගන්තිය ප්‍රකාර 2015 වර්ෂයේ සත්‍යෙක්ෂණය 2016 වසර සඳහා අනුමත කර නොමැති හෙයින් මෙම තීරණය ශූන්‍ය හා බලරහිත වේ.

iii. බලපත්‍ර ගාස්තු:

2016 වර්ෂය සඳහා වන බලපත්‍ර ගාස්තු සහ කර්මාන්ත බද්ද එකම නිවේදනයෙන් පළකර තිබේ. මෙහි ඇති උපලේඛණය ප්‍රකාර බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර 29 ක් ද අත්තරායකාරී

ව්‍යාපාර 22 ක් ද අප්‍රසන්න ව්‍යාපාර 29 ක් ද අන්තරායකාරී හා අප්‍රසන්න ව්‍යාපාර 48 ක් ද වශයෙන් බලපත්‍ර ලබාගතයුතු ව්‍යාපාර 128 ක් දක්වා ඇත. එහෙත් සම්මත අතුරු ව්‍යවස්ථා ඇත්තේ ව්‍යාපාර 14 ක් සම්බන්ධයෙන් පමණි. එසේනම් සෙසු ව්‍යාපාර සඳහා බලපත්‍ර නිකුත් කිරීම කෙසේ සිදුවේ ද ? අතුරු ව්‍යවස්ථාවක් නොමැතිව කිසිම බලපත්‍රයක් නිකුත් කළ නොහැකිය. අප්‍රසන්න ව්‍යාපාර ලැයිස්තුවේ (26) යටතේ පශු වෛද්‍ය ගිලන්හලක් පවත්වාගෙන යාම සඳහා ද අංක 47 හා 48 ඩිස්පැන්සරියක් පවත්වාගෙන යාම හා ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම ආදිය වෘත්තීන් වේ. වෘත්තීන් සඳහා බලපත්‍ර ගාස්තු හෝ බදු පැනවීම් නොහැකිය. තවද අන්තරායකාරී හා අප්‍රසන්න ව්‍යාපාර ලේඛනයේ අංක (2) ගිණිකෙලි හා රතිඤ්ඤා විකිණීම අංක (11) පෙට්‍රල්, ඩීසල් නිකුත් කිරීමේ ස්ථානයන් පවත්වාගෙන යාම සඳහන් කර ඇත. මේ සඳහා පිළිවෙලින් පුපුරණ ද්‍රව්‍ය ආඥාපනත යටතේ දිසාපතිවරයාත්, ඛනිජ තෙල් ආඥාපනත යටතේ අදාල අමාත්‍යවරයා ද බලපත්‍ර ගාස්තු පනවා ඇත. එකී නීති ගැන නොසලකා මෙසේ බලපත්‍ර ගාස්තු පැනවීම ඉතා බැරෑරුම් ක්‍රියාවකි.

අතුරු ව්‍යවස්ථා නොමැතිව මෙතරම් විශාල ව්‍යාපාර සංඛ්‍යාවකට බලපත්‍ර ලබාදීමට ක්‍රියා කිරීම කිසිසේත්ම ප්‍රඥාගෝචර ක්‍රියාවක් නොවේ. තවද මෙම ලේඛණයේ ගබඩා කිරීම් 17 ක් තිබේ. විකිණීම සඳහා තොග ගබඩාකර තබා ගැනීම වෙළඳ ව්‍යාපාරයන් නොවේ. එසේම සංචාරක වෙළඳාම (22) හා (27) අංක යටතේ දක්වා ඇත. ඒ සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කළ හැක්කේ ඒ සඳහා විශේෂයෙන් සකස් කළ අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ පමණි.

iv. ව්‍යාපාර බදු:

ව්‍යාපාර බද්ද යටකී මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව විසින් ම පනවන ලද්දකි. එය 2016 වසර සඳහා ද ඉන්පසු එලඹෙන වර්ෂ වෙනුවෙන් ද පනවා ඇති බව සඳහන්ය. මෙය වාර්ෂික බද්දක් වන අතර, ඊට වැඩි කාලයක් සඳහා පැනවිය නොහැකිය.

මෙහි ඇති උපලේඛණය ප්‍රකාර වෘත්තීන් හතක් ඇතුලත් වේ. ඒ සඳහා බදු පැනවිය නොහැකිය. එසේම නියෝජිතයෙකු ලෙස කටයුතු කිරීම් එනම් රක්ෂණ නියෝජිතයෙකු ලොතරැයි නියෝජිතයෙකු ප්‍රවාහන නියෝජිතයෙකු, ඉන්ධන පිරවුම්හල් නියෝජිතයෙකු ආදී වශයෙන් නියෝජිතයෙකු වීම වෙළඳ ව්‍යාපාරයක් නොවේ. එබැවින් මෙම පැනවීමේ තීරණ දෝෂ සහගත නීතියට පටහැනි වුවක් සේ සැලකේ.

v. කර්මාන්ත බදු:

කර්මාන්ත බද්දු පැනවීම ද බලපත්‍ර ගාස්තු පිළිබඳ නිවේදනයේම සඳහන් වේ. එම පැනවීම අතිශයින් අවිධිමත්ය. අදාල උපලේඛණයෙහි කර්මාන්ත 50 ක් ඇත. එහි අංක (44) මත්පැන් රටබීම අලවිය. අංක (45) ඉංග්‍රීසි බෙහෙත් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම (46) මනාලියන් හැඩගැන්වීම ආදිය ද සඳහන් වේ. මත්පැන් රටබීම සුරාබදු ආඥා පනත යටතේ එම අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ අධිකාරි බලය යටතේ වූවකි. ඉංග්‍රීසි බෙහෙත් අලවිය ආහාර හා ඖෂධ පනත යටතේ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාරයකි. මනාලියන් හැඩගැන්වීම වෘත්තියකි.

එබැවින් මෙම කර්මාන්ත බදු පැනවීම ද විධිමත් හා නිවැරදි අයුරින් සිදුකර නොමැති බව පෙනේ.

vi. විනෝද බද්ද:

මෙම සභාව විනෝද බද්දක් පනවා නැත.

vii. වාහන හා සත්ව බද්ද:

මෙම බද්ද පනවා ඇත්තේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව විසිනි. එසේම පැනවූ තැනැත්තා වනුයේ ලේකම්වරියයි. ඇය විසින් මෙම කාර්යය කළේ නම් ඒ කුමන ප්‍රතිපාදනයක් මත ද යන්න නිවේදනයෙන් සඳහන් විය යුතුවේ. එබඳු කිසිම සඳහනක් එහි නොවිය. එනම් බදු පැනවීමට ලේකම් වෙත බලය පැවරෙන බලදායී වගන්තිය එහි සඳහන් කර නැත. මෙය අවිධිමත් හා බල රහිත වූවකි.

viii. සංවර්ධනය නොකළ ඉඩම් මත බදු:

මෙම පැනවීම ද මූලින් සිදුකර ඇති පරිදි මූල්‍ය හා ප්‍රතිපත්ති කාරක සභාවක් විසින් පනවන ලද්දකි. බදු පැනවීමට අදාලව ලේකම් වෙත සභාවේ බලය පැවරීමේ බලදායි වගන්තිය සඳහන් කළ යුතු වුවත් එවැන්නක් සඳහන් කර නැත.

එබැවින් මෙය අසම්පූර්ණ හා දෝෂ සහගත පැනවීමක් බව පෙනේ.

ඉහත ආදායම් මාර්ග වලට අමතරව තවත් බදු හා ගාස්තු පනවනු ලැබ ඇති බව පෙනේ. එකී සමහර පැනවීම් බලාතික්‍රමණයට යටත් වේ.

උදා :-

i. **ඇතැම් ඉඩම් විකිණීම මත බදු:**

මෙම බද්ද අමාත්‍යවරයා විසින් දැනටමත් පනවා ඇත. සභාවේ කාර්යය වන්නේ එය අයකර ගැනීමය.

ii . පිඹුරු පත් අනුමත කර ගැනීමේ ගාස්තු, මෙම ගාස්තු රු.500/= සිට රු. 1500/= දක්වා විස්තීරණය වේ.

ii. **පාරිසරික බලපත්‍ර ගාස්තු පැනවීම:**

මෙය ද අමාත්‍යවරයා විසින් පනවා ඇත. සභාව කළයුත්තේ බලපත්‍ර නිකුත් කර ගාස්තු අයකර ගැනීම පමණි.

මෙබඳු ප්‍රයත්නයන් ප්‍රාදේශීය සභාවක් මගින් සිදුකිරීම ඉතා වේදනීය තත්වයකි.

5.7.10 දික්වැල්ල ප්‍රාදේශීය සභාව:

2016 වර්ෂය සඳහා ආදායම් පැනවීම සිදුකර ඇත්තේ 2015-11-13 දිනැති අංක 1941 දරණ ගැසට් පත්‍රයේ සභාවේ ලේකම්වරයා විසින් පළකර ඇති නිවේදන මගිනි.

i. **වරිපනම්:**

වරිපනම් පැනවීම සිදුකිරීමට උත්සාහ දරා ඇත්තේ නිවේදනයක් සමග යෝජනාවක් ඉදිරිපත් කිරීමෙනි. නිවේදනයෙහි ලේකම්වරයාට බදු පැනවීමට බලය ලැබී ඇති ප්‍රාදේශීය සභා පනතේ බලදායි වගන්තිය 9.3 ලෙස දක්වා ඇත. එහෙත් එය 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය ලෙස එය නිවැරදි විය යුතුයි. මෙහි දී ලේකම්වරයා විසින් සිදුකරනු ලැබ ඇත්තේ වරිපනම් පැනවීමට යෝජනාවක් සකස්කර එය මහජනයා වෙත දැනුම් දීමයි.

එහි 2016 වසරේ තක්සේරුව 2010 වසරේ අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද නව තක්සේරුවක් හා තක්සේරු දෙපාර්තමේන්තුවේ නව තක්සේරු වාර්තාවක් බව සඳහන් කරයි. මෙය ඉතා ව්‍යාකූල ප්‍රකාශයකි. වරිපනමක් පැනවීමේදී සරල හා නිශ්චිත ලෙස කුමන වර්ෂයේ

පදනම් තක්සේරුව අනුගාමි වර්ෂය සඳහා යොදාගත්තේ ද යන්න සම්මත කරන බව ප්‍රකාශ කළ යුතුය. එවැන්නක් මෙහි සිදුවී නැත.

තවද සියළු කරුණු ලේකම්වරයා විසින් යෝජනා කර ඇතිවා මිස සිය තීරණය කුමක්ද යන්න සඳහන් කර නැත. එබැවින් මෙය අපැහැදිලි අවිනිශ්චිත හා තීරණයක් රහිත හුදු යෝජනාවක් පමණක් බව පෙනේ. එබැවින් මෙය නිසි ලෙස සිදුකර ඇති වරිපනම් පැනවීමක් ලෙස සැලකිය නොහැකිය. ඒ අනුව මෙම නිවේදනය බල රහිත වූවකි.

ii. අක්කර බද්ද:

2016 වර්ෂය සඳහා අක්කර බදු පැනවීමට අදාල යෝජනාවක් ප්‍රකාශයට පත්කර තිබේ. ඊට ඇතුලත් වන්නේ දික්වැල්ල ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පිහිටි එක් එක් ඉඩම් හෙක්ටයාරය මත පනවා අයකළ යුතු අක්කර බදු ප්‍රමාණය නිශ්චය කිරීමය. මෙම කාරණය සඳහා ලේකම්වරයා විසින් යෝජනාවක් ඉදිරිපත් කර තිබේ. එහෙත් ඔහුගේ කර්තව්‍යය වන්නේ අදාල නීති සලකා බලා අක්කර බදු පැනවීමය. ඔහුගේ යෝජනාව වෙනුවට සිය තීරණය නිශ්චිතව ගැසට් පත්‍රයේ පළකළ යුතුව තිබුණි. මෙවැනි යෝජනාවකින් කිසිම බද්දක් අයකළ නොහැකිය. මෙම නිවේදනය එනයින්ම බලරහිත වේ.

iii. බලපත්‍ර ගාස්තු:

බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් ද ලේකම්වරයා තීරණය කර ඇතත් පැනවීම් සිදු කර නැත. යෝජනාවක් පමණක් ගැසට් පත්‍රයේ පළකර ඇත. බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත 54 ක් උපලේඛණයේ දක්වා තිබේ. එහෙත් ඒ සියල්ල නීතිය ඉදිරියේ බල රහිත වේ.

අංක (01)	-	සංචාරක වෙළඳාම -
		අතුරු ව්‍යවස්ථා මගින් බලපත්‍ර ගාස්තු නියම කළ යුතුය.
අංක(6-7)	-	කළුගල් කැඩීම -
		පාරිසරික බලපත්‍ර විෂයට අයත් කරුණකි.
අංක (13)	-	ඉංග්‍රීසි සිංහල බෙහෙත් විකිණීම -
		ඖෂධ පනත යටතේ බලපත්‍ර ගත යුතුය
අංක (20)	-	සිනමා ශාලාවක් -

	ප්‍රසිද්ධ රැගුම් ආඥා පනත යටතේ බලපත්‍ර නිකුත් කෙරේ.
අංක (28 හා 47)-	ඩීසල්, පෙට්‍රල්, භූමිතෙල් -
	බනිජ තෙල් ආඥා පනත යටතේ බලපත්‍ර ගාස්තුව ඇමතිවරයා විසින් පනවා ඇත.
අංක (54)	පිහිනුම් තටාක සඳහා බලපත්‍ර ලබාදීමට යෝජනාකර ඇත.
	පිහිනුම් තටාක අධීක්ෂණය පාලනය සඳහා අතුරු ව්‍යවස්ථා තිබිය යුතුය. ප්‍රාදේශීය සභා පනතේ මේ සඳහා ප්‍රතිපාදන නැත.

iv. ව්‍යාපාර බදු:

මෙම කරුණට අදාලව ද යෝජනාවක් පමණක් ඉදිරිපත් කර ඇත. පැනවීමක් සිදුකර නැත. එහෙත් පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද පනතේ විධිවිධාන සාවද්‍ය ලෙස සංශෝධනය කර ඇත. ව්‍යාපාර බදු පැනවීම ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වන්නේ එම ව්‍යාපාරයෙන් ලද ඉපැයීම් පදනම් කොටගෙන වුවත් දික්වැල්ල ප්‍රා.ස ලේකම් විසින් එය ස්ථානයේ වාර්ෂික වටිනාකම මත අය කිරීමට යෝජනාකර ඇත. ඔහුට මෙම නීති අභිබවා යාමට බලය ලද ආකාරය විමසා බැලිම ප්‍රයෝජනවත් වියහැකිය. මෙම නිවේදනය නීතිය ඉදිරියේ බලරහිත වේ.

v. කර්මාන්ත බද්ද:

මේ සඳහා ද ලේකම් විසින් යෝජනාවක් මහජනතාව වෙත ඉදිරිපත් කර ඇත. එහෙත් කර්මාන්ත බද්දක් පැනවීමට තීරණය කර නැත. මෙය අතිශයින් අවිධිමත්ය. නීතිය ඉදිරියේ බල රහිතය.

vi. විනෝද බද්ද:

දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් මීට අදාල යෝජනාවක් මහජනයා වෙත ඉදිරිපත් කර ඇත. විනෝද බද්ද අමාත්‍යවරයා විසින් විනෝද බදු ආඥාපනතේ විධිවිධාන ප්‍රකාර පැනවිය යුතුය. මෙම යෝජනාව අවිධිමත් වේ. එයින් විනෝද බදු අයකළ නොහැකිය.

vii. වාහන හා සත්ව බද්ද:

මේ සම්බන්ධව ද ලේකම්වරයා ගේ යෝජනාවක් ගැසට් නිවේදනයේ පළකර ඇත. ඒ හැර එම බද්ද පැනවීමට තීරණය කර නැත. ප්‍රාදේශීය සභා පනතේ හතර වන උපලේඛණයේ

සඳහන් වාහන හා සතුන් පිළිබඳ විස්තර අභිබවා යමින් කුලී රථ සඳහා ද මසකට රු.200/= බැගින් බදු පනවා ඇත. එහෙත් සභා යෝජනාවේ සඳහන් වන්නේ බලපත්‍ර ලබාගැනීමක් ගැනය. ඒ අනුව මෙය ව්‍යාකූල නිවේදනයකි. පාර්ලිමේන්තුව විසින් පනවන ලද පනතක අඩංගු ප්‍රතිපාදන ප්‍රාදේශීය සභා ලේකම්වරයෙකුට සංශෝධනය කළ නොහැකිය. මෙහි මෙම පැනවීමට අදාල බලදායී වගන්ති සාවද්‍ය ලෙස සඳහන් කර ඇත. එනයින්ම මෙම නිවේදනය නීතිය ඉදිරියේ බල රහිත වේ.

viii. සංවර්ධනය නොකළ ඉඩම් මත බදු:

සෙසු බදු මෙන්ම මෙම බද්ද සම්බන්ධව ද යෝජනාවක් ගැසට් පත්‍රයේ පළකර ඇත. එය තීරණයක් ලෙස නිශ්චිතව පනවා නැත. මෙමගින් කිසිදු බදු මුදලක් සභාවට අදාල වර්ෂය සඳහා අයකරගත නොහැකිවේ. එසේම බදු පැනවීමට බලය ලැබෙන බලදායී වගන්තිය සාවද්‍ය අයුරින් සඳහන් කර තිබේ. මෙම ආදායම් වලට අමතරව ප්‍රාදේශීය සභාවක් මහජනතාවට සැපයීමට බැඳී සිටින මූලික සේවා සඳහා ඉල්ලුම් කිරීම පිණිස සකස් කරගත් ආකෘති/පෝරම ආදිය ඉතා අධික, අසාධාරණ මිල ගණන් වලට විකිණීමට කරන ලද යෝජනාවක් ද ගැසට් පත්‍රයේ පළකර තිබේ. එහි සඳහන් ඇතැම් අයකිරීම් පිළිබඳ නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

1.	ඔප්පු සාරාංශ ඉල්ලුම් පත්‍ර	-	රු.	400.00
2.	වරිපනම් සහතික නිකුත් කිරීම	-	රු.	200.00
3.	විදි රේඛා හා නොපවරා ගැනීමේ සහතික	-	රු.	300.00 මෙම සහතික ගැන ප්‍රා.ස පනතේ සඳහන් නොවේ.
4.	ගොඩනැගිලි අයදුම්පත්‍රය	-	රු.	400.00
5.	ඉඩම් අනුබෙදුම් අයදුම්පත	-	රු.	400.00
6.	පරිසර බලපත්‍ර අයදුම්පත	-	රු.	200.00
7.	පාපැදි බලපත්‍ර ලිපි ද්‍රව්‍ය ගැනීම	-	රු.	16.00 ශ්‍රී ලංකාවේ නීතියෙහි පාපැදි බලපත්‍රයක් ගැන සඳහන් නොවේ.
8.	පාරිසරික බලපත්‍ර අයදුම්පත	-	රු.	200.00
9.	පාරිසරික බලපෑම් හඳුනාගැණීමේ අයදුම්පත	-	රු.	400.00

10. ගෝඝාතක බලපත්‍ර අයදුම්පත - රු. 1000.00

11. අනතුරුදායක කොස් ගස් පරීක්ෂා කිරීමේ අයදුම්පත් ගැනීම - රු. 500.00

12. වෙනත් අනතුරුදායක ගස් සඳහා අයදුම් පත - රු. 200.00

සාමාන්‍යයෙන් පොදු මහජනතාවට එදිනෙදා ජන ජීවිතයේ අත්‍යාවශ්‍ය සේවා ඉල්ලා සිටීමේ පෝරම ගාස්තුව මෙසේ නම් පුරවැසියා මුහුණ දී සිටින පීඩනයේ පරිමාව කොතෙක් දැයි සිතා ගැනීමටවත් බැරි තරම් බැරෑරුම් බව පෙනේ. මෙය ශ්‍රී ලංකාවේ බලපවත්වන අයුතු ලෙස පෙහොසත්වීම (Injust enrichment) නැමැති වරදක් ලෙස සලකා මින් පීඩාවට පත්වන තැනැත්තන්ට මීට එරෙහිව අධිකරණයෙන් සහන අයැද සිටිය හැකිය.

5.7.11 බෙන්තොට ප්‍රාදේශීය සභාව:

2016 වර්ෂය සඳහා වූ ආදායම් පැනවීම 2015-12-11 දිනැති අංක 1945 දරණ ගැසට් පත්‍රයේ ලේකම් විසින් පළකරන ලද නිවේදන මගින් සිදුකර ඇත.

i. වරිපනම් පැනවීම සිදුකර ඇත්තේ ලේකම්වරයා විසින් වන අතර ඒ සඳහා ඔහුට බලය පැවරෙන ප්‍රාදේශීය සභා පනතේ බලදායි වගන්තිය නිවේදනයේ කිසිම ස්ථානයක සඳහන් වී නොමැත. එසේම වරිපනම් පනවා ඇත්තේ ප්‍රාදේශීය සභා පනතේ 146 වගන්තියේ (1) වන උප වගන්තියේ ප්‍රතිපාදන මත හෙයින් ඒ අනුව ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික වටිනාකම් අනුගාමී වර්ෂයේ වාර්ෂික වටිනාකම් ලෙස සභාවේ සම්මුතියක් මගින් පිළිගත යුතුය. මෙහි එවැන්නක් සිදු වී නැති අතර එබැවින් වාර්ෂික වටිනාකමක් (තක්සේරුවක්) නොමැතිව වරිපනමක් ගණනය කළ නොහැකිය. ඒ අනුව මෙම පැනවීම ශූන්‍ය හා බල රහිත වන්නේය.

ii. **අක්කර බද්ද:**

අක්කර බදු පැනවීමේදී ද, ලේකම්වරයා විසින් ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික වටිනාකම් අනුගාමී වර්ෂය සඳහා පදනම් කරගනු ලබන බවට සභාවේ අනුමැතිය මත ප්‍රකාශයට කළ යුතුය. මෙහි එවැන්නක් සිදුවී නැත. එසේම අක්කර බද්දට අදාළ ඉඩම් ප්‍රමාණය සත්‍යෝක්ෂණය කර නොමැත. එසේ වූ විට අනුගාමී වර්ෂය සඳහා අක්කර බද්ද පැනවිය නොහැකිවේ. තවද

අක්කර බද්ද පැනවීමට අදාළ බලදායී වගන්තිය ද මෙහි කිසිම තැනක සඳහන් වී නැත. මෙය නීතිය ඉදිරියේ බල රහිත නිවේදනයකි.

iii. බලපත්‍ර ගාස්තු:

2016 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීමේ දී ද පූර්වෝක්ත ගැසට් පත්‍රයේම පළකරන ලද නිවේදනයක් උපයෝගී කොටගෙන ඇත. මෙහි දී එකම නිවේදනය මගින් බලපත්‍ර ගාස්තු, කර්මාන්ත බද්ද හා ව්‍යාපාර බද්ද ද පනවා ඇත. බලපත්‍ර ගාස්තු සඳහා උපලේඛණ අංක 01 හි වෙළඳ ව්‍යාපාර 26 ක් ද එහිම අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර 42 ක් ද පළකර ඇත. මේ අනුව (26+42=68) මෙම වෙළඳ ව්‍යාපාර 68 සඳහාම සභාව විසින් පනවා ගන්නා ලද අතුරු ව්‍යවස්ථා තිබිය යුතුවේ. සම්මත අතුරු ව්‍යවස්ථා 14 ක් පමණ මෙහිලා උපයෝගී කොට ගත හැකිය. එවිට සෙසු වෙළඳාම් සඳහා බලපත්‍ර නිකුත් කරනුයේ කුමන නීතියක් යටතේද යන්න අපැහැදිලිය.

තවද දෙවන ලැයිස්තුවේ අප්‍රසන්න හා අන්තරායකාරී ව්‍යාපාර ලෙස හඳුන්වා ඇති.

අංක	07	-	ඉංග්‍රීසි බෙහෙත් අළෙවිය ෆාමසි
	08	-	සිංහල බෙහෙත් අළෙවිසැල්
	09	-	දත්ත චිකිත්සාගාරය, දත් බැඳීම හා X රේ යන්ත්‍ර
	10	-	මෙඩිලැබ් රසායනාගාරයක්

යන කාර්යයයන් සඳහා බෙන්තොට ප්‍රාදේශීය සභාව බලපත්‍ර නිකුත් කරනුයේ කවර නීතියක් යටතේ ද යන්න අපැහැදිලිය. ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාර මෙම කාර්යයන් සඳහා අතුරු ව්‍යවස්ථා පැනවීමට ප්‍රාදේශීය සභාවට බලය ලබා දී නැත. එසේම අංක (13) පශු වෛද්‍ය ගිලන්හලක් ප්‍රතිකාර මධ්‍යස්ථානයක් යන්න වෘත්තියකි ඊට බලපත්‍ර ගාස්තු පනවා බලපත්‍ර නිකුත් කිරීමට ප්‍රාදේශීය සභාවට බලය පවරා නැත.

21. පොහොර විකිණීම හා ගබඩා කිරීම.

ගබඩා කර තැබීම ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් නොවේ.

26. ගෝ ඝාතකාගාරයක් පවත්වාගෙන යන යාම ගෝඝාතක ආඥා පතන යටතේ ප්‍රාදේශීය සභාව මගින් කටයුතු කළ යුතු අවස්ථාවකි.

36. ගිණිකෙළි රතිඤ්ඤා නිෂ්පාදනය විකිණීම පුපුරණ ද්‍රව්‍ය ආඥාපනත යටතේ දිසාපතිවරයාගේ අධිකාරී බලය යටතේ පවත්නා බලපත්‍ර ක්‍රියාවලියට අයත් කාර්යයකි. මේ අනුව රටේ පවතින නීතිය ගැන සැලකිල්ලක් නොදක්වා වෙනත් අධිකාරයන් යටතේ වූ කාර්යයන් ගෙන් බලපත්‍ර ගාස්තු අයකිරීමට ක්‍රියා කිරීම බලාතික්‍රමණයට යටත් වන කරුණකි.

iv. ව්‍යාපාර බදු:

2016 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද වෙළඳ ව්‍යාපාර 74 ක් සඳහා පනවා ඇත. මෙම නිවේදනය මගින් ව්‍යාපාර සඳහා මෙන්ම වෘත්තීන් සඳහා ද බදු පනවා තිබේ. එහෙත් ඊට අදාල බලදායී වගන්තිය මෙම නිවේදනයේ සඳහන් නොවේ. එනයින්ම මෙය බලරහිත වන බව පෙනීයයි. ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (2) වන උපවගන්තිය ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් වෘත්තියක් කරගෙන යන සෑම තැනැත්තෙකු ගෙන්ම ඒ ප්‍රාදේශීය සභාව විසින් වෘත්තිය බද්ද අයකර ගැනීමට අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරන ලද නියෝගයක් මගින් නියම කළ මුදල නොඉක්මවන මුදලක බද්දක් ප්‍රාදේශීය සභාව විසින් සභා සම්මුතියකින් පනවා අය කරනු ලැබිය හැකිය. එහෙත් 152 (2) උප වගන්තිය යටතේ අමාත්‍යවරයා වෘත්තීය බදු මුදල නියම කර නැති නිසා ප්‍රාදේශීය සභාවකට වෘත්තිකයින් ගෙන් කිසිම බද්දක් අයකළ නොහැකිය.

එතෙකුදුවුව මෙම උප ලේඛනයෙනි (04) නීතිඥයින් (06) ගණන් පරීක්ෂකවරුන් (11) නොතාරිස්වරුන් (14) ගෘහ නිර්මාණ ශිල්පීන් (21) සාත්තු නිවාස විශේෂඥ වෛද්‍ය සේවා (31) දිවා සුරැකුම් මධ්‍යස්ථාන (36) ජාත්‍යන්තර පාසැල් (48) දියමත ගුවන්යානා බැස්සවීම (මෙම ප්‍රලතීරුවේ අයිතිය ප්‍රාදේශීය සභාවට තිබේ ද ? එය රාජ්‍යය සතු පොදු දේපලකි) ආදී වෘත්තීන් සඳහා බදු පනවා තිබේ. මෙය නීතිය අභිබවා යාමකි.

තවද (19) සම්ප්‍රේෂණ කුළුණු (68), දුරකථන කුළුණු සඳහා ව්‍යාපාර හා වසරකට රු.50,000/= බැගින් අය කිරීම බලාතික්‍රමණයට යටත්වන වරදකි. ඒ හැර (20) ඉන්ධන පිරවුම්හල් (24) රටබීම, මත්පැන් වෙළඳාම (28) රේස් බයි රේස් පැවැත්වීම. (46) සිනමා ශාලාවක් පවත්වා ගෙන යාම ආදිය පිළිවෙලින් ඛනිජ තෙල් ආඥාපනත, සුරාබදු ආඥාපනත, රේස් ඔට්ටු ආඥාපනත, ප්‍රසිද්ධ රැගුම් ආඥාපතන යන නීති මගින් නියාමනය කරන ව්‍යාපාර වන අතර

ඒ සඳහා බලපත්‍ර ගාස්තු අදාල විෂයභාර අමාත්‍යවරුන් විසින් පනවා අයකර ගැනීමේ බලය පළාත් පාලන ආයතන / දිසාපතිවරයා හා සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරා ඇත.

රටේ බලපවත්නා පොදු නීතිය නොතකා හැර මෙම විෂයයන් සඳහා ව්‍යාපාර බදු පැනවීම බලාතික්‍රමණයට යටත් විය හැකි කාරණයකි.

v. කර්මාන්ත බද්ද:

මීට අයත්වන ව්‍යාපාර 90 ක් අදාල ලේඛනයෙහි දක්වා ඇත. එය ඵලදායි පියවරකි. එහෙත් එම ලේඛනයේ ඇති අංක (08) වැලි ගොඩදැමීම (දිසාපතිවරයාගේ බලපත්‍ර අධිකරය ප්‍රාදේශීය ලේකම් මගින් ක්‍රියාත්මක කෙරේ)

18. ජ්‍යෝතිෂ්‍ය කාර්යාලයක් පැවැත්වීම. මෙය වෙළඳාමක් ද නැතහොත් කර්මාන්තයක් ද ?
41. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වා ගෙන යාම (වෙළඳාමක් ද නැතිනම් කර්මාන්තයක් ද ?
58. ජංගම (පාන් බේකරි කෑම) වෙළඳාම මේ සඳහා වාර්ෂික වටිනාකම් ගණනය කරන්නේ කෙසේ ද ?
59. ජංගම (මාළු) වෙළඳාම
90. ඔරු සේවාවක් පවත්වාගෙන යාම මෙය තොටුපල රේන්ද යටතේ ප්‍රාදේශීය ලේකම් ගේ බලපත්‍ර මත ක්‍රියාත්මක වේ.

ආදිය සම්බන්ධයෙන් කර්මාන්ත බද්දක් පැනවීම ප්‍රායෝගික නොවේ. රටේ බලපවත්නා නීතිය හා නොගැටෙන පරිදි ප්‍රාදේශීය සභා සිය බදු පැනවීම පැහැදිලිව ම ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන මත ම සිදු කළ යුතුවේ.

vi. විනෝද බද්ද:

මෙම සභාව විනෝද බදු පනවා නැත. එහෙත් ප්‍රසිද්ධ රැඟුම් බලපත්‍ර ගාස්තු පනවා ඇත. ප්‍රසිද්ධ රඟදැක්වීම් ආඥාපනතේ 3 වන වගන්තියේ (1) (ඇ) යටතේ අමාත්‍යවරයා විසින් බලපත්‍ර ගාස්තු නියම කළ යුතුවේ. ප්‍රාදේශීය සභාවට එම බද්ද ඇමතිවරයාගේ අනුමැතියකින් තොරව පැනවීමට බලය පැවරී නැත.

vii. වාහන හා සත්ව බද්ද:

බෙන්තොට ප්‍රාදේශීය සභාව 2016 වර්ෂය සඳහා වාහන හා සත්ව බද්ද නීතියෙහි දැක්වෙන ප්‍රතිපාදන වලට අදාලව පනවා ඇති බවක් නොපෙනේ. මෙහි බදු පැනවීමට අදාල බලදායී වගන්තිය සඳහන් නොවේ. එසේම බද්ද ගෙවිය යුතු දිනය හෝ දින එහි සඳහන් කර නැත. එනයින් මෙයද නීතියට අනුකූල නොවේ.

viii. සංවර්ධනය නොකළ ඉඩම් මත බදු

බෙන්තොට ප්‍රාදේශීය සභාව මෙම බද්ද 2016 වර්ෂය සඳහා පනවා නැත.

5.7.12 පස්සර ප්‍රාදේශීය සභාව:

2016 වර්ෂය සඳහා පස්සර ප්‍රාදේශීය සභාව ආදායම් පනවා ඇත්තේ 2015-11-13 දින අංක 1941 දරණ ගැසට් පත්‍රයේ ලේකම්වරිය විසින් පළකර ඇති නිවේදන මගිනි. මෙහි සඳහන් සියළු නිවේදන නීත්‍යානුකූල නොවන අතර නීතියට පටහැනි ලෙස ආදායම් පැනවීමේ ක්‍රියාවලිය සිදුකර ඇත්තේ පස්සර ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටුවක් මගිනි. ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය ප්‍රකාර සභාව ක්‍රියාත්මකව නොපවතින විටක එහි බලතල ලේකම්වරයාට භාවිතා කළ හැකිවේ. එසේ නැතිව බදු පැනවීම ඇතුළු සභාව සතු බලය කළමනාකරණ කමිටු වලට ඉටු කිරීමට නීතියෙන් බලය පවරා නැත. ඒ අනුව මෙම පැනවීම් ශූන්‍ය හා බලරහිත වේ.

i. වරිපනම්:

මෙම නිවේදනය ප්‍රකාර පවතින වර්ෂයේ දේපල තක්සේරු වටිනාකම් අනුගාමි වර්ෂයේ දේපලවල තක්සේරුව ලෙස සම්මත කළ යුතු වුවද මෙහි එබඳු කිසිම තීරණයක් ගෙන නැත. එහි වට්ටම් ලබාගැනීමට ඇති සුදුසුකම් ගැනද කිසිදු සඳහනක් නැත.

ඒ අනුව පස්සර ප්‍රාදේශිය සභාව වෙනුවෙන් ලේකම්වරිය විසින් වරිපනම් පැනවීමට ගෙන ඇති සියලු ක්‍රියාමාර්ග නීතියට මුළුමනින්ම පටහැනි ඒවා වේ. මෙබඳු ජනතාව නොමග යවන සුළු නිවේදන ප්‍රසිද්ධ කිරීම බලාතික්‍රමණයට යටත්වන වරදකි. මෙම නිවේදනය ශූන්‍ය හා බලරහිත වේ.

ii. අක්කර බද්ද:

මෙම බද්ද පනවා ඇත්තේ ද සභාවේ බලය හිමි ලේකම්වරිය නොව කළමනාකරණ කමිටුවයි. මෙහි දී ප්‍රවර්තන වර්ෂයේ ඉඩම් වල ප්‍රමාණය සත්‍යෙක්ෂණය කර පළකළ යුතු වුවත් මෙහි එබඳු කිසිදු සඳහනක් නැත. වාර්ෂික තක්සේරුවක් හෝ සත්‍යෙක්ෂණයක් නොමැතිව අක්කර බදු පැනවිය නොහැකිය. මෙම තීරණය මුළුමනින්ම නීතියට පටහැනි වන අතර එය ශුන්‍ය හා බලරහිත වේ.

iii. බලපත්‍ර ගාස්තු:

පස්සර ප්‍රාදේශීය සභාව 2016 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පනවා ඇත්තේ කළමනාකරණ කමිටුවක් විසිනි. සභාවේ බලතල පාවිච්චි කිරීමට එබඳු කමිටුවකට බලයක් පවරා නැත. හැරත් මෙම බලපත්‍ර ගාස්තු කර්මාන්ත බදු, ව්‍යාපාර බදු ආදි සියල්ල පනවා ඇත්තේ එකම නිවේදනයකිනි. එය ද ව්‍යාකූල වූවකි. එහි කර්මාන්ත බද්දක් පනවා ඇතත් ඊට අදාල ව්‍යාපාර නාම ලේඛණයන් වෙන් කොට දක්වා නැත.

මේ සමග ඇති ව්‍යාපාර ලැයිස්තුවේ බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත 170 ක් දක්වා ඇත. මෙම බලපත්‍ර ගාස්තු පැනවීමේ තීරණය මුළුමනින්ම දෝෂ සහිතය. එහි අවසානයේ ''මෙම බලපත්‍ර ගාස්තු මත 10% ක මුද්දර ගාස්තු ද මීට ගෙවිය යුතු බව තීරණය කරමි''. යනුවෙන් සඳහන් කර ඇත. ප්‍රාදේශීය සභාවකට අයකළ හැක්කේ පනතේ සඳහන් බලපත්‍ර ගාස්තුව පමණි. මුද්දර ගාස්තු ගෙවීමට නියම කිරීම බලාතිත්‍රමණයකි. රජය විසින් මුද්දර ගාස්තු පනවා ඇත්නම් එම නීතිය සඳහන් කළ යුතුය.

බලපත්‍ර ගාස්තු නියම කිරීමේ දී ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තියේ අතුරු විධානය අනුව වාර්ෂික වටිනාකම රු. 750.00 ක් නොඉක්මවන අවස්ථාවක බලපත්‍ර ගාස්තුව රු. 500.00 ක් ද, රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක රු. 750.00 ක් ද රු. 1500.00 ඉක්මවන අවස්ථාවක රු. 1000.00 ක් ද බලපත්‍ර ගාස්තු ලෙස අයකළ හැකිවේ.

එහෙත් ලැයිස්තුවේ ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750.00 දක්වා වන අවස්ථාවක බලපත්‍ර ගාස්තුව රු. 1000.00 බැගින් පනවා ඇති අවස්ථා හතක් ද රු. 600.00 බැගින් වන අවස්ථා 39 ක් ද ඇතුලත් වී තිබේ.

මෙම අවිධිමත් හා නීතියට පටහැනි පැනවීම් නීතිය ඉක්මවා ක්‍රියා කිරීම් වේ. තවද මෙම ලේඛනයේ (18) ඉංග්‍රීසි බෙහෙත් අලෙවිය.(19) ඩිස්පැන්සරියක් පැවැත්වීම (26) සංචාරක වෙළඳාම (88) සිංහල ආයුර්වේද බෙහෙත් ශාලාවක් පැවැත්වීම (113) රසායනාගාරයක් පවත්වාගෙන යාම. (119) වැලි ගොඩ දැමීම (129) හෝමියෝපති වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වා ගෙනයාම (130) නක්ෂත්‍ර කටයුතු කිරීම (143) මනාලියන් හැඩගැන්වීම. (144) තරඟ ඔට්ටු ඇල්ලීම් ස්ථාන ආදිය සඳහා බලපත්‍ර ගාස්තු නියම කිරීම විධිමත් නොවේ. ඒ අතුරින් ඇතැම් ව්‍යාපාර වෘත්තීන් වේ. සෙසු කාර්යයන් වෙනත් නීති මගින් පාලනය වන බලපත්‍ර වලට යටත් ඒවා වේ.

මෙම ලේඛනයෙනි පසුව අප්‍රසන්න වෙළඳ ව්‍යාපාර 24 ක් ද අන්තරායදායක ව්‍යාපාර 31 ක් ද දක්වා ඇත. එහෙත් ඒ සඳහා බලපත්‍ර ගාස්තු හෝ ස්ථානයේ වාර්ෂික වටිනාකම් දක්වා නැත. එබැවින් එය නීතියට පටහැනි වේ. ඉහත කරුණු අනුව මෙම බලපත්‍ර ගාස්තු පැනවීම දෝෂ සහගත හා නීතියට අනුකූල නොවන තීරණයක් බව පෙනේ. ඒ අනුව මෙම නිවේදනය ශූන්‍ය හා බලරහිත වූවක් වේ.

iv. ව්‍යාපාර බදු:

මෙම බද්ද පැනවීම ද ඉතා ව්‍යාකූල ලෙස සෙසු බදු සමග සිදුකර ඇත. මේ සඳහා ඇති ලේඛනයේ කාර්යයන් 45 ක් දක්වා ඇත. ඒ අතර (11) සැලසුම් කරුවන්, (12) පෞද්ගලික මිනින්දෝරුවන්, (13) ප්‍රසිද්ධ නොතාරිස්වරුන් (18) මත්පැන් අලෙවිසැල් (24) රා තැබෑරුම් (25) දන්ත ශල්‍යාගාර (27) ළදරු පාසැල් (28) පුද්ගලික අධ්‍යාපන ආයතනය (31) සමාජ ශාලා (36) පරිගණක පුහුණු මධ්‍යස්ථාන (40 සම්ප්‍රේෂණ කුලුණු (44) ඉන්ධන පිරවුම්හල් ආදිය සඳහා ව්‍යාපාර බද්ද පනවා ඇත. මේ අතර වෘත්තීන් රැසක් මෙන්ම වෙනත් නීති මගින් නියමිත බලධාරීන් විසින් බලපත්‍ර ගාස්තු පනවා ඇති කාර්යයන් ද වේ. ඒ අනුව මෙම තීරණය මුළුමනින්ම දෝෂ සහගත සහ නීතියට පටහැනි වූවක් බව පෙනේ. මෙමගින් ව්‍යාපාර බදු අයකළ නොහැකි අතර මෙම නිවේදනය බල රහිත වූවකි.

v. කර්මාන්ත බදු:

මේ ගැන නිවේදනයේ සඳහන් වුවද කර්මාන්ත බදු පැන වූ ව්‍යාපාර කිසිවක් ගැසට් පත්‍රයේ පළකර ඇති බවක් නොපෙනේ. ඒ අනුව මෙම නිවේදනය බල රහිත වූවකි.

vi. විනෝද බදු:

විනෝද බදු පැනවීම් නිවේදනය අනුව එම බද්ද පනවා ඇත්තේ ද කළමනාකරණ කමිටුවය. යථෝක්ත තීරණය සභාව විසින් ගනු ලැබ අමාත්‍යවරයාගේ අනුමැතියට ඉදිරිපත් කර නැත. ඒ අනුව මෙම තීරණය ශූන්‍ය හා බලරහිත වේ.

vii. වාහන හා සත්ව බදු:

මෙම බද්ද පනවා ඇත්තේ ප්‍රාදේශීය සභාව හෝ ලේකම්වරිය විසින් නොව කළමනාකරණ කමිටුවකිනි. එහි ප්‍රාදේශීය සභා පනතේ හතරවන උපලේඛණයේ සඳහන් බදු ලේඛණ ගතව ඇත. උපලේඛණය අවසානයේ ''හැම බද්දක් වෙනුවෙන්ම රුපියල් දහසයක (16.00) සේවා ගාස්තුවක් ගෙවිය යුතුය'' යනුවෙන් සඳහන් කර තිබේ. මෙය බලාතික්‍රමණයකි. රටේ බලපවත්වන නීතිය බරපතල ලෙස ප්‍රසිද්ධියේ උල්ලංඝනය කිරීමකි. ඒ අනුව මෙය බලරහිත වූවකි.

viii. සංවර්ධනය නොකළ ඉඩම් මත බදු:

පස්සර ප්‍රාදේශීය සභාව මෙම බද්ද පනවා නැත. මේ හැර පස්සර ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කමිටුව තමන් වෙත නොමැති බලයක් ආරෝපණය කර ගනිමින් නගරයේ ජීවත් වන ජනතාව මත ඉතා අසාධාරණ හා නීතියට පටහැනි ලෙස ගාස්තු රාශියක් නියම කර ඇත. මෙය ඌව පළාතේ හා රේඛීය අමාත්‍යාංශයේ පළාත් පාලන බලධාරීන්ගේ කඩිනම් අවධානයට යොමුවිය යුතු අවස්ථාවකි.

5.7.13 මොණරාගල ප්‍රාදේශීය සභාව:

2016 වසර සඳහා මොණරාගල ප්‍රාදේශීය සභාව ආදායම් පනවා ඇත්තේ 2015-12-18 දිනැති අංක 1946 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදන මගිනි.

i. වරිපනම්:

මෙහි වරිපනම් පැනවීම සිදුකර ඇත්තේ කළමනාකරණ කමිටු රැස්වීම මගිනි. බදු පැනවීමට සභාවට ලැබී ඇති බලය සභාව ක්‍රියාත්මක නොවන අවස්ථාවක ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාර ලේකම් වරයාට පැවරේ. මෙහි දී එබඳු ක්‍රියා මාර්ගයක් ගෙන නැති අතර මෙම ව්‍යවස්ථාපිත වරිපනම් පැනවීම සිදුකර ඇත්තේ ද

කළමනාකරණ කමිටුව විසිනි. ඒ අනුව මෙය බල රහිත තීරණයක් වේ. වරිපනම් බදු පැනවීමේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් පනවන නීතියක ප්‍රතිපාදන මත මිස කිසිම බද්දක්, ගාස්තුවක්, වරිපනමක් පැනවිය නොහැකි බව දක්වා ඇත. මෙහි දී ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික තක්සේරුව අනුගාමී වර්ෂය සඳහා අනුමත කර ගත යුතු වේ. එහෙත් මෙහි එබඳු කිසිදු විධිවිධානයක් ඇතුලත් නොවේ. එබැවින් අනුමත තක්සේරුවක් නොමැතිව බදු ප්‍රතිශත දැක්වුවද එහි ප්‍රතිඵලය ශුන්‍යවේ. එනයින්ම මෙම සාවද්‍ය පැනවීම ද ශුන්‍ය හා බලරහිත වන්නේය.

ii. අක්කර බදු:

2016 වර්ෂය සඳහා මොණරාගල ප්‍රාදේශීය සභාව අක්කර බද්ද පනවා නැත.

iii. බලපත්‍ර ගාස්තු:

මොණරාගල ප්‍රාදේශීය සභාව 2016 වසර සඳහා බලපත්‍ර ගාස්තු පනවා ඇත්තේ ද ඉතාමත් අවිධිමත් පරිදි නිසි බලධාරියා විසින් නොව කළමනාකරණ කමිටුවක් මගිනි. බලපත්‍ර ගාස්තු පනවා ඇති කාර්යයන් 46 ක් අදාල උපලේඛනයෙහි දැක්වේ. එකී සියළුම කාර්යයන් සඳහා අතුරු ව්‍යවස්ථා තිබිය යුතු වුවත් සම්මත අතුරු ව්‍යවස්ථාවන්හි ආවරණය ලබාගත හැක්කේ මෙයින් ඉහත සීමිත වෙළඳාම් ගණනකට පමණි. මේ අතර ගබඩාකිරීම්, වෙනත් නීති යටතේ බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත ගණනාවක් ඇත.

උදා:- කළුගල් කැඩීම හා පිපිරවීම, ගෝ ඝාතක මඩු, මස්කඩ ආදිය ද වෘත්තීන් වලට අයත් වන ආයුර්වේද, ඉංග්‍රීසි බෙහෙත් ශාලා, දන්තශල්‍යාගාර ආදිය ද දක්වා ඇත. එබැවින් මෙම බලපත්‍ර ගාස්තු පැනවීම දෝෂ සහගත හා නීතියට පටහැනි කාර්යයක් බව පෙනීයයි.

iv. ව්‍යාපාර බදු:

ව්‍යාපාර බද්ද පැනවීම සිදුකර ඇත්තේ ද ඊට කිසිදු බලයක් නැති කළමනාකරණ කමිටුවක් විසිනි. ඊට අදාල ව්‍යාපාර ලේඛනයෙහි වෘත්තීන් වූ (4) පෞද්ගලික පන්ති පැවැත්වීම (5) ගෘහ නිර්මාණ ශිල්පීන්, ඇතුලත් කර තිබීම සාවද්‍ය වේ. (17) මත්පැන් අලෙවිය සඳහා බලපත්‍ර ලබාදීම සුරාබදු අශ්‍රාපනත යටතේ සුරාබදු අධිකාරීන් විසින් කළ යුතුවේ. (19) සමාජ ශාලා සඳහා බලපත්‍ර ලබාදීම 1975 අංක 17 පනතේ විධිවිධාන මත අමාත්‍යවරයා විසින් නියම කර ඇති බලපත්‍ර ගාස්තු අයකළ යුතුය. (22) ප්‍රදේශයේ සම්ප්‍රේෂණ කුළුණු .. යටිතල පහසුකම්

වන අතර ව්‍යාපාරයක් නොවේ. (23) වැලි ප්‍රවාහන බලපත්‍ර ලබාදීම ප්‍රාදේශීය ලේකම් ගේ වගකීමකි. මෙහි අවසානයේ දක්වා ඇති (24) මෙහි වර්ග නොකරන ලද වෙනත් ව්‍යාපාරික ස්ථාන යන්න අතිශය අවිධිවත් අවිනිශ්චිත බදු පැනවීමකි. ප්‍රාදේශීය සභාවකට එබඳු බදු පැනවීමට බලයක් පැවරී නැත.

v. කර්මාන්ත බද්ද:

මෙම බද්ද පනවා ඇත්තේ ද යටකී කළමනාකරණ කමිටුව විසිනි. එහි නීතිමය බලයක් නොමැති හෙයින් මෙම බද්ද බලරහිත වූවකි.

මෙහි දක්වා ඇති උප ලේඛණයෙහි කර්මාන්ත 90 ක් සඳහා බදු පනවා ඇත. මේ අතුරින් කාර්යයන් 17 ක්, වෙළඳාම සඳහා යම්යම් වෙළඳ ද්‍රව්‍ය තොගයක් තමා වෙත තබාගැනීම්ය. මෙය ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් නොවේ. (14) සංචාරක වෙළඳුන්ට කර්මාන්ත බද්දක් පැනවීම සඳහා ඔවුන්ට වාර්ෂික වටිනාකමක් නියම කරන්නේ කෙසේ ද? (37) ගෑස් නිපදවීම හා වෙළඳාම (70) ඉන්ධන ගබඩාකර විකිණීම බනිජ තෙල් ආඥාපතන යටතේ අමාත්‍යවරයා විසින් බලපත්‍ර ගාස්තු පනවා ඇති වෙළඳාම් වේ. ඒ සඳහා බදු පැනවිය නොහැකිය. (71) කෘෂිකාර්මික, ගෘහ භාණ්ඩ ප්‍රදර්ශනය කිරීම කර්මාන්තයක් ද ? (72) නොතාරිස් කාර්යාලය වෘත්තියකි. ඒ සඳහා කර්මාන්ත බදු හෝ වෙනත් බද්දක් පැනවිය නොහැකිය. (81) වැලිගොඩ දැමීම (89) කළුගල් කැඩීම සඳහා ප්‍රාදේශීය ලේකම් වරයාගේ බලපත්‍ර හා පාරිසරික බලපත්‍ර යටතට ගැනෙන කර්මාන්ත වේ. (90) මෙයින් ආවරණය නොවන වෙනත් කර්මාන්ත සඳහා බදු පැනවීමක් අපේක්ෂා කර ඇත. මෙය අතිශය වැරදි සහගත අවිනිශ්චිත පැනවීමකි. එබඳු පැනවීම් සඳහා ප්‍රාදේශීය සභා පනතෙහි බලය පවරා නැත.

vi. විනෝද බදු පැනවීමක් මෙම සභාව සිදුකර නැත.

vii. වාහන හා සත්ව බද්ද:

මෙම බද්ද මොණරාගල ප්‍රාදේශීය සභාව විසින් පනවනු ලැබ නොමැති බව පෙනේ.

viii. සංවර්ධනය නොකළ ඉඩම් මත බදු

මෙම බද්ද ප්‍රාදේශීය සභාව විසින් පනවනු ලැබ නැති බව පෙනේ.

එසේ වුවත් ප්‍රාදේශීය සභාව විසින් මහජනතාව වෙත සැපයීමට බැඳී සිටින සේවාවන් රැසක් සඳහා ඉතා ඉහළ ගාස්තු පනවා ප්‍රසිද්ධ කර ඇත. මෙම ගාස්තු ඇතැම් අවස්ථාවන්හි

ඉතාමත් අසාධාරණ ඒවා බව පෙනේ. මේ ගැන ඌව පළාතේ පළාත් පාලන බලධාරීන්ගේ ක්ෂණික අවධානය යොමුවිය යුතුය.

5.7.14 තලාව ප්‍රාදේශීය සභාව:

2016 වර්ෂය සඳහා තලාව ප්‍රාදේශීය සභාව ආදායම් පනවා ඇත්තේ 2015-11-27 දිනැති අංක 1943 දරණ ගැසට් පත්‍රයේ ලේකම්වරිය විසින් පනවා ඇති නිවේදන මගිනි.

i. වරිපනම්:

ලේකම්වරිය විසින් ගැසට් පත්‍රයේ පළකර ඇති වරිපනම් පැනවීමේ තීරණය බොහෝ දුරට අපැහැදිළි එකක් බව පෙනේ. එම බදු පැනවීම සිදු කරනුයේ ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය අනුව බව සඳහන් කර ඇතත් පනතේ එබඳු වගන්තියක් නැත. සභාව ක්‍රියාත්මක නොවන විට එහි බදු පැනවීමේ බලය ලේකම් වෙත පැවරෙන වගන්තිය වන්නේ '' ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තියයි''

තවද මෙම තීරණයෙහි දෙවන ඡේදයෙහි ''2015 වර්ෂයේ දේපල වල වාර්ෂික තක්සේරුව සත්‍යෙක්ෂණය වර්ෂය සඳහා තක්සේරුව/සත්‍යෙක්ෂණය ලෙස සම්මත කළ යුතු බව...'' දැක්වේ. මෙය ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) උප වගන්තියට අනුකූලව කරන ලද පැනවීමක් නොවේ. එහි අර්ථය නිසි පරිදි සඳහන් නොවේ. එහෙයින් එකී හේතුන් මත මෙම වරිපනම් පැනවීම දෝෂ සහගත බව පෙනේ.

ii. අක්කර බද්ද:

මෙම ප්‍රදේශය කාලීන ගොවිතැන් සහ විශාල කෘෂි ඉඩම් සහිත ප්‍රදේශයක් වුවත් 2016 වර්ෂය සඳහා මෙම බද්ද පනවා නොමැති බව අනාවරණය විය.

iii. බලපත්‍ර ගාස්තු:

2016 වර්ෂය සඳහා තලාව ප්‍රාදේශීය සභාව බලපත්‍ර ගාස්තු පැනවීමේ නිවේදනය ඉහත සඳහන් ගැසට් පත්‍රයේ ම පළකර ඇත. මෙම නිවේදනයේ ද බදු පැනවීමේ බලදායි වගන්තිය සාවද්‍ය ලෙස සඳහන් කර ඇත. එය 9.3 නොව ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය යනුවෙන් විය යුතුය. මෙම තීරණය බොහෝ දුරට නිවැරදි අතර එහි අතුරු

ව්‍යවස්ථා යටතේම බලපත්‍ර ගාස්තු පනවා තිබේ. බහුතරයක් ප්‍රාදේශීය සභා 149 වන වගන්තියේ ප්‍රතිපාදන වලට අනුකූලව බලපත්‍ර ගාස්තු පනවා නැත. එවැනි පසුබිමක තලාව ප්‍රාදේශීය සභාව එම වගන්තියේ විධිවිධාන වලට අනුකූලව බලපත්‍ර ගාස්තු පනවා තිබීම විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණකි.

iv. ව්‍යාපාර බදු:

මෙම බදු පැනවීමේ තීරණයේ ද බදු පැනවීමේ බලදායි වගන්තිය සාවද්‍ය ලෙස සඳහන් කර ඇත. තලාව ප්‍රාදේශීය සභාව ව්‍යාපාර 99 ක් සඳහා ව්‍යාපාර බදු පනවා ඇත. ඒ අතුරින් (7) ඉන්ධන පිරවුම්හලක් (39) පෞද්ගලික පශු වෛද්‍ය ගිලන් හලක් පැවැත්වීම (18) සම්ප්‍රේෂණ කුලුණු මගින් දුරකථන සේවා පැවැත්වීම (61) ඛනිජ තෙල් ප්‍රවාහනය කිරීම ආදිය අතර වෘත්තීන්, වෙනත් නීති මගින් බලපත්‍ර ලබාගත යුතු කාර්යයන් හා යටිතල පහසුකම් සේවා ආදිය ද ව්‍යාපාර ලෙස ඇතුලත් කර තිබීම නිවැරදි නොවේ.

v. කර්මාන්ත බද්ද:

තලාව ප්‍රාදේශීය සභාව විසින් කර්මාන්ත බද්ද ප්‍රදේශයේ පවත්නා කර්මාන්ත 30 ක් සඳහා පනවා ඇත. මෙම තීරණයෙහි ද බලදායි වගන්තිය දෝෂ සහගතව සටහන් කර ඇත.

තවද ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (3) වන උප වගන්තිය ප්‍රකාර මෙම බද්ද ප්‍රාදේශීය සභාව තීරණය කරනු ලබන හෝ අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලබන යම් දිනයක කර්මාන්තය පවත්වාගෙන යනු ලබන තැනැත්තා විසින් ගෙවිය යුතු දිනය සඳහන් නොවේ. මෙබඳු දෝෂ සහගත තත්වයන් නොවේ නම් බොහෝ දුරට මෙම නිවේදනය නිවැරදි වන්නට ඉඩ තිබුණි.

vi. විනෝද බද්ද:

තලාව ප්‍රාදේශීය සභාව මෙය පනවා නැත. ඇමතිවරයා විසින් පනවන ලද නිවේදනයක් මගින් විනෝද බදු ආවරණය වන්නේද යන්න අවිනිශ්චිතය. එතෙකුදු වුවත් මෙම සභාව ප්‍රසිද්ධ රැඟුම් සඳහා දිනකට රු. 1000/- ක බැගින් අයකිරීමට තීරණයකර ඇත. මෙය බද්දක් ද, බලපත්‍ර ගාස්තුවක් ද යන්න සඳහන් නොවේ. එහෙත් මෙබඳු මුදල් අය කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන නැත. එබැවින් එය බලාතික්‍රමණයට යටත් වේ.

vii. වාහන හා සත්ව බද්දඃ

2016 වර්ෂය සඳහා වාහන හා සත්ව බද්ද පනවා ඇත. එහි දී ද බලදායි වගන්තිය නිවැරදි ව සඳහන් කර නැත. එහි උපලේඛණය නිවැරදි බව පෙනේ. එහෙත් ප්‍රාදේශීය සභා පනතේ 148 වන වගන්තියේ (3) වන උප වගන්තිය ප්‍රකාර මෙම බද්ද ගෙවිය යුතු දිනය හෝ දින මෙම නිවේදනයේ සඳහන් කර නැත. එබැවින් මෙම නිවේදනය දෝෂ සහගත වේ.

viii. සංවර්ධනය නොකළ ඉඩම් බදු:

තලාව ප්‍රාදේශීය සභාව මෙම බද්ද පනවා තිබේ. එය ගොඩනැගිලි බිම් අනුපාතය ද සහිතව නියම කිරීම විශේෂත්වයකි. එහිද බලදායි වගන්තිය සාවද්‍ය ලෙස සඳහන් කර ඇත.

ඉහත සඳහන් බදු හා බලපත්‍ර ගාස්තු වලට අමතරව ලේකම්වරිය විසින් පහත සඳහන් නීතියට පටහැනි බදු හා ගාස්තු අයකිරීමට තීරණය කර ඇත. ඒ අනුව ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය ප්‍රකාර 2016 වසරට වෙනත් බදු පැනවීම් විෂයයන් 25 ක් සඳහා පනවා ඇත. මෙහි සඳහන් කරුණු ප්‍රාදේශීය සභාවක් විසින් සිය බදු ගෙවන්නන් වෙත සැපයීමට බැඳී සිටින මූලික අවශ්‍යතාවයන් වේ. එබඳු අවශ්‍යතා ලබා ගැනීම සඳහා වන පෝරම /ආකෘතිපත්‍ර ගාස්තු හා යම්යම් සහතික කිරීම සඳහා ඉතා අසාධාරණ හා නීතියට පටහැනි බදු හා ගාස්තු මේ යටතේ පනවා ඇත.

ඒ අතර වාහන හා සත්ව බද්ද යටතේ බදු ගෙවීමට අමතරව රු. 6/- ගාස්තුවක් ද, වාහන නතර කිරීමේ ගාස්තු වශයෙන් බෙහෙවින් අසාධාරණ මුදල්ද, අතුරු ව්‍යවස්ථාවන්ට පටහැනිව පනවා ඇත. පුස්තකාල සාමාජික ගාස්තු රු. 100/- ක් පනවා ඇත්තේ පුස්තකාල අතුරු ව්‍යවස්ථාවන්ට පටහැනිව බව පෙනේ. මෙම පැනවීම බලාතික්‍රමණයට නතුවන අතර ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තියෙන් මෙවැනි බදු පැනවීමට බලය පවරා නැත.

මීට අමතරව ඉඩම් විකිණීම මත බදු, සංචාරක හෝටල් හා ආපනශාලා සඳහා බලපත්‍ර ගාස්තු වලට අමතරව එම ආයතනවල වාර්ෂික ආදායමෙන් 1% ක ගාස්තුවක් ද පනවා ඇත. මේ සියල්ල දේශයේ පවතින නීතිය බරපතල ලෙස උල්ලංඝනය කිරීම් වන හෙයින් මේ පිළිබඳව පළාත් පාලන බලධාරීන් සිය දැඩි අවධානය මේ කෙරෙහි යොමු කළ යුතු වේ.

5.7.15 මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව

මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව 2016 වසර සඳහා ආදායම් පනවා ඇත්තේ 2015-12-18 දිනැති අංක 1946 දරණ ගැසට් පත්‍රයේ ලේකම් විසින් පළකරන ලද නිවේදන මගිනි. එහෙත් ලේකම් වරයා ගේ සෑම තීරණයකම පාහේ අවසානයේ මෙසේ බදු/ගාස්තු අය කිරීමට මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව තීරණය කරන්නිය යනුවෙන් සඳහන් වේ. ඒ සමගම එම තීරණයේ ම සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍ය ඉටු කරන එකී ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා මෙසේ තීරණය කරමි. යනුවෙන් ද දැක්වේ. ඒ සෑම අවස්ථාවකම ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල යනුවෙන් ද සඳහන් වේ. ප්‍රාදේශීය සභා පනතේ 9.3 යනුවෙන් වගන්තියක් නැත. සභාව ක්‍රියාත්මකව නොමැතිවිට ලේකම්ට බදු පැනවීමට බලය ලැබෙන්නේ ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තියෙනි. මේ අනුව අදාල පැනවීම් නිවේදන සියල්ල දෝෂ සහගත බව පෙනේ.

i. වරිපනම්:

මෙම සභාව දියුණු ගම් ප්‍රදේශය ලෙස පිළිගෙන වරිපනම් කාර්යය සඳහා ප්‍රකාශයට පත්කර නැත. එබැවින් වරිපනම් පැනවීමක් සිදු නොවේ. එහෙත් ප්‍රාදේශීය සභාවේ තුලාන (ගම් තුලාන) 54 න් 37 ඇතුලත් අනුරාධපුර නගරයට යාවන කොටස නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ සංවර්ධිත ප්‍රදේශයක් ලෙස ගැසට් කර ඇත.

ii. අක්කර බද්ද:

මෙම සභා බල ප්‍රදේශයේ වගාකළ ඉඩම් සඳහා පනතේ ප්‍රතිපාදන මත අක්කර බදු පනවා ඇතත් එය ගැසට් පත්‍රයේ පළකර නැති බවත් වරිපනම් සඳහා තක්සේරු කටයුතු අවසන් කළ විට ගැසට් පත්‍රයේ පළකරන බවත්, සභාවේ නිලධාරීන් පැවසූහ.

iii. බලපත්‍ර ගාස්තු:

මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව බලපත්‍ර ගාස්තු එම සභාව පිළිගත් අතුරු ව්‍යවස්ථාවන්ට ගැලපෙන ආකාරයට වෙළඳාම් 19 ක් සඳහා පනවා ඇත. මෙම තීරණයේ බලදායි වගන්තිය සාවද්‍ය ලෙස සටහන් කර තිබේ. එකී සියළුම ව්‍යාපාර සඳහා පනතේ සඳහන් උපරිම බලපත්‍ර ගාස්තුව ම පනවා තිබේ.

iv. **ව්‍යාපාර බදු:**

මෙම බද්ද පැනවීමේ දී ඊට අදාල බලදායි වගන්තිය බදු නිවේදනයේ සාවද්‍ය ලෙස සටහන් කර ඇත. මෙම ව්‍යාපාර බද්ද සඳහා අදාල වන ව්‍යාපාර ලැයිස්තුව තීරණයට / නිවේදනයට ඇතුලත් කර නැත. ඒ හේතුකොට ගෙන මීට නතුවන ව්‍යාපාරිකයින්ට කුමන ව්‍යාපාර මීට ඇතුලත් වන්නේද යන්න දැනගැනීමට ඇති අයිතිය නිශේධනය වී ඇත.

v. **කර්මාන්ත බද්ද:**

මෙම බද්ද පැනවීමේ නිවේදනයේ සඳහන් අදාල බලදායි වගන්තිය සාවද්‍ය වේ. කර්මාන්ත බද්දට යටත්වන කර්මාන්ත 77 ක් ඊට අයත් ලැයිස්තුවේ දැක්වේ. මෙම ලැයිස්තුවේ (03) පශු වෛද්‍ය හලක් පවත්වාගෙන යාම (77) පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම ආදිය වෘත්තීන්ය. මේ සඳහා කර්මාන්ත බදු අය කළ නොහැකිය. ඒ හැර මෙහි සඳහන් සියළුම කර්මාන්ත සඳහා පනතේ දැක්වෙන බද්දේ උපරිමය පනවා තිබේ. එය පිරිවැටුම අඩු කර්මාන්ත සඳහා පනතේ සඳහන් විධිවිධාන උල්ලංඝනය වීමකි. උදා:- විෂයාංක 04 යටතේ ඇති බුලත්, පුවක් අළෙවිය වැනි පිරිවැටුම ඉතාම අඩු වෙළඳාම් සම්බන්ධයෙන් පිලිවෙලින් රු. 500/= රු.750/= හා රු. 1000/= බැගින් වන බද්දක් නියම කර තිබේ. මධ්‍යම නුවරගම් පලාත සංවර්ධනය නොවූ ප්‍රදේශයක් බැවින් උපරිම බද්ද පැනවීම ඇතැම් කුඩා ව්‍යාපාරිකයන්ට බලවත් අසාධාරණයක් වනු ඇත. ඉහත කරුණු අනුව මෙය අවිධිමත් පැනවීමකි.

vi. **විනෝද බද්ද:**

විනෝද බද්ද සෘජුව පනවා නැතත් මෙම සභාව විසින් උක්ත ගැසට් නිවේදනයේ ම 2016 වර්ෂයට අදාලව ප්‍රසිද්ධ විනෝද ප්‍රසංග රඟ දැක්වීම පිළිබඳ ගාස්තු පැනවීමක් කර ඇත. මෙය පනවා ඇත්තේ 1988-08-03 දිනැති අංක 520/2 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද අතුරු ව්‍යවස්ථාවෙන් ලැබී ඇති බලය මතයැයි දැක්වේ. ප්‍රසිද්ධ රඟදැක්වීම් ආඥා පනතේ විධිවිධාන අනුව ආරක්ෂක විෂයභාර අමාත්‍යවරයා විසින් මෙය පනවනු ලැබිය යුතුවේ. එහෙත් සභාවේ ලේකම්වරයා විසින් මෙය පනවා ඇති බව පෙනේ.

මෙම නිවේදනයෙහි ම 1975 අංක 77 දරණ සමාජ ශාලා වලට බලපත්‍ර දීමේ පනත යටතේ බව සඳහන් කර සමාජ ශාලා ලියාපදිංචිය සඳහා ඉල්ලුම්පත්‍ර ගාස්තුව ලෙස රු. 300/= ක් ද වාර්ෂික බලපත්‍ර ගාස්තු ලෙස රු.3000/= ක් ද පනවා ඇත. මෙය මුළුමනින්ම නීතියට පටහැනි

ක්‍රියා මාර්ගයකි. මෙම අංකය දරණ සමාජශාලා පනතක් ද ලංකාවේ නීති සාහිත්‍යයේ නොමැත.

vii. වාහන හා සත්ව බද්දඃ

මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව විසින් වාහන හා සත්ව බද්ද පැනවීමේදී ද එහි බලදායි වගන්තිය සාවද්‍ය ලෙස දක්වා තිබේ. මුලදී ලේකම් විසින් මෙය පැනවීමට තීරණය කර ඒ සමග ඇති යෝජනාවක මෙම බදු අය කිරීම සභාව යෝජනා කරන්නීය යනුවෙන් දක්වා ඇත. මෙම කරුණු පරස්පර විරෝධි මෙන්ම බදු අයකිරීමේදී ව්‍යාකූල තත්වයන් ඇති කිරීමට හේතුවේ. තවද මෙහි ඇති උපලේඛණයේ සඳහන් ඇතැම් බදු ප්‍රමාණ පනතේ දක්වා ඇති අනුප්‍රමාණ ඉක්මවා ගොස් ඇති බව පෙනේ. උදාඃ බයිසිකලයක් සඳහා වාර්ෂික බද්ද රු. 4/- විය යුතු වුව ද මෙම නිවේදනයේ එය රු. 5/- ලෙස දක්වා ඇත.

ඒ හැර ප්‍රාදේශීය සභා පනතේ 148 වන වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාර මෙම බද්ද ගෙවිය යුතු දින හෝ දිනයන් සභාව මගින් හෝ අතුරු ව්‍යවස්ථා ප්‍රතිපාදන මත තීරණය කොට නිවේදනය කළ යුතු වුවද මෙහි එබඳු තොරතුරු ඇතුලත් නොවේ.

viii. සංවර්ධනය නොකළ ඉඩම් බදුඃ

මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව වරිපනම් කාර්යය සඳහා වත් දියුණු ප්‍රදේශයක් ලෙස ගැසට් නොකරන ලද ප්‍රදේශයක් වුවත් සංවර්ධනය නොකළ ඉඩම් මත වූ බද්ද එහි වෙළඳ පළ වටිනාකමින් 1% ලෙස පනවා තිබේ. ප්‍රදේශයේ ඉඩම් වලින් 60% -75% අතර කැලෑ වනාන්තර හා නොදියුණු කෘෂි බිම් අතර වේ. ඒ සඳහා මෙබඳු බද්දක් පැනවීම කොතරම් සාධාරණ වන්නේද යන්න සොයා බැලීම වටී.

ඉහත බදු හා ගාස්තු හැරුණු විට මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව ඇතැම් විෂයයන් සඳහා බෙහෙවින් අසාධාරණ, නීතිමය බලයක් නොමැති බදු හා ගාස්තු පනවා ඇත. උදාඃ- ප්‍රසිද්ධ විනෝද ප්‍රසංග රඟ දැක්වීමේ ගාස්තු, විවිධ ගාස්තු පැනවීම, ගොඩනැගිලි ඉදිකිරීමේ ගාස්තු, පරිසර හා සෞඛ්‍ය අංශයන්හි ගාස්තු පැනවීම ආදියයි. මේ අතුරින් ඇතැම් බදු නීතියට පටහැනිව පනවා තිබේ.

විවිධ ගාස්තු පැනවීම යටතේ නල ලිං වාර්ෂික ලියාපදිංචිය සඳහා රු. 300/- ක් ද විටි රේඛා නොපවරා ගැනීම් සහතික සඳහා පෙරසැරි ගාස්තු රු. 600/- ක්ද අදාල විටි රේඛා සහතික සඳහා රු. 400/- ක් ද ගොඩනැගිලි සීමා දැක්වෙන සහතිකය රු. 1000/- ක් ද ගොඩනැගිලි ඉල්ලුම්පත් ගාස්තු රු. 600/- ක් ද අනුකූලතා සහතිකය නිකුත් කිරීමට රු. 500/= සිට රු. 1000/- දක්වා ගාස්තුවක් ද, මාර්ග දෙපස ඇති අනවසර වෙළඳ කුටි සඳහා රු. 300/- මාසික/වාර්ෂික ගාස්තුවක් අය කෙරේ.

එසේම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ගාස්තු නියම කර ඇත. මේ සඳහා ප්‍රාදේශීය සභාවට බලයක් පැවරී නැත. මෙවැනි ජන ජීවිතයට ඉතා සමීප සේවා රැසක් ලබාදීම සඳහා අයදුම්පත්‍ර සඳහා ද ගාස්තු නියම කර ඇත. එහි නල ලිං ලියාපදිංචි කිරීම (3) සඳහා ද වශයෙන් ඉතා ඉහල ගාස්තු නියම කර තිබේ. මෙය මෙබඳු නොදියුණු ප්‍රදේශයක පළාත් පාලන ආයතනයක් නොකළ යුතුව තිබූ දෙයකි.

5.7.16 තමන්කඩුව ප්‍රාදේශීය සභාව:

මෙම ප්‍රාදේශිය සභාවේ ලේකම් විසින් 2015-12-04 දිනැති අංක 1944 දරණ ගැසට් පත්‍රයෙහි නිවේදනයක් පළකරමින් 2016 වර්ෂයට බදු බලපත්‍ර ගාස්තු, සියළු ගාස්තු හා වරිපනම් අය කිරීම් ඇතුළු සියළු නිවේදන 2015 වර්ෂයට එම සභාව අය කළ බදු හා සෙසු ගාස්තු ගැසට් පත්‍රයේ පළකළ ආකාරයටම වන හෙයින් මේ වර්ෂය සඳහා නැවත ගැසට් නොකරන බවට අදහස් කෙරෙන බව සඳහන් කර ඇත.

මෙය අතිශයින් වැරදි සහගත හා රටේ පවතින නීතියට එකඟ නොවූ ක්‍රියාමාර්ගයක් වුවද එම නිවේදනයෙහි ඇති කලින් වර්ෂයේ ගැසට් නිවේදනය ද පරීක්ෂාවට ලක් කිරීමට ක්‍රියා කරන ලදී. එහි දී අනාවරණය වූයේ එම පැනවීමේ තීරණ සියල්ලම පාහේ දෝෂ සහගත හා සාවද්‍ය බවයි. මේ අනුව මෙම සභාව ක්‍රියාත්මකව පැවති කාලයක යම් සභිකයින් ගේ නමින් යෝජනා සම්මත කළ හා සභාපතිවරයෙකු නමින් පළකළ නිවේදන සභාවේ සභිකයින් හා සභාපතිවරයා නොමැති විටක ලේකම් විසින් එම නිවේදන වර්තමානයට වලංගු බව සඳහන් කරමින් නිවේදනය කරන්නේ කෙසේ ද යන්න පළාතේ පලාත් පාලන බලධාරීන් සහ ජාතික මට්ටමේ බලධාරීන් විසින් සොයා බැලිය යුතුවේ. මෙබඳු තත්වයක් දිවයිනේ සෙසු පළාත් පාලන ආයතනවල දැකිය හැකි නොවීය.

5.7.17 තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව:

මෙම ප්‍රාදේශීය සභාව 2016 වර්ෂය සඳහා වරිපනම්, අක්කර බදු ඇතුළු ආදායම් ගණනාවක් පනවා නැත. වෙළඳ බලපත්‍ර, කර්මාන්ත බද්ද, ව්‍යාපාර බද්ද හා වාහන හා සත්ව බද්ද පනවා අය කරනු ලැබුවත් එකදු ආදායම් පැනවීමක් වත් ගැසට් පත්‍රයේ පළකර නැත. මෙම ප්‍රාදේශීය සභා ප්‍රදේශය දියුණු ගම් ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර නොමැති හෙයින් වරිපනම් අය නොකරන බව නිලධාරීන්ගේ මතය විය. සභාවට ඉතා සීමිත ආදායමක් බලපත්‍ර ගාස්තු, කර්මාන්ත බදු, ව්‍යාපාර බදු, විනෝද බදු, ප්‍රචාරක බලපත්‍ර ආදියෙන් ලැබේ.

5.7.18 සේරුවිල ප්‍රාදේශීය සභාව:

2016 වර්ෂය සඳහා සේරුවිල ප්‍රාදේශීය සභාව ආදායම් කිසිවක් විධිමත්ව පනවා නොමැති බවත් කිසිදු නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ නොකළ බවත් වාර්තා විය. මීට ඉහත 2014 වර්ෂය සඳහා අවසන් වරට සභාව විසින් 2013 වර්ෂයේ දී ආදායම් පනවා ගැසට් පත්‍රයේ පළකර තිබුනි. ඒ පිළිබඳව පරීක්ෂා කිරීමේ දී ද අනාවරණය වූයේ එම සියළු පැනවීම් ඉතා අවිධිමත් හා නීතියේ දක්වා ඇති සීමාවන් අභිබවා යම් යම් බදු හා ගාස්තු නියමකර ඇති බවයි. මෙය පළාත් සභාවේ බලධාරීන්ගේ ක්ෂණික අවධානයට යොමු විය යුතු කරුණකි.

5.7.19 නානාටාන් ප්‍රාදේශීය සභාව

මෙම ප්‍රාදේශීය සභාව මන්නාරම දිස්ත්‍රික්කයේ පිහිටි ඉතාම නොදියුණු ප්‍රදේශ රැසකින් සමන්විත පළාත් පාලන ආයතනයකි. මෙම ප්‍රාදේශීය සභාවේ කිසිම කොටසක් ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ ප්‍රකාර දියුණු ගම් ප්‍රදේශ ලෙස පිළිගෙන සම්මත කර නැත. සභාවේ නිළධාරීන් සඳහන් කළේ තමන් වරිපනම් හෝ අක්කර බදු අය නොකරන බවත් එහෙත් බලපත්‍ර ගාස්තු, කර්මාන්ත බද්ද, ව්‍යාපාර බද්ද, විනෝද බද්ද ආදිය සභාවේ තීරණයක් මත අයකරන බවයි.

මෙය දෝෂ සහගත හා නීතියට එකඟ නොවූ ක්‍රියා මාර්ගයකි. මෙවැනි අවස්ථාවන්හිදී පළාත් පාලන කොමසාරිස්, සහකාර කොමසාරිස්වරුන් ආයතන භාර නිළධාරීන්ට නිසි මගපෙන්වීමක් සිදුකර නිවැරදිව ආදායම් පනවා එම නිවේදන ගැසට් කිරීමට උපදෙස් දිය යුතුවේ.

5.7.20 කරච්චි ප්‍රාදේශීය සභාව

මෙය කිලිනොච්චි දිස්ත්‍රික්කයේ බෙහෙවින් අඩු පහසුකම් සහිතව දීර්ඝ කාලීනව සිවිල් ගැටුම්කාරී වාතාවරණයක පැවති ප්‍රදේශයකි. එය දියුණු ප්‍රදේශයක් ලෙස ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර පිළිගෙන සම්මත කර නැත. එබැවින් වරිපනම් හෝ අක්කර බදු අයකරනු නොලැබේ. එහෙත් බලපත්‍ර ගාස්තු, කර්මාන්ත බදු, ව්‍යාපාර බදු ආදිය සහා තීරණ මත අයකරනු ලැබේ. මෙම ප්‍රදේශ ක්‍රමයෙන් දියුණුවට පත්වෙමින් පවතින හෙයින් ඒවායේ කාර්ය මණ්ඩල වෙත නිසි මඟ පෙන්වීම් ලබාදී ආදායම් පනවා එම නිවේදන ගැසට් පත්‍රයේ පළකර නීත්‍යානුකූලව ආදායම් අයකර ගැනීමට යොමු කිරීම පළාත් පාලන බලධාරීන් සතු ඉතා වැදගත් කාර්යයකි.

5.7.21 මුහුදුබඩ පත්තු ප්‍රාදේශීය සභාව

මෙය මුලතිව් දිස්ත්‍රික්කයේ දීර්ඝ කාලයක් යුධමය තත්ත්වය පැවති ප්‍රදේශයක පිහිටි ඉතා අඩු පහසුකම් සහිත එහෙත් දියුණු වෙමින් පවතින කුඩා නගර හා ජනාවාස බහුල ප්‍රදේශයකි. ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර දියුණු ගම් ප්‍රදේශ ලෙස පිළිගෙන සම්මත කර නොමැති නිසා වරිපනම් පැනවීමේ ගැටළුවක් පවතී. එබැවින් එම ක්‍රියා මාර්ගගෙන දේපළ තක්සේරු කිරීමට උතුරු පළාතේ පළාත් පාලන බලධාරීන්ගේ හදිසි අවධානය යොමුවිය යුතුය.

මෙම අධ්‍යයනයේදී ප්‍රාදේශීය සභාවන්හි ආදායම් පැනවීම සම්බන්ධව කරුණු විමර්ශනයට හඳුනාගත් නියැදිගත ප්‍රාදේශීය සභා 21 හිම දත්ත මූලාශ්‍ර කිහිපයක් යටතේ ලබාගන්නා ලදී. ඒ අතර නිල ගැසට් නිවේදන, අවසාන ගිණුම් වාර්තාව, අයවැය ලේඛනය, සභාවේ ලේකම්, ආදායම් පරීක්ෂකවරු, ගිණුම් හා ආදායම් කටයුතු භාර නිලධාරීන්, සැලසුම් කටයුතු භාර සංවර්ධන නිලධාරීන් වෙතින් ලබාගත් වාර්තා, දත්ත හා තොරතුරු යථෝක්ත පළාත් පාලන ආයතනයන්හි ආදායම් පැනවීම් විශ්ලේෂණය කිරීමට මහෝපකාරී විය. මෙම දත්ත විශ්ලේෂණය කිරීමේදී පෙනීයන්නේ ප්‍රාදේශිය සභා අතුරින් අති බහුතරය වරිපනම්, බලපත්‍ර ගාස්තු හා බදු පැනවීමේදී දක්වා ඇත්තේ ඉතාම අඩු ප්‍රවීණතාවයක් බවයි. අධ්‍යයනය සඳහා තෝරාගත් ආදායම් වර්ග අටක් සම්බන්ධව සාර්ථක, නිවැරදි භාවිතාවයක් පෙන්නුම්කර ඇති ආයතන සංඛ්‍යාව පහත දැක්වේ.

වගුව 1: **අධ්‍යයනය සඳහා තෝරාගත් ආදායම් වර්ග**

අංකය	ආදායම් වර්ගය	නිවැරදිව සඳහා ඇති ප්‍රා.ස. ගණන	ප්‍රතිශතය
1	වරිපනම්	00	00
2	අක්කරබදු	00	00
3	බලපත්‍ර ගාස්තු	02	09.5
4	ව්‍යාපාර බදු	00	00
5	කර්මාන්ත බද්ද	01	04.7
6	විනෝද බදු	00	0.0
7	වාහන හා සත්ව බද්ද	00	00
8	සංවර්ධනය නොකළ ඉඩම් මත බදු	01	04.7

මෙයින් ගම්‍යවන මුඛ්‍ය කරුණ වන්නේ දිවයිනේ සෑම පළාතකම ප්‍රාදේශීය සභාවන්හි ආදායම් පැනවීමේ ක්‍රියාවලිය විශාල වශයෙන් බිඳ වැටීමකට ලක්වී ඇති බවයි.

06 පරිච්ඡේදය

6. පළාත් පාලන ආයතනයන්හි මූල්‍ය කළමනාකරණය පිළිබඳ වර්තමාන ස්වරූපය

පළාත් පාලන ආයතනයන්හි මූල්‍ය කළමනාකරණය පිළිබඳ වර්තමානයේ හටගෙන ඇති අර්බුදකාරී තත්ත්වයේ පරිමාව පසුගිය පරිච්ඡේදය පුරා දීර්ඝ වශයෙන් සිදුකරන ලද විමර්ශනයේදී මනාව පැහැදිළි විය. අද ඇතිවී තිබෙන නීතිය පසෙකලා ආදායම් පසුපස හඹායාමට මහා නගර සභා, නගර සභා පමණක් නොව දුෂ්කර පළාත්වල පිහිටි ග්‍රාමීය ප්‍රාදේශීය සභා ද පෙළඹී සිටී. ඒ අතරම ඔවුන්ගේ සාවද්‍ය ක්‍රියා කලාපය හමුවේ ඒවා සොයාබලා පිළියම් යෙදිය යුතු පළාත් පාලන දෙපාර්තමේන්තු, පළාත් පාලන විෂය භාර අමාත්‍යවරු පමණක් නොව විගණනය ද එමතු නොව රජය ද අක්‍රීයව නිහඬව සිටීම පෙන්නුම් කරන්නේ කුමක්ද? මෙය හුදකලා එක් අද්‍යතන ප්‍රවණතාවයක් ලෙස සලකා පසෙකලිය නොහැකිය. මෙම තත්වය ඓතිහාසිකව සිදුවූ ක්‍රමික අර්බුදයක වර්තමාන ස්වරූපය ලෙස විස්තර කිරීම සුදුසුය. ලංකාවේ පළාත් පාලන ආයතන මුහුණ දී සිටි මූල්‍ය දුෂ්කරතා විසඳාලීමට ප්‍රථම ප්‍රබල උත්සාහය රජය විසින් දැරූයේ 1924 දී එවක වැඩබලන යටත්විජිත භාණ්ඩාගාරික ජේ.ඒ.ස්මිත් මහතාගේ ප්‍රධානත්වයෙන් ද පසුව යටත්විජිත භාණ්ඩාගාරික ඩබ්.ඩබ්.වුඩ්ස් මහතාගේ ප්‍රධානත්වයෙන් ද පළාත් පාලන මූල්‍ය සම්බන්ධ කොමිසම පත්කිරීමෙනි.[3]

මෙම කොමිෂන් සභා වාර්තාව මගින් පළාත් පාලන ආයතන එවකට මුහුණපා සිටි මූල්‍ය ගැටළු, බදු අයකිරීම්, වරිපනම් පැනවීම් හා ගාස්තු පැනවීම් පිළිබඳ මනා විග්‍රහයක් සිදුකරමින් පවසා ඇත්තේ පළාත් පාලන ආයතන මුහුණ දී සිටින ගැටළුවට සාර්ථක විසඳුම් ක්‍රියාමාර්ගයක් දීමට නම් ප්‍රථමයෙන්ම යටත් විජිත රජය පළාත් පාලන ආයතන කෙරෙහි ඇති ආකල්ප වෙනස්කර ගතයුතු බවයි. ආසන්න වශයෙන් මෙම සංසිද්ධියෙන් ශතකයකට පසුව අද පවා මෙම ගැටළුව විසඳීමට නම් යටත් විජිත භාණ්ඩාගාරික 'වුඩ්ස්' මහතාගේ යෝජනාව යළි ක්‍රියාත්මක කිරීමට යටත් විජිත නොවූ අපගේම රජය පළාත් පාලන ආයතන විෂයයෙහි පවත්නා සිය ආකල්ප වෙනස් කරගත යුතුව ඇති බව සඳහන් කිරීම නිවැරදිය.

[3] Page 266, Report of the Commission of Local Govenmnet. Ceylon Sessional pp xxxiii -1955

මෙම කොමිසමේ ප්‍රමුඛ නිර්දේශය වී ඇත්තේ පළාත් පාලන ආයතන රජය එකතු කරන බදු මුදල් වියදම් කරන ඒජන්තවරයෙකු බවට පත් නොකර එම ආයතන වලට පවරා ඇති නිශ්චිත කාර්යභාරය ඉටු කිරීමට අවශ්‍ය මුදල් බදු මගින් නීතියට අනුව උපයා ගැනීමට බලතල ලබාදිය යුතු බවය. වෙනත් වචන වලින් සඳහන් කරන්නේනම් රජයේ ආධාර මත යැපෙන බලතල නැති හුදු වියදම් කරන්නෙකු නොව ක්‍රියාකාරී සංවර්ධන පාර්ශ්ව කරුවෙකු ලෙස පළාත් පාලන ආයතන පිළිගෙන ඔවුනට බලතල හා ශක්තිය ලබාදිය යුතු බවයි. මෙම කොමිසම පළාත් පාලන ආයතනවල පොදුසේවා කාර්යභාරය, ඒවාහි අර්ධ සේවා කාර්යභාරය, රජයේ පොදු සේවා කාර්යභාරය, අර්ධ සේවා කාර්යභාරය හඳුනාගෙන ඒවාට ප්‍රමාණවත් යෙදවුම් කළ යුතු බවට යෝජනා කර ඇත. එසේම ළදරු පළාත් පාලන ආයතනවලට පරිණත (Matuarity) භාවයට ලඟා වන තුරු මඟපෙන්වීම හා අතදීම කළයුතු බවද දක්වා ඇත. මෙහි සමහර නිර්දේශ මෙසේය. පළාත් පාලනයේ ප්‍රධාන වගකීමක් වූ පොලිසිය ජාතික වගකීමක් බවට පත්කිරීම, අධ්‍යාපනය අර්ධ රාජ්‍ය වගකීමක් බවට පත්කිරීම සහ ඒ සඳහා අයකරන වරිපනම් අයකිරීමේ යාන්ත්‍රනය සඳහා විකල්ප ක්‍රියා මාර්ගයන්හි සහාය ලබාදීම, සෞඛ්‍ය යටතේ රෝග නිවාරණය සම්පූර්ණයෙන්ම පළාත් පාලන වගකීමක් බවට පත්කර ප්‍රතිකාර සේවා මුළුමනින්ම රජයේ වගකීමක් බවට පත්කර එහි වැයබර රජය දැරීම ප්‍රධාන මාර්ග (Trunk Roads) හා ජලය සැපයීම රජයේ වැයභාරයක් බවට පත්කර ඒවාහි වියදම් පළාත් පාලන ආයතන වෙත සැපයීම, පළාත් පාලනය වෙත ලැබුණු සමහර ආදායම් රජය යටතට පත්කිරීම, උදා ඃ ටෝල් ආදායම, අබිං සඳහා බදු, විදේශ මත්පැන් බලපත්‍ර යන්ත්‍ර, පළාත් පාලන ආයතනවලට අවශ්‍ය යන්ත්‍රෝපකරණ සඳහා වූ රේගු ගාස්තු ගෙවීම පළාත් පාලන ආයතන වෙත ලබාදීම.

රජය සෑම රාජ්‍ය ගොඩනැගිල්ලක් සඳහාම වරිපනම් වෙනුවට වූ ගෙවීම් සෑම පළාත් පාලන ආයතනයකට ම කෙළින්ම සාමාන්‍ය බදු ගෙවන්නෙකු සේ ගෙවීම, නාවික හා යුධ හමුදා දේපළ වරිපනම් වලට යටත් කිරීම, කොළඹ මහා නගර සභාව පානීය ජලය රජයේ සෑම ගොඩනැගිල්ලකටම ගෘහ කටයුතු සඳහා නොමිලේ සැපයීම. පහත සඳහන් නව ආදායම් මාර්ග පළාත් පාලන ආයතන වෙත ලබාදීම.

1. විශාල ප්‍රචාරණ දැන්වීම් පුවරු (Advertisment – Hoardings)
2. විනෝද කාර්යයන් සම්බන්ධ බදු

3. රේස් ඔට්ටු බදු
4. ඉඩම් විකිණීම මත බදු
5. සැනිටරි මණ්ඩල හා ප්‍රාදේශීය මණ්ඩල වල වරිපනම් ප්‍රතිශතය සඳහා 5 හා 6 සීමා ඉවත් කිරීම.
6. මූල්‍ය දුෂ්කරතා ඇති පළාත් පාලන ආයතන වෙත ආධාර කෙළින්ම ප්‍රදානය කිරීමේ වගකීම. රාජ්‍ය (භාණ්ඩාගාරය) සතුවිය යුතු බව.

එතෙකුදු වුවත් යටත් විජිත රජය මෙම නිර්දේශ සියල්ල අනුමත කළේ නැත. එකී නිර්දේශ අතුරින් පොලිස් සේවාව රජයේ වගකීමක් ලෙස සැලකීම ඇතුළු ඉතා සුළු කරුණු කීපයක් පමණක් අනුමත කිරීමට ක්‍රියාකරන ලදී. මෙහිදී යටත් විජිත භාණ්ඩාගාරිකවරයා ඉතා නිවැරදිව සඳහන් කළ පරිදි රජය පළාත් පාලන ආයතන කෙරෙහි පවතින ආකල්ප වෙනස්කර නොගන්නේ නම් පළාත් පාලන ආයතනයන්හි මූල්‍ය කළමනාකරණය තුළ පවතින ගැටළු, අර්බුද බවට පත්වීම නොවැළැක්විය හැකිය. මෙම සීමිත සහන සමග වසර ගණනාවක් ගෙවීයාමත් සමග මූල්‍ය කළමනාකරණය විෂයෙහි සිදුකළ යුතු සංශෝධන සහිතව පළාත් පාලන ආයතන දීර්ඝ කාලයක් බලා සිටියහ.

මින් අනතුරුව පළාත් පාලන මූල්‍ය ප්‍රතිසංස්කරණ ඉල්ලා ඇතිවූ ව්‍යාපාරය පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ බලවත් කෝපය හේතුකොට ගෙන විශාල ශක්තියකින් යුතුව ඉල්ලා සිටින ලද යෝජනා ඉටුවී නොතිබීම මත අතිශයින් ආවේගකාරී එකක් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1946 මූල්‍ය සම්බන්ධතා යෝජනා අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලන්නට යෙදුණි. එහි ක්ෂණික ප්‍රතිඵල ලෙස පළාත් පාලන කාර්ය මණ්ඩල වෙත ගෙවිය යුතු වූ ජීවන වියදම් දීමනාව හා විශේෂ ජීවන වියදම් දීමනා 1944 සිට ගෙවීමට රජය භාරගත්තේය. තවද අතිරේක ආදායම් මාර්ග වශයෙන් මහා නගර සභා, නගර සභා සහ සුළුනගර සභා සඳහා ;

1. උකස්කරුවන් හා මුදල් ණයට දෙන්නන් සඳහා විශේෂ බද්දක් පැනවීම.
2. දිවයිනේ සියළු පළාත් පාලන ආයතන සඳහා වෙළඳ බද්ද වෘත්තිකයන් සඳහා බදු පැනවීම
3. වාර්ෂික තොග දීමනාවක් (Block Grants) ගෙවීමට තීරණය කිරීම

4. දිවයින පුරා සියළු පළාත් පාලන ආයතන සඳහා පානීය ජල යෝජනා ක්‍රමයන්හි ඉදිකිරීමේ ප්‍රාග්ධන වියදම් රජය භාරගැනීම, බෙදාහැරීම පළාත් පාලන ආයතන භාර ගැනීම.
5. නාගරික හා ග්‍රාමීය නිවාස ඉදිකිරීම් යෝජනා ක්‍රම රජය මගින් සිදුකිරීම.
6. ගම්සභා සඳහා වූ එවක පැවති ප්‍රාග්ධන බද්ද (Capitation Tax) 1947 සිට අහෝසි කොට ඊට ගැලපෙන ආධාර මුදල් එම ආයතන වෙත ප්‍රදානය කිරීම.

1946 පළාත් පාලන මූල්‍ය ප්‍රතිසංස්කරණ අතර ඉතාම වැදගත් කරුණ නම් තොග ආධාර ක්‍රමය ආරම්භ කිරීමයි. එහෙත් සෙසු යෝජනා අතරවූ උකස්කරුවන්, ණයට දෙන්නන්, වෙළඳ හා වෘත්තීය බද්ද ඇති කිරීමට ක්‍රියා නොකරන ලදී.

කෙසේ වෙතත් 1948 දෙසැම්බර් හි දී අමාත්‍යවරයා විසින් පළාත් පාලන කොමසාරිස් වී.සී. ජයසූරිය මහතාගේ ප්‍රධානත්වයෙන් පළාත් පාලන මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ නිර්දේශ ලබාගැනීම සඳහාත් නව බදු ක්‍රම හා මූල්‍ය ආධාර ක්‍රම ඇති කිරීම සඳහාත් නව ආදායම් මාර්ග පළාත් පාලන ආයතන වෙත හඳුන්වා දීම සඳහාත් නව කමිටුවක් පත්කරන ලදී. එය මේ විෂය පිළිබඳව ඉතා පුලුල්ව සොයාබලා පළාත් පාලන මූල්‍යය පිළිබඳව එම ආයතන මුහුණදී ඇති ගැටළුව ඉතා හොඳින් අධ්‍යයනය කිරීමෙන් පසු මනාව අවබෝධ කොටගෙන 1949 වසරේදී සවිස්තරාත්මක කමිටු වාර්තාවක් අමාත්‍යවරයා වෙත භාර දෙන ලදී. මෙම වාර්තාවේ නිර්දේශ 1955 චොක්සි කොමිෂන් සභා වාර්තාවේ 270-278 පිටුවල ඉතා පැහැදිලිව දක්වා ඇත. එම නිර්දේශයන්හි අදටත් ඇති වැදගත්කම සලකා එම වාර්තාව මෙහි උප ලේඛන අංක 05 හි දක්වා ඇත.

එසේ වුවද 1949 දී රජය මෙම යෝජනා පුළුල්ව සලකා බලන ලද්දේ වුවත් ඒ සම්බන්ධව අවසන් තීරණයක් ගෙන නැත. මෙය 1924 දී යටත් විජිත භාණ්ඩාගාරික වරයා විසින් පවසන ලද සත්‍යය තවදුරටත් සනාථවීමක් සේ පෙනේ. කෙසේ වෙතත් චොක්සි කොමිෂන් සභාව 1953 වසර අගදී සොල්බරි ආණ්ඩුකාරවරයා විසින් පත්කරනන්ට යෙදුනේ ද ඒ වනවිටත් ලංකාවේ පළාත් පාලනය පිළිබඳව පැවති ගැටළුව උග්‍රව පැවති හෙයින් ඒවාට විසඳුම් ක්‍රියාමාර්ග ඉහළ මට්ටමින් ලබාගැනීම අරමුණු කොටගෙනය. එම කොමිසම පිහිටුවීමේ මූලික පරමාර්ථ හතර අතුරින් තුන්වැන්න වූයේ පළාත් පාලන ආයතනයන්හි කාර්යයන් ඉතා හොඳින් ඉටුකිරීම

සඳහා ඒ ආයතනවලට අවශ්‍ය වන ආදායම් සපයා දියහැකි ක්‍රමෝපායන් හා ඒ සඳහා ගතයුතු ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම ය.

එම කොමිෂන් සභාව මෙම කරුණ සම්බන්ධව ඉතා දීර්ඝ හා පරිපූර්ණ අධ්‍යයනයක් සිදුකරන ලදී. එමගින් පළාත් පාලන ආයතන පද්ධතිය තුළ සෑම ගණයකම පළාත් පාලන ආයතන වෙත ඉතා සුපරීක්ෂාකාරිව නව ආදායම් මාර්ග, එම ආයතන මූල්‍ය කළමණාකරනය සම්බන්ධ බල ගැන්වීමට අවශ්‍ය නෛතික වෙනස්කම් නිර්දේශ කිරීම ඇතුළු මෙරට පළාත් පාලනයේ දීර්ඝ කාලීන තිරසාර වර්ධනය අරමුණු කොටගත් නිර්දේශාවලියක් ඉදිරිපත් කර ඇත. එම සමස්ථ යෝජනාවලිය චොක්සි කොමිෂන් සභා වාර්තාවේ 5 වන කොටසෙහි පරිච්ඡේද XVIII සිට XXII (18 සිට 23 දක්වා) පරිච්ඡේද පහකින් (05) සවිස්තරව දක්වා ඇත. මෙම නිර්දේශ හා විශ්ලේෂණ ඇතුළත් වාර්තාව සෑම පළාත් පාලන බලධාරියෙකු විසින් ම අධ්‍යයනය කළ යුතුවේ. එය මෙම කොමිෂන් සභා වාර්තාවෙහි පිටු අංක 264 සිට 341 දක්වාම විහිදී ඇත. (මෙම අධ්‍යයනයේ අවකාශය තුළ මෙම දීර්ඝ වාර්තාව අන්තර්ගත කළ නොහැකිවීම හේතුවෙන් එය මීට එකතුකළ නොහැකි විය.) මෙම වාර්තාවේ අදාළ මූල්‍ය සම්පාදනය පිළිබඳව වූ පරිච්ඡේදය අවසානයේ චොක්සි කොමසාරිස්වරයා මෙසේ කියයි. "අප විසින් මෙහිදී රජය වෙත ඉදිරිපත් කරන ලද නිර්දේශ කිසියම් හෝ හේතුවක් නිසා රජය ක්‍රියාත්මක කිරීමට එකඟ නොවන්නේ නම් හා එම විශේෂිත ආදායම් මූලයන් පළාත් පාලන ආයතන වෙත ලබා නොදෙන්නේ නම් මෙහිදී නිර්දේශිත නිශ්චිත ආදායම් මූලයන්ගේ අගයට (Yleld) සමාන මුදලක් පොදු පරමාර්ථගත තොග ආධාර (Block of General Purpose Grants) ප්‍රමාණවත් පරිදි වැඩිකර සෑම පළාත් පාලන ආයතනයකටම ගෙවිය යුතුය", යනුවෙන් අවධාරණය කොට ඇත.

එසේම තවදුරටත් මෙම විෂය සම්බන්ධ වැදගත්කම අවධාරණය කරමින් ,"වෙනස්වීම් වලට භාජනය වෙමින් පවතින තත්වයන් හේතුකොටගෙන පළාත් පාලන ආයතනයන්හි මූල්‍ය සම්බන්ධතා පිළිබඳ ගැටළුවට විසඳුම් වශයෙන් ස්ථාවර මූලධර්ම මාලාවක් මේ අවස්ථාවේදී නියම කිරීම ඇත්තෙන්ම ප්‍රායෝගික නොවේ. එබැවින් මෙම සුවිශේෂ විෂය කාලීනව විමර්ශනයට ලක්කළ යුතු හෙයින් ස්ථාවර පළාත් පාලන මූල්‍ය කොමිෂන් සභාවක් හෝ එසේ නොමැතිනම් අදාළ අමාත්‍යංශ නිලධාරීන්ගෙන් සමන්විත වූ නිල කමිටුවක් පත්කොට මෙම

කරුණට අදාළව ක්‍රියා කිරීම පැවරිය යුතු බවටත් එය තවත් පස් වසරකට පසු පූර්ණ විමර්ශනයකට යොමුකළ යුතු බවත් අප නිර්දේශ කරමු" යනුවෙන් දක්වා ඇත.

මෙහිදී ද කිවහැක්කේ චොක්සි කොමිසම අදාළ පුළුල් නිර්දේශ රජය වෙත ඉදිරිපත් කිරීමේදී ද මුලින් යටත් විජිත භාණ්ඩාගාරික ඩබ්.ඩබ් වුඩ්ස් මහතා විසින් පවසන ලද කරුණ සර්ව කාලීන සත්‍යයක් බවට ඔවුන් තුළ ද හැඟීමක් පැවති බවයි. මෙම අද්විතීය නිර්දේශ පසුකාලීනව යම් ප්‍රමාණයකට ක්‍රියාවට නැංවුණි. එහෙත් මේ දක්වා ක්‍රියාත්මක නොවූ ඉතා ප්‍රගතිශීලී නිර්දේශ මෙහි ඇතුළත්ව පැවති බව ඉතා කණගාටුවෙන් වුවද සිහිපත් කළ යුතුව ඇත.

චොක්සි කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශ කෙරෙහි රජය දැක්වූ ආකල්පය හේතුකොට ගෙන පළාත් පාලන ආයතනයන්හි අඛණ්ඩ ඉල්ලීම් හමුවෙහි රජය පළාත් පාලන ආයතනයන්හි ආදායම් වැඩි කිරීමටත්, නව ආදායම් මූලයන් හඳුන්වා දීමටත් මෙතෙක් රජය අත තබා නැති ආදායම් මාර්ග කවරේද යන්න සොයාබලා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් නැවත 1961 දී කමිටුවක් පත්කරන ලදී. මෙම කමිටුව එවකට සිටි පළාත් පාලන කොමසාරිස් වී.සී. මහතන්තිල මහතාගේ ප්‍රධානත්වයෙන් යුක්තවිය. මෙම කමිටුවේ වාර්තාව 1963 දී අමතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී. නව ආදායම් මාර්ග ලෙස හා ආදායම් වර්ධනය සඳහා යෝජනාක්‍රම ලෙස මීට ඉහත ඉදිරිපත්වූ 1948 වී.සී. ජයසූරිය කමිටු වාර්තාව හා 1955 චොක්සි කොමිෂන් සභා වාර්තාවල යෝජනා සියල්ල මෙමගින්ද නිර්දේශ කරන ලදී. රජය දැනට අත නොතබන ලද ආදායම් මාර්ග සොයා බැලුවත් එබඳු ආදායම් මාර්ග නොමැති බවද මෙහි සඳහන් විය.

මෙම කමිටු නිර්දේශ පිළිබඳව ද රජය කිසිදු ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේ නැත. මෙම විෂය පිළිබඳ මීළඟට සිදුවූ වැදගත්ම සංසිද්ධිය වූයේ පළාත් පාලන ආයතන වෙතින් දිගින් දිගටම මූල්‍ය ගැටළු පිළිබඳව විසඳුම් යෝජනා ක්‍රියාත්මක කරන ලෙස වූ දැඩි ඉල්ලීම හේතු කොටගෙන 1969 වර්ෂයේදී නැවත හිටපු කීර්තිමත් පළාත් පාලන කොමසාරිස්වරයෙකු වූ වී.සී. ජයසූරිය මහතාගේ සභාපතිත්වයෙන් යුතු නිලධාරී කමිටුවක් නැවත පත් කිරීමයි. මෙහිදී ජයසූරිය කමිටුවේ කාර්යභාරය වූයේ පළාත් පාලන ආයතනයන්හි දැනට පවතින ආදායම් ප්‍රභවයන් එම ආයතනයන්හි කටයුතු පහසුවෙන් කරගෙන යාමට ප්‍රමාණවත්ද යන්න හා පළාත් පාලන ආයතන වලට වඩා හොඳ සේවා සම්පාදනයක් සහතික කිරීම සඳහා ඔවුන් වෙත

ලබාදිය යුතු නව ආදායම් මාර්ග කවරේද යන්න සොයා බලා නිර්දේශ ඉදිරිපත් කිරීමයි. මෙම කමිටු වාර්තාව 1970 පෙබරවාරි මාසයේදී අමාත්‍යවරයාට භාරදෙන ලදී. වාර්තාව භාරගත් සැනින්ම පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාව සිටි මෙම කමිටුව පත්කළ අමාත්‍යවරයා රජය වෙනස්වීමේ හේතුව මත අමාත්‍ය ධූරයෙන් ඉවත්විය. මෙම කමිටු වාර්තාවේ පළාත් පාලන මූල්‍ය කළමනාකරණය හා එහි ප්‍රමුඛ ගැටළුවක් වූ ආදායම් ප්‍රමාණවත් නොවීමේ ගැටලුව විසඳීමට ප්‍රමාණවත් වැදගත් නිර්දේශ ඇතුළත් විය. එහෙත් උද්ගතවූ තත්වය මත ඊට කුමක් සිදුවූයේද යන්න පැහැදිලි නැත.

මේ අතර පළාත් පාලන මූල්‍ය ක්‍රම පිළිබඳ විශේෂඥ ආර්ථික විද්‍යාඥවරයක වන බ්‍රිතාන්‍ය ජාතික ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ ආචාර්ය වරියක වන උර්සුලා කේ හික්ස් මැතිණිය ලංකාවට පැමිණ පළාත් පාලන ක්‍රමය ගැන, විශේෂයෙන් එහි මූල්‍ය කළමනාකරණය පිළිබඳ සොයාබලා සිය නිරීක්ෂණ ඉදිරිපත් කිරීම 1957-59 අතර කාලය තුළ සිදුවිය. මෙහිදී ඇය විසින් පළ කරන ලද ඉතා වැදගත් වාර්තා ගණනාවක් ඇත. මෙම වාර්තා මගින් ඇය ප්‍රකාශකර ඇත්තේ, "ලංකාවේ ඉතාම මනරම් පළාත් පාලන නීති සමූහයක් ඇතත් පළාත් පාලන ආයතන ආරම්භයේ සිට ප්‍රබල පීඩාවකට ලක්කළ ප්‍රමාණවත් තරම් සම්පත් එම ආයතන වෙත නොලැබීම නිසා ඒවායින් රටේ ආර්ථික සංවර්ධනය උදෙසා ලබාගත හැකිව තිබූ ප්‍රබල දායකත්වය අහිමිකරගෙන ඇති බවයි"[4] මෙම ප්‍රකාශයෙහි සත්‍යතාවය මීට පෙර මෙන්ම පසුව ද පත් කළ අධ්‍යයන කමිටු වාර්තාවන් ගෙන් හෙළිකළ තොරතුරු මගින් ද සනාථ වී ඇත. ලංකාවට පළාත් පාලනය හඳුන්වා දුන් බ්‍රිතාන්‍යයේ පළාත් පාලන ආයතන එරට ආර්ථික සංවර්ධනයට දක්වා ඇති දායකත්වය දෙස බලන කළ මෙරට පළාත් පාලන ආයතන මුහුණ දී සිටින අභාග්‍ය සම්පන්න තත්වය හමුවේ ඇය තවදුරටත් පවසා ඇත්තේ, "ලංකාවේ පලාත් පාලන ආයතනයන්හි වර්ධනය සීමා කිරීම උදෙසා බලපා ඇති මූලිකම සාධකය පැහැදිලිවම සාමාන්‍යයෙන් බලතල වල ඌණ භාවය පමණක් නොවේ. ප්‍රායෝගික භාවිතයේදී සෑම දිසාවකින්ම ඉතා පැහැදිලිව පෙනන පරිදි ස්වාධීන බදු ව්‍යුහයක්, ප්‍රදාන ක්‍රමයක් හෝ ණය සම්පාදන ක්‍රියාවලියක් සහිත ප්‍රමාණවත් වූ මූල්‍ය සම්පත් මෙම ක්ෂේත්‍රය වෙත නොලැබීමයි."[5] මෙම ආර්ථික විද්‍යාඥවරිය විසින් ඉදිරිපත් කළ විද්වත් උපදෙස් සැලසුම් මහා ලේකම්

[4] Page 484, D Vamadevan, Local Government Finance in Ceylon -1955 – Public Management-Edited by Neil Fernando SLIDA

[5] Page 184, D Vamadevan, Local Government Finance in Ceylon -1955 – Public Management-Edited by Neil Fernando SLIDA

කාර්යාංශය මගින් පළාත් පාලන පද්ධතිය වෙතත් රජයේ සෘජු අවධානයටත්, ලංකා විශ්ව විද්‍යාලයටත් යොමු වුවද ඒ සම්බන්ධයෙන් ගත් පසු විමසුම් ක්‍රියා මාර්ගයක් ගැන අසන්නට නොලැබීම මෙරට පළාත් පාලනයේ ප්‍රබල අවාසනාවකි.

මින් අනතුරුව පළාත් පාලන මූල්‍යය උදෙසා කිසියම් පැහැදිලි මෙහෙවරක් සිදුවූයේ 1979 අංක 42 දරණ මහා නගර සභා සහ නගර සභා (සංශෝධන) පනතයි. මෙම සංශෝධන පනත මගින් නව ආදායම් මාර්ග ගණනාවක් හඳුන්වා දෙනු ලැබීය. බලපත්‍ර ගාස්තු පුළුල් කිරීම, කර්මාන්ත බද්ද, ව්‍යාපාර බද්ද, වාහන හා සත්ව බද්ද, සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද, ඇතැම් ඉඩම් විකිණීම මත බද්ද, මුද්දර ගාස්තු ප්‍රතිපූර්ණය, උසාවි දඩ ප්‍රතිපූරණය සහ වරිපනම් ගෙවීම වෙනුවෙන් වට්ටම් දීම ක්‍රමවත් කිරීම හා වැඩි කිරීම ආදී පළාත් පාලන ආදායම් පුළුල් කිරීම උදෙසා නෛතික ප්‍රතිපාදන ඇති කිරීම මෙමගින් සිදුකිරීම විශේෂ සිද්ධියකි. 1946, 1948, 1953, 1962, 1970 යන කාල පරිච්ඡේදයන්හි විවිධ කොමිෂන් සභා සහ කමිටු මගින් යෝජනා කළ ඇතැම් ආදායම් ප්‍රභවයන් හඳුන්වාදීම මේ සංශෝධන මගින් යම් ප්‍රමාණයකට හෝ සිදුවිය.

පළාත් පාලන මූල්‍ය කළමනාකරණය විෂයෙහි ඇතිවූ මීලඟ වැදගත් අවස්ථාව නම් 1998 පෙබරවාරි මස 12 දින පත්කරනු ලැබූ පළාත් පාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවයි. එහි වාර්තාව 1999 සැප්තැම්බර් මස ජනාධිපතිතුමිය වෙත භාරදෙන ලදී. මෙමගින් පැවති පළාත් පාලන මූල්‍ය ක්‍රමය විමර්ශනයට ලක්කර මූල්‍ය ප්‍රතිසංස්කරණ සෙසු නිර්දේශ සමග ඉදිරිපත් කරනු ලැබීය. මෙමගින් ද සමහර නව ආදායම් මාර්ග ඇති කිරීම තිබෙන ආදායම් එක්රැස් කිරීම විධිමත් කිරීම, පළාත් පාලන ආයතනයන්හි ආදායම් කළමනාකරණය සඳහා ඇති ගැටළු හඳුනාගෙන ඊට පිළියම් යෙදීම මෙන්ම ආදායම් ප්‍රවර්ධනයට ඉවහල් වන පරිදි ප්‍රධාන පනත් තුනෙහි ප්‍රතිපාදන, බදු හා ගාස්තු, දඩ මුදල් ආදිය ඉහළ නැංවීමට අදාළ නිර්දේශ රාශියක් ඉදිරිපත් කරන ලදී. එම වාර්තාව ඉදිරිපත් කර මේ වනවිට වසර 18ක් පමණ ගත වුවත් පැහැදිළිව මෙම විෂය පිළිබඳ වර්ධනයක් ඇතිවූයේ යැයි කිව නොහැකිය. මෙහිදී නැවත සිහිපත් වන්නේ සියවසකට ආසන්න කාලයකට පෙර යටත් විජිත භාණ්ඩාගාරික ඩබ්.ඩබ්.වුඩිස් මහතා ලංකාවේ පළාත් පාලනය, රජයේ ඒ කෙරෙහි වූ ආකල්ප විනිවිද දකිමින් කළ ප්‍රකාශයයි. මෙම අධ්‍යයනයේදී අපගේ නිරීක්ෂණයට ලක්වූ

බොහෝ අඩු ආදායම් ලබන පළාත් පාලන ආයතනයන්හි සේවා සම්පාදනය ඉතාම මූලික මට්ටමක පවතිනු දැකිය හැකිවිය. ඔවුන් තමාට නීතියෙන් බලය පැවරී නැති ක්ෂේත්‍ර වෙත හඹාගොස් කෙසේ හෝ මුදල් අයකිරීම තුළ දැකිය හැකි ප්‍රධාන හේතු 02 ක් පැහැදිළි විය.

1. මෙම විෂය සම්බන්ධ නෛතික විධිවිධාන පිළිබඳ අවබෝධයක් නොවීම.
2. සේවා සම්පාදනය සඳහා ප්‍රමාණවත් මූල්‍ය සම්පත් නොමැතිවීම.

මෙම තත්වය හුදකලා නැඹුරුවක් හෝ ප්‍රවණතාවයක් නොව ක්‍රමික විකාශනයක වර්තමාන පැතිකඩ ලෙස අප විසින් මේ පරිච්ඡේදය ආරම්භයේ සඳහන් කළේත් මෙම ක්‍රමික වර්ධනය විශ්ලේෂණයට භාජනය කළේත් වගකිව යුතු බලධාරීන්ගේ පහසු අවබෝධය අපේක්ෂාවෙනි. මීළඟට අප මෙම තත්වය උද්ගවී ඇති ආකාරය කෙරෙහි පළාත් පාලන ආයතන ව්‍යුහයේ හා අධීක්ෂණ බලධාරීන්ගේ ක්‍රියාකාරිත්වය බලපා ඇති ආකාරය විමර්ශනයට භාජනය කිරීම වැදගත් වේ.

6.1 පළාත් පාලන දෙපාර්තමේන්තු වල මගපෙන්වීම හා අධීක්ෂණය පිළිබඳ යථාතත්වය-

මෙම පරීක්ෂණ අධ්‍යයනයේදී වර්තමාන පළාත් පාලන ආයතන පද්ධතිය නියෝජනය කිරීම සඳහා යොදාගත් නියැදිය (Sample Size) සමස්ථ පළාත් පාලන ආයතන පද්ධතියේ මනා පැතිකඩක් පෙන්නුම් කරන බව මෙම වාර්තාවෙහි 5 වන පරිච්ඡේදයෙහි අන්තර්ගත සොයා ගැනීම් (Findings) වලින් සනාථ වේ.

මුල් කාලීනව පළාත් පාලන ආයතන මුහුණදී සිටි මූල්‍ය දුෂ්කරතා විෂයෙහි එම ගැටළුවලට සවන්දී හැකි තරම් සහන සැලසීමටත් යම්යම් ආකාරයේ නීති සංශෝධන ගෙනවිත් පළාත් පාලන ආයතන බලගැන්වීමටත් 1931 ට ප්‍රථම පළාත් පාලන මණ්ඩලයත්, ඩොනමෝර් කොමිෂන් සභා නිර්දේශ ක්‍රියාත්මක වීමෙන් පසුව 1931 සිට පළාත් පාලන කොමසාරිස් ප්‍රමුඛ පළාත් පාලන දෙපාර්තමේන්තුවත් ඉතා පැහැදිළි නායකත්වයක් ලබාදී ඇති අන්දම 6 වන පරිච්ඡේදය ආරම්භයේදී ඉදිරිපත් වූ කරුණු මගින් සනාථ විය. මෙම ප්‍රවණතාවය 1980 පමණ දක්වා ම පැවතුණි. එපමණක් නොව කුඩා ග්‍රාමීය පළාත් පාලන ආයතන ද ඇතුළුව පළාත් පාලන ආයතන සියල්ල වෙත ආදායම් හා වියදම් කළමනාකරනය, නව ආදායම් මාර්ග ඇතිකිරීම, ආදායම් එක්රැස් කරගැනීම, නව නීති සංශෝධන හඳුන්වාදීම, ආදී කටයුතු වලදී

ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා (RACLG) එම පළාත් පාලන ආයතන වෙත ඉතා සමීප මිතුශීලි උපදේශක වරයෙකු, මාර්ගෝපදේශකයෙකු මෙන්ම දර්ශනය සපයන්නෙකු ද විය. එම නිලධාරීන් මධ්‍යම රජයේ පරිපාලන සේවාවේ සාමාජිකයින් වූ අතර ඔවුන් ලංකාවේ පළාත් පාලනය පිළිබඳ හසල දැනුමකින් යුතු නිළධාරීන් වූහ. පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය සමග සිටි විමර්ශන සහ තාක්ෂණ නිලධාරි මණ්ඩලය මෙම කාර්යයන්හි ප්‍රමාණික දැනීමක් හා මනා පළපුරුද්දක් සහිත නිළධාරීන් වූහ. එම නිළධාරීන් සතුව පැවති දැනුම හේතුකොට ගෙන මහා නගර සභා, නගර සභා, සුළු නගර සභා සහ ගම් සභාවන් හි ගිණුම් තැබීම, විගණනය, ආදායම් එක්රැස් කිරීම, ලේඛනගත කිරීම, ගබඩා පාලනය, වත්කම් කළමනාකරණය, බදු හා ආදායම් පැනවීම ආදී කටයුතු ඉතා ඉහළ ප්‍රමිතියකින් හා නිරවද්‍යතාවයකින් යුතුව පැවතුණි.

එකල පළාත් පාලන කොමසාරිස්වරයා දිවයිනේ සියලුම පළාත් පාලන ආයතන සිය ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන් ගේ මෙන්ම එම කාර්යාලයන්හි ක්ෂේත්‍ර, තාක්ෂණික හා පරිපාලන කාර්ය මණ්ඩල මගින් ඉතාම ප්‍රශස්ත කළමනාකරණයකට යොමු කරන ලදී. එම ආයතනවල ආදායම්, වියදම් පාලනය, විගණන විමසුම් සඳහා පිළිතුරු යැවීම, අයවැය සම්පාදනය, අතුරු ව්‍යවස්ථා පැනවීම, වාර්ෂිකව බදු හා ආදායම් පැනවීම ආදී සමස්ථ ක්‍රියාවලියම සමීප අධීක්ෂණයට භාජනය කළහ. මේ තත්වය අවබෝධ කොට ගැනීමට නම් එම පරපුරේ පළාත් පාලන ආයතන භාරව ක්‍රියාකළ නිළධාරීන්ගේ මෙන්ම පළාත් පාලන කොමසාරිස්වරුන්ගේ ද වාර්ෂික පාලන වාර්තා අධ්‍යයනය කළ යුතුවේ.

1. Administration Report of the Commissioner of local Government for 1950 – VC. Jayasuriya (CLG)
2. 1961 - 62 වර්ෂය සඳහා වූ පළාත් පාලන කොමසාරිස්වරයාගේ පාලන වාර්තාව - ඩබ්.ඩී.වී.මහතන්තිල මහත්මා (ප.පා.කො.)
3. 1966-67 වර්ෂය සඳහා වූ පළාත් පාලන කොමසාරිස්ගේ පාලන වාර්තාව - එන්.විජයවර්ධන (ප.පා.කො.)

මෙම වටිනා වාර්තා ලංකාවේ නූතන පළාත් පාලනය හදාරන්නන්හට ඉතා වටිනා මූලාශ්‍ර වශයෙන් පවත්වාගත යුතුවේ. මෙම මූලාශ්‍ර පළාත් පාලන කොමසාරිස්, සහකාර කොමසාරිස්

කාර්යාල වල තිබේද යන්න ප්‍රශ්න සහගතය. ඒවා අමාත්‍යංශවල හෝ නොමැති පසුබිමක පළාත් පාලන ආයතනයන්හි හෝ මහජන පුස්තකාලවල තිබේ නම් ඒ තුළින් නව පළාත් පාලන කළමනාකරණය දැනුවත් කිරීම සඳහා අප්‍රමාණ මෙහෙයක් ලබාගත හැකිවේ. වර්තමානයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවක හෝ කිසිම පළාත් පාලන ආයතනයක ප්‍රධානියා වාර්ෂික පාලන වාර්තාවක් සකස්කර පාර්ලිමේන්තුව / පළාත් සභාව හමුවේ තැබීමේ සිරිතක් නොපවතී. පළාත් පාලන ආයතන ප්‍රධානියා වාර්ෂික පාලන වාර්තා සකස් කිරීමට බැඳිසිටී. එහෙත් ඒ කිසිවක් සිදු නොවන අතර ඒ ගැන සෙවීමක් හෝ බැලීමක් ද, එබඳු අවශ්‍යතාවයක් පවතී ද යන්න ගැනවත් ජනතාව, විගණනය හෝ රජයවත් නොදැන සිටීම විමතියට කරුණකි.

ආදායම් පැනවීම සඳහා පළාත් පාලන ආයතන විසින් අනුගමනය කරනු ලබන ක්‍රියා පිළිවෙත කුමක්ද? ඊට පදනම්වී ඇත්තේ කුමන මූලධර්මයක් ද යන්න අතිශයින් අපැහැදිළිය. කොළඹ මහා නගර සභාව සිරිතක් වශයෙන් වරිපනම් පනවනු නොලබන බව බලධාරීන් විසින් පිළිගෙන ඇත. මෙම ආයතනය ලංකාවේ විශාලම පළාත් පාලන ආයතනය ලෙස සලකන්නේ එහි ආදායම, වියදම, ප්‍රදේශයේ ජනගහනය, එය සතු සම්පත් ප්‍රමාණය හා එහි කාර්ය මණ්ඩලය යන සාධකයන්හි පරිමාව හේතුකොට ගෙනය. එතෙකුදු වුවත්, එය පාලනය විය යුත්තේ මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරවය. එය සෑම මහා නගර සභාවකට ම පොදු මූලධර්මයකි. එසේ නම් ඊට සුවිශේෂ වූ වෙනත් පරිපාටිමය හෝ හරයාත්මකව වෙනස් නීතිමය පරිචයන් පැවතිය නොහැකිය. එහෙත් මෙහි 5 වන පරිච්ඡේදයේදී අත්දුටු පරිදි කොළඹ මහා නගර සභාව පමණක් නොව රත්නපුර මහා නගර සභාව, හපුතලේ නගර සභාව සහ ත්‍රිකුණාමලය නගර සභාව ද තමන්කඩුව හා සේරුවිල ප්‍රාදේශීය සභා ද විශේෂයෙන් වරිපනම් මෙන්ම ඇතැම් විට කිසිම බද්දක් පනවා ගැසට් පත්‍රයේ පළකර නැත. මෙය නීත්‍යානුකූල නොවුව ද යටකී සෑම පළාත් පාලන ආයතනයක්ම බදු ගෙවන්නන්ගෙන් සිරිත් පරිදි බදු අයකර ඇත. එසේ නොගෙවන පිරිස් වෙත බලපෑම් සිදුකර හිඟ මුදල් ද අයකර ඇත. මෙම තත්ත්වය පහත අංක 02 වගුවෙන් තවදුරටත් පැහැදිළි කෙරේ.

වගුව 2: ගැසට් පත්‍රයේ පළකර නැති අයකිරීම්

අංකය	ආයතනය	අස්තමේන්තුගත 2016 වරිපනම එකතුව රු.	පෙර වර්ෂයේ සමුච්චිත හිඟය රු.
01	කොළඹ මනස	3,662,780,000	ලබා ගැනීමට නැත
02	රත්නපුරය මනස	35,000,000	29,279,817.67
03	හපුතලේ නස	185,348,400	3,069,502.80
04	ත්‍රිකුණාමලය නස	35,000,000	106,031,019.18
05	තමන්කඩුව ප්‍රාස	ලබා ගැනීමට නැත	ලබා ගැනීමට නැත
06	සේරුවිල ප්‍රාස	ලබා ගැනීමට නැත	ලබා ගැනීමට නැත

මින් පැහැදිලි වන්නේ යටකී ආයතන නියමිත නෛතික පරිපාටියෙන් බැහැරව වරිපනම් වශයෙන් ලබාගැනීමට උත්සාහ දරා ඇති වරිපනම් ප්‍රමාණයේ පරිමාව හා එම සභාවන්හි පවතින හිඟ වරිපනම් ප්‍රමාණයයි. මෙම තත්වය බොහෝ පළාත් පාලන ආයතන විසින් පසුගිය වර්ෂ ගණනාවක් පුරා සිදුකර තිබුන ද ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් සොයා බැලීමක් හෝ විමර්ශනයක් අදාළ පළාත් පාලන දෙපාර්තමේන්තු මගින් සිදුකර තිබූ බවක් වාර්තාවී නැත. එසේම මෙම අධ්‍යයනයේදී අනාවරණය වූ කරුණු අනුව විගණාධිපතිවරයා විසින් හෝ මේ සම්බන්ධ විමසුම් සිදුකර නැත. වඩාත් පුදුම සහගත කරුණ නම් ඉහත කී පළාත් පාලන ආයතන බල ප්‍රදේශයන්හි බදුගෙවන්නන්, වෙළඳ ආයතන, කර්මාන්ත හා ව්‍යාපාරික ආයතන, අර්ධ රාජ්‍ය ආයතන, රාජ්‍ය ආයතන ආදිය ද මෙම අනීතික පැනවීම් මගින් නියමකර ඇති වරිපනම් ඇතුළු සෙසු බදු බලපත්‍ර ගාස්තු ආදිය ගෙවා තිබීමයි.

6.2 පළාත් පාලන ආයතන පද්ධතියෙහි වාර්ෂික ආදායම් පැනවීම විෂයෙහි පළාත් සභාවන්හි පළාත් පාලන කොමසාරිස් වරයාගේ අධීක්ෂණය පිළිබඳ වර්තමාන තත්වය :

මෙම අධ්‍යයනයේ 03 වන පරිච්ඡේදයේ 03.4 වන කොටසින් දක්වා ඇති සටහන් අංක 10 හි දැක්වෙන තොරතුරු කෙරෙහි අවධානය යොමු කරවමි. පසුගිය වසර 05 තුළ පළාත් පාලන ආයතනයන්හි පරිපාලනය අධීක්ෂණය කිරීමේ ව්‍යවස්ථාපිත බලය ක්‍රියාත්මක කිරීමේ නිරත පළාත් ප්‍රධාන ලේකම් හෝ අන් බලධාරියකු විසින් පළාත් පාලන ආයතනයන්හි ආදායම්

පැනවීම, එකතු කිරීම හා ප්‍රවර්ධනය අරභයා නිකුත්කර ඇති චක්‍රලේඛන උපදෙස් පිළිබඳව විමසීමක් කරන ලදුව. ඊට ලැබී ඇති ප්‍රතිචාර පූර්වෝක්ත සටහනෙහි දැක්වේ. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ දැනුම් දීම අනුව පළාත් සභා බලධාරීන් විසින් එවා තිබූ පූර්වෝක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර තිබූ චක්‍රලේඛන උපදෙස් සියල්ල විමර්ශනයට භාජනය කරන ලදි. මෙම ඉල්ලීමට එලදායී ප්‍රතිචාර දක්වා තිබුනේ මධ්‍යම, උතුරුමැද, ඌව, සබරගමුව හා බස්නාහිර යන පළාත්වල පළාත් පාලන කොමසාරිස්වරුන් පමණි. උතුරු, නැගෙනහිර, දකුණ හා වයඹ පළාත් විසින් මෙම විෂය පිළිබඳව පසුගිය වසර (05) තුළ පළාත් පාලන ආයතන වෙත කිසිදු උපදෙසක් හෝ මගපෙන්වීමක් කර නැති බව මේ අනුව නිගමනය කිරීමට සිදුවේ.

පළාත් පාලන ආයතන වෙත නිසි මගපෙන්වීම කළ පළාත් සභාව ලෙස ඉදිරියෙන්ම සිටිනුයේ මධ්‍යම පළාතයි. මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයා විසින් පහත සඳහන් විෂයයන් සම්බන්ධව පළාත් පාලන ආයතන කටයුතු කළයුතු ආකාරය මැනවින් විස්තර කරමින් බදු පැනවීම් කරන සහා තීරණයේ ආදර්ශ ආකෘති, ගැසට් නිවේදනයන්හි ආදර්ශ ආකෘති ආදිය ද සමග චක්‍රලේඛන පහක් පහත සඳහන් පරිදි අදාළ කාලය තුළ නිකුත් කර තිබුණි.

1. පළාත් පාලන ආයතනයන්වල ආදායම් කළමනාකරණය හා වත්කම් කළමනාකරණය (2015)
2. ව්‍යාපාර බදු පැනවීම හා අයකිරීම (2014)
3. පළාත් පාලන ආයතනවල ආදායම් එකතු කිරීම හා ආදායම් කළමනාකරණය (2014)
4. ප්‍රචාරක දැන්වීම් පුවරු සවිකිරීම (2013)
5. තක්සේරු ප්‍රතිශෝධන කාර්යයන් හා තක්සේරු දැන්වීම් නිකුත් කිරීමේ රාජකාරි සඳහා අතිරේක පාරිශ්‍රමික ගෙවීම්. (2012)

සෙසු පළාත් හතරෙහි ප්‍රධාන වශයෙන් දැකිය හැක්කේ ආදායම් එකතුකිරීම සම්බන්ධ දිරි දීමනා ගෙවීම් පිළිබඳ උපදෙස් නිකුත් කිරීම සහ දේපළ බදු දීම, පොදු කළමනාකරණය, නිල නිවාස භාවිතය යන විෂයන් පිළිබඳ උපදෙස්ය.

කෙසේ වෙතත් මේ පිළිබඳව කරුණු විශ්ලේෂණය කිරීමේදී අනාවරණය වූයේ පළාත් පාලන කොමසාරිස්වරුන් චක්‍රලේඛ උපදෙස් නිකුත් කිරීම හා පළාත් පාලන ආයතනයන්හි කාර්යය සාධනය අතර සහ - සම්බන්ධතාවයක් (cor-relation) නොපැවති බවයි.

ඉතාම ප්‍රශස්ත ලෙස පළාත් පාලන ආයතන දැනුවත් කොට තිබූ මධ්‍යම පළාතේ නියැදිගත මහා නගර අතර වූ මහනුවර හා දඹුල්ල, නගර සභා අතර වූ ගම්පොල හා තලවාකැලේ ලිඳුල ප්‍රාදේශීය සභා වූ යටිනුවර හා අඹගමුව යන ආයතන සියල්ලෙහි වරිපනම්, අක්කර බදු, බලපත්‍ර ගාස්තු ආදිය පැනවීම සම්පූර්ණයෙන්ම දෝෂ සහගත බව පෙනේ. මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතන සියල්ලෙහිම අධ්‍යයනයට ලක්කළ ආදායම් මාර්ග අටම (08) සාවද්‍ය ලෙස පනවා තිබුණි.

වරිපනම්, බලපත්‍ර ගාස්තු, ව්‍යාපාර බදු, කර්මාන්ත බදු හා සංවර්ධනය නොකළ ඉඩම් බදු නිවැරදිව පනවා තිබුනේ හම්බන්තොට මහා නගර සභාව පමණි. එහෙත් දකුණු පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව මෙහිලා මාර්ගෝපදේශ හෝ චක්‍රලේඛන ආදිය නිකුත් කර තිබූ බවක් අනාවරණය නොවුණි. මෙම තත්ත්වය සෑම ආදායම් මාර්ගයක් කෙරෙහිම දැකිය හැකිවිය. බදුල්ල මහා නගර සභාව වරිපනම්ද, රත්නපුර මහා නගර සභාව කර්මාන්ත බදු ද නිවැරදිව පනවා තිබුණි. වව්නියාව නගර සභාව ව්‍යාපාර බද්ද ද හොරණ හා කාතන්කුඩි නගර සභා කර්මාන්ත බද්ද නිවැරදිව පනවා තිබුණි. තලාව හා මධ්‍යම නුවරගම් පළාත, බලපත්‍ර ගාස්තු නිවැරදිව පනවා තිබුණි. මධ්‍යම නුවරගම් පළාත සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද නිවැරදිව පනවා තිබුණි. අක්කර බද්ද නිවැරදිව පනවා තිබූ එකදු පළාත් පාලන ආයතනයක් වත් නොවිය.

මෙම තත්වය තුළින් තවදුරටත් අනාවරණය වන්නේ පළාත් සභාවන්හි වගකීමක් වූ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ කාර්යභාරය ඉටුවීම බොහෝ දුරට දුර්වල තත්වයක පවතින බවයි. මෙය සනාථ කිරීමට උපයෝගී කොටගත හැකි ප්‍රධාන සාධකය පළාත් සභා ඇති කිරීමට පූර්වයෙන් පැවති පළාත් පාලන දෙපාර්තමේන්තුව, විශේෂයෙන් පළාත් පාලන කොමසාරිස්වරයා 1990 ට ප්‍රථම පළාත් පාලන ආයතනවල ආදායම් පැනවීම්, ආදායම් එකතු කිරීම්, හිඟ මුදල් අයකිරීම්, ව්‍යවස්ථාපිත නිවේදන පළකිරීම් සිදුකර තිබූ

ආකාරයයි. මෙය පළාත් පාලන කොමසාරිස්වරයාගේ 1956, 1962 හා 1966 පාලන වාර්තා පරීක්ෂාවට ලක් කිරීමෙන් මනාව පැහැදිලි විය. සත්‍ය වශයෙන්ම අඩු පහසුකම් සහිතව මෙම කටයුතු කොතරම් ඉහළ කාර්යක්ෂමතාවයකින් හා නිරවද්‍යතාවයකින් යුතුව පැවතියේ ද යන්න දැකීම අතිශයින් පුදුම සහගත බව කිව යුතුය.

පළාත් පාලන දෙපාර්තමේන්තුව ලංකාවේ ස්ථාපිත වූයේ 1931 වර්ෂයේදීය. එවකට එහි කාර්යභාරය වූයේ එම දෙපාර්තමේන්තුව, (i) පරිපාලන, තාක්ෂණ හා නීතිමය අත්දැකීම් සහිත විශේෂඥ සංචිතයක් ලෙස පිහිටුවීම. (ii) ඒ මගින් පළාත් පාලන ආයතනවලට සහායවීම, (iii) පළාත් පාලන සේවා පුළුල් කිරීම සඳහා යෝජනා පිළියෙළ කිරීම හා (iv) පළාත් ආයතන වෙත මිත්‍රශීලී මග පෙන්වන්නෙකු, මාර්ගෝපදේශකයෙකු හා දර්ශනය සපයන්නෙකු ලෙස ක්‍රියා කිරීමයි. මෙම කාර්යභාරය රටට නිදහස ලැබීම දක්වාත් එතැන් සිට 1990 දශකය දක්වාත් මෙම දෙපාර්තමේන්තුව තුළින් ඉතා ප්‍රශස්ත ලෙස සැපයුණි. එහි සංයුතිය, සංවිධානය හා ව්‍යුහය ඊට උචිත පරිදි පළාත් පාලනය පිළිබඳ විශේෂඥතාවය දැරූ විවිධ වෘත්තිකයින්ගෙන් සමන්විතව සංවිධානය වී තිබුණි. ඉතාම අවාසනාවන්ත අන්දමින් මෙම තත්වය ගිලිහී ගියේ 1988 වසරේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් සමග "පළාත් පාලනය" නම් වූ පාලන ස්ථරය පළාත් සභාවන්හි තවත් එක් විෂයයක් බවට පත්වීමත් සමගය.[6]

පළාත් පාලන දෙපාර්තමේන්තුව සාම්ප්‍රදායිකව සංවිධානය වී තිබුණේ ඉතා ශක්තිමත් වෘත්තීය පදනමකිනි.

[6] පිටු අංක 21 පළාත් පාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාව අංක 01. සැසි වාර්තාව-1999-රජයේ ප්‍රකාශන කාර්යාංශය

සටහන් අංක 18: පළාත් පාලන දෙපාර්තමේන්තුව සංවිධාන ව්‍යුහය



පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ව්‍යුහය සැකසී තිබුනේ සෑම දිස්ත්‍රික්කයකම පළාත් පාලන ආයතනයන්හි පාලනය, සම්බන්ධීකරණය හා අධීක්ෂණය ඉතා ඉහළ ප්‍රමිතියකින් යුතුව පවත්වාගෙනයාම පිණිස ඉවහල් වූ ක්‍රමානුකූල හා යාවත්කාලීන කළමනාකරණ ක්‍රමවේදයක් සහිතවය.

එවකට එම දෙපාර්තමේන්තුව පරිපාලන හා ඒකාබද්ධ සේවාවන්හි නිලධාරීන්ට පමණක් සීමාවූ සංවෘත සේවාවක් නොවීය. එහෙත් සෑම නිලධරියෙකුටම විශේෂිත පුහුණුවක් හා ප්‍රවීන කාර්ය මණ්ඩල තුළින් ඉතා හොඳ මගපෙන්වීමක් ලැබුණි. එම නිලධාරීන්ට නීතිය පිළිබඳව, ව්‍යවස්ථාපිත නිවේදන පිළිබඳව, සංඛ්‍යා ලේඛන නඩත්තු කිරීම, පාලන වාර්තා සම්පාදනය ආදී සෑම කාර්යයන් සම්බන්ධයෙන්ම ඉතා ඉහළ ප්‍රවීණතාවයක් ලැබුණි. වත්මන් පළාත්බද පළාත් පාලන දෙපාර්තමේන්තු කිසිවක මෙම ගුණාත්මක භාවය දක්නට නොලැබේ. සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන් තුළ හා පළාත් පාලන කොමසාරිස්වරුන් තුළ මේ සම්බන්ධව ඇත්තේ ඉතා දිළිඳු අවබෝධයකි. ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරීන් හා විමර්ශන නිලධාරීන් සතුව පැවති දැනුම් සම්භාරය ඔවුන්ගේ අනුප්‍රාප්තිකයින් වෙත ලැබී නොමැති බව පෙනේ.

6.3 පළාත් පාලන ආයතනවල නිලධාරීන් අදාළ ක්ෂේත්‍රය පිළිබඳව ලබා ඇති පුහුණුවීම්

1990 දශකයට පෙර පළාත් පාලන ක්ෂේත්‍රයේ නිලධාරීන් හට පුහුණුවීම් සැපයුයේ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යංශය යටතේ පැවති පළාත් පාලන පුහුණු හා අභ්‍යාස

ආයතනයෙනි. මෙය කොළඹ කේන්ද්‍ර කොටගත් කුඩා ආයතනයක් වූ අතර එය ප්‍රධාන වශයෙන් ක්‍රියාකාරී වූයේ කාර්ය මණ්ඩළ පුහුණුව සඳහා වුවත් පළාත් පාලන ක්ෂේත්‍රය සම්බන්ධ අධ්‍යයනයන් හා දත්ත රැස්කිරීම් ආදිය සඳහා ද යොමුවිය. කෙසේ වෙතත් රාජ්‍ය අංශය සඳහා පැවති ප්‍රධාන පුහුණු ආයතනය වූ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සමග මෙය සංසන්දනය කිරීම සාධාරණ නොවන්නේ මෙම ආයතනයේ සීමිත ධාරිතාවය සහ පරිමාව හේතුවෙනි. 1989 / 90 කාලයේදී පළාත් පාලනය යන්න පළාත් සභා ලැයිස්තුවේ පළාත් සභා වෙත ලබාදුන් තවත් එක් විෂයයක් බවට පත්විය. එතැන් පටන් පළාත් භාරව පළාත් බද පළාත් පාලන දෙපාර්තමේන්තුව ක්‍රියාකළ අතර කාර්ය මණ්ඩල පුහුණු කිරීම් පළාත් සභාව යටතේ වූ පුහුණු හා සංවර්ධන ඒකකයේ (MDTU) වගකීමක් ලෙස පිළිගන්නා ලදී. පළාත් පාලන ආයතන කාර්ය මණ්ඩල පුහුණුව (MDTU) යටතට ගනු ලැබුව ද පළාත් පාලන විෂය පිළිබඳ පරිචයක් එම ඒකක සතු නොවිය. එබැවින් පළාත් පාලන කාර්ය මණ්ඩල බොහෝවිට පළාත් සභාවේ සෙසු කාර්ය මණ්ඩල සමග සම්මිශ්‍රිතව පුහුණුවීම් සඳහා යොමු කළහ. මෙම ඒකක මගින් එක් එක් සේවක පිරිස් සඳහා අදාළ විෂය පිළිබඳ දැනුම් ලබාදීමට පාඨමාලා පවත්වන ලදී.

1998 දී පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පාර්ලිමේන්තු පනතක් මගින් පළාත් පාලන හා පළාත් සභා ක්ෂේත්‍රයේ කාර්ය මණ්ඩල හා ජන්දයෙන් පත්වූ නියෝජිතයින් පුහුණු කිරීමත්, පර්යේෂණ අධ්‍යයනයන් සිදුකිරීමත් අරමුණු කොට පිහිටවනු ලැබීය. මෙම ආයතනය මගින් පළාත් සභාවන්හි පළාත් පාලන කොමසාරිස්වරුන් හා සමග සම්බන්ධීකරණයෙන් යුතුව පළාත් පාලන ආයතනවල මාණ්ඩලික නිලධාරීන්ට, වෘත්තිකයින්ට හා ජන්දයෙන් තේරී පත්වූ සභිකයින්ට ද පුහුණුව ලබාදෙන ලදී. මෙම ජාතික ආයතනය පසුගිය විසි වසර තුළ සිදුකරන ලද පුහුණු කිරීම් හා ඊට අනුරූප වියදම බෙහෙවින් සැලකිය යුතු ප්‍රමාණයක් වියයුතු වුවත් කාලීන හෝ වාර්ෂික පාලන වාර්තා හෝ සංඛ්‍යා ලේඛන දත්ත වාර්තා ප්‍රකාශයට පත්කර නොමැති හෙයින් ඒ පිළිබඳව තොරතුරු ලබාගත නොහැකිවිය.

මෙම අධ්‍යයනයට අදාළව කරනු ලැබූ කරුණු සොයා බැලීම් වලදී අනාවරණය වූ පරිදි පසුගිය වසර තුනක කාලය තුළ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පළාත් පාලන

ආයතනයන්හි ආදායම් කළමනාකරණයට අනුකූලව පවත්වන ලද පුහුණු සැසි සංඛ්‍යාව හා ඊට ආයෝජනය කරන ලද මුදල් ප්‍රමාණයන් අංක 03 වගුවෙන් පෙන්නුම් කෙරේ.

වගුව 3: පුහුණු සැසි සංඛ්‍යාව හා ඊට ආයෝජනය කරන ලද මුදල්

අංකය	සියලු පළාත්	පාඨමාලා සංඛ්‍යාව				මුළු වැය රු. මිලියන			
		2013	2014	2015	2016	2013	2014	2015	2016
1	සියලු පළාත්	03	14	13	18	.38	.41	1.1	1.2

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් 2013 සිට 2016 දක්වා ඒ ඒ පළාත් කේන්ද්‍රකොට ගෙන පවත්වා ඇති සමස්ථ වැඩසටහන් සංඛ්‍යාව හා ඒ සඳහා වූ පිරිවැය අංක 04 වගුවෙහි දක්වා ඇත.

වගුව 4: ආදායම් කළමනාකරණයට අදාළ වැඩසටහන් සංඛ්‍යාව හා ඒ සඳහා වූ පිරිවැය

අංකය	සියලු පළාත්	පාඨමාලා සංඛ්‍යාව				මුළු වැය රු. මිලියන			
		2013	2014	2015	2016	2013	2014	2015	2016
1	සියලු පළාත්	11	93	273	202	1.9	6.7	17.9	17.0

පළාත් පාලන ආයතන වෙත සපයනු ලබන මෙම පුහුණුවීම් හුදෙක් නෛතික කරුණු පදනම් කොටගත් විශේෂිත පුහණු ගණයට අයත් පුහුණු වැඩසටහන් වේ. මෙම දැනුම සැපයීම සඳහා පළාත් සභාවන්හි කළමනාකරණ පුහුණු සංවර්ධන ඒකක වලට හෝ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයට හෝ ස්ථාවර අධ්‍යයන (Acadamic) කාර්ය මණ්ඩල නොමැත. එබැවින් එම පුහුණු කිරීම් සියල්ල බාහිර දේශක / සම්පත් දායක මණ්ඩල මගින්ම සිදුකෙරේ. මෙම විෂයට අදාළව ලංකාවේ කිසිදු විශ්ව විද්‍යාලයක හෝ තාක්ෂණ ආයතනයක පළපුරුදු දේශකයන් හෝ සම්පත් දායකයින් නැත. එබැවින් මෙම විෂය පිළිබඳ ප්‍රවීණතාවය, පළපුරුද්ද හා ඉගැන්වීම් සම්බන්ධ අත්දැකීම් ඇති ක්ෂේත්‍රයේ කටයුතු කළ හා කරන නිලධාරීන්ගේ සේවය ලබාගැනීමට සිදුවේ. මේ අතරිනුත් පුහුණුකිරීම් සඳහා යොදා ගතහැකි පිරිස් ඇත්තේ ඉතා සීමිත සංඛ්‍යාවකි. ඒ අතුරින් ත්‍රෛයි භාෂා හැකියාව සහිත නිලධාරීන් අතිශයින් විරලය. දෙමළ භාෂාවෙන් ඉගැන්වීම් කළ හැකි විෂය පිළිබඳ ප්‍රවීණයෝද අතිශයින් සීමිතය. මෙම සීමා තුළ මෙම කාර්යය ප්‍රශස්තව ඉටුකිරීම ඉතා විශාල අභියෝගයකි. මෙම ගැටළුව තවදුරටත් උග්‍ර බවට පත් කිරීමට බලපා ඇති සෙසු සාධක අතර මෙබඳු විශේෂිත පුහුණු සඳහා සිදුකළ හැකි ගෙවීම් රජයේ භාණ්ඩාගාර චක්‍රලේඛන හරහා තවදුරටත් සීමා කිරීමට

සිදුවී තිබීම ක්ෂේත්‍රය මුහුණපාන බරපතල ගැටළුවකි. පළාත් පාලන ආයතනයන්හි ආදායම් පැනවීම හා කළමනාකරණය විෂයෙහි ධාරිතා වර්ධනය සම්බන්ධයෙන් මෙම සීමා පවතින අතර පළාත් පාලන ආයතන තුළින් ඒ කෙරෙහි ඇති දැඩි ඉල්ලුම සපුරාලීම රජයට හා පළාත් සභාවන්ට පමණක් තනිව සිදුකළ නොහැකිව ඇත. මෙම තත්වය ලංකාවේ සෙසු පළාත් සමග සංසන්දනාත්මකව බැලීමේදී පෙනීයන්නේ උතුරු හා නැගෙනහිර පළාත් හි පළාත් පාලන ක්ෂේත්‍රය තුළ මෙම ගැටළුව වඩාත් උග්‍ර ස්වරූපයකට පත්ව ඇති බවයි.

මීට ප්‍රතිකර්ම වශයෙන් පළාත් සභා ක්ෂේත්‍රයේ ධාරිතා වර්ධනය හා කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම අරභයා ජාත්‍යන්තර ආධාර ආයතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන හා දේශීය රාජ්‍ය නොවන සංවිධාන පසුගිය දශක දෙකක පමණ කාලය තුළ රජය සමග විවිධ ව්‍යාපෘති හරහා ක්‍රියාත්මක වී ඇති බව පෙනේ. මේ අතුරින් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය සමග සම්බන්ධීකරණයෙන් යුතුව පළාත් පාලන ආයතනයන්හි කාර්ය සාධනය ඉහළ නැංවීම හා ආදායම් අයකිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර ආධාර ආයතන හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන කිහිපයක් ගෙවීගිය දශක දෙක තුළදී විවිධ ව්‍යාපෘති මගින් උත්සාහ දරන ලදී. එම සංවිධාන අතර,

1. ලෝක බැංකුව - WB
2. ආසියානු සංවර්ධන බැංකුව - ADB
3. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන - UNDP
4. ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඇමරිකානු ඒජන්සිය - USAID
5. ආසියානු පදනම - TAF
6. සංවර්ධනය සඳහා වූ ජර්මන් ආධාර වැඩසටහන - GIZ
7. ඕස්ට්‍රේලියානු ජාත්‍යන්තර සංවර්ධන ඒජන්සිය - AUSAD
8. යුරෝපා සංගමය - EU
9. ජපාන ජාත්‍යන්තර සහයෝගිතා වැඩසටහන - JICA
10. කැනේඩියානු ජාත්‍යන්තර ආධාර ආයතනය - CIDA

ආදිය මෙහිලා ඉතා පුළුල් කාර්යභාරයක් ඉටුකරන ලදී. ඉහත සඳහන් ආයතන සම්පූර්ණයෙන්ම අමාත්‍යංශය හා සමීප සම්බන්ධීකරණයෙන් යුතුව සෑමවිටම පළාත් පාලනය

පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ මගපෙන්වීම හා සහයෝගය මත පළාත් පාලන ක්ෂේත්‍රයේ ධාරිතා වර්ධනය (Capacity Building) උදෙසා කල් පවතින (Sustainable) කාර්යභාරයක් ඉටුකරන ලදී. ඒ අනුව පුහුණු අත්පොත්, පුහුණු ද්‍රව්‍ය, පුහුණු මොඩියුල, කාර්ය සාධනය ඉහළ නැංවීමේ මෙවලම්, විෂය අත්පොත්, චක්‍රලේඛන සංග්‍රහ, සැලසුම් ක්‍රමවේද සහභාගිත්ව අයවැය ක්‍රමවේද ප්‍රජා සහභාගිත්ව සංකල්ප පත්‍රිකා, වීඩියෝ වැඩ සටහන්, පුරවැසි ප්‍රඥප්ති ආදී බෙහෙවින් පුළුල් පරාසයක සේවාවන් ඉටුකරන ලදී. එම පෘථුල සේවාවන් රඳවා තබා ගැනීමට (Sustain) අපගේ ආයතන ව්‍යුහය කෙතෙක් දුරට සමත්වීද යන්න වෙනම සලකා බැලිය යුතු ප්‍රශ්නයකි.

පූර්වෝක්ත ආධාර ආයතන හරහා ක්‍රියාත්මකවූ පළාත් පාලන ප්‍රවර්ධන වැඩසටහන් යටතේ පළකර ඇති ග්‍රන්ථ, අත්පොත්, මොඩියුල, උපදෙස් සංග්‍රහ හා මෙවලම් සංඛ්‍යාව සිය ගණනකි. මෙම වටිනා ප්‍රකාශන පළාත් පාලන ආයතනවලදී දැකිය හැක්කේ ඉතා විරලවය. ඒවා ක්‍රමානුකූලව නඩත්තු කිරීමක් පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යංශය විසින් හෝ අදාළ පළාත් සභා විසින් හෝ පළාත් පාලන ආයතන විසින් හෝ පළාත් පාලන කොමසාරිස් වරුන් විසින් හෝ සිදුකර නොමැති වීම ප්‍රබල අඩුපාඩුවකි.

1989 දක්වා රේඛීය පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් එවකට පැවති තාක්ෂණය හා කළමනාකරණ ක්‍රමවේද උපයෝගි කොටගෙන පළාත් පාලන ආයතන භාරව ක්‍රියාකළ නිලධාරීන්ට ක්ෂේත්‍රයේ කටයුතු සොයා බැලීමත් සෑම පළාත් පාලන ආයතනයකම කාර්ය සාධනය, ආදායම් වියදම් විස්තර විශ්ලේෂණය, බදු පැනවීමේ නිවේදන ආදිය ඉතා නිවැරදිව සකස් කර එකී විශ්ලේෂණ පදනම් කොටගත් දත්ත වාර්තා ගත කිරීමටත් ඒ අනුව වාර්ෂික පාලන වාර්තාව සකස් කර ප්‍රසිද්ධ කිරීමටත් ක්‍රියාකර ඇත. එම වර්තා එකල පළාත් පාලනය සම්බන්ධ පර්යේෂකයින්ට අතිශය ප්‍රයෝජනවත් මූලාශ්‍ර වන්නේය. එතෙකුදු වුවත් 1990 න් පසු එම ක්‍රමවේදයන් අභාවයට ගොස් ඇති බව පෙනේ. වර්තමානයේ ලංකාවේ කිසිඳු පළාත් පාලන කොමසාරිස්වරයෙකු සිය වාර්ෂික පරිපාලන වාර්තාව සකස්කර ප්‍රසිද්ධ කර නැත. කිසියම් පළාතක පළාත් පාලන ආයතන එකකට හෝ වැඩි ගණනකට බලපාන වැදගත් සිදුවීම් කිසිවක් දැන් පළාත් පාලන දෙපාර්තමේන්තු සතුව නැත. පළාත් පාලන ආයතනයන්හි අභ්‍යන්තර පාලනය කේන්ද්‍රගතවී තිබෙන්නේ එදිනෙදා මහජනතාව රැගෙන එන දුක්ගැනවිලි

වලට පිළිතුරු දීමට පමණි. ඒ හැර ප්‍රතිපත්ති සැලසුම් කිරීම, හිඟ ආදායම් එකතු කිරීම්, විශේෂ වැඩසටහන්, දීර්ඝ කාලීන සංවර්ධන සැලසුම් සම්පාදනය හා ආදායම් ප්‍රවර්ධන වැඩසටහන් ආදිය කෙරෙහි යොමුවන්නේ අවම අවධානයකි. මෙම අධ්‍යයනයේ දී 5 වන පරිච්ඡේදය තුළ අවධානයට ලක්වූ ආදායම් පැනවීම් සම්බන්ධව පවතින සාවද්‍ය හා නීතියට පටහැනි පරිචයන්ට හේතුවී ඇත්තේ මෙම තත්වයයි. පළාත් පාලන ආයතන පද්ධතිය හෝ එහි පරිපාලනය අධීක්ෂණය කරන පළාත් සභාව හෝ යටත් පිරිසෙයින් රේඛීය අමාත්‍යංශයේ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය හෝ පළාත් පාලනය සතු නිවැරදි නෛතික විධිවිධාන, නිවැරදි නෛතික පූර්වාදර්ශයන්, නවනීති වාර්තා ආදිය ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි පැහැදිළිව නියමකොට ඇති නීතිමය විධිවිධානයන් යථා පරිදි ජනතාව උදෙසා පවතින්නේ ද යන්න සහතික කිරීමට තරම් ශක්තිමත් වී නොමැත්තේ යටකී පරිදි පළාත් පාලන මූලධර්ම මත පදනම්වූ නෛතික හා භාවිත හර පද්ධතින් පසුගිය දශක 03 පමණ කාලය තුළ දරුණු ලෙස බිඳ වැටීම නිසා බව පිළිගැනීමට සිදුවේ. 1990 ට පෙර එනම් පළාත් සභා පැමිණීමට පෙර පැවති පළාත් පාලනයේ ගතික (Dyanamic) ස්වභාවය වර්තමානයේ දැකිය නොහැකිවීම මීට ප්‍රබල ලෙස හේතුවී තිබේ.

6.4 අධ්‍යයනයට අයත් පළාත් පාලන ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ලබාඇති පුහුණුවීම්

මෙම පර්යේෂණ අධ්‍යයනයේදී ආදායම් පැනවීමට සෘජු ලෙස අදාළ වන විෂයයන් අටක් (08) සම්බන්ධ ඒ ඒ පළාත් පාලන ආයතනයන්හි නිලධාරීන් ලබා ඇති පුහුණුවීම් පිළිබඳව ව්‍යුහගත ප්‍රශ්නාවලීන් හරහා තොරතුරු ලබාගන්නා ලදී. මෙම පරීක්ෂණයේදී අනාවරණය වූ තොරතුරු විශ්ලේෂණය කිරීමේදී පෙනීයන්නේ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය, පළාත් සභාවේ කළමනාකරණ පුහුණු හා සංවර්ධන ඒකකය, පළාත් පාලන රේඛීය අමාත්‍යංශය මගින් සම්බන්ධීකරණය කරන ලද සංවර්ධන ව්‍යාපෘති (පුර නැගුම, NELSIP ආදිය) හරහා සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන්, වෙනත් ආයතන එනම් පළාත් පාලන ආයතන සංසදය වැනි සංවිධාන හරහා සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන් ආදිය මගින් පළාත් පාලන ආයතන කාර්ය මණ්ඩල සඳහා පුහුණු වැඩසටහන්, පාඨමාලා, සම්මන්ත්‍රණ, වැඩමුළු හා දේශන පවත්වා ඇති බවයි. මීට අමතරව කොළඹ මහා නගර සභාව සතුව ඉතා දියුණු මට්ටමක පවතින කළමනාකරණ පුහුණු දෙපාර්තමේන්තුවක් හා පුහුණු මධ්‍යස්ථානයක් එහි

නිලධාරීන් සඳහා පිහිටුවා ඇත. ලංකාවේ වෙනත් මහා නගර සභාවක හෝ පළාත් පාලන ආයතනයක මෙබඳු පුහුණු දෙපාර්තමේන්තුවක් දැකිය නොහැකිය. කොළඹ මහා නගර සභාවේ පුහුණු කිරීම් හා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2016 වර්ෂයේ ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 75.7 කි. සත්‍ය වියදම 30.09.2016 දිනට රු. මි. 28.8 කි. ඒ අතර පුහුණු කිරීම් සඳහා පමණක් 2016 වසරේ ඇස්තමේන්තු ගත වියදම රු. මි. 20 කි. 30.09.2016 දිනට සත්‍ය පුහුණු වැය රු.මි. 9.3 කි. කොළඹ මහා නගර සභාව සිය විස්තීරණ සේවා සම්පාදනය ඉහළ මට්ටමක පවත්වාගෙන යාම සඳහා 6444 කින් සමන්විත සිය කාර්ය මණ්ඩලයේ පුහුණු හා සංවර්ධන කටයුතු වෙනුවෙන් මෙතරම් පුළුල් පුහුණු වැඩ සටහන් ස්ථාවර මට්ටමකින් යුතුව පවත්වාගෙන ගියේ වී නමුත් මෙම පර්යේෂණ අධ්‍යයනයේ විෂය පථයට අයත් ආදායම් පැනවීම්හි නිරවද්‍යතාවය සම්බන්ධයෙන් දක්වා ඇති කාර්යසාධන මට්ටම එතරම් සතුටුදායක නොවේ.

පර්යේෂණ අධ්‍යයනය සඳහා යොදාගත් නියැදිගත ප්‍රාදේශීය සභා 21 ක් අතුරින් 25% ක සසම්භාවී නියැදියක් පරීක්ෂා කිරීමෙන් 2016 වර්ෂයේ ප්‍රාදේශීය සභාවන්හි පුහුණුවීම් සම්බන්ධ යථාරූපී පැතිකඩක් දැකිය හැකිවේ. අංක 05 වගුව බලන්න.

වගුව 5: ප්‍රාදේශීය සභා නිලධාරී පුහුණුව (2016 වර්ෂය)

අංකය	ප්‍රාදේශීය සභා	පුහුණුව ලද නිලධාරී සංඛ්‍යාව	පුහුණුව ලද ක්ෂේත්‍ර							
			I	II	III	IV	V	VI	VII	VIII
			පළාත් පාලන ආයතන කළමනාකරණය	පළාත් පාලන ගිණුම්	ආදායම් එකරැස් කිරීම හා ප්‍රවර්ධනය	බදු හා බලපත්‍ර ගාස්තු පැනවීම	ආයවය කළමනාකරණය	පළාත් පාලන අතුරු ව්‍යවස්ථා	මූල්‍ය කළමනාකරණය	වරිපනම් පැනවීම හා අයකිරීම
01	බෙන්තොට	04	01	02	03	03	03	01	02	03
02	දොඩංගොඩ	04	02	02	03	03	02	02	02	03
03	ඇහැළියගොඩ	06	02	00	03	04	02	01	02	03
04	දික්වැල්ල	03	02	00	02	03	00	00	03	01
05	මොණරාගල	04	04	01	03	03	02	03	02	02
06	තිරුක්කෝවිල්	07	05	03	01	00	02	02	00	00
08	නානාටාන්	07	05	02	04	02	03	01	01	02
07	**මුළු ගණන**	**35**	**21**	**10**	**19**	**18**	**14**	**09**	**12**	**14**

මෙම තත්වය විශ්ලේෂණය කිරීමේදී පැහැදිලි වන්නේ කිසියම් ආකාරයක පුහුණුවීම් ක්‍රියාවලියක් සෑම පළාත් පාලන ආයතනයකම කිසියම් නිලධාරී පිරිසකට ලැබී ඇති බවයි. බොහෝ විට සෑම පුහුණුවකටම යොමුවී ඇත්තේ එකම නිලධාරී කණ්ඩායමක් බවද පෙනේ.

මෙහිදී තවදුරටත් සනාථ වන්නේ පළාත් පාලන ක්ෂේත්‍රය තුළ නිලධාරීන් ලබාගන්නා පුහුණුව හා එහි කාර්ය සාධනය අතර සහ සම්බන්ධතාවයක් නොමැති බවයි. නිලධාරීන් පුහුණු පාඨමාලා සඳහා කොතරම් සහභාගී වුවද එම පාඨමාලා පළාත් පාලන ක්ෂේත්‍රයේ පවතින අවශ්‍යතාවය සමග ගැලපී නොමැති බව මෙයින් එළඹිය හැකි නිගමනයකි. තවත් අතකින් විවිධ ආයතන හා සංවිධාන මගින් මෙම විෂය පිළිබඳ පුහුණුව සඳහා තෝරා ගන්නා පුහුණු කරුවන් කොතරම් සාර්ථකව සිය වගකීම ඉටුකර තිබේද යන්න හා එය සාර්ථකව ඉටුකළ බවට පුහුණුව සපයන සංවිධාන දැනුවත් වී සිටියේ ද යන්න ප්‍රශ්න සහගත බව මෙයින් විද්‍යාමාන වේ. ප්‍රාදේශීය සභා තුලින් දිස්වන මෙම ප්‍රාථමික ගැටලු නගර සභා සම්බන්ධයෙන් කෙසේ බලපා ඇද්ද යන්න සොයාබැලීම වැදගත් වේ. අංක 06 වගුව බලන්න

වගුව 6 : නගර සභා නිලධාරී පුහුණුව (2016 වර්ෂය)

අංකය	නගර සභාව	පුහුණුව ලද නිලධාරී සංඛ්‍යාව	පුහුණුව ලද කෙටිත							
			I	II	III	IV	V	VI	VII	VIII
01	ත්‍රිකුණාමලය	07	06	04	03	02	04	03	03	03
02	හික්කඩුව	04	04	01	02	02	01	03	02	03
03	පේදුරුතුඩුව	08	05	03	05	04	02	02	03	04
04	හොරණ	02	01	01	02	02	01	02	02	02
05	ඇඹිලිපිටිය	05	02	01	03	03	02	02	03	03
06	වව්නියාව	06	04	03	04	03	01	01	02	05
07	**මුළු ගණන**	**32**	**22**	**13**	**19**	**16**	**11**	**13**	**15**	**20**

නගර සභා සම්බන්ධයෙන් දැකිය හැකි කැපී පෙනන වෙනස වන්නේ නිලධාරීන් බහුතරයකට පුහුණුව සඳහා ඇති ඉඩ ප්‍රස්ථා විවර වී ඇති බවයි. එතෙකුදු වුවත් ලබා ඇති පුහුණුව සහ කාර්ය සාධනය අතර සෘජු සම්බන්ධතාවක් නොමැති වීම මෙහිදී තවදුරටත් සනාථවේ. මෙහිදී අවධානයට ලක්වන තවත් කරුණක් වනුයේ ත්‍රිකුණාමලය හා පේදුරුතුඩුව නගර සභා වැඩිම නිලධාරීන් පිරිස් පුහුනුව ලබා ඇති ආයතන ලෙස ඉදිරියෙන් සිටියත් එම ආයතන දෙකම යටත් පිරිසෙයින් ආදායම් පැනවීම හෝ ගැසට් නිවේදන පළකිරීමවත් සිදුකර නොමැති වීමයි. නිලධාරීන් ආදායම් පැනවීම හා කළමනාකරණය සම්බන්ධ මූලික නෛතික අවශ්‍යතා අවබෝධකර ගත්තේ නම් අනිවාර්යයෙන්ම ආදායම් පැනවීම හා ප්‍රසිද්ධ කිරීමවත් නිවැරදිව සිදුකළ යුතුව තිබුණි. මෙයින් තවදුරටත් ස්ථිර වන්නේ පළාත් පාලන ක්ෂේත්‍රයේ දැනට සිදුවන පුහුණුවීම් / පුහුණු කිරීම් එම ආයතනවල අවශ්‍යතාවයන්ට සමපාත නොවන බවත්, එකී පුහුණු පාඨමාලාවල අන්තර්ගතය ප්‍රශ්න කළයුතු තත්වයකට පත්ව ඇති බවත්ය.

අවසාන වශයෙන් මහානගර සභාවල තත්ත්වය සොයා බැලීම වැදගත් වේ. අංක 07 වගුව බලන්න

වගුව 7: මහා නගර සභා නිලධාරී පුහුණුව (2016 වර්ෂය)

අංකය	මහනගර සභාව	පුහුණුව ලද නිලධාරී සංඛ්‍යාව	පුහුණුව ලද ක්ෂේත්‍ර							
			I	II	III	IV	V	VI	VII	VIII
01	බදුල්ල	04	00	01	02	02	00	02	02	02
02	හම්බන්තොට	03	01	02	02	01	01	01	02	02
03	රත්නපුර	04	01	01	03	04	01	03	03	03
04	යාපනය	08	05	03	07	03	07	03	03	04
05	මඩකලපුව	08	03	02	05	04	05	03	03	01
06	**මුළු ගණන**	**27**	**10**	**09**	**19**	**14**	**14**	**12**	**13**	**12**

මහා නගර සභා පිළිබඳ දත්ත විශ්ලේෂණය කිරීමෙන් මෙහිලා වැදගත්වන තවත් කරුණු කිහිපයක් අනාවරණය වේ. මෙම අධ්‍යයනයේදී මහා නගර සභා අතුරින් ආදායම් පැනවීම විෂයෙහි වැඩිම සමත්කම් දක්වා තිබුණේ හම්බන්තොට මහා නගර සභාවයි. දෙවැන්න හා තෙවැන්න පිළිවෙලින් බදුල්ල හා රත්නපුරයයි. මෙම දත්ත සමීක්ෂණයේදී හම්බන්තොට මහා නගර සභාව අවම නිලධාරි සංඛ්‍යාවක් පුහුණුව ලද ආයතනය ලෙස ද බදුල්ල හා රත්නපුරය ඊලඟ අවම නිලධාරි සංඛ්‍යාවක් පුහුණුව ලද ආයතන ලෙස ද වාර්තාවී ඇත. මෙමගින් ඉතා පැහැදිලිව සනාථ වනුයේ මහා නගර සභාවන්හි නිලධාරීන් වර්තමානයේ ලබන පළාත් පාලන විෂය සම්බන්ධ පුහුණු වැඩ සටහන් එකී ආයතනයන්හි සත්‍ය පුහුණු අවශ්‍යතා හෝ කාර්යසාධන මට්ටම කෙරේ බලපෑමක් ඇතිකර නොමැති බවයි.

අනෙක් අතට වැඩිම නිලධාරි සංඛ්‍යාවක් පුහුණුව ලබා ඇති යාපනය හා මඩකලපුව මහා නගර සභාවන් ආදායම් පැනවීම් විෂයෙහි දක්වා ඇත්තේ අවම කාර්යසාධන මට්ටමක් වීම ද මෙහිලා බලධාරීන්ගේ අවධානයට යොමුවිය යුතු තත්වයකි.

මෙම පරීක්ෂණ අධ්‍යයනයේදී අනාවරණය වූ ඉහත කී තත්වයන් මත ඉදිරියේ දී පුහුණු සැලසුම් කරුවන්ට හා ප්‍රතිපත්ති සම්පාදකයින්ට විශේෂයෙන් ආධාර සපයන ජාත්‍යන්තර ආයතනවලට ලබාගත හැකි මෙහෙය ඉතා පුළුල් වූවකි. මෙය ප්‍රාදේශීය සභා, නගර සභා සහ මහා නගර සභා සම්බන්ධයෙන් ද අඩුවැඩි වශයෙන් එකසේ බලපා ඇති ප්‍රබල ගැටළුවක් බව අවබෝධකොට ගැනීම වැදගත් වේ. මෙම තත්ත්වය තුළින් ඍජුවම පසුගිය දශක 02 තුළ

ලංකාවේ ක්‍රියාත්මක වන පුහුණු වැඩ සටහන් වල සඵලතාවයත් එම පුහුණු තුළින් නිසි ප්‍රතිඵල ලබාගැනීමට පළාත් පාලන ආයතන දක්වන කැපවීමත් පිළිබිඹුවේ.

ඉහත සඳහන් කරුණු අධ්‍යයනය කිරීමේදී ඇතැම්විට මෙතෙක් ලංකාවේ පළාත් පාලන ක්ෂේත්‍රයේ සිදුකර ඇති පුහුණු වැඩසටහන් පාඨමාලා ආදිය අර්ථ විරහිත ව්‍යායාමයක් ද යන අදහස ඇතිවිය හැකිය. එහෙත් කිසිවිටක එබඳු නිගමනයකට එළඹීම සුදුසු නොවන බව බොහෝ ජාත්‍යන්තර ආධාර ආයතන විසින් මෙම ක්ෂේත්‍රයේ පුහුණු කටයුතු වලදී නිපදවා බෙදා හැර ඇති පුහුණු ද්‍රව්‍ය (Training Materials) පුහුණු අත්පොත්, පුහුණු මාර්ගෝපදේශ සංග්‍රහ ආදිය අධ්‍යයනය කිරීමේදී පැහැදිළිවේ. නිදසුනක් වශයෙන් 2009-2013 සිව් අවුරුදු කාලය තුළ ලංකාවේ නැගෙනහිර හා උතුරු මැද පළාත් ආවරණය කරමින් USAID ආයතනය ක්‍රියාත්මක කළ පළාත් පරිපාලන සහයෝගිතා වැඩසටහන (SURG) දැක්විය හැකිය. එම පුහුණු වැඩ සටහන් ඉතාම වැදගත් මෙන්ම කල් පවත්නා ඒවා විය. ව්‍යාපෘතිය අවසානයේ 2013 වසරේදී භාෂාත්‍රයෙන්ම සම්පාදනය කර පළ කරන ලද "පළාත් පාලන කළමනාකරණය පළාත් පාලන වෘත්තිකයින් හා පුහුණුකරුවන් සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහය"[7] ලංකාවේ පළාත් පාලන ක්ෂේත්‍රයට ඇමරිකානු ජාත්‍යන්තර ආධාර ඒජන්සිය මගින් පිරිනමන ලද මිල කළ නොහෙන ත්‍යාගයකි. එසේම කැනේඩියානු ජාත්‍යන්තර ආධාර ආයතනය (CIDA) මගින් සිංහල හා දෙමල භාෂාවන් ගෙන් පළ කල පළාත් පාලන විෂයයන් 12 කට අදාල අත්පොත් මාලාව මෙම ක්ෂේත්‍රයට ලැබුණු මහඟු දායාදයකි.

මීට අතිරේකව පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යංශය මගින් ප්‍රකාශිත ආසියා පදනමේ අනුග්‍රහය මත සම්පාදනය වූ සහභාගිත්ව සැලසුම්කරණය හා අයවැය පිළිබඳ ත්‍රෛයිභාෂික මාර්ගෝපදේශ සංග්‍රහයන් පළාත් පාලන අතුරු ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයන් මෙම ක්ෂේත්‍රය වෙත දායක වූ ඉතා වැදගත් පාඨ ග්‍රන්ථ වේ.

එබැවින් මෙම ක්ෂේත්‍රයේ සිදුකරන ලද පුහුණු වැඩසටහන් පළාත් පාලන ආයතන තුළින් පිළිබිඹුවන අකාර්යක්ෂමතාවයන්ට හේතුවක් ලෙස අවතක්සේරුවකට ලක්කිරීම මෙම පර්යේෂණයේදී කිසිසේත් සිදුනොවේ. එම වැඩසටහන් හා පුහුණ ද්‍රව්‍ය හා සම්පත් ප්‍රයෝජනයට ගන්නා ආකාරය හා ඊට ඇති කැපවීම මෙහිලා බලපා ඇති බව කිවයුතුය.

---

[7] Managing Local Governance - Practitioner's and Trainers Guide – 2013 July – USAID-EML Consultents Ltd. Colombo Sri Lanka

6.5 පළාත් පාලන ආයතන පද්ධතියෙහි ආදායම් කළමනාකරනය කෙරෙහි ජාතික මට්ටමේ මැදිහත්වීම් ඃ

13 වන ව්‍යවස්ථා සංශෝධනය ප්‍රකාර 1989 න් පසු පළාත් පාලන ආයතනයන්හි පරිපාලනය අධීක්ෂණය කිරීමේ වගකීම මධ්‍යයේ සිට පරිධියේ පිහිටි පළාත් සභා වෙත පවරනු ලැබ ඇත. ඒ අනුව ආරම්භයේ සිට 1990 මුල දක්වා පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් රජය ක්‍රියාකළ ආකාරය 13 වන සංශෝධනයෙන් පසුව ප්‍රබල වෙනසකට ලක්විය. එතෙකුදු වුවත් 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පළාත් පාලන ආයතනවල සංස්ථාපනය, සංයුතිය හා ව්‍යුහය, පළාත් පාලන මැතිවරණ සහ පළාත් පාලනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය රජය වෙතම තවදුරටත් තබා ඇත. හැරත් පළාත් සභා සහ පළාත් පාලන ආයතන වෙත පුහුණු ධාරිතා වර්ධන, පර්යේෂණ හා ප්‍රකාශන පළකිරීම් සහාය ලබාදීම සඳහා පිහිටුවා ඇති ජාතික ආයතනය ද පළාත් පාලන රේඛීය අමාත්‍යංශයට අයත්වේ.

මේ අනුව පළාත් පාලන ආයතනයන්හි ධාරිතා වර්ධනය, කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා සහායවීම, සේවා සම්පාදනය සඳහා ආධාර කිරීම, ආදායම් උත්පාදනය සඳහා මගපෙන්වීම, කාර්ය සාධනය වැඩිදියුණු කිරීම යන කරුණු සම්බන්ධයෙන් රජය පළාත් පාලනය පිළිබඳ රේඛීය අමාත්‍යංශය හරහා පුළුල් වැඩ කොටසක් සිදුකරනු ලබයි. මේ යටතේ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය දිවයිනේ සියළු පළාත් සභා සමග සමීප සම්බන්ධීකරණයෙන් යුතුව පළාත් පාලන ආයතනයන්හි කාර්යසාධනය මත පදනම් වූ ජාතික හා පළාත් මට්ටමේ වාර්ෂික තරඟ පවත්වා පළාත් මට්ටමින් හා ජාතික මට්ටමින් ප්‍රවීණත්වයට පත්වන ආයතන ඇගයීමට ක්‍රියාකෙරේ.

මෙම වැඩ පිළිවෙල 1990 මැද භාගයේ සිටම කිසියම් ආකාරයකට සිදුකර ඇති අතර එය වඩා සංවිධානාත්මකව හා ක්‍රමානුකූලව සිදුකිරීමට ජාත්‍යන්තර ආධාර ආයතනයන්හි සහයෝගය මත 2009 වසරේ සිට අඛණ්ඩ ක්‍රමවත් වැඩසටහන් සම්පාදනය කරන ලදී. මේ සඳහා පදනම් කරගනු ලබන නිර්ණායක පද්ධතිය ආසියා පදනමේ (TAF) අනුග්‍රහය මත පළාත් පාලන ආයතනයන්හි කාර්ය සාධනය ඉහළ නැංවීම හා තහවුරු කිරීමේ මෙවලම

(PERFECT)[8] ලෙස පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යංශය විසින් භාවිතයට සම්මත කර ගන්නා ලදී.

මෙම මෙවලම (Tool) මගින් පළාත් පාලන ආයතනයක් විසින් ඉටුකිරීමට බැඳී සිටින සියළු සේවා සඳහා ප්‍රමිතීන් හා දර්ශක ගොඩනගා ඒවා ඇගයීමේ ක්‍රමවේද නිශ්චිතව දක්වා ඇත. ඒ අතර ආදායම් උත්පාදනය මෙන්ම ව්‍යවස්ථාපිත විධිවිධාන අනුගමනය කර තිබීම අවධානයට ගෙන දර්ශක හා අවම ප්‍රමිතීන් ගොඩනගා ඇත. ඒ අනුව පළාත් පාලන ආයතන විසින් වාර්ෂිකව ආදායම් පැනවීම හා එම ආදායම් නිසිලෙස එකතු කිරීම පළාත් මට්ටමේදී මෙන්ම ජාතික මට්ටමේදී ද වාර්ෂිකව අවධානයට ගැනේ. මෙම කාර්යය ප්‍රධාන වශයෙන්ම පළාත් පාලන ආයතනයන්හි නිරවද්‍ය ගැසට් නිවේදන පැනවීම දක්වා ගැඹුරු ලෙස මෙම මෙවලමෙහි දක්වා නැත.

එහෙත් කිසියම් දුරකට එම කරුණු කාර්ය සාධන තරඟයන්හිදී සැලකිල්ලට ගැනීමේ අවස්ථාවක් ලෙස මෙය හඳුන්වා දිය හැකිය.

මෙම මෙවලම පාවිච්චි කිරීමේදී පරීක්ෂණ මණ්ඩල පළාත් පාලන ආයතනයන්හි ආදායම් සම්බන්ධ නෛතික ක්‍රියාපටිපාටිය, අතුරු ව්‍යවස්ථා නියෝග, රීති, විධාන (නියමයන්) වරෙන්තු, ප්‍රකාශන ආදියෙහි භාවිතය හා බලය (Validiety) පිළිබඳ මනා පරිචයකින් යුක්ත වූවෝ විය යුතුමය. නොඑසේනම් ඇගයීම හෝ එහි අවසාන ප්‍රතිඵලය බෙහෙවින් විකෘති වීමට ඇති අවකාශ බොහෝය.

[8] Performance Enchansiment & Consolidation Tool. 2009 M/LG&PC – The Asia Foundation, Colombo, Sri Lanka.

07 පරිච්ඡේදය

7. අවිධිමත් ආදායම් පැනවීම් විෂයෙහි දැකිය හැකි ප්‍රතිවිපාක

පළාත් පාලන ආයතන වෙත ආදායම් ලබාගැනීම සඳහා පවත්නා නීතිය ඇතුළත ආදායම් මාර්ග ගණනාවක් පවරාදී තිබේ. පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පනත් මගින් (ආඥා පනත්ද ඇතුළුව) මෙම ඉඩකඩ සලසා ඇත. උත්තරීතර නීතිය වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මෙය තවදුරටත් තහවුරු කර එහි සීමා මායිම් ඉතා හොඳින් පෙන්වා දී ඇත.[9]

එහි නිශ්චිතව සඳහන් වන්නේ "පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ නීතියක හෝ පවත්නා යම් නීතියක හෝ අධිකාරය අනුව හෝ ඒ යටතේ හෝ මිස කිසිම පළාත් පාලන ආයතනයක් විසින් හෝ වෙනත් පොදු අධිකාරයක් විසින් හෝ කිසිම බද්දක්, වරිපනමක් හෝ වෙනත් යම්කිසි බදු විශේෂයක් නියම කිරීමට බලයක් නොමැත්තේය," යනුවෙනි.

මෙම විධි විධානය පළාත් පාලන ආයතන පාලනය කරන මහජන නියෝජිතයින්, රාජ්‍ය නිලධාරීන්, සෙසු කාර්ය මණ්ඩල, මහජනතාව, ව්‍යාපාරික ප්‍රජාව, සෙසු පාර්ශවකරුවන් යන සියළුදෙනා විසින් සෑම අවස්ථාවකම දැඩිව අවධානයේ තබාගත යුතුය. ඕනෑම පළාත් පාලන ආයතනයක් මෙම විධිවිධාන තේරුම්ගෙන ප්‍රජා සහභාගිත්වයෙන් යුතුව බදු හා ගාස්තු පනවන්නේ නම් ඒවා අයකරගැනීම ඉතාම පහසුවේ. මීට ලොව හොඳම උදාහරණය සපයන්නේ ස්කැන්ඩිනේවියානු රටවල් හා ජපානයයි. ජනතාවගේ දැනුවත් බවින් වියුක්තව නීතියේ විධිවිධාන ඉක්මවා යමින් පනවනු ලබන ආදායම් නොගෙවීමට ජනතාව පෙළඹෙන අතර ඒවා මගහැර යාමට ක්‍රම හා විධි අත්හදා බලති.

මෙම පර්යේෂණ අධ්‍යයනයේදී නියැදිගත පළාත් පාලන ආයතන සිය ආදායම් අයකිරීම විෂයෙහි දක්වා ඇති කාර්යක්ෂමතාවය ද විමසුමට ලක් කරන ලදී. ඒ අනුව මූලික නියැදියෙන් සසම්භාවීව තෝරාගත් ආයතන කිහිපයක පවතින හිඟ ආදායම් ප්‍රමාණ කෙරෙහි අවධානය යොමුකරන ලදී.

---

[9] 148 වන ව්‍යවස්ථාව - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1978 රජයේ ප්‍රකාශන කාර්යාංශය, කොළඹ

7.1 අධික සමුච්චිත හිඟ මුදලක් ගොඩනැගීම

පර්යේෂණ නියැදිය තුළින් සසම්භාවීව තෝරාගත් පළාත් පාලන ආයතන කිහිපයක ප්‍රධාන ආදායම් මාර්ග කිහිපයක 2016 වර්ෂයේ ඉපැයීම (Yield) හා හිඟය (Arrears) පරීක්ෂාකර බැලීම කාලෝචිතය. අංක 08 වගුව බලන්න.

ප්‍රාදේශීය සභා 2016 වර්ෂයේ හිඟ ආදායම් විශ්ලේෂණය

සමුච්චිත හිඟ මුදල්

වගුව 8 : 1. කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව - 2016

අංකය	ආදායම් මූලය	2016 ඇස්තමේන්තුගත ආදායම රු.	2016.12.31 දිනම හිඟය
01	වරිපනම්	43,663,464.75	35,255,823.54
02	බලපත්‍ර ගාස්තු	666,060.00	219,115.00
03	කර්මාන්ත බදු	1,864,140.00	719,160.00
04	කඩකුළී	2,881,800.00	1,347,935.93
05	නිවාස කුළී	275,400.00	1,631,320.67
	එකතුව	**49,350,864.00**	**39,373,353.00**
	2. අඹගමුව ප්‍රාදේශීය සභාව - 2015		
01	වරිපනම්	8,540,258.44	3,551,377.64
02	බලපත්‍ර ගාස්තු	3,193,700.00	18,420.74
03	අක්කර බදු	236,976.40	207,060.46
04	කඩකුළී	154,035.00	172,764.66
05	ජල ගාස්තු	1,511,905.00	1496734.49
	එකතුව	**73,636,874.00**	**5610355.00**

ඉහත අංක 08 වගුවෙහි බස්නාහිර පළාතේ හා මධ්‍යම පළාතේ ප්‍රාදේශීය සභා දෙකක ප්‍රධාන ආදායම් මාර්ග පහක 2015 හා 2016 වර්ෂ තුළ කාර්ය සාධනය දක්වා තිබේ. අගනුවරට ආසන්න කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ ඇස්තමේන්තු ගත වරිපනම් ආදායම රු. මිලියන 43.6 ක් වන අතර එම වර්ෂය අවසානයේ සමුච්චිත වරිපනම් හිඟය රු.මි.35.2 කි. එය ප්‍රතිශතයක් ලෙස 81.3% කි. මෙය ඉතාම අකාර්යක්ෂම වරිපනම් කළමනාකරණයක පිළිබිඹුවකි. එම ආයතනයේ 2016 වසරේ තෝරා ගත් ආදායම් මූලයන් පහක (05) මුළු ආදායම රු.මි.49.3 කි. එම වර්ෂය අවසානයේ එහි පැවති හිඟ මුදල රු.මි.39.3 කි. මෙය

ප්‍රතිශතයක් ලෙස 79.5% කි. මෙයින් පැහැදිලි වන්නේ කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව 2016 වසරේදී සිය කටයුතු කරගෙන යාමේදී ඊට ලැබිය යුතු ආදායමින් 80% ක පමණ මුදලක් රහිතව කටයුතු කර ඇති බවයි. එහි සමස්ථ ආදායම සලකා බැලුවහොත් මෙය තවදුරටත් තියුණු ඍණ අගයක් ගන්නවා ඇත.

මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹගමුව ප්‍රාදේශීය සභාව 2015 වර්ෂය සඳහා ඇස්තමේන්තු කර ඇති වරිපනම් ආදායම රු.මි.8.5 කි. එහි වසර අග වරිපනම් හිඟය රු. මි.3.5 කි. මෙය ප්‍රතිශතයක් වශයෙන් 41.1% කි. මෙම ආයතනයේ තෝරාගත් ආදායම් මූලයන් පහක මුළු ඇස්තමේන්තු ගත ආදායම රු. මි. 13.6 කි. වර්ෂය අවසානයේ පැවති හිඟය රු.මි.5.7 කි. එය ප්‍රතිශතයක් ලෙස එය 41.2% කි. මේ අනුව පැහැදිලි වන්නේ සමස්ථ ආදායම ගණනය කිරීමේදී අඹගමුව ප්‍රාදේශීය සභාව එම වර්ෂයේ ලැබිය යුතු ආදායමෙන් දළ වශයෙන් 50% ක පමණ අඩුවක් සහිතව ක්‍රියාත්මක වී ඇති බවයි.

මෙම තත්වය නගර සභා සහ මහා නගර සභා සම්බන්ධයෙන් බලන කල මීට වඩා බෙහෙවින් උග්‍ර ස්වරූපයක් ගනී. උදාහරණ වශයෙන් බදුල්ල හා කොළඹ මහා නගර සභා ආශ්‍රයෙන් මෙම තත්වය විමසා බලමු.

වගුව 9 : සමුච්චිත හිඟ මුදල්

බදුල්ල මහා නගර සභාව – 2015

අංකය	ආදායම් මූලය	2015 - ඇස්තමේන්තු ආදායම	2015-12-31 දිනට හිඟය
01	වරිපනම්	19,066,630.64	35,530,931.94
02	කුලී ආදායම්	33,573,661.38	14,687,492.79
03	බලපත්‍ර ගාස්තු	11,338,805,93	
04	සේවා සඳහා ගාස්තු	12,303,214.36	
	එකතුව	**75,282,312.21**	**50,218,424.73**

වගුව 10 : සමුච්චිත හිඟ මුදල්

කොළඹ මහා නගර සභාව – 2015 / 2016

අංකය	ආදායම් මූලය	2016 - ඇස්තමේන්තු ආදායම	2015 සත්‍ය ආදායම
01	වරිපනම්	3662,780,000.00	2,785,562,272.00
02	වෙළඳ බලපත්‍ර	65,000,000.00	32,281,930.00
03	කර්මාන්ත බද්ද	65,000,000.00	29,777,000.00
04	ව්‍යාපාර බද්ද	1,500,000.00	918,810.00
05	ඉඩම් විකිණීම මත බදු	2,500.000.00	533,010.00
06	**එකතුව**	**3,796,780,000.00**	**2,849,073,022.00**

බදුල්ල මහා නගර සභාවේ 2015 ඇස්තමේන්තු ගත වරිපනම් ආදායම රු.මි.19 කි. 2015.12.31 දිනට පැවති සමුච්චිත හිඟය රු.මි.35.5 කි. මෙය ප්‍රතිශතයක් ලෙස 186.8% ක හිඟයකි. මීට හේතුව වී ඇත්තේ පසුගිය වසර ගණනාවක් තුල සමුච්චිත වරිපනම් හිඟය අසීමිත ලෙස ඒකරාශීවී අය නොවී පැවතීමයි. මෙය සමස්ථයක් වශයෙන් සියළු පළාත් පාලන ආයතනවලට පොදුවූ තත්වයකි. මෙම සභාවේ 2015 වසරේ මුළු ඇස්තමේන්තුගත ආදායම රු.මි.75.2 ක් වන අතර වර්ෂ අවසාන හිඟය රු.මි.50.2 ක් වී ඇත. එය ප්‍රතිශතයක් ලෙස 66.7% කි. බදුල්ල මහා නගර සභාව එකී වර්ෂයේ කටයුතු කර ඇත්තේ සිය ලැබිය යුතු ආදායමින් 66.7% ක ඌණතාවයකින් යුතුව බව මේ අනුව පැහැදිලි වේ. අංක 09 - වගුව බලන්න.

ලංකාවේ පුමුඛතම පළාත් පාලන ආයතන වූ කොළඹ මහා නගර සභාවේ කිසිදු දත්තයක් දිවයිනේ සෙසු කිසිම පළාත් පාලන ආයතනයක් හා සංසන්දනය කළ නොහැකි තරම් විශාල වේ. එහි 2016 වර්ෂයේ ඇස්තමේන්තු ගත වරිපනම් ආදායම රු.මි.3662.7 කි. 2015.09.30 දිනට සත්‍ය වරිපනම් ආදායම රු.මි.4234.2 කි. ඒ අනුව එම වර්ෂයෙන් හිඟය රු.මි.571.5 කි.

මෙය ප්‍රතිශයක් ලෙස 15.6 % කි. එහෙත් කොළඹ මහා නගර සභාවේ 2016.12.31 ට අය විය යුතු සමුච්චිත වරිපනම් හිඟය ගතහොත් මෙම ප්‍රතිශතයන් ඉතා ඉහළ අගයක් ගැනීම නොවැලැක්විය හැකිය. එහි සංඛ්‍යා දත්ත ලබාගැනීම අතිශය දුෂ්කර කාර්යයක් වී ඇති හෙයින් එබඳු සංසන්දනයක් කළ නොහැකි විය. කොළඹ මහා නගර සභාවේ තෝරාගත් ආදායම් මූලයන් පහක (05) 2016 සඳහා මුළු ආදායම රු.මි.3796.7 කි. 2015.12.31 දිනට සත්‍ය ආදායම රු.මි.2849.00 කි. මෙහි පවතින හිඟය ප්‍රතිශතයක් ලෙස 24.9% කි. මේ සඳහා සමුච්චිත ආදායම් හිඟය ගතහොත් එය මීට වඩා ඉතා ඉහළ අගයක් ගනු ඇත. අංක 10 වගුව බලන්න.

7.2 ආදායම් පැනවීමේ ඒකමිතික / විද්‍යාත්මක ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබීම

ඉහත නිදසුන් මගින් පැහැදිලි වන ප්‍රධාන කරුණ වන්නේ පළාත් පාලන ආයතන වෙත ලැබිය යුතු ආදායම් අදාල වර්ෂය තුලදී එකතු කර ගැනීමට එම ආයතන පද්ධතිය අසමත් වී ඇති බවයි. ඉතා ශක්තිමත් නීතිමය පදනමකින් යුතු ආදායම් එකතු කර ගැනීම මෙතරම් ගැටළුවක් වී ඇත්තේ මන්ද යන කරුණ ගැන ද මෙහිදී අවධානය යොමු කිරීම වටී. මෙම ආදායම් පැනවීමේ ක්‍රියාවලිය තුළ දිස්වන දෝෂ සහගත තත්වයන් ද මීට හේතු වී ඇතැයි අනුමාන කළ හැකිය. එසේම පළාත් පාලන ආයතන විසින් වරිපනම්, බලපත්‍ර ගාස්තු, කර්මාන්ත බදු, ව්‍යාපාර බදු, සංවර්ධනය නොකළ ඉඩම් මත බදු ආදියත් නොයෙක් අන්දමේ සේවා ගාස්තු ලෙස සඳහන් කරමින් මහජනතාව වෙත ඉටු කළ යුතු සේවා සඳහා ගාස්තු අය කිරීමේදීත් එම බදුවල නීතියේ සඳහන් උපරිමයන් සහ ගාස්තු වශයෙන් ඉතා අසාධාරණ මිල ගණන් අය කිරීමත් සිදුවනු දැකිය හැකිය. වරිපනම් අය කිරීමේදී ඇතැම් පළාත් පාලන ආයතන ඉතා ඉහළ ප්‍රතිශතයන් ගෙන් යුතුව වරිපනම් අයකරන අතර තවත් සමහර ආයතන ඉතා අඩු ප්‍රතිශතයන් සහිතව වරිපනම් පනවනු ලැබේ. ඇතැම් විට බදු ගෙවන්නන් වෙත ලැබෙන ප්‍රතිලාභ (පහසුකම්) සමග සංසන්දනය කිරීමේදී එබඳු බදු ප්‍රතිශතයක් ගෙවීමට සිදුවීම සාධාරණීකරණය කිරීම ගැටළු සහගතය.

වගුව 11 : දිවයිනේ නගර කිහිපයක 2016 වර්ෂයේ වරිපනම් ප්‍රතිශතය

අංකය	පළාත් පාලන ආයතනය	ව්‍යාපාරික	නේවාසික
1	කොළඹ මහා නගර සභාව	35%	25%
2	මධකලපුව මහා නගර සභාව	14%	10.12%
3	ගම්පහ මහා නගර සභාව	08%	06%
4	දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව	30%	06 %
5	මහනුවර මහා නගර සභාව	15%	09%
6	අනුරාධපුරය මහා නගර සභාව	10%	04.06%
7	යාපනය මහා නගර සභාව	06%	06%
8	හම්බන්තොට මහා නගර සභාව	12%	12%

ප්‍රස්ථාරය 1 :



අංක 11 වගුවෙන් හා අංක 01 ප්‍රස්ථාරයෙන් මනාව පැහැදිලි වන කරුණක් නම් ලංකාවේ මහා නගර සභාවන්හි වරිපනම් ප්‍රතිශතය කිසියම් විද්‍යාත්මක තාර්කික හෝ ගණිතමය සූත්‍රයකට (Formula) අනුව ගණනය නොකරන බවයි. වරිපනම් ප්‍රතිශතය ගණනය කළ යුතු සූත්‍රය 05 වන පරිච්ඡේදයේ 05.1 ඡේදයේ සඳහන් කර ඇත. එබඳු විද්‍යාත්මක පදනමක් මේ සඳහා අනුගමනය කර ඒ පිළිබඳ අවබෝධයක් හා පාරදෘෂ්‍ය භාවයක් පළාත් පාලන ආයතන විසින් අනුගමනය කළහොත් බදු ගෙවීම පිළිබඳ ජනතාවගේ ආකල්ප වෙනස් වී පැනවීම් රටාවෙහි විචල්‍යය අඩු වී බදු ගෙවන්නන්ට ලැබෙන ප්‍රතිලාභ පාරදෘෂ්‍ය වන්නේ නම් බදු අයකිරීම මීට

වඩා පහසුවනු ඇත. දෙහිවල - ගල්කිස්ස, යාපනය, ගම්පහ, හා අනුරාධපුරය යන මහා නගර සභා 6% ක බදු ප්‍රතිශතයක් නේවාසික ස්ථාන සඳහා අයකිරීමත් යාපනය මහා නගර සභාව ව්‍යාපාරික ස්ථාන සඳහා ද 6% ක ප්‍රතිශතයක වරිපනමක් අය කිරීමත් සිදුවී ඇත්තේ ඉහත සාකච්ඡා කළ පරිදි විද්‍යාත්මක සූත්‍රයක් මගින් අය කළ යුතු බදු ප්‍රතිශතය ගණනය නොකිරීම හේතුවෙනි.

7.3 පළපුරුදු ආදායම් නිලධාරීන්ගේ හිඟය :

වරිපනම් හා බදු අයකිරීම ඉහත දුර්වල තත්වයකට පත්වීමට හේතුවී ඇති තවත් කරුණක් නම් පළාත් පාලන ක්ෂේත්‍රය සඳහා මනා දැනුමක් සහිත බදු/ආදායම් නිලධාරීන් නොමැති වීමයි. ආරම්භයේ සිටම ලංකාවේ ප්‍රධාන නගර ඇතුළු ප්‍රමුඛ පළාත් පාලන ආයතනයන්හි බදු අයකිරීම හා ඊට ආනුෂාංගික රාජකාරී සියල්ල ඉටු කරනුයේ ආදායම් පරීක්ෂක (Revenue Inspector) සේවාවේ නිලධාරීන් විසිනි. සෑම මහා නගර සභාවකම විශේෂ ශ්‍රේණියේ හෝ පළමු ශ්‍රේණියේ ප්‍රධාන ආදායම් පරීක්ෂක වරයෙකු (Chief Revenue Inspector) = CRI යටතේ ආදායම් පැනවීම්, එකතු කිරීම් නව ආදායම් වාර්තා කිරීම්, ක්ෂේත්‍ර පරීක්ෂණ, බදු නිදහස් කිරීම්, බදු කපා හැරීම් ආදී කටයුතු රාශියක් සිදුවිය. මෙය නිදහසට පෙර සිටම පැවති ඉතා සක්‍රීය සේවාවකි. එම නිලධාරීන් මනා දැනුමකින්, පළපුරුද්දකින්, පෙනුමකින් සහ ක්‍රියා ශීලිත්වයෙන් යුක්ත පිරිසක් වූහ. එහෙත් පළාත් සභා යටතේ පළාත් පාලනය ක්‍රියාත්මක වීමේ දී සෙසු වෘත්තීන් මෙන්ම මෙයද අඩු වටිනාකමක් සහිත අනුක්‍රමයෙන් වඳවී යන සේවාවක් බවට පත් වෙමින් ඇත. මීට ප්‍රධානම හේතුව වී ඇත්තේ සිය කාර්ය මණ්ඩල අවශ්‍යතා තීරණය කරගැනීමට ඇති අයිතිය, (මහා නගර සභා ආඥා පනතේ 40 වගන්තිය, නගර සභා ආඥා පනතේ 36 වගන්තිය සහ ප්‍රාදේශීය සභා පනතේ 19 වන වගන්තිය බලන්න.) පළාත් පාලන ආයතන වෙතින් රජයේ භාණ්ඩාගාරයට අයත් කළමනාකරණ දෙපාර්තමේන්තුව චක්‍රලේඛනයන් මගින් අත්පත් කර ගැනීමයි. ඒ අනුව දැන් මෙම නිලධාරීන් බඳවාගැනීම, සේවක සංඛ්‍යා තීරණය, තනතුරු ඇති කිරීම, සිදුවනුයේ පළාත් පාලන ආයතනයේ අවශ්‍යතාව මත නොව භාණ්ඩාගාරයේ සිතැඟි අනුවය. එබැවින් කොළඹ මහා නගර සභාව ඇතුළු දිවයිනේ සියළු පළාත් පාලන ආයතනවල සිටි පළපුරුදු ආදායම් පරීක්ෂක සේවාවේ නිලධාරීන් විශ්‍රාම ලද පසු ඇතිවන පුරප්පාඩු සඳහා කලට වේලාවට නිලධාරීන් බඳවා ගැනීමක් සිදු නොවේ. නිදසුන් වශයෙන් කොළඹ මහා නගර සභාවේ මධ්‍යම පාලන හා මූල්‍ය

අංශයෙහි අනුමත කාර්ය මණ්ඩලය 2016 වසර සඳහා 1161 ක් වන විට එහි භෞතික වශයෙන් සිටින සංඛ්‍යාව 798 කි. මෙහි කාර්ය මණ්ඩල 31.2% ක ඌණතාවයකි.[10]

මෙම අභාග්‍ය සම්පන්න තත්වය ලංකාවේ සෑම පළාත් පාලන ආයතනයකම අඩු වැඩි වශයෙන් දක්නට ලැබේ. තාක්ෂණ සේවාවන් සම්බන්ධයෙන් මෙම තත්වය අතිශය අයහපත් ලෙස පවතී. මෙම කරුණ හේතුකොට ගෙන පළාත් පාලන ආයතනයන්හි ආදායම් පැනවීමට එකතු කිරීමට හා ප්‍රවර්ධනය කිරීමට ඉමහත් බාධා පැමිණ ඇත. මේ පිළිබඳව සෘජු මැදිහත් වීමක් සිදු කළ යුතු පළාත් සභාවේ වගකිව යුතු නිලධාරියකු වන පළාත් පාලන කොමසාරිස් වරයාගේ මැදිහත් වීම ශුන්‍ය බව පෙනේ.

7.4 දෝෂ සහගත ආදායම් පැනවීම් හේතු කොට ගෙන අධිකරණ ක්‍රියාමාර්ග සඳහා ඉඩ ප්‍රස්ථා සැලසීම.

මෙම අධ්‍යයනයේදී මහා නගර සභා, නගර සභා සහ ප්‍රදේශීය සභා මගින් 2016 වසර සඳහා වරිපනම්, බලපත්‍ර ගාස්තු හා බදු පැනවීමේ ක්‍රියාවලිය තුළ විවිධ අවස්ථාවන්හි දී සිදු කරන ලද නීතියට පටහැනි, නීතියේ ප්‍රතිපාදන ඉක්මවා යන, (බලාතික්‍රමණ) නීතියේ සඳහන් වගන්ති, ප්‍රතිපාදන ආදිය ව්‍යවස්ථාපිත නිවේදන වල සාවද්‍ය ලෙස දැක්වීම, අතීතයට බලපාන පරිදි බදු පැනවීම, නිසි බලධාරියා විසින් බදු හෝ බලපත්‍ර ගාස්තු පනවා ඇති විට නැවත පළාත් පාලන ආයතනය විසින් එම බද්ද හෝ බලපත්‍ර ගාස්තුව පැනවීම, නීතියේ සඳහන් බදු, බලපත්‍ර ගාස්තු ඉක්මවා බලපත්‍ර ගාස්තු බදු ආදිය පැනවීම. පැනවූ නිලධාරියා සැඟව සිට නිවේදනය පළ කිරීම, රාජ්‍ය භාෂා භාවිතය පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විධිවිධාන උල්ලංඝනය කරමින් සංස්ථාපිත නිවේදන පළ කිරීම ආදී සාවද්‍ය හා නීතියට පටහැනි චර්යාවන් රාශියක් 05 වන පරිච්ඡේදයේ දී විමසුමට භාජනය කරන ලදී.

මෙම දෝෂ කිසිදු ලෙසකින් පළාත් පාලන ආයතනයක් විසින් ආදායම් පැනවීමේ දී නොකළ යුතුය. එතෙකුදු වුවත් 2016 වර්ෂයේ පමණක් නොව වසර ගණාවක සිට බොහෝ පළාත් පාලන ආයතන මෙම සාවද්‍ය ව්‍යවස්ථාපිත නිවේදන වාර්ෂිකව ඉතාම අවිචාරවත්ව පැනවීම නොකඩවා සිදුවේ. මෙය පළාත් පාලන බලධාරීන් සිය නොදැනුවත්කම මත සිදු කරනු ලබන ක්‍රියාවක් සේම සිය නොසැලකිලිමත් බව නිසා සිදුකරන දෙයක් ද විය හැකිය. ඒ කෙසේ

[10] පිටු අංක 41- 42 - 2017 අයවැය ලේඛනය, කොළඹ මහා නගර සභාව, නාගරික මුද්‍රණාලය, හයිඩ්පාක්, කොළඹ 02.

වෙතත් මෙය ඉතාම අවදානම් සහිත ක්‍රියාවකි. අතීතයේදී ද පළාත් පාලන ආයතන මෙන්ම සෙසු බදු හා බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයන් විසින් ද යම් යම් සාවද්‍ය පැනවීම සිදුකර ඇති අවස්ථා රාශියක් අපගේ පරිපාලන නීති සාහිත්‍යයේ දක්නට ලැබේ.

එම අවස්ථාවන් නව නීති වාර්තා (New Law Reports) සහ ශ්‍රී ලංකා නීති වාර්තා (SL Law Reports) යනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණය / අභියාචනා අධිකරණය විසින් වාර්තාකොට සංග්‍රහ කරනු ලැබ ප්‍රකාශයට පත් කර තිබේ. එම වාර්තා නීතියේ සඳහන් ඇතැම් කරුණු තවදුරටත් පැහැදිලිව විග්‍රහ කිරීම් ලෙස සැලකෙන අතර එම නඩුකරයන්හි තීන්දු නීති ලෙස ක්‍රියාත්මක වේ.

එබැවින් මේ කාලයේ විශේෂයෙන් ආදායම් පැනවීම් විෂයෙහි සිදුවන වැරදි සහගත තත්වයන් සම්බන්ධයෙන් මීට ඉහත නව නීති වාර්තා හා ශ්‍රී ලංකා නීති වාර්තාවල දැක්වෙන නිගමන හා තීන්දු මාර්ගෝපදේශ ලෙස භාවිතා කළ හැකිය. ඒ අනුව වර්තමානයේ පළාත් පාලන බලධාරීන් විසින් නිතර සිදුකරන දෝෂ සහගත අවස්ථා කිහිපයක් නිදසුන් සහිතව සලකා බැලීම වැදගත්වේ.

1. නීතිපති එදිරිව ඩබ්.එම්.ප්‍රනාන්දු 79-1 නනීවා 39 මෙයින් ප්‍රකාශ වන්නේ අතීතයට බලපාන පරිදි බද්දක් පැනවිය හැකිද යන කරුණයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 75 වන ව්‍යවස්ථාවට අනුව අතීතයට බලපාන ලෙස නීති පැනවීමට බලය ඇත්තේ පාර්ලිමේන්තුවට පමණි. අනුනීති පැනවීම සම්බන්ධයෙන් එවැනි බලයක් යම් අධිකරණයකට පැවරී නැත. මේ නඩුවේදී ලොතරැයි ආඥා පනතේ 19 වන වගන්තියෙන් නියෝජිත මංත්‍රී මණ්ඩලය වෙත, සෑම ලොතරැයියකම දළ ආදායම මත බද්දක් පැනවීමට දෙන ලද බලය අනුව අතීතයට බලපාන ලෙස බද්දක් පැනවිය හැකිද යන්න සලකා බලා ඇත. මෙහිදී අධිකරණය තීරණය කර ඇත්තේ අතීතයට බලපාන ලෙස බදු පැනවීමට එම ආඥාපනතින් ප්‍රකාශිතව හෝ පැහැදිලි ව්‍යංගයෙන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට බලය පවරා නැති බවයි. ඒ අනුව බදු පැනවීම හෝ අතුරු ව්‍යවස්ථා පැනවීම අතීතයට බලපාන පරිදි කළ නොහැකි අතර එසේ වූ විට අවලංගු වේ.

   මෙම අධ්‍යයනයේ දී ආයතන ගණනාවක් 2016 වසරට බදු පැනවීම් කර තිබුණේ 2016 වසරේ මැද භාගයේදී බව අනාවරණය විය. මෙය සාවද්‍ය පැනවීමකි.

2. පෙරේරා එදිරිව ප්‍රනාන්දු 17 නනීවා 494 සහ සෞඛ්‍ය පරීක්ෂක එදිරිව : හරමානිස් 19 නනීවා 339 - 1898 අංක 18 දරන සනීපාරක්ෂක සභා ආඥා පනත යටතේ එක් සනීපාරක්ෂක සභාවක් (Sanitary Board) අතුරු ව්‍යවස්ථාවක් මඟින් පොදු වෙළඳ පොළෙන් පිටත ස්ථානවල මාළු වෙළඳාම තහනම් කොට තිබුණි. අතුරු ව්‍යවස්ථාවකට කළ හැක්කේ පොදු වෙළඳසැල තුළ එය භාවිතා කරන පුද්ගලයින්ගේ කටයුතු විධිමත් කිරීම මිස එයින් බාහිර කටයුතු තහනම් කිරීමට යාම නොවේ. මෙම දෝෂය පළාත් පාලන ආයතන ගණනාවක තිබුණි. මෙම දෝෂය වාහන නතර කිරීමේ ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් ආයතන කිහිපයක්ම මෙම මූලධර්මයට පටහැනිව ක්‍රියාකර තිබුණි. එසේ කර තිබුයේ ''මෙම පළාත් පාලන ආයතනය තුල කිසිම ස්ථානයක අදාල ගාස්තු ගෙවීමකින් තොරව වාහන නතර කිරීම නොකළ යුතුය'' යන්න සඳහන් කිරීමෙනි. එවිට කිසිදු තැනැත්තෙකුට තම පරිශ්‍රයෙහි හෝ අදාල ගාස්තු පළාත් පාලන ආයතනයට නොගෙවා වාහනයක් නතර කර තැබිය නොහැකි වේ. මෙය මූලික මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක්ද වන්නේය.

3. ජයසූරිය එදිරිව රූපසිංහ 26 නනීවා 321

මෙයින් දක්වා ඇත්තේ ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් (Trade) නොවන ක්‍රියාකාරකමක් ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් ලෙස සලකා කටයුතු කිරීම බලාතික්‍රමණයක් බවයි. එක් දිස්ත්‍රික් සභාවක් යම් පුද්ගලයෙක් කබුක් ගල් කැපීම අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාරයක් ලෙස සලකා ඔහුට එරෙහිව නඩු පවරා තිබුණි. විත්ති වාචකය පෙන්වා දී ඇත්තේ තමා සිය නිවස තැනීමට තම ඉඩමෙහි කබුක් ගල් කපන බවයි. එය වෙළඳාමක් හෝ කර්මාන්තයක් නොවන බව අධිකරණය පිළිගෙන ඇත.

4. සනීපාරක්ෂක සභා පරීක්ෂක එදිරිව ලව්නේරිස් 17 නනීවා 275 අතුරු ව්‍යවස්ථා ප්‍රකාර සනීපාරක්ෂක සභාවලට එළවළු හා පළතුරු විකිණීම විධිමත් කිරීමට බලපත්‍ර නිකුත් කිරීමට ඉඩකඩ පැවතුනි. ඒ යටතේ බලපත්‍රයක් නොමැතිව බුලත් විකිණීම සම්බන්ධයෙන් එක් තැනැත්තෙකුට එරෙහිව පරීක්ෂකවරයෙකු විසින් අභිචෝදනා ඉදිරිපත් කර තිබුනි. අධිකරණය තීන්දු කළේ බුලත් යනු එළවළුවක් නොවන බැවින් ඊට එම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍ර නිකුත් කළ නොහැකි බවයි.

5. වැලිගම නගර සභාව එදිරිව අයි එල් එම් එම් අසුරන් 66 තනීවා 41 - බොහෝ පළාත් පාලන ආයතන අතුරු ව්‍යවස්ථාවන්හි ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය සඳහා ගාස්තු චක්‍රයක් නොමැතිව ඒ ඒ අවස්ථාවල සභා තීරණ මඟින් විවිධ ගාස්තු අය කෙරේ. මෙය බලානික්‍රමණයකි. අතුරු ව්‍යවස්ථාවේ අනුමත කර නැති ගාස්තුවක් අවස්ථානුකූලව සභාවේ නිළධාරීන්ට අය කළ නොහැකිය.

6. සීමිත ක්‍රෙස්ට් ජේම්ස් එදිරිව කොළඹ මහා නගර සභාව (2003) 1 ශ්‍රී ලංනීවා 370 -
මෙය ඉතා වැදගත් නඩු තීන්දුවකි. ලේඛනයේදී භාවිත කරනු ලබන ඇතැම් පද අවිනිශ්චිත (Ambiguous) වේ. මෙවැනි වචන නීති කෙටුම්පත් කරණයේදී භාවිතා නොකළ යුතුය. එසේ කළ යුතුවූ විටක ඊට අර්ථ නිරූපණයක් දිය යුතුය. ඉංග්‍රීසි Trade යන පදය මිලයට ගෙන විකිණීම මෙන්ම විකිණීම සඳහා නිපදවීමද අදහස් කෙරේ. මහා නගර සභා ආඥා පනතේ 247 අ සහ 247 ආ වගන්තිවල Trade යන්නට ''කර්මාන්තය'' යන පදය යොදා තිබේ. මේ වගන්තිවල අර්ථ නිරූපණ දී නැත. මහා නගර සභා ආඥා පනත යටතේ කොළඹ මහා නගර සභාවට ඉදිරිපත් වූ නීති කෘත්‍යයකදී අභියාචනා අධිකරණය සඳහන් කර ඇත්තේ ''කර්මාන්තය'' යන්නෙන් "Industry" යන්න අදහස් කරන බවයි. මේ අනුව වෙළඳ ව්‍යාපාර වලින් බදු ලබා ගැනීම අපහසු වී තිබේ.

7. මරික්කාර් එදිරිව පුංචිහේවා - 39 නනීවා 412 - සභා රැස්වීමකදී ගණපූරණය පැවතීම අනිවාර්ය කාරණයකි. එසේ නොවුන හොත් එබඳු රැස්වීමක දී සම්මත කරන ලද යෝජනාව අවලංගු හෙවත් බලරහිතවේ. ගණපූරණය නොමැති නිසා රැස්වීමක දී සභාපතිවරයා තෝරා පත් කර ගැනීම පිණිස සම්මත කරන ලද යෝජනාවක් අවලංගු වන බව අධිකරණය තීරණය කර ඇත. වර්තමානයේ මෙම කරුණ බහුල ලෙස සිදු වුවද නොදැනුවත්කම මත හෝ නොසැලකිල්ල මත ඒ පිළිබඳ තැකීමක් නොකිරීම වැරදි සහගත වේ.

8. යාපනය මහා නගර සභාව එදිරිව පෙරුමෙයිනාර් - 66 නනීවා 327 -
රැස්වීමක ගණපූරණය නොමැතිව තීරණ ගැනීම බලරහිත වේ. බදු පැනවීමේදී හෝ වෙනත් යම් යෝජනා සම්මතයේ දී ඒ යෝජනාව සභාවට ඉදිරිපත් කර ස්ථිර කරන ලද්දේ නම් මිස විවාදයට ඉඩ නොදිය යුතුය. යෝජනාව ස්ථිර කළ පසු විවාදකර එය අවසානයේ

ඡන්දය විමසිය යුතුය. යාපනය මහා නගර සභාවට විනෝද බදු පැනවීමට ඉදිරිපත් වූ යෝජනාවක් ස්ථිර නොකර විවාදකර තිබුණි. එයට ඡන්ද විමසීමක්ද කර නැත. එහෙත් සම්මත වූයේ යයි සලකා ගැසට් පත්‍රයේ නිවේදනය පළ කර ඇත. විනෝද බදු අය කිරීම සඳහා වූ නඩුකරයක දී වගඋත්තරකාර පෙරුමෙයිනාර් විත්ති වාචිකයේදී සඳහන් කර ඇත්තේ සභාව විසින් විනෝද බදු පනවා නැති බවයි. යෝජනාව ස්ථිර කළ බව මෙන්ම ඡන්දය විමසා සම්මත කළ බව සභා වාර්තාවෙහි අනිවාර්යයෙන්ම සටහන් විය යුතුය. මෙහිදී එය සිදුව නොමැති නිසා විත්ති වාචකය පිළිගත් අධිකරණය ඔහු විනෝද බදු ගෙවීමට බැඳී නැති බව තීරණය කර ඇත. මෙය ඉතා බහුලව අද දිනයේ ද සිදුවන කරුණකි.

9. ටී.ඩී.ඕ.ජාන්සන් එදිරිව දෙහිවල ගල්කිස්ස නගර සභාව - 56 නනීවා 445

   බලපත්‍රයක් නොමැතිව උළු නිපදවීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ජාන්සන් නැමැත්තෙකුට එරෙහිව අභිචෝදනා කර තිබුණි. අදාල කාර්ය සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබූ බැවින් චූදිත විසින් නීතියක් උල්ලංඝනය කර නොමැති බව අධිකරණය විසින් තීරණය කරන ලදී.

10. i. ගුණසේකර එදිරිව නාගරික ආදායම් පරීක්ෂක 53 නනීවා 229

    ii. සිල්වා එදිරිව කුරුණෑගල සමුපකාර සමිතිය - 57 නනීවා 430

    iii. කේ ඒ දොන් ඇල්බට් එදිරිව නාගරික ආදායම් පරීක්ෂක 65 නනීවා 1

පළාත් පාලන ආයතන වාර්ෂිකව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන බලපත්‍ර ගාස්තු පැනවීමට අදාල නිවේදනවල ඇතැම් ද්‍රව්‍ය ''ගබඩා කිරීම'' බලපත්‍රයක් ලබාගත යුතු ව්‍යාපාරයක් ලෙස සඳහන් කර තිබේ. ''ගබඩා කිරීම'' ව්‍යාපාරයක් වන්නේ කිසියම් තැනැත්තෙකු තවත් පුද්ගලයෙකුගේ භාණ්ඩ, ගාස්තුවක් අයකර ගෙන කිසියම් කාල පරිච්ඡේදයක් තුළ තම සන්තකයේ පවතින ගොඩනැගිල්ලක තබා ගැනීමෙනි. විකිණීම සඳහා යම් භාණ්ඩ තබා ගැනීම ගබඩා කිරීමක් නොවේ. ඒ අනුව විකිණීමට සහල් තබා ගැනීම හෝ වෙන්දේසි කරුවෙකු අන්‍යයන්ගේ ලීබඩු තම පරිශ්‍රයක තබා ගැනීම බලපත්‍ර ලබාගත යුතු ගබඩා කිරීමක් නොවේ.

මෙබඳු අවස්ථා සියගණන් මෙම අධ්‍යයනයේ පස්වන (05) පරිච්ඡේදයෙහි දක්වා ඇත. මෙම තත්වය අපගේ පළාත් පාලන ආයතනවල නිළධාරීන්ට වටහාගත නොහැකි වීම විමතියට කරුණකි.

11. කළමණාකාර අධ්‍යක්ෂ, පොල්හේන රීත් ගාඩන්ස් හෝටලය එදිරිව මාතර නගර සභාවේ ආදායම් පරීක්ෂක (2004) 1 ශ්‍රී ලංකීවා 362

    පනවා ඇති අතුරු ව්‍යවස්ථාවක් අනුව බලපත්‍රයක් ලබා ගත යුතු යයි නියම කර ඇති යම් කාර්යයක් බලපත්‍රයක් නොමැතිව කරගෙන යාම වරදකි. මෙවැනි වරදක් සඳහා යම් තැනැත්තෙකුට එරෙහිව අභිචෝදනයක් කිරීම වරද සිදු කිරීමෙන් පසු ඊළඟට එළඹෙන මාස හය (6) ඇතුලත ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස යම් තැනැත්තෙකු දණ්ඩනයට යටත් කළ නොහැකිය.[11]

    මෙහි සඳහන් මාස 6 ක කාල පරිච්ඡේදය සම්බන්ධයෙන් විවිධ මත පවතී. එසේ වුවද මෑතකදී තීරණය කරන ලද නඩුවකදී මේ පිළිබඳ පැහැදිලි නිර්වචනයක් අධිකරණය විසින් ප්‍රකාශ කරනු ලැබ ඇත. (2004 1 ශ්‍රීලනීවා 362) වුදිත 1997 වසරේ දී බලපත්‍රයක් නොමැතිව ව්‍යාපාරයක් පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් 1998-05-25 දින අභිචෝදනය ඉදිරිපත් කර තිබේ. 1997-12-31 වන දින ව්‍යාපාරය පවත්වාගෙන ගියේ නම් 1998-05-25 දින වන විට මාස 6 ක කාල සීමාව ඉක්මවා නොමැති බැවින් චෝදනාව අධිකරණය භාර ගෙන ඇත. කිසියම් වසරක දෙසැම්බර් මස 31 වන දින ව්‍යාපාරය කරගෙන ගියේ නම් අනුගාමී වර්ෂයේ ජූනි 30 වන දින හෝ ඊට පෙර අභිචෝදනය ඉදිරිපත් කළ යුතුවේ. මෙම නඩු තීන්දුව වර්තමානයේ පළාත් පාලන බලධාරීන් විසින් තරයේ සිය අවධානයට ගත යුතු එකකි.

12. ගාල්ල නගරාධිපති එරෙහිව ද ස්ටේට් ඇන්ඩ් මෝටර් ඉංජිනියරින් කම්පැනි - 41 නනීවා 179 පළාත් පාලන ආයතන වල සේවය කරන බොහෝ නිලධාරීන්ගේ මතය වන්නේ බලපත්‍රයක් ලබාගත යුතුයයි අතුරු ව්‍යවස්ථාවකින් නියම කර ඇති විට බලපත්‍රය නිකුත් නොකරන ලද්දේ වුවද බලපත්‍ර ගාස්තුව අය කර ගැනීමට සභාවට හිමි කමක් ඇති බවයි. මේ මතය අනුව ඇතැම් නිලධරයන් බලපත්‍ර ගාස්තුව නොගෙවීම වරදක් ලෙස සලකා

[11] ඔහා නගර සභා ආඥා පනතේ 308, නගර සභා ආඥා පනතේ 219 සහ ප්‍රාදේශීය සභා පනතේ 213 යන වගන්ති බලන්න.

චෝදනා පත්‍ර ඉදිරිපත් කරනු ලැබේ. එමෙන්ම හිඟ බලපත්‍ර ගාස්තු අය කර ගැනීම සඳහා ද අභිචෝදනා ඉදිරිපත් කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් වාර්තා වී ඇති නීති කෘත්‍යයන්හි දී අධිකරණය තීරණය කර ඇත්තේ බලපත්‍ර ගාස්තු නොගෙවීම වරදක් නොවන බවයි. බලදායී වගන්තිවල විධිවිධාන අනුව මුදල් අය කළ හැක්කේ නිකුත් කරන ලද බලපත්‍ර සම්බන්ධයෙන් පමණි. නිකුත් නොකරන ලද බලපත්‍රයක් සම්බන්ධයෙන් ගාස්තුවක් අයකළ නොහැකිය.[12]

13. ඩේවිඩ් එදිරිව අබ්දුල් කාදර් 65 නනීවා 253 හා 77 නනීවා 18

ප්‍රසිද්ධ රැඟුම් ආඥාපනත යටතේ සිනමා ශාලාවකට බලපත්‍ර නිකුත් කිරීම පුත්තලම නගර සභාවේ සභාපතිවරයා විසින් ප්‍රතික්ෂේප කිරීම නිසා වන්දි ඉල්ලා පවරන ලද නඩුවකි. රාජාධිකරණයේ තීන්දුව අනුව කිසිදු බලපත්‍රයකට කොන්දේසි ඇතුලත් කළ නොහැකි බව දක්වා ඇත. රාජාධිකරණය ඩේවිඩ් යන අයගේ විත්තිවාචකය පිළිගෙන ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයට නඩුකරය නැවත විමසා චුදිතට සිනමා ශාලාව වසා තැබූ අවුරුදු (2) දෙකක කාලය තුළ අහිමිවූ ආදායම් වන්දි වශයෙන් සභාපති වරයාගේ පෞද්ගලික මුදලින් ගෙවන ලෙස නියෝග කර ඇත. මෙම නඩු තීන්දුව අතීතයට වඩා වර්තමානයට බෙහෙවින් අදාලවන ඉතා වැදගත් තීන්දුවකි.

14. ෆර්ඩිනැන්ඩස් එදිරිව කොළඹ මහා නගර සභාව 49 - නනීවා 519

මෙයින් ප්‍රකාශිතව ඇත්තේ කොළඹ මහා නගර සභාව කිසියම් කාර්තුවක් අවසාන වූ වහාම ගෙවිය යුතු වරිපනමට වරෙන්තු ගාස්තු එකතු කර අය කිරීමට දරන ලද උත්සාහයට එරෙහිව ඇති වූ නඩුකරයකි. එහිදී අධිකරණය තීරණය කර ඇත්තේ වරෙන්තු ගාස්තුවක් උපචිත වන්නේ වරෙන්තුවක් නිකුත් කර එය ක්‍රියාත්මක කළහොත් පමණක් බවය.

මෙම අධ්‍යයනයේ 5 වන පරිච්ඡේදයේ සඳහන් නියැදිගත පළාත් පාලන ආයතන බහුතරය වරෙන්තු ගාස්තු පමණක් නොව දඩ පවා වරිපනම් පැනවීමේ නිවේදනයේ ම සඳහන් කර කාර්තුව අවසාන වූ දිනට පසු දින සිට එම ගාස්තු ගෙවිය යුතු බවට නියම කර ඇත.

---

[12] පිටු අංක 38, 39 හා 40 පළාත් පාලන අතුරු ව්‍යවස්ථා සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය 2009ී පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය,

මෙම නීතියට පටහැනි පරිචයන් සිදු කරන නිලධාරීන් හට මේ පිළිබඳව නිසි අවබෝධයක් ලබාදීම ඉතා හදිසි අවශ්‍යතාවයකි.

ඉහත දැක්වූ නනීවා / ශ්‍රී ලංනීවා සියල්ල, සාවද්‍ය ලෙස ආදායම් පැනවීම හේතුකොට ගෙන පළාත් පාලන බලධාරීන්ට මුහුණ පෑමට සිදුවූ අධිකරණ ක්‍රියාවලීන් වේ. ආදායම් පැනවීම් ක්‍රියාවලිය ඉතා කල්පනාකාරීව හොඳ අවබෝධයකින් යුතුව සිදු කළ යුතු ඉතා වැදගත් කාර්යයකි. මෑතදී පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද තොරතුරු දැනගැනීම පනත දැන් ක්‍රියාත්මක හෙයින් මෙම විෂයන්ට අදාලව තීරණ ගත් ආකාරය හා පළ කරන ලද නිවේදන බදු ප්‍රමාණ ආදී සෑම තොරතුරක් ම මහජනතාවගේ ඉල්ලීමක දී ඔවුන් වෙත ලබා දීමට පළාත් පාලන ආයතන බැඳී සිටින බැවින් ආදායම් පැනවීමේදී පළාත් පාලන ආයතන ඉතා පැහැදිලි අවබෝධයකින් යුතුව කටයුතු කිරීම අත්‍යාවශ්‍යවේ.

7.5 විභව ආදායම් ප්‍රභවයන්හි ඌණ භාවිතය

සාපේක්ෂ වශයෙන් බලන කල ලංකාවේ පළාත් පාලන ආයතන වෙත පැවරී ඇති ආදායම් මාර්ග සීමිතය. එම සීමිත ආදායම් ප්‍රභවයන්ගෙන් උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීමට එම ආයතන සමත් වී නැති බව පෙනේ. මෙසේ පළාත් පාලන ආයතන වෙත පැවරී ඇති ආදායම් මාර්ගයන්හි ඌණ භාවිතය සැකෙවින් විමර්ශනය කිරීම වැදගත් වේ.

7.5.1 වරිපනම් / දේපල බදු

මෙරට පළාත් පාලන ආයතන සතු ප්‍රමුඛතම ආදායම් ප්‍රභවය වරිපනම් හෝ දේපල බදු ලෙස හැඳින්විය හැකිය. ලංකාවේ සියළු මහා නගර සභා සහ නගර සභා බල ප්‍රදේශයක්ම දියුණු කළ ප්‍රදේශ ගණයට අයත්වන නිසා ඒ සියළුම ප්‍රදේශත් ප්‍රාදේශීය සභාවන්හි දියුණු කළ ප්‍රදේශ ලෙස හඳුනාගෙන ඇති ප්‍රදේශ පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා විසින් අනුමත කර ගැසට් පත්‍රයේ පළකරනු ලබන ප්‍රදේශත් වරිපනම් අය කිරීමේ කාර්යය සඳහා සුදුසුකම් ලබා තිබේ. වරිපනම් හෙවත් දේපල බදු ලෝකයේ බෙහෝ රටවල පළාත් පාලනයට ගැනෙන ප්‍රමුඛ ආදායම් මාර්ගයකි. මෙය අය කිරීම හා එහි ඉපැයීම් පරිමාව (Yield) ගණනය කිරීම සංකීර්ණ කාර්යයක් නොවේ. එබැවින් එය පළාත් පාලනයෙහි ඉතාම බහුලව යොදා ගන්නා බදු ආදායම ලෙස පිළිගැනේ. එහි ආදායම (Yield) ඉහල අගයක් ගන්නා අතර ස්ථාවර වුවක් ද වේ. එය සමානාත්මතා මූලධර්මයට එකඟ වුවකි. සමාජයේ ඇති හැකි ධනවත් පිරිස

සාමාන්‍යයෙන් වඩා වටිනා දේපල භුක්තිවිඳී. එවිට ඔවුන් නිසැකවම වැඩි දේපල බද්දක් ගෙවිය යුතුය. අඩු ආදායම් ලාභී දිළිඳු පුද්ගලයින් එතරම් වටිනා දේපල හිමිකරුවෝ නොවෙති. ඒ අනුව තමා සතු ආර්ථික හැකියාව මත මෙම බදු බර අඩු වැඩිවේ. සාපේක්ෂ වශයෙන් මෙම බදු ආදායම එකතු කර ගැනීමට වැයවන මුදල අඩු ප්‍රමාණයකි. එබැවින් එහි කාර්යක්ෂමතාවය ඉහල අගයක් ගනී.

එතෙකුදු වුවත් ලංකාවේ බොහෝ පළාත් පාලන ආයතන මෙයින් නිසි ඵලදායිතාවය ලබා නොගන්නා බව පෙනේ. මෙම අධ්‍යයනයේ නියැදිගත ආයතන අතුරින් රත්නපුර මහා නගර සභාව, හපුතල් නගර සභාව, මධ්‍යම නුවරගම් පලාත ප්‍රාදේශීය සභාව, තමන්කඩුව ප්‍රාදේශීය සභාව, නිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව , සේරුවිල ප්‍රාදේශීය සභාව, නානාටාන් ප්‍රාදේශීය සභාව, කරච්චි ප්‍රාදේශීය සභාව සහ මුහුදු බඩ පත්තු ප්‍රාදේශීය සභාව 2016 වර්ෂය සඳහා ගැසට් නිවේදන මගින් වරිපනම් පනවා තිබුනේ නැත. මෙකී පළාත් පාලන ආයතන සියල්ලම වරිපනම් / දේපල බද්ද සඳහා සුදුසුකම් ලබන ප්‍රදේශ රාශියකින් සමන්විත වේ. ඒවාහි යටිතල පහසුකම්, පොදු පහසුකම්, වෙළඳ ව්‍යාපාර සංස්කෘතික අවශ්‍යතා ආදිය දියුණු මට්ටමක පවතී. එහෙත් ඒ ප්‍රාදේශීය සභා සිය දියුණු කළ ප්‍රදේශ වලට හෝ වරිපනම් පැනවීමේ සුදානමක නොසිටි බව නිරීක්ෂණය විය. එසේම දිවයිනේ වරිපනම් අයකරනු ලබන සෙසු පළාත් පාලන ආයතන පවා විධිමත් පරිදි කාලීනව දේපල තක්සේරු කිරීම් සිදුකර නොමැත. උදා:- යාපනය මහා නගර සභාව 1990 ට පසු 2013 දක්වා තක්සේරු ප්‍රතිශෝධනයන් සිදුකර නොතිබුනි. පළාත් පාලන ආයතනයන්හි දේපල තක්සේරු කිරීම පංච වාර්ෂිකව සිදුකළ යුතු බවට 1971 අංක 48 දරණ පළාත් පාලන බලමණ්ඩල විශේෂ විධිවිධාන පනත අනුව අනිවාර්ය කර තිබුණු අතර පසුව ඒ පිළිබඳව 1979 අංක 57 දරණ පනත මගින් කරන ලද සංශෝධනය අනුව අමාත්‍යවරයා ගේ විධානයක් මත නව තක්සේරුවක් කිරීමට පළාත් පාලන ආයතන වෙත බලය ලබා දී තිබුණ ද වර්තමානයේ එම වැඩ පිළිවෙළ යථාවත්ව සිදු නොවේ. කොළඹ මහා නගර සභාව හැරුණු විට අන් කිසිදු ආයතනයක නාගරික තක්සේරුකරුවෙකු හෝ තක්සේරු දෙපාර්තමේන්තුවක් නැත. එබැවින් එම ආයතනවල දේපල තක්සේරු කිරීමට ප්‍රධාන තක්සේරුකරුට අවකාශය ලැබෙන තුරු සිටිය යුතුව ඇත. මේ සඳහා වසර ගණන් ගතවේ. මෙම දේපල තක්සේරු කරණය නව ක්‍රමවේදයකට අනුව සිදුකළ හැකි නම් මෙරට පළාත් පාලන ආයතනවල ආදායම සැලකියයුතු ප්‍රමාණයකින් වැඩි කිරීමට

එය ඉවහල් වනු ඇත. තවද බෙහෝ නගර සභා සහ මහා නගර සභාවන්හි වරිපනම් ප්‍රතිශතය 4% - 8% අතර ප්‍රමාණයන්හි පවතී. සිය සේවා තත්වය ඉහල ගුණාත්මක බවකින් පවත්වාගෙන යාමට වඩා දේශපාලන හේතු මත මෙසේ ඉතා අඩු වරිපනම් ප්‍රතිශතයක් වසර ගණනාවක් පවත්වාගෙන යාම හා නිග වරිපනම් එකතු කිරීමට ක්‍රියාමාර්ග නොගැනීම මෙම වටිනා ආදායම් මූලයෙහි අගය හීන කිරීමට හේතු වී ඇත. එබැවින් උක්ත හේතු මත මෙම ආදායම් මූලය ඌණ භාවිතාවට ලක්ව ඇති බව සනාථ වී ඇත.

7.5.2 අක්කර බදු

අක්කර බදු අයකිරීම සඳහා නීතියේ විධිවිධාන සැලසී ඇත්තේ ප්‍රාදේශීය සභාවන්ට පමණි. මෙම අධ්‍යයනය සඳහා තෝරා ගත් ප්‍රාදේශීය සභා 21 න් නිවැරදි ලෙස අක්කර බදු පනවා අය කරන එකම ප්‍රාදේශීය සභාවක් වත් නොවිය. ප්‍රාදේශීය සභා 10 ක් සාවද්‍ය ලෙස පැනවීම් කර තිබුනි. තවත් ආයතන 11 ක් අක්කර බදු පනවා නොතිබුනි. ඒ අතුරින් කොටිකාවත්ත මුල්ලේරියාව හා බියගම දියුණු ගම් ප්‍රදේශ වන අතර මුළු ප්‍රදේශයම වරිපනම් සඳහා ඇතුලත් වේ. එහෙත් සෙසු ආයතන නවය (09) අක්කර බදු පනවා නොතිබීම සම්බන්ධව සාධාරණ හේතුවක් ඉදිරිපත් කිරීමට අදාල නිලධාරීන් අපොහොසත් වුහ. ලංකාවේ සෑම පළාතකම පිහිටි ප්‍රාදේශීය සභාවන්ට අක්කර බද්ද අය කළ හැකිය. මෙයද ඉතා සරල බද්දකි. එකතු කිරීමේ පිරිවැය ඉතා අඩුය. එහෙත් බොහෝ ග්‍රාමීය පළාත් පාලන ආයතන මෙම බද්ද පැනවීමට හා අය කිරීමට දක්වන මැලිබව පුදුම සහගතය. ඊට එරෙහිව විගණාධිපතිවරයා විසින් හෝ පළාත් පාලන කොමසාරිස්වරුන් විසින් කිසිදු විමසීමක් කර නොතිබුනි. ඒ අනුව පෙනී යන්නේ අක්කර බද්ද ඌණ භාවිතයට ලක්වූ ස්ථාවර බදු විශේෂයක් බවය යන්න සඳහන් කළ යුතුව ඇත.

7.5.3 බලපත්‍ර ගාස්තු

බලපත්‍ර ගාස්තු ඉතා පැහැදිලි හා පාරදෘෂ්‍ය භාවයෙන් යුතුව පැනවිය යුතු සැලකිය යුතු තරම් විශාල ආදායම් මාර්ගයකි. බලපත්‍ර ගාස්තු පැනවීමේදී කිසියම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් නියාමනය කිරීම සඳහා අනිවාර්යයෙන්ම අතුරු ව්‍යවස්ථාවක් තිබිය යුතුය. වර්තමාන පරිචය වී ඇත්තේ කිසියම් කර්මාන්තයකට අතුරු ව්‍යවස්ථා තිබුණත් නැතත් එය බලපත්‍ර ගාස්තු නිවේදනය සමඟ වූ උපලේඛනයට ඇතුලත් කිරීමයි. ඇතැම් මහා නගර සභා

නගර සභා සහ ප්‍රාදේශීය සභා සිය ගණනක් වූ කර්මාන්ත මීට ඇතුල් කරනු ලබයි. මේ සෑම කර්මාන්තයකටම (Trade) අතුරු ව්‍යවස්ථාවක් තිබිය යුතුය යන්න සම්පූර්ණයෙන්ම අමතක කරනු ලබයි. ඒ අනුව මෙම බලපත්‍ර ගාස්තු අයකිරීමේ ක්‍රියාවලිය බෙහෙවින් නිශ්ක්‍රිය අභ්‍යාසයක් බවට පත්වී තිබේ. මේ වන විට සම්මත අතුරු ව්‍යවස්ථා පනවා ඇත්තේ මහා නගර සභා සම්බන්ධයෙන් 57 ක් ද නගර සභා සම්බන්ධයෙන් 29 ක් ද ප්‍රාදේශීය සභා සඳහා 32 ක් ද වශයෙන් ඉතා සීමිත සම්මත අතුරු ව්‍යවස්ථා සංඛ්‍යාවකි. මේ අතුරින් බදු හා බලපත්‍ර ගාස්තු සඳහා අදාල කරගත හැක්කේ ඉතා සීමිත සම්මත අතුරු ව්‍යවස්ථා සංඛ්‍යාවකි. විශේෂයෙන්ම අප්‍රසන්න හා අන්තරායකාරී ව්‍යාපාර සඳහා වෙන් වෙන්ව අතුරු ව්‍යවස්ථා තිබිය යුතු වුවත් එසේ ඒ ඒ කර්මාන්තය සඳහා වෙන් වෙන් වශයෙන් අතුරු ව්‍යවස්ථා පනවා නැත. මේ නිසා පළාත් පාලන ආයතන වලට බලපත්‍ර ගාස්තු පැනවීමට නීතියේ සලසා දී ඇති ඉඩකඩ තවදුරටත් සීමා වී ඇත. මීට ප්‍රතිකර්ම ලෙස කළ යුත්තේ ප්‍රධාන පාලන නීති (ප්‍රඥප්ති) වල සඳහන් සියළු විෂයයන් සඳහා සම්මත අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර පළාත් සභාවේ විෂය භාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කිරීමයි. එමගින් පළාත් පාලන ආයතන වෙත විශාල පරාසයක වෙළඳ ව්‍යාපාර හා කර්මාන්ත විධිමත් කිරීමේ හැකියාවත් බලපත්‍ර නිකුත් කර ගාස්තු අය කිරීමේ ඉඩ ප්‍රස්ථාවත් විවර වේ. මෙම අධ්‍යයනයේදී අනාවරණය වූ කරුණු අනුව බලපත්‍ර ගාස්තු නිවැරදිව පනවා ඇත්තේ ආයතන 12 ක් අතුරින් හම්බන්තොට මහා නගර සභාව පමණි. නගර සභා 15 ක් අතුරින් කිසිම ආයතනයක් නිවැරදිව බලපත්‍ර ගාස්තු පනවා නොතිබුණි. ප්‍රාදේශීය සභා 21 ක් අතුරින් නිවැරදිව බලපත්‍ර ගාස්තු පනවා ඇත්තේ ආයතන 2 ක් පමණි. ආයතන 6 ක් බලපත්‍ර ගාස්තු පනවා නොතිබුනි.

7.5.4.(1) කර්මාන්ත බද්ද

මෙම බද්ද බලපත්‍ර ලබාගත යුතු නොවන හා ව්‍යාපාර බද්දට යටත් නොවන කර්මාන්ත සඳහා පැනවිය හැකි ඉතා ඉහල නම්‍යතාවයකින් යුතු බද්දකි. එහෙත් ඊට ඇතුලත් විය යුතු කර්මාන්ත හඳුනා ගැනීමේදී බොහෝ පළාත් පාලන ආයතන සංකීර්ණ ගැටළුකාරී තත්වයන්ට මුහුණ පා සිටී.

මෙම අධ්‍යයනයේදී මහා නගර සභා 12 ක් අතුරින් මෙම බද්ද නිවැරදිව පනවා තිබුනේ හම්බන්තොට මහා නගර සභාව පමණි. නගර සභා 15 ක් අතුරින් එකම ආයතනයක් වත්

මෙය නිවැරදිව පනවා නොතිබුනි. ප්‍රාදේශීය සභා 21 අතුරින් ආයතන එකක් (1) ක් නිවැරදිව පනවා තිබුනි. ආයතන හයක් (6) බද්ද පනවා නොතිබුනි. මෙය පළාත් පාලන ආයතන සතු ඉතා සඵල ආදායම් මූලයකි. එබැවින් ඒ පිළිබඳව ඇති බාධා ඉවත් කර දීමෙන් මෙම ඌණ භාවිත තත්වය පිටු දැකිය හැකිවනු ඇත.

7.5.4 ව්‍යාපාර බදු

වර්තමානයේ පළාත් පාලන ආයතන බොහොමයකට ව්‍යාපාර බද්ද අයකළ යුතු ව්‍යාපාර හඳුනාගැනීම පිළිබඳ ගැටළුවක් පවතී. ඔවුන් බොහෝ විට මෙම බදු සියල්ල සම්මිශ්‍ර කර ගැසට් නිවේදන පළ කරනු ලැබේ. මෙය ඉතා සාවද්‍ය පරිචයකි. බලපත්‍ර ගාස්තු අදාල නොවන කර්මාන්ත බද්දට යටත් නොවන ව්‍යාපාර මීට අයත් වන්නේය. ව්‍යාපාරය යන්න පනතේ නිර්වචනය කර තිබුනද එය බොහෝ නිලධාරීන් නිවැරදිව වටහාගෙන නැත. මෙම අධ්‍යයනයට අදාල කරගත් මහා නගර සභා 12 අතුරින් ව්‍යාපාර බද්ද නිසි ලෙස පනවා ඇත්තේ ආයතන එකක් පමණි. එනම් කොළඹ මහා නගර සභාව පමණි. සෙසු ආයතන සාවද්‍ය පැනවීම් සිදුකර ඇත. නගර සභා 15 අතුරින් කිසිම ආයතනයක් නිවැරදිව මෙම බද්ද පනවා නැත. ප්‍රාදේශීය සභා 21 අතුරින් නිවැරදි පැනවීම් සිදුකර ඇති එකදු ආයතනයක් වත් නොතිබුණි. ප්‍රාදේශීය සභා හතක් (7) ව්‍යාපාර බදු පැනවීමක් සිදුකර නැත.

7.5.5 වෘත්තීය බද්ද

පළාත් පාලන ආයතන වලට අදාල පාලන ව්‍යවස්ථා තුනෙහිම මීට අදාල ප්‍රතිපාදන දී ඇත. එහෙත් මෙම බද්ද පැනවීමට නම් එහි උපරිම මට්ටම් අමාත්‍යවරයා විසින් නියමයක් මගින් ප්‍රකාශයට පත් කළ යුතුවේ. මෙතෙක් එවැන්නක් සිදු කිරීමට අමාත්‍යවරයා ක්‍රියාකර නැති හෙයින් ලංකාවේ කිසිදු පළාත් පාලන ආයතනයකට මෙම බද්ද අයකළ නොහැකි වී ඇත. එතෙකුදු වුවත් බොහෝ පළාත් පාලන ආයතන බොහෝ වෘත්තිකයින් ගෙන් විවිධ ගාස්තු, බදු ආදිය අයකිරීම සුපුරුදු දෙයක් බවට පත් කරගෙන ඇත. එහෙත් එය බලාතික්‍රමණයට අයත්වන්නාවූ ඉතා අවදානම් සහගත ක්‍රියාවකි.

7.5.6 විනෝද බදු

බොහෝ පළාත් පාලන ආයතන මෙම බද්ද සාවද්‍ය ලෙස පනවනු ලැබේ. මෙම බද්ද විනෝද බදු ආඥා පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව සභා සම්මත යෝජනාවක් පදනම් කොට ගෙන සභාවේ අනුමැතිය ලබාගෙන එය පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එහිදී එම කරුණට අදාලව අමාත්‍යවරයා විසින් නියමයක් මගින් එය අනුමත කර සිය අනුමැතිය ගැසට් පත්‍රයේ පළ කළ යුතුවේ. එසේ නොමැතිව සභාවේ ප්‍රධාන නිලධාරියා විසින් ඉතා ඉහල ගාස්තු ක්‍රම අනුගමනය කරමින් විනෝද බදු පනවා තිබෙනු දැකිය හැකිය. විනෝද බද්ද වාර්ෂික බද්දක් නොවේ. වරක් අමාත්‍යවරයා එය පැනවූ පසු නැවත ගැසට් නිවේදනයක් මගින් අමාත්‍යවරයා විසින් එම නියමය සංශෝධනය කිරීම, ඉවත දැමීම හෝ නිවැරදි කිරීමක් කරන තුරු එම පැනවීම් නිවේදනය වලංගු වන්නේය.

මෙම අධ්‍යයනය සඳහා යොදාගත් ප්‍රාදේශීය සභා අතුරින් එකදු සභාවක් වත්, නගර සභාවන් අතරින් එකදු නගර සභාවක් වත් මහා නගර සභා අතුරින් එකදු මහා නගර සභාවක් වත් මෙම බද්ද නිවැරදිව පනවා නොතිබුනි. මෙම වටිනා ආදායම් මූලයෙහි. අගය වටහා නොගැනීම මගින් මෙය ඌණ භාවිත බද්දක් බවට පත්වී තිබේ.

7.5.7 වාහන හා සත්ව බද්ද

මෙය මුල් කාල වල සැලකිය යුතු ඉපැයීමක් (Yield) සහිත බද්දක්ව පැවතුනි. මේ සම්බන්ධයෙන් උපරිම බදු සීමා පාලන ව්‍යවස්ථාවන්හි දක්වා ඇත. එම ප්‍රමාණ මේ වන විට යල් පැන ගිය (Out Dated) තත්වයකට පත්ව ඇත. නියැදිගත මහා නගර සභා අතුරින් ආයතන හතරක් ද නගර සභා අතුරින් ආයතන දෙකක්ද මෙම බද්ද නිවැරදිව පැනවීම සිදුකර තිබුණි. කිසිම ප්‍රාදේශීය සභාවක් මෙය නිවැරදිව පනවා නොතිබුණි. මෙහි සඳහන් බදු සීමාවන් සංශෝධනය කර කාලීන අවශ්‍යතාවන්ට එකඟව ඉදිරිපත් කරන්නේ නම් මෙය ඉතා වැදගත් ආදායම් ප්‍රභවයක් වනු ඇත.

7.5.8 සංවර්ධනය නොකළ ඉඩම් මත බදු

මෙම බද්දට අදාල ප්‍රතිපාදන සෑම පාලන ව්‍යවස්ථාවකම ඇතුලත්වේ. සංවර්ධනය සඳහා යොදා නොගත් ඉඩමක වෙළඳ පළ වටිනාකම මත 2% අඩු වාර්ෂික බද්දක් අයකර ගැනීමට

මෙමඟින් ඉඩකඩ සැලසී ඇත. මෙම බද්ද අය කිරීමට ඉතා පහසු වැඩි නම්‍යතාවයකින් යුතු අඩු පිරිවැයක් මගින් එක් රැස් කළ හැකි බද්දකි. මෙම බද්ද මේ අධ්‍යයනයේ ඇතුලත් මහා නගර සභා අතුරින් හම්බන්තොට මහා නගර සභාවේ පමණක් නියමිත පරිදි පනවා තිබුනි. නගර සභා 15 අතුරින් ආයතන දෙකක් ද ප්‍රාදේශීය සභා 21 අතුරින් ආයතන එකක්ද නිවැරදිව පනවා තිබූ අතර ආයතන පහලොවක් (15) ක් මෙය පනවා නොතිබුනි.

7.5.9 ප්‍රචාරක දැන්වීම් පුවරු

පාලන ව්‍යවස්ථාවන්හි පළාත් පාලන ආයතන බල ප්‍රදේශ තුළ යම් වීථියක හෝ ඊට යාව සිටින සේ දැන්වීම් පුවරු හා වෙනත් තාවකාලික ව්‍යුහයක් ඉදිකිරීම හෝ යම් මාර්ගයක සැරසිල්ලක් කිරීම, හා ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද යම් අවසර පත්‍ර සඳහා ගාස්තු අය කර ගැනීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට ඉඩ සලසා ඇත. මෙසේ අතුරු ව්‍යවස්ථා පනවා එමගින් ගාස්තු අයකර ගැනීමේදී අදාල ගාස්තු සියල්ල අතුරු ව්‍යවස්ථාවේ අඩංගු විය යුතුය. එහෙත් වර්තමානයේ සෑම පළාත් පාලන ආයතනයක්ම සිදු කරනුයේ අතුරු ව්‍යවස්ථාව පසෙකලා සභාව විසින් හෝ එහි ප්‍රධාන නිලධාරියා විසින් තීරණය කරන ගාස්තු වෙළඳ ප්‍රචාරක දැන්වීම්කරු ගෙන් අය කිරීමයි. ඇතැම් විටක මෙය බද්දක් ලෙසත් තවත් විටක ගාස්තුවක් ලෙසත්, තවත් විටෙක බලපත්‍ර ගාස්තුවක් ලෙසත් හඳුන්වමින් ඉතා විකෘති සහගත මුදල් අය කිරීමක් සිදුකරනු දැකිය හැකිය. මෙය පවතින නීතියට අනුව අයකරන්නේ නම් එය කිසියම් විධිමත් කිරීමක් හා පාලනයක් සහිතව සභාවට බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට හැකි මාර්ගයක් වේ. එහෙත් ඒ ඒ ප්‍රදේශවල මුළුමනින්ම නීතියට පටහැනි ගාස්තු සභාව මගින් තීරණය කර අය කිරීම අතිශය දෝෂ සහගත ක්‍රියාමාර්ගයකි. එබැවින් මෙම ආදායම් මූලයද විධිමත් බවකින් තොරව ඌණ භාවිත ආදායම් මාර්ගයක් බවට පත්වෙමින් ඇත. මෙම බලපත්‍ර සඳහා මහා නගර සභාවක අයකළ හැකි උපරිම ගාස්තුව රු.5000/- කි. එහෙත් වර්ග ප්‍රමාණ අනුව ගණනය කර ඉතා ඉහල ගාස්තු අය කිරීම සිදු කෙරේ.

7.5.10 ඇතැම් ඉඩම් විකිණීම් මත බදු පැනවීම

මෙම බද්ද වෙන්දේසියක් හෝ බ්‍රෝකර් වරයෙකු ගේ මැදිහත් වීම මත කිසියම් ඉඩමක් විකුණු විට එම විකුණු මුදලින් 1% කට නොඅඩු බද්දක් පළාත් පාලන ආයතනයට ගෙවිය යුතු බවට අමත්‍යවරයා විසින් මෙය පනවා ඇත.

එහෙත් සෑම පළාත් පාලන ආයතනයකම එම බද්ද නිසි ලෙස එකතු කර ගැනීම වෙනුවට වාර්ෂිකව මෙය නැවත පැනවීමක් සිදුකරයි. එය එක් අතකින් බලාතික්‍රමණයකි. නිසි ක්‍රමවේදයකින් මෙම බද්ද අයකර ගැනීමෙන් මෙය එලදායි ආදායම් මාර්ගයක් බවට පත් කර ගත හැකිය.

7.5.11 පරිසර බලපත්‍ර ගාස්තු පැනවීම

ඉහත බද්ද පරිදිම මෙම බලපත්‍ර ගාස්තුව ද අමාත්‍යවරයා විසින් පනවා තිබේ. එය නිසි පරිදි එකතු නොකොට නැවත නැවත වාර්ෂිකව එම බලපත්‍ර ගාස්තු පැනවීමට පළාත් පාලන ආයතන ක්‍රියා කෙරේ. මෙය සාවද්‍ය පරිචයක් මෙන්ම බලාතික්‍රමණයකි.

7.5.12 ප්‍රසිද්ධ රැඟුම් බලපත්‍ර ගාස්තු

1912 අංක 7 දරන දරන ප්‍රසිද්ධ රැඟුම් පාලන ආඥා පනතට අනුව බෙහෝ පළාත් පාලන ආයතන බලපත්‍ර ගාස්තු පනවා අය කිරීම් කරනු ලැබේ. උක්ත ආඥා පනතේ 3 වන වගන්තිය ප්‍රකාර අමාත්‍යවරයා විසින් මේ සඳහා අවශ්‍ය රීති සැකසිය යුතුය. මුලදී මෙම රීති පනවා ඇත්තේ 1914 වසරේ දී එම නීති අදාල වූ ඇතැම් පළාත් පාලන ආයතන වලටය. ඒ අනුව එම නීතිය සියළුම පළාත් පාලන ආයතනවලට එකසේ බල පවත්වන්නේ නැත. අමත්‍යවරයා විසින් අළුතින් රීති සකස් කර වර්තමානයේ ඇති පළාත් පාලන ආයතන සඳහා ඒවා අදාල කරගත හැකි වන පරිදි පැනවිය යුතුය. මේ බව නොදන්නා පළාත් පාලන ආයතන වල නිලධාරීන් නීතියට පටහැනිව වාර්ෂිකව සභාව මඟින් ප්‍රසිද්ධ රැඟුම් පාලන බලපත්‍ර ගාස්තු පනවනු ලැබේ. මෙම කරුණ අප්‍රමාදව පළාත් පාලන බලධාරීන්ගේ අවධානයට යොමු විය යුතුවේ. මෙම ආඥා පනතේ 11 වගන්තිය ප්‍රකාර මෙහි බලධාරීත්වය දරණුයේ ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍ය වරයාය.

7.5.13 සමාජ ශාලා බලපත්‍ර ගාස්තු

1975 අංක 17 දරන පනතේ 4 වන වගන්තිය ප්‍රකාර අමාත්‍යවරයා විසින් නියම කරන ලද උපරිමයකට යටත්ව ගාස්තු අය කිරීමට පළාත් පාලන ආයතන වෙත බලය පැවරේ. එහෙත් ඇතැම් ආයතන වාර්ෂිකව ගාස්තු පනවමින් ගැසට් නිවේදන ප්‍රකාශයට පත් කරති. මෙම පැනවීම් නිත්‍යානුකූල නොවේ. මෙහිදී පළාත් පාලන බලධාරීන්නේ හදිසි අවධානය යොමු විය

යුත්තේ මෙම පනතට සංශෝධන ගෙනවිත් මෙම බලපත්‍ර ගාස්තු සීමා කාලානුරූපව සංශෝධනය කිරීමටය. මෙම බලපත්‍ර ගාස්තුවල උපරිමය පනතේ 4 වන වගන්තියේ දක්වා ඇත. ඒ අනුව කොළඹ මහා නගර සභාව සම්බන්ධයෙන් වූ විට රු 1000.00 කි. වෙනත් මහා නගර සභා සම්බන්ධයෙන් රු 600.00 කි. නගර සභා සඳහා රු 400.00 කි. සුළු නගර / ගම් සභා සඳහා (ප්‍රාදේශීය සභා)රු 350.00 කි. ඒ ඒ සභා සඳහා අමාත්‍යවරයා මෙම බලපත්‍ර ගාස්තු විශේෂිතව ගැසට් නිවේදනයක් මගින් නියම කළ යුතුය.

7.5.14 බනිජ තෙල් ආඥාපනත අනුව බලපත්‍ර ගාස්තු

බණිජ තෙල් ආඥා පනතේ ප්‍රතිපාදන ප්‍රකාර විෂය භාර අමාත්‍යවරයා විසින් රීති මගින් බලපත්‍ර ගාස්තු පනවා පළාත් පාලන ආයතන වලට ඒවා අයකර ගැනීම පවරා ඇත. එහෙත් වර්තමානයේ බොහෝ පළාත් පාලන ආයතන විවිධ ගාස්තු පනවා ගැසට් මගින් පළකර මේ සඳහා අය කිරීම් සිදුකරනු ලබයි. මෙය බලාතික්‍රමණයකි.

7.5.15 සන්නිවේදනය කුළුණු බදු

ගැසට් පත්‍රවල පළවන තොරතුරු අනුව බොහෝ පලාත් පාලන ආයතන සන්නිවේදන කුළුණකින් වාර්ෂිකව රු.100000/- කට වැඩි මුදලක් උපයන බව පැහැදිලි වේ. මෙබඳු බලයක් ලංකාවේ කිසිම ව්‍යවස්ථාපිත නීතියකින් පළාත් පාලන ආයතන වෙත ලබා දී නැත. පළාත් පාලන ආයතනයට බලය ලැබී ඇත්තේ අදාල දේපල සඳහා වරිපනම් අය කිරීමට පමණි. මෙම පහසුකම් ප්‍රදේශයේ යටිතල පහසුකම් ප්‍රවර්ධනය උදෙසා ඉවහල් වන ඉදිකිරීම් වේ.

පළාත් පාලන ආයතන විසින් නීතියේ ප්‍රතිපාදන මත අය කළ යුතු හා අය කළ හැකි බොහෝ ආදායම් අය කිරීම කෙරෙහි එතරම් උනන්දුවක් දක්වන බවක් නොපෙනේ. එහෙත් නීතියෙන් තමාට බලය පැවරී නොමැති කාර්යයන් සඳහා නොබියව බදු හා බලපත්‍ර ගාස්තු පැනවීමට වැඩි නැඹුරුවක් දක්වන බව පෙනේ. මෙය අතිශයින් අවදානම් සහගත ක්‍රියාවකි. බොහෝ ඌණ භාවිත බදු හා බලපත්‍ර ගාස්තු දැකිය හැකි වන්නේ මෙම විෂය පිළිබඳව පුළුල් අවබෝධයකින් යුතුව කටයුතු නොකිරීම නිසා බව අදාල ගැසට් නිවේදන විශ්ලේෂණය කිරීමේදී පෙනියයි.

7.6 පළාත් පාලන ආයතනයන්හි ආදායම් පැනවීම බිඳවැටීමට බලපා ඇති සාධක

ගෙවීගිය දශක තුනක පමණ කාල පරිච්ඡේදය තුළ පළාත් පාලන ආයතනයන්හි වාර්ෂිකව සිදු කෙරෙන ආදායම් පැනවීම් අසාර්ථක වීමට කරුණු රාශියක් බලපා ඇත. මෙම තත්වය කිසියම් එක් සංසිද්ධියක ප්‍රතිඵලයක් නොව සෑහෙන කාලයක් තුළ හේතු සාධක ගණනාවක් නිසා ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වූ තත්වයක් බව පෙන්වා දිය හැකිය. එසේ මේ කෙරෙහි බලපෑම් කරන ලද සාධක කවරේද යන්න හඳුනාගැනීම වැදගත්වේ. ඒ අනුව මෙම අධ්‍යයනයේදී අනාවරණය වූ කරුණු පදනම් කොට ගෙන මෙම තත්වය ඇතිවීමට සෘජුව හා වක්‍රව බලපා ඇති කරුණු පහත සඳහන් පරිදි සම්පිණ්ඩනය කළ හැකිය.

1. 1931 සිට 1989 දක්වා පැවති ශක්තිමත් පළාත් පාලන කළමනාකරණ හා අධීක්ෂණ ව්‍යුහය හා මධ්‍ය පාලනය අහෝසි වීම.
2. පළාත් පාලන සේවය අහෝසි වීම.
3. පළාත් පාලනය පළාත් රාජ්‍ය සේවාවේ තවත් එක් සේවා ස්ථානයක් බවට පත්වීම.
4. පළාත් පාලන ආයතන පරිපාලනය අධීක්ෂණය කරන ජාතික, පළාත්බද හා පළාත් පාලන ස්ථරයන්හි නිලධාරීන් තුළ පළාත් පාලන මූලධර්ම පිළිබඳ අවබෝධය හීන වීම.
5. පළාත් පාලන ආයතනයන්හි පරිපාලනය අධීක්ෂණය කිරීම බිඳ වැටීම
6. පළාත් පාලනයේ නිරත පිරිස තුළ නීතිය පිළිබඳව ප්‍රමාණවත් දැනුම්වත් භාවයක් නොමැති වීම හා නීති කියවා අවබෝධ කර නොගැනීම.
7. පළාත් පාලන ආයතන සඳහා පැවති, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කාලීන විමර්ශන (Periodical Invetigations) නොමැති වීම.
8. පළාත් පාලන ආයතනයන්හි නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග තුළින් පළාත් පාලන විෂය ඉවත් කිරීම.
9. පළාත් පාලන ආයතනයන්හි නිලධාරීන්ගේ පුහුණුවේ ඌණතා
10. පළාත් පාලන විගණනයේ දුර්වලතා

7.6.1 1931 සිට 1989 දක්වා පැවති ශක්තිමත් පළාත් පාලන කළමනාකරණ හා අධීක්ෂණ ව්‍යුහය හා මධ්‍ය පාලනය අහෝසිවීම.

1931 වසරේදී ඩොනමෝර් කොමිෂන් සභා නිර්දේශ ප්‍රකාර පළාත් පාලන දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලද්දේ ඉතා පැහැදිලි දර්ශනයක් සහිතවය. එමගින් පළාත් පාලන ආයතන වෙත තාක්ෂණ හා පරිපාලන අත්දැකීම් ලබා දීම පිණිස විශේෂඥතාව සහිත සංචිතයක් හඳුන්වා දෙන ලදී. එම පදනම මත පළාත් පාලන ආයතන සතු දැනුම හා පළපුරුද්ද වර්ධනය කිරීම උදෙසා එම දෙපාර්තමේන්තුව දිවයිනේ සියළු පළාත් පාලන ආයතන ආවරණය වන පරිදි වැඩ සටහන් සම්පාදනය කරන ලදී.

එම ආයතනයන්හි කළමනාකරණය, මූල්‍ය හා ගිණුම්කරණය, තාක්ෂණික සේවා සම්පාදනය ආදී වශයෙන් වූ සෑම අංශයකම කටයුතු සොයා බලා මඟ පෙන්වීමටත් ඒ ඒ සේවා සම්පාදන අංශයන්හි කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම සඳහාත් අඛණ්ඩ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරන ලදී.[13] මෙය තවදුරටත් ශක්තිමත් කිරීමට 1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥා පනත යටතේ පළාත් පාලන සේවාව ඒකාබද්ධ සේවාවන් ලෙස ස්ථාපනය කිරීමත්, 1945 අංක 57 දරන පළාත් පාලන පරිපාලන කලාප ආඥා පනත බිහිවීමත් ප්‍රධාන වශයෙන් හේතුවිය. ඒ අනුව මධ්‍යගත දෙපාර්තමේන්තුවක් ලෙස කොළඹ කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාත්මක වූ පළාත් පාලන දෙපාර්තමේන්තුව දිවයිනේ සියළුම පළාත් පාලන ආයතන වලට දැනුම හා දර්ශනය සපයන නිලධාරීන්ගෙන් හෙබි සංචිතයක් ලෙසත් මිත්‍රශීලී මඟපෙන්වන්නෙකු සේ ආකල්පමය වෙනසක් ඇති කරමින් පළාත් පාලනය පෝෂණය කිරීමට උපකාරී වීම සිය මෙහෙවර කරගන්නා ලදී. මුලින් පළාත් මට්ටමින් පැවති මෙම නිළධාරී සංවිධානය පසුව දිස්ත්‍රික්ක මට්ටමින් ව්‍යාප්ත කිරීම නිසා පළාත් පාලන ආයතනවලට අවශ්‍ය තාක්ෂණ ඥාණය හා මඟ පෙන්වීම වඩාත් ක්‍රමවත්ව පිරිනැමීම කළ හැකි විය.[14]

මෙසේ ගොඩනගන ලද මේ මධ්‍යගත සංවිධාන ව්‍යුහය 1989 දී 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් උප ජාතික ව්‍යුහය වූ පළාත් සභා ඇති කරන තුරු ලංකාවේ ප්‍රමුඛතම සමස්ථ දිවයිනම ආවරණය කරගත් පරිපාලන අධීක්ෂණ ජාලය විය. පළාත් පාලන ආයතන 683 කින් හා සභිකයින් 834 කින් පමණ සමන්විත පළාත් පාලන ආයතන ව්‍යුහයක් ප්‍රශස්ත

---

[13] Page 47, Hundred years of Local Government in Ceylon Dr. V.Kanesalingam 1971- Colombo

[14] පිටු අංක 21 – පළාත් පාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාව සැසි වාර්තා අංක 1 - 1999 ශ්‍රී ලංකා ප්‍රකාශන කාර්යාංශය

ලෙස මෙහෙයවමින් ඒවායේ පරිපාලනය අධීක්ෂණය කිරීම, කාර්ය මණ්ඩලය සම්පාදනය මූල්‍ය සහාය සැපයීම, ප්‍රාග්ධන අවශ්‍යතා සැපයීම, විනය හා මධ්‍ය පාලනය මෙහෙයවීම, එම ආයතනවල ගිණුම් කළමනාකරණය අභ්‍යන්තර පාලනය හා විගණනය යාවත්කාලීනව ගෙන යාම, ආදායම් එකතු කිරීම, ව්‍යවස්ථාපිත නිවේදන ඉතාම නිවැරදි අන්දමින් පළ කිරීම සහතික කිරීම ආදී සෑම අංශයක්ම මනා ලෙස හසුරුවන ලදී. මේ බව පළාත් පාලන කොමසාරිස්වරයාගේ වාර්ෂික පාලන වාර්තා මගින් ඉතා පැහැදිලිව වාර්තා කොට තිබීම සත්‍ය වශයෙන්ම පුදුම සහගතය.

වගුව 12: 1971 වර්ෂයේදී ලංකාවේ පළාත් පාලන ව්‍යුහය

අංකය	පළාත් පාලන ආයතන වර්ගය	ආයතන සංඛ්‍යාව	සංඛ්‍යාව
1	මහා නගර සභා	12	290
2	නගර සභා	39	386
3	පුළු නගර සභා	85	7665
4	ගම් සභා	542	
	එකතුව	**678**	**8341**

සැසි වාර්තා අංක I – 1999 රජයේ ප්‍රකාශන කාර්යංශය කොළඹ

➢ මූලාශ්‍රය :- 1973/74 පළාත් පාලන කොමසාරිස් - පාලන වාර්තාව

පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් පළාත් පාලන ආයතන පද්ධතිය මත පැවති අධීක්ෂණය ඉතාම ක්‍රියාකාරී හා ගතික (Dynamic) වූවකි. පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා සිය මාසික වැඩසටහනට තම දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන වෙත ගොස් නියමිත විමර්ශන ආකෘතියක ඇති කරුණු සොයා බලන ලදී. ඔහුගේ චාරිකා වලට අමතරව විමර්ශන නිලධාරීන්ට සිය රාජකාරි සඳහා පළාත් පාලන ආයතන සංඛ්‍යාවක් වෙන් කර දී තිබුණි. ඔවුන් සිය කාර්යය මැනවින් ඉටු කරන්නේද යන්න ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරියා විසින් සිය අහඹු පරීක්ෂණ තුලින් අධීක්ෂණය කරන ලදී. සෑම දෙපාර්තමේන්තු නිලධාරියෙක්ම පළාත් පාලන ආයතනයට සිය පැමිණීම හා සිදුකළ රාජකාරි සිය ක්ෂේත්‍ර සටහන් පොතෙහි සවිස්තරව දැක්විය යුතු අතර සතිපතා එය ඉහල නිලධාරියාගේ පරීක්ෂාවට ලක්වේ. මෙම නිලධාරීන් පළාත් පාලන ආයතනයකට ගිය විට එහි ඇති යම් ගැටළු, ඒ සඳහා උපදෙස් ආදිය සහාවේ ලොග් පොතෙහි සටහන් කළ යුතුවිය. පළාත් පාලන ආයතනයේ පරිපාලන ප්‍රධානියා විසින් මෙම ලොග් සටහන් පිටපත් ලබාගෙන අදාල උපදෙස් පරිදි ක්‍රියාකර ඒ බව දෙපාර්තමේන්තුවට ලිඛිතව වාර්තා කළ යුතු විය.

සෑම සභාවකම වාර්ෂික බදු හා ආදායම් පැනවීම්, තක්සේරු කටයුතු, ගිණුම් කටයුතු, සහා තීරණ ක්‍රියාත්මක කිරීම, මූල්‍ය පාලනය, ආදායම් එකතු කිරීම, ඉලක්ක සපුරා තිබේද යන්න විමර්ශන නිලධාරියා විසින් ද සිය පූර්ණ විමර්ශනයට භාජනය කරන ලදී.

එසේම සභාවේ මාර්ග ඉදිකිරීම් හා නඩත්තු, ගොඩනැගිලි නඩත්තු, කොන්ත්‍රාත් කටයුතු කර්මාන්ත ඇස්තමේන්තු, ගෙවීම් වාර්තා සහා අනුමැති, පොදු පහසුකම් සම්පාදනය, ජල සම්පාදනය, විදුලිය බෙදාහැරීම් ආදිය පළාත් පාලන දෙපාර්තමේන්තුවේ තාක්ෂණික නිලධාරියාගේ අධීක්ෂණය ඔහුට නායකත්වය සපයන තාක්ෂණික මණ්ඩලික සහකාර වරයාගේ අධීක්ෂණය අහඹු පරීක්ෂණ මගින් සෑම ආයතනයකටම යොමුවුනි. ඒ අතර ප්‍රජා සංවර්ධන කටයුතු, පුස්තකාල පරිපාලනය, ක්‍රීඩා කටයුතු පළාත් පාලනය සඳහා ප්‍රජාව සම්බන්ධ කර ගැනීම, කෘෂිකර්මයට වූ දායකත්ව වැඩ ආදිය දිස්ත්‍රික් ප්‍රජා සංවර්ධන නිලධාරියාගේ අධීක්ෂණය මත ප්‍රජා සංවර්ධන නිලධාරීන් විසින් නිරන්තර අධීක්ෂණයට භාජනය කරන ලදී. මෙම සංවිධාන ව්‍යුහය හේතු කොට ගෙන කිසිම පළාත් පාලන ආයතනයකට වාර්ෂික අයවැයෙන් බැහැර වීමට හෝ සිය වාර්ෂික සැලැස්මෙන් පිටතට යාම, සාවද්‍ය ලේඛන, ගිණුම් නිවේදන පළකිරීම් ආදිය සම්පූර්ණයෙන්ම වැළකුනි. එම කාලපරිච්ඡේදය තුළ ඉතා ඈත පිටිසර ගම් සභාවක පවා ඇතැම්විට තනි නිලධාරියෙකු විසින් වුවද ඉතා නිවැරදිව මෙම කටයුතු සියල්ල ඉටුකරන ලදී. අතුරු ව්‍යවස්ථා ඉතා හොඳින් ක්‍රියාත්මකව පැවතුනි. සෑම වසරකම අවසානයේ සෑම පළාත් පාලන ආයතනයක්ම වාර්ෂික විගණනය තීරණය කරන පිළිවෙලට පාර්ලිමේන්තු ගිණුම් කාරක සභා ඉදිරියට අවශ්‍යතාවය මත පමුණුවනු ලැබීය. වාර්ෂික අයවැය වෙන්කිරීම් වසර තුළ සිදු කළ නොහැකි වූ විට ඊට හේතු ඉදිරිපත් කළ යුතු විය. මෙවැනි ශක්තිමත් පරිපාලන අධීක්ෂණ ජාලයක් පැවතීම හේතුකොට ගෙන පළාත් පාලනය ජනතාවට ඉතා සමීප ඔවුන්ගේ ප්‍රසාදය දිනාගත් ආයතනයක් ලෙස පැවතුනි.

විශේෂයෙන් සෑම පළාත් පාලන ආයතනයකම (කුඩා නොදියුණු පළාත්වල ගම් සභා කාර්යාලය ඇතුළුව) ගිණුම් තැබීම, ආදායම් පැනවීම , ආදායම් ඒකරාශි කිරීම, වියදම් සිදු කිරීම, ව්‍යාපෘති නිම කිරීම, කොන්ත්‍රාත් පාලනය, අතුරු ව්‍යවස්ථා පැනවීම, කාලීන ව්‍යවස්ථාපිත නිවේදන ගැසට් පත්‍රයේ හා පුවත් පත්වල පළ කිරීම, විනය පරීක්ෂණ ආදී කරුණු දෙසතියකට වරක් වත් තම ආයතනයට පැමිණෙන සහකාර කොමසාරිස් කාර්යාලයේ

විශේෂඥ දැනුම සහිත නිලධාරීන්ගේ මඟ පෙන්වීම අනුව සිදු කිරීමට පළාත් පාලන ආයතන වල නිලධාරීන්ට හා සභාපති වරුන්ට හැකි විය. එයම ඔවුන් ලැබූ ඉතා ඵලදායි පුහුණුවක් ද විය. මේ අගනා මිත්‍රශීලී මඟ පෙන්වීම පළාත් පාලන දෙපාර්තමේන්තුව අහෝසි වී එහි සිටි විෂය පූර්ණ අවබෝධය සහිත ඇතැම් නිලධාරීන් දිවයිනේ පළාත් සභා, වෙනත් ආයතන වෙත විසිරියාමත් පසුව ඔවුන් විශ්‍රාම යාමත් නිසා ක්‍රම ක්‍රමයෙන් පළාත් පාලනයට අහිමි විය. ඉන් පසුව පළාත් සභා යටතේ එබඳු අධීක්ෂණ ව්‍යුහයක් නොපැවති හෙයින් අද එම ආයතනවල හටගෙන තිබෙන ව්‍යාකූල තත්වය උද්ගත වී ඇත. මෙය පොදුවේ ලංකාවේ සියළුම පළාත් පාලන ආයතනවලට මුහුණදීමට සිදුවූ පිරිමැසිය නොහැකි අඩුපාඩුවකි.

මෙම විශිෂ්ඨ පාලන ක්‍රමය පවත්වා ගෙන ගිය විශේෂඥ දැනුමින් යුතුවූ ලංකා පරිපාලන සේවාවේ, පළාත් පාලන කොමසාරිස්වරුන්(CLG) නියෝජ්‍ය කොමසාරිස්වරුන් (DCLG) හා සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන් (RACLC) ගේ ලේඛනයක් මෙහි උපලේඛන අංක 06 හි වර්තමාන පරපුරෙහි දැනගැනීම සඳහා ගොනු කර ඇත.

7.6.2 පළාත් පාලන සේවය බිඳවැටීම.

ලංකාවේ රාජ්‍ය සේවය හා සමගාමීව පැවති සේවා ගණනාවක් විය. පළාත් පාලන සේවය, සමුපකාර සේවය, තැපැල් සේවය, දුම්රිය සේවය, ඉඩම් නිළධාරී සේවය, අධිකරණ සේවය ආදී වශයෙනි. පළාත් පාලන සේවාව 1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥා පනත යටතේ එතෙක් පැවති පළාත් පාලන ආයතනයන්හි කාර්ය මණ්ඩලය ඒකාබද්ධව අන්තර් ග්‍රහණය කර (Unification) පිහිටුවන ලදී. මෙය ඩොනමෝර් කොමිෂන් සභාවේ වැදගත් නිර්දේශයක් වූ අතර එය සිදු කරන ලද්දේ පළාත් පරිපාලනය පිළිබඳ විධායක කාරක සභාවේ සභාපතිවරයා වූ පළාත් පාලන අමාත්‍ය එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක මහතාගේ මඟ පෙන්වීම යටතේ පළාත් පාලන කොමසාරිස් වී.සී.ජයසූරිය මහතාය.

මෙම සේවාව :-

i. පළාත් පාලන පරිපාලන සේවය

ii. පළාත් පාලන ගණකාධිකාරී සේවය

iii. පළාත් පාලන ඉංජිනේරු සේවය

iv. පළාත් පාලන වෛද්‍ය සේවය

v. පළාත් පාලන පශු වෛද්‍ය සේවය

vi. පළාත් පාලන තක්සේරු සේවය

vii. පළාත් පාලන ආයුර්වේද වෛද්‍ය සේවය

viii. පළාත් පාලන පුස්තකාලයාධිපති සේවය

ix. පළාත් පාලන ආදායම් පරීක්ෂක සේවය

x. පළාත් පාලන කාර්මික නිලධාරි සේවය

xi. පළාත් පාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක සේවය

xii. පළාත් පාලන පොත් තබන්ගේ සේවය

xiii. පළාත් පාලන ගබඩා භාරකරු සේවය

xiv. පළාත් පාලන ලිපිකරු සේවය

xv. පළාත් පාලන යතුරු ලේඛන / ලඝුලේඛක සේවය

xvi. පළාත් පාලන සාත්තු සේවය

xvii. පළාත් පාලන භාෂා පරිවර්තන සේවය

xviii. පළාත් පාලන ලේකම් සේවය

ආදි විෂය මූලික සේවාවන් ගෙන් සමන්විත වූහ. මෙම සෑම සේවාවක්ම පළාත් පාලන සේවා කොමිෂන් සභාව යටතේ රාජ්‍ය සේවාවට සමාන්තරව වර්ධනය වූහ. ඔවුන් පළාත් පාලනය පිළිබඳ විශේෂඥ දැනුමින් යුතු වූ අතර දීප ව්‍යාප්ත සේවාවක සාමාජිකයින් ලෙස සෑම පළාතකම සේවයේ යෙදීමට අවස්ථාව ලද්දෝ වූහ. ඒ අනුව එම නිලධාරීන් සිය විෂය තුළ පරිපූර්ණ දැනුමක් සහිත විශේෂඥ භාවයක් ලැබීමට අවස්ථාව ලදහ.

මේ සමගම පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ද පළාත් පාලනය පිළිබඳ කටයුතු කරන නිලධාරි සේවා කිහිපයක් පැවතුනි.

1. විමර්ශන නිළධාරි සේවය
2. තාක්ෂණ නිළධාරි සේවය
3. ප්‍රජා සංවර්ධන නිළධාරි සේවය

ආදී වශයෙන් පැවති එම නිලධාරීන් ශ්‍රේණි ගතව පළාත් පාලන ආයතනයන්හි පරිපාලන කටයුතු අධීක්ෂණය කිරීමෙහි නිරතව පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාල වලට අනුයුක්තව පළාත් පාලන දෙපාර්තමේන්තුව යටතේ සේවය කළහ. පළාත් පාලන සේවය පළාත් සභා ක්‍රමය යටතේ පළාත් සභා රාජ්‍ය සේවාවට අන්තර්ග්‍රහණය වූ අතර පරිපාලන, ගණකාධිකාරී, ඉංජිනේරු, වෛද්‍ය ආදී මණ්ඩලික සේවා සමාන්තරව පැවති රාජ්‍ය සේවයේ දීප ව්‍යාප්ත සේවාවන්ට අන්තර් ග්‍රහණය විය. පළාත් රාජ්‍ය සේවයට පත් වූ නිලධාරීන් එම සේවාවේ ප්‍රධානියා වූ පළාත් ආණ්ඩුකාර වරයා යටතේ පලාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පාලනයට පත් වූහ. එමඟින් පළාත් පාලන ආයතනවල එම විෂය ගැන හොඳ දැනුමක් තිබූ නිලධාරීන් පළාත් රාජ්‍ය සේවයේ වෙනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු ආදියට මාරුවී යාම පළාත් පාලනයට සිදුවූ බරපතල පාඩුවක් විය.[15]

7.6.3 පළාත් පාලනය පළාත් රාජ්‍ය සේවාවේ තවත් එක් සේවා ස්ථානයක් බවට පත්වීම.

පළාත් පාලනය පළාත් සභාවට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරුණ විෂයයන් 36 අතුරින් 04 වන විෂය බවට පත්විය. එහි වූ අධ්‍යාපනය, සෞඛ්‍ය, කෘෂිකර්ම, සමාජ සේවා ආදී විෂයයන් හා මෙම විෂය ද සමාන්තරව ක්‍රියාත්මක වීම බලධාරීන්ගේ අවධානය යොමු නොවී සිදු වූ, ප්‍රබල අඩුපාඩුවකි. පළාත් පාලනය සෙසු විෂයයන් සමග සංසන්දනය කළ හැක්කක් නොවේ. එය විෂයයක් නොව පාලන ස්ථරයකි. (Govering Sphere) පළාත් පාලනය තුළ දේශපාලන අධිකාරියේ පාලනය යටතේ වූ සභා ක්‍රමයක්, වෙනම ගිණුම් ක්‍රමයක් වෙනම කාර්ය මණ්ඩල සහිත පිරිස් කළමනාකරණ ක්‍රමයක්, විශේෂිත විගණන ක්‍රමයක්, සභා වාර්තා සම්පාදනයේ, භාෂා පරිවර්තන ලඝු ලේඛන ආදී පළාත් පාලනයට සුවිශේෂි ක්ෂෙත්‍ර ගණනාවක් පැවතුනි. මේ පිළිබඳව තැකීමක් නොකළ පළාත් රාජ්‍ය සේවයේ බලධාරීන් අධ්‍යාපනය, කෘෂිකර්මය, සෞඛ්‍යය ආදී දෙපාර්තමේන්තු වල නිලධාරීන් උසස් වීම් හා සේවා ස්ථාන මාරුවීම් මත පළාත් පාලන ආයතනවලට පත් කළ අතර පළාත් පාලන ආයතන වල සිටි ප්‍රවීණ කාර්යමණ්ඩල එකී වෙනත් දෙපාර්තමේන්තු අමාත්‍යංශ ආදියට ස්ථාන මාරු ලැබ යාමට අවස්ථාව සැලසුහ. ඒ තත්වය හේතු කොට ගෙන පළාත් පාලන ආයතන තුළ දශක හයක (6)

---

[15] පිටු අංක 21 - පළාත් පාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාව ශ්‍රී ලංකා සැසි වාර්තා අංක 1 -1999 රජයේ ප්‍රකාශන කාර්යාංශය - කොළඹ

ක පමණ කාලයක් තුළ පැවති දැනුම, ක්‍රමවේද, පරිපාටි ආදිය ඉතා සීඝ්‍රයෙන් අභාවයට පත්ව ගියේය.

මෙම පරිහාණිය කරුණු දෙකක් හේතු කොට ගෙන කඩිනම් විය.

(i) නව පත්වීම් ලැබූ පරිපාලන, ඒකාබද්ධ සේවා, නිලධාරීන් විෂය පුහුණුවකින් තොරව පළාත් පාලන ආයතන වලට පත් කිරීම

(ii) වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවලින් උසස් වීම් හා ස්ථාන මාරු මත පැමිණෙන නිළධාරීන් කිසිදු පුහුණුවකින් තොරව පළාත් පාලන ආයතන ලේකම්, කොමසාරිස්, ගණකාධිකාරී, පරිපාලන නිලධාරී වැනි ජ්‍යෙෂ්ඨ තනතුරු වලට පත් කිරීම.

මෙම නිලධාරීන් කිසිදු විෂය මූලික දැනීමකින් තොරව පළාත් පාලන ආයතනවල පාලන කටයුතු මෙහෙය වීම හා ආදායම් පැනවීම් තීරණ ගැනීම ගැසට් නිවේදන සකස් කිරීම ආදිය සිදුකර ඇත. මෙහිදී පළාත් පාලන ආයතන වල කටයුතු සොයා බැලීමට පළාත් පාලන දෙපාර්තමේන්තුවේ නිළධාරීන් මුල් කාල වල පැමිණිය ද පළාත් සභා පාලනය තුළ පැවති පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාල වලින් එබඳු නිලධාරීන් නොපැමිණීම නිසා මෙම තත්වය තවදුරටත් අසතුටුදායක විය. ප.ප.ස.කො කාර්යාල වල එබඳු නිළධාරීන් ද නොමැති විය. එම කාර්යාල වල ද සිටිනුයේ නවක නිළධාරීන් නිසා ඔවුනට ද පළාත් පාලන ආයතන වල නිළධාරීන්ට මඟ පෙන්වීමේ හැකියාවක් නොවුනි. එහි ප්‍රතිඵලය වූයේ පළාත් පාලන ආයතන වල නිලධාරීන්ගේ දැනුම හා අභිමතය පරිදි බදු, ගාස්තු පැනවීම හා ආදායම් එකතු කිරීම් ආදී කටයුතු සිදුවීමය. ඒ අනුව සාවද්‍ය බදු හා ආදායම් පැනවීම් සිදුවීම නොවැලැක්විය හැකි සංසිද්ධියක් බවට පත්වී ඇති බව පෙනේ. දැන් මෙම තත්වය යථාවත් කිරීම අතිශය දුෂ්කර අභ්‍යාසයකි.

7.6.4 පළාත් පාලන ආයතන පරිපාලනය අධීක්ෂණය කරන ජාතික, පළාත් බද හා පළාත් පාලන ස්ථරයන්හි නිලධාරීන් තුළ පළාත් පාලන මූලධර්ම පිළිබඳ පවතින අවබෝධය හීනවීම.

මීට පෙරාතුව සඳහන් කළ පරිදි පළාත් පාලනය යනු පාලන ස්ථරයකි. එයට ආවේනික වූ පාලන ක්‍රමවේදයක්, නීති, පටිපාටි, නියෝග, රීති, අතුරු ව්‍යවස්ථා, නව නීති වාර්තා ආදී පරිපූර්ණ නෛතික පද්ධතියක් එය සතුව පවතී. පළාත් පාලන ආයතන විසින් ඉටුකරනු ලබන

කාර්යභාරය හැමවිටම යටකී නෛතික පද්ධතිය ඇතුළත පැවතීම හා ඊට සමපාත වීම අත්‍යාවශ්‍යවේ. එයින් පරිබාහිර යමක් සිදුවන්නේ නම් ඒවා බලාතික්‍රමණය (Ultra vives) වන්නේය. බලාතික්‍රමණය යනු නීතියේ බලසීමාව ඉක්මවා ක්‍රියා කිරීමය. පළාත් පාලනය සහමුලින්ම නීතිමය රාමුවක් තුළ නිර්මාණය වූවක් හෙයින් එහිදී සිදුකරන සෑම ක්‍රියාවක්ම නීතිමය රාමුව තුළ පැවතිය යුතුය. එසේ නම් ඒ බව තහවුරු කර ගැනීමට එම කටයුතු සිදු කරන, ඒවා අධීක්ෂණය කරන සහ ඊට අදාලව ප්‍රතිපත්ති, පටිපාටි සහ ක්‍රමවේද තීරණය කරනු ලබන ඉහල අධිකාරයන්ට අයත් නිලධාරීන් පළාත් පාලන මූලධර්ම පිළිබඳව ඉතා පැහැදිලි හා නිරවුල් අවබෝධයකින් යුක්තව කටයුතු කළ යුතුය. එසේ නොමැති වූ විට අධිකරණ ක්‍රියාමාර්ගයන්හිදී, විනය ක්‍රියාමාර්ගයන්හිදී, ආදායම් පැනවීමේදී, අයවැය සම්මත කිරීමේදී සහා රැස්වීම් වලදී හා විගණනයේදී බරපතල අර්බුදකාරී තත්වයන්ට මුහුණ දීමට සිදුවිය හැකිය. පළාත් පාලන ආයතනයක් 'පාලන ස්ථරයක්' හෙවත් ප්‍රාදේශීය ආණ්ඩුකරණ ක්‍රියාවලියෙහි කේන්ද්‍රස්ථානය වන හෙයින් මෙබඳු ගැටළු ඕනෑම අවස්ථාවක ඇතිවිය හැකිය. එවිට එබඳු බරපතල අවදානම් සහගත තීරණ ගතයුතු අවස්ථාවන්ට පෙර සූදානමකින් තොරව මුහුණ දීමට සිදුවේ. එම අවස්ථා බොහෝවිට පුරෝකථනය කළ නොහැකිය. එබැවින් පළාත් පාලනයේ නිරත පිරිස හා ඉහල ස්ථරවල නිලධාරීන් පළාත් පාලන මූලධර්ම හා පරිපාලන නීතිය (Administrative Law) පිළිබඳ ප්‍රමාණික දැනුමක් සහිත වූවෝ විය යුතුමය.

වර්තමාන තත්වය අනුව ලංකාවේ පළාත් පාලන දෙපාර්තමේන්තු හා සහකාර කොමසාරිස් කාර්යාල මෙම කරුණෙහිලා දක්වා ඇත්තේ ඉතාමත් අසාර්ථක බවකි. ඔවුන් බොහෝ විට පළාත් පාලන ආයතන වෙත උපදෙස් දීමේ හෝ මග පෙන්වීමේ හැකියාවෙන් යුක්ත වූවෝ නොවෙති. එසේම පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාගේ කාර්යාලයේ තත්වය ද ඊට වෙනස් ස්වරූපයක් ගත් ස්ථානයක් නොවේ. පළාත් පාලනය පිළිබඳ රේඛීය අමාත්‍යංශයේ ද පළාත් පාලනය පිළිබඳ අතිරේක ලේකම්වරයෙක්, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙක් හා සහකාර ලේකම්වරයෙකු සහිත කාර්ය මණ්ඩලයක් පැවතියත් එම දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් වූ නිලධාරීන් සියල්ලම පාහේ රටේ වෙනත් ක්ෂෙත්‍රයන් වෙතින් ස්ථාන මාරු ලබා පැමිණි පිරිසගෙන් සමන්විත වේ. එම නිලධාරීන් සතු පළාත් පාලනය පිළිබඳව පවත්නා ඌණ අවබෝධය හේතු කොටගෙන පළාත් පාලන ක්ෂේත්‍රයට අදාලව තීරණ ගැනීමේදී නොයෙක් අන්දමේ සීමා කිරීම් වලට මුහුණ පෑමට සිදුවිය හැකිය.

උදා : -1. 2003 - කොළඹ මහා නගර සභාව කර්මාන්ත බද්ද පැනවීම. මෙය අධිකරණය මගින් නිශේධනය කර ඇත.

2. වැලිගම ප්‍රාදේශීය සභාව - සභාපතිවරයා ඉවත් කිරීමෙන් පසු පත්කළ සභාපතිවරයාට සහ අනතුරුව අධිකරණය මගින් යලි තනතුරෙහි පිහිට වූ මුල් සභාපති යන දෙදෙනාටම දීමනා ගෙවීම

3. පළාත් පාලන ආයතන කාර්ය මණ්ඩල ප්‍රඥප්තිය

4. පළාත් පාලන නිවාස ප්‍රඥප්තිය - උතුරු මැද හැර සෙසු පළාත්වල මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මකය. උතුරු මැද පළාත් පාලන නිවාස ප්‍රඥප්තිය ශ්‍රේෂ්ඨාධිකරණය නිශේධනය කර ඇත.

1. සීමා සහිත ක්‍රෙස්ට් ජේම්ස් එදිරිව කොළඹ මහා නගර සභාව - 2003 - ශ්‍රී. ල. නී. වා 370 කොළඹ මහා නගර සභාව සී/ස ක්‍රෙස්ට් ජේම්ස් ආයතනයට මහා නගර සභා ආඥා පනතේ 247 සහ 247 ආ වගන්ති ප්‍රකාර කර්මාන්ත බද්ද අයකර ගැනීම සඳහා බදු නිවේදන යැවූ පසු එම සමාගම තමන් කර්මාන්තයක් නොකරන බව පවසා අභියාචනයක් කර ඇත. එහිදී අභියාචනාධිකරණය තීරණය කර ඇත්තේ කර්මාන්ත යන්නෙන් Industry යන්න අදහස් වන බවයි. සත්‍ය වශයෙන්ම මෙය Industry නොව ඉංග්‍රීසි Trade යන පදයට අදාලව පනතෙහි භාවිතාකොට ඇති සිංහල වචනයයි. මෙහිදී කර්මාන්ත බද්ද යනු වෙළඳ බද්ද වේ. එහෙත් අභියාචනා අධිකරණයට කොළඹ මහා නගර සභාව නිවැරදිව කරුණු ඉදිරිපත් නොකිරීම නිසා එම නීති කෘත්‍යය මහා නගර සභාවට අවාසි වන ලෙස තීන්දු විය. එහෙත් කොළඹ මහා නගර සභාවේ බලධාරීන් නියමිත කාලය තුළ ශ්‍රේෂ්ඨාධිකරණයට කරුණු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මහා නගර සභාවට එම ව්‍යාපාරයෙන් කිසිම බද්දක් අයකරගත නොහැකිවී ඇත.

2. වැලිගම ප්‍රදේශීය සභාවේ සභාපතිවරයා දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා විසින් පළාත් පාලන ආයතන පරිපාලනය අධීක්ෂණය කිරීමේ ප්‍රඥප්තිය යටතේ ධුරයෙන් ඉවත් කරන ලදී. එහිදී සභාපතිවරයා එකී තීරණයට එරෙහිව අභියාචනා අධිකරණයට

අභියාචනා කිරීමේදී ඔහු නිවැරදිකරු බවට තීරණය කර නැවත සේවයේ පිහිටුවීමට ආඥාවක් නිකුත් කරන ලදී.

මේ අතර සභාපතිවරයා ඉවත් කිරීමෙන් ඇතිවූ පුරප්පාඩුව සඳහා හිටපු උප සභාපතිවරයා පත්කර ඒ අනුව පුරප්පාඩු වූ සෙසු තනතුරු සියල්ලටම අනුප්‍රාප්තිකයන් පත්කරන ලදී. පසුව අභියාචනා අධිකරණය කලින් සිටි සභාපතිවරයා නැවත තනතුරෙහි පිහිට වූ පසු අළුතින් පත්කළ සභාපතිවරයා ඉවත් කිරීමට පළාත් පාලන බලධාරීන් ක්‍රියාකොට නොමැත. ඒ අනුව සභාපතිවරුන් දෙදෙනෙකුට දීමනා ගෙවීමට ක්‍රියාකර ඇත. මේ සම්බන්ධයෙන් විගණනය සභාවේ ලේකම් වරයාටත් දීමනා ගෙවීම අනුමත කළ පළාත් පාලන කොමසාරිස් වරයාටත් අයුතු ලෙස ගෙවන ලද මුදල අධිභාර කර ඇත. සභා ලේකම් එය ගෙවා ඇති අතර පළාත් පාලන කොමසාරිස්වරයා ඊට එරෙහිව ප්‍රධාන අමාත්‍යවරයාට අභියාචනා කර ඇත. ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන අනුව ප්‍රධාන අමාත්‍යවරයාට අභියාචනා විමසීමේ බලයක් නොමැති හෙයින් නැවත එම අභියාචනය පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යංශයට යොමුකර ඇතැයි පැවැසේ.

3. පළාත් සභාව විසින් පළාත් පාලන ආයතන කාර්යමණ්ඩල ප්‍රඥප්ති පනවා අනුමත කිරීම.

පළාත් සභා රාජ්‍ය සේවාව ආරම්භ කිරීමේදී එතෙක් පැවති පළාත් පාලන නිලධාරීන් විධිමත් පරිදි පළාත් සභා රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය නොකර එතෙක් බලපැවැත්වූ නීතිය වන 1974 අංක 16 දරණ පනත එසේම තිබියදී පළාත් සභාවක් විසින් පළාත් පාලන ආයතන කාර්යමණ්ඩල ප්‍රඥප්ති සම්මත කර පළාත් පාලන සේවාවේ සිටි නිලධාරීන්ගේ උසස් වීම්, මාරුවීම්, විනය කටයුතු හා විශ්‍රාම ගැන්වීම් ආදි සියලු කාර්යයන් කරනු ලබයි. එහෙත් ඒ කිසිදු නිළධාරියෙකු විධිමත් පරිදි පළාත් සභා රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කර නැති අතර ඔවුන්ට බලපවත්නා මව් නීතියද එසේම පවතී.

එහෙත් මේ පිළිබඳව කිසිම බලධාරියෙක් යථා පරිදි මෙම ප්‍රශ්නය මේ වනතෙක් අවබෝධ කොටගෙන නැත.

4. පළාත් පාලන ආයතන නිවාස ප්‍රඥප්තිය.

පළාත් පාලන ආයතන විසින් ඉදිකර කුලී නිවැසියන්ට ලබාදී තිබූ නිවාස අතුරින් මාසික කුලිය රු. 25/- ට අඩු නිවාස රජය මගින් පළාත් පාලන ආයතන වල සහභාගීත්වයෙන් 1979 අංක 63 දරන පළාත් පාලන ආයතන නිවාස (සංශෝධන) පනතේ විධිවිධාන අනුව කුලී නිවැසියන්ට සින්නක්කරව පවරා දෙන ලදී. පළාත් සභා ක්‍රියාත්මක වූ පසු ඉහත පරිදිම රු. 50/- ට අඩු කුලිය සහිත නිවාස ද කුලී නිවැසියන්ට පැවරීමට පළාත් සභා කිහිපයක්ම ප්‍රඥප්ති සංවිධානය කරන ලදී. උතුරු මැද පළාත් සභාව විසින් සම්මත කරන ලද 1995 අංක 02 දරන පළාත් පාලන නිවාස ප්‍රඥප්තිය පිළිබඳව එහි නීතිමය වලංගුභාවය විමසා ශ්‍රේෂ්ඨාධිකරණයට යොමුකරන ලදුව එය දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154උ (8) වගන්තිය මගින් නියම කර ඇති පරිදි එකී ප්‍රඥප්තියේ දීර්ඝ නාමයේ නීතියට අනනුකූල බව විස්තර නොකිරීම මත නීතිය ඉදිරියේ වලංගු නොවන බව පවසා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එකී ප්‍රඥප්තිය නිශේධනය කරන ලදී, (S.C.No16/97-S.D.ශ්‍රී ලංකා නීති වාර්තා 1997 -13 කොටස) එතෙකුදු වුවත් ඒ සමග අනුමත කරන ලද නීතියට අනුකූල වූ සෙසු පළාත් පාලන නිවාස ප්‍රඥප්ති ක්‍රියාවට නංවා ඇත. මෙබඳු අවස්ථා රාශියක් 1990 න් පසු පළාත් පාලන ක්ෂේත්‍රයේ උද්ගත වී ඇත. මෙයින් පැහැදිලි වන්නේ යට කී ඉහළ ස්ථරයන්හි පළාත් පාලනය භාරව සිටින නිළධාරීන්ගේ පළාත් පාලන මූලධර්ම පිළිබඳව ඇති දැනුම ඉතාමත් දුර්වල බවය. මේ තත්වය ඉතාමත් බැරෑරුම් අවදානම් සහිත කරුණු සම්බන්ධ තීරණ ගැනීමේදී පළාත් පාලන ආයතන වෙත නිසි මඟ පෙන්වන්නෙකු නොමැති වීම ඉතාම බරපතල අඩුපාඩුවක් පත්වී ඇත.

7.6.5 පළාත් පාලන ආයතන පරිපාලනය අධීක්ෂණය කිරීම බිඳවැටීම.

පළාත් සභා ඇති කිරීමට ප්‍රථම ලංකාවේ පැවති පළාත් පාලන ආයතන පද්ධතිය එවකට පැවති පළාත් පාලන දෙපාර්තුමේන්තුව හා එහි දිස්ත්‍රික් සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාල ව්‍යුහය මගින් අධීක්ෂණය කළ ආකාරය සහ වර්තමාන පළාත් සභා විසින් සිදුකරන අධීක්ෂණ ක්‍රියාවලිය අතර විශාල පරතරයක් පවතී. 1990 ට ප්‍රථම පළාත් පාලන කොමසාරිස්වරයා ගේ වාර්ෂික පාලන වාර්තා වලින් පැහැදිලිව පෙනීයන්නේ කාලීන විමර්ශන සිදුකර ඒවායින් මතුවන ඌණතා සම්බන්ධ කඩිනම් පියවරගෙන අදාල නිවැරදි කිරීම් සිදුකර පළාත් පාලන කොමසාරිස් වෙත වාර්තා කිරීමට සෑම විමර්ශන නිළධාරි කණ්ඩායමක් විසින්ම කටයුතු කොට තිබූ බවය. මෙහිදී ඡන්දයෙන් පත්වූ නිලධාරීන්ගේ එනම් සභාපතිවරුන්

සභිකවරුන් ආදීන්ගේ කාර්යභාරය ද දැඩිලෙස සැලකිල්ලට ගන්නා ලදී. සෑම ආයතනයකටම විනය, මූල්‍ය විනය හා සම්පත් අවභාවිතය කෙරෙහි දැඩි සැලකිල්ලක් දක්වන ලදී. සෑම වර්ෂයකම පළාත් පාලන ආයතන විසුරුවා හැරීම්, සභාපතිවරු ඉවත් කිරීම්, අතුරු මැතිවරණ පැවැත්වීම් ආදි අවස්ථා සැලකිය යුතු සංඛ්‍යාවක් වාර්තා වී ඇත.

මෙම වාර්තාවන්හි දිවයිනේ මහා නගර සභා, නගර සභා, සුළු නගර සභා සහ ගම් සභාවන්හි ආදායම් මූලයන්, වියදම්, රජයේ ආධාර, ශ්‍රමදාන ආදී සියළුම සංඛ්‍යා දත්ත ඉතා ක්‍රමානුකූලව වාර්ෂිකව සටහන් කර ඇත. ඒ අනුව පළාත් පාලන ආයතන පරීක්ෂාව හා අධීක්ෂණය මෙම දෙපාර්තමේන්තුව විසින් කොතරම් සමීපව සිදුකර ඇද්ද යන්න සිතාගත හැකිය. පළාත් පාලන ආයතන විසින් සිදුකළ ව්‍යාපෘති සියල්ල වෙන් වෙන්ව ඒවායේ නමින්ම වාර්තා කොට ඇත. මෙතරම් පහසුකම් ඇති වර්තමානයේ මෙම ක්‍රියාවලිය සිදු නොවීම තුළින් පැහැදිලි වන්නේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් සහ සහකාර කොමසාරිස්වරුන් ගෙන් කොතරම් ඈත් වී තිබේද යන්නයි.

7.6.6 පළාත් පාලනයේ නිරත පිරිස තුල නීතිය පිළිබඳව ප්‍රමාණවත් දැනුවත් භාවයක් නොමැතිවීම හා නීති කියවා අවබෝධකර ගැනීමට නොහැකිවීම.

වර්තමානයේ පළාත් පාලන ආයතනවල සිටින බොහෝ නිළධාරීන් සහ පළාත් පාලන දෙපාර්තමේන්තු වල නිලධාරීන් අතර පොදුවේ දැකිය හැකි කරුණක් වන්නේ නීතියෙහි සඳහන් කරුණු පිළිබඳ ඔවුනට මූලික අවබෝධයක් නොමැති බවයි. මෙම තත්වය එම නිලධාරීන් විසින් බදු හා ආදායම් පැනවීමේ නිවේදන පළ කිරීමේදි බහුලව දැකිය හැකිය. නීතියේ සඳහන් කරුණු කෙරෙහි කිසිදු අවධානයක් යොමු නොකර වෙනත් සභාවක් විසින් සාවද්‍ය ලෙස හෝ පළකරනු ලැබ ඇති නිවේදනයන් පිටපත් කර ආයතනයේ නම ඇතුළත් කර පළ කිරීම බොහෝ විට දක්නට ලැබේ. කිසිදු විචාර බුද්ධියකින් තොරව අදාල නීතියෙන් දක්වා ඇති විධිවිධාන ගැන අවධානය යොමු කර නොමැති බව පැහැදිලි වේ.

උදා : i විනෝද බද්ද පැනවීම.

ii ඇතැම් ඉඩම් විකිණීම් මත බදු පැනවීම.

iii පරිසර බලපත්‍ර ගාස්තු පැනවීම.

iv ඉන්ධන බෙදාහැරීම, අලෙවිය, ගබඩා කිරීම සඳහා බදු, බලපත්‍ර ගාස්තු ආදිය පැනවීම.

v ප්‍රසිද්ධ රැගුම් සඳහා බලපත්‍ර ගාස්තු අයකිරීම.

ඉහත සඳහන් සියළු බදු හා බලපත්‍ර ගාස්තු අදාල අමාත්‍යවරයා විසින් පනවා ඒ බව අදාළ පනතේ පැහැදිලිව දක්වා ඇත. සභාවන්හි කාර්යය වන්නේ එම බදු හෝ බලපත්‍ර ගාස්තු වාර්ෂිකව අය කර ගැනීමයි. එහෙත් බහුතර ආයතන සංඛ්‍යාවක් එම බදු හෝ බලපත්‍ර ගාස්තු ඉතා අසාධාරණ ගාස්තු සහිතව පනවා වාර්ෂිකව ගැසට් පත්‍රයේ පළ කරනු ලැබේ. මෙය නීතියේ සීමා ඉක්මවා ක්‍රියා කිරීමක් හෙවත් බලාතික්‍රමණයකි. මේ පිළිබඳව පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකු කිසිදු ක්‍රියාමාර්ගයක් වත් ගෙන නැත. එයින් ගම්‍යවන්නේ ඔවුන් කිසිවකු ද ඒ පිළිබඳ දැනුවත් වී නොමැති බවය.

මේ තත්වය දේපළ තහනමට ගැනීම, කුලී නොගෙවීම මත වෙළඳ සැල් පවරා ගැනීම, ඉඩම් පවරා ගැනීම, මාර්ග පළල් කිරීම ආදී අවස්ථාවන්හි දී ඉතා සුලභව දැකිය හැකිය. අතුරු ව්‍යවස්ථා ප්‍රතිපාදන පසෙක ලා වාහන නතර කිරීමේ ගාස්තු අය කිරීම හා වෙළඳ ප්‍රචාරක දැන්වීම් සඳහා අතිවිශාල මුදල් ප්‍රමාණයන් අය කිරීම, කිසිදු නීතියක විධිවිධාන නොමැතිව සන්නිවේදන කුළුණු සඳහා දැවැන්ත බදු නියම කිරීම ආදිය මෙහිලා ඉදිරිපත් කළ හැකි උදාහරණ කීපයක් පමණි.

7.6.7 පළාත් පාලන ආයතන සඳහා පැවති පළාත් පාලන කොමසාරිස්වරයාගේ කාලීන විමර්ශන (PERIODICAL INVESTIGATIONS) නොමැතිවීම.

පළාත් පාලන කොමසාරිස්වරයාගේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි එක් ප්‍රධාන කාර්යයක් වූයේ සිය දිස්ත්‍රික් සහකාර පළාත් පාලන කොමසාරිස් වරුන්ගේ පළාත් පාලන ආයතන තුළ සිදු කරනු ලබන කාලීන විමර්ශන සමාලෝචනය කර දිවයිනේ පළාත් පාලන ආයතන පද්ධතියේ කාර්යක්ෂමතාවය පිළිබඳව සංඛ්‍යාත්මකව හා ගුණාත්මකව ගණනය කිරීමයි. මේ

සඳහා වෙනම විශේෂිත කාර්ය මණ්ඩලයක් හා ප්‍රධාන කාර්යාලයේ ප්‍රගති පාලන ඒකකයක් ස්ථාපනය කර තිබුණි.

පළාත් පාලන ආයතන විමර්ශනය සඳහා යොදවා සිටි කාර්ය මණ්ඩලය ශ්‍රේණිගත විමර්ශන නිලධාරීන්ගෙන් සමන්විත විය. මෙම සේවය සමූපකාර සමිති පරීක්ෂක, තැපැල් කාර්යාල පරීක්ෂක ආදී සේවාවන්ට සමාන්තරව පැවතුනි. ඒ සඳහා විශේෂිත බඳවා ගැනීම් පටිපාටියක් ද පැවතුනි. එම සියලු නිලධාරීන් ගිණුම් හා ගණකාධිකරණය පිළිබඳ වෘත්තිය සුදුසුකම් සපුරා තිබිය යුතු වූ අතර විගණනය පිළිබඳව පුහුණුවක්ද ලබා දෙන ලදී. පොල්ගොල්ල සමූපකාර විද්‍යාලයේ ගණකාධිකරණ පාඨමාලාව හදාරා සමත් වූ නිළධාරීන්, මරදාන කාර්මික විද්‍යාලයේ ගිණුම්කරණය සමත් නිළධාරීන් මේ සඳහා පැවති තරඟ විභාගයට සුදුසුකම් ලද්දෝ වූහ.

මෙම විමර්ශන නිලධාරීන්ගේ සේවාව, විමර්ශන නිලධාරී, ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී සහ මූලස්ථාන ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී වශයෙන් ශ්‍රේණි ගත කොට තිබුණි. ඔවුන් තුළ ගිණුම් කටයුතු, නීති කටයුතු, විනය කටයුතු, ටෙන්ඩර් පටිපාටි, සහා රැස්වීම් හා කමිටු කළමණාකාරණය, ගබඩා හා වත්කම් කළමනාකරණය පිළිබඳව පැවති දැනුම ඉතා ඉහළ මට්ටමක පැවතුනි. ඔවුන්ට සිය කුසලතාව තුළින් සහකාර කොමසාරිස් තනතුර දක්වා උසස්වීමේ ඉඩ ප්‍රස්ථා පැවතුනි.

මෙම විමර්ශන නිළධාරීන්ගේ ක්ෂෙත්‍ර කටයුතු මැනවින් සංවිධානය වී තිබුණි. සෑම පළාත් පාලන ආයතනයක් සම්බන්ධයෙන්ම නිශ්චිත රාමුවක විමර්ශන වාර්තාවක් ඔවුන් විසින් සම්පාදනය කළ යුතු විය. එහෙත් එය විගණනයක් හෝ පොලිසිය මගින් කරනු ලබන වංචා විමර්ශනයක් ද නොවේ. ඔහුගේ විමර්ශනය ඉතා මිත්‍රශීලී එකකි. සභාපති/ලේකම් වරයාගේ ඉතා කිට්ටුවන්ත මිත්‍රශීලී මඟපෙන්වන්නා ඔහු විය. මෙම නිළධාරියා පළාත් පාලන ආයතනය හෙවත් රජය හා පළාත් පාලන ආයතනය හෙවත් ප්‍රාදේශීය ආණ්ඩුකරණය සම්බන්ධ කරන ප්‍රධාන පුරුක විය. ඩොනමෝර් කොමිෂන් සභා නිර්දේශ මත බිහිවූ මෙම සේවාව වර්තමානය දක්වාම පවතී. එහෙත් අද එහි ගුණාත්මක භාවය සහ නිපුණතාවය ඉතා දුර්වල මට්ටමකට පත්වී ඇත. විධිමත් කාලීන විමර්ශන වාර්තාවන් දැකිය නොහැකි අතර මෙම නිළධාරීන් ප්‍රධාන වශයෙන් මහජන පැමිණිලි පරීක්ෂාවෙහි යෙදී සිටින බව පෙනේ.

7.6.8 පළාත් පාලන ආයතනයන්හි නිළධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග තුළින් පළාත් පාලන විෂය ඉවත් වීම.

1989/90 වර්ෂයන්හි පළාත් පාලන සේවාව පළාත් රාජ්‍ය සේවයට සාවද්‍ය ලෙස අන්තර් ග්‍රහණය කිරීම පළාත් පාලනයේ සංකීර්ණ ගැටළු ඇති කිරීමට හේතු වී ඇත. එසේ ඇතිවූ එක් ගැටළුකාරී තත්වයක් නම් පළාත් පාලන ආයතනවල සේවය කරන පළාත් සභා රාජ්‍ය සේවාවේ නිලධාරීන්ට සිය මූලික විෂයය තමන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා සම්බන්ධ කර නොගැනීමයි. පරිපාලන සේවාවන්හි හෝ වෙනත් දීප ව්‍යාප්ත සමාන්තර සේවාවෙහි මාණ්ඩලික නිලධාරීන්ට හෝ ඒකාබද්ධ සේවාවේ නිලධාරීන්ට කාර්යක්ෂමතා කඩඉම් සඳහා තමාගේ විෂය ක්ෂේත්‍රයට අදාල වූ ප්‍රශ්න පත්‍රයක් හෝ යටත් පිරිසයින් ප්‍රශ්න කිහිපයක්වත් තිබිය යුතුය. එසේ වූ විට නිළධාරීන් පළාත් පාලනයේ සෑම අංශයක්ම ඉගැනීමට හා නිවැරදි කරුණු සොයා බැලීමට ඇතැම් නිළධාරීන් ක්‍රියා කරනු දැකිය හැකිය. පොදුවේ විභාගයකදී කිසියම් විෂය ක්ෂේත්‍රයක් සඳහා පළාත් සභා රාජ්‍ය සේවා නිළධාරීන්ගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා උපයෝගී කොට ගන්නේනම් එම විෂයය පිළිබඳව ප්‍රශ්න පත්‍ර එකක් හෝ කිහිපයක් මගින් එය සිදුකළ යුතුය. එහෙත් පළාත් රාජ්‍ය සේවාවේ නිලධාරීන්ට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන පොදු කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහාම පෙනී සිටීමට සෑම පළාත් සභාවකම රාජ්‍ය සේවා කොමිෂන් සභා ක්‍රියා කර ඇත. මේ තත්වය හේතුකොට ගෙන පළාත් පාලනය පිළිබඳ කිසිම නිළධාරියෙකු මොනම කරුණක් හෝ ඉගැනීමට හෝ වැඩිදුර සොයා බැලීමට උනන්දුවක් දැක්වූයේ නැත. එය පළාත් පාලනය නොදන්නා පිරිසක් එම ආයතන පාලනයට පත්වීමට මූලික හේතුව ලෙස අදටත් පවතී.

7.6.9 පළාත් පාලන ආයතනයන්හි නිළධාරීන්ගේ පුහුණුවේ ඌණතා.

මීට ඉහතදී ද සඳහන් කළ පරිදි පළාත් පාලන ආයතන සඳහා පුහුණුව ලබාදෙන ප්‍රධාන ආයතන දෙකක් පවතී.

(1) පළාත් කළමනාකරණ පුහුණු සංවර්ධන ඒකකය. (MDTU)

(2) පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (SLILG)

I මේ අතුරින් (MDTU) මගින් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරණුයේ රාජ්‍ය සේවාවේ සාමාන්‍ය පුහුණු ක්‍රියාමාර්ග පළාත් සභාවේ කාර්ය මණ්ඩල සඳහා ද පවත්වා

ගෙන යාමය. එමගින් අධ්‍යාපන, සෞඛ්‍ය, කෘෂිකර්ම, සමාජ සේවා වැනි දෙපාර්තමේන්තුවල බහුතරයක් වූ නිළධාරීන්ට පවත්වන පුහුණුව සඳහා ම පළාත් පාලන ආයතනවල නිලධාරීන් ද කැඳවනු ලැබේ. එයින් සිදුවී ඇත්තේ පළාත් පාලනය නමැති විශේෂිත ආණ්ඩුකරණ ස්ථරයේ විෂය දැනුම හා බැඳී ඇති විශේෂිත බව නැතිවී යාම තවදුරටත් ඉක්මන් වීමයි. ඇත්ත වශයෙන්ම මෙය සිදුවී හමාරය.

II පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් පළාත් පාලනය පිළිබඳ විවිධ විෂයයන් සහ පුහුණු පාඨමාලා පැවැත්වීම මත MDTU හරහා පළාත් පාලන කොමසාරිස්වරු මගින් පළාත් පාලන කාර්ය මණ්ඩල ඉලක්ක කර පාඨමාලා පවත්වනු ලැබේ. මෙම ආයතනය පළාත් පාලනය පිළිබඳ පුහුණුව, ධාරිතා වර්ධනය, පර්යේෂණ සඳහා ඇති ප්‍රධානතම ආයතනයයි. එසේ වුවත් ඊට විෂය මූලික උපදේශකවරු හෝ අධ්‍යයන කාර්ය මණ්ඩලයක් නැත. අධ්‍යයන කාර්ය සඳහා ඊට ප්‍රධාන වශයෙන්ම බාහිර සම්පත් දායකයින් කෙරෙහි රැඳී සිටීමට සිදුවී ඇත. පුහුණු පාඨමාලා පවත්වාගෙන යාමේදී හෝ බාහිර පුහුණු ලබාදීමේදීත් SLILG ආයතනය විසින් උපයෝගී කොට ගනු ලබන්නේ ලංකාවේ දැනට පළාත් පාලන ආයතනවල හෝ පළාත් සභාවල සේවයේ නිරත නිළධාරීන් හා පළාත් පාලන දැනුම සහිත විශ්‍රාමික නිළධාරීන්ය. එම නිළධාරීන් අතුරින් ඉතා ඉහල දැනුමක් සහිත පළාත් පාලන විශේෂඥ පිරිස දැන් වියපත් වී හෝ අභාවයට පත්වී හෝ විදෙස් ගතවී ඇත. එබැවින් දැනට එම පිරිස අතර සිටින ශාස්ත්‍රීය අධ්‍යාපන සුදුසුකම් ලත් නිළධාරීන් සිටිනුයේ අතිශයින් විරලවය. දෙවනුව SLILG ආයතනය මෙරට විශ්ව විද්‍යාල වල අධ්‍යයන කාර්ය මණ්ඩලය ද යම් ප්‍රමාණයකට මේ සඳහා යොදාගනී. එහෙත් එම පිරිස අතර පළාත් පාලනය ප්‍රගුණ කළ කිසිවකු නැත. පළාත් පාලන ආයතන වල හා පළාත් සභාවන්හි නිළධාරීන්ගේ පළාත් පාලනය පිළිබඳ දැනුම සීමිත වුවකි. ඔවුන් පැරණි පරපුරේ පළාත් පාලන නිළධාරීන් මෙන් එම විෂය මූලධර්ම සමග කියවීමෙන් ලද දැනුමෙන් තොර වුවෝ වෙති.

මෙසේ නානාවිධ සම්පත්දායක පිරිස් වෙන වෙනම පළාත් පාලන ආයතන කාර්ය මණ්ඩල වෙත ලබාදෙන දැනුම බෙහෝවිට එකිනෙකට වෙනස් වේ. ඊට හේතුව ඔවුන් ශාස්ත්‍රීය දැනුමින් තොර ක්ෂේත්‍රය තුළ වැඩ කිරීමෙන් ලද දැනුමින් පුහුණු කටයුතු කිරීමය. පළාත් පාලන ගිණුම්කරණය, පළාත් පාලන බදු, පළාත් පාලන ආදායම් ප්‍රවර්ධනය, පළාත් පාලන නීතිය ආදී විෂයයන් සම්බන්ධයෙන් මෙම සම්පත් දායකයින් බහුවිධ අදහස් හෝ මත ප්‍රකාශ කිරීම ඉතා බහුලව දැකිය හැකිය.

මේ අතර පළාත් පාලන ආයතන සංසදය විසින් ද විවිධ පුහුණු කිරීම් හා පළාත් පාලනය පිළිබඳ ප්‍රකාශන පළ කිරීම් කරනු ලැබේ. එසේම කලින් කල විවිධ ආයතන හා ව්‍යාපෘති මගින් ද යම් යම් පුද්ගලයන් ලවා පළාත් පාලන කාර්ය මණ්ඩල වෙත පුහුණු අවස්ථා සම්පාදනය කරනු ලබයි. මේ සඳහා ජාත්‍යන්තර සංවිධාන විසින් මූල්‍යාධාර සම්පාදනය කිරීම සිදුවේ. එහෙත් එමගින් කෙරෙන්නේ සත්‍ය වශයෙන්ම පළාත් පාලන ආයතනවලට අවශ්‍ය දැනුම ලබාදීම ද එසේ නැතහොත් ඔවුන් සුදුසු යයි සලකන යම් කරුණු ද යන්න සොයා බැලිය යුතුය.

පළාත් පාලන පුහුණු සැලසුම් කිරීම සඳහා පුහුණු අවශ්‍යතා අධ්‍යයනයක් (Training Need Assessment) සිදුකළ යුතුය. අනතුරුව එහි නිගමන විශ්ලේෂණය කොට පුහුණු පාඨමාලා සංවිධානය කළ යුතුය. එම පාඨමාලා සඳහා පළාත් පාලන විශේෂඥතාව දරන සම්පත් දායකයින් මගින් පුහුණුව ලබාදිය යුතුය. වෙනත් ආයතන, විශේෂයෙන් (FSLGA) වැනි ආයතන හෝ ජාත්‍යන්තර ආධාර ආයතන පළාත් පාලන මානව සම්පත් සංවර්ධනය සඳහා ආයෝජනය කිරීමට අදහස් කරන්නේ නම් එය SLILG ආයතනයේ එකඟතාව මත පමණක් සිදුකළ යුතුවේ.

එසේ නොමැතිව පළාත් පාලනය ගැන යමක් දන්නා පිරිස් කාර්ය මණ්ඩල පුහුණුවට යොමුවීම විශාල අභාග්‍යයකි. දැන් එම කාර්ය සිදුවී ඇත. පළාත් පාලන පුහුණු ලබා දෙන ඇතැම් පිරිස් සත්‍ය වශයෙන්ම උගන්වන්නේ පළාත් පාලනය ද යන්න බෙහෙවින් ප්‍රශ්න සහගතය. මෙහිලා ගත හැකි හොඳම ක්‍රියාමාර්ගය පුහුණු මොඩියුල සෑම ක්ෂේත්‍රයක් සඳහාම SLILG ආයතනය මගින් සම්පාදනය කොට MDTU හා සෙසු ආයතනවල පුහුණුකරුවන්ට ඒ ගැන අවබෝධයක්

ලබාදී පළාත් පාලන ක්ෂේත්‍රය තුළ ප්‍රචලිත කිරීමයි. මේ සඳහා වර්තමානයේ SLILG ආයතනය කටයුතු ආරම්භ කර තිබීම වැදගත් පියවරකි.

කෙසේ වෙතත් දැනට පවතින පළාත් පාලන පුහුණුව නම් ඉතාම අසාර්ථක ක්‍රියාවලියකි. එහි ඌණතා බොහෝ ඇත. මෙය ඉතා කල්පනාකාරීව සම්පාදනය කරනු ලබන සැලැස්මක් මත සෑම පාර්ශව කරුවකුගේම සහභාගීත්වයෙන් යුතුව සිදුවිය යුතුය.

7.6.10 පළාත් පාලන විගණනයේ දුර්වලතා

පළාත් පාලනයේ විගණනය යනු කුමක්ද? ''විගණනය යන්නෙන් අදහස් කරන්නේ කිසියම් ආයතනයක හෝ ව්‍යාපාරයක පරමාර්ථ ඉෂ්ඨ කර ගැනීම පිණිස කළමනාකාරීත්වය විසින් යොදවා ඇති උපාය මාර්ග හෝ ශිල්ප ක්‍රම, අභ්‍යන්තර පාලන ක්‍රම, එයට අදාල අණ පනත්, නීතිරීති හෝ සම්ප්‍රදායන් නිසි පරිදි ක්‍රියාත්මක කර තිබේදැයි සහ පරමාර්ථයන් පිළිබිඹු වන සේ පිළිගත් ගණකාධිකරණ සිද්ධාන්තයන් පදනම් කරගෙන සත්‍ය හා සාධාරණත්වය පෙන්නුම් කරන මූල්‍ය ප්‍රකාශන හා අනෙකුත් විශ්වාසදායක මූල්‍ය ලේඛන පිළියෙළ කර තිබේදැයි ක්‍රමානුකූලව පරීක්ෂණයට භාජනය කිරීමයි. වෙනත් වචන වලින් සඳහන් කළහොත් අධිකාරය, යෝග්‍යතාවය, පිරිමැස්ම, කාර්යක්ෂමතාවය හා ඵලදායී බවට මනා සැලකිල්ලෙන් යුතුව කළමනාකාරීත්වය විසින් ගිණුම් වගකීම් හා පරිපාලන යුතුකම් නිසියාකාරව ඉෂ්ඨකර තිබේදැයි පරීක්ෂාකර බැලීමයි''[16]

පළාත් පාලන විගණනය පිළිබඳ ප්‍රමාණික විද්වතෙකු වූ කොළඹ මහා නගර සභාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණකව සිටි වරලත් ගණකාධිකාරී, ජී. ආර්. ඊ. එල්. බණ්ඩාර මහතාගේ ඉහත කෙටි හැඳින්වීම වත්මන් විගණකවරුන්ගේ අවධානයට යොමුවන්නේ නම් ලංකාවේ පළාත් පාලන ආයතනයන්හි කළමනාකාරීත්වය ඉදිරි කාලයේදී හෝ රටට ඵලදායක වූවක් වනු නිසැකය. වර්තමාන විගණනය පළාත් පාලන විගණනයෙහි යෙදෙනුයේ පළාත් පාලන නීතිය හෝ එහි මූලධර්ම පිළිබඳ කිසිදු දැනුමක් හෝ අවබෝධයක් නොමැතිව වීම කණගාටුදායක තත්වයකි. පළාත් පාලන නීතිය, පළාත් පාලන ගිණුම් ක්‍රමය, පළාත් පාලන බදු ක්‍රමය, පළාත්

---

16 පිටු අංක 3,4 අභ්‍යන්තර විගණනය (පළාත් පාලන ආයතනය) - 1988 ජී.ආර්.ඊ.එල්. බණ්ඩාර් නාගරික මුද්‍රණාලය- කොළඹ 07

පාලන විගණනය පිළිබඳ පාලන ව්‍යවස්ථා ප්‍රතිපාදන ආදිය පිළිබඳ හොඳ දැනීමක් පළාත් පාලන විගණකවරයා සතුවිය යුතුය.

ඇතැම් පළාත් පාලන විගණන නිලධාරීන්ගේ මගපෙන්වීම හා බලපෑම මත බෙහෝ පළාත් පාලන ආයතන විසින් මේ වන විට පළාත් පාලන ගිණුම් ක්‍රමය අනුගමනය කරනු නොලැබේ. ඒ වෙනුවට රජයේ දෙපාර්තමේන්තු, අමාත්‍යංශ හා ව්‍යවස්ථාපිත ආයතන සඳහා සම්පාදනය කොට නීති ගතකර ඇති ගිණුම් ප්‍රමිති (Accounting Standerds) පළාත් පාලන ආයතනයන්හි ද භාවිතා කරනු ලැබේ.

> උදා :- ඌව පළාත් සභාවේ පළාත් පාලන කොමසාරිස්වරයාගේ අංක CLG/UVA/2/3/4 හා 2015.12.14 දිනැති චක්‍රලේඛනය, මෙය ඌව පළාතේ මහා නගර සභාවන්හි නාගරික කොමසාරිස්වරු, නගර සභා හා ප්‍රාදේශීය සභා ලේකම්වරුන් අමතා නිකුත් කරන ලද්දකි. මෙය විගණකාධිපතිවරයාගේ උපදෙස් මත ගිණුම් ප්‍රමිති පළාත් පාලන ආයතන මගින් සම්පාදනය කරවීමට අවශ්‍ය උපදෙස් හා ආකෘති සමග පිටු 10 කින් යුතු වූ චක්‍රලේඛණයකි.

එහි පූර්වකාවෙහි පළාත් පාලන කොමසාරිස්වරයා සඳහන් කරන්නේ විගණකාධිපති වරයාගේ වාර්ෂික වාර්තාවෙහි පළාත් පාලන ආයතනවල මූල්‍ය ප්‍රකාශන ප්‍රමාදවීම ගැන තමන් දිගින් දිගටම දෝෂ දර්ශනයට ලක්වී ඇති බවය. එසේම එහි අවසානයේ පළාත් පාලන ආයතන වෙත ලැබෙන මුදල් ප්‍රතිපූරණ ලබා ගැනීමට නම් මෙම මූල්‍ය ප්‍රකාශන කඩිනමින් ඉදිරිපත් කළ යුතු බව දක්වා ඇත.

මෙයින් පිළිබිඹු කෙරෙන යථාර්ථය කුමක්ද? ශතවර්ෂාධික කාලයක් තිස්සේ පළාත් පාලනයට ආවේණික වූ ගිණුම් හා මූල්‍ය කළමනාකරණ ක්‍රම පැවැතුනි. එය 1974 වර්ෂයේ දී යථාවත් කොට එවකට පැවති රජයේ, පළාත් පාලන බලධාරීන්ගේ මෙහෙයවීම මත නවීකරණය කොට පළාත් පාලන ආයතනයන්හි භාවිතය සඳහා නීතිගත කර ඇත. එම ගිණුම් ක්‍රමය රැගත් මූල්‍ය රීති පළාත් පාලන අමාත්‍යවරයා විසින් පනවනු ලැබිය යුතුය. එම රීති පද්ධතිය තුළ පළාත් පාලන ආයතනයක අවසාන ගිණුම් සැකසීමේ විධිවිධාන පැහැදිලිව දක්වා තිබේ. එසේ අමාත්‍යවරයාගේ විධිමත් අනුමැතිය මගින් ක්‍රියාත්මක ගිණුම් ක්‍රමය හදිසියේ විගණකාධිපතිවරයා රජයේ ආයතන සඳහා වූ ගිණුම් ප්‍රමිති මෙම ක්ෂේත්‍රය සඳහා මෙතෙක්

කල්හි පැවති රීති පරිච්ඡින්න කිරීමකින් තොරව පළාත් පාලන ආයතන වෙත බලෙන් පැටවීම කෙතරම් අභාග්‍යසම්පන්න තත්වයක් ද? නමුත් එය එසේම සිදුවී ඇත.

ඒ හැර පළාත් පාලන ආයතන විසින් දැනට දශකයකට වැඩි කාලයක සිට සිදුකරන නීතියට පටහැනි ආදායම් පැනවීම හා නිවේදන ආදිය අතිශය දෝෂ සහගතව පළ කෙරේ. ඒ සම්බන්ධව කිසිම අවස්ථාවක විගණනය පළාත් පාලන කොමසාරිස්වරුන් වෙත දැනුම් දීමක් කර ඇති බවක් අනාවරණය නොවුනි. ඊට හේතුව මෙහි මුලින් බණ්ඩාර මහතා සඳහන් කළ පරිදි විගණකවරයා සතු විය යුතු මූලික සුදුසුකම් හා ප්‍රවීණතාව දැන් එම නිළධාරීන් සතු නොවීමයි.

මුල් කාලවල පළාත් පාලන ආයතන විගණනය කර වාර්ෂිකව පැවැත්වෙන විගණන සාකච්ඡාව (Audit Conference) පළාත් පාලන ආයතන ප්‍රධානියාගේ නායකත්වයෙන් නියෝජ්‍ය විගණකාධිපතිගේ හෝ විගණන අධිකාරීගේ සහභාගීත්වයෙන් පැවතුනි. එහිදී පැවති ගැටළු, දෙපාර්ශ්වයේම පැහැදිලි කිරීම්, සාවද්‍ය නිගමන පැවතියේ නම් ඒවා නිවැරදි කිරීම එහිදීම සිදුවිය. එය ඉතා මිත්‍රශීලිව සිදුවූ සාකච්ඡාවකි. එයින් නිරාකරණය නොවූ බරපතල කරුණු පමණක් රාජ්‍ය ගිණුම්කාරක සභා වාර්තාවේ ඡේද වලට ඇතුළත් කෙරුණි.

වර්තමානයේ මෙබඳු ක්‍රියාකාරකම් සිදුනොවේ. පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාව වෙත සමහර විට ඉදිරිපත් වන්නේ ද එතරම් හරයක් නොමැති සුළු සුළු කාරණා වීම දක්නට ලැබේ.

උදාහරණ වශයෙන් 1981 වර්ෂයේ සිටි විගණකාධිපති පී. එම්. ඩබ්. විජේසූරිය මහතා විසින් පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම්කාරක සභාවට ඉදිරිපත් කර ඇති වාර්තාවේ ලංකාවේ පළාත් පාලන ආයතන:

i.	මහනගර සභා	12
ii.	නගර සභා	38
iii.	සුළු නගර සභා	83
iv.	ගම්සභා	546
		679

කින් අයවීමට තිබූ අධිභාර සංඛ්‍යාව 1046 කි.[17] එම වාර්තාවට අනුව මහානගර සභා සහ නගර සභාවන්හි හිඟ ආදායම් මෙසේ දැක්වේ.

වගුව 13: 1981 - 12 - 31 දිනට හිඟ ආදායම්

අංකය	ප.පා ආයතනය	වරිපනම්	වෙනත්	එකතුව
1	මහා නගර සභා	45,230,114	45,304,824	90,534,938
2	නගර සභා	15,514,334	47,178,267	58,738,149
3	**එකතුව**	**467,744,448**	**92,483,091**	**149,273,087**
	මුළු එකතුව	560,227,539		

මේ අනුව 1981-12-31 දිනට ලංකාවේ මහා නගර සභා හා නගර සභාවන්හි මුළු හිඟ ආදායම රු.මි.560 කි. වරිපනම් හිඟය රු.මි. 467.7 කි. වෙනත් ආදායම් හිඟය රු.මි. 92.5 කි. මීට අමතරව දිවයිනේ සියළුම සුළු නගර සභා හා ගම් සභාවන්හි අදාල හිඟ මුදල් සියල්ල ද ගණනය කර වාර්තාවෙහි සඳහන් කර තිබේ.

මේ අනුව එකල පළාත් පාලනයට අදාලව විගණකාධිපති දෙපාර්තමේන්තුව ඉතා සමීප අධ්‍යයනයන් සිදුකරන ලද අතර දත්ත පද්ධතියක්ද පවත්වාගෙන ගිය බව අනාවරණය වේ. මේ අනුව වර්තමාන විගණනය පළාත් පාලන ආයතනයන්හි නීති පද්ධතිය හා මුලින් සඳහන් කළ සෑම අංශයකම පුළුල් දැනුමක් සහිතව සිය කාර්යභාරය ඉටුකළ යුතු තත්වයකට පත්ව ඇති බව පෙන්වා දිය හැකිය.

ඉහත දැක්වූ කරුණු දහය (10) හේතුකොට ගෙන පළාත් පාලනය තුළ දැනට උද්ගත වී ඇති ගැටළුකාරී තත්වය ක්‍රමිකව වර්ධනය වූ අයුරු මැනවින් පැහැදිලි කරගත හැකිය. මෙම තත්වය යථාවත් කර පළාත් පාලන ආයතන පද්ධතිය නිසි මගකට ගැනීම සඳහා විශාල පරිශ්‍රමයක් දැරීමට සිදුවේ. ඒ සඳහා ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ හා නීති ප්‍රතිසංස්කරණ සිදුකිරීමත් ප්‍රබල නායකත්වයක් සහිතව ඊට ඉදිරිපත් වීමක් අත්‍යවශ්‍ය වේ.

---

[17] පිටු අංක 207- 238 පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 50 - 1981 වර්ෂය සඳහා විගණකාධිපති - (පළාත් පාලන බල මණ්ඩල) - රජයේ ප්‍රකාශන කාර්යාංශය, කොළඹ

08 පරිච්ඡේදය

8. නිරීක්ෂණ හා නිර්දේශ

මෙම පර්යේෂණය සඳහා ශ්‍රී ලංකාවේ මුළු පළාත් පාලන ආයතන සංඛ්‍යාවෙන් 14% ක නියැදියක් පරීක්ෂාවට ලක්කරන ලදී. එහිදී ඒ එක් එක් පළාත් පාලන ආයතනයක් සම්බන්ධ යථා ස්වරූපය හා එකී සභාවල භෞතික වශයෙන් පැවති තත්වය විශ්ලේෂණය කරන ලදී. එම තොරතුරු මත පදනම්ව එළඹි නිගමන හා ඒ පිළිබඳ නිරීක්ෂණ මෙන්ම නිර්දේශ ද මෙම පරිච්ඡේදයේදී ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ.

8.1 නිරීක්ෂණ

I <u>පළාත් පාලන ආයතන පරිපාලනය අධීක්ෂණය කිරීමේ දුර්වලතාවයන්</u>

මෙම පර්යේෂණ අධ්‍යයනය සිදු කිරීම තුළ පළාත් පාලන ආයතනයන්හි තොරතුරු ලබා ගැනීමේදී මෙන්ම වර්තමාන පළාත් පාලන ආයතන ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීමේදී අනාවරණය වූ කේන්ද්‍රගත ප්‍රශ්නය වූයේ සමස්ථ පළාත් පාලන ආයතන පද්ධතියෙහි පරිපාලන කටයුතු සඳහා උපදේශනය, මඟ පෙන්වීම හා අධීක්ෂණය නිසි පරිදි සිදු නොවන බවකි. මෙම තත්වය විශේෂයෙන් පර්යන්තයන්හි පිහිටි පළාත් පාලන ආයතන තුළ මෙන්ම පාලන කේන්ද්‍රයන්ට සමීප පළාත් පාලන ආයතන තුළ ද එකසේ දැකිය හැකිවීම මෙම ක්ෂෙත්‍රය පොදුවේ මුහුණ පා ඇති කිසියම් අර්බුදකාරී තත්වයක් පිළිබඳව නිහඬ ඉඟියක් විදහාපාන තත්වයක් බව පෙනීයයි.

එහිදී ප්‍රථමයෙන්ම මෙම පර්යේෂණ අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලද පළාත් පාලන ආයතන 48 හි ඇතුලත් මහා නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා අධ්‍යයනය කිරීම තුලින් අනාවරණය වූ ප්‍රතිඵල ලංකාවේ සමස්ථ මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සම්බන්ධයෙන් විශ්ලේෂණාත්මකව ගලපා පුරෝකථනය කළහොත් දිස්වන චිත්‍රය පිළිබඳව අවධානය යොමු කිරීම පළාත් පාලනය උදෙසා ප්‍රතිපත්ති සම්පාදනය කරන්නන් හට බෙහෙවින් වැදගත් වනු ඇත.

පළමුව මහා නගර සභාවන්ට අදාල නියැදියේ යථා ස්වරූපයට අනුරූපව මුළු මහා නගර සභා සංඛ්‍යාවට එය ගැලපිය හැකි අන්දම විමසා බලමු. (නියැදිය ආයතන 12 කි. සමස්ථය ආයතන 24 කි.)

වගුව14: මහා නගර සභා සම්බන්ධ නිවැරදි ආදායම් පැනවීම් පුරෝකථනය

අංකය	ආදායම් මූලය	නිසැදිගත නිවැරදි පැනවීම් සංඛ්‍යාව	සමස්ත මහජන නිවැරදි පැනවීම් පුරෝකතනය
1	වරිපනම්	02	04
2	බලපත්‍ර ගාස්තු	01	02
3	ව්‍යාපාර බදු	03	06
4	කර්මාන්ත බදු	03	06
5	විනෝද බදු	00	00
6	වාහන හා සත්ව බදු	04	08
7	සංවර්ධනය නොකළ ඉඩම් මත බදු	02	04

මේ අනුව පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාවේ මුළු මහා නගර සංඛ්‍යාව වූ 24 න් ආයතන 04 ක පමණක් වරිපනම් නිවැරදිව පනවා තිබිය හැකි බවත්, ආයතන 02 ක් බලපත්‍ර ගාස්තු නිවැරදිව පනවා තිබිය හැකි බවත්, ආයතන 06 ක් ව්‍යාපාර බදු නිවැරදිව පනවා තිබිය හැකි බවත්, ආයතන 06 ක් කර්මාන්ත බද්ද නිවැරදිව පනවා තිබිය හැකි බවත්, ආයතන කිසිවක් විනෝද බදු නිවැරදිව පනවා නොමැති විය හැකි බවත් ආයතන 08 ක් වාහන හා සත්ව බද්ද නිවැරදිව පනවා තිබිය හැකි බවත් හා ආයතන 04 ක් සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද නිවැරදිව පනවා තිබිය හැකි බවත්ය. මෙය කෙතරම් බරපතල ගැටළුවක්ද යන්න අවබෝධ කොට ගෙන ඊට සාධනීය විසඳුම් ලබාදිය හැකි ආකාරයට ප්‍රතිපත්ති සම්පාදනය කළ යුතුවේ. දෙවනුව ශ්‍රී ලංකාවේ නගර සභා 42 කට අදාලව ආයතන 15 ක් වූ නියැදියේ ප්‍රතිඵල නිරූපණය වන ආකාරය ගලපා බැලිය හැකිය. (නියැදිය ආයතන 15 යි. සමස්ථය ආයතන 42 යි.)

වගුව15: නගර සභා සම්බන්ධ නිවැරදි ආදායම් පැනවීම් පුරෝකථනය

අංකය	ආදායම් මූලය	නියැදිගත නිවැරදි පැනවීම් සංඛ්‍යාව	සමස්ථ නස. නිවැරදි පැනවීම් පුරෝකථනය
1	වරිපනම්	00	00
2	බලපත්‍ර ගාස්තු	00	00
3	ව්‍යාපාර බදු	00	00
4	කර්මාන්ත බදු	00	00
5	විනෝද බදු	00	00
6	වාහන හා සත්ව බදු	02	05
7	සංවර්ධනය නොකළ ඉඩම් මත බදු	02	05

මෙයින් පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාවේ නගර සභා 42 ක් අතුරින් කිසිම ආයතනයක් නිවැරදිව වරිපනම්, බලපත්‍ර ගාස්තු, ව්‍යාපාර බදු, කර්මාන්ත බදු හා විනෝද බද්ද පනවා ගැනීමටත් නොහැකි තත්වයක පවතින බවත්, ආයතන 05 ක් වාහන හා සත්ව බදු සහ ආයතන 05 ක් සංවර්ධනය නොකළ ඉඩම් මත බදු නිවැරදිව පැනවිය හැකිව තිබූ බව පුරෝකථනය කළ හැකි බවයි. මෙම අතිශය බැරෑරුම් තත්ත්වය රටේ පළාත් පාලන ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ කඩිනම් අවධානයට යොමු කිරීම වැදගත් වේ.

අවසාන වශයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සභා 270 ට අදාලව නියැදියේ ඇතුලත් ආයතන 21 හි දත්ත ගැලපීම් කිරීමේදී නිරූපණය වන අන්දම සලකා බැලීම ප්‍රයෝජනවත් වේ. (නියැදිය ආයතන 21 යි. සමස්ථය ආයතන 270 යි.)

වගුව16: ප්‍රාදේශීය සභා සම්බන්ධ නිවැරදි ආදායම් පැනවීමේ පුරෝකථනය

අංකය	ආදායම් මූලය	නියැදිගත නිවැරදි පැනවීම් සංඛ්‍යාව	සමස්ථ නස. නිවැරදි පැනවීම් පුරෝකථනය
1	වරිපනම්	00	00
2	අක්කර බදු	00	00
3	බලපත්‍ර ගාස්තු	02	25
4	ව්‍යාපාර බදු	00	00
5	කර්මාන්ත බදු	01	12
6	විනෝද බදු	00	00
7	වාහන හා සත්ව බදු	00	00
8	සංවර්ධනය නොකළ ඉඩම් මත බදු	01	12

මෙයින් ගම්‍ය වන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සභා 270 න් ආයතන කිසිවක් වරිපනම්, අක්කර බදු, ව්‍යාපාර බදු, විනෝද බදු හා වාහන හා සත්ව බදු පැනවීම නිවැරදිව සිදුකළ නොහැකි වී ඇති බවය. ආයතන 25 ක් බලපත්‍ර ගාස්තු ද, ආයතන 12 ක් කර්මාන්ත බද්ද ද, ආයතන 12 ක් සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද ද නිවැරදිව පැනවිය හැකිව තිබූ බවද වේ.
මෙය අතිශයින් අයහපත් ප්‍රවණතාවයකි. බොහෝ විට යථා ස්වරූපය පරීක්ෂා කළහොත් එය දළ පුරෝකථනයට වඩා බෙහෙවින් අඩු ප්‍රතිශතයක් ගැනීමට ද ඉඩ තිබේ. කෙසේ වෙතත් පළාත් පදනම යටතේ හෝ ජාතික මට්ටමින් හෝ මෙබඳු ගණනය කිරීමක් සිදු නොවීම හේතු කොට ගෙන පළාත් පාලන ආයතන සතුව පවතින ආදායම් අය කර ගැනීමේ විභව ශක්තිය බරපතල ලෙස නිශ්ක්‍රීය වී ඇති බව පැහැදිලි වේ.

II <u>පළාත් පාලන ආයතනයන්හි පරිපාලනය දුර්වලවීම</u>

මෙම අධ්‍යයනයෙහි මූල්‍ය අවධානය යොමු වූයේ පළාත් පාලන ආයතනයන්හි ආදායම් පැනවීම හා එකතුකිරීම විෂයෙහි වූ තත්වය සොයා බැලීමයි. එහෙත් එම කරුණට අදාලව තොරතුරු ලබා ගැනීමේදී හා විමසුමට භාජනය කිරීමේදී නිරීක්ෂණය වූ තවත් වැදගත් කරුණක් වූයේ එම ආයතනවල සේවා සම්පාදනය බොහෝ දුරට ඒකාංශිකව නොඑසේනම් තෝරාගත් ප්‍රමුඛතා කිහිපයක් තුලට පමණක් ගොනුවී තිබෙන බවයි. මෙරට පළාත් පාලන විෂය පථය සීමාසහිත වුවත් පළාත් පාලන ආයතනයක කාර්යයන් හා කර්තව්‍යයන් බෙහෙවින් විස්තීරණ පරාසයක පැතිර තිබේ. එතෙකුදු වුවත් බහුතර පළාත් පාලන ආයතනයන්හි ප්‍රමුඛ අවධානය යොමු වන්නේ රජය හෝ පළාත් නිළධාරීන් විසින් සංවිධානය කරන වැඩ සටහන් කෙරෙහි වීම දැකිය හැකිය. පසුගිය කාලය තුළ කසල එකතු කිරීම හා ඩෙංගු රෝගය මැඩලීමේ දීප ව්‍යාප්ත වැඩ සටහන වෙත මෙම ආයතනවල ප්‍රමුඛතාව අවධානය යොමු වී පැවති බව පෙනීගිය අතර මාර්ග පද්ධතිය රැක බලා ගැනීම නඩත්තුව හා සංවර්ධනය කිරීම, පොදු උපයෝගිතා සේවා කළමනාකරණය උදා:- සුසානභූමි, ක්‍රීඩාපිටි, වෙළඳ පොළවල් හා පොළවල්, වැසිකිළි හා පොදු වැසිකිළි, පුස්තකාල හා කියවීම් ශාලා වැඩි දියුණු කිරීම වැනි සේවාවන් ගැන බෙහෝ ආයතන දක්වා තිබුණේ ඉතා අඩු අවධානයකි.

සෞඛ්‍ය සේවා යටතට ගැනෙන මතුපිට කාණු කළමනාකරණය, ආහාර ස්වස්ථතාව, අයාලේ යන සුනඛ පාලනය, ආපනශාලා, හෝටල්, බත් කඩ, මග දෙපස ඕනෑම තැනැත්තෙකුට කෑම

විකිණීමට ඉඩ සැලසී තිබීම ආදී කරුණු ඉදිරියේ පළාත් පාලන ආයතන ඉතා පසුගාමී තත්වයක පසු වුණි.

අවිධිමත් වාහන නතර කිරීම, අවිධිමත් හා අනතුරුදායක රථවාහන ගමනාගමනය, පදික වේදිකාවන්හි වෙළඳාම වැනි දේ පළාත් පාලන ආයතනවල වගකීමෙන් සම්පූර්ණයෙන් ගිලිහී පැවතුන ස්වරූපයක් විද්‍යමාන විය. මෙම නිෂ්ක්‍රිය හෝ උපේක්ෂා සහගත ආකල්පය සහිතව පැවතීමට පළාත් පාලන ආයතනයන්ට හැකි වූයේ කවර කරුණක් නිසාද යන්න රජයේ හා අදාල බලධාරීන්ගේ අවධානයට යොමු විය යුතු කරුණකි.

මේ සඳහා බලපා ඇති කරුණු ලෙස මෙම අධ්‍යයනයේදී අනාවරණය වූයේ පළාත් පාලන ආයතන පද්ධතියෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳ විපරම් කිරීමට, සොයා බැලීමට, මඟ පෙන්වීමට, උපදෙස් දීමට හෝ අධීක්ෂණය කිරීමට කිසිම සංවිධිත වැඩ පිළිවෙළක් නොමැතිවීමත් ජනතාවට ඒ සම්බන්ධ සිය දුක් ගැනවිලි ඉදිරිපත් කිරීම පිණිස හා එහිලා ඔවුන් දැනුවත් කරන, ඔවුන්ගේ විශ්වාසය දිනාගත් ආයතනයක් නොමැතිවීමයි.

III <u>පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පරිපාලනමය දුර්වලතා</u>

එසේම මෙම අධ්‍යයනයේදී පරීක්ෂාවට භාජනය වූ ඇතැම් පළාත් පාලන ආයතන අවිධිමත් හා සාවද්‍ය ලෙස පැනවූ ආදායම් එකතු කිරීමට දේපළ තහනම් කිරීම වැනි කටයුතු වල නිරතවන අයුරුද නිරීක්ෂණය කිරීමට හැකිවිය.

උදා :- බියගම ප්‍රාදේශීය සභාව, වත්තල ප්‍රාදේශීය සභාව

ලංකාවේ පළාත් පාලන ආයතන පද්ධතිය තුළ දැනට පවත්නා මෙම පරිහාණි තත්වය වඩාත් උග්‍ර ලෙස පෙනීයන්නේ මීට දශක 2 ½ කට 3 කට පමණ පෙර ලංකාවේ පළාත් පාලන පද්ධතියේ පැවති ගතික ස්වභාවය හා සංසන්දනාත්මකව බැලීමේදීය. එබඳු තුලනාත්මක අධ්‍යයනයන් සඳහා ප්‍රශස්ත මූලාශ්‍ර වන්නේ පළාත් පාලන කොමසාරිස්වරයාගේ වාර්ෂික පාලන වාර්තාවන්ය.

පළාත් පාලන ආයතන පද්ධතියෙහි උද්ගත වී ඇති මෙම අයහපත් වාතාවරණය සම්බන්ධ ප්‍රමුඛ වගකීම දරනුයේ පළාත්බද පළාත් පාලන දෙපාර්තමේන්තුවය. වර්තමානයේ පළාත්

පාලන කොමසාරිස්වරුන් විසින් පාලන වාර්තා පළ නොකෙරේ. පළාත් පාලන ආයතනයන්හි ආදායම්, වියදම්, හිඟ මුදල්, අත්තිකාරම්, අයවැය කළමනාකරණය වැනි විෂයයන් වර්තමානයේ පළාත් පාලන කොමසාරිස්වරුන්ගේ අවධානයට නොගැනේ. ඊට අදාල සංඛ්‍යා ලේඛන නඩත්තු කරන පළාත් බද ආයතන නොමැත. යටත් පිරිසෙයින් පළාත් පාලන ආයතන පවා සිය වාර්ෂික පාලන වාර්තා සකස් කරනු නොලැබේ. මෙම පසුබිම තුළ පළාත් සභා සහ පළාත් පාලන ආමාත්‍යංශය විසින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන Review of Financial Performance නමැති සංඛ්‍යා ලේඛන වාර්තාව විශේෂයෙන් අගය කළ යුතු වුවකි. එය 1988 ට පෙර එකල පැවති මධ්‍යගත පළාත් පාලන දෙපාර්තමේන්තුවේ වාර්ෂික පාලන වාර්තාව හා සමකල නොහැකි වුවද අඩුතරමින් ලංකාවේ පළාත් පාලන ආයතන පද්ධතියෙහි මූලික දත්ත පරිශීලනය කිරීමට ඇති ප්‍රමුඛ මෙවලමක් ලෙස එය හැඳින්වීම නිවැරදිය.

වර්තමානයේ පළාත් පාලන දෙපාර්තමේන්තු සෑම පළාතකම පිහිටුවා ඇත. මෙම පළාත් බඳ දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවාවේ ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු කටයුතු කරයි. ඒ යටතේ පළාත තුළ ඇති සෑම දිස්ත්‍රික්කයක් සඳහාම පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන් පත්කරනු ලැබ ඇත. මෙම සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන්ගේ බහුතරය ද ශ්‍රී ලංකා පරිපාලන සේවාවේ නිළධාරීන්ය. මෙම සහකාර කොමසාරිස් කාර්යාලයන්හි ජ්‍යෙෂ්ඨ විමර්ශන නිළධාරීන්, විමර්ශන නිළධාරීන්, ඉංජිනේරු, ගණකාධිකාරී, තාක්ෂණ සේවා නිළධාරී, දිස්ත්‍රික් සැලසුම් නිළධාරී, ප්‍රජා සංවර්ධන නිළධාරී, සංවර්ධන නිළධාරී, සැලසුම් නිළධාරී ආදී තනතුරු දරන නිළධාරී පිරිසක් සේවය කරනු ලැබේ. එහෙත් එම නිළධාරීන් සතුව පළාත් පාලනයේ මූලධර්ම හෝ න්‍යායාත්මක ප්‍රවේශය හෝ ප්‍රායෝගික භාවිතය හෝ එම ආයතනවල සේවා සම්පාදනය ක්‍රියාවලිය පිළිබඳව වත් පළාත් පාලන ගිණුම් ක්‍රමය හෝ පළාත් පාලන විගණන ක්‍රමය පිළිබඳව වත් යථා අවබෝධයක් නොමැති බව පෙනීයයි. මෙම තත්වය නිරූපණය වන හොඳම දර්ශකය වන්නේ පළාත් පාලන ආයතනයක අභ්‍යන්තර පාලනය, නීතිමය පසුබිම, සේවා සම්පාදනය, ගිණුම්කරණය, ආදායම් පැනවීම හා ඒකරාශී කිරීම, සහභාගීත්ව අයවැය හා සැලසුම් පිළිබඳ මෙම නිළධාරීන් වෙතින් සිදුවී ඇත්තේ මන්දගාමී මැදිහත් වීමයි.

යට කී ක්‍රියාකාරකම් අධීක්ෂණය කළ හැකි ඊට නිසි මග පෙන්වීම හෝ උපදෙස් දීම කළ හැකි ප්‍රවීණ නිළධාරීන් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලවල වර්තමානයේ නොමැත. එම ගැටළුව හේතු කොටගෙන පළාත් පාලන ආයතනයන්හි ක්‍රියාකාරිත්වය සොයා බලා මාර්ගෝපදේශනය හෝ අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය වර්තමානය වන විට කණගාටුදායක ලෙස පරිහාණියට යමින් පවතී.

IV <u>පළාත් පාලන නීති යාවත්කාලීන නොවීම</u>

මෙම අධ්‍යයනයේදී අවධානය යොමුවූ තවත් වැදගත් කරුණක් වූයේ පළාත් පාලන ආයතන සඳහා වරිපනම්, බදු, බලපත්‍ර ගාස්තු හා වෙනත් ගාස්තු පැනවීමට අදාල නීති, අණ පනත් ආදිය වර්තමානයට උචිත නොවන ලෙස යල් පැනගොස් තිබීමයි. මෙම ගැටළුව හමුවේ පළාත් පාලන ආයතන සැලකිය යුතු පීඩාවකට මුහුණ දී සිටී. බදු හා බලපත්‍ර ගාස්තු පැනවීමේ දී අනුගමනය කළ යුතු මූල්‍ය සීමා බෙහෝ සෙයින් යල් පැන ගොස් තිබීම හේතුවෙන් එම ගාස්තු එකතු කිරීමට දරණ ප්‍රයත්නයේ තරමට ඉන් ලැබෙන ඵලදාව (Yield) ප්‍රමාණවත් නොවේ. මීට හේතුව වී ඇත්තේ 1979 අංක 42 දරන මහා නගර සභා සහ නගර සභා සංශෝධන පනත මගින් නව ආදායම් මාර්ග ගණනාවක් සහ එතෙක් පැවති ගාස්තු සීමා, සංශෝධනය කළ පසු පසුගිය වසර 38 ක කාලය තුළ පළාත් පාලන ආදායම් මූලයන් මෙන්ම පැවති බදු හා බලපත්‍ර ගාස්තු රේට් (අනුප්‍රමාණ) වල කිසිදු වෙනසක් සිදු නොවී පැවතීමයි.

උදා i. මහා නගර සභාවකට, නගර සභාවකට හෝ ප්‍රාදේශීය සභාවකට සිය බල ප්‍රදේශය තුළ පිහිටි ඕනෑම විශාල පිරිවැටුමක් සහිත ව්‍යාපාරයක් විෂයෙහි පැනවිය හැකි වාර්ෂික ව්‍යාපාර බද්දේ උපරිමය රු.3,000/-කි. (කොලොන්නාව බනිජතෙල් නිමාව, කොළඹ වරාය වැනි ව්‍යාපාරික ස්ථාන පවා මීට අයත් වේ.)

ii. නගර සභාවකට හෝ ප්‍රාදේශීය සභාවකට අයකළ හැකි වෙළඳ බලපත්‍ර ගාස්තු වේ උපරිමය රු. 1,000/- කි. අදාල ස්ථානයේ වාර්ෂික වටිනාකම කොපමණ විශාල ප්‍රමාණයක් වුවද මෙම මුදල උපරිමය සේ නීතියෙන් නියම වී ඇත.

මෙබඳු අවස්ථා රාශියක් වර්තමානයේ බලපවත්වන නීතියෙහි ඇතුළත් වේ.

මෙතරම් දීර්ඝ කාලයක් තුළ කාලීනව සංශෝධනය විය යුතු මෙම නීති ප්‍රතිපාදන නොවෙනස්ව පැවතීමෙන් ගම්‍ය වන්නේ කුමක්ද?

i. රජය පළාත් පාලන ආයතනයන්හි ආදායම් ප්‍රවර්ධනය කෙරෙහි දක්වන මන්දගාමී ආකල්පය.

ii. පළාත් සභාව ප්‍රඥප්ති පැනවීම මගින් මෙම නීති අක්‍රිය වන පරිදි යාවත් කාලීන විධිවිධාන හඳුන්වා දීමට දක්වා ඇති අකාර්යක්ෂමතාවය.

iii. පළාත් පාලන ආයතන සතු බලතල ඉතා ප්‍රාථමික මට්ටමක පැවතීම.

මෙබඳු වාතාවරණයක් තුළ පළාත් පාලන ආයතනවල ක්‍රියාකාරීත්වයෙහි මන්දගාමී ස්වරූපය එක් අතකින් බලන කල බලධාරීන් විසින් නිර්මාණය කරන ලද්දක් බව නිගමනය කළ හැකිය.

V <u>අතුරු ව්‍යවස්ථා නොමැතිවීම, යල්පැනගොස් තිබීම</u>

තවදුරටත් මෙම අධ්‍යයනයේදී අනාවරණය වූ කරුණක් වූයේ පළාත් පාලන ආයතන පද්ධතිය වෙනුවෙන් දැනට ක්‍රියාත්මක වන අතුරු ව්‍යවස්ථා මාලාවන්හි පවත්නා යල් පැනගිය ස්වරූපය හා බොහෝ ක්ෂෙත්‍ර සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොමැති වීමයි. කොළඹ මහා නගර සභාව සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳගෙන නොමැති හෙයින් එහි ක්‍රියාත්මකව පවත්නේ 1800-1953 කාලය අතරතුර සම්මත කරගන්නා ලද සභා අතුරු ව්‍යවස්ථා පමණි. නගර සභා සඳහා පවතින සම්මත අතුරු ව්‍යවස්ථා 1953 වසරේදී පනවන ලද ඒවා වේ.

මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථා සහ ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථා 1989 වර්ෂයේ පනවන ලද ඒවා වේ. උතුරු පළාත් සභාවේ හා නැගෙනහිර පළාත් සභාවේ අතුරු ව්‍යවස්ථා නොතිබූ අතර 2016-02-02 දින අති විශේෂ ගැසට්පත්‍ර අංක 1952/14, 1952/15 හා 1952/16 මගින් මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සඳහා නව අතුරු ව්‍යවස්ථා පනවා ඇත. නැගෙනහිර පළාත් සභාව මේ දක්වා අතුරු ව්‍යවස්ථා පනවාගෙන නැත. සෙසු පළාත් අතර මධ්‍යම, දකුණ, වයඹ සහ බස්නාහිර පළාත් පැරණි සම්මත අතුරු ව්‍යවස්ථා සුළු වශයෙන් සංශෝධනය කර පළකර තිබේ. එහෙත් ඒවාහි දෝෂ හා ඌණතා බොහෝය.

දැනට කුමන අන්දමට හෝ ඕනෑම පළාතක පනවා ඇති සම්මත අතුරු ව්‍යවස්ථා ප්‍රමාණය, අතුරු ව්‍යවස්ථා පැනවීමට නීතියෙන් ඉඩ ලබා දී ඇති ප්‍රමාණයෙන් 1/4 ක් වත් නොමැති තරම් බව පෙනේ. එයින් අදහස් වන්නේ පළාත් පාලන ආයතන ක්‍රියාකාරීත්වය කාර්යක්ෂමව හා ඵලදායී බවට පත් කිරීම සඳහා නව අතුරු ව්‍යවස්ථා තවත් විශාල ප්‍රමාණයක් සකස් කළ යුතුව ඇති බවයි.

මෙම කාර්යය පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යංශය පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය හා පළාත් සභා සතු හදිසි හා ප්‍රමුඛ වගකීමකි. රේඛීය අමාත්‍යංශයට මෙම කාර්යය පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය මගින් සිදුකළ හැකිය. එහිදී සෑම පළාතකම එකඟතාව හා ඇතැම්විට ජාත්‍යන්තර ආධාර ආයතනයන්හි සහයෝගය ද ලබාගත හැකිවනු ඇත. පළාත් සභා විසින් මෙය ඉටු කරන්නේනම් ප්‍රධාන පනත්වල අවශ්‍ය වගන්ති වෙනුවෙන් ප්‍රඥප්ති සම්පාදනය කළ හැකිය. එසේ ප්‍රඥප්ති සම්පාදනය කර විධිමත් පරිදි අනුමත කර ගත් විට ප්‍රධාන නීතියේ අදාල වගන්ති නිහඬ වී ප්‍රඥප්ති ක්‍රියාත්මක වනවා ඇත.

වසර 40කට ආසන්න කාලයක් මේ කාර්යය ඵලදායක ලෙස ඉටු නොවී තිබීම පළාත් පාලනයේ පැවැත්මට සිදුවන දැඩි බාධාවකි.

VI <u>පළාත් පාලන ආයතනයන්හි මහජන නියෝජිත පාලනය බිඳවැටීම</u>

මෙම අධ්‍යයනය සිදුකළ කාල පරිච්ඡේදය තුළ පළාත් පාලන ආයතන කිසිවක සභා ක්‍රියාත්මකව නොතිබුණි. ඒවාහි ධූරකාල අවසන්ව මැතිවරණ ක්‍රමයේ ඇතිවූ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම හේතුවෙන් පළාත් පාලන මැතිවරණ ප්‍රමාද වී තිබුණි. මෙම කාල පරිච්ඡේදය තුළ කොමසාරිස්වරුන් හා ලේකම්වරුන් සභාවන්හි බලතල ක්‍රියාත්මක කරන කාර්යය හා කර්තව්‍ය ඉටු කරන නිළධාරීන් ලෙස කටයුතු කරන ලදී.

මෙම නිළධාරී පාලනය පළාත් පාලනය නොවේ. මහජනතාවගේ අවශ්‍යතා සිය නියෝජිතයින් මගින් නීතියට අනුකූල අන්දමින් ඉටුකරවා ගැනීම බදු ගෙවන්නන්ගේ අපේක්ෂාවයි. ඒ සඳහා පළාත් පාලන ආයතන මහජනතාවට නිරතුරුවම සංවේදී විය යුතුය. එසේ වුවද නිළධාරී පාලනය තුළ මහජනතාවගේ සිතුම් පැතුම් කෙරෙහි සංවේදී වීමකින් තොරව නිළධාරීන්ට අවශ්‍ය පරිදි තීරණ ගැනීම. ආදායම් පැනවීම, සෑම ආයතනයකම පාහේ දැකිය හැකිවිය.

උදා :-

i. නියැදිගත ආයතන බහුතරයක වෙළඳ බලපත්‍ර ගාස්තු, කර්මාන්ත බදු හා ව්‍යාපාරික බදු ඉතා හිතුවක්කාරී (Arbitrary) ලෙස පනවා තිබුණි. ඉතා ඈත පිටිසර ප්‍රදේශවල පවා ඉතා කුඩා වෙළඳාම් වලට පවා බද්දේ ගාස්තුව උපරිමය පනවා තිබුණි.

ii. බදු ගෙවන ජනතාවට බැංකු ණයක් වැනි කරුණක් සඳහා අවශ්‍ය වන විරේබා සහතික, නොපවරා ගැනීම් සහතික, නිවාස ඉදිකිරීම් අයදුම්පත්, අනුකූලතා සහතික, දේපල අයිතිය වෙනස් කිරීමේ ඉල්ලුම්පත් ආදිය සඳහා ඉතා අසාධාරණ ගාස්තු පනවා තිබුණි. මෙය කිසිම නීතියකට අනුකූලව සිදුකරන ලද්දක් නොවන බව නිරීක්ෂණය විය.

එබැවින් දැනට වසර දෙකකට අධික කාලයක් ප්‍රමාද වී ඇති පළාත් පාලන මැතිවරණ කඩිනමින් පවත්වා සභාවන්හි මහජන නියෝජිත පාලනය වහා ස්ථාපනය කළ යුතුව ඇත.

VII <u>පළාත් පාලන ආයතනවල කාර්ය මණ්ඩල හිඟය</u>

පළාත් පාලන ආයතනයන්හි ආදායම් කළමනාකරණය විෂයෙහි බලපෑම් ඇති කරන තෙවන ප්‍රධාන කරුණ වූයේ පොදුවේ සෑම පළාත් පාලන ආයතනයකම පැවති මූල්‍ය හා ආදායම් කටයුතු වලට අදාල කාර්ය මණ්ඩල හිඟයයි. නියැදිගත පළාත් පාලන ආයතන අතුරින් නගර සභා තුනක (03) ලේකම් තනතුරු පුරප්පාඩුව පැවති අතර වැඩ බැලීමේ නිළධාරීන් පත්කර තිබුණි. ඇතැම් ආයතනවල ආදායම් පරීක්ෂක, ආදායම් පරිපාලක ආදී තනතුරු පුරප්පාඩු පවතින අතරම වෙළඳ බලපත්‍ර සඳහා වාර්තා ලබාදීම සිදුකරන මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරු ද පුරප්පාඩුව පැවතුනි. කොළඹ මහා නගර සභාව ඇතුළු ප්‍රධාන පළාත් පාලන ආයතනයන්හි ද කාර්ය මණ්ඩල පුරප්පාඩු මෙන්ම අනුමත කාර්ය මණ්ඩලයේ අඩුපාඩු පවත්නා බවද නිරීක්ෂණය විය.

VIII භාෂා භාවිතය පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන උල්ලංඝණය වීම.

මෙම අධ්‍යයනයේදී අනාවරණය වූ තවත් එක් වැදගත් කරුණක් වන්නේ ආදායම් පැනවීමේදී පළාත් පාලන ආයතන විසින් ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරනු ලබන ව්‍යවස්ථාපිත නිවේදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ ''භාෂාව'' සම්බන්ධයෙන් බල පැවැත්විය යුතු විධිවිධාන අතර 23 වන ව්‍යවස්ථාවේ (2) වන ඡේදය නියැදිගත බොහෝ පළාත් පාලන ආයතනයන්හි නාගරික කොමසාරිස්වරුන් හා ලේකම්වරුන් විසින් උල්ලංඝණය කර තිබුණි.

පූර්වෝක්ත ව්‍යවස්ථාවෙහි දැක්වෙන්නේ පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් ''යම් ලිඛිත නීතියක් යටතේ සාදනු ලබන හෝ නිකුත් කරනු ලබන සියළුම නියම ප්‍රකාශන, රීති, අතුරු ව්‍යවස්ථා, නියෝග සහ නිවේදන ද, ගැසට් පත්‍රය ද, ඉංග්‍රීසි පරිවර්තනයක් ද, ඇතිව සිංහල සහ දෙමළ භාෂාවලින් පළකරනු ලැබිය යුත්තේ ය.'' යනුවෙනි.

මෙය ඉතා පැහැදිලි ව්‍යවස්ථාපිත විධිවිධානයකි. එතෙකුදු වුවත් බොහෝ පළාත් පාලන ආයතන මෙම විධිවිධානය උල්ලංඝනය කර ඇති බව නිරීක්ෂණය විය. මෙය දෙයාකාරයකින් දෝෂ සහගතව ක්‍රියාවේ යොදවා තිබුණි.

i. ඇතැම් පළාත් පාලන ආයතන ඉංග්‍රීසි හෝ දෙමළ භාෂාවන්ගේ පරිවර්තන රහිතව සිංහල භාෂා නිවේදන පළකර තිබූ අතර ඇතැම් ආයතන සිංහල හෝ ඉංග්‍රීසි පරිවර්තන නොමැතිව දෙමළ බසින් පමණක් නිවේදන පළකර තිබුණි.

ii. බොහෝ පළාත් පාලන ආයතන විසින් පළකර තිබූ ඉංග්‍රීසි පරිවර්තන ඉතාම දෝෂ සහිත සාවද්‍ය අර්ථ ගෙන දෙන නිවේදන වීම.

මෙය ඉතා අසතුටුදායක හා සිදුනොවිය යුතු ක්‍රියාමාර්ගයක් වන අතර එය කිසියම් පුරවැසියෙකුගේ මූලික අයිතිවාසිකම් කඩවීමට හේතු කාරක වන තත්වයක් ද විය හැකිය.

IX පළාත් පාලනය පිළිබඳ සෑම ස්ථරයකම සිටින නිළධාරීන් සතුව ඇති අල්ප දැනුම

විශේෂයෙන් පළාත් පාලන ආයතන තුළත් එසේම පළාත් සභාවන්හි හා ජාතික මට්ටමේදී බොහෝ නිළධාරීන් තුළ ඇති පළාත් පාලනය පිළිබඳ අල්ප දැනුම මෙම ක්ෂේත්‍රයේ පසුබෑමට බොහෝ දුරට හේතු වී තිබේ. මීට ප්‍රධාන හේතුව වී ඇත්තේ සෑම ස්ථරයකම පළාත් පාලනය

ක්‍රියාත්මක වන්නේ පළාත් සභාවේ අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක දිගු කාලයක් අත්දැකීම් ඇති නිළධාරීන් හෝ නව පත්වීම් ලබා පැමිණි නිළධාරීන් වීමයි. ඔවුන්ගේ දිගුකාලීන නැඹුරුව වී ඇත්තේ රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන කෙරෙහි මිස පළාත් පාලන මූල්‍ය පාලන ක්‍රමවේදය වෙත නොවේ. ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති පිළිබඳ අවබෝධය ලබා ගැනීමට මෙම නිළධාරීන්ට දිගු කලක් ගතවනු ඇත. එහෙත් ඒ සඳහා වුවද ඔවුනට මග පෙන්වීමට සමත් නිළධාරීන් බොහෝ පළාත් පාලන ආයතනවල නැත. එමෙන්ම මීට අදාල නීති, රීති, චක්‍රලේඛ, උපදෙස් මාලා ද බොහෝ පළාත් පාලන ආයතනවල නැත. නියැදිගත බොහෝ පළාත් පාලන ආයතනයන්හි මෙකී විෂයන්ට අදාල නීති රීති, පත පොත තබා යටත් පිරිසෙයින් ප්‍රදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති පවා නොතිබුණි.

වර්තමානයේ මෙම තත්වය වඩාත් බරපතල පරිමාවකට වර්ධනය වීමට හේතුවූ තවත් වැදගත් කරුණක් ලෙස නිරීක්ෂණය වූයේ පළාත් පාලන ආයතනයන්හි නිළධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා පළාත් පාලනය, පළාත් පාලන ආදායම් කළමනාකරණය, පළාත් පාලන නීතිය වැනි විෂයයන්ගෙන් කිසිදු ප්‍රශ්ණයක් ඇතුළත් නොවීමයි. මේ නිසා අනාගතයේදී හෝ නිවැරදි දැනුමක් සහිත කාර්ය මණ්ඩල පළාත් පාලන ක්ෂෙත්‍රය තුළින් බිහිවීම බෙහෙවින් සැක සහිතය.

X <u>පළාත් පාලන පුහුණුව පිළිබඳ දුර්වලතා</u>

පෙර පරිච්ඡේදයන්හි දී සවිස්තරව දක්වා ඇති පරිදි පළාත් පාලන ආයතන වෙනුවෙන් පැවැත්වෙන බොහෝ පුහුණු පාඨමාලා සාවද්‍ය හා අසම්පූර්ණ අන්තර්ගතයන්ගෙන් යුක්ත වේ. බොහෝ ආයතනයන්හි කාර්ය මණ්ඩල විමසීමේ දී ඔවුන්ගේ පිළිතුර වූයේ පුහුණු පාඨමාලාවලදී ඔවුනට උපදෙස් ලැබී ඇත්තේ ඒ ආකාරයට බවයි. මෙවැනි අවස්ථා පිළිබඳ නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

(අ) අයවැය කෙටුම්පත් කිරීමට පුළුවෙන් ආදායම් ප්‍රභවයන් සියල්ල සැලකිල්ලට ගෙන සමීක්ෂණ පවත්වා එකී ආදායම් පිළිබඳ ශක්‍යතා ගණනය කිරීමක් (Potencial Revenue) සිදුකළ යුතු බවට උපදෙස් ලැබී නොතිබීම.

(ආ) උක්ත තත්වය හේතුකොටගෙන කර්මාන්ත බද්දට යටත් කර්මාන්ත හා ව්‍යාපාර කොපමණ සංඛ්‍යාවක් එම බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන්නේද යන්න ගැන අවබෝධයක් නිළධාරීන් සතුව නැත. එහි ප්‍රතිඵලය වී ඇත්තේ කර්මාන්ත හා ව්‍යාපාර බදු පිළිබඳ ඉදිරි වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුව සාවද්‍ය වීමයි.

(ඇ) අක්කර බදු පැනවීමට ප්‍රථම බල ප්‍රදේශයේ පවත්නා ඉඩම්වල ප්‍රමාණය සත්‍යෙක්ෂණය කිරීමේ පුළු අවශ්‍යතාව කිසිදු පළාත් පාලන ආයතනයක් විසින් සිදුකර නොමැත. මේ පිළිබඳව අවබෝධයක් පුහුණු පාඨමාලාවන්හි දී නිළධාරීන්ට නොලැබුණු බව නිරීක්ෂණය විය. මේ නිසා සෑම ප්‍රාදේශීය සභාවකම අක්කර බදු පැනවීම, ආදායම් ඇස්තමේන්තු කිරීම හා ආදායම් ඒකරාශී කිරීම ද අතිශයින් දෝෂ සහගත බව පෙනේ. බොහෝ ප්‍රදේශීය සභා අක්කර බදු පැනවීම සිදු නොකරන්නා සේම අක්කර බදු පැනවීම ඉඩම්වල ප්‍රමාණය මත පදනම්ව ඇති ආකාරය පිළිබඳ අවබෝධයක් ද ඔවුන් සතුව නැත. හලාවත ප්‍රාදේශීය සභාව වැනි පොල් වගා විශාල වශයෙන් ඇති ආයතන, පස්සර ප්‍රාදේශීය සභාව, අඹගමුව ප්‍රාදේශීය සභාව වැනි විශාල ස්ථාවර වගා ඇති ආයතනවල මෙම බද්ද පනවා තිබුණේ ඉතා සාවද්‍ය ආකාරයට වන අතර මොණරාගල, තලාව, මධ්‍යම නුවරගම් පළාත, තමන්කඩුව, තිරුක්කෝවිල්, සේරුවිල, නානාටාන්, කරච්චි හා මුහුදු බඩ පත්තුව යන ප්‍රාදේශීය සභා අක්කර බද්ද පනවා නොතිබුණි.

(ඈ) බදු හා බලපත්‍ර ගාස්තු පැනවීම පිළිබඳ සෑම ප්‍රාදේශීය සභාවක්ම පාහේ අනුගමනය කර තිබෙන ක්‍රියාමාර්ග සියල්ල සාවද්‍ය බව නිරීක්ෂණය විය. බදු හා බලපත්‍ර ගාස්තු පැනවීමේ මූලධර්ම කිසිවක් බොහෝ පළාත් පාලන ආයතනවල නිළධාරීන්ට සිය පුහුණු පාඨමාලා වලදී ලබා දී නැත. ඇතැම් අවස්ථාවලදී යම් යම් පුහුණු කරුවන් දී ඇති උපදෙස් දෝෂ සහගත වන්නා සේම පරස්පර විරෝධී වන බවද පෙනී ගොස් ඇත.

(ඉ) ආදායම් පැනවීම පිළිබඳ ගැසට් නිවේදන පළ කිරීම මුළුමනින්ම සාවද්‍ය වේ. මෙම අධ්‍යයනයේ 5 වන පරිච්ඡේදයේ මේ පිළිබඳ පවතින තත්වය විශ්ලේෂණය කර ඇත. මෙහිලා නිළධාරීන් හට ලැබී ඇති පුහුණු කිරීම් අතිශයින් නිශ්ඵල ප්‍රයත්නයන් වේ.

(ඊ) නියැදිගත පළාත් පාලන ආයතන බහුතරයක ගෙවීම් පැහැර හරින ලද කර්මාන්ත බදු හා ව්‍යාපාර බදු අයකර ගැනීමට අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇති අවස්ථා විරලය. අධිකරණ ක්‍රියාමාර්ග තුළින් මෙම හිඟ බදු නොපමාව අයකරගත හැකි බව බොහෝ නිළධාරීන් දැන සිටියේ නැති බව අනාවරණය විය. ඇතැම් ආයතන හිඟ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට අධිකරණයට වාර්තා ඉදිරිපත් කර ඇති අවස්ථාද නිරීක්ෂණය විය. බලපත්‍ර නිකුත් කිරීමේ මූලධර්මය හෝ ඒවා අයකර ගැනීමට අනුගමනය කළ යුතු නිසි නෛතික ක්‍රියාවලිය පිළිබඳව නිළධාරීන් සතු දැනුම ඉතා අල්ප වූවකි. බද්දේ හා බලපත්‍ර ගාස්තුවේ වෙනස පිළිබඳව කිසිදු නිලධාරියෙකු සතුව පැහැදිලි අවබෝධයක් නොතිබුණි.

XI <u>පළාත් පාලන නීති රීති හා ආදායම් පැනවීම පිළිබඳව පළාත් පාලන ආයතන ප්‍රධානීන් සතු දැනුම දුර්වලවීම</u>

මෙම තත්වය විශේෂයෙන් අනාවරණය වූයේ මහනුවර, දෙහිවල ගල්කිස්ස, අනුරාධපුරය, බදුල්ල, දඹුල්ල හා රත්නපුරය යන මහා නගර සභාවන්හි නගරාධිපතිවරුන් විසින් පළකර තිබූ 2016 වර්ෂය සඳහා වූ ආදායම් පැනවීමේ නිවේදන පරීක්ෂා කිරීමේදීය. මේ පිළිබඳ විශ්ලේෂණාත්මක විග්‍රහයක් තුන්වන (03) පරිච්ඡේදයේ හතරවන (04) වගුවෙහි දැක්වේ. මෙය ඉතා කණගාටුදායක තත්වයක් වන අතර ඔවුන්ට ලබා දී ඇති පුහුණුව හා මගපෙන්වීම් මුළුමනින්ම අසාර්ථක ප්‍රයත්නයක් බව පෙනීයයි.

8.2 නිර්දේශ

ප්‍රස්තුත විෂය සම්බන්ධයෙන් සිදුකරන ලද පර්යේෂණ අධ්‍යයනයේදී නියැදිගත පළාත් පාලන ආයතන 48 ක ආදායම් පැනවීම් හා ඊට ආනුෂාංගික කරුණු සවිස්තරව සොයා බැලීමේදී අනාවරණය වූ තොරතුරු පදනම් කොටගෙන පහත සඳහන් කෙටිකාලීන නිර්දේශ මෙන්ම මධ්‍ය හා දිගුකාලීන නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ. මෙහිදී කෙටි කාලීන නිර්දේශ යන්නෙන් අදහස් කර ඇත්තේ මාස 03 සිට මාස 06 දක්වා කාලය තුළ ආරම්භ කළ හැකි කාර්යයන්ය. මධ්‍ය හා දිගුකාලීන යන්නෙන් අදහස් කරනු ලැබ ඇත්තේ මාස 06 සිට මාස 18 දක්වා කාලය ඇතුළත් ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ හැකි කාර්යයන් වේ.

8.2.1 කෙටිකාලීන නිර්දේශ

i. මෙම පර්යේෂණ අධ්‍යයනයේදී අනාවරණය වූ පළාත් පාලන ආයතනයන්හි ආදායම් පැනවීමට අදාල දෝෂ හා බරපතල ගැටළු අවධානයට ගනිමින් වරිපනම්, බදු, ගාස්තු හා කුලී පැනවීම පිළිබඳ නිවැරදි මූලධර්ම හා මාර්ගෝපදේශ පෙන්වා දෙමින් සෑම පළාතකම ප්‍රධාන ලේකම්වරුන් වෙත භාෂාත්‍රයෙන් අංග සම්පූර්ණ චක්‍රලේඛණයක් අමාත්‍යංශයේ ලේකම් විසින් යැවීම, එහි පිටපත් පළාත් සභාවල පළාත් පාලන අමාත්‍යංශ ලේකම්, පළාත් පාලන කොමසාරිස් හා විගණකාධිපතිවරයා වෙත යොමුකිරීම නිර්දේශ කෙරේ.

ii. දිවයිනේ සෑම පළාත් පාලන ආයතනයකම නාගරික කොමසාරිස්වරුන්, නගර සභා සහ ප්‍රාදේශීය සභා ලේකම්වරුන් සඳහා සිංහල දෙමළ භාෂාවන්ගෙන් පළාත් පාලන ආයතනයන්ගේ ආදායම් පැනවීම හා ව්‍යවස්ථාපිත නිවේදන සම්පාදනය කිරීම පිළිබඳ තෙදින වැඩ මුළුවක් පැවැත්වීම. මෙය පළාත්බදව සංවිධානය කළ යුතු අතර එය මෙම විෂය පිළිබඳ ප්‍රවීණ සම්පත්දායක මඩුල්ලක් හරහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ මෙහෙයවීම මත නොපමාව පැවැත්විය යුතුයයි නිර්දේශ කෙරේ.

iii. ලංකාවේ සෑම පළාතකම පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයකටම අනුයුක්තව සේවය කරන (සිංහල හා දෙමල) සියළුම විමර්ශන නිලධාරීන් (කාන්තා හා පිරිමි දෙපක්ෂයම) පළාත් පාලන ආයතන වල ආදායම් පැනවීම හා ව්‍යවස්ථාපිත නිවේදන සකස් කිරීම සම්බන්ධව පුහුණුකරුවන් වශයෙන් පුහුණු කිරීම (TOT) සඳහා මැනවින් සැලසුම් කරන ලද සිව්දින පාඨමාලාවක් සිංහල, දෙමළ භාෂා ද්වයෙන්

සූදානම් කර ඒ සියළු නිළධාරීන් අනිවාර්යෙන්ම ඊට සහභාගී කරවීම නිර්දේශ කරනු ලැබේ. මෙය සෑම පළාතකම කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකක (MDTU) යන්හි මූලිකත්වයෙන් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (SLILG) විසින් මෙම විෂය පිළිබඳ විශේෂඥ දැනුමක් හා පරිචයක් ඇති සම්පත් දායක මඩුල්ලක් මගින් පැවැත්විය යුතුවේ.

iv. පළාත් පාලන ආයතනවල මේ වන විට සේවය කරන ජ්‍යෙෂ්ඨ ආදායම් පරීක්ෂක, ආදායම් පරීක්ෂක, ආදායම් පරිපාලක, මිශ්‍ර ආදායම් විෂයභාර කළමනාකරණ සහකාර, ප්‍රධාන කළමනාකරණ සහකාර, උප කාර්යාල භාර නිළධාරී, ගිණුම් කටයුතු භාර නිළධාරී ආදී ආදායම් කළමනාකරණයට සම්බන්ධව සේවය කරන කාර්ය මණ්ඩල සඳහා දිස්ත්‍රික් මට්ටමින් ආදායම් පැනවීම ව්‍යවස්ථාපිත නිවේදන සැකසීම පිළිබඳ වැඩමුළු පැවැත්වීම සහ ඊට දිවයිනේ ප්‍රමුඛ සම්පත්දායක වරුන්ගේ සේවය ලබාගැනීම නිර්දේශ කරනු ලැබේ.

v. ආදායම් පැනවීමේදී යොදාගනු ලබන බදු හා ගාස්තු සඳහා වන ගැසට් නිවේදන වල නිවැරදි ආකෘති භාෂාත්‍රයෙන්ම සකස්කොට ආදර්ශීන ලෙස දිවයිනේ සෑම පළාත් පාලන ආයතනයකම කොමසාරිස්වරුන් හා ලේකම්වරුන් වෙත යැවීම නිර්දේශ කෙරේ.

vi. පළාත් පාලන ආයතන වෙත ලබාදෙන පුහුණුව විධිමත් කළ යුතුය. සෑම විෂය ක්ෂේත්‍රයක් සඳහාම ඒ සම්බන්ධ විශේෂඥ දැනුම සහිත තැනැත්තන් මගින් පුහුණු මොඩියුල සම්පාදනය කළ යුතුය. කිසියම් විධිමත් ක්‍රමවේදයක් මත මෙම මොඩියුල සකස් කරන්නන් තෝරා ගෙන ඔවුනට එම කාර්යය පැහැදිලිව පවරා මොඩියුල සකස් කර අනතුරුව ඒවා අනුමත කර ඒ මත පුහුණු කිරීම් සිදු කිරීම නිර්දේශ කෙරේ. එමගින් පුහුණු මොඩියුලයන්හි අන්තර්ගත විෂය කරුණු වලින් පරිබාහිරව එක් එක් පුද්ගලයින් හෝ සංවිධාන විසින් අසංවිධානව සිදුකරන පුහුණු කිරීම් වැළකෙන පරිදි ක්‍රමවත් වැඩ පිළිවෙළක් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් ඇති කළ යුතුය.

vii. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් වරිපනම් අක්කර බදු, කර්මාන්ත බදු, ව්‍යාපාර බදු, බලපත්‍ර ගාස්තු ආදී ප්‍රධාන ආදායම් වර්ග සහ ඒවා පැනවීමේ ක්‍රියාවලිය සවිස්තරව දැක්වෙන සරල භාෂාවෙන් යුතු අත්පොත්, ඒ සම්බන්ධ විද්වතුන්

ලවා සම්පාදනය කොට සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් ප්‍රකාශයට පත් කරවීම නිර්දේශ කරනු ලැබේ.

viii. දැනට පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන පළාත් පාලන උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ විෂය නිර්දේශය තවදුරටත් පුළුල් කොට පළාත් පාලන ආයතනවල කාර්යය හා කර්තව්‍ය පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහ ආදායම් පැනවීමේ ක්‍රමවේද ඊට ඇතුල්වන පරිදි සංශෝධනය කොට ඒ ඒ විෂය පිළිබඳ විශේෂඥ දැනුම සහිත සම්පත් දායකයින් මගින් අදාල මොඩියුල ක්‍රියාත්මක කරවීම නිර්දේශ කරනු ලැබේ.

ix. ආදායම් පැනවීමට අදාල ව්‍යවස්ථාපිත නිවේදන සම්පාදනය කිරීම පිණිස පළාත් සභා පැමිණීමට පෙර පැවති පරිචය වූයේ පළාත් පාලන ආයතන විසින් සකස් කරන නිවේදන සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත යවා ඒවායේ නිරවද්‍යතාවය සහතික කළ පසු අදාල පළාත් පාලන ආයතනය විසින් ඒවා ගැසට් පත්‍රයේ පලකිරීමයි. මෙම ගැටළුවේ පරිමාව සැලකිල්ලට ගෙන නැවත එබඳු වැඩ පිළිවෙළක් ක්‍රියාවට නංවා යථෝක්ත නිවේදන පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලවලට ගෙන්වාගෙන ඉතා කෙටි කාලයක් තුළ විමර්ශන නිළධාරීන්ගේ පරීක්ෂාවට ලක්කර සහකාර කොමසාරිස්වරයා අනුමත කොට අදාල ආයතන වෙත ලබාදීමේ ක්‍රමවේදයක් නැවත ඇති කිරීම නිර්දේශ කරනු ලැබේ.

x. පළාත පාලන ආයතන පද්ධතියෙහි දැනට පවතින ප්‍රධාන නිලධාරී (Key Staff) සහ ආදායම්, වියදම් ක්ෂෙත්‍රයට අයත් නිළධාරී පුරප්පාඩු ඉතා කඩිනමින් සම්පූර්ණ කිරීම, මෙහිදී ආදායම් පරීක්ෂක, ආදායම් පරිපාලක, තක්සේරු පරීක්ෂක වැනි තනතුරු වල පවත්නා පුරප්පාඩු සපුරාලීම ඉතා කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීම නිර්දේශ කෙරේ.

xi. ප්‍රස්තුත ගැටළුව තිරසාර ලෙස විසඳලීම සඳහා පදනමක් ඇති කිරීම පිණිස ඉතා කඩිනමින්, කෙටි කාලීනව ගතයුතු පියවරක් වන්නේ පළාත් පාලන ආයතනවල මෙන්ම පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාල හා පළාත් පාලන කොමසාරිස් කාර්යාල වලද කාර්ය මණ්ඩල සාමාජිකයින්ට නිවැරදිව, පැහැදිලිව රාජකාරී හා වගකීම් පැවරීමයි.

නියැදිගත පළාත් පාලන ආයතන 48 අතුරින් කිසිදු ආයතනයක විධිමත් අයුරින් ආයතනයේ ප්‍රධානියාගේ සිට සුළු සේවකයා දක්වා සෑම තැනැත්තෙකුට තමාගේ රාජකාරිය, එය ඉටුකළ යුතු ආකාරය. එහිලා උපකාරී කරගත හැකි මෙවලම් හා ඊට අදාල නීති රාමුව දැක්වෙන ලිඛිත රාජකාරී පැවරීමක් සිදුකොට නොතිබුණි. මෙරට රාජ්‍ය ආයතන පද්ධතිය වෙත ''රැකියා විස්තරය'' (Job Description) නමැති මෙවලම ජනාධිපති ලේකම්වරයාගේ නියෝග සහිතව හඳුන්වා දුන්නේ 1998 වර්ෂයේදීය. එතැන් සිට එතෙක් පැවති සාම්ප්‍රදායික ''රාජකාරී ලැයිස්තුව' භාවිතයෙන් ඉවත් කළ යුතු විය. මෙය පළාත් පාලන ක්ෂේත්‍රය වෙතද හඳුන්වා දෙන ලදී. එහෙත් වසර 19 කට පසුව වුවත් අද පවා මෙරට පළාත් පාලන ආයතන තුළ භාවිතා වන්නේ රාජකාරී ලැයිස්තුවමය. එයද ඉතාමත් අසම්පූර්ණ ප්‍රාථමික ලියවිල්ලක් ලෙස භාවිතා වේ.

මෙම තත්වයම ඇතැම් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාල වල හා පළාත් පාලන කොමසාරිස් කාර්යාලවල ද දක්නට ලැබේ. රැකියා විස්තර හා කාර්ය සාධන ඇගැයීම් මෙම කාර්යාලවල ක්‍රියාත්මක වන්නේ එහි අපේක්ෂිත අර්ථයෙන් කාර්ය සාධනය මැනීමට හා කාර්ය සාධනය සමග සම්බන්ධ වූ වැටුප් වැඩිවීම් ක්‍රමය (Perfomance Realated Salery Increment System) සාධනය කිරීම පිණිස නොව කෙසේ හෝ වාර්ෂික වැටුප් වැඩිවීම ලබාදීම පිණිසය.

රේඛීය අමාත්‍යාංශයේ මැදිහත් වීම මත රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් ලෙසින් මෙම තත්වය මුළුමනින්ම වෙනස් කර පළාත් පාලන දෙපාර්තමේන්තු, සහකාර කොමසාරිස් කාර්යාල, මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභාවන්හි සියළු කාර්ය මණ්ඩල සමාජිකයින්ට නිශ්චිතව (Specific) පැහැදිලිව, පාරදෘශ්‍ය භාවයෙන් යුතු රැකියා විස්තර මගින් කාර්ය, කර්තව්‍ය හා වගකීම් පැවරීමට කඩිනම් පියවර ගැනීම නිර්දේශ කරනු ලැබේ.

ඒ තුළින් පළාත් පාලන ආයතනවල නිරවද්‍ය ලෙස ආදායම් පැනවීම, ව්‍යවස්ථාපිත නිවේදන සම්පාදනය කිරීම, ආදායම් ලේඛන හෝ පද්ධති නඩත්තු කිරීම. හිඟ මුදල් පාලනය හා පියවා ගැනීම ගිණුම්කරණය ආදී නිශ්චිත කාර්යයන් ඒ ඒ නිළධාරීන්ට පැවරීමට ක්‍රියාකළ යුතුය. එම ආයතනවල ඒ ඒ අංශ ප්‍රධානීන්ට කාල රාමුවක් නියම කොට ඊට අනුරූපව යථෝක්ත කාර්යය ඉටුකර තිබේද, ඉලක්ක ලඟා කර ගෙන තිබේද යන්න, 'පරීක්ෂා කිරීමේ වගකීම පැවරිය

යුතුය' පළාත් පාලන ආයතන සමූහය කුඩා කලාපවලට වෙන්කර ඒවායේ ඉහත කී කටයුතු නිසි පරිදි ඉටුවන්නේ ද යන්න සොයා බැලීම විමර්ශන නිළධාරී ජාලය මගින් සහකාර පළාත් පාලන කොමසාරිස්වරයා විසින් සොයා බැලිය යුතුය. එම ක්‍රියාවලිය පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පරීක්ෂාවට ලක්විය යුතුය. මෙසේ ක්‍රියාදාම විපරම් ක්‍රමයක් ගොඩ නැගීමෙන් සෑම අංශයකම නිසි ක්‍රියාකාරිත්වය ඉලක්ක ගත කාල රාමුවක් තුළ ඉටුකරවා ගැනීමටත් එය අඛණ්ඩව පවත්වාගෙන යාමටත් හැකිවනු ඇත.

මෙම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ආයතනික රීති පද්ධති අවශ්‍ය ආකෘති සියල්ල සකස් වී ඇති අතර ඒවා බොහෝ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල භාවිතයේ පවතී. එබැවින් මෙම කාර්යය අප්‍රමාදව ක්‍රියාවට නැංවීම අතිශය ප්‍රතිඵල දායක වනු ඇත.

xii. පළාත් පාලන ක්ෂෙත්‍රය සඳහා අංග සම්පූර්ණ (සංඛ්‍යා ලේඛන) දත්ත පද්ධතියක් ගොඩ නැගීම.

1990 ට පෙර ලංකාවේ පළාත් පාලන ආයතන පද්ධතිය හා පළාත් පාලන දෙපාර්තමේන්තුව සම්බන්ධ වූ ඉතා කාර්යක්ෂම සංඛ්‍යා ලේඛන හා තොරතුරු පද්ධතියක් නඩත්තු කරන ලදී. නවීන තාක්ෂණය නොපැවති එකල මෙම දත්ත සැකසීම් හා වාර්තා කිරීම් සියල්ල අතින් සකස් කරන ලද (Manual) ක්‍රමවේද හරහා ඉතා කාර්යක්ෂමව සිදුවිය.

එතෙකුදු වුවත් වර්තමානයේ කිසිදු පළාත් පාලන ආයතනයක, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයක හෝ පළාත් පාලන දෙපාර්තමේන්තුවක දත්ත හා තොරතුරු යාවත්කාලීනව සම්පාදනය කර ප්‍රකාශයට පත්කිරීමේ වැඩපිළිවෙළක් නැත. පළාත් පාලන අමාත්‍යාංශයේ ගිණුම් දෙපාර්තමේන්තුවේ විමර්ශන අංශය මගින් වාර්ෂිකව ප්‍රසිද්ධ කරනු ලබන පළාත් පාලන මූල්‍ය කාර්ය සාධනය නම් වූ ප්‍රකාශනය හැරුණු විට මේ සම්බන්ධයෙන් වෙනත් වාර්තා මෙම ක්ෂෙත්‍රයේ සම්පාදනය නොවේ. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව හා මහ බැංකු වාර්තාවේ සඳහන් දත්ත ලබාගැනීම ද මේ හරහා සිදුවේ. එහෙත් මෙම වාර්තාව අංග සම්පූර්ණ සංඛ්‍යා ලේඛන මූලධර්ම මත පදනම් වූ එකක් නොවේ. එබැවින් එය තව දුරටත් ව්‍යාප්ත කර මේ පිළිබඳ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තුමේන්තුවේ විශේෂඥ සහය ලබාගෙන සෑම පළාත් පාලන ආයතනයකම (ප්‍රාදේශීය මට්ටම), සෑම පළාත් පාලන සහකාර

කොමසාරිස් කාර්යාලයකම (දිස්ත්‍රික් මට්ටම) හා සෑම පළාත් පාලන දෙපාර්තුමේන්තුවකම (පළාත් මට්ටම) සංඛ්‍යා ලේඛන රැස්කිරීමේ, නඩත්තු කිරීමේ, සැකසීමේ, වාර්තා කිරීමේ, හා ප්‍රසිද්ධ කිරීමේ යාන්ත්‍රණයක් ඇති කිරීම නිර්දේශ කරනු ලැබේ.

මේ සඳහා යට කී සෑම ආයතනයකම දැනට සිටින උපාධිධාරී සංවර්ධන නිලධාරී පිරිස් විශේෂ පුහුණුවක් ලබාදීමෙන් පසු යෙදවිය හැකිය. තොරතුරු තාක්ෂණික ක්‍රම වේද භාවිතය මගින් මෙම දත්ත ප්‍රාදේශීය, දිස්ත්‍රික්, පළාත් හා මධ්‍යම මට්ටම් අතර කඩිනමින් සන්නිවේදනය කළ හැකි අතර කාලීනව වාර්තා සම්පාදනය කොට ප්‍රකාශයට පත්කළ හැකිය.

මෙම ක්‍රියාමාර්ගය ගැනීමෙන් පසු කිසිම පළාත් පාලන ආයතනයකට අක්‍රියව සිටීමට හෝ සිය කාර්යය සාධනය දුර්වල මට්ටමක පැවතීමට ඉඩ හැරීම දුෂ්කර වේ. මක්නිසාද යත්, සියළු පාර්ශවයන්ගේ ක්‍රියාකාරීත්වය පාරදෘශ්‍ය වන බැවිනි. එබැවින් මෙම පියවර ගැනීම මගින් පළාත් පාලන ආයතනයන්හි ආදායම් පැනවීම හා කළමනාකරණයද විධිමත් හා කාර්යක්ෂම වනවා ඇත.

8.2.2 මධ්‍ය කාලීන හා දිගු කාලීන නිර්දේශ

1 පළාත් පාලනය පළාත් සභා රාජ්‍ය සේවාව තුළ විශේෂිත සේවාවක් ලෙස ස්ථාපනය කිරීම.

පළාත් පාලනය හුදු විෂය ක්ෂෙත්‍රයක් (Subject Area) නොව එය රටක ආණ්ඩුකරණ ස්ථරයකි. (Governing Sphere) එබැවින් එම ක්ෂෙත්‍රයේ රාජ්‍යකාරී වෙනත් විෂයානුබද්ධ දෙපාර්තමේන්තු, කාර්යංශයන්හි රාජ්‍යකාරී වලට වඩා විශේෂිත වේ. වර්තමානයේ පළාත් පාලන ආයතනයන්හි සේවය කරන කාර්ය මණ්ඩල තුළ මෙම ක්ෂෙත්‍රයට අදාල නෛතික හා ප්‍රායෝගික තත්වයන් කෙසේ විය යුතුද යන්න පිළිබඳව පූර්ණ අවබෝධයක් නොමැති වීමට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත්තේ එකී කාර්ය මණ්ඩල සාමාජිකයින් ස්ථාන මාරු කිරීමේදී පළාත් සභාවේ විවිධ දෙපාර්තමේන්තු හා අමාත්‍යංශවල කාර්ය මණ්ඩල සාමාජිකයින් පළාත් පාලන ආයතනවලට අනුයුක්ත කිරීමට ඉඩකඩ සැලසී තිබීමයි.

එමගින් පළාත් පාලන ආයතනවල සිටින එම ක්ෂේත්‍රයේ ප්‍රවීණත්වය ලද නිළධාරීන් එම ආයතන වලින් බැහැරව ස්ථාන මාරුවීමෙන් පළාත් පාලන ක්ෂේත්‍රය, එම ක්ෂේත්‍රයට ආගන්තුක වෙනත් ආයතනවල සිටින නිළධාරීන්ගෙන් හා නවක නිළධාරීන්ගෙන් සමන්විතව තිබීමෙන් මෙම ආයතන මේ වන විට බරපතල ගැටළුවකට මුහුණ දී සිටී.

එබැවින් පළාතේ පළාත් පාලන ආයතන පද්ධතිය තුළ හා පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව අතර පමණක් මෙම නිළධාරීන්ට ස්ථාන මාරු ලබා ගැනීමට හැකි ක්‍රමවේදයක් සකස් කිරීමට නිර්දේශ කෙරේ. මෙය උතුරු හා නැගෙනහිර පළාත් සභා දෙක හැර සෙසු පළාත් සභාවන්හි සම්මත කර ඇති පළාත් පාලන ආයතන (කාර්ය මණ්ඩල) ප්‍රඥප්තිය සුදුසු පරිදි සංශෝධනය කිරීමෙන් සිදු කළ හැකිය. එමගින් පළාත් සභා රාජ්‍ය සේවාව තුළ විශේෂිත වූ පළාත් පාලන සේවාවක් ස්ථාපනය කළ හැකි වනු ඇත.

I. පළාත් පාලන නීති පද්ධතිය යාවත්කාලීන කිරීම

ප්‍රස්තුත කරුණට අදාළව පළාත් පාලන ආයතනයන්හි ආදායම් පැනවීම හා ඒකරාශි කිරීම මෙන්ම එහි ඉපැයීම් පරිමාව (Yeild) යන කරුණු සැලකිල්ලට ගත් කල එම ක්‍රියාවලියට බාධා පැමිණෙන ප්‍රධාන සාධකය වන්නේ මෙම ක්ෂේත්‍රයේ පවතින යල් පැනගිය නීති පද්ධතියයි. මේ සඳහා 2003 වසරේ සිට 2010 වර්ෂය දක්වා එවකට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යංශය විසින් විස්තීරණ වැඩ සටහන් ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව ප්‍රධාන නීති (Govetning Legilations) සහ ආදායම් කෙරෙහි සෘජු බලපෑම් සහිත ප්‍රධාන නීති දහයක් (10) යාවත්කාලීන කෙරෙන පරිදි සංශෝධනය සිදු කරන ලදී. එහෙත් එම ක්‍රියාමාර්ගය ඉදිරියට ගෙන ගොස් එම සංශෝධන සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගැනීම මේ වන තෙක්ම සිදුවී නැත. එබැවින් අප්‍රමාදව එම නීති ප්‍රතිසංස්කරණ කටයුතු නිම කිරීමට නිර්දේශ කරනු ලැබේ.

II. ප්‍රධාන පනත් භාෂාතුයෙන් පළකිරීම.

මහා නගර සභා සහ නගර සභා මෙරට පාලනයෙහි පසුගිය වසර 75 ක පමණ කාලය තුළ ක්‍රියාකාරීව පැවති ඇත. එහෙත් එම ආඥා පනත් දෙකම එනම් මහා නගර සභා ආඥාපනත (252 වන අධිකාරය) හා නගර සභා ආඥාපනත (255 වන අධිකාරය) දෙමළ භාෂාවෙන්

ලබාගත නොහැකිව ඇත. මහා නගර සභා ආඥා පනත දෙමළ භාෂාවෙන් කවරදාකවත් පළවී නැතත් නගර සභා ආඥා පනත 1970 දශකයට පෙර දෙමළ බසින් පළවී තිබුණද දැන් එය දැකගත නොහැකිය. ප්‍රාදේශීය සභා පනත භාෂාත්‍රයෙන්ම පළ වී ඇතත් එය මේ වනතුරු සංශෝධන සියල්ල ඇතුළත් කොට ඒකාබද්ධ කර (Consolidate) පළකර නැත.

මේ වන විට ලංකාවේ පළාත් පාලන ආයතන මුළු සංඛ්‍යාවෙන් 24% ක් දෙමළ භාෂාව කතා කරන ප්‍රදේශවල පිහිටා ඇත. එම ආයතනවල මහජන නියෝජිත පිරිස හා නිළධාරීන් බහුතරය දෙමළ භාෂාව කථා කරන අය වෙති. එම පසුබිම මත ප්‍රධාන නීති දෙමළ බසින් ලබාගත නොහැකිවීම කෙතරම් අසාධාරණ තත්වයක්ද යන්න අවධාරණය කළ යුතු වේ. එම නිසා ඉතා ඉක්මනින් ප්‍රධාන නීති හා සෙසු අත්‍යවශ්‍ය අණපනත් දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම තරයේ නිර්දේශ කෙරේ.

III. පළාත් පාලන අතුරු ව්‍යවස්ථා යාවත්කාලීන කිරීම

IV. මෙතෙක් අතුරු ව්‍යවස්ථා පනවා නොමැති විෂයයන් සඳහා ද අතුරු ව්‍යවස්ථා සම්පාදනය කිරීම.

මෙම වාර්තාවේ ඉහත පරිච්ඡේදයන්හි සවිස්තරව සඳහන් කර ඇති පරිදි දැනට බල පවත්නා අතුරු ව්‍යවස්ථා වර්තමාන සමාජ ආර්ථික අවශ්‍යතා හමුවේ ප්‍රමාණවත් නොවන හෙයින් එම අතුරු ව්‍යවස්ථා යාවත්කාලීන කොට සංශෝධනය කිරීමත් මෙතෙක් අතුරු ව්‍යවස්ථා පනවා නොමැති ක්ෂේත්‍ර ආවරණය වන පරිදි නව අතුරු ව්‍යවස්ථා පැනවීමත් නිර්දේශ කරනු ලැබේ. මෙම කාර්යය ඒ ඒ පළාත් සභා විසින් කළ යුතු අතර පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය ඊට අවශ්‍ය තාක්ෂණ සහාය, මූල්‍ය සහාය හා මාර්ගෝපදේශ ලබාදිය යුතුව ඇත.

V. විකල්ප තක්සේරු ක්‍රම හඳුන්වා දීම

පළාත් පාලන ක්ෂේත්‍රය තුළ වරිපනම් පැනවීම සඳහා දැනට භාවිතා වන වාර්ෂික වටිනාකම මත දේපළ තක්සේරු කිරීමේ ක්‍රමය බදු ගෙවන ජනතාවට අවබෝධ කර ගත නොහැකි සංකීර්ණ ක්‍රමයක් හෙයින් ඒ වෙනුවට ප්‍රාග්ධන වටිනාකමට පදනම් කොට දේපළ තක්සේරු කිරීමේ ක්‍රමවේදය පළාත් පාලනය සඳහා හඳුන්වා දීම නිර්දේශ කරනු ලැබේ. මේ සඳහා වූ ඍජු නිර්දේශ පළාත් පාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවෙහිද

දැක්වේ.[18] එමගින් පළාත් පාලන ආයතනයන්හි ආදායම වැඩි වන අතර බදු ගෙවන්නන්ට වාසිදායක ප්‍රතිඵල ගණනාවක් අත්කරගත හැකිය.

VI. පළාත් පාලන ආයතන සඳහා තක්සේරු නිළධාරී තනතුරු ඇති කිරීම හා නිළධාරීන්ට තක්සේරුකරණ පුහුණුව ලබාදීම.

ලංකාවේ පළාත් පාලන ආයතන අතුරින් තක්සේරු දෙපාර්තමේන්තුවක් ස්ථාපිතව ඇත්තේ කොළඹ මහා නගර සභාවේ පමණි. එම හේතුව නිසා එහි දේපළ තක්සේරු කිරීමේ ක්‍රියාවලිය ක්‍රමානුකූලව සිදුවේ. සෙසු මහා නගර සභාවන්හි එබඳු තක්සේරු දෙපාර්තමේන්තු හෝ අංශ පිහිටුවා නැත. මොරටුව වැනි ඇතැම් ආයතන වල එක් තක්සේරු නිළධාරී තනතුරක් පවතී.

දැනට මෙරට පළාත් පාලන ආයතන අතුරින් 90% කම දේපළ තක්සේරු කිරීම් ක්‍රියාවලිය අතිශයින් ප්‍රමාද වී ඇත. බොහෝ පළාත් පාලන ආයතන වල වසර 10-15 හෝ ඊට වැඩි කාලයක් තුළ දේපල තක්සේරු කිරීම් සිදුවී නැත. රජයේ ප්‍රධාන තක්සේරුකරුට සිය සෙසු රාජකාරී පරිමාව සමග පළාත් පාලන ආයතනයන්හි දේපළ තක්සේරු කිරීමට සිදුවීමෙන් මෙම ප්‍රමාදය හටගෙන ඇත.

1971 අංක 48 දරණ පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත මගින් පංච වාර්ෂික තක්සේරුව අනිවාර්ය කරන ලද නමුත් 1979 අංක 57 දරණ සංශෝධනයේ දී එම අවශ්‍යතාවය ඉවත්ව ඇත. එම විධිවිධාන නැවත ඇති කිරීමත්, ලංකාවේ සෑම නාගරික පළාත් පාලන ආයතනයකම තක්සේරු අංශයක් ඇතිකර ඊට අවශ්‍ය කාර්ය මණ්ඩල පත් කළ යුතු අතර ප්‍රාදේශීය සභා සඳහා ද යටත් පිරිසෙයින් එක් වෘත්තීය තක්සේරු නිළධාරියෙකු සහිත තක්සේරු අංශයක් ස්ථාපනය කිරීමත් නිර්දේශ කෙරේ.

එසේම මුලින් ශ්‍රී ලංකාවේ කාර්මික විද්‍යාල මගින් පවත්වනු ලැබූ ඉතා වටිනා තක්සේරුකරණ ඩිප්ලෝමා පාඨමාලාව දැන් නොපැවැත්වේ. එම පාඨමාලාව නැවත ආරම්භ කොට පළාත් පාලන ආයතනවල ආදායම් පරීක්ෂක හා පරිපාලක වරුන්ට එම පුහුණුව ලබාදීමෙන් පළාත් පාලන ආයතනයන්හි දැනට දේපළ තක්සේරු කිරීමට අදාලව ඇති ගැටළු රාශියක් කඩිනමින් නිරාකරණය කරගත හැකිය. මේ සඳහා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශයේ මැදිහත්වීම මත කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම නිර්දේශ කරනු ලැබේ.

[18] පිටු අංක: 103, 104 පළාත් පාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාව- සැසි වාර්තා අංක 01-1999 රජයේ ප්‍රකාශන කාර්යාංශය- කොළඹ.

VII. පළාත් පාලන ආයතන සඳහා විශේෂිත පළාත් පාලන සේවාවක් ස්ථාපනය කළ පසු ඊට අයත්වන සෑම සේවා ගණයකටම බඳවා ගැනීම්, උසස්වීම්, ස්ථාන මාරුවීම් ආදී කටයුතු එම සේවාවට ආවේනික ක්‍රමවේදයන් මගින් සිදුකළ හැකි වේ. ඒ අනුව පළාත් පාලන නීතිය ආදී විෂයයන් එකී විභාග නිර්දේශ මාලාවන්ට ඇතුළත් කිරීම නිර්දේශ කෙරේ.

VIII. පළාත් පාලන ක්ෂේත්‍රය ලංකාවේ සෙසු බොහෝ ක්ෂේත්‍ර මෙන්ම පැරණි හා ගතානුගතික පාලන ක්‍රමවේද තුළට සීමාවී පැවතීම ප්‍රබල දුර්වලතාවයකි. එබැවින් එකී සේවා සම්පාදනය, වත්කම් කළමනාකරණය, ගිණුම් ක්‍රමය, ආදායම් එකතු කිරීම, ප්‍රසම්පාදනය හා නීතිමය පියවර ගැනීම් ආදී කටයුතු නවීකරණය කළ යුතු අතර ඊට දියුණු රටවල පළාත් පාලන ආයතන අනුගමනය කරන නවීන තාක්ෂණය සමග බද්ධ වූ පාලන ක්‍රමවේදය හඳුන්වා දිය යුතු අතර එම ආයතන වල සීමිත ආදායම් සීමාව පුළුල් කර ස්වයං උත්පාදිත ආදායම් මාර්ග ශක්තිමත් කිරීමට විධිමත් ක්‍රියාමාර්ග ගැනීම නිර්දේශ කරනු ලැබේ.

මෙහිදී පළාත් පාලන නීති පද්ධතිය නූතන සමාජ ආර්ථික පසුබිම හා සමපාත වන අයුරින් නවීකරණය කිරීම, පළාත් පාලනයේ මූලධර්ම තුළ එහි අනන්‍යතාවය රැකෙන පරිදි සිදු කිරීම අතිශයින් වැදගත් වේ. පළාත් පාලන ආයතන යනු රජයේ හෝ පළාත් සභාවේ හෝ එබඳු වෙනත් ආයතනයන්හි ශාඛා හෝ උපකාර්යාල නොවන බව මෙහිදී බලධාරීන් අවබෝධ කොට ගැනීම අතිශයින් වැදගත් වේ.

IX. මේ වන විට ශ්‍රී ලංකාවේ සෑම පළාත් පාලන ආයතනයකම වරිපනම් හා බදු පැනවීම සම්බන්ධව ගැසට් පත්‍රයේ පළ කළ යුතු ව්‍යවස්ථාපිත නිවේදන ඉතා සංවේදී ලෙස පළ කරන අතර ඇතැම් ආයතන වීදි පාළු නොකර වරිපනම් හා බදු සැලකරන බවට නිලීක්ෂණය වීම

ඊට තවත් ප්‍රතිකර්මයක් ලෙස පහත සඳහන් පියවර ගැනීම නිර්දේශ කෙරේ.

i. ප්‍රාදේශීය සභා සඳහා වූ වරිපනම් හා බදු පැනවීම් පිළිබඳ ආදර්ශ වාර්ෂික නිවේදන වල ආකෘති කෙටුම්පත් කර 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 184(1)(ඇ) වගන්තිය සමග කියවිය යුතු 171(උ) වගන්තිය ප්‍රකාර පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් රීතියක් වශයෙන් ගැසට් පත්‍රයේ පළ කිරීම.

ii. නගර සභා ආඥා පනතේ 193(2)(1) (ඉ) වගන්තිය අනුව නගර සභාවල වාර්ෂික වරිපනම් හා බදු නිවේදනවල ආදර්ශ ආකෘති පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් රීතියක් වශයෙන් ගැසට් පත්‍රයේ පළ කිරීම.

iii. මහා නගර සභා ආඥා පනතේ 289 වන වගන්තිය අනුව මහා නගර සභා වල වරිපනම් හා බදු පිළිබඳ වාර්ෂික නිවේදන ආදර්ශ ආකෘති පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් නියෝගයක් වශයෙන් ගැසට් පත්‍රයේ පළ කිරීම.

මේ සඳහා උපදෙස් රැගත් චක්‍රලේඛයක් පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යංශ ලේකම් විසින් පළාත් සභා බලධාරීන් වෙත යැවීමෙන් ඒ ඒ පළාත් සභාවන්හි පළාත් පාලන විෂයභාර අමාත්‍යවරුනට ඉදිරි පියවර ගැනීමට හැකිවනවා ඇත.

X. මෙම අධ්‍යයනයේදී අනාවරණය වූ තවත් වැදගත් කරුණක් නම් දිවයිනේ සෑම පළාතකම බදු ගෙවන්නන්ගේ සංගම් වල ඇති අක්‍රීය ස්වභාවයයි. මෙම සංගම් ක්‍රියාශීලී කාර්යභාරයක් ඉටුකරන්නේ නම් පළාත් පාලන ආයතන වලට අත්තනෝමතික ලෙස කටයුතු කළ හැකි නොවේ. එබැවින් එම සංගම් ශක්තිමත් කිරීම උදෙසා කිසියම් දිරිගැන්වීමක් කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම නිර්දේශ කෙරේ.

උපලේඛණ

උපලේඛණ අංක 01

පළාත් පාලන ආයතනයන්හි වරිපනම්, බදු හා බලපත්‍ර ගාස්තු පැනවීමට අදාල නව නීති හා ශ්‍රී.ලං.නි වාර්තා කිහිපයක්;.

1. ෆර්ඩිනැන්ඩස් එදිරිව කොළඹ ම.න.ස. 49 න.නී.වා.420

   වරෙන්තු ගාස්තු අය කළ හැක්කේ වරෙන්තුවක් නිකුත් කර එය ක්‍රියාත්මක කළේ නම් පමණි.

2. ඊ.නවරත්නම් එදිරිව කඳුකර ඉහළ කෝරළේ ගම් සභාව 56 න.නී.වා. 430 අක්කර බදු පැනවීමට අදාල නඩුකරයකි.

3. ද සිල්වා එදිරිව කුරුණෑගල සමූපකාර සමිතිය 57 න.නී.වා. 430 - සමූපකාර සමිතියක විකිණීමට සහල් තබා ගැනීම සහල් ගබඩා කිරීමක් සේ සලකා පවරන ලද නඩුවකි. එය ගබඩාවක් නොවන බව තීරණය කර ඇත.

4. ජයවර්ධන එදිරිව අප්පුහාමි - 17 න.නී.වා. 74 බලපත්‍රයක් අවලංගු කරනු ලැබූ විට ඒ බලපත්‍ර ලාභියාට දැනුම් දිය යුතු යැයි තීරණය වී ඇත.

5. පුසාරි එදිරිව පෙරේරා - 25 න.නී.වා. 255 බලපත්‍රයක් නියමිත බලධාරියා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් අත්සන් කරනු ලැබිය යුතුය. බලපත්‍රයක වෙනුවට යනුවෙන් යොදා අත්සන් කළ නොහැකිය.

6. සෞඛ්‍ය පරීක්ෂක එදිරිව හරමානිස් - 19 න.නී.වා. 339 විධිමත් කිරීමට හෝ පාලනය කිරීමට අතුරු ව්‍යවස්ථා පැනවීම සඳහා බලය පවරා ඇත්නම් එයින් ගම්‍ය වන්නේ ව්‍යාපාරය අඛණ්ඩව පවත්නා බව හා එය විධිමත් කිරීමට හා පාලනය කිරීමට බලය ඇති බවයි. පොදු වෙළෙඳ පොළෙන් බැහැර ස්ථාන වල මාළු විකිණීම තහනම් කර තිබුණි. අතුරු ව්‍යවස්ථාවකින් කළ යුත්තේ පොදු වෙළෙඳපොළ භාවිතා කරන්නන් ගේ කටයුතු විධිමත් කිරීම විනා එයින් බැහැර කටයුතු තහනම් කිරීම නොවේ. ඒ අනුව මෙම අතුරු ව්‍යවස්ථාව බලාතික්‍රමණය කර තිබූ බවට අධිකරණය නියෝග කොට තිබුණි.

7. පෙරේරා එදිරිව ප්‍රනාන්දු - 17 න.නී.වා 494 මෙයට ඉහත කරුණට සමාන සිද්ධියක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාව බලාතික්‍රමණය කර ඇති බවට දෙන ලද තීන්දුවකි.

8. සනීපාරක්ෂක සහා පරීක්ෂක එදිරිව ලව්නේරිස් - 17 න.නී.වා 275

එක් නාගරික දිස්ත්‍රික් සභාවක් විසින් අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථා මගින් "කබුක් ගල් කැපීම" අන්තරාදායක ව්‍යාපාරයක් ලෙස නම් කර තිබුණි. එය උල්ලංඝනය කරනු ලැබුවේ යැයි යම් පුද්ගලයෙකුට එරෙහිව ඉදිරිපත් කර තිබූ අභිචෝදනයක විත්ති වාචකය වශයෙන් ඔහු ඉදිරිපත් කර තිබුණේ තමා විසින් කබුක් ගල් කැපීම කරන ලද්දේ තමාගේම නිවස තනා ගැනීම සඳහා වන හෙයින් එය ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් නොවන බවයි. මේ විත්ති වාචකය අධිකරණය විසින් පිළිගන්නා ලදී.

ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් නොවන ක්‍රියාකාරකමක් ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් ලෙස අතුරු ව්‍යවස්ථාවක් මගින් නියම කිරීම බලාතික්‍රමණය කිරීමක් බව අධිකරණය තීරණය කර ඇත.

9. වැලිගම නගර සභාව එදිරිව අයි.එල්.එම්.අශරෆ් - 66 න.නී.වා 41

බොහෝ පළාත් පාලන ආයතන විසින් ප්‍රචාරක දැන්වීම් පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගෙන ක්‍රියාත්මක කරනු ලැබේ. සම්මත අතුරු ව්‍යවස්ථාවේ බලපත්‍ර ගාස්තු ප්‍රමාණය නිශ්චිතව දක්වා නැත. කිසිදු පළාත් පාලන ආයතනයක් ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා වල ගාස්තු දැක්වෙන උපලේඛණය ඇතුලත් කර අතුරු ව්‍යවස්ථා පනවා නැත. ප්‍රා.ස. පනතේ 126 වන වගන්තියේ (xxx) වන පේදය අනුව බලපත්‍ර ගාස්තු අය කළ හැක්කේ අය කළ යුතු බලපත්‍ර ගාස්තුව අතුරු ව්‍යවස්ථාට ඇතුලත් වන්නේ නම් පමණි.

10. කේ.ඒ.ඩේවිඩ් එදිරිව අබ්දුල් කාදර් - 65 න.නී.වා 253 රාජාධිකරණ තීන්දුව

11. කේ.ඒ.ඩේවිඩ් එදිරිව අබ්දුල් කාදර් - 77 න.නී.වා 18

ලංකාවේ නීතිය අනුව නීතියට අනුකූල නොවන කරුණු සලකා බලා බලපත්‍රයක් ප්‍රතික්ෂේප කිරීමෙන් ආධිනතාව උද්ගත වේ. එවිට බලපත්‍ර දායක බලධාරියාගේ තීරණයේ ප්‍රතිඵලය වන්නේ අදාල ව්‍යාපාරය, වෘත්තීය, කර්මාන්තය හෝ රැකියාව කරගෙන යාමට නොහැකිවීමයි. මෙවැනි අවස්ථාවක ඉල්ලුම්කරුට තම ව්‍යාපාරය, රැකියාව කරගෙන යාමට නොහැකි වීම

නිසා සිදුවන අලාභය බලපත්‍ර දායක බලධරයාගෙන් අයකර ගැනීම සඳහා නඩුකරයක් ඉදිරිපත් කළ හැකිය.

මෙම නඩුව පුත්තලම නගර සභාවේ සභාපතිවරයා ප්‍රසිද්ධ රැගුම් ආඥාපනත යටතේ කොන්දේසි සහිත බලපත්‍රයක් නිකුත් කිරීම නිසා වසර දෙකක් තුළ පැමිණිලිකරුගේ ව්‍යාපාරය කරගෙන යා නොහැකි විය. කිසියම් ලිඛිත නීතියකින් විධිමත් කර ඇති කර්මාන්තයක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රැකියාවක් සම්බන්ධයෙන් බලපත්‍රයක් නිකුත් කිරීමේදී එයට අමතර කොන්දේසි එකතු කිරීමට බලධරයාට බලයක් නැත.

මෙහිදී එසේ කර තිබීම හේතුවෙන් රාජාධිකරණය තීරණය කර ඇත්තේ වග උත්තරකරු වන්දි ගෙවීමට යටත් වන බවයි. මෙහිදී සභාපතිවරයාට අදාල වන්දිය සිය පෞද්ගලික මුදලින් පැමිණිලිකරුට ගෙවීමට සිදුවිය.

12. ගුණසේකර එදිරිව ආදායම් පරීක්ෂක - 53 න.නී.වා 229

13. සිල්වා එදිරිව කුරුණෑගල සමූපකාර සමිතිය - 57 න.නී.වා 430

14. කේ.ඒ.දොන් ඇල්බට් එදිරිව නාගරික ආදායම් පරීක්ෂක - 65 න.නී.වා 1

මෙම නඩුකර තුනම අදාල වන්නේ පළාත් පාලන ආයතන මගින් වාර්ෂිකව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන බලපත්‍ර ගාස්තු පැනවීමට අදාල නිවේදන වල ඇතැම් ද්‍රව්‍ය "ගබඩා කිරීම" බලපත්‍රයක් ලබා ගත යුතු ව්‍යාපාරයක් ලෙස සඳහන් කර තිබීම සම්බන්ධයෙනි. "ගබඩා කිරීම" ව්‍යාපාරයක් වන්නේ කිසියම් තැනැත්තෙකු තවත් පුද්ගලයෙකුගේ භාණ්ඩ ගාස්තුවක් අයකර ගෙන කිසියම් කාල පරිච්ඡේදයක් තුළ තම සන්තකයේ පවතින ගොඩනැගිල්ලක තබා ගැනීමෙනි. විකිණීම සඳහා යම් භාණ්ඩ තබා ගැනීම ගබඩා කිරීමක් නොවේ. ඒ අනුව විකිණීමට සහල් තබා ගැනීම හෝ වෙන්දේසිකරුවෙකු අන්‍යයන්ගේ ලී බඩු වෙන්දේසි කිරීම සඳහා තම පරිශ්‍රයේ තබා ගැනීම බලපත්‍ර ලබාගත යුතු ගබඩා කිරීමක් නොවේ.

15. ටී.ඕ.ඩී. ජැනිසන් එදිරිව දෙහිවල ගල්කිස්ස නගර සභාව - 56 න.නී.වා. 445 -

අර්ථ නිරූපන ආඥාපනතේ 17 (1) (ඇ) ඡේදය අනුව යම් නීතියකින් කිසියම් බලධරයෙකුට යම් කාර්යයක් විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම හෝ පාලනය කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවීමේ බලයක් පවරා ඇත්නම් එම බලයට බලපත්‍ර නිකුත් කිරීමේ බලයද

පවරා ඇති ලෙස සලකනු ලැබිය යුතුවේ. අතුරු ව්‍යවස්ථා පැනවීමට බලය පවරා තිබීම පමණක් ප්‍රමාණවත් නොවේ. එම කාර්යය සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා තිබිය යුතුය. බලපත්‍රයක් නොමැතිව උළු නිපදවීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් තැනැත්තෙකුට එරෙහි අභිචෝදනයක් ඉදිරිපත් කර තිබුණි. අදාල කාර්යය සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබූ බැවින් චූදිත විසින් නීතියක් උල්ලංඝනය කර නොමැති බව අධිකරණය තීරණය කර ඇත.

16. කොරිලැක් එදිරිව බෙනඩික්ට් - 46 න.නී.වා. 427 -

බලපත්‍රයක් ලබා ගැනීමට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබූ විට පළාත් පාලන ආයතනයේ නිලධාරීන්ගේ කාර්යය ආරම්භ වේ. බලපත්‍රය ඉල්ලා ඇති කාර්යය හෝ විෂය සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබේනම් ඒ බව ඉල්ලුම්කරුට දන්වා යැවිය යුතුය. අතුරු ව්‍යවස්ථා පනවා තිබේනම් අදාල පරිශ්‍රය අතුරු ව්‍යවස්ථාවට අනුකූලද යන්න පරීක්ෂා කොට අනුකූල නම් බලපත්‍රය නිකුත් කළ යුතුය. නොඑසේනම් ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඊට හේතු දැක්විය යුතුය. ඉල්ලුම් පත්‍රය සභාපතිවරයා වෙත ලැබී ඇති විටක ඒ සම්බන්ධයෙන් ක්‍රියා නොකර ඉල්ලුම්කරුට එරෙහිව බලපත්‍රයක් නොමැතිව ව්‍යපාරයක් කරගෙන යාම සම්බන්ධයෙන් අභිචෝදනයක් ඉදිරිපත් කළ නොහැකිය.

17. නුර්දීන් එදිරිව ගොඩපිටිය ගම් සභාව - 44 න.නී.වා. 294

18. ඒ.ආර්.එම්. ජුනයිඩ් එදිරිව ඩී.පී.එම්.ගුණවර්ධන - 75 න.නී.වා. 408

19. ඒ.එල්.ඒ.අසීස් එදිරිව උඩුනුවර ප්‍රාදේශීය සභාව - අභියාචනාධිකරණ ඉල්ලුම්පත් අංක 407/94

ඇතැම් පළාත් පාලන ආයතන මගින් අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කිරීමේ මුවාවෙන් මහජනයාගේ මූලික අයිතිවාසිකම් නිශේධනය කරන ලද අවස්ථා වාර්තා වී තිබේ. ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තියේ (ix) වන අනුඡේදයේ (ඒ) විෂයාංකය යටතේ මස් වෙළඳාම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පැනවීමට ප්‍රාදේශීය සභා වලට බලය පැවරී තිබේ. ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථා වල 20 වන කොටසේ "මස් විකිණීම" පිළිබඳ අතුරු ව්‍යවස්ථා ඇතුලත් වේ. බලදායී වගන්තියේ හෝ අතුරු ව්‍යවස්ථා වල හෝ බලපත්‍රයක් ලබා ගැනීමට

ප්‍රථම "මස් වෙළඳාමේ අයිතිය" ලබාගත යුතු බවට පැනවුමක් නැත. එසේ වුවද බොහෝ ප්‍රාදේශීය සභා "මස් වෙළඳාමේ අයිතිය" ටෙන්ඩර් කැඳවා තෝරාගනු ලබන තැනැත්තාට මුදලක් අයකර ප්‍රදානය කරනු ලැබේ. මෙම ක්‍රියාව ප්‍රාදේශීය සභා පනතට පමණක් නොව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටද පටහැනිය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වන ව්‍යවස්ථාවේ (i) වන අනු ව්‍යවස්ථාවේ (උ) ඡේදයේ සෑම පුරවැසියෙකුටම "එකලාව හෝ අන් අය සමඟ යම් නීත්‍යානුකූල රැකියාවක, වෘත්තියක, කර්මාන්තයක, වෙළෙඳ ව්‍යාපාරයක හෝ ව්‍යවසායක නියුක්ත වීමේ නිදහස" හිමි බව සඳහන් වේ. එහෙත් පළාත් පාලන ආයතන විසින් ඉහත ආකාරයෙන් මේ නිදහස අහිමි කිරීමට ක්‍රියාකරනු ලබන අතර ඒ ආයතන වලට නොපවරන ලද "අයිතියක්" බදු දෙනු ලැබේ. පළාත් පාලන ආයතනයකට මස් වෙළෙඳාම් කිරීමේ අයිතිවාසිකමක් කවර හෝ නීතියකින් පවරා නොමැති අතර එවැනි ව්‍යාපාරයක් කරගෙන යාමේ අයිතිවාසිකම ඕනෑම පුරවැසියෙකුට තිබේ.

20. බුල්ජන්ස් එදිරිව හෙන්ඩ්‍රික් අප්පු - 42 න.නී.වා. 420

පළාත් පාලන ආයතන අතුරු ව්‍යවස්ථාවක් යටතේ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පෙර ඒ පිළිබඳව හොඳින් අධ්‍යයනය කර නෛතික ප්‍රතිපාදන පිළිබඳව හොඳ අවබෝධයක් ඇති කර ගත යුතුය. මෙහිදී පොදු වෙළෙඳ ප්‍රදේශයක් තුළ බුලත් විකිණීම සම්බන්ධයෙන් තැනැත්තෙකුට එරෙහිව අභිචෝදනයක් ඉදිරිපත් කර තිබුණි. එසේ කරන ලද්දේ 1898 අංක 18 දරණ ප්‍රාදේශීය මණ්ඩල (Local Board) ආඥා පනත යටතේ පනවන ලද අතුරු ව්‍යවස්ථාවක් මඟිනි. එයින් පොදු වෙළඳ ප්‍රදේශයේ බුලත් වෙළෙඳාම තහනම් කර තිබුණි. එසේ වුවද නීතිකෘත්‍යය ඉදිරිපත් කර තිබුණේ නගර සභා ආඥා පනතේ විධි විධාන යටතේය. එහෙත් නගර සභා ආඥා පනතේ එවැනි තහනමක් කිරීමට අතුරු ව්‍යවස්ථා පැනවීමට බලය පවරා නොතිබුණි. නගර සභාවේ පූර්වගාමියා වූ ප්‍රාදේශීය මණ්ඩලය පනවා තිබූ අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් අභිචෝදනය ඉදිරිපත් කර තිබූ අතර එම අතුරු ව්‍යවස්ථා නගර සභා ආඥා පනතේ විධිවිධාන වලට අනනුකූල බැවින් අවලංගු වන බව තීරණය කොට චූදිත නිදහස් කරන ලදි.

උපලේඛණ අංක 02

ප්‍රශ්නාවලිය I

අධ්‍යයනයට අදාල දත්ත විශ්ලේෂණය

අංකය	පළාත	දිස්ත්‍රික්කය	පළාත් පාලන ආයතනය	නිලධාරී සංඛ්‍යාව	පුහුණු ක්ෂේත්‍ර								වෙනත් කරුණු
					i	ii	iii	iv	v	vi	vii	viii	

05 - පනවා ඇති බදු හා බලපත්‍ර ගාස්තු

පළාත - ..... දිස්ත්‍රික්කය- ..... පළාත් පාලන ආයතනය-.....

අංකය		ඔව්	නැත	වෙනත් කරුණු
i	වරිපනම්			
ii	බලපත්‍ර ගාස්තු			
iii	කර්මාන්ත බදු			
iv	ව්‍යාපාර බදු			
v	වාහන හා සත්ව බදු			
vi	සංවර්ධනය නොකළ ඉඩම් පිළිබඳ බදු			
vii	විනෝද බදු			
viii	අක්කර බදු			
ix	ප්‍රසිද්ධ රැගුම් බලපත්‍ර ගාස්තු			
x	වෙනත් බදු			
xi	ඉඩම් විකිණීම් මත බදු			
06	බදුපැනවීම සම්බන්ධ සභා යෝජනා / තීරණ			
07	එම නිවේදන ගැසට් පත්‍රයේ පළ කිරීම			

08	අංකය හා දිනය	
09	තක්සේරු දැන්වීම් යවා තිබේද?	
10		
11	යවන ලද දිනය	
12	..... ලැබුණු විරෝධතා සංඛ්‍යාව ..... සිදුකළ පරීක්ෂණ සංඛ්‍යාව	

13. 2016 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම

අංකය	පළාත - ..... දිස්ත්‍රික්කය- ..... පළාත් පාලන ආයතනය-.....			
i	වරිපනම්			
ii	වෙළඳ බලපත්‍ර ගාස්තු			
iii	කර්මාන්ත බදු			
iv	ව්‍යාපාර බදු			
v	වාහන හා සත්ව බදු			
vi	ඉඩම් විකිණීම මත බදු			
vii	ප්‍රචාරක දැන්වීම් ගාස්තු			
viii	විනෝද බදු			
ix	අක්කර බදු			
x	සංවර්ධනය නොකළ ඉඩම් පිළිබඳ බදු			
14	පනවා ඇති අතුරු ව්‍යවස්ථා ඔව් නැත			
i	වරිපනම්			

ii	අක්කර බදු			
iii	බලපත්‍ර ගාස්තු			
iv	ව්‍යාපාර බදු			
v	අන්තරාදායක සහ අප්‍රසන්න ව්‍යාපාර			
vi	පොදු වෙළඳ පොල			
vii	සති පොල			
viii	හෝටල්			
ix	නවාතැන් පොළවල			
x	සංචාරක වෙළඳාම			

අංකය	පළාත - ..... දිස්ත්‍රික්කය- ..... පළාත් පාලන ආයතනය-.....
15	2016 වර්ෂයේ වරිපනම් ප්‍රතිශතය
16	එය ගණනය කළ සූත්‍රය
17	2016 වර්ෂයේ නිකුත් කළ වෙළඳ බලපත්‍ර සංඛ්‍යාව
18	බලපත්‍ර නිකුත්කල වර්ග
19	2016 සඳහා නිකුත්කළ වෙළඳ බලපත්‍ර සඳහා අතුරු ව්‍යවස්ථා පනවා තිබේද ?
20	වරිපනම් ගෙවිය යුතු දින කාර්තු අනුව දන්වා තිබේද ?

ඔව්	නැත

ප්‍රශ්නාවලිය II

පළාත - ..... දිස්ත්‍රික්කය- ..... පළාත් පාලන ආයතනය-.....

අංකය		ඔව්	නැත	වෙනත් කරුණු
	සමීක්ෂණයට භාජනය කළ පුද්ගල සංඛ්‍යාව			
01	2016 වරිපනම් නිවේදනය ලැබී තිබේද ?			
02	ලැබුණු දිනය			
03	වෙළඳ බලපත්‍ර ගාස්තු නිවේදන ලැබී තිබේද ?			
04	ලැබුණු දිනය			
05	වෙළඳ බලපත්‍රය ලැබී තිබේද ?			
06	වාහන හෝ සත්ව බදු ගෙවා තිබේද ?			
07	සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පනවා තිබේද ?			
08	ව්‍යාපාරයේ පෙර වර්ෂයේ ලැබීම් පළාත් පාලන ආයතනය විසින් ලබාගෙන තිබේද ?			
09	පළාත් පාලන ආයතනයෙන් ලද සේවා පිළිබඳ ඔබ තෘප්තිමත් ද?			
10				

පළාත් පාලන ආයතනයෙන් ලබාගත් ලිඛිත තොරතුරු

පළාත - ..... දිස්ත්‍රික්කය- ..... පළාත් පාලන ආයතනය-.....

01	**2016 වර්ෂය සඳහා වූ බදු සඳහා වූ ගැසට් නිවේදනය / නිවේදන**					
	ශේෂ පත්‍රය	2013				
02	ආදායම් වියදම් ගිණුම			2014		2015
03	හිග ආදායම් ප්‍රකාශ					
04						

Questioner – 1

(For Commissioners/Secretaries, Revenue Accountants, revenue inspectors, Revenue supervisors, Management Assistants in charge of revenue subject.)

1.Name:-.....

2. Designation:-.....

3. Experience of the Local authority/ LG Field:-.....

4. Fields of Training received

Type of training	Yes	No
i. Local Authority Management		
ii. Accounts in Local Authorities		
iii. Revenue Collection and Enhancement		
iv. Levying of Taxes and License Duties		
v. Budget Administration		
vi. Local Government By Laws		
vii. Recovery of Rents		
viii. Levying and Recovery of Rates		

5. Have your council levied following Rates, Taxes and Licenses Duties for 2016? Yes ☐ No ☐

	Yes	No
i. Rates		
ii. License duties		
iii. Trade Tax		
iv. Business Tax		
v. Vehicles and Animal tax		
vi. Tax on Undeveloped Lands		
vii. Entertainment Tax		
Viii. Acreage Tax		
ix. Public Performance License Duties (council approval)		
x. Other Taxes		

6. Are there decisions/ council resolutions for above levies? Yes ☐ No ☐

7. Have you published above decisions in the Government Gazette? Yes ☐ No ☐

8. If so indicate No. and date of the notification .....

9. Have you delivered Assessment notices to every Property? Yes ☐ No ☐

10.If so indicate the date of delivery of the last notice.....

11. Number of Objections Received?.....

12. Number of Objection Inquires carried out?.....

13. What is the total estimated revenue of your council for the year 2016?(In Rs.)

i. Rates	
ii. Trade license Duties	
iii. Trade Tax	
iv. Business Tax	
v. Vehicle and Animal Tax	
vi. Tax on certain land sales	
vii. License Duties for Advertisement Boards	
viii. Entertainment Tax	
ix. Acreage Tax	
x. tax on Undeveloped lands	

14. Do you have approved By Laws for following subjects?

	Yes	No
i. Rates		
ii. Acreage Tax		
iii. License Duties.		
iv. Business tax		
v. Dangerous and Offensive Trades		
vi. Public Markets		
vii. Weekly Fair		
Viii. Hotels		
ix. Lodging Houses		
x. Itenery Trades		

15. What is the rate Percentage of year 2016?.....

16. Please describe the formula of calculation of the rate

%.....

.....

.....

17. No. of Trade License issued by your council as at 30th November

2016?.....

18. Please indicate categories of trades which you have issued Licenses (Pl. annex the list)

19. Do you have approved By Laws for Trade License levied of

2016?..... ☐ ☐

20. Have you informed the specific dates of Rate payment in each Quarter? Yes No

Questioner 2

(For Ratepayers Associations/ Traders Associations/ Interested Parties Local government Matters)

1. Name;-

   .....

2. Residential Address:-

   .....

3. Business Registration No. ..... Date:-

   ..... ☐ ☐

4. Have received the Assessment notice for 2016? Yes No

5. If so Indicate the date of the Notice:-

   .....

6. Have you received Notices for the payment of trade license Duties? Yes ☐ No ☐

7. Date of receipt of the Notice?.....

8. Have you paid Vehicle and Animal Tax?.....

9. Is there any of your properties subject to Tax on Undeveloped Lands? Yes ☐ No ☐

උපලේඛණ අංක 03

Box 2.1. Principal revenue sources for local government

✓1. Property tax (rates) on land and/or buildings
✓2. Tax on the transfer of immovable property
3. Tax on motor vehicles
4. Local sales tax and/or tax on the sale of local products
✓5. Tax on local businesses and services
6. Tax on electricity consumption
✓7. Tax on non-motorised vehicles
✓8. Tax on tourism, hotels, restaurants and entertainments
9. Tolls on roads, bridges, etc. within the limits of the local government
✓10. Charges for public works and public utilities like waste collection, drainage, sewerage and water supply
✓11. Charges for markets and rents for market stalls
✓12. Charges for the use of bus stations and taxi parks
✓13. Fees for approval of building plans, and erection and re-erection of buildings
✓14. Fees for fairs, agricultural shows, cattle fairs, industrial exhibitions, tournaments and other public events
✓15. Fees for licensing of businesses, professions and vocations
✓16. Fees for other licences or permits, and penalties or fines for violations
✓17. Fees for advertisements
18. Fees on sale of animals in cattle markets
19. Fees for registration and certification of births, marriages and deaths
20. Fees in respect of education and health facilities established or maintained by the local government
✓21. Fees for other specific services rendered by the local government
✓22. Rent for land, buildings, equipment, machinery and vehicles
23. Surpluses from local commercial enterprises
✓24. Interest on bank deposits or other funds

උපලේඛණ අංක 04

හම්බන්තොට මහ නගර සභාව

2016 වර්ෂය සඳහා වරිපනම් පැනවීම

හම්බන්තොට මහ නගර සභාව විසින් 2015 වර්ෂයේ ඔක්තෝබර් මස 14 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී නිර්දේශ කරන ලද [illegible] දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සරත් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නගරාධිපති,
හම්බන්තොට මහ නගර සභාව.

2015 වර්ෂයේ නොවැම්බර් මස 02 වැනි දින,
හම්බන්තොට මහ නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"252 වන අධිකාරය වූ මහ නගර සභා ආඥාපනතේ 238 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මහ නගර සභා වෙත කරන ලද නියමය ප්‍රකාර, හම්බන්තොට මහ නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා කවර වූ හෝ ගෙපත්වල වාර්ෂික තක්සේරු වටිනාකම් වශයෙන් 2015 වර්ෂය සඳහා පිළිගෙන තිබූ වාර්ෂික තක්සේරු වටිනාකම්, 2016 වර්ෂය සඳහා තක්සේරු වටිනාකම් වශයෙන් පිළිගැනීමටත්,

එකී මහ නගර සභා ආඥාපනතේ 230 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් හම්බන්තොට මහ නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී දේපළ මත වාර්ෂික වටිනාකමෙන් සියයට දොළහ (12%) ක වරිපනම් මුදලක් 2016 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්,

2016 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2016 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දින හෝ එදිනට පෙර හම්බන්තොට මහ නගර සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවක් අදාළ වරිපනම් එ් එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දින හෝ එදිනට මත්තෙන් හම්බන්තොට මහ නගර සභාවට ගෙවන ලැබුවහොත් එ් එක් එක් කාර්තුවේ වරිපනම් ප්‍රමාණයෙන් සියයට පහ (5%) ක වට්ටමක් ද ගෙවීමටත් ; සහ

ඒ වරිපනම්, එකී මහ නගර සභා ආඥාපනතේ 230 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන එක් එක් කාර්තුව අවසන් වීමට පෙර සමාන වාරික හතරකින් හම්බන්තොට මහ නගර සභාවට ගෙවීමට විධාන කිරීමටත් හම්බන්තොට මහ නගර සභාව යෝජනා කරන්නේ ය.

12 - 197/1

877. The most important of these decisions of the Board of Ministers in 1946 was to pay Block Grants to local authorities. The basis of this grant was a combination of the factors of population and revenue in the case of Municipal, Urban and Town Councils. In the case of Village Committees, however, only the revenue factor was taken into account.

878. **Local authorities are still being paid Block Grants on the basis of the population figures of the Census year of 1946 ; the basis of average revenue has also remained static at the average of the three years 1943, 1944, and 1945.** It should be made clear that the annual revenue of these three years include revenue from all sources, but in the case of trading activities, however, it was only the nett income that was included in the figures of revenue.

879. Effect has not been given to the decision regarding taxes on Pawn Brokers and Monylenders and on Trades and Professions.

Official Committee on Local Government Finance (1948)

880. In December 1948 the Hon. the Minister of Health and Local Government appointed an Official Committee under the Chairmanship of Mr. V. C. Jayasuriya, Commissioner of Local Government, " to report on the present methods of taxation of local authorities, their sources of revenue, the need, if any, for a reformulation of the system of taxation and for further sources of revenue to enable local authorities to discharge their duties satisfactorily.". This Committee was appointed because local authorities thought that the decisions reached in 1946 did not provide an adequate solution for their financial problems. Implicit in the appointment was the recognition of the insufficiency of the funds available to local authorities for the efficient discharge of their duties and functions. This Official Committee presented its Report to the Minister in 1949. It was considered by the Government, but no final decisions were taken. The summary of Recommendations of this Committee are reproduced below.

Recommendations of the Official Committee (1948) on Local Government Finance

" A—INTRODUCTORY

" (i) The question of finance must needs be related to that of functions.

" (ii) For various reasons a financial stringency in very many areas has been noted even in regard to functions already being performed.

" (iii) Besides, there are several sectors in the accepted sphere of local functions which hold much scope for local activity being practically untouched as yet, and which are of high priority from the social and civic point of view. Some of these are likely to draw heavy sums as initial investments.

" (iv) (iii) is expected to be met predominantly through loan finance, while ordinary revene is chiefly meant for (ii).

" (v) The requirements of the situation could be met either by some re-formulation of the existing basis of finance, or by substitution of a new basis. We have proceeded on the lines of the first, but have had occasion to comment adequately on the second as well.

" B—TAX ON IMMOVABLES

" (1) *Rates*—Lower income houses constitute unremunerative housing and any increment in revenue must be looked for in the better type of housing.

Graded rating on value of total property owned is practically certain to discourage investment in small houses—which come within the scope of Rent Control.

Simultaneously some specific encouragement to new housing is to be desired, as differential rating is not likely by itself to provide the necessary incentive.

The present system of valuation for ration creates several anomalies, geographical, social and individual.

We recommend—

(i) Graded property rate on a unit basis.

(ii) A policy of rebates on new houses, or small subsidies.

(iii) Strengthening of Valuation staff at the Centre and centralisation at an early date of all assessments.

" (2) *Under Development*—It is a legitimate item.

We recommend a levy of 2¼ per cent of capital value as the annual value on which to levy the taxes ; such land to be defined in terms of Section 44 of the Rating and Valuation Ordinance, No. 30 of 1946.

" (3) *Acreage Tax in Rural Areas*—To be of wider use the minimum taxable unit must be less than at present. There are no objections so long as the charge is low enough.

Nor are there any to the inclusion of paddy lands, but not chena.

We recommend the reduction of the minimum taxable area from 5 acres to ½ acre (undivided) and the inclusion of paddy lands.

" (4) *Incremental Values of Land in Urban Areas*—It is a legitimate source, capable of substantial revenue. There is however a main objection that the proposal is a part of a much larger problem—relating to payment of compensation and recovery of betterment and general Town and Country Planning.

We do not recommend its adoption, but would like to see this taken up as a separate question in itself.

" C—TAX ON MOVABLES

" (1) *Vehicles and Animals Tax*—It is one of the oldest and most accepted items. In the Village Committee Ordinance cattle and buffaloes are excluded. There is some economic argument for the exclusion which could be met by adequate concessions.

We recommend that cattle and buffaloes be taxed at the rate of 50 cents per head per year, but not those below one year in age.

" (2) *Entertainment Tax*—It is a commendable item. We recommend its continuation.

" (3) *Trades and Professions*—In a sense an approximation to Income Tax. It is likely to be of much assistance to the present tax structure.

We endorse its adoption. This has already been recommended and approved (1946 Financial Relations decisions).

" (4) *Sales Tax*—It is a rich source of revenue, but has very many economic objections, some of them of more than local relevance in fact. It is rather a matter for consideration at a National level and in relation to National economic policy.

We do not recommend its adoption.

" (5) *Local Income Tax*—It has an impressive array of arguments in its favour despite several practical difficulties. The cumulative effect of these difficulties reduces its attractiveness.

The main objection, however, is that on the nature and scope of local functions here envisaged, " there is no cogent argument for tampering with the nature and scope of the tax structure itself in any drastic way. What is called for is liberalisation and bold improvement of the existing structure itself.

We do not recommend its adoption.

" D—ASSIGNED REVENUE

" (1) The " local item ". It is a legitimate source. In deciding what are " local items ", a combination of circumstances would require to be taken into consideration.

We recommend continuation of all existing items (including Pawn Brokers).

" (2) *Fines*—We recommend—

(i) Extension of right to Excise fines to all local bodies (not the Municipal Councils alone).

(ii) Extension of similar right in regard to the following Ordinances as well—

(*a*) Street Collections Ordinance ;

(*b*) Poisons, Opium and Dangerous Drugs Ordinance ;

(*c*) Pure Foods and Drugs Ordinance ;

(*d*) Housing and Town Improvement Ordinance ;

(*e*) Pawn Brokers Ordinance ;

(*f*) Election offences under the Local Authorities (Elections) Ordinance ;

" (3) *Stamp Duties*—An item long requested and commented on favourably by the Commission of 1924. It is capable of considerable help to local finance.

We recommend its adoption.

" (4) *Arrack Rent and Tree Tax*—The subject of frequent and persistent demands. There is much argument in its favour (especially Tree Tax) despite the principle of local option and despite considerable Central expense. It is, however, bound up too closely with Government policy at the moment.

We do not recommend its adoption. We recommend, however, that the matter be re-examined five years hence.

" E—GRANTS

" (1) *The Principle*—There are several cogent reasons for grants as a rightful source.

" (2) *Block Grants*—The basis. A computation on the range of the duties and responsibilities of each area is the most apposite.

In the existing situation population and area constitute an adequate index, population being the more important of the two.

Certain special cases not adequately served may of course require special assistance. The volume of the Central grant cannot be increased without limit. On a comparison with England, a generous estimate gives 15 per cent.

We recommend—

(i) Allocation of grants in the ratios obtained on the following basis as suited to meet the practical needs of the situation :

$$\frac{\cdot 75\,p}{P} \text{ plus } \frac{\cdot 25\,a}{A}$$

p — Population

a — Area

P — Total population of all areas

A — Total area

" (It may be noted that taking two areas x and y of the same size and population, one of them x having a larger revenue, the grants they

get will be equal, but the grant to y is necessarily a larger percentage of its revenue than that to x.) "

(ii) For V. CC. since area is not readily obtainable the present basis may continue for the time being.

(iii) Where block grant plus revenue amount to less than Rs. 3,000 the grant to be increased to make up the difference.

(iv) Where grant on the basis of the new formula is less than the existing grant figures, the latter should not be reduced immediately.

(v) Total figure set apart as grants to V. C. C. to be the present amount plus whatever is required in addition under (iii) above.

For T. CC. the maximum rate per cent as fixed by Ordinance to be raised and the grant (for some years) to be increased to $1\frac{1}{2}$ times the present amount.

The amount to U. CC. (at present 9·9 per cent) to be raised to $1\frac{1}{2}$ times the present amount.

" The amount to M. CC. (except Colombo) to be grouped with that to U. CC. (the figures for Kandy and Galle being treated similarly). Colombo to be treated separately and grant to be doubled.

(vi) These arrangements to be reviewed five years hence.

" (3) *Specific Grants*—

(*a*) Towards whole or part costs works, wells, community centres, &c. All deserve such assistance.

We recommend continuation of the present grants.

(*b*) Percentage basis.

Certain items large or involving extraneous factors or both (public assistance, flood damage, &c.) are clearly entitled to this consideration.

Recommendation—

(1) *Water and Housing*—The present position to continue.

(2) *Public Assistance*—Where Municipalities contribute half the amount, they shall have the right to administer the votes. In the remaining areas administration will be in the hands of the Central Government.

(3) *Drainage*—The present basis of 2/3-1/3 contributions to continue.

(4) *Public Health Works*—

(*a*) *T. B.*—Already accepted as a Central responsibility.

(*b*) *I. D. H.*—The local body to provide the site; erection of building to be by the Central Government. Maintenance and running cost to be divided half and half between the local bodies and the Central Government excepting cases where outside patients are brought in; in which case the Central Government will bear the full cost. At any time a report that sanitation is not up to standard will render the local authority liable to forfeiture of assistance under the above arrangement.

(*c*) *Epidemics*—The Central Government to contribute half the value of the houses demolished.

(*d*) *Blind*—Provided work is up to a desired standard. Central Government to provide 50 per cent of cost.

(*e*) *Maternity and Child Welfare*—To continue as the responsibility of local authorities; the usual grants to local authorities to continue.

(5) *Floods and Widespread Distress*—To be Central responsibility.

(6) *Fire*—To be local responsibility.

(7) *Pilgrims*—There is now provision for the Centre to give assistance to local areas on this account.

(8) *Free Libraries*—Ad hoc grants up to 50 per cent of capital costs to be given (other than Municipal Councils).

" F—PUBLIC UTILITIES, TRADING UNDERTAKINGS AND BORROWING FACILITIES

" Public utilities and trading undertakings are items to which local bodies should henceforward pay considerably greater attention, there being enormous scope and much headway to be made.

" They constitute both fruitful sources of revenue in the long run and a major answer to the existing poverty of local finance.

" Method of finance must generally be by loans, though as security and otherwise, an initial sound basis in rate income, &c., is important.

" A marked liberalisation in loan policy seems called for.

" *We recommend*—

(i) The proposed amendment to the L. L. D. F. Ordinance removing the upper limit of two million rupees as the loanable amount by the Government to the Fund.

11—H. 18040 (10/68)

(ii) Steps as envisaged in the Housing Loans Bill and in Building Society Movements need to be actively pursued. Also full facilities to be given to Municipal Councils to float their own loans.

(iii) The interest rate to be not more than ½ per cent. above the rate at which Government can float loans. The period of loans to be related to the durability or otherwise of the assets and not restricted to the present maximum of 25 years. (In England loans up to 80 years are not rare).

(iv) A conscious attempt at a more liberal interpretation of local functions is both necessary and legitimate.

(v) The electricity position in Colombo Municipal area to be examined with a view to removing the anomaly of Government being supplier and distributor.

" G—MISCELLANEOUS

" The items here are classified as " Miscellaneous " not because they are really unclassifiable, but because these constitute odds and ends, of various categories, whose cumulative importance, however, is financially considerable and whose usefulness is also easier considered thus grouped together :—

" (1) *Roads*—

Maintenance of Trunk Roads—This has now been agreed upon as an entirely Central responsibility.

Local Roads used by through Traffic—There seems to be no case for special grant for this. If the local road becomes sufficiently important as a trunk road, then it will automatically be recognized and taken over as such.

Lighting—Local responsibility.

Policemen's Shelters—On trunk roads they are a Central responsibility.

Roundabouts—Where local and trunk roads cross, the costs are to be shared equally.

Automatic Signals—On trunk roads they are a Central responsibility. This matter has already been settled.

" (2) *Assessment*—

The revision of assessment of Crown properties may be expedited ; till then rates may be paid on the last available figures.

Public utilities and undertakings—These should be assessed for rates on an analysis of the accounts for the ten preceding years.

Pillar post boxes—It is not considered desirable to assess these.

" (3) *Water*—

Queens House—The Municipality intended to amend the Regulation with a view to allowing larger amounts free of charge per quarter for premises with an annual value of over Rs. 4,000, but until the law was amended, it was agreed that Government should pay in the same way as any private individual for any water in excess of the free issue of 50,000 gallons per quarter. (There will be no need to meter water supplied for garden purposes). This provision will cover similar cases that may arise like Temple Trees, the Speaker's Residence, and so on.

Port Commission—Shipping is a matter that affects not only Colombo but the whole Island and rates must continue to be approved by the Centre. Tugs may be charged at the proposed rate of Rs. 5, but in respect of shipping, it is felt that any figure in excess of actual cost must be carefully considered. Whatever rate is adopted, it will be expected to be operative with retrospective effect from 1940.

Bacteriogical Institute—Whatever is agreed on as being water used for non-domestic purposes may be taxed. The rest must be supplied free.

Railway—Rate of 50 cents on all water supplied may be charged.

" (4) *Other Amenities*—

Harbour, Lighting up of Roads, &c.—The Port Commission at present provides these amenities. We suggest that for rating purposes the whole of the Harbour should be treated as coming within the Municipal limits of Colombo and Colombo Municipal Council be paid a contribution in lieu of rates on that basis. In return for this the Municipal Council should provide the Harbour with all the services and amenities that are provided for other commercial undertakings. If this were done water supplied to shipping would be provided to the Harbour as a commercial undertaking at the ordinary trade rates.

" (5) *Postage Rates*—The practice of V. CC. using O. H. M. S. envelopes for correspondence has ceased to be relevant with the advance towards local self-government and it is not desirable. We suggest that in future all local bodies should provide for postage out of their own funds.".

881. These were the proposals and recommendations made up to 1949. We approach the question of the financial resources of local authorities therefore bearing in mind the decisions arrived at in 1926, supplemented by the decisions arrived at by the Board of Ministers in 1946, and the fact that further Government assistance (necessitated by compelling general economic and social conditions of the country) was given in the form of grants towards the payment of cost of living and special living allowances.

උපලේඛණ අංක 06

1931 - 1990 අතර කාල පරිච්ඡේදය තුළ සිටි පළාත් පාලන කොමසාරිස්, නියෝජ්‍ය කොමසාරිස් හා සහකාර කොමසාරිස්වරු:

I. පළාත් පාලන කොමසාරිස්වරු : -

- එච්.ඊ.නිවුන්හැම් මහතා
- වී.සී.ජයසූරිය මහතා
- ඩබ්.සී.වී.මහතන්තිල මහතා
- එන්.විජයවර්ධන මහතා
- ඩබ්.ඊ.වී.එස් ද අල්විස් මහතා
- පැරකුම් විජේසිංහ මහතා
- කේ.එච්.අබේසිංහ මහතා
- එස්.ඒ.පිනදාස මහතා

II. නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස්වරු :-

- ඩී.රාජේන්ද්‍ර මහතා
- ෆිලික්ස් ඩයස් අබේසිංහ මහතා
- එස්.ඩබ්.ගුණවර්ධන මහතා
- එස්.එස්.සිල්වා මහතා
- ආර්.බී.තෙන්නකෝන් මහතා
- ජේ.පී.කීර්තිරත්න මහතා
- ඒ.එල්.අමරසිංහ මහතා

III. පළාත් පාලන සහකාර කොමසාරිස්වරු :-

- බී.ලියනමාන මහතා — කොළඹ
- කේ.පී.බී.පියතිලක මහතා — කළුතර
- ඩබ්.කේ.ඒ.පී.අබේසිංහ මහතා — ගාල්ල
- එච්.ඒ.පී.අබේවර්ධන මහතා — මාතර
- සී.ඩබ්.එස් ද සිල්වා මහතා — කුරුණෑගල
- කේ.නල්ලෙයිනාදන් මහතා — වව්නියාව
- බී.ඒ.ජේ.කාසිනාදර් මහතා — මඩකලපුව
- එම්.බී.සමරකෝන් මහතා — බදුල්ල
- එල්.පී.සිරිවර්ධන මහතා — රත්නපුර
- බී.වාමදේවන් මහතා — ත්‍රිකුණාමලය
- ඩබ්.පී.හඳගම මහතා — කෑගල්ල
- කේ.ඒ. කරුණාරත්න මහතා — අනුරාධපුරය
- ඩී.ඩෑන්ගෝත් මහතා — මන්නාරම
- එල්.පී.ඊ.වික්‍රමසේකර මහතා — පුත්තලම/ හලාවත
- ඩී.ගුරුසිංහ මහතා — හම්බන්තොට
- සී.ඇළුවිහාරේ මහතා — මාතලේ